# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2026 පෙබරවාරි මස 13 වන දින

## II වන කොටස

## අතිරේකය

(2026.02.19 දින නිකුත් කරන ලදී)

**බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව**
**(ආයතනික සහ පුද්ගලික)**

**තැනැත්තන් සහ සමාගම් බේරා ගැනීමට, පුනරුත්ථාපනය කිරීමට සහ තැනැත්තන්ගේ සහ සමාගම්වල වස්තුභංගත්වයට අදාළ නීතිය සංශෝධනය කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහා ද; (97 වන අධිකාරය වූ) වස්තුභංගත්ව ආඥාපනත ඉවත් කිරීම සඳහා ද; 2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා ද; 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා ද; 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැක.

**මිල : රු. 2391.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## පටුන

*වගන්තිය* *පිටුව*


පූර්විකාව 1

1. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය 2
2. අර්ථ නිරූපණය 2

## I වන කොටස

## ආයතනික සැලසුම්

## 1 වන පරිච්ඡේදය

### වස්තුභංගත්ව නියාමන අධිකාරිය

3. වස්තුභංගත්ව නියාමන අධිකාරිය පිහිටුවීම 18
4. අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය 20
5. අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා 23
6. අධිකාරියේ අරමුදල 24
7. ගිණුම් සහ විගණනය 25

## 2 වන පරිච්ඡේදය

### නිල දේපළ භාර ගැනුම්කරු

8. නිල දේපළ භාර ගැනුම්කරු සහ නියෝජ්‍ය නිල දේපළ භාර ගැනුම්කරුවෝ 25
9. නිල දේපළ භාර ගැනුම්කරුගේ බලතල 27
10. නිල දේපළ භාර ගැනුම්කරුගේ ධුරය හා නාමය 27
11. නිල දේපළ භාරගැනුම්කරු බංකොලොත්භාවය පිළිබඳ භාරකරුවකු වශයෙන් ක්‍රියා කිරීම නොකරනු ලබන අවස්ථා 28

## 3 වන පරිච්ඡේදය

### වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන්

12. ප්‍රධාන ධුර දරන්නන් වශයෙන් පත් කිරීමට සහ ක්‍රියාකිරීමට සුදුසුකම් ලබන තැනැත්තන් 29
13. පුද්ගල මණ්ඩලයක් ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත්නොකළ හැකි හෝ ක්‍රියා කළ නොහැකි බව 30
14. ලියාපදිංචි කිරීම 30
15. කොන්දේසි 31
16. ලියාපදිංචිය අලුත් කිරීම 31
17. ලියාපදිංචිය අවලංගු කිරීම 32
18. ලියාපදිංචිය අත්හිටුවීම 34
19. වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන්ගේ ලේඛනය 36
20. රක්ෂණය 38
21. නිශ්චිත සිදුවීම් පිළිබඳ දැන්වීම 39
22. වෙනත් සිද්ධි පිළිබඳ දැන්වීම 40
23. ක්‍රියාකලාපය සහ කාර්යසාධනය පිළිබඳ පරීක්ෂණය 40

24. විනය ක්‍රියාමාර්ග 42
25. අර්ථ නිරූපණය 45

## 4 වන පරිච්ඡේදය

## ආයතනික වැඩපිළිවෙළ: විවිධ

26. අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඇවරකරු ලෙස පත් කරනු ලැබීමට පෙලඹවීම 45
27. තහනම් නියෝග 45
28. අභියාචනා 47
29. එසේ කිරීමට අවසර නොමැති විට ක්‍රියා කිරීම 47
30. සම්බන්ධතා ප්‍රකාශය 47
31. පූර්ව අද්මිනිස්ත්‍රාසි වියදම් පිළිබඳ ප්‍රකාශය 48

## II වන කොටස

## පුද්ගලික වස්තුභංගත්ව : මූලධර්ම

32. පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටි යටතේ ණයකරුවකුගේ වගකීම 49
33. ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශය 52
34. ආරක්ෂිත දේපළ 53
35. අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල්, විශ්‍රාම වැටුප් සහ ව්‍යවස්ථාපිත පාරිතෝෂික යටතේ දායකත්ව සහ හිමිකම් 57
36. සාධාරණ ආදායමක් ආරක්ෂා කිරීම 58
37. ඇතුළත් කරන ලද සහ බැහැර කරන ලද ණය 59

## III වන කොටස

## ණය ආරක්ෂා කිරීම සඳහා කල් දැමීමේ නියෝගය

38. ණය ආරක්ෂා කිරීම සඳහා වන ඉල්ලීම 61
39. ණය ආරක්ෂා කිරීම සඳහා කල් දැමීමේ ආඥාවක් ලබාදීමේ නිර්ණායක 63
40. ණය ආරක්ෂා කිරීම සඳහා කල් දැමීමේ ආඥාවේ බලපෑම 66
41. ණය සහන කාලයක් සඳහා ආඥාවට බලපවත්නා කාලසීමාව 70
42. සහන කාල සීමාව සඳහා වන ආඥාව බලපවත්නා කාලය තුළ ණයකරුගේ බැඳීම් 71
43. ණය සහන කාලය කල්දැමීමේ නියෝගයට ණයහිමියා විරෝධය පළ කිරීම 72

## IV වන කොටස

## ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ

44. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ 74
45. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල: සාමාන්‍ය කොන්දේසි 75

46. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: යෝග්‍යතා නිර්ණායක 76
47. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: අනිවාර්ය විධිවිධාන 77
48. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: සුරක්ෂිත ණයහිමියන් සහ දේපළ හිමිකම් 79
49. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු පත් කිරීම 81
50. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: ණයකරුගේ යෝජනාව සකස් කිරීම 83
51. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ පිළිබඳ සාකච්ඡා රැස්වීම 85
52. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා ණයහිමියාගේ අනුමතය 87
53. නිල දේපළ භාරගැනුම්කරු වෙත අනුමත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ඉදිරිපත් කිරීම 91
54. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අධිකරණය විසින් තහවුරු කිරීම 93
55. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අධිකරණය විසින් තහවුරු කිරීමේ බලපෑම 95
56. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ ණයකරුගේ බැඳීම් 101
57. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට ඇති අභියෝගය 101
58. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: වෙනස් කිරීම 104
59. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සම්පූර්ණ කිරීම 108
60. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සම්පූර්ණ කිරීම 112
61. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළ යටතේ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරය 113
62. පුද්ගලික වස්තුභංගත්ව යෝජකයින් 116
63. පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවන් 117
64. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: අධිකරණ විධාන 118

V වන කොටස

## ණය පුනරුත්ථාපන ආඥා

65. ණය පුනරුත්ථාපන ආඥාව 119
66. ණය පුනරුත්ථාපන ආඥාවන් සඳහා යෝග්‍යතාව 120
67. ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා ඉල්ලීම 121
68. ණය පුනරුත්ථාපන ආඥාවක් සෑදීමේ නිර්ණායක 122
69. නිල දේපළ භාර ගැනුම්කරුගේ නිර්දේශය: ණය පුනරුත්ථාපන ආඥාව 123
70. ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීමක් අධිකරණය තීරණය කිරීම 125
71. ණය පුනරුත්ථාපන ආඥාවේ බලපෑම 127
72. ණය පුනරුත්ථාපන ආඥාවේ කාලසීමාව 132
73. ණය නිදහස් කිරීම 132
74. ණය පුනරුත්ථාපන ආඥාව නිල දේපළ භාරකරු විසින් අධීක්ෂණය කළ යුතු බව 134
75. ණය පුනරුත්ථාපන ආඥාවට ණයකරුගේ විරෝධතාව 136
76. ණය පුනරුත්ථාපන ආඥාව අවසන් කිරීම 139
77. බංකොලොත් භාවය පිළිබඳ ආඥාව බවට පරිවර්තනය කිරීම 142

78. නිල දේපළ භාරගැනුම්කරු විසින් දේපළ සංරක්ෂණ ආඥාවක් සඳහා ඉල්ලුම් කළ හැකි බව 145
79. ණය පුනරුත්ථාපන ආඥාව නිදහස් කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම 146
80. බලයලත් අතරමැදියන් 147

# VI වන කොටස

## බංකොලොත්භාවය

## 1 වන පරිච්ඡේදය

### බංකොලොත්භාවය පිළිබඳ ඉල්ලීම සහ බංකොලොත්භාවය පිළිබඳ ආඥාව

81. බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන ණයකරුගේ ඉල්ලීම 148
82. ණයකරු ශ්‍රී ලංකාවේ පදිංචිව සිටිය යුතු බව 148
83. ණයකරු ශ්‍රී ලංකාවේ පදිංචිව සිටිය යුතු බව 149
84. ණයකරුගේ ඉල්ලීම මත බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කිරීම 149
85. බංකොලොත් භාවය පිළිබඳ නියෝගය සඳහා වන පෙත්සම 151
86. බංකොලොත්භාවය පිළිබඳ පෙත්සම: ණයකරුගේ කොන්දේසිය 152
87. බංකොලොත්භාවය පිළිබඳ පෙත්සම: ඉල්ලා අස්කර ගැනීමට, අත්හිටුවීම සහ නිශ්ප්‍රභ කිරීමට අධිකරණයට ඇති බලතල 152
88. ණයහිමියාගේ පෙත්සමේ පදනම 154
89. බංකොලොත්භාවය පිළිබඳ දැන්වීම සහ මුදල් ගෙවීමට ඇති නොහැකියාව 155
90. බංකොලොත් භාවය පිළිබඳ ආඥාව සඳහා වූ පෙත්සම පිළිබඳ අධිකරණ තීරණය 157
91. අතුරු දේපළ භාර ගැණුම්කරු 158

## 2 වන පරිච්ඡේදය

### බංකොලොත්භාවය පිළිබඳ ආඥාවේ බලපෑම

92. බංකොලොත්භාවය ආරම්භ කිරීම 160
93. නීති කෘත්‍ය සහ ප්‍රතිකර්ම නැවැත්වීම 160
94. මුලා කටයුතු පිළිබඳ ප්‍රකාශය 166
95. සුවිශේෂ අවස්ථාවන්හි දී ණය හිමියන් හමුවීම 167
96. විශේෂ අවස්ථාවලදී බංකොලොත් වීම පිළිබඳ මහජන පරීක්ෂාව 169

## 3 වන පරිච්ඡේදය

### නිල දේපළ භාර ගැණුම්කරු සහ බංකොලොත් භාරකරු පත් කිරීම

97. නිල දේපළ භාර ගැනුම්කරු බංකොලොත් භාරකරු බවට පත්වීම 171
98. භාරකරුවන් පත් කිරීම 172
99. භාරකරු ඉවත් කිරීම සහ ධුරය අත්හැරීම 174
100. භාරකරු නිදහස් කිරීම 175

## 4 වන පරිච්ඡේදය

**බංකොලොත් භාරකරුගේ කාර්යයන් සහ කර්තව්‍ය**


101. බංකොලොත් භාරකරුගේ පොදු කර්තව්‍ය සහ නිල නාමය 177
102. බංකොලොත් භාරකරුගේ බලතල 178
103. නිල දේපළ භාරකරු බංකොලොත් භාවය පිළිබඳ
භාරකරු නොවන අවස්ථාවලදී ණයහිමියන්ගේ කමිටුව 181
104. බංකොලොත් භාවය පිළිබඳ භාරකරුගේ ක්‍රියාව පිළිබඳ
අධිකරණ සමාලෝචනය 182
105. භාරකරුගේ පාරිශ්‍රමිකය, වියදම් සහ පිරිවැය 183
106. භාරකරු විසින් ගිණුම් පවත්වාගෙන යායුතු අතර
තොරතුරු සැපයිය යුතු ය 183
107. බංකොලොත් භාවය පිළිබඳ භාරකරුගේ ගිණුම් විගණනය කිරීම 185
108. මුදල්වලට අදාළව බංකොලොත් භාවය පිළිබඳ
භාරකරුගේ කාර්යභාරය 186


## 5 වන පරිච්ඡේදය

**බංකොලොත්භාවයේ දී ණය**


109. බංකොලොත්භාවයේ දී ඔප්පු කළ හැකි ණය 186
110. හිමිකම්පෑන සහ 427 වන වගන්තිය නොපැවතියේ නම්
අන්‍යෝන්‍ය ණය සහ හිලව් කිරීම 188
111. බංකොලොත් භාවයේ දී ණයවල ප්‍රමුඛතාවය 188


## 6 වන පරිච්ඡේදය

**බංකොලොත්භාවයේ දී ණයකරුගේ කාර්යභාරය**


112. බංකොලොත් භාවය පිළිබඳ ණයකරුගේ පොදු වගකීම් 190
113. දේපළ එළිදරව් කිරීම සහ උපලබ්ධි වීම
සම්බන්ධයෙන් ණයකරුගේ බැඳීම් 190
114. මූල්‍ය තොරතුරු 191


## 7 වන පරිච්ඡේදය

**බංකොලොත්භාවයේ ණයකරුගේ දේපළ**


115. බංකොලොත් දේපළේ විස්තරය 192
116. බංකොලොත් භාවය පිළිබඳ භාරකරුට දේපළ පැවරීම 193
117. පසුව අත් කරගත් දේපළ 194
118. භාරකරු විසින් දේපළ සන්තකයේ තබා ගැනීම 195
119. බංකොලොත් දේපළ තහනමට ගැනීම 197
120. බැඳීම්, සහිත දේපළ පිළිබඳ අයිතිය අත්හැරීම 198
121. දේපළ කළමනාකරණය කිරීමට ණයකරුට
අවසර දීමේ බලය 198
122. කුලී සින්නක්කර ගිවිසුමක් මත මිලදී ගත් භාණ්ඩ 199
123. ඇතැම් අවස්ථාවල දී වගකීම්වලින් නිල දේපළ භාර ගැනුම්කරු
සහ බංකොලොත් භාරකරු ආරක්ෂා කිරීම 201

124. දෙවන බංකොලොත්භාවය 201
125. ණය ආපසු ගෙවීමේ ආඥාව 203
126. ණය ආපසු ගෙවීමේ ගිවිසුම 204
127. වස්තුභංගත්වයට පත්වී මිය යන තැනැත්තකුගේ බූදලය 206

## 8 වන පරිච්ඡේදය

### සමහර ගනුදෙනු සඳහා බංකොලොත්භාවයේ බලපෑම

128. ණයහිමියකුට හිංසා කිරීම ප්‍රමාද කිරීම
හෝ පරාජය කිරීම යන අරමුණු සහිතව දේපළ
අවලංගු කළ හැකි ප්‍රමුඛතා අවලංගු කළ හැකි බැඳීම්
සහ අන්සතු කිරීම 206
129. වටිනාකම අඩුවෙන් දක්වන ලද ගනුදෙනු 206
130. දැනුම් දීමකින් තොරව සද්භාවයෙන් ගනුදෙනු ආරක්ෂා කිරීම 206
131. බංකොලොත් ණයකරුට සහ පැවරුම්ලාභියා කරනු
ලබන ඇතැම් ගෙවීම්වල වලංගුභාවය 208
132. පොත් ණය පිළිබඳ පොදුවේ පැවරුම් 208
133. ත්‍රාසග්‍රහණ ගනුදෙනු බංකොලොත් ණයකරුට
සහ පැවරුම්ලාභියාට කරනු ලබන
ඇතැම් ගෙවීම්වල වලංගුභාවය 209
134. බංකොලොත් භාවයට පෙර අවසන් කරනු ලැබුවේ
නම් මිස, ඇස්තීසි කිරීමකින් වෙනත් ක්‍රියාවලියකින්
ප්‍රතිලාභ නොතිබීම 211
135. බංකොලොත්භාවයේ දී පිස්කල්ගේ කාර්යභාරය 211

## 9 වන පරිච්ඡේදය

### දේපළ බෙදා හැරීම

136. බංකොලොත් භාවයේ දී බෙදාහැරීම 213

## 10 වන පරිච්ඡේදය

### බංකොලොත්භාවය අවසන්වීම

137. බංකොලොත් භාවයේ කාල සීමාව 213
138. නිදහස් කිරීම 214
139. අධි වටිනාකමක් යුතු බංකොලොත් භාවය 215
140. නිදහස් කිරීම අභියෝගයට ලක් කිරීම සඳහා වූ
ඉල්ලීම 217
141. නිදහස් කිරීම අතුරු අත්හිටුවීම 217
142. බංකොලොත් වාර්තාව: නිදහස් කිරීම අභියෝගයට
ලක් කිරීමේ ඉල්ලීම 219
143. නිදහස් කිරීම අභියෝගයට ලක් කිරීම සඳහා වූ
ඉල්ලීම පිළිබඳව අධිකරණ තීරණය 220
144. බංකොලොත්භාවය නිදහස් කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ
කිරීම 221

145. බංකොලොත් භාවය පිළිබඳ නියෝගය අවලංගු කිරීම 222
146. බංකොලොත්භාවය අතරතුර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා ඉල්ලීමක් කිරීම 223

## 11 වන පරිච්ඡේදය
## නිල දේපළ භාර ගැනුම්කරු

147. බංකොලොත්භාවයේ දී ණයකරුගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් නිල දේපළ භාරගැනුම්කරුගේ බලතල 224
148. බංකොලොත්භාවය සම්බන්ධයෙන් නිල දේපළ භාරගැනුම්කරුගේ පොදු කාර්යභාරය 225

## 12 වන පරිච්ඡේදය
## බංකොලොත්භාවයේ හවුල්කාරිත්වය

149. හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් බංකොලොත්භාවය පිළිබඳ ඉල්ලීම් සහ බංකොලොත්භාවය පෙත්සම් 225
150. අධිකරණය විසින් පෙත්සම නිෂ්ප්‍රභ කිරීම 226
151. හවුල්කරුවන්ගේ දේපළ එකම භාරකරු වෙත පැවරිය යුතු බව 226
152. බංකොලොත් භාරකරු විසින් සහ බංකොලොත් ණයකරුගේ හවුල්කරු විසින් ගනු ලබන ක්‍රියාමාර්ග 227
153. ඒකාබද්ධ කොන්ත්‍රාත් මත වලට එරෙහිව නඩු 228
154. හවුල් ව්‍යාපාරයේ නමින් නඩු කටයුතු පවත්වාගෙන යාම 228

## VII කොටස
## පුද්ගලික බංකොලොත් ලේඛනය

155. පුද්ගලික බංකොලොත් ලේඛනය පවත්වාගෙන යා යුතු බව අධිකාරි බලය 229
156. පුද්ගලික බංකොලොත් ලේඛනයේ කාර්ය 229
157. පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ සටහන් කළ යුතු තොරතුරු 229
158. පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයෙන් තොරතුරු ඉවත් කිරීම 231
159. පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයට ප්‍රවේශය 232
160. යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් අධිකාරිය සහ නිල දේපළ භාරගැනුම්කරු වගකීමකට යටත් නොවන බව 233
161. පුද්ගලික වස්තුභංගත්ව ලේඛනය සහ ණය තොරතුරු කාර්යාංශය 234

# VIII වන කොටස
## පුද්ගලික වස්තුභංගත්ව වැරදි
## 1 වන පරිච්ඡේදය
### වැරදි පිළිබඳ පොදු විධිවිධාන

162. චේතනාව 235
163. මේ කොටස යටතේ වැරදි සඳහා දඬුවම් 235
164. නිදහස් කිරීමෙන් පසු සාපරාධී වගකීම 235

## 2 වන පරිච්ඡේදය
## පුද්ගලික වස්තුභංගත්ව වැරදි


165. පුද්ගලික වස්තුභංගත්ව ක්‍රියාපටිපාටියේ අදාළ වීම්:
අසත්‍ය තොරතුරු 236
166. පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටිය:
ණයකරුවන් වගකීම්වලට අනුකූලව ක්‍රියා නොකිරීම 236
167. පුද්ගලික වස්තුභංගත්ව කාර්ය පටිපාටි: ලේඛන සහ වාර්තා 238
168. පුද්ගලික වස්තුභංගත්ව කාර්ය පටිපාටිය: දේපළ බැහැර කිරීම 239
169. පුද්ගලික වස්තුභංගත්ව කාර්ය පටිපාටි: ණය සහ ව්‍යාපාර 241


## 3 වන පරිච්ඡේදය
## බංකොලොත්භාවය පිළිබඳ වැරදි


170. බංකොලොත්භාවය පිළිබඳ වැරදි: හෙළිදරව් නොකිරීම
සහ අසත්‍ය නියෝජනය 243
171. බංකොලොත් භාවය පිළිබඳ වැරදි: දේපළ 243
172. බංකොලොත් භාවය පිළිබඳ වැරදි: ලේඛන 244
173. බංකොලොත් භාවය පිළිබඳ වැරදි:
ණය සහ ණයට ගැනීම 246
174. බංකොලොත් භාවය පිළිබඳ වැරදි: ව්‍යාජ හිමිකම්පෑම් 247
175. බංකොලොත් භාවය පිළිබඳ වැරදි: ශ්‍රී ලංකාව හැර යාම 247
176. බංකොලොත් භාවය පිළිබඳ වැරදි: වගකීම්වලට
අනුකූලව ක්‍රියා නොකිරීම 248
177. බංකොලොත්භාවය පිළිබඳ වැරදි: සැඟවීමේ චේතනාවෙන්
නිසි වාර්තා තැබීම පැහැර හැරීම 248


# IX වන කොටස
# සමාගම් බේරා ගැනීම අද්මිනිස්ත්‍රාසි කිරීම
## 1 වන පරිච්ඡේදය
## අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරය


178. අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරය 249


## 2 වන පරිච්ඡේදය
## අද්මිනිස්ත්‍රාසිකරණයේ කාර්යපටිපාටිය


179. අද්මිනිස්ත්‍රාසිකරණය ආරම්භ වීම 250
180. අද්මිනිස්ත්‍රාසි කිරීමේ ක්‍රියාමාර්ග 250


## 3 වන පරිච්ඡේදය
## අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීම


181. අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත් කරනු ලැබිය හැකි,
ක්‍රියා කරනු ලැබිය හැකි වනුයේ කවුරුන්ද යන වග 254

182. අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත්කරනු ලැබීමට හෝ
කටයුතු කරනු ලැබීමට නුසුදුසුකම් 255
183. අද්මිනිස්ත්‍රාසිකරුව පත් කළ හැක්කේ කවුරුන්ටද? 256
184. තැනැත්තන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක්
අද්මිනිස්ත්‍රාසිකරුවන් ලෙස පත්කිරීම 257
185. සමාගමක් විසින් අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම 257
186. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අද්මිනිස්ත්‍රාසිකරු
පත්කිරීම 258
187. සමාගම හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අද්මිනිස්ත්‍රාසිකරු
පත්කිරීම මත වන සීමාව 258
188. ඇවරකරුවකු විසින් හෝ තාවකාලික ඇවරකරුවකු
විසින් හෝ අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීම 260
189. සුරක්ෂිත ණයහිමියකු විසින් අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීම 261
190. අධිකරණය විසින් අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීම 261
191. අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කළ බව සටහන් කළ යුතු බව 263
192. අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීමට නොහැකි බව 263
193. අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීම පිළිබඳ දැන්වීම සහ විස්තර 264
194. අද්මිනිස්ත්‍රාසි කිරීම පිළිබඳව ලේඛනවල සඳහන්කළ යුතු බව 266
195. අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින ලේඛනවල සමාගමේ නම
වෙනස් කිරීම පිළිබඳව සඳහන් විය යුතු බව 266

## 4 වන පරිච්ඡේදය
## **අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපෑම්**

196. අද්මිනිස්ත්‍රාසි කිරීම සිදුවන කාලය තුළ පිළිබැඳීම්
ක්‍රියාත්මක නොකළ යුතු බව 267
197. අද්මිනිස්ත්‍රාසි කිරීම සිදුවන කාලය තුළ දේපළ ආපසු
ලබා නොගත යුතු බව 268
198. අද්මිනිස්ත්‍රාසි කිරීම අතරතුර දී නඩු කටයුතු ආරම්භ කිරීම
හෝ පවත්වාගෙන යාම නොකළ යුතු බව 269
199. අද්මිනිස්ත්‍රාසි කිරීම පවතින කාලය තුළ දී ක්‍රියාවේ යෙදවීම
හෝ වෙනත් ක්‍රියාවලියක් සිදු නොකළ යුතු බව 270
200. අද්මිනිස්ත්‍රාසි කිරීමට පෙර අවසන් කළහොත් මිස තීන්දුවක්
ක්‍රියාත්මක කිරීමකින් හෝ වෙනත් ක්‍රියාවලියකින්
ප්‍රතිලාභ අත්කර නොගත යුතු බව 270
201. අද්මිනිස්ත්‍රාසි කිරීමේ දී පිස්කල්වරයාගේ කාර්යභාරය 271
202. අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කිරීමට පෙර ක්‍රියාත්මක කරනු
ලබන බලතල 272
203. ස්ථාවර සුරකුම් බලාත්මක කිරීමට අවසර ලබාදීම
සඳහා වූ තීරණ කාලය තුළ කරනු ලබන ඉල්ලීම 273
204. දැන්වීමක් කිරීම සඳහා කැමැත්ත හෝ අවසරයක්
අවශ්‍යා නොවන බව 276
205. සමාගමේ අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් අනුයෝජිතයන්
කෙරෙහි අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපෑම 276
206. අද්මිනිස්ත්‍රාසිකරුට තොරතුරු ලබා දිය යුතු බව 277
207. සේවා නියුක්තයන් කෙරෙහි අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපෑම 278

208. දේපළ සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ දී අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපෑම 278
209. කොටස් පැවරීම මත අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපෑම 280
210. අද්මිනිස්ත්‍රාසි කිරීමට යටත්ව ඇති අත්‍යවශ්‍ය සේවා 281

## 5 වන පරිච්ඡේදය
## අද්මිනිස්ත්‍රාසි කිරීමේ මාර්ග

211. සම්මත සහ කඩිනම් කරන ලද මාර්ගවලට අදාළ විධිවිධාන 282
212. ආරම්භක රැස්වීම 282
213. ප්‍රතිඵල රැස්වීම 286
214. ප්‍රතිඵල රැස්වීමේ කටයුතු 288

### *ආ - සම්මත මාර්ගය*

215. ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීම 291
216. ඔප්පු සමාලෝචක විභාගය 294

### ඇ - මාර්ග ද්විත්වය සඳහා ම අදාළ වන කාරණා

217. අද්මිනිස්ත්‍රාසි කිරීම පිළිබඳ ණයහිමියන්ගේ කමිටුව 298
218. කොටස් හිමියන්ගේ, ණයහිමියන්ගේ සහ කමිටු පිළිබඳ අද්මිනිස්ත්‍රාසි කිරීමේ රැස්වීම් 300
219. අද්මිනිස්ත්‍රාසි කිරීමේ දී අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශ 301
220. අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් වන්නේ කවර අවස්ථාවක දී ද යන වග 302

## 6 වන පරිච්ඡේදය
## සමාගම් ඔප්පු වැඩපිළිවෙළ සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන්
### *අ - සමාගම් ඔප්පු වැඩපිළිවෙළ*

221. ඔප්පුවක අන්තර්ගත කරුණු 304
222. ඔප්පුවක් යටතේ තුන්වන පාර්ශ්වයන් නිදහස් කිරීම 305
223. ඔප්පුවක් සඳහා වන අවශ්‍යතා 305
224. ඔප්පුවෙන් බැඳී සිටින ප්‍රමාණය 307
225. ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු 309
226. ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත් කර ක්‍රියා කළ හැක්කේ කවුරුන් ද යන වග 310
227. ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් පත් කිරීම 311
228. ඔප්පු අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ වනුයේ සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු පත් කරන්නේ කවර අවස්ථාවක දී ද යන වග 311
229. ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම සඳහා ඇප 312
230. ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම ප්‍රත්‍යාදිෂ්ට නොකළ යුතු බව 312

*ඇ - සමාගම් ඔප්පු වැඩපිළිවෙළක වලංගුතාව, වැඩපිළිවෙළ වෙනස් කිරීම හා අවසන් කිරීම.*

231. ඔප්පුවක වලංගුවීම පිළිබඳව ආඥාවක් අධිකරණය විසින් පැනවිය හැකි බව 312

## 7 වන පරිච්ඡේදය

**අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල**

232. අද්මිනිස්ත්‍රාසි කරුගේ බලතල 314
233. සහය ලබාදෙන ලෙස අද්මිනිස්ත්‍රාසි කරුවකු විසින් කරනු ලබන ඉල්ලීම 314
234. දේපළ භාර ගැනුම්කාරිත්වය හෝ පත්වීම අවසන් විය යුතු බවට අද්මිනිස්ත්‍රාසිකරුගේ දැන්වීම 317
235. අද්මිනිස්ත්‍රාසිකරු විසින් කොටස් සඳහා ඇමතුම් 318
236. අද්මිනිස්ත්‍රාසිකරු විසින් ලේඛන ලියා අත්සන් කිරීම 318
237. පිළිබැඳීමකට යටත් යම් දේපළක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අද්මිනිස්ත්‍රාසිකරුට ඇති බලතල 319

## 8 වන පරිච්ඡේදය

**අද්මිනිස්ත්‍රාසිකරුගේ සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරය**

*අ - විමර්ශනය කිරීම සඳහා වූ කාර්යභාරය*

238. සමාගමේ කටයුතු විමර්ශනය කිරීමට අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්යය භාරය 321

*ආ - වාර්තා කිරීම සඳහා කාර්යභාරය*

239. වැරදි ක්‍රියා වාර්තා කිරීම සඳහා අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරය 322
240. සිදු කරන ලද වරදක් වාර්තා කිරීමට අද්මිනිස්ත්‍රාසිකරු සතු කාර්යභාරය 323
241. ගිණුම් සකස් කිරීම සඳහා අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්ය 324
242. අවසන් වාර්තාව යැවීමට ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්යභාරය 325
243. අවසාන වාර්තාව යැවීමට අද්මිනිස්ත්‍රාසිකරු වෙත වන කාර්යභාරය 326

*ඇ - විවිධ කාර්ය*

244. මුදල්වලට අදාළව අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්යභාරය 326
245. ගිණුම් වාර්තාවලට අදාළව අද්මිනිස්ත්‍රාසිකරුට සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්යය 327

## 9 වන පරිච්ඡේදය

**අද්මිනිස්ත්‍රාසිකරුගේ සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ පාරිශ්‍රමිකය සහ අද්මිනිස්ත්‍රාසි කිරීමේ ගාස්තු අනුමත කිරීම**


246. අද්මිනිස්ත්‍රාසි කරුගේ සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසි කරුගේ පාරිශ්‍රමිකය 328
247. පූර්ව අද්මිනිස්ත්‍රාසි කිරීමේ ගාස්තු අනුමත කිරීම 328


## 10 වන පරිච්ඡේදය

**අද්මිනිස්ත්‍රාසිකරුගේ සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ බැරකම**


248. අද්මිනිස්ත්‍රාසිකරුගේ හානිපූරණය 329
249. පෙර පැවති රැකියා ගිවිසුම් යටතේ අද්මිනිස්ත්‍රාසිකරුගේ වගකීම 330
250. වෙනත් ගිවිසුම් මත සහ කුලිය සඳහා අද්මිනිස්ත්‍රාසිකරුගේ වගකීම 331
251. දෝෂයක් ඇති අවස්ථාවක වගකීමෙන් නිදහස් වීම 332


## 11 වන පරිච්ඡේදය

**අද්මිනිස්ත්‍රාසිකරණය සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරණය - විවිධ**


252. අද්මිනිස්ත්‍රාසිකරුගේ යම් නඩුවක් ඉවත් කිරීම 333
253. අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරය පුරප්පාඩු වීම 333
254. ණයහිමියන් විසින් අද්මිනිස්ත්‍රාසිකරු ධුරයෙන් ඉවත් කිරීම 337
255. ප්‍රතියෝජන අද්මිනිස්ත්‍රාසිකරු 338
256. ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ඉවත් කිරීම සහ ප්‍රතියෝජනය කිරීම 339
257. ඇවර කිරීම හෝ තාවකාලික ඇවර කිරීම නැවත ආරම්භ කිරීම සඳහා ආඥාව 339
258. අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු නිදහස් කිරීම 339
259. ලේඛන මගින් ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරණය පිළිබඳව සඳහන් කළ යුතු බව 340
260. ඔප්පු අද්මිනිස්ත්‍රාසි කරණය අවසන්වන්නේ කවර අවස්ථාවක දී ද යන වග 341


## 12 වන පරිච්ඡේදය

**අද්මිනිස්ත්‍රාසිකරණය සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරණයේ දී අධිකරණය සතු බලතල**


261. අද්මිනිස්ත්‍රාසිකරු විසින් හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු විසින් විධාන සඳහා කරනු ලබන ඉල්ලීම 342
262. අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ පාරිශ්‍රමිකය හෝ පත්වීම සම්බන්ධයෙන් වූ ආඥාව 342
263. අද්මිනිස්ත්‍රාසි කරණයේදී සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරණයේ දී අධිකරණයේ සාමාන්‍ය බලතල 344
264. අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්ය බලාත්මක කිරීම සඳහා වූ නියෝගය 345

265. අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ඉවත් කිරීම
අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් ක්‍රියා කිරීම 181 වන වගන්තිය
යටතේ අවසරදීම නවතා ඇති බවට 347
266. ව්‍යාපාර හෝ දේපළ ආරක්ෂා කිරීම සඳහා වූ ආඥා 348
267. ණයහිමියන්ගේ සහ කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම 348
268. අද්මිනිස්ත්‍රාසිකරණයේ දී ණයහිමියන් ආරක්ෂා කිරීම සඳහා කරනු
ලබන ආඥා 350

## X වන කොටස
## සමස්ථයකට එළඹීම

269. අර්ථ නිරූපණය 350
270. එකඟතාව පිළිබඳ යෝජනාව 350
271. යෝජිත සමස්ථය පිළිබඳ දැනුම්දීම 352
272. සමථයකට එළඹීමේ බලපෑම 355
273. සමථයක් වෙනස් කිරීම 356
274. සමථයන්ට අදාළව අධිකරණය සතු බලතල 357
275. සමථයේ පිරිවැය 358

## XI වන කොටස
## ක්ෂුද්‍ර කුඩා මධ්‍යම පරිමාණ ව්‍යවසාය (එම්.එස්.එම්.ඊ) සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ

276. එම්.එස්.එම්.ඊ සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ 359
277. එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ:
සාමාන්‍ය කොන්දේසි 359
278. එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ:
යෝග්‍යතා නිර්ණායක 361
279. එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ:
අනිවාර්ය ප්‍රතිපාදනය 362
280. එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ:
සුරක්ෂිත ණයහිමියන් සහ දේපළ හිමිකම් 362
281. එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ:
පුද්ගලික වස්තුභංගත්ව යෝජනාකරුවකු පත් කිරීම 364
282. එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ:
එම්.එස්.එම්.ඊ. ණයකරුගේ යෝජනාව සකස් කිරීම 366
283. එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ:
සාකච්ඡා රැස්වීම 369
284. එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ
ණයහිමියා විසින් අනුමත කිරීම 370
285. අනුමත එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ
වැඩපිළිවෙළ නිල දේපළ භාරගැනුම්කරු වෙත ඉදිරිපත් කිරීම 374
286. එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ
අධිකරණයෙන් ස්ථිර කිරීම 376
287. එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ
අධිකරණය විසින් තහවුරු කිරීමේ බලපෑම 378

288. එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට අභියෝග කිරීම 383
289. එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කිරීම 386
290. එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අවසන් කිරීම 390
291. එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සම්පූර්ණ කිරීම 393
292. එම්.එස්.එම්.ඊ.සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරය 394
293. පුද්ගලික වස්තුභංගත්ව යෝජනාවන්: එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ 396
294. පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු: එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ 398
295. එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: අධිකරණ විධාන 399

## XII වන කොටස
## **ඇවර කිරීම**
### 1 වන පරිච්ඡේදය
### **ඇවරකරුගේ කාර්යභාරය**

296. ඇවරකරුගේ කාර්යභාරය 400

### 2 වන පරිච්ඡේදය
### **ඇවර කිරීමේ ක්‍රියාවලිය**

297. ඇවර කිරීම ආරම්භ වන්නේ කවර අවස්ථාවක ද යන වග 400
298. ඇවරකරු පත් කිරීම 401
299. සමාගම විසින් හෝ මණ්ඩලය විසින් ඇවරකරු පත් කිරීම පිළිබඳ සීමා කිරීම 403
300. ඇවර කිරීමේ ආරම්භය සටහන් කළ යුතු බව 404
301. ප්‍රතිඵල රැස්වීමේ දී ඇවරකරු පත් කිරීම 404
302. බුන්වත් බව පිළිබඳ ප්‍රකාශය 405
303. ණය ගෙවීමට නොහැකි වීම පිළිබඳව සාක්ෂි 408
304. තාවකාලික ඇවරකරුවකු පත් කිරීම 408
305. ඇවර කිරීමේ දී අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය 409
306. ඇවරකරු විසින් ණයහිමියන්ගේ රැස්වීම කැඳවිය යුතු බව 411
307. ප්‍රතියෝජක ඇවරකරු 414
308. ඇවර කිරීමක දී ණයහිමියන්ගේ කමිටුව 415
309. ඇවර කිරීමේ දී සහදායකයන්ගේ කමිටුව 417
310. ඇවර කිරීමකදී කොටස් හිමියන්ගේ, ණයහිමියන්ගේ , සහදායකයින්ගේ සහ කමිටුවල රැස්වීම් 420

311. ඇවර කිරීමේ අවසානය 422

## 3 වන පරිච්ඡේදය
## ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු පත් කිරීම

312. ඇවරකරු ලෙස පත් කළ හැක්කේ සහ ක්‍රියා කළ හැක්කේ කවුරුන් ද යන වග 422
313. ඇවරකරුවකු ලෙස කටයුතු කිරීමට හෝ ක්‍රියා කරනු ලැබීමට නුසුදුසුකම් 423
314. ඇවරකරුවන් හෝ තාවකාලික ඇවරකරුවන් දෙදෙනෙක් හෝ වැඩි ගණනක් පත් කිරීම 424
315. ඇවරකරුගේ පත්වීමේ දැනුම් දීම සහ විස්තර 425
316. ලේඛනවල ඇවර කිරීම පිළිබඳව සඳහන් කළ යුතු බව 427

## 4 වන පරිච්ඡේදය
## ඇවර කිරීමේ බලපෑම

317. ඇවර කිරීමක් තුළ දී පිළිබැඳුමක් බලාත්මක නොකළ යුතු බව 427
318. ඇවර කිරීම සිදුවෙමින් පවතිද්දී කිසිඳු සාමාන්‍ය නඩු කටයුත්තක් ආරම්භ කිරීම හෝ ඉදිරියට ගෙන යාම නොකළ යුතු බව 428
319. ඇවර කිරීමේ දී තහනමට ගැනීමක් හෝ වෙනත් ක්‍රියාවලියක් නොකළ යුතු බව 429
320. ඇවර කිරීම ආරම්භ කිරීමට පෙර අවසන් කරනු ලැබුවේ නම් මිස තහනමට ගැනීමේ හෝ වෙනත් ක්‍රියාවලියක ප්‍රතිලාභ අත්නොවන බව 429
321. ඇවර කිරීමේ දී පිස්කල්ගේ කාර්යභාරය 430
322. ඇවර කිරීම ආරම්භ කිරීමට පෙර ක්‍රියාත්මක කරන ලද බලතල 431
323. සමාගමේ අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් අනුනියෝජිතයින් මත ඇවර කිරීමේ බලපෑම 432
324. ඇවරකරු හට තොරතුරු සැපයීමට ඇති නියමය 433
325. දේපළ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ඇවර කිරීමේ බලපෑම 434
326. කොටස් පැවරීම මත ඇවර කිරීමේ බලපෑම 436
327. ඇවර කිරීමේදී අත්‍යවශ්‍ය සේවා 437
328. තාවකාලික ඇවර කිරීමේ දී මෙම පරිච්ඡේදය අදාළ වීම (ඇති කිරීමේ බලපෑම) 437

## 5 වන පරිච්ඡේදය
## ඇවරකරුගේ බලතල

329. ඇවරකරුගේ බලතල 438
330. සහයෝගය සඳහා ඇවරකරු විසින් ඉල්ලීම් සිදු කිරීම 439
331. දේපළ භාර ගැනුම්කාරිත්වය හෝ පත්වීම්ලාභියකුගේ පත්වීම අවසන් වියයුතු බවට ඇවරකරුගේදැන්වීම 442
332. ඇවරකරු විසින් ලේඛන ලියා අත්සන් කිරීම 443
333. පිළිබැඳුමකට යටත්ව දේපළක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඇවරකරුට ඇති බලතල 444
334. දුර්වාහ්‍ය දේපළ පිළිබඳ හිමිකම් නොපෑම 444

335. වියාචනය කළ යුතු ද නැද්ද යන්න තෝරා ගැනීමේ අවශ්‍යතාවය 446
336. තාවකාලික ඇවර කිරීමේ දී මෙම පරිච්ඡේදයේ අදාළ වීම 447

## 6 වන පරිච්ඡේදය

## ඇවරකරුගේ කාර්යභාරය

*අ - සාමාන්‍ය*

337. ඇතැම් අවස්ථාවල දී ඇවරකරු ක්‍රියා කිරීම අවශ්‍ය නොවන බව 447
338. සමාගමේ කටයුතු විමර්ශනය කිරීම සඳහා ඇවරකරුගේ කාර්යභාර්යය 448

*ආ - සහදායකයන්*

339. සහදායක ලැයිස්තුවක් නිරවුල් කිරීම 449
340. සහදායකයන්ගේ ලැයිස්තුවක් වෙනස් වීම 449
341. සහදායකයින්ගේ අයිතිවාසිකම් ගැලපීම 449
342. පෙර කොටස්හිමි සහදායකයන්ගේ වගකීම 449
343. සහදායකයන්ගේ බැරකම් ක්‍රියාත්මක කිරීම 450

*ඇ - සමාගමේ දේපළ අදාළකර ගැනීම*

344. වරණීය හිමිකම් 451

*ඈ - වාර්තා කිරීම සඳහා වූ කාර්ය භාරය*

345. වැරදි ක්‍රියා වාර්තා කිරීමට ඇවරකරුට ඇති කාර්යභාරය 453
346. සිදු කරන ලද වරද වාර්තා කිරීමට ඇවරකරුට ඇති කාර්යභාරය 454
347. ගිණුම් සකස් කිරීම සඳහා ඇවරකරුට ඇති කාර්යභාරය 455
348. වැරදි ක්‍රියා වාර්තා කිරීම සඳහා වූ ඇවරකරුගේ කාර්යභාරය 456

*ඉ - විසුරුවා හැරීම*

349. විසුරුවා හැරීම 457

*ඊ - විවිධ කාර්යභාර*

350. මුදල් සම්බන්ධයෙන් ඇවරකරුගේ කාර්යභාරය 458
351. ගිණුම් වාර්තා සම්බන්ධයෙන් ඇවරකරුගේ කාර්යභාරය 459

*උ- තාවකාලික ඇවර කිරීමේ දී කාර්යභාරය*

352. තාවකාලික ඇවර කිරීමේ දී මෙම පරිච්ඡේදය අදාළ වන බව 459

## 7 වන පරිච්ඡේදය
### ඇවරකරුගේ පාරිශ්‍රමිකය

353. නිල දේපළ භාරගැනුම්කරු හැර ඇවරකරුගේ පාරිශ්‍රමිකය 460

## 8 වන පරිච්ඡේදය
### ඇවරකරුගේ, තාවකාලික ඇවරකරුගේ සහ විශේෂ කළමනාකරුගේ වගකීම්

354. දෝෂයක් ඇති අවස්ථාවක වගකීමෙන් නිදහස් කිරීම 460

## 9 වන පරිච්ඡේදය
### ඇවර කිරීම - විවිධ

355. අද්මිනිස්ත්‍රාසිකරුගේ දේපළ භාර ගැනුම්කරු හෝ විසින් ඇවරකරුට තොරතුරු සහ සහාය ලබා දිය යුතු බව 461
356. ඇවරකරුගේ ධුරය පුරප්පාඩු වීම 462
357. ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු නිදහස් කිරීම 465
358. විශේෂ කළමනාකරුවකු පත් කිරීම 466
359. මුද්දර ගාස්තුවලින් නිදහස් කිරීම 469

## 10 වන පරිච්ඡේදය
### ඇවර කිරීමේ දී සහ තාවකාලික ඇවර කිරීමේ දී අධිකරණයේ බලතල

360. ඇවරකරුවකු හෝ තාවකාලික ඇවරකරු විසින් විධාන සඳහා ඉල්ලුම් කිරීම 469
361. ඇවරකරුවන් සහ තාවකාලික ඇවරකරුවන් පිළිබඳ අධිකරණයේ අධීක්ෂණය සහ ඇවරකරුවන්ගේ පාරිශ්‍රමික හෝ පත්වීම් පිළිබඳව ආඥා කිරීම 470
362. ඇවර කිරීමේ දී සහ තාවකාලික ඇවර කිරීමේ දී අධිකරණයේ සාමාන්‍ය බලතල 471
363. ඇවරකරුගේ හෝ තාවකාලික ඇවරකරුගේ කාර්ය බලාත්මක කිරීම සඳහා වූ ආඥාව 473
364. අධිකරණය මගින් ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු ධුරයෙන් ඉවත් කිරීම 475
365. යම් ඉල්ලීමක් හෝ නඩු කටයුත්තක් නැවැත්වීමට හෝ වැළැක්වීමට ඇති බලය 475
366. ඇවර කිරීමක දී හෝ තාවකාලික ඇවර කිරීමේ දී ණයහිමියන් ආරක්ෂා කිරීම සඳහා වූ ආඥාව 476

# XIII වන කොටස
## දේපළ භාරගැනුම්කාරිත්වය
## 1 වන පරිච්ඡේදය
### අර්ථ නිරූපණය

367. අර්ථ නිරූපණය 476

## 2 වන පරිච්ඡේදය
## දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම


368. දේපළ භාර ගැනුම්කරුවකු පත්කිරීම සඳහා සාධන පත්‍රයක් මඟින් බලය පැවැරිය හැකි බව 476
369. දේපළ භාර ගැනුම්කාරිත්වය ආරම්භ වන්නේ කවර අවස්ථාවකදී ද යන වග 476
370. දේපළ භාර ගැනුම්කරුවකු ලෙස පත් කළ හැකි වනුයේ සහ ක්‍රියා කළ හැකි වනුයේ කවුරුන් ද යන්න 477
371. දේපළ භාර ගැනුම්කරුවකු ලෙස පත් කිරීමට හෝ ක්‍රියා කිරීමට නුසුදුසුකම් 478
372. සාධන පත්‍රයක් යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම 479
373. අධිකරණය විසින් දේපළ භාර ගැනුම්කරුවෙකු පත් කළ හැකි බව 481
374. දේපළ භාරගැනුම්කරු පත් කිරීම පිළිබඳ දැන්වීම සහ විස්තර 482
375. ලේඛනවල දේපළ භාර ගැනුම්කරුවකුගේ පත්වීම පිළිබඳව සඳහන් කළ යුතු බව 483


## 3 වන පරිච්ඡේදය
## දේපළ භාරගැනුම්කරුගේ බලතල


376. දේපළ භාර ගැනුම්කරුගේ බලතල 485
377. දේපළ භාර ගැනුම්කරු විසින් ලේඛන ලියා අත්සන් කිරීම 485
378. දේපළ භාර ගැනුම්කරුවන් අතර ප්‍රමුඛත්වය 486
379. දේපළ භාර ගැනුම්කරුට තොරතුරු සැපයීමේ අවශ්‍යතාවය 487
380. දේපළ විකිණීම සඳහා ප්‍රදානකරුගේ කැමැත්ත 488
381. ඈවර කිරීමක දී දේපළ භාරගැනුම්කරුට ඇති බලතල 489


## 4 වන පරිච්ඡේදය
## දේපළ භාර ගැනුම්කරුගේ කාර්ය


382. දේපළ භාර ගැනුම්කරුවන්ගේ පොදු කාර්යය 490
383. දේපළ විකිණීමේදී දේපළ භාර ගැනුම්කරුට ඇති කාර්ය භාර්ය 491
384. විත්තිවාචකයක් හෝ හානිපූරණයක් නොමැති බව 492
385. ස්ථිර ඇප දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබූ විට ප්‍රමුඛතා අනුපිළිවෙළ 492
386. චල ඍණ භාර දේපළ භාර ලැබුම්කරුවකු පත් කරනු ලැබූ අවස්ථාවක දී ප්‍රමුඛතා අනුපිළිවෙළ 494
387. මුදල් සම්බන්ධයෙන් දේපළ භාර ගැනුම්කරුගේ කාර්ය 495
388. ගිණුම් වාර්තා සම්බන්ධයෙන් දේපළ භාරගැනුම්කරුගේ කාර්යය 496


## 5 වන පරිච්ඡේදය
## දේපළ භාර ගැනුම්කරුගේ පාරිශ්‍රමිකය


389. දේපළ භාර ගැනුම්කරුගේ පාරිශ්‍රමික 496

## 6 වන පරිච්ඡේදය

## දේපළ භාර ගැනුම්කරු විසින් වාර්තා පිළියෙළ කිරීම


390. දේපළ භාර ගැනුම්කරුගේ පළමු වාර්තාව 497
391. දේපළ භාර ගැනුම්කරු විසින් තවදුරටත් වාර්තා ඉදිරිපත් කිරීම 499
392. වාර්තා සකස් කිරීම සඳහා කාලය දීර්ඝ කිරීම 500
393. වාර්තා පරීක්ෂා කිරීමට සහ ලබා ගැනීමට හිමිකම් ඇති තැනැත්තන් 500
394. සිදු කළ වරදක් වාර්තා කිරීමට දේපළ භාරගැනුම්කරුට ඇති කාර්යභාරය 502


## 7 වන පරිච්ඡේදය

## දේපළ භාර ගැනුම්කරුගේ වගකීම්


395. දේපළ භාර ගැනුම්කරු හානි පූරණය කිරීම 503
396. කලින් පැවති සේවානියුක්ති පිළිබඳ ගිවිසුම් යටතේ දේපළ භාර ගැනුම්කරුගේ වගකීම 504
397. වෙනත් ගිවිසුම් සහ කුලිය පිළිබඳව දේපළ භාර ගැනුම්කරුට ඇති වගකීම 505
398. දෝෂයක් ඇති අවස්ථාවක වගකීමෙන් නිදහස් වීම 507


## 8 වන පරිච්ඡේදය

## දේපළ භාර ගැනුම්කාරත්වය පිළිබඳ ධූරය පුරප්පාඩුවීම සහ දේපළ භාර ගැනුම්කාරත්වය අවසන්වීම


399. දේපළ භාර ගැනුම්කරුගේ ධූරය පුරප්පාඩු වීම 508
400. දේපළ භාර ගැනුම්කාරත්වය අවසන් වීම 510
401. දේපළ භාර ගැනුම්කාරිත්වය අවසන් වූ බවට දැනුම් දීමේ දේපළ භාර ගැනුම්කරුගේ කාර්යයභාරය 511


## 9 වන පරිච්ඡේදය

## දේපළ භාර ගැනුම්කාරිත්වය පවතින අතරතුර අධිකරණයේ බලතල


402. දේපළ භාර ගැනුම්කරුවකු විසින් විධාන සඳහා ඉල්ලීම් කිරීම 512
403. දේපළ භාරගැනුම්කරුගේ පාරිශ්‍රමිකය හෝ පත්වීම පිළිබඳ නියෝගය 513
404. දේපළ භාර ගැනුම්කාරිත්වය අධිකරණය විසින් වැළැක්වීම හෝ සීමා කිරීම කළ හැකි බව 514
405. දේපළ භාර ගැනුම්කරුගේ කාර්ය ඉටු කිරීම සඳහා වූ ආඥාව 515
406. අධිකරණය විසින් දේපළ භාර ගැනුම්කරු ධූරයෙන් ඉවත් කිරීමට 517
407. දේපළ භාර ගැනුම්කාරිත්වය යටතේ දේපළ ආරක්ෂා කිරීම සඳහා වූ ආඥා 517

## XIV වන කොටස
### හරස්-දේශසීමා වස්තුභංගත්වය


408. විදේශීය සමාගම් 518


## XV වන කොටස
### වස්තුභංගත්වය
### 1 වන පරිච්ඡේදය
### ණය ගෙවා ගැනීමට නොහැකි වීම සහ වැරදි සහගත වෙළඳාම


409. ණය ගෙවා ගැනීමට නොහැකි වීම 519

410. අධිකරණය විසින් ඉල්ලීම ඉවතලිය හැකි බව 520

411. වැරදි සහගත වෙළඳාම 521


### 2 වන පරිච්ඡේදය
### අවලංගු කළ හැකි ගනුදෙනු


412. අවලංගු කළ හැකි ප්‍රමුඛතාව 524

413. අවලංගු කළ හැකි පිළිබැඳීමක් 526

414. ණය හිමියකුට බාධා කිරීම, ප්‍රමාද කිරීම හෝ දුබල කිරීමේ චේතනාවෙන් දේපළ අන්සතු කිරීම 528

415. අරමුණක්සහිතව අවලංගු කළ හැකි ප්‍රමුඛතාවක්, අවලංගු කළ හැකි පිළිබැඳීමක් හෝ අන්සතු කිරීමක්, ඉවත දැමීම සඳහා කාර්ය පටිපාටිය 529

416. අවලංගු කළ හැකි ප්‍රමුඛත්වයක්, අවලංගු කළ හැකි පිළිබැඳීමක් හෝ චේතනාන්විත අන්සතු කිරීමක්, අවලංගු කිරීම සඳහා වන කාර්යය පටිපාටි 530

417. අවලංගු කළ හැකි ප්‍රමුඛත්වයක්, අවලංගු කළ හැකි පිළිබැඳීමක් හෝ චේතනාවක් සහිත අන්සතු කිරීමක්, අස් කිරීම සඳහා වූ අධිකරණ නියෝග 532

418. අඩු අගයක ගනුදෙනුව 533

419. අනීතිකරණය 534

420. නිර්වචන 536


### 3 වන පරිච්ඡේදය
### ෆීනික්ස් සමාගම්


421. ෆීනික්ස් සමාගම 537

422. පුද්ගලික වගකීම 538

423. අනුප්‍රාප්තික සමාගම් නිවේදනයේ නම් කර ඇති තැනැත්තකු සඳහා ව්‍යාතිරේකය 540

424. තාවකාලික කාල සීමාව සඳහා නිදහස් කිරීම 541

425. අක්‍රීය නොවන සමාගමක් සම්බන්ධයෙන් ව්‍යාතිරේකය 542

## 4 වන පරිච්ඡේදය
**ණය , හිලව් කිරීම, බෙදා හැරීම් සහ ලේඛන යැවීම පිළිබඳ සාක්ෂි**

*අ - ණය පිළිබඳ සාක්ෂි සහ ණය ඔප්පු කිරීම*


426. ණය පිළිබඳ සාක්ෂි සහ ණය ඔප්පු කිරීම 542


*ආ - හිලව් කිරීම*


427. බංකොලොත් ණයකරුවකු සහ වෙනත් පාර්ශ්වයක් අතර හිලව් කිරීම 546
428. සමාගමක් සහ වෙනත් පාර්ශ්වයක් අතර හිලව් කිරීම 548


*ඇ - බෙදා හැරීම්*


429. බෙදා හැරීම් 550


*ඈ - ණයහිමියන්ට සහ ඉවත් වූ ණයහිමියන්ට ලේඛන යැවීම*


430. ණය හිමියන්ට හා ඉවත් වූ ණය හිමියන්ට ලේඛන යැවීම 552


# XVI වන කොටස
**සාමාන්‍ය සහ විවිධ විධිවිධාන**

## 1 වන පරිච්ඡේදය
**සාමාන්‍ය**


431. වස්තුභංගත්ව ධාරක ගිණුම සහ වස්තුභංගත්ව අතිරික්ත ගිණුම 554
432. හිමිකම් නොපාන ලද සහ අතිරික්ත මුදල් අදාළ කර ගැනීම 554
433. ණයහිමි යෝජනා සම්මතයන් 556
434. සහදායකයන්ගේ යෝජනා සම්මතයන් 556
435. දේපළ පරිග්‍රහණය කිරීම හෝ බැහැර කිරීම පිළිබඳ ආරක්ෂාව 556
436. ක්‍රියාවල වලංගුභාවය 557
437. කාලසීමාව දීර්ඝ කිරීම 557
438. නිශ්චිත ධුර දරන්නෙකු විසින් නියම කරනු ලබන ලේඛන 557
439. ඉල්ලීම් සහ දැනුම් දීම 559


## 2 වන පරිච්ඡේදය
වැරදි


440. අද්මිනිස්ත්‍රාසි කිරීමට හෝ ඈවර කිරීමට පෙර අධ්‍යක්ෂවරයකුගේ හෝ වෙනත් නිලධරයකුගේ වැරදි ක්‍රියා 560
441. වංචනික ලෙස වෙළඳාම් කිරීම 562
442. අද්මිනිස්ත්‍රාසිකරණය හෝ ඈවර කිරීම හා සම්බන්ධිත වැරදි 563
443. තහනම් කරන ලද ක්‍රියාකලාපය 565
444. නියමිත පරිදි ගිණුම් නොතබා ඇති අවස්ථාවක වගකීම 566

445. අසත්‍ය හෝ නොමඟ යවන ප්‍රකාශ 567
446. අද්මිනිස්ත්‍රාසිකරුවන්ට සහ ඇවරකරුවන්ට සේවක අර්ථ සාධක අරමුදල් පනත, සේවක භාරකාර අරමුදල් පනත සහ පාරිතෝෂික දීමනා ගෙවීමේ පනත අදාළ වීම 567

## 3 වන පරිච්ඡේදය
## අධිකරණ බලය සහ කාර්ය පටිපාටිය

447. අධිකරණ බලය 568
448. වැරදි පිළිබඳව විභාග කිරීම සහ දඬ නියම කිරීම 568
449. කාර්ය පටිපාටිය 569
450. අතුරු සහන 569
451. පිරිවැය 571
452. අධිකරණ නියෝග බලාත්මක කිරීම 571
453. වැරදි සම්බන්ධයෙන් පොදු විධිවිධාන 572

## 4 වන පරිච්ඡේදය
## නීති පැනවීමට පවරන ලද බලතල

454. නියම 573
455. නියෝග 573
456. රීති, ප්‍රමිති, පරිවයන්, විධාන, අචාර ධර්ම පද්ධති සහ මාර්ගෝපදේශ 575

## XVII වන කොටස
## අවසානය
## 1 වන පරිච්ඡේදය
## අදාළ කර ගැනීම

457. අදාළ කර ගැනීම 575

## සංශෝධන

458. සමාගම් පනතේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම 576
459. සමාගම් පනතේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම 576
460. සමාගම් පනතේ 88 වන වගන්තිය සංශෝධනය කිරීම 576
461. සමාගම් පනතේ 92 වන වගන්තිය සංශෝධනය කිරීම 576
462. සමාගම් පනතේ 97 වන වගන්තිය සංශෝධනය කිරීම 576
463. සමාගම් පනතේ 213 වන වගන්තිය සංශෝධනය කිරීම 577
464. සමාගම් පනතේ 214 වන වගන්තිය සංශෝධනය කිරීම 578
465. සමාගම් පනතේ 220 වන වගන්තිය සංශෝධනය කිරීම 581
466. සමාගම් පනතේ 228 වන වගන්තිය සංශෝධනය කිරීම 581
467. සමාගම් පනතේ 246 වන වගන්තිය සංශෝධනය කිරීම 581
468. සමාගම් පනතේ 255 වන වගන්තිය සංශෝධනය කිරීම 582

469. සමාගම් පනතේ 394 වන වගන්තිය සංශෝධනය කිරීම 584
470. සමාගම් පනතේ 431 වන වගන්තිය සංශෝධනය කිරීම 586
471. සමාගම් පනතේ 433 වන වගන්තිය සංශෝධනය කිරීම 586
472. සමාගම් පනතේ 529 වන වගන්තිය සංශෝධනය කිරීම 587
473. සමාගම් පනතේ පළමු උපලේඛනය සංශෝධනය කිරීම 587
474. සමාගම් පනතේ හයවන උපලේඛනය සංශෝධනය කිරීම 588
475. 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම 588
476. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 175 වන වගන්තිය සංශෝධනය කිරීම 588

## 2 වන පරිච්ඡේදය
## ඉවත් කිරීම

477. ඉවත් කිරීම් 589

## 3 වන පරිච්ඡේදය
## අන්තර්කාලීන විධිවිධාන සහ ව්‍යාවර්තන

478. අන්තර්කාලීන විධිවිධාන සහ ව්‍යාවර්තන 589
479. අන්තර්කාලීන විධිවිධාන: වස්තුභංගත්ව වෘත්තිකයන් 591

පළමුවන උපලේඛනය
**අධිකාරියේ පත් කළ සාමාජිකයන් පිළිබඳ විධිවිධාන** 592

දෙවන උපලේඛනය
**බැහැර කළ අස්ථීත්වයන්** 600

තුන්වන උපලේඛනය
**සම්බන්ධිත පාර්ශ්වයන්** 601

හතරවන උපලේඛනය
ඇවර කිරීමක දී වරණීය හිමිකම්පෑම් 604

පස්වන උපලේඛනය
**ණය හිමියන්ගේ සහ සහදායකයින්ගේ රැස්වීම් සඳහා වූ කාර්ය පටිපාටිය** 609

හයවන උපලේඛනය
[127 වන වගන්තිය]
**වස්තුභංගත්වයට පත්ව**
**මියයන තැනැත්තකුගේ**
**බංකොලොත් බූදලය**
**කළමනාකරණය කිරීම** 615

හත්වන උපලේඛනය
**අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල** 619

අටවන උපලේඛනය
**සුරක්ෂිත ණය හිමියන්ගේ විකල්ප** 623

නවවන උපලේඛනය
**ඇවරකරුගේ බලතල** 625

දසවන උපලේඛනය
**දේපළ භාර ගැනුම්කරුවන්ගේ බලතල** 630

480. අනනුකූලතාවත් ඇති වූ විට සිංහල භාෂා පාඨය
බලපැවැත්විය යුතු බව 634

# බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික)

එල්.ඩී.-ඕ. 49/2024

**තැනැත්තන් සහ සමාගම් බේරා ගැනීමට, පුනරුත්ථාපනය කිරීමට සහ තැනැත්තන්ගේ සහ සමාගම්වල වස්තුභංගත්වයට අදාළ නීතිය සංශෝධනය කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහා ද; (97 වන අධිකාරය වූ) වස්තුභංගත්ව ආඥාපනත ඉවත් කිරීම සඳහා ද; 2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා ද; 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා ද; 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව

ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දී ඇති තැනැත්තන් සහ ශක්‍ය ව්‍යවසාය කලට වේලාවට, කාර්යක්ෂමව සහ අපක්ෂපාතී ලෙස බේරා ගැනීම සහ පුනරුත්ථාපනය කිරීම සඳහා ද, ශක්‍ය නොවන ව්‍යවසාය වසා දැමීම සඳහා ද නීති සංග්‍රහයක් පැනවීම අවශ්‍ය බවට ශ්‍රී ලංකා රජය සලකනු ලබන හෙයින් ද:

වස්තුභංගත්වය පිළිබඳ පුරෝකථනය කිරීමේ හැකියාව වැඩි කළ යුතු වීම අවශ්‍යව ඇති හෙයින් ද, සමස්තයක් ලෙස ණය හිමියන්ගේ අයිතිවාසිකම්වලට සහ මහජන අයිතිවාසිකම්වලට ප්‍රතිලාභ සලසන්නා වූ ප්‍රතිඵල ඇති කිරීමෙහි ලා සහයෝගය දැක්වීම සහ ණය ගනුදෙනුවල දී සිදු වන අක්‍රමිකතාවලට එරෙහිව ආරක්ෂිත පියවර ගැනීමට ණය හිමියන් දිරිමත් කිරීම තුළින් වස්තුභංගත්වය හේතු කොටගෙන සිදු වන අනවශ්‍ය පාඩු වැළැක්විය යුතු වීම අවශ්‍යව ඇති හෙයින් ද:

වස්තුභංගත්ව වෘත්තිකයන් නියාමනය, අධීක්ෂණය සහ ඔවුන්ගේ විනය යන කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම අත්‍යාවශ්‍ය වී ඇති හෙයින් ද; එසේම ණය හිමියන් විසින් කාර්යක්ෂමව ණය නැවත අයකර ගැනීම වැඩි කිරීම උදෙසා ණයගැතියන්ගේ දේපළවල අගය ද ණය හිමියන් විසින් ණය අයකර ගැනීම ද උපරිම කිරීම අභිලාෂය වී ඇති හෙයින් ද:

පුද්ගලික වස්තුභංගත්වය සම්බන්ධයෙන් වන විට, පීඩාකාරී ණය බරින් අවංක ණයකරුට සහනය සැලසීමෙන් සහ එවැනි ණයකරුට යළි ගොඩනැගීමට අවකාශ සැලසීමෙන් ආර්ථික ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම ද, වස්තුභංගත්වය නිසා ඇති වන සමාජ පිරිවැය අඩු කිරීම ද එසේම, ව්‍යවසායකත්වය දිරිගැන්වීම සහ ශක්‍ය ව්‍යාපාර පුනරුත්ථාපනය කිරීම සහ බේරා ගැනීමට සහාය දැක්වීම හා ඒක පුද්ගල ව්‍යාපාර හවුල්ව්‍යාපාර සහ සංස්ථාගත නොකරන ලද අනෙකුත් ව්‍යාපාර ද ඇතුළුව ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යවසායවල පැවැත්මට ඉඩ සැලසීමටද අවශ්‍යව ඇති හෙයින් ද:

PL 15039-465 (2025/01)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1**. (1) මේ පනත 2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

(2) මේ වගන්තියේ විධිවිධාන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 වන ව්‍යවස්ථාව ප්‍රකාරව, කථානායකවරයා විසින් සහතිකය සටහන් කළ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) (4) වන උපවගන්තියට යටත්ව, මේ පනතේ වෙනත් සියලු විධිවිධාන (2) වන උපවගන්තිය යටතේ කථානායකවරයා විසින් සහතිකය සටහන් කළ දින සිට මාස හයක කාලයක් අවසන් වීමෙන් පසු ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින්, (3) වන උපවගන්තිය යටතේ මේ පනත ක්‍රියාත්මක විය යුතු වන දිනයට පෙරාතුව වන එක් මාසයක් ඇතුළත *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින්, (3) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දැක්වෙන කාලය තවදුරටත් දීර්ඝ කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එසේ දීර්ඝ කිරීමේ මුළු කාලය කථානායකවරයා විසින් සහතිකය සටහන් කළ දින සිට අවුරුදු දෙකකට වඩා දීර්ඝ නොවිය යුතු ය.

**2**. (1) මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස – අර්ථ නිරූපණය

"අද්මිනිස්ත්‍රාසි කිරීම" යන්නෙන්, IX වන කොටස යටතේ වන අද්මිනිස්ත්‍රාසි කිරීම අදහස් වන අතර, "අද්මිනිස්ත්‍රාසිකරු"යන්නට, ඊට අනුරූප අර්ථය ම තිබිය යුතු ය;

"අද්මිනිස්ත්‍රාසිකරණයේදී ණයහිමියන්ගේ කමිටුව" යන්නෙන්, 217 වන වගන්තිය යටතේ පිහිටුවන ලද කමිටුවක් අදහස් වේ;

"පත් කළ තැනැත්තා" යන්නෙන්, මේ පනත යටතේ නොව අන්‍යාකාරයකින් පත් කරනු ලැබූ යම් දේපළක දේපළ

භාර ගැනුම්කරුවකු හෝ කළමනාකරුවකු නැතහොත් දේපළ භාර ගැනුම්කරුවකු, එකී දේපළ විකිණීමට එකී තැනැත්තාට බලය පැවරී තිබුණ ද නොතිබුණ ද, අදහස් වේ;

"වත්කම් නොමැති සමාගමක්" යන්නෙන්, ඈවර කරමින් තිබෙන්නා වූ-

(අ) ඈවර කිරීමේ දී උද්ගත විය හැකි පිරිවැය, ගාස්තු සහ වියදම් සපුරාලීමට ප්‍රමාණවත් වත්කම් නොමැත්තා වූ ද, ඈවරකරුගේ පාරිශ්‍රමිකය ගෙවීමට මුදල් නොමැති වූ ද; සහ

(ආ) ණයහිමියන්ට ලාභාංශ ගෙවීමට ප්‍රමාණවත් මුදල් නොමැති වූ ද,

සමාගමක් අදහස් වේ;

"අධිකාරිය" යන්නෙන්, වස්තුභංගත්ව නියාමන අධිකාරිය අදහස් වේ;

"බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් අදහස් වේ;

"බැංකු ගිණුම" යන්නෙන්, යම් බැංකුවක පවත්වාගෙන යනු ලබන ගිණුමක් අදහස් වේ;

"බංකොලොත් ණයකරු" යන්නෙන්, බංකොලොත්භාවයට අදාළ වූ කාර්යපටිපාටිය සම්බන්ධයෙන් යෙදෙන විට, බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් යම් ණයකරුවකු සම්බන්ධයෙන් කර ඇත්තේ ද, එම ණයකරු අදහස් වේ;

"බංකොලොත්භාවය පිළිබඳ භාරකරු" යන්නෙන්, 98 වන වගන්තිය යටතේ බංකොලොත්භාවය පිළිබඳ භාරකරු ලෙස පත් කරනු ලබන තැනැත්තකු අදහස් වේ ;

"ආරම්භ වීම" යන්නට -

(අ) සමාගමක් අද්මිනිස්ත්‍රාසි කිරීම සම්බන්ධයෙන් වන විට, 179 වන වගන්තිය යටතේ ඊට ලබා දී ඇති අර්ථය ම ;

(ආ) සමාගමක ඔප්පු අද්මිනිස්ත්‍රාසි කිරීම සම්බන්ධයෙන් වන විට, 228 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඊට ලබා දී ඇති අර්ථය ම;

(ඇ) බංකොලොත්භාවය සම්බන්ධයෙන් වන විට, 92 වන වගන්තිය යටතේ ඊට ලබා දී ඇති අර්ථය ම;

(ඈ) සමාගමක් ඇවර කිරීම සම්බන්ධයෙන් වන විට, 297 වන වගන්තිය යටතේ ඊට ලබා දී ඇති අර්ථය ම;

(ඉ) සමාගමක් තාවකාලික ඇවර කිරීම සම්බන්ධයෙන් වන විට, 304 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ඊට ලබා දී ඇති අර්ථය ම,

(ඊ) සමාගමක දේපළ භාරකාරත්වය සම්බන්ධයෙන් වන විට, 369 වන වගන්තියේ ඊට ලබා දී ඇති අර්ථය ම,

තිබිය යුතු ය;

“සමාගම් පනත” යන්නෙන්, 2007 අංක 07 දරන සමාගම් පනත අදහස් වේ;

“සමාගම” යන්නෙන්, සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් හෝ පවත්නා සමාගමක් අදහස් වන අතර, ඊට -

(අ) සමාගම් පනතේ XI වන කොටසේ කාර්ය සඳහා වූ අක් වෙරළ සමාගමක් ඇතුළත් වේ;

එසේ වුවද, නොහෙත්,

එහෙත්,

(ආ) දෙවන උපලේඛනයේ සඳහන් ආස්ථිතා වර්ග ඊට ඇතුළත් නොවේ;

"සම්බන්ධිත පාර්ශ්වයන්" යන්නෙන්, තුන්වන උපලේඛනයේ සඳහන් ආකාරයට වෙනත් තැනැත්තකුට සම්බන්ධ වූ තැනැත්තකු අදහස් වේ;

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අදහස් වේ;

"සහදායකයා" යන්නෙන්, සමාගමක් සම්බන්ධයෙන් වන විට-

(අ) (i) සමාගමේ සෑම කොටස් හිමියකු ම සහ නීතිය ක්‍රියාත්මක වීම මගින් කොටසක් පැවරෙනු ලබන සෑම තැනැත්තකු සහ;

(ii) ඈවර කිරීමක් සිදු වන අවස්ථාවක දී, සමාගමේ වත්කම්වලට දායකවීමට යටත් වන සෑම තැනැත්තකුම අදහස් වේ; සහ

(ආ) යම් තැනැත්තකු සහදායකයකු ද යන්න තීරණය කිරීම සඳහා වූ සියලු නීති කෘත්‍යවල කාර්ය සඳහා සහ එසේ අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර පවත්වනු ලබන සියලු නීති කෘත්‍යවල කාර්ය සඳහා, (අ) ඡේදයේ අර්ථානුකූලව සහදායකයකු ලෙස කියාපානු ලබන යම් තැනැත්තකු අදහස් වේ;

"පාලනය" යන්නෙන්, සෘජුව හෝ වක්‍රව යම් තැනැත්තකුගේ ප්‍රාග්ධනයෙන් සියයට පනහකට වැඩි කොටසක හිමිකාරිත්වය දැරීම, පනතක් මගින් හෝ ගිවිසුමක් මගින් යම් තැනැත්තකුගේ කළමනාකරණය, ප්‍රතිපත්ති හෝ කටයුතුවලට විධානය කිරීමට හෝ විධානය කිරීමට කටයුතු සැලැස්වීමේ බලය, අයිතිවාසිකම හෝ හැකියාව අදහස් වේ ;

"ණයහිමියා" යන්නට, සමාගමක් හෝ යම් පුද්ගලයකු විසින් වර්තමානයේ හෝ අනාගත නිශ්චිතව හෝ අවිනිශ්චිත වන සහ හානිය නිශ්චය කරගෙන ඇති හෝ පරීක්ෂා කර ඇති යම් ණයක් ගෙවිය යුත්තේ යම් තැනැත්තකුට ද නැතහොත් එවැනි බැරකමකට යටත්ව ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එවැනි තැනැත්තකු ඇතුළත් වේ;

"ණයකරු" යන්නෙන්, පුද්ගලික වස්තුභංගත්ව කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් වන විට -

(අ) පුද්ගලික වස්තුභංගත්ව ආඥාවක් කිරීමට පෙර, ඉල්ලීමක්, පෙත්සමක් හෝ යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ හෝ එසේ කිරීමට සැලසුම් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එවැන්නකු අදහස් වේ; සහ

(ආ) පුද්ගලික වස්තුභංගත්ව ආඥාවක් කිරීමෙන් පසුව ආඥාවක් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා අදහස් වේ;

"ඔප්පු අද්මිනිස්ත්‍රාසි කිරීම" යන්නෙන්, IX වන කොටස යටතේ ඔප්පු අද්මිනිස්ත්‍රාසි කිරීම අදහස් වන අතර, "ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු" යන්නට, ඊට අනුරූප අර්ථය ම තිබිය යුතු ය;

"අධ්‍යක්ෂවරයා" යන්නට, සමාගමක් සම්බන්ධයෙන් වන විට -

(අ) කවර හෝ නමකින් හඳුන්වනු ලබන සමාගමේ අධ්‍යක්ෂ ධුරය හොබවන තැනැත්තකු ඇතුළත් වේ; සහ

(ආ) "මැදිහත් වන පාර්ශ්වය" යන අර්ථ නිරූපණයේ කාර්ය සඳහා සහ 9 වන, 182 වන, 313 වන, 371 වන, 440 වන සහ 442 වන වගන්තිවල කාර්ය සඳහා -

(i) (අ) ඡේදයේ සඳහන් තැනැත්තකු ක්‍රියා කිරීමට නියමිතව ඇත්තේ හෝ පුරුදු වී සිටිනුයේ යම් තැනැත්තකුගේ විධානවලට හෝ උපදෙස්වලට අනුව ද එවැනි තැනැත්තකු;

(ii) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කිරීමට නියමිතව ඇත්තේ හෝ පුරුදු වී සිටිනුයේ යම් තැනැත්තකුගේ විධානවලට හෝ උපදෙස්වලට අනුව ද එවැනි තැනැත්තකු; හෝ

(iii) සමාගමේ ව්‍යවස්ථාවලිය හැර, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත බලතල ක්‍රියාත්මක කරන හෝ ක්‍රියාත්මක කිරීමට හිමිකම් ඇති හෝ එම බලතල ක්‍රියාත්මක කිරීම පාලනය කරන හෝ ක්‍රියාත්මක කිරීම පාලනය කිරීමට හිමිකම් ඇති තැනැත්තකු,

ඇතුළත් වන මුත්, යම් තැනැත්තකු ක්‍රියා කරන්නේ තම වෘත්තීය මට්ටමෙන් පමණක් නම් ඒ අදාළ ප්‍රමාණයට අනුව මිස එකී තැනැත්තා සම්බන්ධයෙන් මේ ඡේදයේ විධිවිධාන, අදාළ නොවිය යුතු ය;

“පිළිබැඳීම” යන්නෙන්, කවර හෝ වර්ගයක ඇපයක් අදහස් වේ;

“බලාත්මක කිරීම” යන්නට, සමාගමක දේපළ හෝ තැනැත්තකුගේ දේපළ කෙරෙහි වන පිළිබැඳීමක් සම්බන්ධයෙන් වන විට -

(අ) චල සෘණභාරයක් ස්ථිර සෘණභාරයක් බවට පරිවර්තනය කිරීම පිළිබඳ දැන්වීම කිරීම;

(ආ) පිළිබැඳුම බලාත්මක කිරීම ලෙසින් සමාගමේ හෝ යම් තැනැත්තා දේපළ සන්තකයට හෝ භාරයට ගැනීම හෝ එම දේපළ වල පාලනය භාර ගැනීම;

(ඇ) පිළිබැඳුම ක්‍රියාත්මක කිරීම ලෙසින් 372 වන වගන්තිය යටතේ, සාධන පත්‍රයක් යටතේ සමාගමේ හෝ තැනැත්තාගේ දේපළ සඳහා භාරගැනුම්කරුවකු පත් කිරීම;

(ඈ) පිළිබැඳුම බලාත්මක කිරීම ලෙසින් සමාගමේ හෝ තැනැත්තා දේපළ සඳහා දේපළ භාරගැනුම්කරුවකු පත් කිරීම සඳහා 373 වන වගන්තිය යටතේ අධිකරණයට ඉල්ලුම් කිරීම;

(ඉ) පිළිබැඳුම බලාත්මක කිරීම ලෙසින් පත්වීම්ලාභියකු පත් කිරීම හෝ පත්වීම්ලාභියකු පත් කිරීම සඳහා අධිකරණයට ඉල්ලුම් කිරීම;

(ඊ) පිළිබැඳුම බලාත්මක කිරීම ලෙසින් සමාගමේ හෝ තැනැත්තා දේපළ සන්තකයට ගැනීම හෝ භාරයට ගැනීම හෝ දේපළෙහි පාලනය භාර ගැනීම පිණිස -

(i) පිළිබැඳුමෙහි ප්‍රදානලාභියා හෝ නියෝජිතයා ලෙස;

(ii) සමාගමේ හෝ තැනැත්තාගේ නියෝජිතයා ලෙස තැනැත්තකු,

පත් කිරීම;

(උ) සාධන පත්‍රයක් යටතේ, ප්‍රඥප්තියක් යටතේ හෝ අන්‍යාකාරයකින් පැන නගින්නා වූ පිළිබැඳීම හේතුකොටගෙන පවතින අයිතියක් හෝ ප්‍රතිකර්මයක්, පිළිබැඳුමේ ප්‍රදානය ලැබූ තැනැත්තා වශයෙන් හෝ දේපළ භාරගැනුම්කරු වශයෙන් හෝ පත් කළ තැනැත්තා වශයෙන් ක්‍රියාත්මක කිරීම;

(ඌ) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ණයක් අය කර ගැනීමේ අදහසින් පියවරක් ගැනීම;

ද ඇතුළත් වේ ;

“අත්‍යාවශ්‍ය භාණ්ඩයක් හෝ සේවාවක්” යන්නෙන්-

(අ) විදුලිබලය;
(ආ) අදාළ තොරතුරු තාක්ෂණය;
(ඇ) විදුලිසංදේශ සේවා; සහ
(ඈ) ජලය,

අදහස් වේ;

“පිස්කල්” යන්නට, රිට් බලපත්‍රයක් හෝ වෙනත් නෛතික ක්‍රියාවලියක් ක්‍රියාවේ යෙදවීම භාරව සිටින යම් නිලධරයකු ද ඇතුළත් වේ;

“චල සෘණභාරය” යන්නෙන්, සමාගම් පනතේ 427 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අර්ථානුකූලව එය ඇති කරනු ලැබූ අවස්ථාවේ දී චල සෘණ භාරයක් වන භාරයක් අදහස් වේ;

“භාණ්ඩ” යන්නෙන්, සෑම වර්ගයක ම ස්පෘශ්‍ය චංචල දේපළ අදහස් වේ;

“ප්‍රදානලාභියා” යන්නෙන්, පිළිබැඳීමක් ඇති කළ සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, එම සාධන පත්‍රයේ ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ඇති තැනැත්තා අදහස් වේ;

“කුලී සින්නක්කර ගිවිසුම” යන්නට, කොන්දේසි යටතේ විකුණුම් ගිවිසුමක්, චංචල දේපළ පිළිබඳ වැඩපිළිවෙළවල්, හෝ හිමිකම් රඳවා ගැනීමේ ගිවිසුමක් ඇතුළත් වේ;

“වස්තුභංගත්ව දාරක ගිණුම” යන්නෙන්, 431 වන වගන්තියේ සඳහන් ගිණුම අදහස් වේ;

“වස්තුභංගත්ව වෘත්තිකයා” යන්නෙන්, I වන කොටසේ 3 වන පරිච්ඡේදය යටතේ වස්තුභංගත්ව වෘත්තිකයකු ලෙස අධිකාරිය මගින් ලියාපදිංචි කර ඇති තැනැත්තකු අදහස් වේ;

“වස්තුභංගත්ව අතිරික්ත ගිණුම” යන්නෙන්, 431 වන වගන්තියේ සඳහන් ගිණුම අදහස් වේ;

"වස්තුභංගත්වයට පත්" යන්නෙන්, තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, 409 වන වගන්තියේ (1) වන උපවගන්තියේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු අතර, සමාගමක් සම්බන්ධයෙන් වන විට, 409 වන වගන්තියේ (2) වන උපවගන්තියේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මැදිහත් වන පාර්ශ්වකරු" යන්නෙන්, සමාගමක් සම්බන්ධයෙන් වන විට -

(අ) සමාගම පිහිටුවීමේ, ප්‍රවර්ධනය කිරීමේ හෝ කළමනාකරණය කිරීමේ දී සහභාගි වී ඇති තැනැත්තකු අදහස් වේ;

(ආ) සමාගමේ අතීත හෝ වර්තමාන කොටස් හිමියකු අදහස් වේ;

(ඇ) සමාගමේ අතීත හෝ වර්තමාන අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු අදහස් වේ;

(ඈ) සමාගමේ දේපළ සම්බන්ධයෙන් වන විට අතීත හෝ වර්තමාන අද්මිනිස්ත්‍රාසිකරුවකු, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු, ඇවරකරුවකු, විශේෂ කළමනාකරුවකු, දේපළ භාර ගැනුම්කරුවකු හෝ පත්වීම්ලාභියකු අදහස් වේ; හෝ

(ඉ) සමාගමේ දේපළ සම්බන්ධයෙන් වන විට අද්මිනිස්ත්‍රාසිකරුවකු, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු, ඇවරකරුවකු, විශේෂ කළමනාකරුවකු, දේපළ භාරගැනුම්කරුවකු හෝ පත්වීම්ලාභියකු ලෙස පෙනී සිටින හෝ පෙනී සිටීමට අදහස් කරන තැනැත්තකු,

අදහස් වේ;

"ප්‍රධාන ධුර දරන්නා" යන්නෙන්, බංකොලොත්භාවය පිළිබඳ භාරකරුවකු, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු, පුද්ගලික වස්තුභංගත්ව යෝජනාකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු, ඇවරකරුවකු, තාවකාලික ඇවරකරුවකු හෝ දේපළ භාරගැනුම්කරුවකු අදහස් වේ;

"නීති කෘත්‍යයන්" යන්නෙන්, II සිට VIII දක්වා වූ කොටස් වල කාර්යය සඳහා වන විට, අදාළ අවස්ථාවල දී සමථකරණය සහ බේරුම්කරණය ඇතුළත් වේ;

"ඇවර කිරීම" යන්නෙන්, XII වන කොටස යටතේ ඇවර කිරීම අදහස් වන අතර, "ඇවරකරු" යන්නට ඊට අනුරූප අර්ථයම තිබිය යුතු ය;

"ඇවර කිරීමේ සහදායක කමිටුව" යන්නෙන්, 309 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන කමිටුවක් අදහස් වේ;

"ඇවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුව" යන්නෙන්, 308 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන කමිටුවක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ පරිපාලනය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"ධුර දරන්නා" යන්නෙන්, බංකොලොත්භාවය පිළිබඳ භාරකරුවකු, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු, පුද්ගලික වස්තුභංගත්ව යෝජනාකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු, ඇවරකරුවකු, තාවකාලික ඇවරකරුවකු හෝ දේපළ භාරගැනුම්කරුවකු අදහස් වේ;

"නිලධරයා" යන්නෙන්, සංස්ථාපිත ආයතනයක් සම්බන්ධයෙන් වන විට, අධ්‍යක්ෂවරයා, ලේකම්වරයා සහ විධායකවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකරන කණ්ඩායමේ සාමාජිකයකු අදහස් වේ;

"පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු" යන්නෙන්, IX වන කොටසේ 3 වන පරිච්ඡේදයේ සඳහන් ධුරය අදහස් වේ;

"පුද්ගලික වස්තුභංගත්ව නිලධාරි" යන්නෙන්, වස්තුභංගත්ව භාරකරුවකු, බලයලත් අතරමැදියකු, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු හෝ නිල දේපළ භාර ගැනුම්කරුවකු අදහස් වේ;

"පුද්ගල වස්තුභංගත්ව ආඥාව" යන්නට-

(අ) ණය ආරක්ෂා කිරීම සඳහා කල් දැමීමේ ආඥාවක් ; සහ

(ආ) තනි පුද්ගල ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ බලාත්මක වීම තහවුරු කරනු ලබන ආඥාවක් අදහස් වේ;

(ඇ) ණය පුනරුත්ථාපන කිරීමේ ආඥාවක්; සහ

(ඈ) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක්,

ද ඇතුළත් වේ;

"පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටිය" යන්නට-

(අ) III වන කොටස යටතේ පුද්ගලික ණය ආරක්ෂා කිරීම සඳහා කල් දැමීම පිළිබඳ කාර්යපටිපාටිය;

(ආ) IV වන කොටස යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ පිළිබඳ කාර්යපටිපාටිය;

(ඇ) V වන කොටස යටතේ ණය පුනරුත්ථාපනය නියෝගය යටතේ වූ කාර්යපටිපාටිය; සහ

(ඈ) VI වන කොටස යටතේ බංකොලොත්භාවය පිළිබඳ කාර්යපටිපාටිය,

ද ඇතුළත් වේ;

"පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා" යන්නෙන්, 49 වන වගන්තියේ සඳහන් නිලධරයකු අදහස් වේ;

"අද්මිනිස්ත්‍රාසි කිරීමට පෙර වියදම්" යන්නෙන්, සමාගමක් සම්බන්ධයෙන් වන විට, සමාගම අද්මිනිස්ත්‍රාසි කිරීමට පෙර හා එසේ අද්මිනිස්ත්‍රාසිකරණයකට අවතීර්ණ වීමේ අදහසින් සහ, 178 වන වගන්තියේ (ඇ) වන ඡේදයේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම පිණිස සමාගමට අදාළව අද්මිනිස්ත්‍රාසි කර දරන ලද පිරිවැය, අය කිරීම් සහ වියදම් සහ අද්මිනිස්ත්‍රාසිකරුගේ වේතන අදහස් වේ;

"වරණීය හිමිකම්පෑම්" යන්නෙන්, හතරවන උපලේඛනයේ 1 වන, 2 වන සහ 8 වන ඡේදවල සඳහන් හිමිකම්පෑමක් අදහස් වේ;

“නියම කර ඇති” යන්නෙන්, නියෝග මගින් නියම කිරීම අදහස් වේ;

“දේපළ” යන්නෙන්, වාස්තව හෝ පෞද්ගලික, ස්පෘශ්‍ය හෝ අස්පෘශ්‍ය සෑම වර්ගයක ම දේපළ අදහස් වන අතර, ඊට වර්තමාන හෝ අතීත සෑම ස්ථිර හෝ අවිනිශ්චිත දේපළෙන් පැනනගින්නා වූ හෝ ඊට ආනුෂංගික අයිතිවාසිකමක් ද ඇතුළත් වේ;

“භාරගැනුම්කාරිත්වයට අදාළ දේපළ” යන්නෙන්, දේපළ භාරගැනුම්කරුවකු පත් කරනු ලබන්නේ යම් දේපළක් සම්බන්ධයෙන් ද, එම දේපළ අදහස් වේ;

“තාවකාලික ඇවර කිරීම” යන්නෙන්, XII වන කොටස යටතේ වන තාවකාලික ඇවර කිරීම අදහස් වන අතර, “තාවකාලික ඇවරකරු” යන්නට ඊට අනුරූප අර්ථය ම තිබිය යුතු ය;

“දේපළ භාරගැනුම්කරු” යන්නෙන්, පත් කළ තැනැත්තා යන අර්ථ නිරූපණයේ කාර්ය සඳහා හැරුණු විට, පද සම්බන්ධයෙන් අවශ්‍ය වන විට, මේ පනත යටතේ -

(අ) සාධන පත්‍රයක් මගින්; හෝ

(ආ) අධිකරණය විසින්,

පත් කරන ලද හෝ පත්කරනු ලබන්නා වූ ද, අවස්ථාවෝචිත පරිදි, යම් දේපළක් විකිණීමට බලය ඇති හෝ බලය හිමිවන තැනැත්තකු වුව ද නොවුව ද, එකී දේපළෙහි දේපළ භාරගැනුම්කරු හෝ කළමනාකරු නැතහොත් දේපළ භාරගැනුම්කරු සහ කළමනාකරු අදහස් වන අතර, “දේපළ භාරගැනුම්කාරිත්වය” යන්නට ඊට අනුරූප අර්ථය තිබිය යුතු ය;

“රෙජිස්ට්‍රාර්වරයා” යන්නට, සමාගම් පනත යටතේ ඊට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

“ආශ්‍රිත සමාගම” යන්නෙන්, යම් සමාගමක් සම්බන්ධයෙන් වන විට-

(අ) පළමු සමාගම ඍජුව ම හෝ වක්‍රව පාලනය කරනු ලබන, එමගින් පාලනය වනු ලබන හෝ එය සමඟ පොදු පාලනයකට යටත් වන වෙනත් යම් සමාගමක් අදහස් වේ; සහ

(ආ) දැනට බලපවත්නා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති පනත ප්‍රකාරව පළමු සමාගමේ ආශ්‍රිත සමාගමක් බවට සලකනු ලබන වෙනත් යම් සමාගමක් අදහස් වේ;

“අදාළ දිනය” යන්නෙන්-

(අ) අද්මිනිස්ත්‍රාසි කිරීමක් හෝ අද්මිනිස්ත්‍රාසි කිරීමකට පෙරාතුව ම වූ ඇවර කිරීමක් සම්බන්ධයෙන් වන විට, අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කළ දිනය අදහස් වේ;

(ආ) අද්මිනිස්ත්‍රාසි කිරීමට පෙරාතුව ම නොවූ ඇවර කිරීමක් සම්බන්ධයෙන් වන විට, ඇවර කිරීම ආරම්භ කළ දිනය අදහස් වේ;

(ඇ) දේපළ භාරගැනුම්කාරිත්වය සම්බන්ධයෙන් වන විට, දේපළ භාර ගැනුම්කාරිත්වය ආරම්භ කළ දිනය, අදහස් වේ;

“අදාළ තොරතුරු තාක්ෂණය” යන්නෙන්-

(අ) පරිගණක දෘඩාංග සහ මෘදුකාංග;

(ආ) ක්ලවුඩ් සේවා ද ඇතුළුව දත්ත ගබඩා කිරීම සහ පිරිසැකසුම් කිරීම;

(ඇ) තොරතුරු තාක්ෂණය භාවිත කිරීමට අදාළව තොරතුරු, උපදෙස් සහ තාක්ෂණික සහාය;

(ඈ) විකුණුම් පර්යන්තය; සහ

(ඉ) වෙබ් අඩවි නිර්මාණය කිරීම,

අදහස් වේ;

“ප්‍රතියෝජිත අද්මිනිස්ත්‍රාසිකරු” යන්නෙන්, පද සම්බන්ධයෙන් අවශ්‍ය වන පරිදි, අද්මිනිස්ත්‍රාසිකරුවකු ප්‍රතියෝජනය කිරීම සඳහා X වන කොටසේ I වන පරිච්ඡේදය යටතේ පත් කරනු ලබන හෝ පත් කරනු ලැබිය හැකි අද්මිනිස්ත්‍රාසිකරුවකු අදහස් වේ;

"ප්‍රතියෝජිත ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු" යන්නෙන්, පද සම්බන්ධයෙන් අවශ්‍ය වන පරිදි, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු ප්‍රතියෝජනය කිරීම සඳහා IX වන කොටස යටතේ, පත් කළ හෝ පත් කරනු ලබන ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු අදහස් වේ;

"ප්‍රතියෝජිත ඇවරකරු" යන්නෙන්, පද සම්බන්ධයෙන් අවශ්‍ය වන පරිදි, ඇවරකරු ප්‍රතියෝජනය කිරීම සඳහා XII වන කොටස යටතේ පත් කළ හෝ පත් කරනු ලබන ඇවරකරුවකු අදහස් වේ;

"ප්‍රතියෝජිත දේපළ භාරගැනුම්කරු" යන්නෙන්, පද සම්බන්ධයෙන් අවශ්‍ය වන පරිදි, දේපළ භාරගැනුම්කරුවකු ප්‍රතියෝජනය කිරීම සඳහා XIII වන කොටස යටතේ පත් කළ හෝ පත් කරනු ලබන දේපළ භාරගැනුම්කරුවකු අදහස් වේ;

"සුරක්ෂිත ණයහිමියා" යන්නෙන්, පිළිබැඳීමක ප්‍රතිලාභය ඇති ණයහිමියකු අදහස් වේ;

"කොටස් හිමියා" යන්නෙන්, සමාගමක් සම්බන්ධයෙන් වන විට, සමාගම් පනතේ 86 වන වගන්තියේ අර්ථානුකූලව වන කොටස් හිමියකු අදහස් වේ;

"ව්‍යවස්ථාපිත ඉල්ලීම" යන්නෙන්, ගෙවිය යුතු මුදලක් ගෙවන ලෙසට සමාගමකට නියම කරනු ලබන යම් ආකෘතියක වන ලිඛිත ඉල්ලීමක් අදහස් වේ;

"විදුලිසංදේශ සේවා" යන්නෙන්, එක උපකරණයක සිට තවත් උපකරණයකට, යම් සලකුණක්, සංඥාවක්, උත්ප්‍රේරණයක්, ලිඛිත ලේඛනයක්, ප්‍රතිබිම්බයක්, ශබ්දයක්, විධානයක්, උපකරණය භාවිතා කරන තැනැත්තා සඳහා වන තොරතුරක් වුවද නොවූව ද ඕනෑම ස්වභාවයක වූ තොරතුරක් හෝ බුද්ධි තොරතුරු සැපයීමක්, රැහැන් මගින්,ගුවන් විදුලි සංඛ්‍යාත මගින්, චන්ද්‍රිකා සම්ප්‍රේෂණය මගින් හෝ වෙනත් මාධ්‍යයක් මගින් යැවීම අදහස් වේ;

"ඌන ලෙස අගය කළ ගනුදෙනුවක්" යන්නට, 418 වන වගන්තියේ ඊට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"නොකැඳවන ලද ප්‍රාග්ධනය" යන්නට, කොටස් නිකුත් කිරීම සම්බන්ධයෙන් හෝ සමාගමක ව්‍යවස්ථාවලිය යටතේ ගෙවිය යුතු ඕනෑම මුදලක් ඇතුළත් වේ;

"අවලංගු කළ හැකි ගනුදෙනුව" යන්නෙන්-

(අ) අවලංගු කළ හැකි මනාපයක්;

(ආ) අවලංගු කළ හැකි පිළිබැඳීමක්; හෝ

(ඇ) චේතාන්විත අන්සතු කිරීමක්,

අදහස් වන අතර, එම යෙදුමට අනුපිළිවෙළින් 412 වන, 413 වන සහ 414 වන වගන්තිවල ඊට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"වැඩ කරන දිනය" යන්නෙන්, සෙනසුරාදා, ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක් නොවන, වෙනත් දිනයක් අදහස් වේ ;

(2) මේ පනතේ-

(අ) සමාගමක දේපළ සහ ව්‍යවසායක සමස්තය හෝ එහි හරවත් සමස්තය කෙරෙහි වූ පිළිබැඳුමක ම කරනු ලබන සඳහනකට එකී පිළිබැඳීම්වලට යටත් සමාගමේ දේපළ එක්ව ගත්කළ සමාගමේ දේපළ සහ ව්‍යවසායයේ සමස්ත හෝ හරවත් සමස්තයක් වන අවස්ථාවකදී සමාගමේ දේපළ මත වූ දෙකක් හෝ වැඩි ගණනක පිළිබැඳුම්වලට කරනු ලබන සඳහනක් කිරීම්) ද ඇතුළත් වේ;

(ආ) 8 වන වගන්තිය හැර, නිල දේපළ භාරගැනුම්කරුට කරන ලද සඳහනකට, නිල දේපළ භාරගැනුම්කරු වෙනුවෙන් ක්‍රියා කරන හෝ එම වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ නිල දේපළ භාරගැනුම්කරු වෙනුවට ක්‍රියා කරන හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටින නියෝජ්‍ය නිල දේපළ භාරගැනුම්කරුවකුට කරන ලද සඳහනක් ද ඇතුළත් වේ;

(3) සිදුවීමක් හෝ දෙයක් පිළිබඳ සඳහනකට -

(අ) එහි අතථ්‍ය හෝ ඩිජිටල් සමානාත්මතාව ඇතුළත් වන පරිදි-

(i) ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් තබා ඇති දත්ත සහ තොරතුරු ද ඇතුළුව පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ ඒ හා සමාන දේට කරනු ලබන සඳහනක් ;

(ii) පොත්, ලේඛන, වාර්තා, දේපළ හෝ ඒ හා සමාන දේවලට ප්‍රවේශය ලබා දීම සහ ඒවා සම්ප්‍රේෂණය කිරීම ද ඇතුළුව ඒවා "බෙදා හැරීම" හෝ "ලබා දීම" ට කරනු ලබන සඳහනක්;

(iii) යම් ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින් චිත්‍ර ආකාර වූ සන්නිවේදනය කිරීමක් ද ඇතුළුව, "ලිවීම" ට කරනු ලබන සඳහනක් ;

(iv) වලංගු වීම සඳහා අවශ්‍ය විට දී ලිඛිතව දැන්වීමක් කරනු ලැබිය යුතු ලද අධිකාරිය විසින් තත්කාර්ය සඳහා සම්පාදනය කළ වෙබ් අඩවියක් ද ඇතුළුව, ඒ කාර්ය සඳහා වෙන් කළ වෙබ් අඩවියක පළ කරන ලද "වෙළඳ දැන්වීමක්" හෝ "දැන්වීමකට" කරනු ලබන සඳහනක්,

ද ඇතුළත් වේ;

(ආ) වෙනත් විකල්ප කලින් කලට, නියම කළ හැකි ය.

## I වන කොටස

## ආයතනික සැලසුම්

## 1 වන පරිච්ඡේදය

### වස්තුභංගත්ව නියාමන අධිකාරිය

**3.** (1) මේ පනතේ නිශ්චිතව දක්වා ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා ද, ඉටු කිරීම සඳහා ද (මේ පනතේ "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) "වස්තුභංගත්ව නියාමන අධිකාරිය" නම් වූ අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය. වස්තුභංගත්ව නියාමන අධිකාරිය පිහිටුවීම

(2) අධිකාරිය, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිත සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී සංස්ථාපිත නාමයෙන් එය විසින් ද, එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(3) අධිකාරිය-

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත් වන සාමාජිකයන්ගෙන්, එනම්-

(i) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නාමිකයකු;

(ii) අධිකරණ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නාමිකයකු;

(iii) වෙළඳ හෝ වාණිජ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නාමිකයකු;

(iv) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා හෝ අතිරේක සමාගම් රෙජිස්ට්‍රාර්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නාමිකයකු;

(v) 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 19 වන වගන්තිය යටතේ පත් කරනු ලබන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නාමිකයකු;

(vi) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 97 වන වගන්තිය යටතේ පත් කරනු ලබන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා හෝ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නාමිකයකු;

(vii) 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 14 වන වගන්තිය යටතේ පත් කරනු ලබන මහබැංකුවේ අධිපතිවරයා හෝ සහාය අධිපතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නාමිකයකු; සහ

(viii) (289 වන අධිකාරය වූ) වාණිජ මණ්ඩල ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද ලංකා වාණිජ මණ්ඩලයේ සහ ජාතික වාණිජ මණ්ඩලයේ එක් එක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නාමයෝජිත සාමාජිකයන් දෙදෙනකු; සහ

(ආ) වයස අවුරුදු හැත්තෑවට අඩු සහ, බදුකරණය, ගිණුම්කරණය, බැංකුකරණය, තොරතුරු තාක්ෂණය, සිවිල්, වාණිජ හෝ සමාගම් නීතිය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම, අත්දැකීම හා විශිෂ්ටත්වය ඇති, තැනැත්තකු බවට තහවුරුවීමෙන් ප්‍රසිද්ධියට පත් වූ, ශක්නුවත්, අවංක, මනා චරිතයකින් යුතු සහ කීර්තිධර තැනැත්තන් අතරින් (මේ පනතේ “පත් කළ සාමාජිකයන්” යනුවෙන් සඳහන් කරනු ලබන) (5) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් පස්දෙනකු,

ගෙන් සමන්විත විය යුතු ය.

(4) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට එක් මාසයක් ඇතුළත-

(i) ගැසට් පත්‍රයේ; සහ

(ii) පාර්ලිමේන්තු නිල වෙබ් අඩවියේ,

පළ කරනු ලබන දැන්වීමක් මගින් 'පත් කළ' සාමාජිකයන් පත් කරනු ලැබීම සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවිය යුතු ය.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්, අනාගතයේ ඇති විය හැකි පත් කළ සාමාජිකයකුගේ පුරප්පාඩුවක් සම්බන්ධයෙන්, ඒ පිළිබඳ ලිඛිත දැනුම්දීමක් කර එක් මාසයක් ඇතුළත-

(i) ගැසට් පත්‍රයේ; සහ

(ii) පාර්ලිමේන්තු නිල වෙබ් අඩවියේ,

පළ කරනු ලබන දැන්වීමක් මගින් එකී සාමාජිකයා පත් කරනු ලැබීම සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍ර ලැබීමෙන් පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත් කරනු ලැබිය යුතු සාමාජිකයන් පිළිබඳ සිය නිර්දේශ ජනාධිපතිවරයා වෙත යවනු ලැබිය යුතු ය. ජනාධිපතිවරයා විසින් එසේ නිර්දේශ කරනු ලැබූ තැනැත්තන් පත් කිරීමට කටයුතු කළ යුතු අතර, ඔවුන්ගෙන් එක් අයකු අධිකාරියේ සභාපතිවරයා විය යුතු ය.

(6) අධිකාරියේ පත් කළ සාමාජිකයන් සම්බන්ධයෙන් වන විධිවිධාන සහ අධිකාරියේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ වෙනත් යම් විධිවිධාන පළමුවන උපලේඛනයේ දක්වා ඇති පරිදි විය යුතු ය.

(7) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයෙන් හා අනුප්‍රමාණ මත අධිකාරියේ පත් කළ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, ධුර කාලය තුළ දී පාරිශ්‍රමික හීන නොවිය යුතු ය.

**4.** (1) අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය විය යුත්තේ - අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

(අ) ශ්‍රී ලංකාවේ තැනැත්තන්ගේ සහ සමාගම්වල වස්තුභංගත්වය සම්බන්ධයෙන් වන නීතිය සහ පරිචය සමාලෝචනයට ලක් කිරීම සහ අවශ්‍ය යයි සැලකෙන යම් වෙනස්කමක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන් ලෙස තැනැත්තන් ලියාපදිංචි කිරීම, ඔවුන්ගේ ලියාපදිංචිය අලුත් කිරීම සහ අවලංගු කිරීම හෝ අත්හිටුවීම;

(ඇ) වස්තුභංගත්ව වෘත්තිකයන්ගේ ලේඛනයක් තබා ගැනීම සහ පවත්වාගෙන යාම;

(ඈ) (i) එක් වස්තුභංගත්ව වෘත්තිකයකුට;

(ii) සියලුම වස්තුභංගත්ව වෘත්තිකයන්ට; සහ

(iii) නිශ්චිත පන්ති එකක් හෝ වැඩි ගණනකට අයත් වස්තුභංගත්ව වෘත්තිකයන්ට,

කොන්දේසි පැනවීම;

(ඉ) අදාළ සියලුම වෘත්තීය ආයතන සමග එක්ව, වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයින්ගේ කුසලතා සහ ප්‍රමිති වැඩි දියුණු කිරීම සඳහා පුහුණු කිරීම් දිරිමත් කිරීම;

(ඊ) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස ලියාපදිංචිය ලබා ගැනීම සඳහා තැනැත්තකු අනුකූල විය යුතු අවශ්‍යතා ලැයිස්තුවක් පවත්වාගෙන යාම සහ එම අවශ්‍යතාවලට අනුකූල වීම, නියම කරනු ලැබිය යුතු ආකාරයකින්, ඇගයීම සඳහා කටයුතු සැලැස්වීම ;

(උ) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන්ගේ ක්‍රියාකලාපය සහ කාර්යසාධනය සම්බන්ධයෙන් රීති, ප්‍රමිති, ආචාර ධර්ම මාලා සහ මාර්ගෝපදේශ සෑදීම;

(ඌ) මේ පනත සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ සිදු කිරීමට හෝ ඉටු කිරීමට අවශ්‍ය යම් ක්‍රියාවක් හෝ කාරණයක් සම්බන්ධයෙන් ප්‍රායෝගික උපදෙස් සහ මාර්ගෝපදේශ සෑදීම;

(එ) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන්ගේ ක්‍රියාකලාපය සහ කාර්යසාධනය අධීක්ෂණය කිරීම;

(ඒ) පැමිණිලි පිළිගන්නා අවස්ථාවල දී ප්‍රතිකර්ම සැලසීම ද ඇතුළුව, වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන්ට එරෙහිව වන පැමිණිලි භාර ගැනීම, පැමිණිලි පිළිබඳ කටයුතු මෙහෙයවීම සහ තීරණය කිරීම සම්බන්ධයෙන් කාර්යපටිපාටි ඇති කිරීම සහ පවත්වාගෙන යාම;

(ඕ) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන්ට එරෙහිව, නියම කරනු ලැබිය හැකි යම් හේතු මත සහ නියම කරනු ලැබිය හැකි යම් ස්වභාවයේ වන යම් විනය ක්‍රියාමාර්ග නියම කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව පැනවීම;

(ඖ) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ධුරයෙන් ඉවත් කිරීම සහ තහනම් නියෝග ගැනීම සඳහා අධිකරණයට ඉල්ලීම් ඉදිරිපත් කිරීම;

(ක) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකුගේ ක්‍රියාකලාපය හෝ කාර්යසාධනය සම්බන්ධයෙන් වන නඩු කටයුතුවලට සහභාගී වන ලෙසට අධිකාරියේ යම් නිලධරයකුට විධානය කිරීම;

(ග) නිල භාර ගැනුම්කරුගේ ක්‍රියාකලාපය සහ කාර්යසාධනය අධීක්ෂණය කිරීම සහ මෙම පනත යටතේ සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ නිල භාර ගැනුම්කරුගේ කර්තව්‍යවල කාර්යසාධනයට අදාළ යම් කාරණාවක් සම්බන්ධයෙන්, නිල භාර ගැනුම්කරුගෙන් ඉල්ලා සිටිනු ලබන පරිදි හෝ නියමිත උපලේඛනයකට අනුව වාර වාර්තා ලබා ගැනීම සහ ඒ නිල භාර ගැනුම්කරුගේ ක්‍රියාකලාපය සහ කාර්යසාධනය පිළිබඳ සහ නිල භාර ගැනුම්කරුගේ කර්තව්‍ය ඵලදායී ලෙස ඉටු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය යම් සම්පත් හෝ වෙනත් අවශ්‍යතා පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙත වාර්තා කිරීම;

(ච) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු, බලයලත් මැදිහත්කරු සහ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු, පුද්ගලික වස්තුභංගත්ව යෝජක, අද්මිනිස්ත්‍රාසිකරු, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු, ඇවරකරු, තාවකාලික ඇවරකරු හෝ දේපළ භාර ගැනුම්කරු යන අයගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් රීති, ප්‍රමිති සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම;

(ජ) පුද්ගලික වස්තුභංගත්වය පිළිබඳ ලේඛනයක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම;

(ට) තැනැත්තන්ගේ සහ සමාගම්වල වස්තුභංගත්ව ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ කිරීම, අධ්‍යයන සිදු

කිරීම, තොරතුරු බෙදා හැරීම සහ පොදු අධ්‍යාපනය ලබා දීම;

(ඩ) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය විය හැකි දේශීය හා ජාත්‍යන්තර ආස්ථිතායයත් සමඟ සන්නිවේදනය සහ සම්බන්ධතා ඇති කර පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම ;

(ණ) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි සංඛ්‍යාලේඛන සහ දත්ත සම්පාදනය කර පවත්වාගෙන යාම;

(ත) ස්වකීය කර්තව්‍ය ඵලදායීව පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය වන කමිටු පිහිටුවීම සහ එම කමිටුවලට අවශ්‍ය යම් බලතල සහ කර්තව්‍ය පැවරීම; සහ

(ද) මේ පනත සහ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක් යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට අවශ්‍ය, ආනුෂංගික සහ උපකාර වන බවට සැලකිය හැකි අනෙකුත් සියලුම ක්‍රියා සිදුකිරීම.

(2) අධිකාරිය-

(අ) එහි යම් සාමාජිකයකුට;

(ආ) 5 වන වගන්තිය යටතේ පත්කරනු ලබන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට;

(ඇ) අධිකාරියේ නිලධරයකුට,

අධිකාරියේ යම් බලතල සහ කර්තව්‍ය පවරනු ලැබිය හැකි අතර, එකී තැනැත්තා විසින්, එකී බලතල සහ කර්තව්‍යය අධිකාරියේ සාමාන්‍ය විධානයට යටත්ව ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා

**5**. (1) අධිකාරියේ කටයුතු පරිපාලනය, සහ කළමනාකරණය අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබිය යුතුය.

(2) අධිකාරිය විසින්, වස්තුභංගත්වයට අදාළ ගණකාධිකරණය, නීතිය සහ මූල්‍ය ක්ෂේත්‍රවල සුදුසුකම් හා පළපුරුද්ද සහිත තැනැත්තකු වන අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(3) අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා සහ අධිකාරියට සහාය වීම පිණිස අවශ්‍ය වන වෙනත් යම් නිලධරයන් සහ සේවකයන් පළමු උපලේඛනයේ සඳහන් පරිදි අධිකාරිය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධිකාරියේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, අධිකාරියේ කටයුතු පරිපාලනය සහ අධිකාරියේ කාර්යාලයේ කටයුතු ඉටුකිරීම සහ අධිකාරියේ සේවානියුක්තයන් පරිපාලනය සහ පාලනය ද කළ යුතු ය.

(5) අධිකාරියේ අනුමතයට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙම පනත මගින් ඔහු වෙත පවරන ලද, නියම කරන ලද හෝ පනවන ලද යම් බලතල, හෝ කර්තව්‍ය යම් සේවානියුක්තයකු වෙත පවරනු ලැබිය හැකි අතර, එකී සේවානියුක්තයා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විශේෂ විධානයට යටත්ව එම බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

(6) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අධිකාරිය විසින්, කලින් කලට නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට සහ යම් අනුප්‍රමාණ මත අධ්‍යක්ෂ ජනරාල්වරයාට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි අතර, එය ඔහුගේ ධුර කාලය තුළ දී හීන නොවිය යුතු ය.

අධිකාරියේ අරමුදල

**6.** (1) අධිකාරියට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) අරමුදලට-

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ;

(ආ) මේ පනත මගින් අධිකාරියට පැවරී ඇති කර්තව්‍ය ඉටු කිරීමට හැකි වන පරිදි රජය විසින් ලබා දිය හැකි අරමුදල්;

(ඇ) මේ පනතේ විධිවිධාන අනුව අධිකාරිය විසින් රැස් කළ හැකි යම් මුදල් ප්‍රමාණ;

(ඈ) අධිකාරියේ බැරට උපචිත වන වෙනත් සියලුම මුදල් ප්‍රමාණ; සහ

(ඉ) ඒකාබද්ධ අරමුදලෙන්, රජයෙන් හෝ විදේශීය රජයකින්, රාජ්‍ය ආයතනවලින් සහ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික ආයතනවලින් වන පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන ලෙස අධිකාරිය වෙත ලැබිය හැකි වන, එහෙත්, අවශ්‍ය පරිදි බාහිර සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලැබිය යුතු වන්නා වූ, මුදල් ප්‍රමාණ,

ගෙවනු ලැබිය යුතු ය.

(3) අධිකාරිය විසින් එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී දරන ලද වියදම් පියවා ගැනීමට අවශ්‍ය සියලුම මුදල් අරමුදලින් ගෙවිය යුතු ය.

(4) අධිකාරියේ අරමුදලට අයත් මුදල්, අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයට අධිකාරිය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

ගිණුම් සහ විගණනය

**7.** (1) අධිකාරිය විසින් අධිකාරියේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ අනෙකුත් සියලුම ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) අධිකාරියේ මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා අධිකාරිය විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය විසින් 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත යටතේ සම්මත කර ගන්නා ලද ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට හෝ බලපවත්නා වෙනත් යම් අදාළ ලිඛිත නීතියකට අනුකූලව සිය ගිණුම් සකස් කළ යුතු ය.

(3) රාජ්‍ය සංස්ථා ගිණුම් විගණනයට අදාළ වන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

2 වන පරිච්ඡේදය

**නිල දේපළ භාර ගැනුම්කරු**

නිල දේපළ භාර ගැනුම්කරු සහ නියෝජ්‍ය නිල දේපළ භාර ගැනුම්කරුවෝ

**8.** (1) අමාත්‍යවරයා විසින් -

(අ) නිල දේපළ භාර ගැනුම්කරු වශයෙන් නමින් හෝ ධුරයෙන් සුදුසු තැනැත්තකු; සහ

(ආ) අවශ්‍ය අවස්ථාවල දී, නිල දේපළ භාර ගැනුම්කරු වෙනුවෙන් ක්‍රියා කිරීමට හෝ ඒ වෙනුවට පෙනී සිටීමට නමින් හෝ ධුරයෙන් නියෝජ්‍ය නිල දේපළ භාර ගැනුම්කරුවන් වශයෙන් සුදුසු එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි ප්‍රමාණයක්,

පත්කරනු ලැබිය යුතු ය.

(2) නිල දේපළ භාර ගැනුම්කරු සහ නියෝජ්‍ය නිල දේපළ භාර ගැනුම්කරුවන් අධිකරණයේ නිලධරයන් විය යුතු ය.

(3) නිල දේපළ භාර ගැනුම්කරු සහ නියෝජ්‍ය නිල දේපළ භාරගැනුම්කරුවන්-

(අ) අමාත්‍යවරයා විසින් විධානය කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසි මත ධුර දරනු ලැබිය හැකි ය; සහ

(ආ) අමාත්‍යවරයාගේ විධානයක් අනුව ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිල දේපළ භාර ගැනුම්කරුගේ සහ නියෝජ්‍ය නිල දේපළ භාර ගැනුම්කරුවන්ගේ ක්‍රියාකලාපය සහ කාර්යසාධනය අධීක්ෂණය කළයුතු අතර, නිල දේපළ භාර ගැනුම්කරුගේ හෝ නියෝජ්‍ය නිල දේපළ භාර ගැනුම්කරුවන්ගේ ක්‍රියාකලාපයට සහ කාර්යසාධනයට අදාළ විය හැකි යම් ලේඛනයක් හෝ තොරතුරු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලබාදෙන ලෙසට නිල දේපළ භාර ගැනුම්කරුට නියම කරනු ලැබිය හැකි ය.

(5) නියෝජ්‍ය නිල දේපළ භාර ගැනුම්කරුවන් විසින්, නිල දේපළ භාර ගැනුම්කරුගේ පාලනයට සහ විධානයට යටත්ව, තම කාර්ය ඉටු කිරීම හා බලතල ක්‍රියාත්මක කිරීම කළ යුතු ය.

(6) යම් නියෝජ්‍ය නිල දේපළ භාර ගැනුම්කරුවකු නිල දේපළ භාර ගැනුම්කරු වෙනුවෙන් ක්‍රියා කළ හැකි හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටිය හැකි අතර එසේ කිරීමේ දී-

(අ) ඔහුට නිල දේපළ භාර ගැනුම්කරුගේ සියලු අධිකාරි බලය සහ බලතල තිබිය යුතු ය; සහ

(ආ) ඔහු, මේ පනත මගින් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග මගින් නිල දේපළ භාර ගැනුම්කරු කෙරෙහි පනවනු ලැබිය හැකි සීමා කිරීම් සහ සීමාවන්ට ද යටත් විය යුතු ය.

**9**. නිල දේපළ භාර ගැනුම්කරුගේ බලතල විය යුත්තේ -

නිල දේපළ භාර ගැනුම්කරුගේ බලතල

(අ) ඇවරකරුවකු හෝ තාවකාලික ඇවරකරුවකු ලෙස කටයුතු කිරීම;

(ආ) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු හෝ අතරමැදි දේපළ භාර ගැනුම්කරුවකු වශයෙන් කටයුතු කිරීම;

(ඇ) අධ්‍යක්ෂවරුන් නුසුදුස්සන් බවට පත්කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීම සහ ඒ ආශ්‍රිත කටයුතු ඉටු කිරීමට භාර ගැනීම;

(ඈ) වස්තුභංගත්ව පාලන ගිණුම සහ වස්තුභංගත්ව අතිරික්ත ගිණුම සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ ඒ ආශ්‍රිත කටයුතු ඉටු කිරීමට භාර ගැනීම;

(ඉ) බංකොලොත්භාවයට පත් වී ඇති ණයකරුවන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම;

(ඊ) 419 වන වගන්තිය යටතේ ඉල්ලීම් ඉදිරිපත් කිරීම; සහ

(උ) මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද නියෝග යටතේ විධිවිධාන සලසා ඇති වෙනත් යම් බලතල ක්‍රියාත්මක කිරීම,

ය.

**10**. (1) නිල දේපළ භාර ගැනුම්කරුට -

නිල දේපළ භාර ගැනුම්කරුගේ ධුරය හා නාමය

(අ) “[වස්තුභංගත්වයට පත් වී ඇති ණයකරුගේ නම හෝ ඇවර කිරීමට භාජනය වී ඇති සමාගමේ නම ඇතුළත් කිරීම] නිල දේපළ භාරගැනුම්කරු”

යන නාමයෙන්, ඔහු විසින් හෝ ඔහුට එරෙහිව නඩු පවරනු ලැබිය හැකි ය; සහ

(ආ) එකී නාමයෙන්, නිල දේපළ භාර ගැනුම්කරුගේ ධුරයේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී කිරීමට අවශ්‍ය හෝ සුදුසු යම් ක්‍රියාවක් කළ හැකි ය.

(2) නිල දේපළ භාර ගැනුම්කරුට නිල දේපළ භාර ගැනුම්කරුගේ නිල නාමය යටතේ නිල දේපළ භාර ගැනුම්කරුගේ පෞද්ගලික නම අත්සන් කිරීම මගින් යම් ලේඛනයක් ලියා අත්සන් කළ හැකි වන නමුත්, මෙම උපවගන්තියේ කිසිවක් මගින් නිල දේපළ භාර ගැනුම්කරු විසින් නිල දේපළ භාර ගැනුම්කරුගේ නිල මුද්‍රාව තබා, එසේ මුද්‍රාව තැබීම සහතික කිරීම මගින් ලේඛනයක් ලියා අත්සන් තැබීම වළක්වනු නොලැබේ.

නිල දේපළ භාරගැනුම්කරු බංකොලොත්භාවය පිළිබඳ භාරකරුවකු වශයෙන් ක්‍රියා කිරීම නොකරනු ලබන අවස්ථා

**11.** (1) නිල දේපළ භාර ගැනුම්කරුගේ ධුරය දරන තැනැත්තකු, එකී තැනැත්තා -

(අ) බංකොලොත්භාවයට පත් වී ඇති ණයකරුගේ ණයහිමියකු නම්; සහ

(ආ) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වශයෙන් ක්‍රියා කරනු ලැබීමට තමන් අකමැති බවට ණයහිමියන් විසින් යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරන්නේ නම්,

බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වශයෙන් පත් කරනු නොලැබිය යුතු ය.

(2) නිල දේපළ භාර ගැනුම්කරුගේ ධුරය දරන තැනැත්තකු, එකී තැනැත්තා -

(අ) යම් සමාගමක ණයහිමියකු නම්; සහ

(ආ) එකී සමාගමේ ඈවරකරු හෝ තාවකාලික ඈවරකරු ලෙස ක්‍රියා කරනු ලැබීමට තමන් අකැමති බවට ණයහිමියන් විසින් යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරන්නේ නම්,

එකී සමාගමේ ඈවරකරු හෝ තාවකාලික ඈවරකරු වශයෙන් පත් කරනු නොලැබිය යුතු ය; ක්‍රියා කිරීම හෝ දිගින් දිගටම ක්‍රියා කිරීම කරනු නොලැබිය යුතුය .

(3) ණයහිමියන් විසින් (1) වන උපවගන්තියේ (ආ)ඡේදයේ හෝ (2)වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ආකාරයේ යෝජනා

සම්මතයක් සම්මත කර ගනු ලබන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 8 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව, බංකොලොත්භාවය පිළිබඳ භාරකරු, ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු වශයෙන් වෙනත් තැනැත්තකු පත් කළ යුතු ය.

## 3 වන පරිච්ඡේදය

### වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන්

ප්‍රධාන ධුර දරන්නන් වශයෙන් පත් කිරීමට සහ ක්‍රියාකිරීමට සුදුසුකම් ලබන තැනැත්තන්

**12.** බංකොලොත්භාවය, ඇවර කිරීම හෝ තාවකාලික ඇවර කිරීම සම්බන්ධයෙන් නිල දේපළ භාර ගැනුම්කරු, හැර ප්‍රධාන ධුර දරන්නකු වශයෙන් පත්කරනු ලැබීමට හෝ ක්‍රියා කරනු ලැබීමට යම් තැනැත්තකු සුදුසුකම් ලැබිය යුතු වනුයේ -

(අ) එකී තැනැත්තා වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස අධිකාරිය විසින් ලියාපදිංචි කර ඇත්නම්;

(ආ) 18 වන වගන්තිය යටතේ එකී තැනැත්තාගේ ලියාපදිංචිය අත්හිටුවා නොමැති නම්;

(ඇ) අදාළ ක්‍රියාකාරකම සම්බන්ධයෙන් ප්‍රධාන ධුර දරන්නා ලෙස සේවය කිරීම වළක්වමින් හෝ සීමා කරමින් 15 වන වගන්තිය යටතේ පනවා ඇති යම් කොන්දේසියකට එකී තැනැත්තාගේ ලියාපදිංචිය යටත් නොවන්නේ නම්;

(ඈ) එකී තැනැත්තා නිදහස් නොකළ බංකොලොත් ණයකරුවකු නොවන්නේ නම්;

(ඉ) එකී තැනැත්තා (227 වන අධිකාරය වූ) මානසික රෝග ආඥාපනත යටතේ සිහිවිකල තැනැත්තකු ලෙස විනිශ්චය කරනු ලැබූ තැනැත්තකු නොවන්නේ නම්;

(ඊ) 27 වන වගන්තිය යටතේ කරන ලද තහනම් ආඥාවකට එකී තැනැත්තා යටත් නොවන්නේ නම්; සහ

(උ) එකී තැනැත්තා, සමාගම් පනතේ 213 වන වගන්තිය යටතේ හෝ සමාගම් පනතේ 214 වන වගන්තිය යටතේ කරනු ලබන ආඥාවක් යටතේ ප්‍රධාන ධුරයකට පත් කිරීම හෝ ක්‍රියා කිරීම වළක්වමින් කරනු ලබන තහනමකට යටත් නොවන්නේ නම්,

පමණි.

පුද්ගල මණ්ඩලයක් ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත්කළ හැකි හෝ ක්‍රියා කළ නොහැකි බව

**13.** පුද්ගල මණ්ඩලයක් ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කරනු ලැබිය හෝ ක්‍රියා කරනු ලැබිය නොහැකිය.

ලියාපදිංචි කිරීම

**14.** (1) තැනැත්තකු විසින්, වස්තුභංගත්වභාවය පිළිබඳ වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වීම සඳහා, නියම කරනු ලැබිය හැකි ආකාරයෙන්, සහ නියම කරනු ලැබිය හැකි. ලියාපදිංචි ගාස්තු ගෙවීමෙන් පසුව අධිකාරිය වෙත ඉල්ලුම් කළ හැකි ය.

(2) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු අධිකාරිය විසින් -

(අ) අභියාචනා ද ඇතුළුව, නියම කරනු ලැබිය හැකි යම් ක්‍රියාපටිපාටියක් අනුගමනය කළ යුතු ය; සහ

(ආ) එම ක්‍රියාපටිපාටියට අනුකූලව සහ (4) වන උපවගන්තියට යටත්ව, එකී තැනැත්තා වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස ලියාපදිංචි කර, නියම කරනු ලබන ආකාරයට ලියාපදිංචි සහතිකයක් නිකුත් කළ යුතු ය.

(3) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වීමට තැනැත්තකු අනුකූල විය යුතු අවශ්‍යතාවලට, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද, අදාළ විභාග සහ -

(අ) නියම කර කරනු ලබන; හෝ
(ආ) අධිකාරිය විසින් සාදන ලද යම් රීතියක අන්තර්ගත,

වෙනත් අදාළ නිර්ණායක ද ඇතුළත් විය යුතු ය.

(4) තැනැත්තකු-

(අ) ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කරනු ලැබීමට සහ ක්‍රියා කරනු ලැබීමට යෝග්‍ය සහ සුදුසු තැනැත්තකු වන්නේ නම් මිස; සහ

(ආ) (3) වන උපවගන්තියේ සඳහන් වන වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වීමට සපුරාලිය යුතු අවශ්‍යතාවලට අනුකූල වන්නේ නම් මිස,

අධිකාරිය විසින්, එකී තැනැත්තා වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස ලියාපදිංචි නොකරනු ලැබිය හැකි ය.

(5) මෙම කොටස යටතේ ලියාපදිංචිය අලුත් කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීමට යටත්ව, අධිකාරිය විසින්, තැනැත්තකු, වසරක ස්ථාවර කාලයක් සඳහා හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් කාලසීමාවක් සඳහා වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

**15.** (1) අධිකාරිය විසින් යම් අවස්ථාවක, සියලුම ලියාපදිංචි වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන් සම්බන්ධයෙන් හෝ නිශ්චිතව දක්වනු ලබන පන්ති එකකට හෝ වැඩි ගණනකට අයත් ලියාපදිංචි වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන් සම්බන්ධයෙන්, එවැනි වස්තුභංගත්ව වෘත්තිකයන් විසින් සිදු කළ හැකි ක්‍රියාකාරකම් වර්ග සීමා කරන්නා වූ යම් කොන්දේසියක් පැනවිය හැකි ය. කොන්දේසි

(2) (1) වන උපවගන්තිය යටතේ පනවා ඇති කොන්දේසිවලට, අධිකාරිය සුදුසු යයි සලකන පරිදි, වෘත්තීය සංවර්ධන අවශ්‍යතාවලට අඛණ්ඩව අනුකූලවීම ද ඇතුළත් විය හැකි ය.

(3) (1) වන උපවගන්තියට අගති විරහිතව, අධිකාරිය විසින් යම් අවස්ථාවක, වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු විසින් බාර ගත හැකි ක්‍රියාකාරකම වර්ග සීමා කරන කොන්දේසියක් වස්තුභංගත්ව වෘත්තිකයාගේ ලියාපදිංචිය සම්බන්ධයෙන් පැනවිය හැකි ය.

(4) නියම කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු, (3) වන උපවගන්තිය යටතේ එකී වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයාට පනවා ඇති කොන්දේසියක් වෙනස් කිරීම හෝ ඉවත් කිරීම සඳහා අධිකාරියට ඉල්ලීමක් කළ හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු අධිකාරිය විසින්, අභියාචනා ද ඇතුළත්, නියම කරනු ලැබිය හැකි කාර්යපටිපාටියක් අනුගමනය කළ යුතු ය.

**16.** (1) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස යම් තැනැත්තකුගේ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා, එකී තැනැත්තා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් සහ නියම කරනු ලැබිය හැකි යම් අලුත් කිරීමේ ගාස්තුවක් ගෙවීමෙන් පසු අධිකාරිය වෙත ඉල්ලීමක් කළ හැකි ය. ලියාපදිංචිය අලුත් කිරීම

(2) (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීමක් කිරීමෙන් පසු අධිකාරිය විසින් -

(අ) අභියාචනා ද ඇතුළත් වන, නියම කරනු ලැබිය හැකි යම් කාර්ය පටිපාටියක් අනුගමනය කළ යුතු ය; සහ

(ආ) එම කාර්යපටිපාටියට අනුකූලව සහ (3) වන උපවගන්තියට යටත්ව, වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස තැනැත්තාගේ ලියාපදිංචිය අලුත් කර, නියම කරනු ලබන ආකාරයකින් ලියාපදිංචි සහතිකයක් නිකුත් කළ යුතු ය.

(3) යම් තැනැත්තකු-

(අ) ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කරනු ලැබීමට සහ ක්‍රියාකරනු ලැබීමට යෝග්‍ය සහ සුදුසු තැනැත්තකු බවට; සහ

(ආ) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු වශයෙන් ලියාපදිංචිවීම සඳහා 14 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලැබිය යුතු වූ අවශ්‍යතාවලට අනුකූල වන බවට; සහ

(ඇ) නියම කරනු ලැබිය හැකි වෙනත් නිර්ණායකවලට අනුකූල වන බවට,

අධිකාරිය සෑහීමට පත් වන්නේනම් මිස, අධිකාරිය විසින් වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස එකී තැනැත්තාගේ ලියාපදිංචිය අලුත් නොකළ යුතු ය.

(4) අධිකාරිය විසින්, වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස යම් තැනැත්තකුගේ ලියාපදිංචිය, මේ කොටස යටතේ තවදුරටත් අලුත් කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීමට යටත්ව, අවුරුදු එකක ස්ථාවර කාලයක් සඳහා හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් කාලසීමාවක් සඳහා අලුත් කළ හැකි ය.

**17.** (1) අධිකාරිය විසින් වස්තුභංගත්ව වෘත්තිකයකු ලෙස තැනැත්තකුගේ ලියාපදිංචිය- ලියාපදිංචිය අවලංගු කිරීම

(අ) පහත දැක්වෙන සාධාරණ හේතු මත, එනම් -

(i) එකී තැනැත්තා මිය ගොස් ඇති බවට;

(ii) එකී තැනැත්තා සාවද්‍ය හෝ නොමඟ යවන සුලු නියෝජනයක් හෝ ප්‍රකාශයක් කරමින් ලියාපදිංචිය ලබා ගත් බවට;

(iii) එකී තැනැත්තා වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස ලියාපදිංචිය සඳහා 14 වන වගන්තිය යටතේ වන අවශ්‍යතා අඛණ්ඩව පවත්වාගෙන නොයන හෝ අඛණ්ඩව පවත්වා නොගත් තැනැත්තකු බවට;

(iv) එකී තැනැත්තා වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස ලියාපදිංචි කිරීමේ දී 15 වන වගන්තිය යටතේ තැනැත්තාට පනවන ලද කොන්දේසියක් එකී තැනැත්තා විසින් සපුරනු නොලබන බවට හෝ සපුරා නොමැති බවට;

(v) එකී තැනැත්තා 20 වන වගන්තියේ අවශ්‍යතාවලට අනුකූල නොවන බවට හෝ අනුකූල නොවූ බවට; හෝ

(vi) එකී තැනැත්තා ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කරනු ලැබීමට සහ ක්‍රියා කරනු ලැබීමට සුදුසු සහ යෝග්‍ය තැනැත්තකු නොවන බවට,

අධිකාරිය සෑහීමට පත් වන්නේ නම් ;

(ආ) 24 වන වගන්තිය යටතේ ගනු ලබන විනය ක්‍රියාමාර්ග ලෙස;

(ඇ) එකී තැනැත්තා 27 වන වගන්තිය යටතේ කරන ලද තහනම් ආඥාවකට යටත් වන්නේ නම්;

(ඈ) සමාගම් පනතේ 213 වන වගන්තිය යටතේ හෝ සමාගම් පනතේ 214 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් තැනැත්තා වෙත තහනමක් පනවා ඇත්නම්; හෝ

(ඉ) තැනැත්තා විසින් එසේ ඉල්ලා සිටින්නේ නම්,

අවලංගු කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචියක් අවලංගු කිරීම සම්බන්ධයෙන්, අධිකාරිය විසින් (අ)(ii), (අ)(iii) සහ (අ)(iv) යන ඡේදවල සඳහන් අවස්ථා ද ඇතුළත්ව -

(අ) කාරණාව පිළිබඳව කරුණු කියාපෑමට පූර්ව අවස්ථාවක් වස්තුභංගත්වභාවය පිළිබඳ වෘත්තිකයාට ලබා දීම; සහ

(ආ) අභියාචනා ඉදිරිපත් කිරීම,

සඳහා නියම කරනු ලැබිය යුතු යම් කාර්ය පටිපාටි අනුගමනය කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස යම් තැනැත්තකුගේ ලියාපදිංචිය අවලංගු කර ඇති තාක් කල්, එකී තැනැත්තා ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කරනු හෝ ක්‍රියා කරනු නොලැබිය යුතු ය.

ලියාපදිංචිය අත්හිටුවීම

**18.** (1) අධිකාරිය විසින් වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස යම් තැනැත්තකුගේ ලියාපදිංචිය -

(අ) 19(3) වන වගන්තිය යටතේ පළමු පියවර ලෙස;

(ආ) එකී තැනැත්තා විසින්, 14 වන වගන්තිය යටතේ වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස ලියාපදිංචිය පවත්වාගෙන යාමට සපුරාලිය යුතු අවශ්‍යතා අඛණ්ඩව සපුරනු නොලබන බවට හෝ අඛණ්ඩව සපුරා නොමැති බව සාධාරණ හේතු මත එය සෑහීමකට පත් වේ නම්;

(ඇ) එකී තැනැත්තා විසින්, 15 වන වගන්තිය යටතේ වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස එකී තැනැත්තා ලියාපදිංචි කිරීමේ දී පනවන ලද කොන්දේසියක් සපුරනු නොලබන බවට හෝ සපුරා නොමැති බවට සාධාරණ හේතු මත එය සෑහීමකට පත් වේ නම්;

(ඈ) එකී තැනැත්තා 20 වන වගන්තියේ අවශ්‍යතාවට අනුකූල නොවන හෝ ඊට අනුකූල නොවූ බවට සාධාරණ හේතු මත එය සෑහීමකට පත් වේ නම්;

(ඉ) 23 වන වගන්තිය යටතේ වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයාගේ ක්‍රියා කලාපය හෝ කාර්යසාධනය පිළිබඳව එය විසින් විමර්ශනයක් කරනු ලබන්නේ නම්; හෝ

(ඊ) 24 වන වගන්තිය යටතේ විනය ක්‍රියාමාර්ගයක් ලෙස,

අත්හිටුවීමේ කාලසීමාවේ නියම කරනු ලැබිය හැකි යම් සීමාකිරීමකට යටත්ව, අවශ්‍ය පරිදි යම් නියම සහ කොන්දේසි මත අත්හිටුවිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචියක් අත්හිටුවීම සම්බන්ධයෙන්, (අ), (ආ) සහ (ඇ) වන ඡේදවල සඳහන් අවස්ථා ද ඇතුළුව -

(අ) කාරණය සම්බන්ධයෙන් කරුණු කියාපෑමට පූර්ව අවස්ථාවක් වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයාට ලබා දීම; සහ

(ආ) අභියාචනා ඉදිරිපත් කිරීම,

සඳහා නියම කරනු ලැබිය හැකි කාර්ය පටිපාටි අධිකාරිය විසින් අනුගමනය කළ යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස තැනැත්තකුගේ ලියාපදිංචිය අත්හිටුවා ඇති තාක් කල්, එකී තැනැත්තා ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කරනු හෝ ක්‍රියා කරනු නොලැබිය යුතු ය.

(4) අධිකාරිය විසින්, අත්හිට වූ ලියාපදිංචිය නියම කරනු ලැබිය හැකි කාල හෝ අවස්ථාවල දී සහ කෙසේ වුවත් අත්හිටුවීම අවසන් කිරීමට නියමිත හෝ ඒ ආසන්න කාලයේ දී සමාලෝචනය කළ යුතු ය.

(5) අධිකාරිය විසින්, (4) වන උපවගන්තිය යටතේ අත්හිටවූ ලියාපදිංචියක් සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් -

(අ) කාරණාව පිළිබඳ කියාපෑමට වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයාට පූර්ව අවස්ථාවක් ලබා දීම; සහ

(ආ) අභියාචනා කිරීම,

ද ඇතුළුව නියම කරනු ලැබිය හැකි යම් කාර්යපටිපාටි අනුගමනය කරනු ලැබිය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ සමාලෝචනයක් සම්පූර්ණ කිරීමෙන් පසු අධිකාරිය විසින් අත්හිටුවීම අවසන් කිරීම හෝ නියම කරනු ලැබිය හැකි වූ අත්හිටුවීමේ කාලයේ යම් සීමා කිරීමකට යටත්ව, අත්හිටුවීම දීර්ඝ කිරීම, සිදු කළ හැකි ය.

වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන්ගේ ලේඛනය

**19.** (1) අධිකාරිය විසින් වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන්ගේ ලේඛනයක් තබා පවත්වාගෙන යා යුතු අතර, එහි වස්තුභංගත්වය පිළිබඳ සෑම වෘත්තිකයකුගේ නම, ලිපිනය සහ සුදුසුකම් ඇතුළත් කළ යුතු ය.

(2) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු, ඈවරකරුවකු හෝ දේපළ භාරගැනුම්කරුවකු ලෙස පත් කිරීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත, එකී පත්කිරීම පිළිබඳව වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයා විසින් අධිකාරියට ලිඛිතව දැන්විය යුතු ය.

(3) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු සම්බන්ධයෙන්, 21 වන වගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) ඡේදවල සඳහන් සිදුවීමක් පිළිබඳ දැන්වීමක් අධිකාරිය විසින් ලද අවස්ථාවක දී හෝ එවැනි සිදුවීම් කිසිවක් සිදුවී ඇති බවට සැක කිරීමට අධිකාරියට සාධාරණ හේතු පවතින අවස්ථාවක දී, අධිකාරිය විසින් (5) වන උපවගන්තියට යටත්ව, පහත පියවර, ඒවා නිශ්චිතව දක්වා ඇති අනුපිළිවෙළට ගත හැකි ය :-

(අ) පළමුව -

(i) (ඇ) ඡේදයේ (i) වන අනු ඡේදයේ සඳහන් ඉල්ලීම සම්බන්ධයෙන් අධිකරණය විසින් සුදුස්සක් කිරීම; හෝ

(ii) (ඇ)ඡේදයේ (ii) වන අනු ඡේදයේ සඳහන් තීරණය කිරීමට,

පොරොත්තුව ඇති විට දී වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයාගේ ලියාපදිංචිය අත්හිටුවීම;

(ආ) දෙවනුව, 23 වන වගන්තිය යටතේ පරීක්ෂණයක් සිදු කිරීම;

(ඇ) තෙවනුව -

(i) 27 වන වගන්තිය යටතේ අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කිරීම; හෝ

(ii) එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සුදුසු නොවන බවට තීරණය කිරීම.

(4) අධිකාරිය, (7) වන උපවගන්තියට යටත්ව, වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන්ගේ ලේඛනයේ නම ඇති තැනැත්තකුගේ නමට එරෙහිව පහත සඳහන් එක් එක් විශේෂ කරුණක් ඇතුළත් කළ යුතු ය :-

(අ) 18 වන වගන්තිය යටතේ වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස තැනැත්තාගේ ලියාපදිංචිය අත්හිටුවා ඇති බව;

(ආ) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස තැනැත්තාගේ ලියාපදිංචිය 17 වන වගන්තිය යටතේ අවලංගු කර ඇති බව හෝ අලුත් කිරීමකින් තොරව වෙනත් ආකාරයකින් අවසන් කර ඇති බව;

(ඇ) වෘත්තීය ආයතනයක් විසින් එකී තැනැත්තා වෘත්තියෙහි යෙදීම අත්හිටුවා හෝ ඉන් ඉවත් කර ඇති බව හෝ එකී තැනැත්තා වෘත්තියෙහි යෙදීම අත්හිටුවා හෝ වෘත්තියෙහි යෙදීමෙන් ඉවත් කර ඇති බවට යම් වෘත්තීය ආයතනයක් විසින් අධිකාරියට උපදෙස් දී ඇති බව;

(ඈ) එකී තැනැත්තා 27 වන වගන්තිය යටතේ සාදන ලද තහනම් ආඥාවකට යටත් කර ඇති බව;

(ඉ) එකී තැනැත්තාව, සමාගම් පනතේ 213 වන වගන්තිය යටතේ හෝ සමාගම් පනතේ 214 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් ධුර දරන්නකු ලෙස පත් කිරීම හෝ ක්‍රියා කිරීම තහනම් කර ඇති බව;

(ඊ) එකී තැනැත්තා වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස කටයුතු කිරීම නතර කර ඇති බව;

(උ) එකී තැනැත්තා මිය ගොස් ඇති බව.

(5) (4) වන උපවගන්තියේ (ඊ) වන ඡේදයේ කාර්යය සඳහා, ධුර දරන්නකු ලෙස පත් කරන ලද හෝ ක්‍රියා කරනු ලබන තැනැත්තකු වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස වෘත්තියෙහි යෙදී සිටිනු ලබන ලෙසට සලකනු ලැබිය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුගේ නමට එරෙහිව යම් සටහනක් ඇතුළත් කිරීමක් සිදු කර ඇති අවස්ථාවක සහ -

(අ) අනුරූප තත්ත්වයන් තවදුරටත් නොපවතින බවට; හෝ

(ආ) සටහන් ඇතුළත් කිරීම වැරදි සහගත බවට,

අධිකාරිය සෑහීමට පත් වේ නම්, අධිකාරිය විසින් ඒ අනුව, එම ලේඛනය සංශෝධනය කළ යුතු ය.

(7) යම් තැනැත්තකු වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස කටයුතු කිරීම නවතා ඇති අවස්ථාවක සහ (4) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ එම තැනැත්තාගේ නමට එරෙහිව අනුරූප සටහනක් ඇතුළත් කර ඇති අවස්ථාවක, (6) වන උපවගන්තිය එම ඇතුළත් කිරීමට අදාළ නොවන්නේ නම්, එම උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ) සහ (උ) වන ඡේදවල සඳහන් කර ඇති යම් කරුණක් පිළිබඳ සටහනක් අධිකාරිය විසින් එම තැනැත්තාගේ නමට එරෙහිව ඇතුළත් නොකළ යුතු ය.

(8) ප්‍රවේශය, පරීක්ෂා කිරීම, සංඛ්‍යාලේඛන තැබීමේ කාර්ය සහ පර්යේෂණ කාර්ය සඳහා තෙවන පාර්ශ්වයකට වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන්ගේ ලේඛනය ලබා දිය යුතු ප්‍රමාණය සහ ආකාරය නියම කළ හැකි පරිදි විය යුතු ය.

රක්ෂණය

**20.** (1) මේ පනත යටතේ වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු විසින් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ඇරීමට සිදු වන වගකීමට එරෙහිව වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු සුදුසු රක්ෂණයක් පවත්වාගත යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා සුදුසු රක්ෂණයක අවශ්‍යතා පිළිබඳව අධිකාරිය විසින් වරින් වර මාර්ගෝපදේශ නිකුත් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තියට අනුකූල වීමට අපොහොසත් වන වස්තුභංගත්ව වෘත්තිකයකු වරදක් සිදු කරන්නේ ය.

නිශ්චිත සිදුවීම් පිළිබඳ දැන්වීම

**21.** (1) මේ වගන්තියෙහි, “නිශ්චිත සිදුවීම” යන්නෙන්, නියම කරනු ලැබිය හැකි යම් එක් එක් සිද්ධියක් අදහස් වේ.

(2) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු විසින්, නියම කරනු ලැබිය හැකි යම් ආකාරයට, පහත සඳහන් සිද්ධි පිළිබඳව අධිකාරියට දන්වනු ලැබිය යුතුය:-

(අ) කාර්යයකට අනුකූලවන ලෙසට 264 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය, 363 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ 405 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ තැනැත්තකුට එරෙහිව අධිකරණමය ආඥාවක් කිරීම;

(ආ) 265 වන, 364 වන, හෝ 406 වන වගන්ති යටතේ තැනැත්තකුට එරෙහිව අධිකරණමය ආඥාවක් කිරීම;

(ඇ) 27 වන වගන්තිය යටතේ තැනැත්තකුට එරෙහිව තහනම් ආඥාවක් කිරීම;

(ඈ) තැනැත්තකුට එරෙහිව සමාගම් පනතේ 214 වන වගන්තිය යටතේ අධිකරණමය ආඥාවක් කිරීම;

(ඉ) වෘත්තීය ආයතනයක් විසින් තැනැත්තකු වෘත්තියේ යෙදීම අත්හිටුවීම හෝ ඉන් ඉවත් කිරීම;

(ඊ) 254 වන වගන්තිය යටතේ තැනැත්තකු ධූරයෙන් ඉවත් කිරීම;

(උ) 255 වන හෝ 307 වන වගන්තිය යටතේ තැනැත්තකු ධූරයෙන් ඉවත් කිරීම; සහ

(ඊ) වෙනත් නිශ්චිත සිද්ධියක් සිදුවීම.

(3) (2) වන උපවගන්තිය යටතේ දැන්වීමක් -

(අ) එම සිද්ධිය සිදුවීම පිළිබඳව වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයා දැනගත් දින; හෝ

(ආ) ඉන් පෙර නම්, එම සිද්ධිය සිදුවීම පිළිබඳව වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයා දැන ගනු ඇතැයි සාධාරණ වශයෙන් අපේක්ෂා කරනු ලබන දින,

සිට වැඩ කරන දින පහක් ඇතුළත කළ යුතු ය.

(4) මේ වගන්තියට අනුකූල වීමට අපොහොසත් වන වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු වරදක් සිදු කරන්නේ ය.

වෙනත් සිද්ධි පිළිබඳ දැන්වීම

**22.** වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයාගේ මතය අනුව අධිකාරිය වෙත දැනුම් දිය යුතු වන යම් කාරණාවක් නිශ්චිතව දක්වාලමින් වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයා විසින් අධිකාරිය වෙත වාර්තාවක් යැවිය හැකි ය.

ක්‍රියාකලාපය සහ කාර්යසාධනය පිළිබඳ පරීක්ෂණය

**23.** (1) 19 වන හෝ 24 වන වගන්තිය යටතේ එසේ කිරීමට අවසර දී ඇති විට, වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකුගේ හෝ වස්තුභංගත්වය පිළිබඳ හිටපු වෘත්තිකයකුගේ ක්‍රියාකලාපය හෝ කාර්යසාධනය පිළිබඳව අධිකාරිය විසින් පරීක්ෂණ සිදු කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පරීක්ෂණයක් කිරීමේ කාර්යය සඳහා අධිකාරිය විසින්, ලිඛිත දැන්වීමක් මගින් , වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයාගේ හෝ හිටපු වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයාගේ ක්‍රියාකලාපය හෝ කාර්යසාධනය පිළිබඳ දැනුමක් ඇති හෝ තිබිය හැකි තැනැත්තකුගෙන් (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රියාවක්, එය සාධාරණ වන්නේ නම් හා සාධාරණ වන තාක් දුරට, සිදු කරන ලෙසට ඉල්ලා සිටිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් ක්‍රියා වනුයේ-

(අ) අධිකාරිය විසින් ඉල්ලා සිටිය හැකි වේලාවක සහ ස්ථානයකදී අධිකාරිය හමුවට පැමිණීම;

(ආ) අධිකාරිය විසින් ඉල්ලා සිටිය හැකි පරිදි, වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයාගේ හෝ

හිටපු වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයාගේ ක්‍රියාකලාපය හෝ කාර්යසාධනය පිළිබඳ යම් තොරතුරු අධිකාරියට ලබා දීම;

(ඇ) අධිකාරිය ඉල්ලා සිටිය හැකි පරිදි ණයකරුගේ කටයුතු, ව්‍යාපාර, දේපළ හෝ මූල්‍ය තත්ත්වයන් පිළිබඳ යම් තොරතුරු අධිකාරියට ලබා දීම;

(ඈ) ණයකරුගේ කටයුතු, ව්‍යාපාර, දේපළ හෝ මූල්‍ය තත්ත්වයන් හෝ වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයාගේ හෝ හිටපු වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයාගේ ක්‍රියාකලාපය සහ කාර්යසාධනය හා සම්බන්ධ යම් කාරණාවක් සම්බන්ධයෙන් දිවුරුමක් මත සහ සාක්ෂි දීම සහ වෙනත් පරිපාටිමය කරුණු පිළිබඳ නියම කරනු ලැබිය හැකි රීතිවලට යටත්ව අධිකාරියේ නියෝජිතයකු විසින් දිවුරුමක් මත කරනු ලබන සාක්ෂි විමසීමකට ලක්වීම;

(ඉ) දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් මත ප්‍රකාශයක් සැපයීම;

(ඊ) යම් තැනැත්තකුගේ උපරිම හැකියාව පරිදි අධිකාරියේ පරීක්ෂණයකට අධිකාරියට සහාය වීම.

(4) අධිකාරිය විසින්, (3) වන උපවගන්තියේ (ආ) හෝ (ඇ) ඡේදයේ සඳහන් තැනැත්තකුට, (3) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමකට අනුකූලවීමේ දී දැරීමට සිදු වන සාධාරණ ගමන් වියදම් හා වෙනත් වියදම් අධිකාරිය විසින් ඇති කරනු ලැබ ඇති අනුප්‍රමාණ මත ගෙවිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ සද්භාවයෙන් තොරතුරක් හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට එරෙහිව කිසිදු සිවිල්, අපරාධ නඩු කටයුත්තක් හෝ වෙනත් නීති කෘත්‍යයක් හෝ වෘත්තීයමය ක්‍රියාකලාපය සම්බන්ධයෙන් බලය ඇති යම් වෘත්තීය ආයතනයක් හෝ අධිකාරියක් විසින් සිදු කරන විනය ක්‍රියාමාර්ගයක් ද ඇතුළුව වෙනත් ක්‍රියාමාර්ගයක් පවරනු නොලැබිය යුතු ය.

(6) අධිකාරියේ ඉල්ලීම මත මේ වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමකට අනුකූලවීම පැහැර හරින තැනැත්තකුට, -

(අ) 4 වන වගන්තියේ දක්වා ඇති කර්තව්‍ය එකක් හෝ ඊට වැඩි ගණනක් අධිකාරිය විසින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ විට; සහ

(ආ) තැනැත්තාට අසාධාරණ පීඩාකාරිත්වයක් ගෙන නොදෙන්නා වූ බවට අධිකරණය සෑහීමට පත් වන විට,

එකී ඉල්ලීමට අනුකූල වන ලෙසට හෝ නියම කරනු ලැබිය හැකි සාක්ෂි සහ වෙනත් කාර්යපටිපාටි රීති යටතේ, අධිකරණයට පැමිණ දිවුරුම් දීම මත විභාග කිරීමකට ලක් වන ලෙසට අධිකරණය විසින් නියෝග කළ හැකි ය.

විනය ක්‍රියාමාර්ග

**24.** (1) මේ වගන්තියේ "විනය ක්‍රියාමාර්ග" යන්නෙන්-

(අ) අධිකරණයට ඉල්ලීමක් කිරීම ද ඇතුළුව නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, නියම කරනු ලැබිය හැකි යම් හේතු මත සහ යම් ස්වභාවයේ වන විනය දණ්ඩන පැනවීම;

(ආ) අධිකරණයට -

(i) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ධුරයෙන් ඉවත් කිරීම;

(ii) 27 වන වගන්තිය යටතේ තහනම් ආඥාවක් පැනවීම,

සඳහා ඉල්ලීමක් කිරීම

අදහස් වේ.

(2) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු හෝ හිටපු වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු -

(අ) විසින් වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වී සිටිය දී, 15 වන වගන්තිය යටතේ එකී තැනැත්තාගේ ලියාපදිංචිය මත පනවන ලද කොන්දේසියක් ඉටු නොකරනු ලබන බවට, අඛණ්ඩව ඉටු නොකරනු ලබන බවට හෝ අඛණ්ඩව ඉටු නොකළ බවට හෝ ඉටු නොකළ බවට;

(ආ) විසින්- (i) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක්, ප්‍රමිතියක්, චර්යා ධර්ම මාලාවක්, මාර්ගෝපදේශ හෝ ප්‍රායෝගික උපදෙස්;

(ii) වෙනත් ලිඛිත නීතියක්; හෝ

(iii) අධිකරණයේ යම් ආඥාවක් හෝ, විධානයක්,

යටතේ වන නියමයක් උල්ලංඝනය කරනු ලබන බවට හෝ උල්ලංඝනය කළ බවට;

(ඇ) ට එරෙහිව 264 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය, 363 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ 405 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ යම් කාර්යයකට අනුකූල වන ලෙසට අධිකරණ ආඥාවක් කර ඇති බවට;

(ඈ) ට එරෙහිව 265 වන, 364 වන හෝ 406 වන වගන්තිය යටතේ අධිකරණ ආඥාවක් සිදු කර ඇති බවට;

(ඉ) 27 වන වගන්තිය යටතේ තහනම් ආඥාවකට යටත් කර ඇති බවට;

(ඊ) සමාගම් පනතේ 213 වන වගන්තිය යටතේ හෝ සමාගම් පනතේ 214 වන වගන්තිය යටතේ කරනු ලබන ආඥාවක් මගින් ධුර දරන්නකු ලෙස පත් කිරීම හෝ ක්‍රියා කිරීම තහනම් කර ඇති බවට; හෝ

(උ) විසින් අධිකාරියේ විධානයකට අනුකූලවීම සැලකිය යුතු ප්‍රමාණයෙන් පැහැර හරින බවට හෝ පැහැර හැර ඇති බවට,

අධිකාරිය විසින්, (3) වන උපවගන්තියට යටත්ව, නිශ්චය කරන විට හෝ නිශ්චය කිරීමට සාධාරණ හේතු ඇති බවට තීරණය කරනු ලබන අවස්ථාවක දී අධිකාරිය විසින් -

(ඌ) 23 වන වගන්තිය යටතේ පරීක්ෂණයක් කිරීම; සහ

(එ) අවශ්‍ය විය හැකි පරිදි එවැනි යම් ක්‍රියාමාර්ග ගැනීම,

කළ හැකි ය.

(3) හිටපු වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු සම්බන්ධයෙන් වන විට, එකී වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයා වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස කටයුතු කිරීම අවසන් වී වසර හයකට වඩා වැඩි කාලයකට පෙර සිදු වූ කාරණාවකට අදාළව (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ කාර්ය සඳහා, කවර හෝ අවස්ථාවක දී, ලියාපදිංචි වී හෝ නොවී වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකුගේ කාර්ය ඉටු කරන තැනැත්තකු එම අවස්ථාවේ දී වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයකු ලෙස කටයුතු කරනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ, එක් කාරණාවක් සම්බන්ධයෙන් අධිකාරියට විනය ක්‍රියාමාර්ග එකක් හෝ කිහිපයක් ගත හැකි ය.

(6) (2) වන උපවගන්තිය යටතේ විනය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන්, අධිකාරිය -

(අ) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයාට මෙම කාරණය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට පූර්ව අවස්ථාවක් ලබා දීම; සහ

(ආ) අභියාචනා ඉදිරිපත් කිරීම,

ඇතුළුව නියම කරනු ලැබිය හැකි ක්‍රියාපටිපාටි අනුගමනය කළ යුතු ය.

අර්ථ නිරූපණය

**25.** මෙම පරිච්ඡේදයේ කාර්ය සඳහා, අධිකාරියට කරනු ලබන යම් සඳහනකට, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, අධිකාරියේ කමිටුවක් සඳහා කරන ලද සඳහනක් ද ඇතුළත් විය යුතු ය.

4 වන පරිච්ඡේදය

**ආයතනික වැඩපිළිවෙළ: විවිධ**

අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඇවරකරු ලෙස පත් කරනු ලැබීමට පෙලඹවීම

**26.** (1) (2) වන උපවගන්තියට යටත්ව, යම් සමාගමක අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඇවරකරු ලෙසට තමා පත්කරනු ලැබීම සහතික කරගනු ලැබීමට හෝ වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබීම සහතික කිරීම හෝ පත් කරනු ලැබීම වැළැක්වීම සඳහා සමාගමක යම් සහදායකයකු හෝ ණයහිමියකුට යම් ත්‍යාගයක් ලබා දෙන හෝ ලබා දීමට එකඟ වන හෝ ලබා දීමට අර්පණය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන්නේ ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඇවරකරුවකු ලෙස කටයුතු කිරීම සඳහා සද්භාවයෙන් යුතුව පාරිශ්‍රමික පිළිබඳ කතිකා කිරීම හෝ සාකච්ඡා කිරීම මගින් (1) වන උපවගන්තිය උල්ලංඝනය වීමක් ස්ථාපනය නොවිය යුතු ය.

තහනම් නියෝග

**27.** (1) අධිකාරියේ ඉල්ලීම මත යම් තැනැත්තකු (2) වන උපවගන්තියේ කොන්දේසිය සපුරාලන බවට අධිකරණය සෑහීමකට පත් වන අවස්ථාවක, අධිකරණය විසින්, වසර පහකට නොවැඩි කාලයක් සඳහා එකී තැනැත්තා සම්බන්ධයෙන් තහනම් ආඥාවක් පැනවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති කොන්දේසි වනුයේ, 264 වන, 363 වන, සහ 405 වන වගන්තිවල කාර්ය එකක් හෝ කිහිපයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු -

(අ) අනුකූලවීමට අඛණ්ඩව පැහැර හැරීම; හෝ

(ආ) අනුකූලවීම පැහැර හැර ඇති කරුණුවල බරපතලකම,

යන හේතු මත ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කරනු ලැබීමට හෝ ක්‍රියා කිරීමට එකී තැනැත්තා සුදුසු නොවීම ය.

(3) තහනම් ආඥාවක් අදාළ වන තැනැත්තකු ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කිරීම හෝ ඔහු එලෙස ක්‍රියා කිරීම නොකළ යුතු ය.

(4) තහනම් ආඥාවක් කිරීමේ දී, අධිකරණයට අවශ්‍ය පරිදි -

(අ) ආඥාව බලාත්මක වන කාලය සම්බන්ධයෙන් නියම හෝ කොන්දේසියක් පැනවීම සිදු කරනු ලැබිය හැකි ය;

(ආ) ඒ හා සම්බන්ධිත වෙනත් ආඥාවක් පැනවීම කරනු ලැබිය හැකිය.

(5) සෑම තහනම් ආඥාවක ම පිටපතක්, ආඥාව නිකුත් කිරීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත, අධිකරණය විසින් අධිකාරිය වෙත එවිය යුතු ය.

(6) පූර්වගාමී වසර පහක කාලය තුළ දෙවරක් හෝ ඊට වැඩි වාරයක් -

(අ) යම් කාර්යයකට අනුකූලව ක්‍රියා කරන ලෙසට 264 වන, 364 වන සහ 405 වන වගන්ති යටතේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක; හෝ

(ආ) (අ) හි සඳහන් කළ යම් වගන්තියක් යටතේ යම් තැනැත්තා සම්බන්ධයෙන් යම් කාර්යයකට අනුකූල වීමේ නියෝගයක් සඳහා වන ඉල්ලීමක් කර ඇති විට සහ එම එක් එක් අවස්ථාවේ දී ඉල්ලීම කිරීමෙන් පසුව සහ විභාගයට පෙර අදාළ කාර්යයට අනුකූලව තැනැත්තා කටයුතු ඇති අවස්ථාවකදී,

පටහැනිව යම් විශේෂ හේතු දක්වා නොමැති නම් (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්ය සඳහා එකී තැනැත්තා විසින් එකී අවස්ථාවලට අනුකූල වීම අඛණ්ඩව පැහැර හැර ඇති බවට එය සාක්ෂියක් ලෙසට සලකනු ලැබිය යුතු ය.

(7) තහනම් ආඥාවකට අනුකූල වීම පැහැර හරින යම් තැනැත්තකු වරදක් සිදු කරන්නේ ය.

අභියාචනා

**28.** මේ කොටස යටතේ අධිකාරියේ යම් ක්‍රියාවක් හෝ තීරණයක් සම්බන්ධයෙන් වන අභියාචනයක් දිසා අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

එසේ කිරීමට අවසර නොමැති විට ක්‍රියා කිරීම

**29.** ධුර දරන්නකු ලෙස පත් කරනු ලැබීමට හෝ ක්‍රියා කරනු ලැබීමට අවසර නොමැති අවස්ථාවක දී ධුර දරන්නෙකු ලෙස පත් කරන ලද හෝ ක්‍රියා කරනු ලබන තැනැත්තකු වරදක් සිදු කරන්නේ ය.

සම්බන්ධතා ප්‍රකාශය

**30.** (1) නියම කරනු ලැබිය හැකි මට්ටමේ විස්තර සහිත තැනැත්තකු විසින් අත්සන් කරන ලද සම්බන්ධතා ප්‍රකාශයක් මගින් -

(අ) සම්බන්ධතා ප්‍රකාශය අවශ්‍ය වන භූමිකාවට අදාළව, තැනැත්තාගේ සම්බන්ධතා සමග ගැටුමක් ඇති කරවන හෝ ඇති වීමට ඉඩ ඇති ලෙස සාධාරණව වටහා ගත හැකි එක් එක් තත්ත්වයන්, බැඳියා හෝ වෙනත් කරුණක් හෝ කාරණයක්;

(ආ) එවැනි එක් එක් සම්බන්ධතා ගැටුමේ ස්වභාවය; සහ

(ඇ) තැනැත්තා එවැනි එක් එක් සම්බන්ධතා ගැටුම කළමනාකරණය කිරීමට අදහස් කරන්නේ කෙසේද යන්න,

හෙළිදරව් කළ යුතු ය.

(2) තැනැත්තකු සම්බන්ධතා ප්‍රකාශයක් අත්සන් කිරීමට පෙර, එම සම්බන්ධතා ප්‍රකාශය සම්පූර්ණ බවට වගබලා ගැනීම සඳහා තැනැත්තා විසින් සාධාරණ ලෙස අවශ්‍ය වන විමසීම් කරනු ලැබිය යුතු ය.

(3) සම්බන්ධතා ප්‍රකාශයක් අත්සන් කරනු ලබන යම් තැනැත්තෙක්, -

(අ) එකී සම්බන්ධතා ප්‍රකාශය අසත්‍ය හෝ නිසැකවම නොමඟ යවන සුලු වන්නේ නම්; සහ

(ආ) එකී තැනැත්තා -

(i) එම සම්බන්ධතා ප්‍රකාශය නිසැකව ම අසත්‍ය බවට හෝ නොමඟ යවන සුලු බවට දැනගෙන සිටින්නේ නම්; හෝ

(ii) යම් කරුණක් හෝ කාරණාවක් හෙළිදරව් කිරීම අත්හැරීම මගින්, එම සම්බන්ධතා ප්‍රකාශය අසත්‍ය බවට හෝ නොමඟ යවන සුලු බවට පත් වන බව දනිමින් ම එම හෙළිදරව් කිරීම අත්හරින්නේ නම්,

වරදක් සිදු කරන්නේ ය.

පූර්ව අද්මිනිස්ත්‍රාසි වියදම් පිළිබඳ ප්‍රකාශය

**31.** සකස් කර ඇත්නම්, පූර්ව අද්මිනිස්ත්‍රාසි වියදම් පිළිබඳ ප්‍රකාශයකට, පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු ය:-

(අ) වියදම්, ගාස්තු සහ පිරිවැය දරනු ලැබුවේ සහ පාරිශ්‍රමික ගෙවනු ලැබුවේ කවර කාර්යයක් සම්බන්ධයෙන් ද හෝ ගිවිසුමක් යටතේ ද, එම කාර්යය සහ ගිවිසුම පිළිබඳ විස්තර;

(ආ) (i) සමාගමේ අද්මිනිස්ත්‍රාසිකරණය ආරම්භ කිරීමට පෙර; සහ

(ii) 178 වන වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ අරමුණ ඇතිව,

කටයුතු කරන ලද්දේ ඇයි ද යන්න පිළිබඳව පැහැදිලි කිරීමක්;

(ඇ) (i) දරන ලද වියදම්, ගාස්තු සහ පිරිවැය; සහ

(ii) අය කරන ලද පාරිශ්‍රමිකය,

වෙන් වෙන්ව දක්වාලමින් පූර්ව අද්මිනිස්ත්‍රාසිකරණ වියදම්වල නොගෙවූ ප්‍රමාණ;

(ඈ) (i) දරන ලද ගාස්තු, වියදම් සහ පිරිවැය; සහ

(ii) අයකරන ලද පාරිශ්‍රමික,

වෙන් වෙන්ව දක්වාලමින් පූර්ව අද්මිනිස්ත්‍රාසිකරණ වියදම්වල කලින් ගෙවන ලද ප්‍රමාණ (ඇත්නම්);

(ඉ) නියම කරනු ලැබිය හැකි වෙනත් තොරතුරු.

## II වන කොටස

### පුද්ගලික වස්තුභංගත්ව : මූලධර්ම

පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටි යටතේ ණයකරුවකුගේ වගකීම

**32.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියක පාර්ශ්වකරුවකු වන ණය ගැනුම්කරුවකු මෙම වගන්තියේ දක්වා ඇති බැඳීම්වලට යටත් වන්නේ ය.

(2) යම් පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියකට සහභාගී වන ණයකරුවකු -

(අ) 33 වන වගන්තිය ප්‍රකාරව සහ මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් ප්‍රකාරව, තම ආදායම, දේපළ සහ වගකීම් ද හෙළිදරව් කරමින් ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ සම්පූර්ණ ප්‍රකාශයක් පුද්ගලික වස්තුභංගත්වය පිළිබඳ නිලධාරියකුට සහ අධිකරණයට ලබා දීමට;

(ආ) ණයකරුගේ වියදම් සහ ආදායම් මූලාශ්‍ර සම්බන්ධයෙන් පුද්ගලික වස්තුභංගත්වය පිළිබඳ නිලධරයකු ඉල්ලා සිටිනු ලැබිය හැකි යම් තොරතුරක් අදාළ පුද්ගලික වස්තුභංගත්වය පිළිබඳ නිලධරයාට ලබා දීමට; සහ

(ඇ) පුද්ගලික වස්තුභංගත්වය පිළිබඳ නිලධරයාට සාධාරණ ලෙස අවශ්‍ය වන යම් වාර්තා, ගිණුම් සහ ලේඛන ලබා දීමට,

බැඳී සිටින්නේ ය.

(3) යම් පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියකට සහභාගී වන ණයකරුවකු, කාර්යපටිපාටියට සම්පූර්ණයෙන් ම සහයෝගය දැක්විය යුතු වන අතර-

(අ) ණයකරු සම්බන්ධයෙන් කාර්යපටිපාටිය අදාළ කර ගැනීම සඳහා වන ඉල්ලීම; හෝ

(ආ) පුද්ගලික වස්තුභංගත්වය පිළිබඳ නිලධරයාගේ කර්තව්‍ය ඉටු කිරීම,

සඳහා අවශ්‍ය වන සහාය, ලේඛන සහ තොරතුරු සැපයීම සම්බන්ධයෙන් පුද්ගලික වස්තුභංගත්වය පිළිබඳ නිලධරයාගේ යම් සාධාරණ ඉල්ලීමකට අනුකූල විය යුතු ය.

(4) ණයකරු විසින් කරගෙන යන සාමාන්‍ය ව්‍යාපාර කටයුතු හෝ ණයකරුගේ සාමාන්‍ය පවුල් කටයුතුවල දී හැර, පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියක් ආරම්භ කිරීමෙන් පසු යම් අවස්ථාවක-

(අ) යම් දේපළක් ණයකරු විසින් අත්පත් කර ගනු ලබනන්නේ නම්; හෝ

(ආ) ණයගැනුම්කරුගේ මූල්‍ය තත්ත්වයන්හි වෙනත් කිසියම් වැදගත් හා අනපේක්ෂිත වෙනසක් සිදු වන්නේ නම්,

ණයකරු විසින් ප්‍රායෝගිකව සාධාරණ වන හැකි ඉක්මණින් අදාළ පුද්ගලික වස්තුභංගත්වය පිළිබඳ නිලධරයාට, අවස්ථාවෝචිතව, දේපළ පිළිබඳව හෝ ණයකරුගේ ආදායම වැඩි වීම පිළිබඳව ලිඛිතව දැනුම්දිය යුතු ය.

(5) පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියක් ආරම්භ කිරීමෙන් පසු යම් අවස්ථාවක දී, ණයකරුගේ ලිපිනය, රැකියාව, නම හෝ වෙනත් වැදගත් පුද්ගලික තොරතුරුවල වෙනසක් සිදු වූ අවස්ථාවක දී, ණයකරු විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් අදාළ පුද්ගලික වස්තුභංගත්වය පිළිබඳ නිලධරයාට වෙනස් වූ තොරතුරු පිළිබඳව ලිඛිතව දැන්විය යුතු ය.

(6) පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියක පාර්ශ්වකරුවකු වන ණයකරුවකු විසින් ණයකරුගේ මූල්‍ය කටයුතු ප්‍රකාශයේ යම් වැදගත් සාවද්‍යතාවයක් හෝ මඟහැරීමක් පිළිබඳව දැන ගැනීමෙන් පසු ප්‍රායෝගිකව සාධාරණ වන හැකි ඉක්මනින් ඒ බව අදාළ පුද්ගලික වස්තුභංගත්වය පිළිබඳ නිලධරයාට දැනුම් දිය යුතු ය.

(7) ණයකරු විසින් ණයකරුගේ දේපළ සහ ආදායම සම්බන්ධයෙන් -

(අ) මේ පනත යටතේ නියම කර ඇති;

(ආ) නියෝග මගින් නියම කර ඇති;

(ඇ) විශේෂිත වස්තුභංගත්ව කාර්යපටිපාටියක් දක්වාලමින් කරන ලද අධිකරණ ආඥාවක් මගින් විධානය කරන ලද;

(ඈ) අදාළ පුද්ගලික වස්තුභංගත්වය පිළිබඳ නිලධරයා විසින් සාධාරණ ලෙස නියම කරනු ලබන,

සියලු පියවර ගත යුතු ය.

(8) පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියක පාර්ශ්වකරුවකු වන ණයකරුවකු විසින් -

(අ) ඇතුළත් කළ ණය සම්බන්ධයෙන්, කාර්ය පටිපාටියේ නියම යටතේ පුද්ගලික වස්තුභංගත්ව පිළිබඳ නිලධරයකු හරහා හැර, රුපියල් දසදහසක වටිනාකමක් හෝ නියම කරනු ලැබිය හැකි ඊට ඉහළ අගයකට වඩා වැඩි අතිරේක ගෙවීමක් මුදලින් හෝ ද්‍රව්‍ය ආකාරයෙන් ණයහිමියාට නොගෙවිය යුතු ය; සහ

(ආ) කාර්යපටිපාටියේ නියම යටතේ, පුද්ගලික වස්තුභංගත්වය පිළිබඳ නිලධරයා හරහා හැර, රුපියල් දසදහසක වටිනාකමක් හෝ නියම කරනු ලැබිය හැකි ඊට ඉහළ අගයකට දේපළක අයිතිය පැවරීම, දේපළ බඳු දීම, දේපළෙහි ආරක්ෂාව පැවරීම හෝ දේපළ වෙනත් ආකාරයකින් බැහැර කිරීම නොකළ යුතු ය.

(9) පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියක පාර්ශ්වකරුවකු වන ණයකරුවකු විසින්, තනිව හෝ වෙනත් යම් තැනැත්තකු සමග එක්ව, රුපියල් පනස් දහසක් හෝ නියම කරනු ලැබිය හැකි ඊට ඉහළ අගයක ණයක් යම් තැනැත්තකුගෙන්, ණයකරු පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියක පාර්ශ්වකරුවකු බව එකී තැනැත්තාට දැන්වීමෙන් තොරව, නොගත යුතු ය.

(10) ණය පුනරුත්ථාපන නියෝගයක හෝ බංකොලොත්භාවය පිළිබඳ නියෝගයක පාර්ශ්වකරුවකු වන ණයකරුවකු, අවශ්‍ය පරිදි යම් නියම සහ කොන්දේසි මත අවසරය ප්‍රදානය කරනු ලැබිය හැකි අධිකරණයක අවසරය ප්‍රථමයෙන් ලබා ගෙන මිස, ශ්‍රී ලංකාව හැර නොයා යුතු ය.

ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශය

**33**. (1) නියම කරනු ලැබිය හැකි අතිරේක විස්තරයකට යටත්ව සහ මේ පනතේ යම් විධිවිධානයක් මගින් හෝ අධිකරණ නියෝගයක් මගින් අන්‍යාකාරයෙන් නියම කර ඇත්නම් මිස, III වන, IV වන, V වන, VI වන, VIII වන සහ IX වන කොටස්වල කාර්ය සඳහා ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශයට-

(අ) ණයහිමියන්ගේ ලැයිස්තුවක්;

(ආ) ණයකරුගේ දේපළ පිළිබඳ විස්තර ඇතුළත් උපලේඛනයක්;

(ඇ) ණයකරුගේ ණය සහ වෙනත් බැරකම් ඇතුළත් උපලේඛනයක්;

(ඈ) වත්මන් ආදායම සහ වත්මන් වියදම් පිළිබඳ උප ලේඛනයක්;

(ඉ) මාසික අතිරික්ත ආදායමේ ප්‍රමාණය පිළිබඳ, එම මුදල ගණනය කරන ආකාරය පෙන්වමින් අයිතමගත කරන ලද, ප්‍රකාශයක්;

(ඊ) මේ පනත යටතේ වන කාර්යපටිපාටියක් යටතේ ඉල්ලීමක් කළ හෝ යෝජනාවක් සකස් කළ දින සිට මාස දොළහක කාලයක් තුළ සාධාරණ ලෙස අපේක්ෂිත ආදායමේ හෝ වියදම්වල යම් වැඩිවීමක් අනාවරණය කරමින් කරන ප්‍රකාශයක්;

(උ) වෙනත් තැනැත්තකුගේ ණය සම්බන්ධයෙන් ණයකරු විසින් ලබා දෙන යම් ඇපකරයක්; සහ

(ඌ) ණය සම්බන්ධයෙන් එක් එක් ණයහිමියා විසින් රඳවා ගත් සුරැකුම්, ඇත්නම්,

ඇතුළත් විය යුතු ය.

(2) දිවුරුම් පෙත්සමක් මගින් සනාථ කළ යුතු මූල්‍ය කටයුතු ප්‍රකාශය නියමිත ආකෘතියට අනුව තිබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධානයක් මගින් ඉල්ලීමකට, පෙත්සමකට, යෝජනාවකට හෝ III වන, IV වන, V වන, VI වන, VIII වන සහ IX වන කොටස් යටතේ ක්‍රියාපටිපාටියකට අදාළව ණයකරුගේ කටයුතු පිළිබඳ ප්‍රකාශයක් සකස් කිරීම නියම කරනු ලබන වන විට-

(අ) ඉල්ලීම, පෙත්සම හෝ යෝජනාව ඉදිරිපත් කිරීමට; හෝ

(ආ) ක්‍රියාපටිපාටිය ආරම්භ වීමට,

දින අනූවකට පෙරාතුව නොවන දිනයක් සඳහා නියමිත තොරතුරු එවැනි ප්‍රකාශයක් මගින් දැක්විය යුතු ය.

**34.** (1) (4) වන උපවගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇති ණයකරුගේ දේපළ වර්ග - ආරක්ෂිත දේපළ

(අ) 66 වන වගන්තිය යටතේ ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා ණයකරුගේ යෝග්‍යතාව නිශ්චය කිරීමේ;

(ආ) 46 වන වගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක නියම සකස් කිරීමේ; සහ

(ඇ) 115 වන වගන්තිය යටතේ බංකොලොත්භාවයට යටත් දේපළෙහි සංයුතිය නිශ්චය කිරීමේ,

කාර්ය සඳහා ආරක්ෂිත දේපළ විය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ ආරක්ෂිත දේපළ -

(අ) 115 වන වගන්තිය යටතේ බංකොලොත්භාවයට යටත් දේපළෙහි කොටසක් නොවිය යුතු ය;

(ආ) 117 වන වගන්තිය යටතේ පසුව අත්කර ගත් දේපළවල කොටසක් නොවිය යුතු ය; සහ

(ඇ) 46 වන වගන්තිය යටතේ උපයෝජ්‍ය දේපළ ගණනය කිරීමෙන් බැහැර කළ යුතු ය.

(3) 46 වන වගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි නියම මගින්, ණයකරුගේ ආරක්ෂිත දේපළක් ණයහිමියන්ගේ හෝ අතරමැදියන්ගේ ප්‍රයෝජනය සඳහා විකිණීමට විධිවිධාන නොසැලස්විය යුතු ය.

(4) 36 වන වගන්තිය යටතේ ණයකරුගේ ප්‍රමාණවත් ආදායමක් ආරක්ෂා කිරීමට අතිරේකව, ආරක්ෂිත දේපළ කාණ්ඩ වනුයේ-

(අ) ණයකරු සහ ණයකරුගේ ඥාතීන් හා යැපෙන්නන් සඳහා ඇඳුම් පැලඳුම් ද ඇතුළුව, ණයකරුට අවශ්‍ය ගෘහභාණ්ඩ සහ බඩුබාහිරාදිය;

(ආ) වෙළෙඳාම, ව්‍යාපාර සහ කෘෂිකර්මාන්තය සඳහා ණයකරුට අවශ්‍ය මෙවලම්;

(ඇ) ණයකරු කෘෂිකාර්මික කටයුතුවල නියැලී සිටින අවස්ථාවක දී, ණයකරුගේ සහ ඔහුගේ හෝ ඇයගේ යැපෙන්නන්ගේ නඩත්තුව සඳහා අවශ්‍ය විය හැකි කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක්;

(ඈ) ණයකරුගේ වෘත්තිය හෝ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන, නියම කරනු ලැබිය හැකි යම් වටිනාකමින් යුක්ත වෘත්තීය උපකරණ සහ පුස්තකාල;

(ඉ) ගිණුම් පොත්;

(ඊ) අලාභ සඳහා නඩු පැවරීමට ඇති අයිතිවාසිකම්;

(උ) පුද්ගලික සේවා සඳහා යම් අයිතිවාසිකමක්;

(ඌ) ප්‍රවර්තක අනුප්‍රාප්තිය පිළිබඳ හෝ, හුදෙක් අවිනිශ්චිත හෝ තිබිය හැකි වෙනත් අයිතිවාසිකම් පිළිබඳ යම් අපේක්ෂාවක්;

(එ) විවාහ හෝ නඩත්තු නඩු කටයුතුවල දී නියෝග කරනු ලබන අනාගත හෝ සියලු නඩත්තු, දික්කසාද දීමනා සහ පිරිවැය සඳහා වූ අයිතියක්;

(ඒ) පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියකින් හිමිකම් පාන මුදලින් සම්පූර්ණ හෝ කොටසක් ගෙවීම සඳහා ඇපකරයක් ලෙස උකස් කර නොමැති වූ -

(i) කාර්යපටිපාටිය පවත්වාගෙන යනු ලබන අවස්ථාවේ ණයකරුගේ සැබෑ පදිංචි ස්ථානය; සහ

(ii) කාර්යපටිපාටිය ආරම්භ කළ අවස්ථාවේ සිට ණයකරු පදිංචි වී සිටින ස්ථානය,

වන යම් නිවසක් හෝ වෙනත් වාසස්ථානයක්, සමග එය භුක්ති විඳීම සඳහා අවශ්‍යයැයි අධිකරණය විසින් සලකනු ලබන, ඊට අදාළ ඉඩම් ප්‍රමාණයක්;

(ඔ) සේවානියුක්තයාගේ පෞද්ගලික ගිණුමේ, 35 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති තාක් දුරට, යම් සේවා නියුක්තියක සේවානියුක්තයන්ගේ ප්‍රතිලාභය සඳහා ස්ථාපිත වෙනත් අර්ථ සාධක අරමුදලක්, සේවා නියුක්ත භාර අරමුදලක හෝ විශ්‍රාම වැටුපක බැරට ඇති මුදලක්;

(ඕ) කෙටි කාලීන නේවාසික කුලී නවාතැන් ගිවිසුමක් යටතේ ණයකරුගේ කුලිය;

(ක) වෙනත් ඕනෑම තැනැත්තකු වෙනුවෙන් භාරයක් ලෙස ණයකරු දරන දේපළක්; සහ

(ග) නියම කරනු ලැබිය හැකි වෙනත් දේපළ කාණ්ඩයක්.

(5) ණයකරුගේ සැබෑ පදිංචිය වන නිවසක් හෝ වෙනත් වාසස්ථානයක් පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියක සුරක්ෂිත ණයහිමියකු විසින් හිමිකම් පාන මුදලක් ගෙවීම සඳහා සුරැකුමක් ලෙස උකස් තබා ඇති අවස්ථාවක-

(අ) නිවස හෝ වාසස්ථානය කෙරෙහි සුරක්ෂිත ණයහිමියාගේ අයිතිවාසිකම සුරක්ෂිත ණයහිමියාට අය විය යුතුව පවතින ණය ප්‍රමාණයට සීමා විය යුතු ය; සහ

(ආ) නිවසේ හෝ වාසස්ථානයේ වටිනාකම සුරක්ෂිත ණයහිමියාට අය විය යුතු ණය ප්‍රමාණයට වඩා වැඩි නම්, නිවස හෝ වාසස්ථානය කෙරෙහි ණයකරුගේ අයිතිවාසිකමෙහි ඉතුරුම ආරක්ෂිත දේපළක් විය යුතු ය.

(6) ණයකරු විසින් කුලී සින්නක්කර ගිවිසුමක්, බදු ගිවිසුමක් හෝ වෙනත් ආකාරයක මූල්‍ය ගිවිසුමක් මගින්, 4 වන උපවගන්තියේ (අ) සිට (ඇ) දක්වා වන ඡේදවල විෂයය පථයට ගැනෙන අයිතමයක් අත්පත් කරගෙන ඇති අවස්ථාවක, කුලී සින්නක්කර ගිවිසුම, බදු ගිවිසුම හෝ වෙනත් ආකාරයේ මූල්‍ය ගිවිසුම යටතේ වන ණයකරුගේ අයිතිවාසිකම මගින් ආරක්ෂිත දේපළක් සංස්ථාපනය විය යුතු අතර, සාමාන්‍ය ණයහිමියන්ගේ ප්‍රතිලාභය සඳහා එය උපයෝජ්‍ය නොවිය යුතු ය.

(7) මේ පනත යටතේ, ණයකරු විසින් ණය ගෙවිය යුතු වන විට දී ඔහුගේ හෝ ඇයගේ ණය ගෙවීමට නොහැකි වන්නේ ද යන්න නිශ්චය කිරීම සඳහා ණයකරුගේ කිසියම් ආරක්ෂිත දේපළක් විකිණීමට බලාපොරොත්තු වන බවක් අදහස් කිරීම යෝග්‍ය නොවිය යුතු ය.

(8) පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියක, “බංකොලොත් භාවයට අදාළ නියම” යනු පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටිය ආරම්භ වීම හේතුවෙන් -

(අ) ගිවිසුම හෝ සැපයුම අවසන් වන්නා වූ, නැතහොත් වෙනත් සිදුවීමක් සිදු වන්නා වූ; හෝ

(ආ) සැපයුම්කරුට ගිවිසුම හෝ සැපයුම අවසන් කිරීමට හෝ වෙනත් දෙයක් කිරීමට හිමිකම් ලැබෙන්නා වූ,

ණයකරු වෙත අත්‍යවශ්‍ය භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා වන ගිවිසුමක විධිවිධානයක් වන්නේ ය.

අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල්, විශ්‍රාම වැටුප් සහ ව්‍යවස්ථාපිත පාරිතෝෂික යටතේ දායකත්ව සහ හිමිකම්

**35.** (1) යම් රැකියාවක සිටින සේවානියුක්තයන්ගේ ප්‍රයෝජනය සඳහා පිහිටුවා ඇති යම් අර්ථසාධක අරමුදලක්, සේවක භාරකාර අරමුදලක්, විශ්‍රාම වැටුපක් හෝ ව්‍යවස්ථාපිත පාරිතෝෂිකයක් යටතේ ගෙවිය යුතු වන දායක මුදල්, හිමිකම් හෝ මුදල් ප්‍රමාණ මගින්-

(අ) ආරක්ෂිත දේපළක් සංයුක්ත විය යුතු ය; සහ

(ආ) මේ පනත යටතේ වන, පසු ව අත්කර ගත් දේපළක් සංයුක්ත නොවිය යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා, ණයකරුගේ සේවායෝජකයකු විසින් ණයකරු සම්බන්ධයෙන්, සේවානියුක්තයන්ගේ ප්‍රයෝජනය සඳහා පිහිටුවා ඇති යම් අර්ථසාධක අරමුදලක්, සේවක භාරකාර අරමුදලක්, විශ්‍රාම වැටුපක් හෝ ව්‍යවස්ථාපිත පාරිතෝෂිකයක් යටතේ ගෙවනු ලබන මුදලක් මගින් -

(අ) මේ පනත යටතේ වන පසුව අත්කර ගත් දේපළක් සංයුක්ත නොවිය යුතු ය; සහ

(ආ) ණයකරුගේ ආදායම සංයුක්ත නොවිය යුතු ය.

(3) පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියක පාර්ශ්වකරුවකු වන ණයකරුවකු, සේවානියුක්තයන්ගේ ප්‍රයෝජනය සඳහා පිහිටුවා ඇති සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල හෝ විශ්‍රාම වැටුපක් යටතේ ගෙවීමක් ලබන අවස්ථාවක දී, එකී ගෙවීම මගින් පසුව අත්කරගත් දේපළක් සංයුක්ත නොවිය යුතු මුත්, එමගින්-

(අ) 47 වන වගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනේ නියම ස්ථාපනය කිරීමේ; සහ

(ආ) 125 වන සහ 126 වන වගන්ති යටතේ බංකොලොත්භාවයට අදාළ ණය ආපසු ගෙවීමේ ආඥාවක් හෝ බංකොලොත්භාවයට අදාළ ණය ආපසු ගෙවීමේ ගිවිසුමක් සකස් කිරීමේ,

කාර්ය සඳහා ආදායමක් සංයුක්ත විය යුතු ය.

(4) මේ වගන්තියේ කිසිවක් මගින් පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටිය යටතේ ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශයක දේපළ පිළිබඳ සම්පූර්ණයෙන් හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් ණයකරු වෙත වන බැඳීම ඉවත් නොකරනු ලැබිය යුතු ය.

සාධාරණ ආදායමක් ආරක්ෂා කිරීම

**36.** (1) පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියක් යටතේ ණයකරුවකුට, මෙම පනතේ කාර්ය සඳහා, ණයකරුගේ සහ ඔහුගේ යැපෙන්නන්ගේ සාධාරණ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ණයකරුගේ ආදායම ලෙස අදහස් වන, සිය ආරක්ෂිත ආදායමෙන් දායක මුදල් ගෙවීමට නියම නොකළ යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා සහ (6) වන උපවගන්තියට යටත්ව, පහත සඳහන් මුදල් ප්‍රමාණ මගින් ණයකරුවකුගේ ආරක්ෂිත ආදායමක සංයුක්ත විය යුතු ය: -

(අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 52 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සහ පස්වන උපලේඛනයේ 2(අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති මුදලට සමාන ණයකරුගේ පුද්ගලික මාසික දීමනාවක්; සහ

(ආ) ණයකරුට යැපෙන්නන් සිටින විට, උපරිම යැපෙන්නන් හතරක් දක්වා වන සේ ණයකරුගේ එක් එක් යැපෙන්නන් සම්බන්ධයෙන් (අ) ඡේදයේ දක්වා ඇති මුදලට සමාන වන අතිරේක මාසික දීමනාවක්.

(3) මේ පනතේ කාර්ය සඳහා සහ (5) වන උපවගන්තියට යටත්ව, සුවිශේෂී තත්ත්වයන් යටතේ දී හැර ණයකරුගේ මාසික අතිරික්ත ආදායම, ණයකරුගේ ආරක්ෂිත ආදායම ඉක්මවා යන ණයකරුගේ මාසික ආදායමේ ප්‍රමාණය වන්නේ ය.

(4) ණයකරු හෝ ණයකරුගේ යැපෙන්නන්ට විශේෂිත වූ සුවිශේෂී තත්ත්වයන් යන්නෙන් අදහස් වන්නේ එවැනි සුවිශේෂී තත්ත්වයන් නොමැති අවස්ථාවල දී ඔවුන්ගේ සාධාරණ අවශ්‍යතා විය හැකි අවශ්‍යතාවලට වඩා වැඩි වන විට-

(අ) ණයකරුගේ ආරක්ෂිත ආදායම (2) වන උපවගන්තියේ දක්වා ඇති ප්‍රමාණය ඉක්මවිය හැකි බව; එහෙත්

(ආ) ණයකරුගේ ආරක්ෂිත ආදායම ණයකරුගේ සහ ණයකරුගේ යැපෙන්නන්ගේ සාධාරණ අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය තාක් දුරට, (3) වන උපවගන්තියේ දක්වා ඇති ප්‍රමාණය පමණක් ඉක්මවිය හැකි ය.

(5) මෙම පනතේ කාර්ය සඳහා, ණයකරුගේ ආදායම කලින් කල, ණයකරුට ගෙවනු ලබන ආදායමක ස්වභාවයෙන් යුතු සෑම ගෙවීමකින් හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම සම්බන්ධයෙන් හෝ යම් ධුරයක් හෝ රැකියාවක් සම්බන්ධයෙන් වන ගෙවීමක් සහ 35 වන වගන්තියට යටත්ව, සේවක අර්ථසාධක අරමුදලක්, සේවක භාරකාර අරමුදලක් හෝ සේවානියුක්තිකයන්ගේ ප්‍රතිලාභය පිණිස පිහිටුවා ඇති විශ්‍රාම වැටුපක් යටතේ යම් ගෙවීමක් ද ඇතුළුව කලින් කලට, ණයකරුට හිමි වන සෑම ගෙවීමකින් ද සංයුක්ත වන්නේ ය.

(6) අධිකාරිය විසින්, (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති තත්ත්වවල දී ණයකරුගේ සහ ණයකරුගේ යැපෙන්නන්ගේ සාධාරණ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය වන්නා වූ ආදායම ගණනය කිරීමට කලින් කල මාර්ගෝපදේශ නිකුත් කළ හැකි ය.

ඇතුළත් කරන ලද සහ බැහැර කරන ලද ණය

**37.** (1) මේ පනතේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත් නම් මිස, ඇතුළත් කරන ලද ණයක් යන්නෙන්, බැහැර කරන ලද ණයක් නොවන (2) වන උපවගන්තියේ අවශ්‍යතා සපුරාලන ණය මුදලක් අදහස් වේ.

(2) ඇතුළත් කරන ලද ණය කාණ්ඩයට -

(අ) ණය සහන කාලයක් සඳහා ආඥාවක්;

(ආ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන බව තහවුරු කිරීමේ ආඥාවක්;

(ඇ) ණය පුනරුත්ථාපන ආඥාවක්; හෝ

(ඈ) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක්,

කරනු ලබන දිනයේ දී ණයකරු යටත් වන්නා වූ වර්තමාන හෝ අනාගත, නිශ්චිත හෝ අවිනිශ්චිත, සියලුම ණය සහ වගකීම් අයත් වන්නේ ය.

(3) ඇතුළත් කරන ලද ණය කාණ්ඩයට, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් ආඥාවක් කිරීමට පෙර ණයකරු වෙත වූ යම් බැඳීමක් හේතුවෙන් (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් ආඥාවක් කිරීමෙන් පසු ණයකරු යටත් වන ඕනෑම ණයක් හෝ වගකීමක් ඇතුළත් වන්නේ ය.

(4) පහත දැක්වෙන ණය බැහැර කරන ලද ණය විය යුතු ය. එනම්-

(අ) ණයකරු පාර්ශ්වකරුවකු වූ වංචාවක් හෝ සාපරාධී විශ්වාසය කඩ කිරීමක් මගින් හටගත් ණයක් හෝ වගකීමක්;

(ආ) බංකොලොත්කරු පාර්ශ්වකරුවකු වූ, ණය ගෙවීම වංචනිකව පැහැර හැරීමට ණයකරු විසින් ලබා ගත් යම් ණයක් හෝ බැරකමක්;

(ඇ) නඩත්තු හා දික්කසාද දීමනා ගෙවීම වූ යම් බැඳීමක් සහ විවාහ නඩුකරවල දී හෝ නඩත්තු නඩුවල දී ආඥා කරන ලද සියලු නඩත්තු, දික්කසාද මුදල් හා පිරිවැය;

(ඈ) වරදක් සඳහා පනවන ලද දඩයක් සම්බන්ධයෙන් වූ වගකීමක්;

(ඉ) ණයකරු විසින් සිදු කරන ලද දිලික්ත වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට අලාභ ගෙවීමේ වගකීමක්.

(5) බැහැර කරන ලද ණය බංකොලොත්භාවයේ දී ඔප්පු කළ යුතු නොවන්නේ ය.

(6) 66 වන වගන්තිය යටතේ ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා ණයකරුගේ යෝග්‍යතාව තීරණය කිරීමේ කාර්ය සඳහා සමස්ත ණය සඳහා ණයකරුගේ වගකීමේ ප්‍රමාණය ගණනය කිරීමේ දී බැහැර කළ ණය ඇතුළත් නොකළ යුතු ය.

(7) 40 වන වගන්තිය යටතේ ණය ආරක්ෂණ කල් දැමීමේ ආඥාවක් යටතේ වන ණය කල්දැමීම බැහැර කළ ණයකට අදාළ නොවිය යුතු ය.

(8) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක්, ඒ වැඩපිළිවෙළක් යටතේ තම ණය ඇතුළත් කිරීමට අදාළ ණයහිමියා එකඟ වන්නේ නම් හැර, බැහැර කරන ලද ණයක් සඳහා අදාළ නොවිය යුතු ය.

(9) ණය පුනරුත්ථාපන නියෝගයක් බැහැර කළ ණයකට අදාළ නොවිය යුතු ය.

(10) 73වන සහ 138 වන වගන්ති යටතේ වූ නිදහස් කිරීමක් මගින් බැහැර කරන ලද ණය සම්බන්ධයෙන් ඇති වගකීමෙන් ණයකරු නිදහස් නොකළ යුතු ය.

(11) 60 වන වගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සම්පූර්ණ වීමේ දී ණයකරු වැඩපිළිවෙළෙහි නියම යටතේ ණයකරු නිදහස් කිරීමට අදාළ ණයහිමියා කැමැත්ත පළ කරනු ලැබූ අවස්ථාවක දී හැර, බැහැර කරන ලද ණය යටතේ ඇති බැරකමින් නිදහස් නොවිය යුතු ය.

## III වන කොටස

### ණය ආරක්ෂා කිරීම සඳහා කල් දැමීමේ නියෝගය

ණය ආරක්ෂා කිරීම සඳහා වන ඉල්ලීම

**38.** (1) මේ කොටසට යටත්ව-

(අ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා යෝජනාවක් සකස් කිරීමට;

(ආ) ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා ඉල්ලීම් කිරීමට; හෝ

(ඇ) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා ඉල්ලීම් කිරීමට,

අදහස් කරන ණයකරුවකු විසින් (2) වන සහ (3) වන උපවගන්තිවලට සහ නියම කරනු ලැබිය හැකි යම් අවශ්‍යතාවලට අනුකූල වන ආකෘතියකින් ණය ආරක්ෂා කිරීම සඳහා වන ණය කල්දැමීමේ ඉල්ලීමක් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) ණයකරුගේ ණය ආරක්ෂා කිරීම ණය කල් දැමීමේ සඳහා වන ඉල්ලීමෙහි පහත සඳහන් තොරතුරු අඩංගු විය යුතු ය:-

(අ) ණයකරුගේ සම්පූර්ණ නම, උපන් දිනය සහ පදිංචි ලිපිනය;

(ආ) ණයකරු විසින් පවත්වාගෙන යනු ලබන යම් ව්‍යාපාරයක යම් වෙළඳ නාම හෝ ලියාපදිංචි ව්‍යාපාර නාම සහ ලිපින;

(ඇ) (i) නිල දේපළ භාර ගැනුම්කරු විසින් ණයකරු සම්බන්ධයෙන් යම් විමසීම් කිරීම; සහ

(ii) අවශ්‍යවන තාක් දුරට සහ 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ විධිවිධානවලට අනුකූලව, නිල දේපළ භාර ගැනුම්කරු විසින් ණයකරුගේ පෞද්ගලික දත්ත හෙළිදරව් කිරීම සහ සැකසීම,

සඳහා ණයකරුගේ ලිඛිත කැමැත්ත.

(3) ණයකරු විසින් තොරතුරු දන්නා තාක් දුරට සහ කරුණට අදාළ වන ප්‍රමාණයට, ඉල්ලීමෙහි පහත තොරතුරු ඇතුළත් විය යුතු ය: -

(අ) ණයකරුගේ ණයහිමියන්ගේ විස්තර සහ එක් එක් ණයහිමියාට ගෙවිය යුතු අදාළ ණය ප්‍රමාණය පිළිබඳ විස්තර;

(ආ) යම් ණයහිමියකු විසින් ලබා ගත් යම් සුරැකුමක විස්තර සහ ණයහිමියකු විසින් ලබා ගත් සුරැකුමේ ස්වභාවය පිළිබඳ විස්තර;

(ඇ) ණය එකතු කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා ණයකරුගේ ණයහිමියාගේ උපදෙස් පරිදි කටයුතු කරන යම් ණය එකතු කිරීමේ අනුයෝජිතයකුගේ හෝ වෙනත් තෙවන පාර්ශ්වයක විස්තර; සහ

(ඇ) ණයකරු වෙනුවෙන් ක්‍රියා කිරීමට ණයකරු විසින් උපදෙස් දී ඇති යම් උපදේශකයකු, අනුයෝජිතයකු හෝ නියෝජිතයකුගේ විස්තර.

(4) ණයකරු විසින් ණය කල් දැමීමේ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ දී, සපයා ඇති යම් තොරතුරක නිරවද්‍යතාවය සහතික වීම කෙරෙහි සාධාරණ සැලකිල්ලක් දැක්විය යුතු අතර, ඉල්ලීමෙහි අදාළ තොරතුරු හිතාමතාම වසන් නොකළ යුතු ය.

ණය ආරක්ෂා කිරීම සඳහා කල් දැමීමේ ආඥාවක් ලබාදීමේ නිර්ණායක

**39.** (1) ණය කල් දැමීම සඳහා වන ඉල්ලීමක් ලැබීමෙන් පසු, ණයකරුගේ ඉල්ලීමට අදාළව ණය සඳහා ආඥාවක් කළ යුතු ද යන්න අධිකරණය විසින් සලකා බැලිය යුතු ය.

(2) ණය ආරක්ෂා කිරීම සඳහා වන ණය කල් දැමීමේ ඉල්ලීමක් සලකා බැලීමේ දී, අධිකරණය විසින් -

(අ) ණයකරු, (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යෝග්‍යතා නිර්ණායක සපුරාලන්නේ ද යන්න සලකා බැලීමේ දී අධිකරණයට සහාය වීම සඳහා අවශ්‍ය යයි නිල දේපළ භාර ගැනුම්කරු විසින් සලකනු ලබන යම් විමසීම් කරන ලෙසට නිල දේපළ භාර ගැනුම්කරුගෙන් ඉල්ලා සිටිය; සහ

(ආ) එවැනි විමසීම් සඳහා නිල දේපළ භාර ගැනුම්කරුගෙන් සතුටුදායක පිළිතුරු ලැබෙන තෙක් ඉල්ලීම සලකා බැලීම නතර කළ,

හැකිය.

(3) ණය කල් දැමීමක් සඳහා වන ඉල්ලීමක් සලකා බැලීමේ දී, අධිකරණයට පෙනී යන පරිදි, ඉල්ලීමේ සපයා ඇති තොරතුරු මගින් ඉල්ලීම කරනු ලබන දිනයේ දී (4) වන උපවගන්තියේ වන නිර්ණායක සපුරා ඇති බවටත් සපයන ලද තොරතුරු අසම්පූර්ණ හෝ සාවද්‍ය බව විශ්වාස කිරීමට අධිකරණයට හේතුවක් නොතිබිය යුතු බවටත් අධිකරණය විසින් උපකල්පනය කළ යුතු ය.

(4) ණයකරු විසින් ණය ආරක්ෂා කිරීම සඳහා වන ණය කල් දැමීමේ ආඥාවක් සඳහා සුදුසුකම් ලබන්නේ ණයකරු -

(අ) විසින් ණය ගෙවිය යුතුව ඇති විටෙක, ණයෙන් කොටසක් හෝ සියල්ල ගෙවීමට ණයකරුට නොහැකි නම් හෝ නොහැකි වීමට ඉඩ ඇත්නම්;

(ආ) ශ්‍රී ලංකාවේ පදිංචිකරුවකු වන්නේ නම් හෝ ණය ආරක්‍ෂා කිරීම සඳහා වන කල් දැමීමේ ඉල්ලීමේ දිනට පෙර අවුරුදු තුනක් ඇතුළත යම් කාලයක දී -

(i) ශ්‍රී ලංකාවේ පදිංචිකරුවකු වූයේ නම් හෝ ශ්‍රී ලංකාව තුළ පදිංචි ස්ථානයක් පැවතියේ නම්; හෝ

(ii) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කරගෙන යනු ලැබුවේ නම්;

(ඇ) දැනට බංකොලොත්භාවයට පත් වූ ණයකරුවකු නොවේ නම්;

(ඈ) IV වන කොටස යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළකට යටත්ව නොසිටියේ නම්;

(ඉ) ණය ආරක්‍ෂා කිරීම සඳහා වන කල් දැමීමේ ඉල්ලීමේ දිනට පෙර මාස දොළොහක් ඇතුළත V වන කොටස යටතේ ණය පුනරුත්ථාපන ආඥාවකට යටත් වී නොමැති නම්;

(ඊ) ණය ආරක්‍ෂා කිරීම සඳහා වන කල් දැමීමේ ඉල්ලීමේ දිනට පෙර වූ අවුරුදු පහක් ඇතුළත VI වන කොටස යටතේ බංකොලොත්භාවය පිළිබඳ ආඥාවකට යටත් වී නොමැති නම්;

(උ) ණය කල්දැමීම සඳහා වන ඉල්ලීමේ දිනට පෙර වූ මාස දොළහක් ඇතුළත III වන කොටස යටතේ ණය ආරක්‍ෂා කිරීම සඳහා ආඥාවකට යටත් වී නොමැති නම්

පමණි;

(5) අධිකරණය, ණය ආරක්‍ෂා කිරීම සඳහා වන කල් දැමීමේ ඉල්ලීමක් සලකා බැලීමෙන් පසු-

(අ) ණයකරු (4) වන උපවගන්තියේ යෝග්‍යතා නිර්ණායක සපුරාලන බව;

(ආ) ඉල්ලීම ඉදිරිපත් කිරීමේ දී ණයකරු විසින් සැලකිය යුතු තරමේ යම් ව්‍යාජ කරුණු ඉදිරිපත් කිරීමක් හෝ කරුණු මග හැරීමක් කර ඇති බවට විශ්වාස කිරීමට අධිකරණයට හේතු නොමැති බව;

(ඇ) ණය ආරක්ෂා කිරීම සඳහා කල් දැමීමේ ආඥාව මගින් ආවරණය වන ණය 37 වන වගන්තියට අනුකූලව ඇතුළත් කරන ලද ණය බව,

අධිකරණයට පෙනී යන්නේ නම්, අධිකරණය විසින්, ණය ආරක්ෂා කිරීම සඳහා කල් දැමීමේ ආඥාවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) අධිකරණය විසින් ණය ආරක්ෂා කිරීම සඳහා කල් කල් දැමීමේ ආඥාවක් කිරීමේ දී, නියම කරනු ලැබිය හැකි යම් වෙනත් විස්තරවලට අමතරව, පහත දැක්වෙන විස්තර පුද්ගලික වස්තුභංගත්වය පිළිබඳ ලේඛනයේ වාර්තාගත කරන ලෙසට අධිකරණය විසින් නිල දේපළ භාරගැනුම්කරුට නියම කළ යුතු ය:-

(අ) ණයකරුගේ විස්තර;

(ආ) ආඥාව නිකුත් කළ දිනය;

(ඇ) කල් දැමීමේ කාලසීමාව අවසන් වීමට නියමිත දිනය;

(ඈ) දීර්ඝ කරන ලද ණය කල් දැමීමේ කාලය අවසන් වීමට නියමිත දිනය ඇතුළුව, ණය කල් දැමීමේ කාලසීමා දීර්ඝ කිරීම පිළිබඳ විස්තර.

(7) ණය ආරක්ෂා කිරීම සඳහා කල් දැමීමේ ඉල්ලීමක් සලකා බැලීමෙන් පසු-

(අ) ණයකරු (4) වන උපවගන්තියේ යෝග්‍යතා නිර්ණායක සපුරාලන්නේ නැති බව;

(ආ) ණය ආරක්ෂා කිරීම සඳහා කල් දැමීමේ ආඥාවක් මගින් ආවරණය කළ යුතු ණය 37 වන වගන්තියේ කාර්යය සඳහා ඇතුළත් කරන ලද ණය නොවන බව;

(ඇ) ඉල්ලීම ඉදිරිපත් කිරීමේ දී හෝ එය සමඟ ඉදිරිපත් කළ යුතු යම් තොරතුරු සැපයීමේ දී ණයකරු සැලකිය යුතු තරමේ ව්‍යාජ කරුණු ඉදිරිපත් කිරීමක් කර ඇති බව හෝ කරුණු මග හැරීමක් කර ඇති බව,

අධිකරණය විසින් සලකන්නේ නම්, අධිකරණය විසින් ණය ආරක්ෂා කිරීම සඳහා වන කල් දැමීමේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ යුතු ය.

ණය ආරක්ෂා කිරීම සඳහා කල් දැමීමේ ආඥාවේ බලපෑම

**40.** (1) ණයකරු විසින් ගෙවිය යුතු එක් එක් ඇතුළත් කරන ලද ණයක් සම්බන්ධයෙන් වනවිට ණය ආරක්ෂා කිරීම සඳහා කල් දැමීමේ ආඥාවේ දින සිට එම ණය කල් දැමීම ආරම්භ විය යුතු ය.

(2) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කල් දැමීමේ කාලය තුළ දී, ණයකරුවකු විසින් ඇතුළත් කරන ලද ණයක් ගෙවිය යුතු වූ ණයහිමියකු -

(අ) ට එම ණය සම්බන්ධයෙන් කිසියම් ප්‍රතිකර්මයක් නොමැති විය යුතු ය; සහ

(ආ) විසින් පහත සඳහන් අවස්ථාවල දී කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය:-

(i) ණය කල් දැමීමේ කාලසීමාව තුළ දී ඇතුළත් කරන ලද ණයක් සඳහා උපචිත වන පොළිය ගෙවීමට යම් ණයකරුවකුට නියම කිරීම;

(ii) ණය කල් දැමීමේ කාලසීමාව තුළ දී උපචිත වන ඇතුළත් කරන ලද ණයකට අදාළ ගාස්තු, දඩ මුදල් හෝ වෙනත් ගාස්තු ගෙවීමට ණයකරුවකුට නියම කිරීම;

(iii) ණයකරු විසින් ණයහිමියා වෙත මුදල් ගෙවීම කඩිනම් කරන ලෙස නියම කිරීම;

(iv) ණය කල් දැමීමේ කාලය තුළ දී ණයකරු විසින් පොලී, ගාස්තු, දඩ මුදල් හෝ වෙනත් ගාස්තු නොගෙවීම, ණයහිමියා සහ ණයකරු අතර පවතින ගිවිසුමක් යටතේ ණයකරු විසින් ගෙවීම පැහැර හැරීමක් හෝ කඩ කිරීමක් කර ඇති ලෙසට සැලකීම;

(v) ණය ආරක්ෂා කිරීම සඳහා කල් දැමීමේ ආඥාවක් පැවතීම නිසා මිස, ණය කල් දැමීමේ කාලසීමාව තුළ ගෙවිය යුතු වන්නා වූ මුදලක් ණයකරු විසින් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් ණය තොරතුරු කාර්යාංශයට වාර්තා කිරීම;

(vi) ණයකරුගේ ඉල්ලීම මත නොවන, ඇතුළත් කරන ලද ණයක් ගෙවීම සම්බන්ධයෙන් ණයකරු ඇමතීම;

(vii) ඇතුළත් කරන ලද ණයක් සම්බන්ධයෙන් ණයකරුට එරෙහිව යම් නඩු කටයුත්තක් ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම;

(viii) ඇතුළත් කරන ලද ණයක් එකතු කිරීම, ඒ සඳහා සුරැකුමක් ගැනීම, අය කර ගැනීම හෝ ගෙවන ලෙසට විධානය කිරීම;

(ix) ණයකරුට එරෙහිව අධිකරණයක හෝ විනිශ්චය සභාවක තීන්දුවක් හෝ ආඥාවක් ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීම;

(x) වරෙන්තුවක් ලබා ගැනීම;

(xi) ණයකරු සන්තකයේ ඇති භාණ්ඩ ආපසු ගැනීම;

(xii) ඇතුළත් කරන ලද ණයක් සම්බන්ධයෙන් වූ සුරැකුමක් බලාත්මක කිරීම;

(xiii) ණයකරු විසින් අදාළ ණයහිමියා සමඟ ඇතුළත් වී ඇති කුලී ගිවිසුමක් යටතේ ණයකරු පදිංචිව සිටින පරිශ්‍රයක සන්තකය ලබා ගැනීම;

(xiv) ණය කල් දැමීමට අදාළ වන ණයකරු සමඟ ඒකාබද්ධව වගකිව යුතු වෙනත්

තැනැත්තකුට එරෙහිව මෙම උපවගන්තියේ සඳහන් යම් ක්‍රියාමාර්ගයක් ගැනීම;

(xv) ණය සහන කාලය අදාළ වන ණයකරුගේ ණය සඳහා ඇප තැබූ වෙනත් තැනැත්තකුට එරෙහිව මෙම උපවගන්තියේ සඳහන් යම් ක්‍රියාමාර්ගයක් ගැනීම;

(xvi) ණයහිමියා භාණ්ඩයේ අයිතිකරු හෝ බදු දීමනාකරු වන අවස්ථාවක දී, ණයකරු විසින් භාවිත කරනු ලබන හෝ ඔහු සන්තකයේ ඇති 34 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් භාණ්ඩයක්, සන්තකයට ගැනීම හෝ වෙනත් ආකාරයකින් ලබා ගැනීම;

(xvii) ඉහත (i), (ii), (iii), (iv), (v), (vi), (vii), (viii), (ix), (x), (xi), (xii), (xiii) , (xiv), (xv) හෝ (xvi) වන අනුඡේදවල සඳහන් යම් ක්‍රියාවක් කිරීමට අනුයෝජිතයකුට උපදෙස් දීම.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන නොතකා, ණය සහන කාලය බලාත්මකව පවතින අතරතුර, ණයහිමියකු විසින් කරනු ලබන ඉල්ලීමකින් පසු, අධිකරණය විසින්-

(අ) ව්‍යතිරේක තත්ත්ව මත, ණයහිමියාට ක්‍රියාමාර්ගයක් ගැනීමට ඉඩ දීම සාධාරණ බව; සහ

(ආ) එම ක්‍රියාමාර්ගය මගින්-

(i) ණය සහන කාලය අදාළ වන ණයකරුට හානිකර තත්ත්වයක් ඇති නොවන බව;

(ii) වෙනත් ණයහිමියකුට අසාධාරණ ලෙස අගතියක් සිදු නොවන බව; හෝ

(iii) ණය සහන කාලයන් සලසා ඇති ආරක්ෂාව සැලකිය යුතු ලෙස හීන නොවන බව,

සලකනු ලබන්නේ නම්, (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (v), (vi), (vii), (viii), (ix), (x), (xi), (xii), (xiii), (xiv), (xv), (xvi) හෝ (xvii) වන අනුඡේදවල සඳහන් ක්‍රියාමාර්ග ගැනීමට ණයහිමියකුට ඉඩ දිය හැකි ය.

(4) මේ වගන්තියේ ඇති කිසිවක් මගින් ණයකරුට එරෙහිව යම් අපරාධ නඩු කටයුත්තක් ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම වළක්වන බවට තේරුම් නොගත යුතු ය.

(5) මෙම වගන්තියට පටහැනිව කරනු ලබන ක්‍රියාවක් ශුන්‍ය සහ බල රහිත විය යුතු ය.

(6) ණය සහන කාලයක් සඳහා ආඥාවක් සිදු කිරීමට පෙර ණයකරුගේ හෝ ණයකරුගේ දේපළකට එරෙහිව යම් ඇස්කීසි කිරීමක් හෝ වෙනත් නෛතික ක්‍රියාවලියක් හෝ දේපළ තහනමක් අවසන් වූ අවස්ථාවක-

(අ) චංචල හෝ නිශ්චල දේපළවලට එරෙහිව ඇස්කීසි කිරීමක්, එම දේපළ තහනමට ගැනීම හෝ දේපළ භාර ගැනුම්කරු හෝ පත් කරන ලද්දකු හෝ ඇස්කීසි කිරීම පැවරුණු තැනැත්තකු විසින් දේපළවල සන්තකය ලබා ගැනීම මගින් සහ විකිණීම මගින් සම්පූර්ණ කරනු ලබන විට; සහ

(ආ) යම් ණය මුදලකට අදාළ දේපළට තහනම ඇති ණය ගෙවීම මගින් අවසන් වන විට,

ණයකරුට හෝ ණයකරුගේ දේපළට එරෙහිව යම් ඇස්කීසි කිරීමක්, නෛතික ක්‍රියාවලියක් හෝ දේපළ තහනමට ගැනීමක් මගින් ප්‍රතිලාභ ලැබීමට ණයහිමියා සතු අයිතිවාසිකමට මේ වගන්තියේ ඇති කිසිවක් මගින් බලපෑමක් ඇති නොවිය යුතු ය.

(7) ණය සහන කාලය අවසන් වීමෙන් පසුව, ණයහිමියකු හෝ ණයහිමියකුගේ අනුයෝජිතයකුට -

(අ) ණය සහන කාලසීමාව තුළ දී ණයහිමියා සහ ණයකරු අතර ඇති ගිවිසුම යටතේ වස්තුභංගත්ව තැනැත්තා විසින් පොලී, ගාස්තු, දඩ මුදල් හෝ වෙනත් ගාස්තු නොගෙවීම ණයකරු විසින් කරන ලද පැහැර හැරීමක් හෝ කඩ කිරීමක් ලෙසට සැලකීමට;

(ආ) ණයකරු විසින් ණය සහන කාලය තුළ දී පොලී, ගාස්තු, දඩ මුදල් හෝ වෙනත් ගාස්තු නොගෙවීමක් පිළිබඳ ණය තොරතුරු කාර්යාංශයට වාර්තා කිරීමට;

(ඇ) ණය සහන කාලය තුළ උපචිත වී ඇති (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) හෝ (iii) වන අනුඡේදයේ සඳහන් ගාස්තු, දඩ මුදල්, වෙනත් ගාස්තු කඩිනම් ගෙවීම් සිදු කිරීමට ණයකරුට නියම කිරීමට,

හිමිකම් නැත්තේ ය.

(8) (7) වන උපවගන්තියට යටත්ව සහ ණයකරු පුද්ගලික වස්තුභංගත්ව ක්‍රියාපටිපාටියකට අවතීර්ණ වී නොමැති නම්, ණය සහන කාලය අවසන් වීමෙන් පසුව, ණය සහන කාලයක් සඳහා ආඥාවක් නොපැවතියේ නම්, ණය සහන කාලය තුළ දී ගෙවිය යුතු වන්නා වූ අනෙකුත් සියලුම ගෙවීම් සිදු කිරීමට ණයකරුගෙන් ඉල්ලා සිටීමට ණය හිමියකුට හෝ ණය හිමියාගේ අනුයෝජිතයකුට හිමිකම් ඇත්තේ ය.

ණය සහන කාලයක් සඳහා ආඥාවට බලපවත්නා කාලසීමාව

**41.** (1) අධිකරණය ණය සහන කාලයක් සඳහා ආඥාව දුන් විට, ණය සහන කාලය ආරම්භ වන්නේ ය.

(2) (3) වන උපවගන්තියට යටත්ව, පහත දැක්වෙන අවස්ථාවල දී හැර, (1) වන උපවගන්තිය යටතේ ආරම්භ වූ දින සිට දින හැටක් ණය සහන කාලයක් සඳහා වන ආඥාවක් බලපැවැත්වේ :-

(අ) 77 වන වගන්තිය අනුව ණය සහන කාලය අවලංගු කළ විට;

(ආ) (5) වන උපවගන්තිය යටතේ ණයකරු මිය යාමේදී සහන කාලය අවසන් වූ විට; හෝ

(ඇ) පුද්ගලික වස්තුභංගත්ව ආඥාවක් නිකුත් කිරීමේ දී (6) වන උපවගන්තිය යටතේ ණය සහන කාලය අවසන් වූ විට.

(3) ණයකරු විසින් කරන ලද ඉල්ලීමක් මත, අධිකරණය විසින් -

(අ) ණයකරු සද්භාවයෙන් සහ සාධාරණ කඩිනමකින් ක්‍රියාකර ඇති බවට අධිකරණය සෑහීමකට පත් වන්නේනම්; සහ

(ආ) IV වන කොටස යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා ඉල්ලීමක් සකස් කිරීමට ණයකරුට කාලය ලබා දීම ඇතුළුව, ණය සහන කාලය දීර්ඝ කිරීම මගින් මේ පනතේ අරමුණු ඉටු වී ඇති බවට අධිකරණය සෑහීමකට පත් වේනම්,

දින අනූවක් නොඉක්මවන අමතර කාලසීමාවක් සඳහා ණය සහන කාලය දීර්ඝ කළ හැකි ය.

(4) අධිකරණය විසින්, (3) වන උපවගන්තිය යටතේ වන ණය සහන කාලසීමාව හතර වතාවකට වඩා නොවැඩි වූත් දින තුන්සිය හැටක් නොඉක්මවන සමස්ත කාලයක් සඳහාත් දීර්ඝ කළ හැකි ය.

(5) ණයකරුවකු ණය සහන කාලසීමාවක් තුළ මිය ගිය අවස්ථාවක දී, ණයකරු මිය ගිය දිනට පසු දින සිට ණය සහන කාලසීමාව අවසන් වේ.

(6) ණයකරු සම්බන්ධයෙන් පුද්ගලික වස්තුභංගත්ව ආඥාවක් සිදු කළ අවස්ථාවක දී, පුද්ගලික වස්තුභංගත්ව නියෝගය නිකුත් කරන ලද දින සිට එම ණය කල් දැමීම අවසන් විය යුතු ය.

(7) (2) වන, (5) වන හෝ (6) වන උපවගන්තිවලට අනුකූලව ණය සහන කාලසීමාවක් අවසන් වන විට, නිල දේපළ භාර ගැනුම්කරු විසින් ණය කල් දැමීමට අදාළ සියලු තොරතුරු පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

සහන කාල සීමාව සඳහා වන ආඥාව බලපවත්නා කාලය තුළ ණයකරුගේ බැඳීම්

**42.** (1) ණය සහන කාලය තුළ ණයකරුවකු විසින් -

(අ) ණයකරුගේ තත්ත්වයේ හෝ මූල්‍ය තත්ත්වයෙහි යම් වැදගත් වෙනසක් සිදු වුවහොත් ඒ බව නිල දේපළ භාරගැනුම්කරුට දැනුම් දිය;

(ආ) ණය සහන කාලය තුළ පවත්නා වගකීමකට අදාළව ගෙවිය යුතු වන යම් ගෙවීමක් සිදු කළ;

(ඇ) තනිව හෝ වෙනත් තැනැත්තකු සමඟ එක්ව කිසියම් අවස්ථාවක දී එකතුව රුපියල් ලක්ෂයක් හෝ නියම කරනු ලැබිය හැකි යම් ඉහළ මුදලක් වන අතිරේක ණයක් ලබා ගැනීම නොකළ;

(ඈ) ණයකරු විසින් සිදු කරනු ලබන සාමාන්‍ය ව්‍යාපාර කටයුත්තක දී හෝ ණයකරුගේ සාමාන්‍ය පවුල් කටයුතුවල දී හැර, යම් වත්කමක් බැහැර නොකළ; සහ

(ඉ) සාධාරණ ආකාරයෙන් නිල දේපළ භාරගැනුම්කරු සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම කළ,

යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පිළිබැඳීම්වලට අමතරව, ණය සහන කල් දැමීම අතරවාරයේ දී, ණය සහන තත්ත්වවලට සාධාරණ ලෙසින් අදාළ විය හැකි 32 වන වගන්තියේ නිශ්චිතව සඳහන් ණයකරුගේ යම් පිළිබැඳීමකට ණයකරු යටත් වන්නේය.

(3) (1) වන උපවගන්තියට පටහැනි යම් ක්‍රියාවක් ශුන්‍ය සහ බල රහිත විය යුතු ය.

ණය සහන කාලය කල්දැමීමේ නියෝගයට ණයහිමියා විරෝධය පළ කිරීම

**43.** (1) මේ කොටස යටතේ ණය ආරක්ෂා කිරීම සඳහා සහන කාලයක් පිළිබඳ දැන්වීමක් ලබන ණයහිමියකුට, ණය සහන කාලයට විරුද්ධව අධිකරණයට ඉල්ලීම් කළ හැකි ය.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ ණය සහන කාලයට විරුද්ධව ණයහිමියාගේ ඉල්ලීම පහත සඳහන් හේතු එකක් හෝ කිහිපයක් මත, එනම්-

(අ) ණයකරු, 39 වන වගන්තියේ සුදුසුකම් නිර්ණායක සපුරනු නොලබන බව;

(ආ) ණය සහන කාලය සඳහා වන ආඥාව මගින් ආවරණය වන ණය, 37 වන වගන්තියේ කාර්ය සඳහා ඇතුළත් කළ ණය නොවන බව;

(ඇ) ඉල්ලීම කිරීමේ දී හෝ ඒ සමඟ යම් තොරතුරු සැපයීමේ දී ණයකරු විසින් කිසියම් වැදගත් කරුණක් පිළිබඳ සාවද්‍ය නියෝජනයක් සිදු කර ඇති බව හෝ ඒ වැදගත් කරුණක් ඇතුළත් කිරීම මඟ හැර ඇති බව;

(ඈ) ඉහත 32 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති පිළිබැඳීම්වලට අනුකූලවීමට ණයකරු අසමත්ව ඇති බව; හෝ

(ඉ) ණය සහන කාලය සඳහා වන ආඥාව මගින් ණයහිමියාගේ අයිතිවාසිකම්වලට අප්‍රතිකාරී හානියක් සිදු ව ඇති බව,

මත පදනම් විය යුතු ය.

(3) ණය සහන කාලයට විරෝධය දක්වමින් අධිකරණය වෙත කරනු ලබන ණයහිමියාගේ ඉල්ලීම ණය සහන කාලය ආරම්භ වන දින සිට දින අනූවක කාලයක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.

(4) ණයහිමියා විසින් ඉල්ලීමට පදනම් කර ගත් හේතු ද ඇතුළුව, ණය සහන කාලයට විරුද්ධ වීමට ඉල්ලුම්පතක් ඉදිරිපත් කර ඇති බවට ණයකරු වෙත දැන්වීමක් කළ යුතු ය.

(5) මේ වගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක දී, ඉහත (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් හේතුවක් සම්බන්ධයෙන් අධිකරණය සෑහීමකට පත්වේ නම්, අධිකරණය විසින් පහත සඳහන් ආඥාවලින් එකක් හෝ දෙකම, එනම්-

(අ) එසේ කිරීමෙන් වෙනත් ණයහිමියකු අසාධාරණ ලෙස අගතිය නොවන අවස්ථාවක දී, අධිකරණයට ඉල්ලීම කළ ණයහිමියාට ණය සහන කාලය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වශයෙන් අදාළ නොවන බවට;

(ආ) ණය සහන කාලය අදාළ වන වෙනත් යම් ණයක් හෝ ණයහිමියකු සම්බන්ධයෙන් ණය සහන කාලය අවලංගු කරමින්, ආඥා කළ හැකි ය.

(6) අධිකරණය විසින් (5) වන උපවගන්තිය යටතේ ආඥාවක් කර ඇති අවස්ථාවක, සහන කාලය අදාළ වන ණයක් සම්බන්ධයෙන් සහන කාලය තුළ දී උපචිත වන යම් පොළී, ගාස්තු හෝ වෙනත් ගාස්තු ගෙවීමට අධිකරණය, ණයකරුට නියම කළ හැකි ය.

(7) (5) වන හෝ (6) වන උපවගන්ති යටතේ අධිකරණ ආඥාවක් කරන යම් අවස්ථාවක, අධිකරණය විසින් ණයකරු, නිල දේපළ භාර ගැනුම්කරු සහ (5) වන උපවගන්තිය යටතේ වන ආඥාවක් අදාළ වන යම් ණයහිමියන් වෙත ලිඛිත දැන්වීමක් කළ යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් නිල දේපළ භාර ගැනුම්කරු වෙත ලිඛිත දැන්වීමක් කරන අවස්ථාවක දී, නිල දේපළ භාර ගැනුම්කරු විසින් දින දාහතරක කාලයක් ඇතුළත-

(අ) පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ සටහනක් ඇතුළත් කිරීමට සැලැස්විය; සහ

(ආ) (5) වන උපවගන්තිය යටතේ කරන ලද අධිකරණ ආඥාව සහ (6) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියම කිරීමක් පිළිබඳව එය බලපාන යම් ණයහිමියකුට දැන්වීමක් යැවිය යුතු ය.

## IV වන කොටස

### ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ

**44.** (1) මෙම කොටස මගින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ පිළිබඳ කාර්ය පටිපාටියක් ස්ථාපිත කරනු ලබන අතර, ඒ යටතේ ණයකරුවකුට පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකුගේ හෝ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ සහාය මත, ණයකරුගේ නොගෙවූ ණය පියවීම සඳහා ණයකරුගේ ණයහිමියන් සමඟ නම්‍යශීලී ආපසු ගෙවීමේ වැඩපිළිවෙළක් පිළිබඳව කතිකා කරනු ලැබිය හැකි ය.

(2) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට අදාළ කාර්යපටිපාටිය මගින්, උපලබ්ධි විය හැකි වත්කම් සහ ආදායමක් ඇති ණයකරුට, එවැනි ණයකරුවන් ණය ආපසු ගෙවීමේ දී සාධාරණ දායකත්වයක් සපයනු ලබන බවට සහතික වෙමින් බංකොලොත්භාවයට විකල්පයක් ලෙස ණය මුදා හැරීමක් සහ ආර්ථික පුනරුත්ථාපනයක් ලබා ගැනීමට හැකියාවක් සැලසීම ඉලක්ක කරනු ලබන්නේ ය.

(3) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට අදාළ කාර්ය පටිපාටිය මගින් ණයකරු සහ ණයහිමියන් අතර සාකච්ඡා මාර්ගයෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් කේවල හිමිකාරිත්වය, හවුල් ව්‍යාපාර සහ සංස්ථාපිත නොවන වෙනත් ව්‍යාපාර පුනරුත්ථාපනය කිරීම සහ බේරා ගැනීමට හැකියාවක් සැලසීම ඉලක්ක කරනු ලබන්නේ ය.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: සාමාන්‍ය කොන්දේසි

**45.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, 46 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යෝග්‍යතා නිර්ණායක සපුරාලන ණයකරුවකු විසින් ණයකරුවකුගේ ණය පියවීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් පිළිබඳ යෝජනාවක් සියලු ණයහිමියන් වෙත ඉදිරිපත් කළ හැකි ය.

(2) මේ කොටසේ විධිවිධාන සහ නියම කරනු ලැබිය හැකි යම් විධිවිධාන ප්‍රකාරව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා යෝජනාවක් ණයකරුවකු විසින් හෝ ණයකරුවකු වෙනුවෙන් පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු විසින් ඉදිරිපත් කළ හැකි ය.

(3) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් බලාත්මක වූ පසු, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකුට, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස ද ක්‍රියා කරනු ලැබිය හැකි ය.

(4) 62 වන සහ 63 වන වගන්ති ප්‍රකාරව, මේ කොටස යටතේ පුද්ගලික වස්තුභංගත්ව යෝජකයින්ගේ සහ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවන්ගේ කර්තව්‍ය නියාමනය කිරීම, කාර්යසාධනය කිරීම සඳහා රීති සකස් කරනු ලැබිය හැකි ය.

(5) ණයකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනකට අදාළව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා වන යෝජනා

දෙකක් හෝ ඊට වැඩි ගණනක්, එක් යෝජනාවක් ලෙස -

(අ) සම්බන්ධ වූ ණයකරුවන්ගේ මූල්‍ය සම්බන්ධතාව නිසා එම ණය එක්ව සලකා බැලිය හැකි බව පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා සලකන්නේ නම්; සහ

(ආ) එක් එක් යෝජනාවක නියම මගින් -

(i) හවුල් හා ඒකපුද්ගල වත්කම් ලෙස සැලකීම සහ ඒකාබද්ධ හා තනි පුද්ගල ණය ලෙස සැලකීම;

(ii) එක් එක් වැඩපිළිවෙළක් සඳහා අනුමතය, වෙනත් වැඩපිළිවෙළක අනුමතය මත රඳා පවතින්නේ ද යන්න;

(iii) එක් වැඩපිළිවෙළක් අසාර්ථකවීම හෝ කලින් අවසන්වීමේ බලපෑම වෙනත් යම් වැඩපිළිවෙළකට බලපාන්නේ ද යන්න; සහ

(iv) ණයකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් සිදු කරන ලද ඒකාබද්ධ ගෙවීම්, ණයහිමියන් අතර බෙදා හැරිය යුත්තේ කුමන අනුපාතිකව ද යන්න,

ඇතුළුව වැඩපිළිවෙළවල් පරිපාලනය කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳව නිශ්චිතව විස්තර කර ඇත්නම්,

සලකා කටයුතු කරනු ලැබිය හැකි ය.

**46.** (1) ණයකරුවකු, පහත සඳහන් සියලු නිර්ණායක සපුරාලන විට ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා සුදුසුකම් ලැබිය යුතු ය:- ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: යෝග්‍යතා නිර්ණායක

(අ) ණයකරුට ඔහුගේ හෝ ඇයගේ ඇතැම් හෝ සියලු ණය, ඒවා ගෙවිය යුතු වන විට දී ගෙවීමට නොහැකි නම්;

(ආ) ණයකරු ශ්‍රී ලංකාවේ පදිංචිකරුවකු වන්නේ නම් හෝ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන දිනට පෙර අවුරුදු තුනක් ඇතුළත යම් කාලයක දී -

(i) ශ්‍රී ලංකාවේ පදිංචිකරුවකු වූයේ නම් හෝ ශ්‍රී ලංකාව තුළ පදිංචි නිවසක් පැවතියේ නම්; හෝ

(ii) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කරගෙන යනු ලැබුවේ නම්;

(ඇ) ණයකරු දැනට බංකොලොත් ණයකරුවකු නොවන්නේ නම්;

(ඈ) V වන කොටස යටතේ ණය පුනරුත්ථාපන නියෝගයකට යටත් නොවන්නේ නම්.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: අනිවාර්ය විධිවිධාන

**47.** (1) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් මගින්, වැඩපිළිවෙළට අදාළව, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස ක්‍රියා කිරීමට යම් තැනැත්තකුට, ආයතනයකට හෝ පුද්ගල මණ්ඩලයකට බලය පවරනු ලැබිය යුතු ය.

(2) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් මගින් පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු වෙත -

(අ) ණයකරු වෙනුවෙන් හෝ ණයකරුගේ නමින් ණයකරුගේ ව්‍යාපාරය හෝ වෙළඳාම පවත්වාගෙන යාම සඳහා;

(ආ) ණයකරුගේ වත්කම් උපලබ්ධි කිරීම සඳහා; හෝ

(ඇ) ණයකරුගේ යම් අරමුදලක් රැස් කිරීම, පරිපාලනය කිරීම හෝ බෙදා හැරීම සඳහා,

බලය පැවරීම හෝ නියම කිරීම කළ හැකි ය.

(3) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් මගින් වැඩපිළිවෙළ යටතේ ඇතුළත් කළ ණය සම්බන්ධයෙන්, මුදල් ගෙවීමට ණයකරුට -

(අ) අවුරුදු තුනකට; හෝ

(ආ) ණයකරුගේ ඇතුළත් කරන ලද ණය ප්‍රමාණය රුපියල් ලක්ෂයක් ඉක්මවන්නේ නම්, වසර හතකට,

වඩා වැඩි කාලසීමාවක් ලබා දීම සඳහා විධිවිධාන සලස්වනු නොලැබිය යුතු ය.

(4) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් මගින්, වෙනත් යම් ණයක් ගෙවීමට පෙර, වැඩපිළිවෙළට අදාළව නිසි පරිදි දරනු ලබන පුද්ගලික වස්තුභංගත්ව යෝජකගේ සහ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුගේ ගාස්තු සහ වියදම් ගෙවීමට විධිවිධාන සැලසිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ (අ) ඡේදය සහ හතරවන උපලේඛනයේ කාර්ය සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩයක් හෝ සේවාවක් සැපයීම සඳහා පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු හෝ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් දරනු ලබන ගාස්තු, වැඩපිළිවෙළ යටතේ වන වියදම් වන්නේ ය.

(6) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ මගින් 34 වන වගන්තියේ නිශ්චිතව සඳහන් යම් ආරක්ෂිත දේපළක් විකිණීමට හෝ බැහැර කිරීමට ණයකරුට නියම නොකළ යුතු ය.

(7) 36 වන වගන්තිය ප්‍රකාරව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් මගින් -

(අ) ණයකරුගේ සහ ඔහුගේ යැපෙන්නන්ගේ සාධාරණ අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් ආදායමක් ණයකරු විසින් රඳවා තබා ගැනීමට විධිවිධාන සැලසිය යුතු ය; සහ

(ආ) ණයකරුගේ ආරක්ෂිත ආදායමෙන් ගෙවීම් කිරීමට ණයකරුට නියම නොකළ යුතු ය.

(8) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් මගින් ණයකරුගේ තත්ත්වයන් මාස දොළහක කාල පරතරයක් නොඉක්මවන කාල පරාසයන් තුළ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින් සමාලෝචනය කිරීමට විධිවිධාන සැලැස්විය යුතු ය.

(9) (3) වන උපවගන්තියේ විධිවිධාන නොසලකා, 60 වන වගන්තිය යටතේ වැඩපිළිවෙළ සම්පූර්ණ කිරීමෙන් පසු, ණයෙහි අය වීමට ඇති අවසාන ගෙවීම නොගෙවූ ණයක අවසාන ගෙවීම කිරීම සඳහා වැඩපිළිවෙළෙහි මුල් නියම මගින් විධිවිධාන සැලැස්විය හැකි ය.

(10) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් මගින් පහත දැක්වෙන අවස්ථාවල දී හැර, ප්‍රමුඛතා හිමිකම්පෑමක් සඳහා මුදල් ගෙවීමට එම හිමිකම්පෑම සම්බන්ධයෙන් වෙනත් ආකාරයකට සැලකීම සඳහා ප්‍රමුඛතා හිමිකම්පෑමේ අයිතිකරු විසින් ලිඛිතව කැමැත්ත ලබා දෙන්නේ නම් මිස, අවසර ලබා නොදිය යුතු ය: -

(අ) ප්‍රමුඛතා හිමිකම්පෑමට පහළින් ඇති ප්‍රමුඛතා හිමිකම්පෑමක් සඳහා; හෝ

(ආ) ප්‍රමුඛතා හිමිකම්පෑමක් නොවන හිමිකම් පෑමක් සඳහා.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: සුරක්ෂිත ණයහිමියන් සහ දේපළ හිමිකම්

**48.** (1) මේ කොටසෙහි විධිවිධාන සලසා ඇති අවස්ථාවල දී හැර, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක කොන්දේසිවලට එකඟවීමට පාර්ශ්වයන්ට ඇති හැකියාව සීමා නොකරමින්, සුරක්ෂිත නොවන සහ සුරක්ෂිත යන ණය දෙයාකාරයම පියවීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා යම් වැඩපිළිවෙළක නියම ඇතුළත් විය හැකි ය.

(2) 52 වන වගන්තිය යටතේ ණයකරුගේ යෝජනාවට ණයහිමියන්ගේ අනුමතය පිළිබඳ වන රීතිවලට යටත්ව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් මගින් -

(අ) ඇපයකට යටත් වන දේපළ විකිණීම හෝ බැහැර කිරීම;

(ආ) ණයකරුට දේපළ භාර දීම; හෝ

(ඇ) සුරක්ෂිත ණයහිමියා විසින් සුරැකුම රඳවා තබා ගැනීම,

ද ඇතුළුව සුරැකුමකට යටත් වන යම් දේපළක් කළමනාකාරණය සඳහා විධිවිධාන සැලැස්විය හැකි ය.

(3) 52 වන වගන්තිය යටතේ ණයකරුගේ යෝජනාවක් සඳහා ණයහිමියන්ගේ අනුමතය පිළිබඳ රීතිවලට යටත්ව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළකට-

(අ) සුරක්ෂිත ණයහිමියකුගේ අයිතිවාසිකම් වෙනස් කිරීම; සහ

(ආ) වැඩපිළිවෙළ බලාත්මකව පවතින කාලය තුළ දී සුරක්ෂිත ණයකරු විසින් සුරැකුම ලබා නොගන්නා බවට විධිවිධාන සැලැස්වීම,

සඳහා නියම ද ඇතුළත් විය හැකි ය.

(4) 52 වන වගන්තිය යටතේ ණයකරුගේ යෝජනාවක් සඳහා ණයහිමියන්ගේ අනුමතය පිළිබඳ රීතිවලට යටත්ව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක, සුරක්ෂිත ණයක් සම්බන්ධයෙන් වන විට මුල් මුදලේ ප්‍රමාණය සුරැකුමේ වටිනාකමට වඩා අඩු බවට වැඩපිළිවෙළ මගින් නිශ්චිතව දක්වා ඇත්නම් පමණක්, කොන්දේසි ඇතුළත් විය හැකි ය.

(5) 52 වන වගන්තිය යටතේ ණයකරුවකුගේ යෝජනාවක් සඳහා ණයහිමියන්ගේ අනුමතය පිළිබඳව වන රීතිවලට යටත්ව, 60 වන වගන්තිය යටතේ ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් අවසන් වන විට අවසාන ගෙවීම නොකරන ලද යම් සුරක්ෂිත ණයක -

(අ) යම් ගෙවීමක් පැහැර හැරීමක් පිළිබඳව සාධාරණ කාලයක් තුළ නිවැරදි කිරීම් සිදු කිරීම; සහ

(ආ) වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන අතරතුර ගෙවීම් අඛණ්ඩව සිදු කිරීම,

සඳහා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල මගින් විධිවිධාන සැලැස්විය හැකි ය.

(6) 52 වන වගන්තිය යටතේ ණයකරුගේ යෝජනාවක් සඳහා ණයහිමියන්ගේ අනුමතය පිළිබඳව වන රීතිවලට යටත්ව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් මගින් -

(අ) යම් ගෙවීමක් පැහැර හැරීමක් පිළිබඳ සාධාරණ කාලයක් තුළ නිවැරදි කිරීම් සිදු කිරීම;

(ආ) ණයකරු අදාළ ණයහිමියා සමඟ ඇතුළත් වී ඇති කුලී නිවැසිභාවය පිළිබඳ ගිවිසුමක් යටතේ උපචිත වන කුලී ගෙවීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මකව පවතින කාලය තුළ දී දිගට ම සිදු කිරීම,

සඳහා විධිවිධාන සැලැස්විය හැකි ය.

(7) 52 වන වගන්තිය යටතේ ණයකරුගේ යෝජනාවක් සඳහා ණයහිමියන්ගේ අනුමතය පිළිබඳව වන රීතිවලට යටත්ව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනක් මගින් -

(අ) යම් ගෙවීමක් පැහැර හැරීමක් පිළිබඳව සාධාරණ කාලයක් තුළ නිවැරදි කිරීම් සිදු කිරීම;

(ආ) වැඩපිළිවෙළ බලාත්මකව පවතින කාලය තුළ ණයකරු විසින් භාණ්ඩ භාවිත කරන හෝ සන්තකය දරන විට කුලී සින්නක්කර ගිවිසුමක් ඇතුළු වෙනත් ගිවිසුමක් යටතේ වාරික ගෙවීම පවත්වාගෙන යාම,

සඳහා විධිවිධාන සැලැස්විය හැකි ය.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු පත් කිරීම

**49.** (1) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා යෝජනාවක් කිරීමට ණයකරුවකු, අදහස් කරන අවස්ථාවක, එවැනි ණයකරුවකු විසින් පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු ලෙස ක්‍රියා කිරීම සඳහා තැනැත්තකු, ආයතනයක් හෝ මණ්ඩලයක් පත් කළ යුතු ය.

(2) ණයකරු සහ පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා එකඟ වන්නේනම්, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු ලෙස ක්‍රියා කිරීමට පත් කරන ලද තැනැත්තා, ආයතනය හෝ මණ්ඩලය, 47 වන වගන්තිය යටතේ වූ යෝජිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සම්බන්ධයෙන් පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස ද ක්‍රියා කළ හැකි ය.

(3) (1) වන සහ (2) වන උපවගන්ති යටතේ පත් කිරීමෙන් පසු පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින් -

(අ) ණයකරුගේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ පිළිබඳ යෝජනාව සම්බන්ධයෙන් පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාගේ කාර්යභාරය ඉටු කිරීමට පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා එකඟ වී ඇති බව ණයකරු වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය;

(ආ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වීමේ දී පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු ලෙස ක්‍රියා කිරීමට එම යෝජකයා කැමැත්ත පළ කරන්නේ නම්, ණයකරු වෙත එම කැමැත්ත පිළිබඳව ලිඛිතව දැනුම් දිය යුතු ය; සහ

(ඇ) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු ලෙස සහ අදාළ වන විට, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු ලෙස ක්‍රියා කිරීමට එලෙස ලද පත්වීම පිළිබඳව නිල දේපළ භාරගැනුම්කරු වෙත දැනුම් දිය යුතු ය.

(4) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමේ දී ණයකරුට සහාය වීමට එකඟ වන පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු විසින් -

(අ) ණයකරුගේ මූල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් තක්සේරු කිරීමට හැකි වන පරිදි ණයකරුගේ දේපළ සහ මූල්‍ය කටයුතු පිළිබඳ සාධාරණ විමසීම් සිදු කළ යුතු ය; සහ

(ආ) මේ කොටසේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට සහ නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සකස් කළ යුතු ය.

(5) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා යෝජනාවක් පිළියෙල කිරීමේ කාර්ය සඳහා සහාය වීමට පුද්ගලික වස්තුභංගත්ව යෝජකවරයකුට හැකි වන පරිදි ණයකරු විසින් මූල්‍ය කටයුතු හෙළිදරව් කරන ප්‍රකාශයක් 33 වන වගන්තියට අනුකූලව පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(6) නියම කරනු ලැබිය හැකි වන හෝ අධිකාරිය විසින් සාදනු ලබන රීතිවල අඩංගු විය හැකි වන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක යෝග්‍යතාවය පිළිබඳව යම් තොරතුරු හෝ උපදෙස් පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු විසින් යෝජකයා පත් කරනු ලැබීමේ දී ණයකරුට සැපයිය යුතු විය හැකිය.

(7) නියම කරනු ලැබිය හැකි හෝ අධිකාරිය විසින් සාදනු ලබන රීතිවල අඩංගු විය හැකි ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙලක් සඳහා යෝජනාවක් සකස් කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී ණයකරුට සහාය වීමට පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු විසින් යම් ක්‍රියා සිදු කරනු ලැබිය යුතු විය හැකි ය.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: ණයකරුගේ යෝජනාව සකස් කිරීම

**50.** (1) 46 වන වගන්තියේ සඳහන් නිර්ණායක සපුරාලන ණයකරුවකු විසින්, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකුගේ සහාය ඇතිව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා යෝජනාවක් සකස් කළ හැකි ය.

(2) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වූ යෝජනාවක ආකෘතිය නියම කරනු ලැබිය හැකි ය.

(3) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වන යෝජනාව –

(අ) ණයකරු විසින් අත්සන් කළ යුතු ය;

(ආ) පහත දැක්වෙන තැනැත්තන්ගේ නම්, එනම්-

(i) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු ලෙස ක්‍රියා කරන තැනැත්තා, ආයතනය හෝ මණ්ඩලයේ නම; සහ

(ii) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වීමේ දී පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස ක්‍රියා කිරීමට කැමති තැනැත්තාගේ, ආයතනයේ හෝ මණ්ඩලයේ නම,

සටහන් කර තිබිය යුතු ය.

(4) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා වන යෝජනාවට -

(අ) 46 වන වගන්තියේ සඳහන් යෝග්‍යතා නිර්ණායක ණයකරු විසින් සපුරා ඇති බව;

(ආ) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාගේ උපරිම දැනුම අනුව, ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශයේ අඩංගු තොරතුරු සම්පූර්ණ සහ නිවැරදි බව සඳහන් කරනු ලබන ;

(ඇ) යෝජනාව අනුමත කර ක්‍රියාත්මක කිරීමට සාධාරණ අවස්ථාවක් තිබෙන බව; සහ

(ඈ) ණයකරුගේ පවතින සම්පත්වලින් ණයහිමියන්ට සාධාරණ කොටසක් ලබා දෙන අතරම ණයකරුගේ ආර්ථිකය පුනරුත්ථාපනය සඳහා පහසුකම් සැලසීමේ සාධාරණ ක්‍රමවේදයක් යෝජනාව මගින් ඉදිරිපත් කරනු ලබන බව,

පුද්ගලික වස්තුභංගත්ව යෝජකගේ මතය වන බව තහවුරු කරන පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාගේ ප්‍රකාශයක් ඇතුළත් විය යුතු ය.

(5) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වන යෝජනාවට ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශයක් සහ නියම කරනු ලැබිය හැකි වෙනත් අවශ්‍යතා ඇතුළත් විය යුතු ය.

(6) (5) වන උපවගන්තිය මගින් නියම කරනු ලබන පරිදි වන ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශය, 94 වන වගන්තියට සහ ඒ යටතේ සාදනු ලබන නියෝගවලට අනුකූල විය යුතු ය.

(7) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වන යෝජනාවට -

(අ) 46 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යෝග්‍යතා නිර්ණායක ණයකරු විසින් සපුරාලන්නේ දැයි තීරණය කිරීමට අවශ්‍ය යයි සලකන යම් විමසීම් නිල දේපළ භාර ගැනුම්කරු විසින් කිරීම සඳහා;

(ආ) එකී විමසීම් පිළිබඳව නිල දේපළ භාරගැනුම්කරුට සතුටුදායක පිළිතුරු ලැබෙන තෙක් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාව නිල දේපළ භාරගැනුම්කරු විසින් සලකා බැලීම කල් දැමීම සඳහා;

(ඇ) ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා ඉල්ලීමක් කිරීමට සහ එය සලකා බැලීම

සඳහා අවශ්‍ය තාක් දුරට, ණයහිමියාගේ පෞද්ගලික දත්ත නිල දේපළ භාරගැනුම්කරු විසින් ණයහිමියන්ට සහ අනෙකුත් තෙවන පාර්ශ්ව වෙත හෙළිදරව් කිරීම සඳහා; සහ

(ඇ) ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා ඉල්ලීමක් කිරීම සහ එය සලකා බැලීම සඳහා අවශ්‍ය වන තාක් දුරට, ණයකරුගේ පෞද්ගලික දත්ත, ණයහිමියන්, රාජ්‍ය ආයතන හෝ වෙනත් අදාළ තෙවන පාර්ශ්වයන් විසින් නිල දේපළ භාරගැනුම්කරු වෙත හෙළිදරව් කිරීම සඳහා,

ණයකරුගේ කැමැත්ත පළ කරන ප්‍රකාශයක් ඇතුළත් විය යුතු ය.

(8) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වන යෝජනාවට, එම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වන යෝජනාවක අවස්ථානුගත කරුණු සම්බන්ධයෙන් සාධාරණ ලෙස අදාළ විය හැකි වන්නා වූ, 32 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ණයකරුට අදාළ යම් බැඳීම්වලට ණයකරු යටත් වන බවට ණයකරු විසින් පිළිගැනීමේ ප්‍රකාශයක් ද ඇතුළත් විය යුතු ය.

(9) මේ වගන්තියේ අවශ්‍යතා සපුරාලන යෝජනාවක් පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාගේ සහාය ඇතිව ණයකරු විසින් සකස් කළ විට, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින් යෝජනාව නිල දේපළ භාරගැනුම්කරු වෙත ඉදිරිපත් කළ යුතු ය.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ පිළිබඳ සාකච්ඡා රැස්වීම

**51.** (1) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා වන යෝජනාව ණයකරුගේ ණයහිමියන් විසින් අනුමත කරන්නේ ද යන්න පිළිබඳව තීරණයක් එම ණයහිමියන්ගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(2) ණයකරුගේ ණයහිමියන් විසින් යෝජනාව අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ පිළිබඳ සාකච්ඡා රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු ය.

(3) පෞද්ගලිකව හෝ ඩිජිටල් සන්නිවේදන ක්‍රම හරහා සිදු විය හැකි සාකච්ඡා රැස්වීම සඳහා දිනය සහ ස්ථානය නියම කිරීමේ දී පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින් ණයහිමියන්ගේ සහ ණයකරුගේ පහසුව සලකා බැලිය යුතු ය.

(4) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින්, ඇතුළත් කළ ණයක ණයහිමියකු වන, සෑම දන්නා ණයහිමියකු වෙත ම -

(අ) සාකච්ඡා රැස්වීම පිළිබඳ ලිඛිත දැන්වීම;

(ආ) 50 වන වගන්තියේ දක්වා ඇති සියලුම අවශ්‍යතා ද ඇතුළත් වන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වන යෝජනාවේ පිටපතක්;

(ඇ) ණයහිමියාගේ හිමිකම්පෑමේ ආකෘති පත්‍රය;

(ඈ) තැපැල් ඡන්ද ආකෘති පත්‍රය සහ විද්‍යුත් තැපැල් ඡන්ද ආකෘති පත්‍රය;

(ඉ) යෝජිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අනුමත කරන්නේ ද නැතහොත් ප්‍රතික්ෂේප කරන්නේ ද යන්න තීරණය කරන ලෙසට එක් එක් ණයහිමියාගෙන් ඉල්ලා සිටිමින් කරන ප්‍රකාශයක්;

(ඊ) ප්‍රකාශය යැවීමෙන් අවම වශයෙන් දින විසි එකකට පසුව වන දිනයක් විය යුතු සාකච්ඡා රැස්වීම පැවැත්වෙන දිනය පිළිබඳ ප්‍රකාශයක් ; සහ

(උ) සාකච්ඡා රැස්වීමට නොපැමිණි හෝ තැපැල් ඡන්දයක් හෝ විද්‍යුත් තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ නොකරන ලද ණයහිමියකු ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වූ යෝජනාව පිළිගත් බවට සලකනු ලබන බවට වූ ප්‍රකාශයක්,

යවනු ලැබිය යුතු ය.

(5) නියම කරනු ලැබිය හැකි යම් අවශ්‍යතා සපුරාලන ආකාරයෙන් ණයහිමියාගේ හිමිකම් ආකෘතිය ඉදිරිපත් කර ඇති ණයහිමියකු විසින් යෝජනාවට -

(අ) සාකච්ඡා රැස්වීමට පෙර හෝ රැස්වීමේ දී පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා වෙත ලැබෙන සේ තැපැල් ඡන්ද පත්‍රිකාවක් යැවීම මගින්; හෝ

(ආ) සාකච්ඡා රැස්වීමට පෙර හෝ රැස්වීමේ දී පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා වෙත ලැබෙන සේ විද්‍යුත් තැපැලෙන් ඡන්ද පත්‍රිකාවක් යැවීම මගින්,

ඡන්දය ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(6) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා වෙත රැස්වීමට පෙර හෝ රැස්වීමේ දී තැපැල් ඡන්ද පත්‍රිකාවක් හෝ නියම කරනු ලැබ ඇති පරිදි එකඟව හෝ විරුද්ධත්වය පිළිබඳ වෙනත් සන්නිවේදනයක් ලැබෙන්නේ නම්, ණයහිමියා රැස්වීමට පැමිණ ඡන්දය ප්‍රකාශ කර ඇති බවට එකී ඡන්දය හෝ සන්නිවේදනය මගින් සැලකේ.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා ණයහිමියාගේ අනුමතය

**52.** (1) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සාකච්ඡා කිරීමේ රැස්වීම සඳහා පහසුකම් සැලැස්විය යුතු අතර, එහි මුලසුන දැරිය යුතු ය.

(2) මේ කොටසෙහි විධිවිධානවලට යටත්ව සහ නියම කරනු ලැබිය හැකි පරිදි, පස්වන උපලේඛනයේ වන පහත සඳහන් ඡේද, මේ වගන්තියේ සඳහන් රැස්වීමක් පැවැත්වීම සම්බන්ධයෙන් පහත කරුණු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය:-

(අ) පෙරකළාසිය;

(ආ) සභාපතිවරයා;

(ඇ) ගණපූරණය;

(ඈ) කල් තැබූ රැස්වීම්;

(ඉ) විවිධ කරුණු.

(3) සාකච්ඡා රැස්වීමේ දී, ණයහිමියන් විසින් -

(අ) ණයකරුගේ මූල්‍ය තත්ත්වයන් පැහැදිලි කිරීම සඳහා යුක්ති සහගත වන පරිදි ණයකරු පිළිබඳව යම් පරීක්ෂණයක් පැවැත්වීම;

(ආ) ණයකරුගේ කටයුතු පිළිබඳ වැඩිදුර වීමර්ශනයට ඉඩ සැලසීම සඳහා වටිනාකමින් බහුතරයක් වන ණයහිමියන්ගේ යෝජනාවක් සම්මත කිරීම මගින් උපරිම දින හතක කාලයකට රැස්වීම කල් තැබීම;

(ඇ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි අවසාන නියමයන් දක්වා ඇති යෝජනා සම්මතයක් (3) වන හෝ (4) වන උපවගන්තියට අනුකූලව සම්මත කර ගැනීම;

(ඈ) ණයකරුගේ කැමැත්ත ඇතිව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අවසාන නියමයන් දක්වා ඇති යෝජනා සම්මතයක්, (3) වන හෝ (4) වන උපවගන්තියට අනුකූලව ඇති කර ගැනීමෙන් යෝජනාව වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම;

(ඉ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා පත් කිරීම හෝ -

(i) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් ක්‍රියා කිරීමට කැමති; සහ

(ii) එම පත්වීම සඳහා ලිඛිතව කැමැත්ත පළ කර පත්වීම සිදු කරන අවස්ථාව වන විට, එම කැමැත්ත ඉල්ලා අස්කර ගෙන නොමැති,

වෙනත් තැනැත්තකු, ආයතනයක් හෝ මණ්ඩලයක් පත් කරනු ලැබීම;

(ඊ) ණයකරුගේ කැමැත්ත ඇතිව, ණයකරුගේ කටයුතු පිළිබඳව අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට යෝග්‍ය විය හැකි යයි සැලකෙන අදාළ කොන්දේසි ඇතුළත් කිරීම,

කළ යුතුය.

(4) යෝජනාවකට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ණයහිමියන්ගෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ඇති සියලුම ණයහිමියන්ගේ හිමිකම්වල වටිනාකමින් බහුතරයක් නියෝජනය වන විට, එම යෝජනාව අනුමත වන්නේ ය.

(5) යෝජනාවකට 48 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට හෝ අන්‍යාකාරයකට සුරක්ෂිත ණයහිමියන්ගේ අයිතිවාසිකම් වෙනස් කරන හෝ සීමා කරන නියම ඇතුළත් වන අවස්ථාවක දී, එම යෝජනාව, යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ණයහිමියන්ගේ හිමිකම්වල වටිනාකම ඡන්දය දීමට හිමිකම් ඇති සුරක්ෂිත ණයහිමියන්ගේ හිමිකම්වල වටිනාකමෙන් තුනෙන් දෙකකට වඩා වැඩි ප්‍රමාණයක් නියෝජනය කරන විට, අනුමත වන්නේ ය.

(6) යෝජනාවකට 48 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට හෝ අන්‍යාකාරයකට ණයකරුවකු විසින් භාවිත කරන හෝ සන්තකයේ තබාගෙන සිටින භාණ්ඩවලට අදාළ වන්නා වූ කුලී සින්නක්කර ගිවිසුමක් ද ඇතුළත් ගිවිසුමක් යටතේ බදු හිමියන්ගේ හෝ භාණ්ඩ හිමිකරුවන් සතු අයිතිවාසිකම් වෙනස් කරන හෝ සීමා කරන නියමයන් යෝජනාවට ඇතුළත් වන අවස්ථාවක දී, එම යෝජනාව, යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ණයහිමියන්ගේ හිමිකම්වල වටිනාකම, ඡන්දය දීමට හිමිකම් ඇති ණයහිමියන්ගේ හිමිකම්වල වටිනාකමෙන් තුනෙන් දෙකකට වඩා වැඩි ප්‍රමාණයක් නියෝජනය කරන විට, අනුමත වන්නේ ය.

(7) සුරක්ෂිත ණයහිමියකුගේ -

(අ) අයිතිවාසිකම් වෙනස් කරන හෝ සීමා කරන නියම ඇතුළත් නොවන අවස්ථාවක දී; හෝ

(ආ) ප්‍රතිලාභය උදෙසා සුරැකුමට යටත්ව වත්කමක් විකිණීමට හෝ බැහැර කිරීම සඳහා විධිවිධාන සලසන අවස්ථාවක දී,

අදාළ සුරක්ෂිත ණයහිමියාගේ යෝජනාවට ඡන්දය ප්‍රකාශ නොකර සිටිය හැකි ය. එසේ වුවද, (89 වන අධිකාරය වූ) උකස් පනතේ 47 වන වගන්තියේ (අ) ඡේදය යටතේ ණයකරු විසින් ප්‍රකාශයක් කර ඇත්නම්, එවැනි සුරක්ෂිත ණයහිමියකුට, ණයෙන් සුරක්ෂිත නොකළ කොටසට අදාළව සුරක්ෂිත නොවූ ණයහිමියකු ලෙස සහභාගී විය හැකි ය.

(8) යෝජනාවට -

(අ) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ ණයහිමියකුගේ අයිතිවාසිකම් වෙනස් කරනු ලබන හෝ සීමා කරනු ලබන නියම ඇතුළත් නොවන අවස්ථාවක දී; හෝ

(ආ) කුලී සින්නක්කර ගිවිසුමට යටත්ව, වත්කම, ණයහිමියකුගේ ප්‍රතිලාභය උදෙසා විකිණීම හෝ බැහැර කිරීම සඳහා විධිවිධාන සලස්වනු ලබන අවස්ථාවක දී,

අදාළ ණයහිමියා විසින් යෝජනාව සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ නොකර සිටිය හැකි ය.

(9) නිසි දැන්වීමක් කරනු ලැබ ඇති ණයහිමියකු-

(අ) සාකච්ඡා රැස්වීමට සහභාගී නොවන්නේ නම්;

(ආ) තැපැල් ඡන්දයක් ප්‍රකාශ නොකරන්නේ නම්; හෝ

(ඇ) විද්‍යුත් තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ නොකරන්නේ නම්,

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා වූ යෝජනාවට එකී ණයහිමියා පක්ෂව ඡන්දය දුන් බවට සලකනු ලැබිය යුතු ය.

(10) කිසිම ණයහිමියකු ඡන්දය නොදෙන විට, යෝජිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ මෙම වගන්තිය යටතේ අනුමත කර ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

(11) සැක දුරු කිරීමේ කාර්ය සඳහා, මේ කොටසෙහි විධිවිධානවලට අනුකූලව දැන්වීමක් කරනු ලැබ ඇති ණයහිමියකුට, ඔහු -

(අ) 57 වන වගන්තිය යටතේ ණයහිමියාගේ හිමිකම් ආකෘති පත්‍රය ඉදිරිපත් නොකළේ නම්;

(ආ) මේ වගන්තිය යටතේ සාකච්ඡා රැස්වීමට සහභාගී නොවුණේ නම්; හෝ

(ඇ) මේ වගන්තිය යටතේ වන යෝජනාවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ නොකළේ නම්,

57 වන වගන්තිය යටතේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන බව තහවුරු කරන අධිකරණ ආඥාවකට එරෙහිව ඉල්ලීමක් කිරීමට හිමිකමක් නොතිබිය යුතු ය.

(12) සාකච්ඡා රැස්වීමක දී ණයහිමියන් යෝජනාව පිළිනොගන්නා අවස්ථාවක -

(අ) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින් "ණයහිමියන් විසින් පිළි නොගනී" ලෙස අනුඅත්සන් කර එය නිල දේපළ භාරගැනුම්කරු වෙත ආපසු යැවිය යුතු ය; සහ

(ආ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි කාර්යපටිපාටිය අවසන් විය යුතු ය.

නිල දේපළ භාරගැනුම්කරු වෙත අනුමත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ඉදිරිපත් කිරීම

**53.** (1) ණයහිමියන් විසින් යෝජනාව පිළිගැනීමෙන් පසු, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින්, නිල දේපළ භාරගැනුම්කරු වෙත -

(අ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ පිළිබඳ සාකච්ඡා රැස්වීමේ දී ණයහිමියන්ගේ ඡන්දයේ ප්‍රතිඵලය පිළිබඳ ලිඛිත දැන්වීම; සහ

(ආ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි අවසාන නියමයන්,

ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති ලේඛන ලැබීමෙන් පසු, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි නියමයන් මගින් මේ කොටසෙහි විධිවිධාන සපුරාලන බවට නිල දේපළ භාරගැනුම්කරු විසින් තහවුරු කළ යුතු ය.

(3) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි නියමයන් මගින් මේ කොටසේ විධිවිධාන සපුරාලන බව තහවුරු කිරීමෙන් පසු, නිල දේපළ භාරගැනුම්කරු විසින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ නිර්දේශ කර සහතිකයක් නිකුත් කළ යුතු ය.

(4) නිල දේපළ භාරගැනුම්කරු විසින්, අනතුරුව -

(අ) සාකච්ඡා රැස්වීමේ දී ණයහිමියන්ගේ ඡන්දයේ ප්‍රතිඵලය පිළිබඳ ලිඛිත දැන්වීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි අවසාන නියම සමඟ එම සහතිකය සුදුසු අධිකරණයකට ඉදිරිපත් කළ යුතු ය; සහ

(ආ) සහතිකය නිකුත් කිරීම පිළිබඳව ණයකරුට, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාට සහ වැඩපිළිවෙළහි ලැයිස්තුගත කර ඇති සියලුම ණයහිමියන්ට දැන්විය යුතු ය.

(5) නිල දේපළ භාරගැනුම්කරු විසින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ නිර්දේශ කිරීමේ සහතිකයක් නිකුත් කිරීම -

(අ) එම වැඩපිළිවෙළ මගින් මේ කොටසෙහි විධිවිධාන සපුරා නොමැති වන්නේ නම්; හෝ

(ආ) ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශයේ හෝ ඒ සමඟ ඇති ලේඛනවල සැලකිය යුතු තරමේ සාවද්‍යතාවක් පිළිබඳව නිල දේපළ භාරගැනුම්කරුට දැන ගැනීමට ලැබුණේ නම්;

(ඇ) ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශය හෝ ඒ සමඟ ඇති ලේඛන මගින් සාධාරණ ලෙස පුරෝකථනය කළ නොහැකි වූ ණයකරුගේ තත්ත්වයන්හි ඇති වූ වැදගත් වෙනසක් පිළිබඳව නිල දේපළ භාරගැනුම්කරුට දැන ගැනීමට ලැබුණේ නම්;

(ඈ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි නියමයන් සාධාරණ නොවන බව හෝ සමස්තයක් වශයෙන් ණයකරුට සහ ණයහිමියන්ට සාධාරණ නොවන බව නිල දේපළ භාරගැනුම්කරුගේ මතය වන්නේ නම්,

පමණක් ප්‍රතික්ෂේප කළ හැකි ය.

(6) නිල දේපළ භාරගැනුම්කරු විසින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් නිර්දේශ කිරීමේ සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, නිල දේපළ භාරගැනුම්කරු විසින් -

(අ) එකී ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු ණයකරු, පුද්ගලික වස්තුභංගත්ව යෝජනාකරු සහ ණය හිමියන් වෙත ඉදිරිපත් කළ යුතු ය; සහ

(ආ) තම නිර්දේශය සුදුසු අධිකරණයට දැන්විය යුතු අතර, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ බලාත්මකවීම අධිකරණය විසින් තහවුරු නොකළ යුතු ය.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අධිකරණය විසින් තහවුරු කිරීම

**54.** (1) 53 වන වගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට අදාළව නිල දේපළ භාරගැනුම්කරුගෙන් අධිකරණය වෙත නිර්දේශයක් ලැබෙන අවස්ථාවක දී, අධිකරණය විසින්, නිර්දේශය, එය සමඟ ඇති යම් ලේඛන ද සමඟ සලකා බැලිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ නිර්දේශයක් සලකා බැලීමේ දී, 53 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ නිල දේපළ භාරගැනුම්කරු විසින් නිකුත් කරන ලද සහතිකයක්, එහි සහතික කර ඇති කාරණා සඳහා සාක්ෂි වශයෙන් සැලකීමට අධිකරණයට හිමිකම් තිබිය යුතු ය.

(3) අධිකරණය විසින් මේ වගන්තිය යටතේ නිර්දේශයක් සලකා බැලීමේ දී, ණයහිමියකු, ණයකරු හෝ පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින් නිර්දේශයට එරෙහිව කරනු ලබන යම් විරෝධතාවක් විභාග කළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ විරෝධතාවක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක සහ තීරණයකට එළඹීම සඳහා එයට වැඩිදුර තොරතුරු සහ සාක්ෂි අවශ්‍ය වන අවස්ථාවක, අධිකරණය විසින් ඒ පිළිබඳ විභාගයක් පැවැත්විය හැකිය. විභාගය පිළිබඳව නිල දේපළ භාරගැනුම්කරු, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා, ණයකරු සහ ණයහිමියන් වෙත ලිඛිත දැන්වීමක් මගින් දැන්විය යුතු ය.

(5) නිර්දේශය සලකා බැලීමෙන් පසුව-

(අ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ මේ කොටසේ නිර්ණායක සපුරාලන බවට; සහ

(ආ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සකස් කිරීම, මේ කොටසෙහි කාර්ය පටිපාටිමය අවශ්‍යතාවලට අනුකූල වන බවට,

අධිකරණය විසින් සලකනු ලබන්නේ නම්, අධිකරණය විසින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ තහවුරු කරමින් ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(6) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීමෙන් පසුව අධිකරණය විසින්, ණයකරුගේ නම, ලිපිනය සහ විස්තරය සහ අධිකරණ ආඥාවේ දිනය ඇතුළුව වැඩපිළිවෙළ පිළිබඳ නියම කරනු ලැබිය හැකි විස්තර -

(අ) පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ; සහ

(ආ) ප්‍රසිද්ධ දැන්වීමක් මගින්,

ප්‍රකාශයට පත් කරවන ලෙසට නිල දේපළ භාරගැනුම්කරුට විධාන කළ යුතු ය.

(7) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ තහවුරු කරමින් ආඥාවක් නිකුත් කරන විට, අධිකරණය විසින් -

(අ) ආඥාව නිකුත් කිරීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මකවීම පිළිබඳව ණයකරුට, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාට සහ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට;

(ආ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන කාලය තුළ 32 වන වගන්තිය යටතේ ණයකරුගේ බැඳීම් පිළිබඳව ඒවා අදාළ වන ප්‍රමාණය දක්වමින්, ණයකරුට;

(ඇ) ආඥාව නිකුත් කිරීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩඩළිවෙළ ක්‍රියාත්මකවීම පිළිබඳව ණයකරුගේ එක් එක් ණයහිමියාට; සහ

(ඈ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට විරෝධය පළ කිරීමට ණයහිමියන්ට 57 වන වගන්තිය යටතේ ඇති අයිතිය පිළිබඳව එක් එක් ණයහිමියාට,

ලිඛිත දැන්වීමක් කරන ලෙසට නිල දේපළ භාරගැනුම්කරුට විධාන කරනු ලැබිය යුතු ය.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අධිකරණය විසින් තහවුරු කිරීමේ බලපෑම

**55.** (1) අධිකරණය විසින් අනුමත කරන ලද ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ මගින්, ඇතුළත් කළ ණයවල ණයහිමියන් සහ වැඩපිළිවෙළෙහි නියම බලපාන සියලුම ණයහිමියන් කෙරෙහි බැඳීමක් ඇති කරනු ලබන්නේ ය.

(2) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වීම තහවුරු කරන අධිකරණ ආඥාව, වැඩපිළිවෙළෙහි වලංගුභාවය පිළිබඳ තීරණාත්මක සාධකයක් විය යුතු ය.

(3) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වීම අධිකරණය විසින් තහවුරු කිරීමේ ආඥාවෙන් පසුව, වැඩපිළිවෙළ, එහි නියම ප්‍රකාරව -

(අ) එකී නියම සහ 60 වන වගන්තියට අනුව වැඩපිළිවෙළ සම්පූර්ණ වන තෙක්: හෝ

(ආ) 59 වන වගන්තිය යටතේ වැඩපිළිවෙළ අවසන් කරන තෙක්,

ක්‍රියාත්මකව පවතින්නේ ය.

(4) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මකව පවතින අතර වාරයේ, ණයකරු විසින් ඇතුළත් කළ ණයක් ගෙවිය යුතු වන ණයහිමියකු විසින් -

(අ) ණය අය කර ගැනීමට හෝ බලාත්මක කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය; සහ

(ආ) විශේෂයෙන් ම -

(i) ණයකරුගේ හෝ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුගේ ඉල්ලීම පරිදි හෝ වැඩපිළිවෙළෙහි නියමයන්ට අනුකූලව මිස, ඇතුළත් කළ ණයක් ගෙවීම සම්බන්ධයෙන් ණයකරුගෙන් විමසීම;

(ii) ඇතුළත් කළ ණයක් සම්බන්ධයෙන්, ණයකරුට එරෙහිව යම් නෛතික

ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම;

(iii) ඇතුළත් කළ ණයක් එකතු කිරීම, ඒ සඳහා සුරැකුමක් ගැනීම, අය කර ගැනීම හෝ ගෙවන ලෙස නියම කිරීම;

(iv) (8) වන උපවගන්තියට යටත්ව, ණයකරුට එරෙහිව අධිකරණයක හෝ විනිශ්චය සභාවක තීන්දුවක් හෝ ආඥාවක් ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීම;

(v) වරෙන්තුවක් ලබා ගැනීම;

(vi) ණයකරු සන්තකයේ ඇති භාණ්ඩ වැඩපිළිවෙළෙහි නියම ප්‍රකාරව නොවන අන්‍යාකාරයකින් නැවත ලබා ගැනීම;

(vii) (6) වන උපවගන්තියේ අවශ්‍යතා සපුරාලන්නේ නම් මිස, ණයකරු අදාළ ණයහිමියා සමඟ ඇතුළත් වී ඇති කුලී නිවැසිභාවය පිළිබඳ ගිවිසුමක් යටතේ ණයකරු පදිංචිව සිටින පරිශ්‍රයේ සන්තකය ලබා ගැනීම;

(viii) වැඩපිළිවෙළෙහි නියම මගින් අන්‍යා කාරයකින් විධිවිධාන සලසා ඇත්නම් මිස, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අදාළ වන ණයකරු සමඟ සාමූහිකව වගකිව යුතු වෙනත් තැනැත්තකුට එරෙහිව මේ උපවගන්තියේ සඳහන් යම් ක්‍රියාමාර්ගයක් ගැනීම;

(ix) වැඩපිළිවෙළෙහි නියම මගින් අන්‍යා කාරයකින් විධිවිධානය සලසා ඇත්නම් මිස, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අදාළ වන ණයකරුගේ ණය සඳහා ඇප වී ඇති වෙනත් තැනැත්තකුට එරෙහිව මේ වගන්තියේ සඳහන් යම් ක්‍රියාමාර්ගයක් ගැනීම;

(x) ඉහත (i), (ii), (iii), (iv), (v), (vi), (vii), (viii) හෝ (ix) ඡේදවල සඳහන් ඕනෑම ක්‍රියාවක් කිරීමට නියෝජිතයකුට උපදෙස් දීම,

සඳහා යම් ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය.

(5) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මකව පවතින අතරවාරයේ අධිකරණය විසින් -

(අ) ව්‍යතිරේක අවස්ථා යන්නෙන්, ණයහිමියාට යම් පියවරක් ගැනීමට ඉඩ දීම සාධාරණ බවට; සහ

(ආ) එම පියවර මගින් -

(i) වැඩපිළිවෙළ අදාළ වන ණයකරුට අනවශ්‍ය හානියක් සිදු නොවන බවට;

(ii) වෙනත් ණයහිමියකුට අසාධාරණ ලෙස අගතියක් සිදු නොවන බවට; හෝ

(iii) වැඩපිළිවෙළෙහි අරමුණු සැලකිය යුතු ලෙස අවතක්සේරු නොවිය යුතු බවට,

සලකනු ලබන්නේ නම්, ණයහිමියකුට (4) වන උපවගන්තියේ ලැයිස්තුගත කර ඇති පියවරක් ගැනීම සඳහා විශේෂ අවසරයක් අධිකරණය විසින් ලබා දිය හැකි ය.

(6) ණයකරුවකු සම්බන්ධයෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මකව පවතින අතරවාරයේ දී, කුලී නිවැසිභාවය පිළිබඳ ගිවිසුමක් යටතේ ණයකරුවකු පදිංචිව සිටින පරිශ්‍රයක හිමිකරුවකුට-

(අ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අතරතුර කුලී නිවැසිභාවය පිළිබඳ ගිවිසුමේ කාලසීමාව අවසන් වී ඇත්නම්;

(ආ) ණයකරු මාස තුනකට වඩා වැඩි කාලයක් සඳහා වන ගෙවල් කුළී මුදලක් අදාළ ණයහිමියාට හිඟ තබා ඇත්නම්, සහ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන කාලය තුළ දී ඉදිරි ගෙවල් කුළී ගෙවීම් සිදු කර ගෙන යාමට ණයකරුට නොහැකි වන බවට අධිකරණය සලකන්නේ නම්; හෝ

(ඇ) පරිශ්‍රය සන්තකයේ තබා ගැනීම සඳහා හිමිකරුවකුගේ ඉල්ලීමක් ණයකරුගේ කුළී නොගෙවීම හැර, වෙනත් හේතු මත පදනම් වී ඇත්නම්,

පමණක් පරිශ්‍රයේ සන්තකය ලබා ගැනීමට අධිකරණය විසින් සුවිශේෂී අවසරයක් ලබා දිය හැකි ය.

(7) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මකවීම තහවුරු කරනු ලබන විට, අධිකරණ ආඥාවට අවම වශයෙන් දින එකසිය අසූවකට පෙර -

(අ) පරිග්‍රහණයට ගැනීමෙන් හෝ දේපළ භාර ගැනුම්කරුවකු හෝ පත් කළ තැනැත්තකු හෝ ඇස්තීසි කිරීම පැවරී ඇති තැනැත්තකු විසින් දේපළෙහි සන්තකය ලබාගෙන විකිණීම සම්පූර්ණ කිරීමෙන් චංචල හෝ නිශ්චල දේපළවලට එරෙහිව ඇස්තීසි කිරීම සම්පූර්ණ කරනු ලබන අවස්ථාවක දී; සහ

(ආ) ණයක් ගෙවීම මගින් ණයකට ඇති සම්බන්ධතාව සම්පූර්ණ කරනු ලබන අවස්ථාවක දී ,

වෙනත් නෛතික ක්‍රියාපටිපාටියක් හෝ ප්‍රතිකර්මයක් සම්පූර්ණ වී ඇත්නම් ඇස්කීසි කිරීමක් හෝ, ණයගැතියාට හෝ ණයගැතියාගේ දේපළවලට එරෙහිව නියෝගයක් හෝ වෙනත් නෛතික ක්‍රියාපටිපාටියක් හෝ ප්‍රතිකර්මයක් බලාත්මක වීම මගින් ණයහිමියාට හිමි වන ප්‍රතිලාභයකට මෙම වගන්තියේ සඳහන් කිසිවක් මගින් බලපෑමක් සිදු නොවිය යුතු ය.

(8) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මකව පවතින අතරවාරයේ දී, යම් අත්‍යවශ්‍ය භාණ්ඩයක් හෝ සේවාවක් සපයන්නකු විසින්-

(අ) වැඩපිළිවෙළ ක්‍රියාත්මක වීමට පෙරාතුව යම් කාලසීමාවකට අදාළව භාණ්ඩ හෝ සේවා සඳහා

ගෙවිය යුතු වූ ගාස්තු ගෙවීම ණයකරු විසින් පැහැර හැරීම හේතුවෙන්, ණයකරුට භාණ්ඩ හෝ සේවා සැපයීම ප්‍රතික්ෂේප කිරීම;

(ආ) වැඩපිළිවෙළ ක්‍රියාත්මක වීමට පෙරාතුව යම් කාලසීමාවකට අදාළව භාණ්ඩ හෝ සේවා සඳහා නොගෙවූ හිඟ ගාස්තු ගෙවිය යුතු බවට වූ කොන්දේසියක් ණයකරුට භාණ්ඩ හෝ සේවා සැපයීමේ දී පැනවීම; හෝ

(ඇ) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුගේ පූර්ව, ලිඛිත අවසරය ඇතිව මිස, භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා ගිවිසුමේ වස්තුභංගත්වයට අදාළ නියමයක් මත රඳා සිටීම,

නොකළ යුතු ය.

(9) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට සහ 44 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි ඉලක්ක ඉටු කිරීමට වස්තුභංගත්වයට අදාළ නියම මත රඳා පැවතීම අවශ්‍ය වන බවට, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු සෑහීමකට පත් වන විට, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින් (8) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය යටතේ කැමැත්ත ලබා දිය හැකිය.

(10) (8) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය යටතේ කැමැත්ත ලබා දීම ප්‍රතික්ෂේප කිරීම මගින් පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු අලාභ ගෙවීමේ වගකීමට යටත් නොවන්නේය.

(11) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ මගින් ණයකරුට එරෙහිව යම් සාපරාධී නඩු කටයුතු ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම වළක්වනු නොලැබේ.

(12) මේ වගන්තියට පටහැනිව කරනු ලබන යම් ක්‍රියාවක් ශුන්‍ය සහ බල රහිත විය යුතු ය.

(13) මේ වගන්තියට පටහැනිව ණයහිමියකු හෝ ණයහිමියාගේ නියෝජිතයකු විසින් ගනු ලැබූ ක්‍රියාවකින් පැන නැඟුණා වූ අයිතියක් වන ණයහිමියකු සමඟ ගනුදෙනුවක් යටතේ යම් තැනැත්තකු විසින් දේපළකට යම් සබඳතාවක් ඇති කරගෙන ඇත්නම් හෝ වෙනත් අයිතිවාසිකමක් ලබාගෙන ඇත්නම් ණයහිමියා සමග එම තැනැත්තා සද්භාවයෙන් සහ ඒ අයිතිවාසිකම හෝ සබඳතාව සඳහා යම් වටිනාකමක් ගෙවනු ලබයි නම්, එම තැනැත්තාගේ අයිතිවාසිකම්වලට එම ක්‍රියාවෙහි ශූන්‍යභාවය මගින් අගතියක් සිදු නොවිය යුතු ය.

(14) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළකට සුරක්ෂිත ණයහිමියකුගේ අයිතිවාසිකම් වෙනස් කිරීමේ හෝ සීමා කිරීමේ නියම ඇතුළත් නොවන විට, මෙම වගන්තියේ කිසිවක් මගින් සුරක්ෂිත සිය ණයහිමියාට සිය සුරැකුම් බලාත්මක කිරීමට ඇති අයිතියට බලපෑමක් නොවිය යුතු ය.

(15) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළකට 48 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට හෝ අන්‍යාකාරයකට සුරක්ෂිත ණයකරුවකුගේ අයිතිවාසිකම්. වෙනස්කරන හෝ සීමා කරන නියම ඇතුළත් වන අවස්ථාවක දී සුරක්ෂිත ණයහිමියා වැඩපිළිවෙළට අනුකූලව පමණක් ස්වකීය සුරැකුම ක්‍රියාත්මක කළ හැකි ය.

(16) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළකට කුළී සින්නක්කර ගිවිසුමක් යටතේ ණයහිමියකුගේ අයිතිවාසිකම් වෙනස් කරන හෝ සීමා කරන නියම ඇතුළත් නොවන අවස්ථාවක දී, එම කුළී සින්නක්කර ගිවිසුම යටතේ ණයහිමියාට තම දේපළ අයිතිවාසිකම් ක්‍රියාත්මත කිරීමට ඇති අයිතියට මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින් බලපෑමක් නොවිය යුතු ය.

(17) ණයකරුවකු කුළී සින්නක්කර ගිවිසුමක් ද ඇතුළුව ගිවිසුමක් යටතේ 48 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට හෝ අන්‍යාකාරයකට භාණ්ඩ භාවිත කරන හෝ සන්තකයේ තබා ගන්නා විට දී සහ බදු දීමනාකරුගේ හෝ භාණ්ඩ හිමිකරුවන්ගේ අයිතිවාසිකම් සීමා කිරීමේ හෝ වෙනස් කිරීමේ නියම වැඩපිළිවෙළට ඇතුළත් වන අවස්ථාවක දී, වැඩපිළිවෙළෙහි නියමවලට අනුකූලව, බදු දීමනාකරු හෝ හිමිකරු විසින් තම දේපළ අයිතිවාසිකම් පමණක් ක්‍රියාත්මක කළ හැකි ය.

**56.** (1) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන අතරවාරයේ දී, වැඩපිළිවෙළ පවතින කාලසීමාව පුරා සාධාරණ ලෙසින් අදාළ විය හැකි වන්නාවූ, 32 වන වගන්තිය යටතේ ණයකරුවන්ගේ යම් බැඳීමක්, ණයකරු විසින් සපුරාලිය යුතු ය.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ ණයකරුගේ බැඳීම්

(2) 32 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති බැඳීම්වලට අමතරව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු දේ ණයකරු විසින් ඉටු කළ යුතු ය.

**57.** (1) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළකින් බැඳී සිටින ණයහිමියකු විසින් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන බවට තහවුරු කරන්නා වූ අධිකරණ ආඥාවට එරෙහිව අධිකරණයක් වෙත ඉල්ලීමක් කළ හැකි ය.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට ඇති අභියෝගය

(2) (1) වන උපවගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට එරෙහිව ණයහිමියාගේ ඉල්ලීම පහත සඳහන් හේතු එකක් හෝ කිහිපයක් මත පදනම් විය යුතු ය, එනම්-

(අ) ණයකරු, 46 වන වගන්තියේ සඳහන් යෝග්‍යතා නිර්ණායක සපුරාලනු නොලබන බව;

(ආ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ 47 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අනිවාර්ය විධිවිධානවලට අනුකූල නොවන බව;

(ඇ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සකස් කිරීම සහ තහවුරු කිරීමේ කොටසෙහි කාර්යපටිපාටිමය අවශ්‍යතාවලට අනුකූල නොවූ බව;

(ඈ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ මගින් ආවරණය කළ යුතු ණයක්, 37 වන වගන්තියේ කාර්ය සඳහා ඇතුළත් කළ ණයක් නොවන බව;

(ඉ) මූල්‍ය කටයුතු ප්‍රකාශය කිරීමේ දී හෝ ඒ සමඟ ඇති තොරතුරු සැපයීමේ දී ණයකරු විසින් යම් සැලකිය යුතු තරමේ ව්‍යාජ නියෝජනයක් හෝ මඟහැරීමක් සිදු කර ඇති බව; හෝ

(ඊ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ මගින් ණයහිමියාගේ අයිතිවාසිකම්වලට අසාධාරණ අගතියක් සිදු වන බව.

(3) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට විරුද්ධවීමට ණයහිමියා විසින් අධිකරණයට කරනු ලබන ඉල්ලීමක් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ බලාත්මක වන දින සිට දින විසිඅටක් ඇතුළත අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) ණය හිමියා විසින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට එදිරිව කරනු ලබන ඉල්ලීමක් පිළිබඳව, එම ඉල්ලීමට පදනම වී ඇති හේතු ද ඇතුළත්ව, ණයකරු සහ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු වෙත ලිඛිතව දැන්විය යුතු ය.

(5) ඉහත (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් හේතුවක් මත මේ වගන්තිය යටතේ ඇති ඉල්ලීමක් සම්බන්ධයෙන් අධිකරණය සෑහීමකට පත් වන්නේ නම්, අධිකරණය විසින් පහත සඳහන් ආඥා හෝ විධාන, එනම්-

(අ) එසේ කිරීමෙන් වෙනත් ණයහිමියකුට අසාධාරණ ලෙස අගතියක් නොවන අවස්ථාවක දී, අධිකරණයට ඉල්ලීම කළ ණයහිමියා කෙරෙහි ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් අදාළ නොවන බවට ආඥාවක් නිකුත් කිරීම;

(ආ) සංශෝධිත යෝජනාවක් අනුමත කරන්නේ ද යන්න පිළිබඳව ණයහිමියන්ගෙන් තීරණයක් ඉල්ලා සිටීම සඳහා 58 වන වගන්තිය යටතේ වන වෙනස් කිරීමේ කාර්යපටිපාටිය භාවිත කිරීමට පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට විධාන කිරීම; හෝ

(ඇ) වෙනත් යම් ඇතුළත් කළ ණයක් හෝ ණයහිමියකු සම්බන්ධයෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළ අවලංගු කරමින් ආඥාවක් කිරීම,

කළ හැකි ය.

(6) අධිකරණය විසින් ඉහත (5) වන උපවගන්තිය යටතේ ආඥාවක් ලබා දී ඇති අවස්ථාවක, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ බලාත්මකව පැවති කාලසීමාව තුළ, ඇතුළත් කළ ණයක් සම්බන්ධයෙන් උපචිත වූ කිසියම් පොලී, ගාස්තු හෝ අය කිරීම් ගෙවීමට අධිකරණය විසින් ණයකරුට නියම කළ හැකි ය.

(7) සියලුම ඇතුළත් කළ ණය සහ සියලුම ණයහිමියන් සම්බන්ධයෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අවලංගු කරමින් අධිකරණය විසින් (5) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ආඥාවක් කර ඇති අවස්ථාවක, අධිකරණය විසින්, 40 වන වගන්තිය යටතේ ණය සහන කාලයක් සඳහා වන ආඥාවකට සමාන බලපෑමක් තිබිය යුතු වන්නා වූ හා දින විසිඑකක කාලයක් පවතින්නා වූ ණයහිමියන්ගේ ප්‍රතිකර්මයක් වන තාවකාලික ණය සහන කාලයක් ස්ථාපිත කිරීමට ආඥාවක් ද කළ යුතු ය.

(8) (5) වන හෝ (6) වන උපවගන්ති යටතේ අධිකරණයක් ආඥාවක් කරන ඕනෑම අවස්ථාවක දී, අධිකරණය විසින් -

(අ) ණයකරු;

(ආ) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු;

(ඇ) නිල දේපළ භාරගැනුම්කරු; සහ

(ඈ) (5) වන හෝ (6) වන උපවගන්තිය යටතේ ආඥාව අදාළ වන යම් ණයහිමියෙක්,

වෙත ලිඛිත දැන්වීමක් කළ යුතු ය.

(9) (8) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් නිල දේපළ භාරගැනුම්කරු වෙත දැන්වීමක් කරනු ලබන අවස්ථාවක දී, නිල දේපළ භාරගැනුම්කරු විසින් දින දහහතරක් ඇතුළත -

(අ) නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ සටහනක් ඇතුළත් කිරීමට සැලැස්විය යුතු ය; සහ

(ආ) (5) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් කරන ලද ආඥාව පිළිබඳව සහ (6) වන උපවගන්තිය යටතේ වන යම් ආඥාවක් පිළිබඳව අදාළ ණයහිමියාට ලිඛිත දැන්වීමක් කළ යුතු ය.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: වෙනස් කිරීම

**58.** (1) 54 වන වගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව අධිකරණයක් විසින් ආඥාවක් කර ඇති අවස්ථාවක, එම වැඩපිළිවෙළ එහි නියමයන්ට අනුව සහ මෙම වගන්තියට යටත්ව වෙනස් හැකි ය.

(2) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින්, ස්වකීය මෙහෙයවීමෙන් හෝ ණයකරුවකුගේ හෝ ණයහිමියකුගේ ඉල්ලීම මත, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කරන ලෙසට -

(අ) ණයකරුගේ තත්ත්වයේ සැලකිය යුතු තරමේ වෙනසක් සිදු වී ඇති බව පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට පෙනී යන්නේ නම්; සහ

(ආ) එවැනි තත්ත්වයක් විසඳාලීම සඳහා කරනු ලබන වෙනස ණයකරුගේ ණයහිමියන් විසින් අනුමත කර ක්‍රියාත්මක කරනු ඇති බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි බවට පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු සෑහීමකට පත් වන්නේ නම්,

යෝජනා කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ කොන්දේසි අදාළ වන අවස්ථාවක දී, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින්, ප්‍රායෝගිකව හැකි ඉක්මනින්-

(අ) 33 වන වගන්තියට අනුකූලව, ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ යාවත්කාලීන ප්‍රකාශයක් සම්පූර්ණ කිරීමට ණයකරුට නියම කළ යුතු ය;

(ආ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි වෙනසක් සඳහා යෝජනාවක් සකස් කිරීමට ණයකරුට සහාය විය යුතු ය;

(ඇ) යෝජනාව සඳහා සහ, යෝජනාවට ණයහිමියාගේ අනුමතය ඉල්ලා සිටීම සඳහා ණයකරුගේ කැමැත්ත ඉල්ලා සිටිය යුතු ය;

(ඈ) යෝජනාව පිළිගත යුතු ද යන්න සඳහන් කරන ලෙසට බලපෑමට ලක් වූ එක් එක් ණයහිමියාගෙන් ලිඛිතව ඉල්ලා සිටිය යුතු ය.

(4) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කිරීමේ යෝජනාවක් සම්බන්ධයෙන් බලපෑමක් සිදු වූ එක් එක් ණයහිමියාගෙන් (3) වන උපවගන්තිය යටතේ ලිඛිතව ඉල්ලා සිටීමේ දී පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින් -

(අ) ණයහිමියාට -

(i) යෝජනාව; සහ

(ii) ණයකරුගේ තත්ත්වයේ සිදුව ඇති සැලකිය යුතු තරමේ, වෙනස පිළිබඳ විස්තර ද ඇතුළුව ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ යාවත්කාලීන කළ ප්‍රකාශයක්,

ලිඛිතව දැන්විය යුතු ය;

(ආ) ණයහිමියාට -

(i) 46 වන වගන්තිය යටතේ වූ යෝග්‍යතා නියමයන් ණයකරු විසින් සපුරා ඇති බවට;

(ii) පුද්ගලික වස්තුභංගත්ව යෝජනාකරුගේ උපරිම දැනුමට අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳව ණයකරු ඉදිරිපත් කර ඇති යාවත්කාලීන ප්‍රකාශයේ අන්තර්ගත කරුණු සම්පූර්ණ හා නිවැරදි බවට;

(iii) ණයකරුගේ තත්ත්වයේ අදාළ වෙනස සම්බන්ධයෙන් යෝජනාව සාධාරණ එකක් වන බවට; සහ

(iv) යෝජනාව අනුමත වනු ඇති බවට හා ක්‍රියාත්මක කරනු ඇති බවට සාධාරණ අපේක්ෂාවක් ඇති බවට

වූ ප්‍රකාශයක් පිළිබඳ දැන්වීමක් ලබා දිය යුතු ය;

(ඇ) යෝජනාව පිළිගත යුතු ද නැද්ද යන්න සඳහන් කරමින් තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් ලිඛිත ප්‍රතිචාරයක් ලබා දෙන ලෙසට ණයහිමියාගෙන් ඉල්ලා සිටිය යුතු ය; සහ

(ඈ) එක් එක් ණයහිමියා වෙත යෝජනාව ලබා දී අවම වශයෙන් දින දාහතරකට පසුව විය යුතු, වන ප්‍රකාශිත නියමිත දිනයකට පෙරාතුව පුද්ගලික වස්තුභංගත්වභාවය වෘත්තිකයාට මෙම ප්‍රතිචාරය ලබා දීමේ අවශ්‍යතාවය පිළිබඳව ණයහිමියාට ලිඛිතව දැන්විය යුතු ය.

(5) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් වෙනස් කිරීම පිළිබඳ යෝජනාවක් -

(අ) වැඩපිළිවෙළ වෙනස් කිරීම පිළිබඳව ණයකරු ලිඛිතව කැමැත්ත ලබා දෙන්නේ නම්;

(ආ) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු මේ වගන්තිය යටතේ බලපෑමට ලක් වූ ණයහිමියන්ට ලිඛිතව දන්වන්නේ නම්;

(ඇ) වැඩපිළිවෙළ මගින් බැඳෙන සියලුම ණයහිමියන්ගේ හිමිකම්වල වටිනාකමෙන් බහුතරයක් නියෝජනය කරන්නා වූ සුරක්ෂිත ණයහිමියන් විසින් (4) වන සහ (5) වන උපවගන්තිවල දක්වා ඇති නියමිත දිනයට පෙර යෝජනාව පිළිගන්නා බවට (ඈ) සහ (ඊ) ඡේදවලට යටත්ව පිළිතුරු සපයනු ලබන්නේ නම්;

(ඈ) සුරක්ෂිත ණයහිමියන්ගේ අයිතිවාසිකම් වෙනස් කරන හෝ සීමා කරන නියම යෝජනාවට ඇතුළත් වන අවස්ථාවක දී, වැඩපිළිවෙළ මගින් බැඳෙන සුරක්ෂිත ණයවල හිමිකම්වල වටිනාකමින් තුනෙන් දෙකකට වඩා වැඩි හිමිකම් නියෝජනය කරනු ලබන සුරක්ෂිත ණයහිමියන් විසින් (4) වන සහ (5) උපවගන්තිවල දක්වා ඇති නියමිත දිනයට පෙර, යෝජනාව පිළිගනිමින් පිළිතුරු සපයනු ලබන්නේ නම්; සහ

(ඉ) ණයකරු භාවිත කරන හෝ සිය සන්තකයේ තබා ගෙන සිටින භාණ්ඩවලට අදාළ වන්නා වූ කුලී සින්නක්කර ගිවිසුමක් ද ඇතුළුව, ගිවිසුමක් යටතේ වන භාණ්ඩවල බදු දීමනාකරුවන්ගේ හෝ එම භාණ්ඩවල හිමිකරුවන්ගේ අයිතිවාසිකම් වෙනස් කරන හෝ සීමා කරන නියමයන් යෝජනාවට ඇතුළත් වන විට, (4) වන සහ (5) වන උපවගන්තිවල දක්වා ඇති

නියමිත දිනයට පෙර, බදු වැඩපිළිවෙළ මගින් බැඳී ඇති සුරක්ෂිත ණයවල හිමිකම්වල වටිනාකමෙන් තුනෙන් දෙකකට වඩා වැඩි ප්‍රමාණයක් නියෝජනය කරනු ලබන බදු දීමනාකරුවන් සහ හිමිකරුවන් විසින්, යෝජනාව පිළිගනිමින් පිළිතුරු සපයනු ලබන්නේ නම්,

පිළිගනු ලබන්නේ ය.

(6) (5) වන උපවගන්තියේ කාර්ය සඳහා, (4) වන උපවගන්තිය යටතේ ඇති ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කිරීම සඳහා වූ යෝජනාව පිළිබඳ දැන්වීම එක් එක් ණයහිමියාට ලබා දී දින දාහතරක කාලසීමාව අවසන් වන දිනට පෙර පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට ප්‍රතිචාරයක් ලබා නොදෙන ණයහිමියකු විසින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කිරීමට වූ යෝජනාව පිළිගත යුතු බවට ප්‍රකාශ කරනු ලැබුවේ යයි සලකනු ලැබිය යුතු ය.

(7) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් වෙනස් කිරීමේ යෝජනාවක් පිළිගෙන ඇති විට, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින්, නිල දේපළ භාරගැනුම්කරු වෙත-

(අ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කිරීම අනුමත කරමින් ණයහිමියාගේ ප්‍රතිචාර පිළිබඳ ලිඛිත දැන්වීමක්; සහ

(ආ) වෙනස් කළ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි අවසාන නියමයන්,

ඉදිරිපත් කළ යුතු ය.

(8) (7) වන උපවගන්තියේ දක්වා ඇති ලේඛන ලැබීමෙන් පසු, නිල දේපළ භාරගැනුම්කරු විසින් වෙනස් කළ ණය ප්‍රතිව්‍යුහගත කිරීම නිර්දේශ කරමින් සහතිකයක් නිකුත් කළ යුතු ය.

(9) වෙනස් කරන ලද ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ නිර්දේශ කරන සහතිකයක් නිකුත් කිරීමෙන් පසු නිල දේපළ භාරගැනුම්කරු විසින් -

(අ) මෙම සහතිකය සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කිරීම සඳහා වූ යෝජනාව අනුමත කරමින් ණයහිමියාගේ ලිඛිත දැන්වීම සහ වෙනස් කරන ලද වැඩපිළිවෙළෙහි අවසාන නියම අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය; සහ

(ආ) සහතිකය නිකුත් කිරීම පිළිබඳව ලිඛිත දැන්වීමක්-

(i) ණයකරුට;

(ii) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට;

(iii) වැඩපිළිවෙළෙහි ලැයිස්තු ගත කර ඇති සියලු ණයහිමියන්ට,

ලබා දිය යුතු ය.

(10) (9) වන උපවගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් වෙනස් කිරීම සම්බන්ධයෙන් නිල දේපළ භාර ගැනුම්කරුගෙන් උචිත අධිකරණයක් නිර්දේශයක් ලද අවස්ථාවක දී, අධිකරණය විසින්, එම නිර්දේශය සලකා බලා වෙනස් කළ වැඩපිළිවෙළ බලාත්මකවීම තහවුරු කරමින් අඥාවක් කරනු ලැබිය යුතු ය.

(11)(10) වන උපවගන්තිය යටතේ වෙනස්කළ වැඩපිළිවෙළක් බලාත්මක වීම තහවුරු කරමින් අධිකරණය විසින් ආඥාවක් නිකුත් කරනු ලබන අවස්ථාවක, මේ කොටසේ විධිවිධාන, 54 වන වගන්තිය යටතේ තහවුරු කරන ලද වැඩපිළිවෙළක් ලෙස සලකා වෙනස් කළ වැඩපිළිවෙළට අදාළ විය යුතු ය.

**59.** (1) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු හෝ ණයහිමියකු සමඟ එක්ව ණයකරු විසින් කරන ලද යෝජනාවක් මගින් යම් අවස්ථාවක දී, නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින්, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් - ණය පුනරුත්ථාපන වැඩපිළිවෙළ අවසන් කිරීම

(අ) යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ණයහිමියන්ගේ හිමිකම්, ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතිය ඇති සියලුම ණයහිමියන්ගේ හිමිකම්වල වටිනාකමින් බහුතරයක් නියෝජනය කරයි නම්;

(ආ) යෝජනාවට සුරක්ෂිත ණයහිමියන්ගේ අයිතිවාසිකම් වෙනස් කිරීමේ හෝ සීමා කිරීමේ නියමයන් ඇතුළත් වේනම් සහ යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන සුරක්ෂිත ණයහිමියන්ගේ හිමිකම්, ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතිය ඇති සුරක්ෂිත ණයහිමියන්ගේ හිමිකම්වල වටිනාකමෙන් තුනෙන් දෙකකට වඩා නියෝජනය කරයි නම්; හෝ

(ඇ) ණයකරුවකු භාවිත කරන හෝ සන්තකයේ තබා ගෙන සිටින භාණ්ඩ වලට අදාළ වන්නා වූ කුලී සින්නක්කර ගිවිසුමක් ද ඇතුළුව ගිවිසුමක් යටතේ වන භාණ්ඩවල බදු දීමනාකරුවන්ගේ හෝ එම භාණ්ඩවල හිමිකරුවන්ගේ අයිතිවාසිකම් වෙනස් කරන හෝ සීමා කරන නියම යෝජනාවට ඇතුළත්වේ නම් සහ යෝජනාවට පක්ෂව ඡන්දය දෙන බදු දීමනාකරුවන්ගේ හා හිමිකරුවන්ගේ හිමිකම්වල වටිනාකම ඡන්දය දීමට අයිතිය ඇති ණයහිමියන්ගේ හිමිකම්වල වටිනාකමෙන් තුනෙන් දෙකකට වඩා නියෝජනය කරයි නම්,

අවසන් කළ හැකි ය.

(2) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අවසන් කිරීමේ ආඥාවක් සඳහා පහත සඳහන් යම් තැනැත්තකුට අධිකරණයක් වෙත ඉල්ලීමක් කළ හැකි ය: -

(අ) ණයකරු;

(ආ) ණයහිමියා;

(ඇ) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු; හෝ

(ඈ) නිල දේපළ භාරගැනුම්කරු.

(3) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අවසන් කිරීමේ ආඥාවක් සඳහා වන ඉල්ලීමකට, නියම කරනු ලැබිය හැකි ආකාරයකට එයට -

(අ) එය ණයකරු විසින් ඉදිරිපත් කරන ලද අවස්ථාවක දී, බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන ඉල්ලීමක්; හෝ

(ආ) එය ණයහිමියකු විසින් කරන ලද අවස්ථාවක දී, ණයකරුට එරෙහිව බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන පෙත්සමක්,

ද ඇතුළත් විය හැකි ය.

(4) (3) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වන ඉල්ලීමක් පහත සඳහන් කරුණු එකක් හෝ කිහිපයක් මත පදනම් විය යුතු ය:-

(අ) ණයහිමියකුට සැලකිය යුතු තරමේ හානියක් සිදු කරනු ලබන ව්‍යාජ නියෝජනයක් හෝ කරුණු අතහැරීමක් ණයහිමියාගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශයේ තිබීම;

(ආ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සකස් කිරීම සහ තහවුරු කිරීම මේ කොටසෙහි කාර්ය පටිපාටියේ අවශ්‍යතාවලට අනුකූල නොමැති වීම;

(ඇ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යෝජනා කළ අවස්ථාව වන විට, ණයකරු, 46 වන වගන්තිය යටතේ ඇති යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති වීම;

(ඈ) 32 වන සහ 56 වන වගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ මගින් ණයකරුට පනවා ඇති බැඳීම්වලට අනුකූලව ණයකරු දිගින් දිගටම ක්‍රියා කර නොමැති වීම;

(ඉ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ බලාත්මක වීමෙන් පසු ණයකරු මේ පනත යටතේ වරදකට වරදකරු වී තිබීම;

(ඊ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ ගෙවීම් සම්බන්ධයෙන් ණයකරු විසින් මාස තුනකට නොඅඩු කාලසීමාවකට අනුරූප වන මුදලක්, හිඟ තබා තිබීම;

(උ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට සාධාරණ ලෙස අවශ්‍ය යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට ණයකරු අපොහොසත් වීම; හෝ

(ඌ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කිරීම සඳහා ණයකරු විසින් කැමැත්ත ප්‍රකාශ කිරීම අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කර තිබීම.

(5) (2) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් විභාග කිරීමේ දී, අධිකරණය විසින් -

(අ) ඉල්ලීම නිෂ්ප්‍රභ කළ හැකි ය;

(ආ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අවසන් කළ හැකි ය; හෝ

(ඇ) 58 වන වගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි වෙනස් කිරීමේ යෝජනාවක් සකස් කරන ලෙසට පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට ආඥා කළ හැකි ය.

(6) අධිකරණය විසින්, (5) වන උපවගන්තිය යටතේ ආඥාවක් කර ඇති අවස්ථාවක, අධිකරණය විසින්, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මකව පැවති කාලසීමාව තුළ ඇතුළත් කළ ණයක් සම්බන්ධයෙන් උපචිත වූ යම් පොලියක්, ගාස්තුවක් හෝ අය විය යුතු යම් මුදලක් ගෙවීමට ණයකරුට ආඥා කරනු ලැබිය හැකි ය.

(7) (5) වන හෝ (6) වන උපවගන්ති යටතේ අධිකරණය ආඥාවක් කරනු ලබන යම් අවස්ථාවක, අධිකරණය විසින් -

(අ) ණයකරු;

(ආ) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු;

(ඇ) නිල දේපළ භාරගැනුම්කරු; සහ

(ඈ) (5) වන හෝ (6) වන උපවගන්තිය යටතේ ආඥාව අදාළ වන යම් ණයහිමියෙක්,

වෙත ලිඛිත දැන්වීමක් කළ යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් නිල දේපළ භාරගැනුම්කරු ලිඛිත දැන්වීමක් කරන විට, නිල දේපළ භාරගැනුම්කරු විසින් එකී දැන්වීම ලද දින සිට දින දාහතරක කාලයක් ඇතුළත, වැඩපිළිවෙළ අවසන් කිරීම පිළිබඳ කරුණු වාර්තාගත කරමින් පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ සටහනක් ඇතුළත් කිරීම සිදු කළ යුතු ය.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සම්පූර්ණ කිරීම

**60.** (1) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක්, 59 වන වගන්තිය යටතේ කලින් අවසන් කරනු ලැබුවහොත් මිස, එය විසින් ඇති කරන ලද සියලුම බැඳීම් අවසන් වූ විට සම්පූර්ණ වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වැඩපිළිවෙළ සම්පූර්ණ කළ විට, සම්පූර්ණ කිරීමෙන් පසු දින දාහතරක් ඇතුළත පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින්-

(අ) ණයකරුට සම්පූර්ණ කිරීමේ සහතිකයක් ලබා දිය යුතු ය; සහ

(ආ) සම්පූර්ණ කිරීමේ සහතිකය පිළිබඳව නිල දේපළ භාර ගැනුම්කරුට ලිඛිතව දැන්විය යුතු ය.

(3) සම්පූර්ණ කිරීමේ සහතිකය එහි දක්වා ඇති කරුණු පිළිබඳ බැලූබැල්මට සාක්ෂියක් වන්නේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සම්පූර්ණ කළ විට, ණයකරුගේ ඇතුළත් කළ ණය ඒ අනුව අවලංගු විය යුතු අතර, එම ණයවලට අදාළව ගෙවිය යුතු පොලිය, ගාස්තු හෝ අය කිරීම් ඇතුළුව ණයවලින් යම් කොටසක් ගෙවීමේ වගකීමට ණයකරු යටත් නොවිය යුතු ය.

(5) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සම්පූර්ණ වීම මගින් ණයකරු බැහැර කරන ලද ණයවලින් නිදහස් නොවිය යුතු ය.

(6) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සම්පූර්ණ වීම මගින් වැඩපිළිවෙළෙහි නියමවල දක්වා ඇති ප්‍රමාණයට හැර -

(අ) ණයකරු සමඟ එක්ව ගෙවිය යුතු ණයකින් වෙනත් යම් තැනැත්තකු නිදහස් කිරීම; හෝ

(ආ) ණයකරුගේ ණය සඳහා ඇපකරුවකු ලබා දුන් ඇපකරයෙන් ඇපකරුවා නිදහස් කිරීම,

සිදු නොවිය යුතු ය.

(7) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සම්පූර්ණ කිරීම මගින් වැඩපිළිවෙළෙහි නියමවල දක්වා ඇති ප්‍රමාණයට හැර, කිසියම් සුරක්ෂිත ණයක් යටතේ වගකීම්වලින් හෝ සුරක්ෂිත ණයක කිසියම් කොටසකට අදාළ වගකීමෙන් ණයකරු නිදහස් නොවිය යුතු ය.

(8) (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සම්පූර්ණ කිරීමේ සහතිකය නිල දේපළ භාරගැනුම්කරු ලද පසුව, නිල දේපළ භාරගැනුම්කරු විසින් -

(අ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සාර්ථක ලෙස නිම කළ බව පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ වාර්තාගත කළ යුතු ය; සහ

(ආ) එය ලැබීමෙන් පසු දින දාහතරක් ඇතුළත, සම්පූර්ණ කළ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ සටහන් කර ඇති සියලුම තොරතුරු ඉන් ඉවත් කළ යුතු ය.

(9) සැක දුරු කිරීමේ කාර්ය සඳහා, (1) වන උපවගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සම්පූර්ණ කළ විට, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ තවදුරටත් ක්‍රියාත්මක නොවන අතර, 55 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ණයහිමි ප්‍රතිකර්ම ලෙස සහන කාලය අදාළ වීම අවසන් වන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළ යටතේ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරය

**61.** (1) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් යටතේ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරයට -

(අ) පොදුවේ, වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම;

(ආ) වැඩපිළිවෙළෙහි නිශ්චිතව දක්වා ඇති ආකාරයට ණයකරුගේ දේපළ සම්බන්ධයෙන් කටයුතු කිරීම;

(ඇ) ණයකරු විසින් තොරතුරු ඉල්ලා සාධාරණ ඉල්ලීමක් කරන විට, ණයකරුට වැඩපිළිවෙළෙහි පරිපාලනය පිළිබඳ තොරතුරු ලබා දීම;

(ඈ) වැඩපිළිවෙළෙහි පරිපාලනය පිළිබඳ තොරතුරු-

(i) වැඩපිළිවෙළ මගින් බැඳී සිටින ණයහිමියකුට;

(ii) තොරතුරු ලබා ගැනීම සඳහා සාධාරණ ඉල්ලීමක් කරන ණයහිමියකුට

ලබා දීම;

(ඉ) නිල දේපළ භාරගැනුම්කරුට වැඩපිළිවෙළෙහි පරිපාලනය පිළිබඳ තොරතුරු ලබා දීම;

(ඊ) ණයකරු මේ පනත යටතේ වරදක් කර තිබේ ද යන්න සලකා බැලීම; සහ

(උ) මේ පනත හෝ ඒ යටතේ හෝ වෙනත් යම් අදාළ ප්‍රඥප්තියක් යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ ණයකරු විසින් කරන ලද යම් වරදක් පිළිබඳ යම් සාක්ෂියක්, නිල දේපළ භාරගැනුම්කරු හෝ නීතිය බලාත්මක කිරීමේ අදාළ බලධරයා වෙත යොමු කිරීම,

ඇතුළත් වන්නේය.

(2) වැඩපිළිවෙළ පරිපාලනය කිරීමේ දී දරන ලද වියදම් එම වියදම්, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා වන අදාළ යෝජනාවේ නිශ්චිතව දක්වා ඇති ආකාරයේ නම් මිස, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු වෙත ප්‍රතිපූරණය නොකරනු ලැබිය යුතු ය.

(3) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින්-

(අ) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුගේ පුද්ගලික බැංකු ගිණුමකට ලද මුදල් නොගෙවිය යුතු ය; සහ

(ආ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ ණයකරුවන් විසින් ගෙවනු ලබන සියලුම මුදල් ලැබීම සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන යා යුතු අතර, එම ගිණුමෙන් මුදල් -

(i) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි පරිපාලනයට අදාළ කාර්ය සඳහා මිස;

(ii) මේ පනතට අනුව සහ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගවලට අනුව මිස; හෝ

(iii) අධිකරණයේ විධානයකට අනුව මිස,

නොගෙවිය යුතු ය.

(4) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ ණයකරුවන් විසින් ගෙවන ලද මුදල්, නියමිත වේලාවට හා එකඟ වූ අනුපාතයට ණයහිමියන් වෙත සම්ප්‍රේෂණය කළ යුතු ය.

(5) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින්, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් යටතේ ණයකරුවන්ගෙන් ලද මුදල් පිළිබඳව සහ ණයහිමියන්ට බෙදා හරින ලද මුදල් පිළිබඳ ගිණුම් වාර්තා සම්පූර්ණ හා නිවැරදි ලෙස පවත්වාගෙන යා යුතු ය.

(6) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු ණයකරු සමඟ ක්‍රමවත් සම්බන්ධතා පැවැත්විය යුතු අතර-

(අ) අවම වශයෙන් සෑම මාස හයකට වරක්; සහ

(ආ) වැඩපිළිවෙළ ක්‍රියාත්මක වීමෙන් ඇති වන තත්ත්වයන් අනුව අවශ්‍ය විය හැකි වෙනත් අවස්ථාවල දී,

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සමාලෝචනය කළ යුතු ය.

(7) ණයකරුගේ තත්ත්වයන් සැලකිය යුතු අන්දමින් වෙනස් වී ඇති අවස්ථාවල දී, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින් ණයකරු විමසා, 58 වන වගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ විධිවිධාන වෙනස් කිරීමේ කාර්යපටිපාටිය ආරම්භ කළ යුතු ද යන්න පිළිබඳව නිසි පරිදි සලකා බැලිය යුතු ය.

පුද්ගලික වස්තුභංගත්ව යෝජකයින්

**62.** (1) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු, මේ කොටස යටතේ පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකුගේ කාර්යය ඉටු කරන විට-

(අ) ණයකරුගේ අනුයෝජිතයකු නොවන්නේ ය;

(ආ) යම් ණයහිමියකුගේ හෝ ණයහිමියන්ගේ අනුයෝජිතයකු නොවන්නේ ය;

(ඇ) හැකි නම්, ණයකරුට සහ ණයහිමියන්ට සෑහීමකට පත් විය හැකි විසඳුමක් ලබා ගැනීම සඳහා, ණයකරු සහ ණයහිමියන් සමඟ පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාගේ වෘත්තීය මට්ටමින් කටයුතු කළ යුතු ය; සහ

(ඈ) මේ පනතේ විධිවිධාන, සහ නියෝග සහ මේ පනතේ 4 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් සාදනු ලබන යම් රීති, ප්‍රමිති, චර්යා ධර්ම සංග්‍රහ, ප්‍රායෝගික විධාන හෝ මාර්ගෝපදේශ පිළිබඳ සැලකිල්ල යොමු කරමින් ස්වාධීන වෘත්තීය විනිශ්චයයක් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) යම් තැනැත්තකුට පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු ලෙස සේවය කළ හැකි වනුයේ, එකී තැනැත්තා-

(අ) යෝජිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට අදාළව ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කරනු ලැබීමට සහ ක්‍රියා කරනු ලැබීමට 12 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබා ඇත්නම්;

(ආ) යෝජිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට අදාළව ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කරනු ලැබීමට සහ ක්‍රියා කරනු ලැබීමට 12 වන

වගන්තිය යටතේ සුදුසුකම් ලබා ඇති බව එම තැනැත්තා විසින් ලිඛිතව සහතික කර ඇත්නම්; සහ

(ඇ) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු ලෙස පත් කරනු ලැබීම සඳහා ලිඛිතව කැමැත්ත පළ කර ඇත්නම් සහ පත් කරනු ලබන අවස්ථාවේ දී ස්වකීය කැමැත්ත ඉල්ලා අස්කරගෙන නොමැති නම්,

පමණි.

(3) (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල අවශ්‍යතා කිසිවක් සපුරා නොමැති බව දනිමින් පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ ක්‍රියා කරනු ලැබීමට කැමැත්ත දෙනු ලබන තැනැත්තකු වරදක් සිදු කරන අතර, වරදකරු කිරීමේ දී රුපියල් ලක්ෂ පහකට නොඅඩු සහ රුපියල් මිලියන දෙකකට නොවැඩි දඩයකට හෝ වසර තුනකට නොවැඩි කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.

පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවන්

**63.** (1) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු, මේ කොටස යටතේ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ කාර්ය ඉටු කරන විට, ඔහු-

(අ) ණයකරුගේ අනුයෝජිතයකු නොවන්නේ ය;

(ආ) යම් ණයහිමියකු හෝ ණයහිමියන්ගේ අනු යෝජිතයකු නොවන්නේ ය;

(ඇ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා ණයකරු සහ ණයහිමියන් සමඟ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුගේ වෘත්තීයමය තත්ත්වයෙන් කටයුතු කළ යුතු ය; සහ

(ඈ) මේ පනතේ විධිවිධාන, නියෝග සහ 4 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් සාදනු ලබන යම් රීති, ප්‍රමිති, චර්යා ධර්ම සංග්‍රහ, ප්‍රායෝගික විධාන හෝ මාර්ගෝපදේශ සම්බන්ධයෙන් සැලකිල්ල යොමු කරමින් ස්වාධීන වෘත්තීය විනිශ්චයක් සිදු කළ යුතු ය.

(2) යම් තැනැත්තකුට පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස සේවය කරනු ලැබිය හැකි වනුයේ, එම තැනැත්තා -

(අ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කරනු ලැබීමට සහ ක්‍රියා කරනු ලැබීමට 12 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබා ඇත්නම්;

(ආ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට අදාළව ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කරනු ලැබීමට සහ ක්‍රියා කරනු ලැබීමට 12 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබා ඇති බවට එම තැනැත්තා විසින් ලිඛිතව සහතික කර ඇත්නම්; සහ

(ඇ) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත් කරනු ලැබීම සඳහා ලිඛිතව කැමැත්ත ප්‍රකාශ කර ඇත්නම් සහ පත් කරනු ලබන අවස්ථාවේ දී ස්වකීය, කැමැත්ත ඉල්ලා අස්කර ගෙන නොමැති නම්,

පමණි.

(3) (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල අවශ්‍යතා කිසිවක් සපුරා නොමැති බව දනිමින් පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත් කරනු ලැබීමට හෝ ක්‍රියා කරනු ලැබීමට කැමැත්ත දෙනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, වරදකරු කිරීමේ දී රුපියල් ලක්ෂ පහකට නොඅඩු සහ රුපියල් මිලියන දෙකකට නොවැඩි දඩයකට හෝ වසර තුනකට නොවැඩි කාලයක් සඳහා බරපතළ වැඩ සහිතව බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: අධිකරණ විධාන

**64.** (1) දේපළ භාරගැනුම්කරු හෝ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින්, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් පැන නඟින යම් කාරණයක් සම්බන්ධයෙන් විධානයක් හෝ ආඥාවක් සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් මත අධිකරණය විසින්-

(අ) අධිකරණය සුදුසු යයි සලකනු ලබන විධාන නිල දේපළ භාරගැනුම්කරුට හෝ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු වෙත ලබා දිය හැකි ය;

(ආ) 32 වන සහ 56 වන වගන්ති යටතේ පැන නඟින ණයකරුගේ බැඳීම් ක්‍රියාත්මක කිරීම සඳහා ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය;

(ඇ) ඉල්ලීම, 59 වන වගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අවසන් කිරීම සඳහා වූ ඉල්ලීමක් ලෙස සලකනු ලැබිය හැකි ය; හෝ

(ඈ) 58 වන වගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය ආරම්භ කරන ලෙසට පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට ආඥා කළ හැකි ය.

## V වන කොටස

### ණය පුනරුත්ථාපන ආඥා

ණය පුනරුත්ථාපන ආඥාව

**65.** (1) මේ කොටස මගින් බංකොලොත්භාවය සඳහා විකල්ප කාර්යපටිපාටියක් ස්ථාපනය කරන අතර, එම කාර්ය පටිපාටියේ ඉලක්කවලට -

(අ) ණයහිමියන්ට ණය ආපසු ගෙවීමේ සාධාරණ අපේක්ෂාවක් තබා ගැනීම සඳහා ප්‍රමාණවත් වත්කම් සහ ආදායමක් නොමැති ණයකරුවන් ආර්ථික වශයෙන් වහාම පුනරුත්ථාපනය කිරීම සහ ඔවුන්ට අධික ණය බරින් සහන සැලසීම; සහ

(ආ) ණයකරුවකුගේ හිඟ ණය මට්ටම් සහ ආදායම් මාර්ග මගින් විධිමත් වස්තුභංගත්ව කාර්ය පටිපාටියක් භාවිත කිරීම සාධාරණීකරණය නොකරන්නාවූ වස්තුභංගත්ව නඩු කාර්ය පටිපාටියේ සංකීර්ණත්වය සහ වියදම් අවම

කරමින් කාලෝචිත, කාර්යක්ෂම සහ අපක්ෂපාති ලෙස විසඳීම,

ඇතුළත් වේ.

(2) ණය පුනරුත්ථාපන ආඥා කාර්යපටිපාටිය මගින් සුරක්ෂිත ණයහිමියන්ගේ අයිතිවාසිකම්වලට බලපෑමක් නොවන්නේ ය.

ණය පුනරුත්ථාපන ආඥාවන් සඳහා යෝග්‍යතාව

**66.** පහත දැක්වෙන නිර්ණායක සියල්ල සපුරා තිබෙන ණයකරුවකු ණය පුනරුත්ථාපන ආඥාවක් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය; එනම්-

(අ) ණයකරුට, රුපියල් මිලියන දෙකකට නොඅඩු සම්පූර්ණ ණය (යම් බැහැර කළ ණයක් හැර) ප්‍රමාණයක් තිබීම;

(ආ) 36 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි රුපියල් ලක්ෂයකට හෝ ඊට අඩු මාසික අතිරික්ත ආදායමක් ණයකරුට තිබීම;

(ඇ) 34 වන වගන්තියේ අර්ථ දක්වා ඇති පරිදි ආරක්ෂිත දේපළ බැහැර කරමින් රුපියල් ලක්ෂ දෙකක් හෝ ඊට අඩු වටිනාකමකින් යුත් දේපළ ණයකරුට තිබීම;

(ඈ) ණයකරුට, ගෙවීමට නියමිත වන විට ස්වකීය ණය ගෙවීමට නොහැකි වීම;

(ඉ) ණයකරු ශ්‍රී ලංකාවේ පදිංචිව සිටීම; නැතහොත් ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීමේ දිනට පෙර අවුරුදු තුනක කාලයක් තුළ ණයකරු -

(i) ශ්‍රී ලංකාවේ පදිංචි වී සිටීම හෝ ණයකරුට ශ්‍රී ලංකාවේ පදිංචි ස්ථානයක් තිබීම; හෝ

(ii) විසින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගොස් තිබීම;

(ඊ) ණයකරු දැනට බංකොලොත්භාවයට පත් වූ ණයකරුවකු නොවීම;

(උ) ණය පුනරුත්ථාපන ආඥාව සඳහා වන ඉල්ලීමේ දිනට පූර්වගාමී වසරක් ඇතුළත ණය පුනරුත්ථාපන ආඥාවට යටත් තැනැත්තකු නොවී තිබීම ; සහ

(ඌ) ණය පුනරුත්ථාපන ආඥාව සඳහා වන ඉල්ලීමේ දිනට පූර්වගාමී අවුරුදු පහක කාලය ඇතුළත බංකොලොත්භාවය පිළිබඳ නියෝගයකට යටත් වූ තැනැත්තකු නොවී තිබීම.

ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා ඉල්ලීම

**67.** (1) 66 වන වගන්තියේ නිර්ණායක සපුරාලන ණයකරුවකු, විසින් තමාගේ මෙහෙයවීමෙන් ම හෝ බලයලත් අතරමැදියකු මගින්, ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා නිල දේපළ භාරගැනුම්කරු වෙත ඉල්ලීමක් කළ යුතු ය.

(2) 65 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාර්යපටිපාටියේ ඉලක්කවලට අනුකූල වන ආකාරයෙන්, ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීමක ආකෘතිය නියම කරනු ලැබිය හැකි ය.

(3) ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීමක් (8) වන උපවගන්තියට අනුකූලව නියම කරනු ලැබිය හැකි ගාස්තු ද (ඇත්නම්) සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(4) ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීමකට, නියම කරනු ලැබිය හැකි යම් අවශ්‍යතාවන්ට අමතරව, 33 වන වගන්තියට අනුකූලව ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශයක් ද ඇතුළත් විය යුතු ය.

(5) ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා ඉල්ලීමක් කිරීමේදී-

(අ) ණයකරු විසින් 66 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යෝග්‍යතා නිර්ණායක සපුරාලන්නේ දැයි නිශ්චය කිරීමට නිල දේපළ භාරගැනුම්කරු විසින් අවශ්‍ය යයි සලකනු ලබන වීමසීම්, නිල දේපළ භාරගැනුම්කරු විසින් සිදු කිරීමට;

(ආ) එකී විමසීම් සඳහා නිල දේපළ භාරගැනුම්කරුට සතුටුදායක පිළිතුරු ලැබෙන තෙක් නිල දේපළ

භාරගැනුම්කරු විසින් ණය පුනරුත්ථාපන ආඥාව ඉල්ලීම සලකා බැලීම කල් දැමීමට;

(ඇ) ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සහ සලකා බැලීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණයට, ණයකරුගේ පුද්ගලික දත්ත නිල දේපළ භාරගැනුම්කරු විසින් ණයහිමියන්ට සහ අනෙකුත් තෙවන පාර්ශ්වයන් වෙත හෙළිදරව් කිරීමට; සහ

(ඈ) ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සහ සලකා බැලීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට, ණයකරුගේ පුද්ගලික දත්ත, ණයහිමියන්, රාජ්‍ය ආයතන හෝ වෙනත් අදාළ තෙවන පාර්ශ්වයන් විසින් නිල දේපළ භාරගැනුම්කරුට හෙළිදරව් කිරීමට,

ණයකරු කැමැත්ත දෙනු ලබන්නේ ය.

(6) ණය පුනරුත්ථාපන ආඥාව සඳහා වන ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ දී, ණයකරු විසින්, ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීමේ තත්ත්වයන්ට සාධාරණ ලෙස අදාළ විය හැකි 32 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් අදාළ බැඳීම්වලට යටත් විය යුතු ය.

(7) ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා ඉල්ලීමක් සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා ණයකරුට සහාය වන බලයලත් මැදිහත්කරුවන්ගේ ක්‍රියාවන් පිළිබඳ විස්තර නියම කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

(8) (3) වන උපවගන්තියට අනුකූලව ගාස්තුවක් නියම කරනු ලබන අවස්ථාවකදී, 65 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාර්යපටිපාටියේ ඉලක්කවලට අනුකූල මට්ටමකින් ගාස්තුව සැකසිය යුතු ය.

**68.** (1) ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීමක් නිශ්චය කිරීමේ කාර්ය සඳහා, නිල දේපළ භාරගැනුම්කරු විසින් පහත දැක්වෙන උපකල්පන අදාළ කර ගත යුතු ය. ණය පුනරුත්ථාපන ආඥාවක් සෑදීමේ නිර්ණායක

(2) (අ) ඉල්ලීම් දිනයේ දී ඉල්ලීමේ සපයා ඇති තොරතුරුවලින් අසම්පූර්ණ හා වැරදි සහගත

තොරතුරු සපයා ඇති බවට විශ්වාස කිරීමට නිල දේපළ භාරගැනුම්කරුට කිසිදු හේතුවක් නොමැති බව ඉල්ලීමේ දිනය වන විට, නිල දේපළ භාරගැනුම්කරුට පෙනී යන්නේ නම්; සහ

(ආ) ඉල්ලීමේ දින සිට ණයකරුගේ මූල්‍ය තත්ත්වයන්හි වෙනසක් තිබීම හේතුකොටගෙන, ණයකරුට ස්වකීය ණය ගෙවීමට හැකි බවට විශ්වාස කිරීමට නිල දේපළ භාරගැනුම්කරුට හේතුවක් නොමැති නම්,

ඉල්ලීම නිශ්චය කරන අවස්ථාවේ දී ණයකරුට ණය ගෙවීමට නොහැකි බව නිල දේපළ භාරගැනුම්කරුට උපකල්පනය කිරීමට හැකි විය යුතු ය.

(3) (අ) සපයා ඇති තොරතුරු අසම්පූර්ණ හා වැරදි සහගත බවට, ඉල්ලීමේ සපයා ඇති තොරතුරුවලින් නිල දේපළ භාරගැනුම්කරුට පෙනී යන්නේ නම්;

(ආ) නියම කරනු ලැබිය හැකි පරිදි යම් සත්‍යායන සිදු කර ඇත්නම්; සහ

(ඇ) ඉල්ලීමේ දින සිට ණයකරුගේ තත්ත්වයන්හි වෙනසක් තිබීම හේතුවෙන්, යම් කොන්දේසියක් තවදුරටත් සපුරාලීමට නොහැකි වන බව නිල දේපළ භාරගැනුම්කරුට විශ්වාස කිරීමට කිසිදු හේතුවක් නොමැති නම්,

66 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අනෙකුත් සියලුම කොන්දේසි සපුරා ඇති බවට නිල දේපළ භාරගැනුම්කරුට උපකල්පනය කිරීමට හැකි විය යුතු ය.

(4) ඉල්ලීමේ සපයා ඇති තොරතුරුවලට මේ වගන්තියේ කරනු ලබන සඳහනකට, ඉල්ලීම සනාථ කිරීම සඳහා නිල දේපළ භාරගැනුම්කරු වෙත සපයා ඇති තොරතුරු හෝ නිල දේපළ භාරගැනුම්කරු විසින් කරන ලද විමසීම් වලට ප්‍රතිචාර වශයෙන් ලද තොරතුරු ද ඇතුළත් වේ.

නිල දේපළ භාර ගැනුම්කරුගේ නිර්දේශය: ණය පුනරුත්ථාපන ආඥාව

**69.** (1) මේ වගන්තිය, ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා ඉල්ලීමක් කර ඇති අවස්ථාවක් සඳහා අදාළ වේ.

(2) නිල දේපළ භාරගැනුම්කරු විසින් ණයකරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් කරන ලද යම් විමසීම් සඳහා ණයකරු විසින් සතුටුදායක ප්‍රතිචාර ලබා දෙන තෙක්, ණය පුනරුත්ථාපන ආඥාව සඳහා වන ඉල්ලීමක් සලකා බැලීම සහ නිශ්චය කිරීම නිල දේපළ භාරගැනුම්කරු විසින් කල් දැමිය හැකි ය.

(3) නිල දේපළ භාරගැනුම්කරු විසින් ණය පුනරුත්ථාපන ආඥාව සඳහා වන ඉල්ලීම -

(අ) ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ ද යන්න තීරණය කිරීම මගින්; හෝ

(ආ) නිල දේපළ භාරගැනුම්කරු විසින් එය ප්‍රතික්ෂේප නොකරන්නේ නම්, ණය පුනරුත්ථාපන ආඥාවක් නිර්දේශ කරන සහතිකයක් නිකුත් කිරීම මගින්,

නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) ණය පුනරුත්ථාපන ආඥාවක් නිර්දේශ කරමින් සහතිකයක් නිකුත් කිරීමේ දී, නිල දේපළ භාරගැනුම්කරු විසින් -

(අ) මේ සහතිකය, ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීම සහ යම් උපකාරක ලියකියවිලි ද සමග, අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය; සහ

(ආ) සහතිකය නිකුත් කිරීම සම්බන්ධයෙන් ණයකරුට සහ ණයකරුට සහාය වන යම් බලයලත් අතරමැදියකුට ලිඛිත දැන්වීමක් කළ යුතු ය.

(5) නිල දේපළ භාරගැනුම්කරු විසින් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ හැක්කේ මේ වගන්තියේ සඳහන් පහත කවර හෝ විධිවිධාන මගින් නිල දේපළ භාරගැනුම්කරුට එසේ කිරීමට බලය පවරා තිබේ නම් පමණි.

(6) (අ) ඉල්ලීම මගින් 68 වන වගන්තිය යටතේ පනවනු ලබන අවශ්‍යතා සියල්ල සපුරනු නොලබන බවට;

(ආ) 66 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසි සපුරා නොමැති බවට;

(ඇ) නිල දේපළ භාරගැනුම්කරු විසින් නියම කරන ලද කාලසීමාවන් තුළ, නිල දේපළ භාරගැනුම්කරුගේ

විමසීම්වලට ණයකරු සතුටුදායක ලෙස ප්‍රතිචාර දක්වා නොමැති බවට; හෝ

(ඇ) ඉල්ලීම කිරීමේ දී හෝ ඉල්ලීම සනාථ කිරීම සඳහා අමතර තොරතුරු සැපයීමේ දී ණයකරු විසින් යම් වැදගත් කරුණක් පිළිබඳව සාවද්‍ය නියෝජනයක් සිදුකර හෝ වැදගත් කරුණක් මගහැර ඇති බවට,

නිල දේපළ භාර ගැනුම්කරු විසින් සලකනු ලබන්නේ නම් නිල දේපළ භාර ගැනුම්කරුට ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

(7) නිල දේපළ භාරගැනුම්කරු විසින් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන්නේ නම්, නිල දේපළ භාරගැනුම්කරු විසින් එම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ණයකරුට සහ ණයකරුට සහාය වන යම් බලයලත් අතරමැදියකුට ලිඛිත දැන්වීමක් ලබා දිය යුතු අතර, එහි, එකී ප්‍රතික්ෂේප කිරීමට හේතු ද ඇතුළත් විය යුතු ය.

ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීමක් අධිකරණය තීරණය කිරීම

**70.** (1) 69 වන වගන්තිය යටතේ ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා නිර්දේශයක් අධිකරණය වෙත ලද අවස්ථාවක දී, අධිකරණය විසින්, නිර්දේශ සහ ඒ සමග ඉදිරිපත් කර ඇති ලේඛන ද සැලකිල්ලට ගත යුතු ය.

(2) මේ වගන්තිය යටතේ ඉල්ලීමක් සලකා බැලීමේ දී, 69 වන වගන්තිය යටතේ නිල දේපළ භාර ගැනුම්කරු විසින් නිකුත් කරන ලද සහතිකය, එහි සහතික කර ඇති කරුණු සඳහා සාක්ෂියක් ලෙස සැලකීමට අධිකරණයට බලය තිබිය යුතු ය.

(3) ණය පුනරුත්ථාපන ආඥාව සඳහා වන නිර්දේශය සලකා බැලීමෙන් පසු, අධිකරණය විසින් -

(අ) ණයකරු 66 වන වගන්තියේ යෝග්‍යතා නිර්ණායක සපුරාලන්නේ නම්; සහ

(ආ) ඉල්ලීම කිරීමේ දී ණයකරු විසින් සාවද්‍ය නියෝජනයක් සිදුකර හෝ වැදගත් කරුණක් මගහැර ඇති බව විශ්වාස කිරීමට අධිකරණයට හේතුවක් නොමැති නම්,

වස්තුභංගත්වයට පත් වූ තැනැත්තා සම්බන්ධයෙන් අධිකරණය විසින් ණය පුනරුත්ථාපන නියෝගයක් කළ යුතු ය.

(4) ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන නිර්දේශයක් සලකා බැලීමෙන් පසු, අධිකරණය විසින් -

(අ) ණයකරු 66 වන වගන්තියේ යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති නම්; හෝ

(ආ) ඉල්ලීම කිරීමේ දී හෝ ඒ සමග ඇති තොරතුරු සැපයීමේ දී ණයකරු විසින් සැලකිය යුතු තරමේ සාවද්‍ය නියෝජනයක් හෝ මඟහැරීමක් සිදු කර ඇත්නම්,

ණයකරු සම්බන්ධයෙන් වන ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය.

(5) ණය පුනරුත්ථාපන ආඥාවක් කිරීමේ දී ණයකරුගේ නම, ලිපිනය සහ විස්තරය සහ ආඥාවේ දිනය ද ඇතුළුව නියම කරනු ලැබිය හැකි විස්තර -

(අ) පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ; සහ

(ආ) ප්‍රසිද්ධ දැන්වීමක,

පළ කරන ලෙසට අධිකරණය විසින් නිල දේපළ භාර ගැනුම්කරුට විධාන කරනු ලැබිය යුතු ය.

(6) ණය පුනරුත්ථාපන ආඥාවක් කිරීමේ දී අධිකරණය විසින් -

(අ) ණය පුනරුත්ථාපන ආඥාව නිකුත් කිරීම සම්බන්ධයෙන් ණයකරු වෙත ;

(ආ) පුනරුත්ථාපන කාලසීමාව සඳහා මේ කාර්ය අදාළ වන ප්‍රමාණයට, 32 වන වගන්තිය යටතේ ණයකරුගේ බැඳීම් පිළිබඳව ණයකරු වෙත;

(ඇ) ණය පුනරුත්ථාපන ආඥාව නිකුත් කිරීම සහ හඳුනන එක් එක් ණයහිමියාගේ ණය ඇතුළත්

කිරීම පිළිබඳව ණයකරුගේ හඳුනන එක් එක් ණයහිමියා වෙත; සහ

(ඇ) 75 වන වගන්තිය යටතේ වන, ණය පුනරුත්ථාපන ආඥාවට විරුද්ධත්වය පළ කිරීම සඳහා ණයහිමියන්ට ඇති අයිතිවාසිකම් පිළිබඳ ණයකරුගේ හඳුනන එක් එක් ණයහිමියා වෙත,

ලිඛිත දැන්වීමක් ලබාදීමට නිල දේපළ භාර ගැනුම්කරු වෙත විධාන කළ යුතු ය.

ණය පුනරුත්ථාපන ආඥාවේ බලපෑම

**71.** (1) ණයකරුවකු සම්බන්ධයෙන් ණය පුනරුත්ථාපන ආඥාවක් ක්‍රියාත්මක වන අතරවාරයේ දී, ඇතුළත් කළ ණයක් ගෙවිය යුතු වන ණයකරුගේ-

(අ) ණයහිමියකුට ණය සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිකර්මයක් නොමැති වන්නේ ය;

(ආ) ණයහිමියා විසින් ණය අය කර ගැනීමට හෝ බලාත්මක කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය; සහ

(ඇ) ණයහිමියා විසින් විශේෂයෙන් ම-

(i) ණයකරුගේ හෝ ණයකරුගේ නියෝජිතයාගේ ඉල්ලීම මත හැර, ඇතුළත් කළ ණයක් ගෙවීම සම්බන්ධයෙන් ණයකරු සම්බන්ධ කර ගැනීමට ;

(ii) ඇතුළත් කළ ණයක් සම්බන්ධයෙන් ණයකරුට එරෙහිව යම් නීතිමය නඩු කටයුතු ආරම්භ කිරීමට හෝ පවත්වාගෙන යාමට ;

(iii) ඇතුළත් කළ ණයක් රැස්කිරීම, සුරක්ෂිත කිරීම, අය කර ගැනීම හෝ ගෙවන ලෙසට නියම කිරීමට;

(iv) ණයකරුට එරෙහිව අධිකරණයක හෝ විනිශ්චය සභාවක තීන්දුවක් හෝ ආඥාවක් ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීමට;

(v) වරෙන්තුවක් ලබා ගැනීමට;

(vi) (2) වන උපවගන්තියේ අවශ්‍යතා සපුරාලන්නේ නම් මිස, ණයකරු ණයහිමියා සමඟ ඇති කර ගත් කුලී නිවැසිභාවය පිළිබඳ ගිවිසුමක් යටතේ ණයකරු පදිංචිව සිටින පරිශ්‍රයක සන්තකය ලබා ගැනීමට ;

(vii) (4) වන උපවගන්තියට යටත්ව, ණයකරු විසින් භාවිත කරනු ලබන හෝ ණයකරුගේ සන්තකයේ පවතින 34 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) හෝ (ඈ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති යම් භාණ්ඩ වර්ගයක් සන්තකයට ගැනීම හෝ වෙනත් ආකාරයකින් අය කර ගැනීමට ;

(viii) (i), (ii), (iii), (iv), (v), (vi), (vii) හෝ (viii) ඡේදවල සඳහන් ඕනෑම ක්‍රියාමාර්ගයක් ගැනීමට අනුයෝජිතයකුට උපදෙස් දීමට,

කිසිඳු ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය.

(2) ණයකරුවකු සම්බන්ධයෙන් ණය පුනරුත්ථාපන ආඥාවක් ක්‍රියාත්මක වන අතරවාරයේ දී, ණයකරු අදාළ ණයහිමියා සමග කුලී නිවැසිභාවය පිළිබඳ ගිවිසුමකට ඇතුළත් වී තිබෙන අවස්ථාවක දී, එකී ගිවිසුම යටතේ ණයකරු පදිංචිව සිටින පරිශ්‍රයක සන්තකය ලබාගැනීමට -

(අ) ණය පුනරුත්ථාපන ආඥාව අතරතුර කුලී නිවැසිභාවය පිළිබඳ ගිවිසුමේ කාලසීමාව කල් ඉකුත් වී ඇත්නම්;

(ආ) ණයකරු මාස තුනක කුලී මුදලට වඩා හිඟ කුලී මුදලක් අදාළ ණයහිමියාට ගෙවිය යුතු වන්නේ

නම් සහ ණයකරුට ආඥාවේ කාලසීමාව තුළ අඛණ්ඩව කුලී ගෙවීම් පවත්වා ගැනීමට නොහැකි වීමට වඩා වැඩි ඉඩක් ඇති බව අධිකරණය සලකන්නේ නම්; හෝ

(ඇ) පරිශ්‍රයේ සන්තකය ලබා ගැනීම සඳහා අදාළ ණයහිමියකුගේ ඉල්ලීමක් ණයකරුගේ කුලී නොගෙවීම හැර, වෙනත් හේතු මත පදනම් වී ඇත්නම්,

අධිකරණයකින් එකී ණයහිමියාට සුවිශේෂී අවසරයක් ලබා දිය හැකි ය.

(3) ණය පුනරුත්ථාපන ආඥාවක් ක්‍රියාත්මක වන අතරවාරයේ දී, -

(අ) සුවිශේෂී අවස්ථා යන්නෙන්, ණයහිමියාට පියවර ගැනීමට ඉඩ දීම සාධාරණ බවට අදහස් කරන බව; සහ

(ආ) පියවර -

(i) ආඥාව අදාළ වන ණයකරුට හානිදායක නොවන බව;

(ii) වෙනත් යම් ණයහිමියකුට අසාධාරණ ලෙස අගතියක් සිදු නොවන බව; හෝ

(iii) ආඥාවෙන් සැලසෙන ආරක්ෂාවත් සැලකිය යුතු ලෙස යටපත් නොවන බව,

අධිකරණය විසින් සලකන විට දී, (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ ලැයිස්තුගත කර ඇති පියවරයක් ගැනීමට අධිකරණය විසින් ණයහිමියකුට අවසර දිය හැකි ය.

(4) ණයකරුවකු සම්බන්ධයෙන් ණය පුනරුත්ථාපන ආඥාවක් ක්‍රියාත්මක වන අතරවාරයේ දී 34 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති වර්ගවල භාණ්ඩ ණයකරුවකු විසින් භාවිත කරනු ලබන්නේ හෝ සන්තකයෙහි පවත්වා ගනු ලබන්නේ කුලී සින්නක්කර ගිවිසුමක් ද ඇතුළු යම් ගිවිසුමක් මාර්ගයෙන් වන්නේ ද එකී ගිවිසුම අවසන් කිරීමට එකී භාණ්ඩවල බඳු දීමනාකරුට හෝ භාණ්ඩ හිමියකුට -

(අ) ණයකරු විසින් මාසික ආපසු ගෙවීම් තුනකට වඩා වැඩි මුදලක් එවැනි ගිවිසුමක් යටතේ හිඟ වශයෙන් ගෙවිය යුතු වන විට දී ණය පුනරුත්ථාපන ආඥාව බලාත්මක වන අතරවාරයේ දී, ණයකරුට, ආපසු ගෙවීම් දිගටම පවත්වාගෙන යාමට නොහැකි වීමට වඩා වැඩි ඉඩක් ඇති බව අධිකරණය විසින් සලකන අවස්ථාවක දී; හෝ

(ආ) එවැනි ගිවිසුමක් අවසන් කිරීම සඳහා සහ ගිවිසුමට යටත් වන භාණ්ඩ සන්තකයට ගැනීමට හෝ වෙනත් ආකාරයකින් අය කර ගැනීම සඳහා වන බදු දීමනාකරුගේ හෝ හිමිකරුගේ ඉල්ලීමක්, ආපසු ගෙවීම් සිදු කිරීම, ණයකරු විසින් පැහැර හැරීම නොවන වෙනත් හේතු මත පදනම් වන අවස්ථාවක,

අධිකරණය විසින් සුවිශේෂී අවසරයක් ලබා දිය හැකි ය.

(5) ණයකරුවකු සම්බන්ධයෙන් ණය පුනරුත්ථාපන ආඥාවක් ක්‍රියාත්මක වන අතරවාරයේ දී, යම් අත්‍යවශ්‍ය භාණ්ඩ හෝ සේවා සපයන්නකු විසින් -

(අ) ආඥාව ලබා දීමට පෙර කාලසීමාවකට අදාළව භාණ්ඩ හෝ සේවා සඳහා අය විය යුතු ගාස්තු ගෙවීම ණයකරු විසින් පැහැර හැරීම හේතුවෙන්, ණයකරුට භාණ්ඩ හෝ සේවා සැපයීම ප්‍රතික්ෂේප කිරීම;

(ආ) ආඥාව ලබා දීමට පෙර කාලසීමාවකට අදාළව භාණ්ඩ හෝ සේවා සඳහා නොගෙවූ ගාස්තු ගෙවිය යුතු බවට ණයකරුට භාණ්ඩ හෝ සේවා සැපයීමේ කොන්දේසියක් පැනවීම; හෝ

(ඇ) භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා ගිවිසුමේ වස්තුභංගත්වයට සම්බන්ධ නියමයක් මත රඳා සිටීම,

නොකළ යුතු ය.

(6) ණය පුනරුත්ථාපන ආඥාවක් මගින් ණයකරුවකුට එරෙහිව කිසියම් අපරාධ නඩු කටයුත්තක් ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම නොවැළැක්විය යුතු ය.

(7) මේ වගන්තියට පටහැනිව සිදු කරන යම් ක්‍රියාවක් ශූන්‍ය සහ බල රහිත විය යුතු ය.

(8) මේ වගන්තියේ ඇති කිසිවක් මගින් සුරක්ෂිත ණයහිමියකුගේ ඇප බලාත්මක කිරීමට ඇති අයිතියට බලපෑමක් ඇති නොකරන්නේ ය.

(9) ණය පුනරුත්ථාපන ආඥාවක් ලබා දීමට අවම වශයෙන් දින එකසිය අසූවකට පෙර ආඥාවක් ක්‍රියාත්මක කිරීම හෝ වෙනත් නෛතික ක්‍රියාමාර්ගයක් හෝ දේපළ තහනමක් සම්පූර්ණ කරන ලද අවස්ථාවක දී -

(අ) චංචල හෝ නිශ්චල දේපළකට එරෙහිව එම ආඥාව ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කරනු ලබන්නේ අත්පත් කර ගැනීමෙන් හෝ දේපළ භාර ගැනුම්කරු හෝ පත්වීම්ලාභියකු හෝ ක්‍රියාත්මක කිරීම පැවරී සිටින තැනැත්තකු විසින් සන්තකය ලබා ගැනීම මගින් සහ විකිණීම සම්පූර්ණ කළ අවස්ථාවක දී නම්; සහ

(ආ) ණය මුදල ගෙවීම මගින් ණය මුදලේ වගකීම අවසන් කර ඇති අවස්ථාවක දී නම්,

මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින්, ණයකරුට හෝ ණයකරුගේ දේපළට එරෙහිව තීන්දුවක් ක්‍රියාත්මක කිරීමට හෝ වෙනත් නෛතික ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ දේපළ තහනමක් ගැනීමට ණයකරුට ඇති අයිතියට බලපෑමක් සිදු නොවන්නේ ය.

(10) ණය පුනරුත්ථාපන නියෝගය ක්‍රියාත්මක වන අතරවාරයේ දී ණයකරු විසින් 32 වන වගන්තිය යටතේ සාධාරණ ලෙස ණයකරුට අදාළ වන යම් වගකීම් ඉටුකළ යුතු ය.

(11) (5) වන උපවගන්තිය යටතේ ණයහිමියකු විසින් ණයකරුවකුට අත්‍යවශ්‍ය භාණ්ඩ හෝ සේවා අඛණ්ඩව සපයා ඇති අවස්ථාවක දී, නිල දේපළ භාර ගැනුම්කරු විසින් එම අඛණ්ඩ

සැපයුම වෙනුවෙන් ණයකරුගේ ආදායමෙන් අදාළ ණයහිමියා වෙත ගෙවීම් සිදු කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(12) මේ වගන්තියට පටහැනිව ණයහිමියකු හෝ ණය හිමියාගේ අනු නියෝජිතයකු විසින් කරනු ලැබූ ක්‍රියාවකින් පැන නැඟුණ ණයහිමියකු සමග සිදුකරන ලද ගනුදෙනුවක් යටතේ යම් තැනැත්තකු විසින් දේපළකට හිමිකමක් හෝ වෙනත් අයිතියක් අත්පත් කරගෙන තිබෙන අවස්ථාවක දී, එම තැනැත්තා ණයහිමියා සමග සද්භාවයෙන් සහ යම් ප්‍රතිෂ්ඨාවක් සඳහා කටයුතු කළේ නම්, එම ක්‍රියාවෙහි ශූන්‍යභාවය මගින් එම තැනැත්තාගේ අයිතිවාසිකම් අගතියට පත් නොවිය යුතු ය.

ණය පුනරුත්ථාපන ආඥාවේ කාලසීමාව

**72**. (1) ණය පුනරුත්ථාපන ආඥාව, ණය පුනරුත්ථාපන ආඥාවේ දින සිට අවුරුද්දක කාල සීමාවක් ඉකුත්වීමෙන් පසු, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් කරනු ලැබිය යුතු වන 73 වන වගන්තිය යටතේ නිදහස් කිරීමේ ආඥාවක් සිදු කරන තෙක් ක්‍රියාත්මක වන්නේ ය.

(2) ණය පුනරුත්ථාපන ආඥාව අවසන් කළ යුතු ද නැතහොත් පරිවර්තනය කළ යුතු ද යන්න නිසි පරිදි සලකා බැලීමේ කාර්ය සඳහා 75, 76 හෝ 77 යන වගන්ති යටතේ වන නියෝගය අධිකරණය විසින් දීර්ඝ කරන්නේ නම්, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ණය පුනරුත්ථාපන ආඥාවේ කාලයට වඩා වැඩි කාලයක් සඳහා දිගට ම බලපැවත්විය හැකි ය.

(3) අධිකරණය විසින් (2) වන උපවගන්තිය යටතේ නියෝගයක් දීර්ඝ කරන විට, නිදහස් කිරීම සඳහා විකල්ප දිනයක් අධිකරණය විසින් නියම කළ යුතු අතර, එය ණය පුනරුත්ථාපන ආඥාවේ දිනයේ සිට ආරම්භක වසර එකක කාලසීමාව ඉකුත්වීමෙන් දින අනූවකට නොවැඩි කාලයක් විය යුතු ය.

ණය නිදහස් කිරීම

**73.** (1) ණය පුනරුත්ථාපන ආඥාවේ දින සිට වසරක කාලසීමාවක් ඉකුත්වීමට පෙර, නිල දේපළ භාර ගැනුම්කරු විසින් -

(අ) ණයකරුට නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතු ය; සහ

(ආ) ණයකරු නිදහස් කිරීම ස්ථිර කරන ආඥාවක් සඳහා අධිකරණයට ඉල්ලීමක් කළ යුතු ය.

(2) ණය පුනරුත්ථාපන ආඥාවේ දින සිට වසරක කාල සීමාවක් ඉකුත්වීමෙන් පසු දින තිහක කාලසීමාවක් තුළ නිල දේපළ භාරගැනුම්කරු විසින් (1) වන උපවගන්තිය යටතේ දැනටමත් ඉල්ලීමක් කර නොමැති නම්, ණයකරු විසින් ඔහු නිදහස් කරන ලෙසට ආඥාවක් ඉල්ලා අධිකරණයට ඉල්ලුම් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු, 76 හෝ 77 වන වගන්ති යටතේ ණය පුනරුත්ථාපන ආඥාව අවසන් කිරීමට හෝ පරිවර්තනය කිරීමට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත්නම් මිස, දින අනූවක් ඇතුළත, අධිකරණය විසින් නිදහස් කිරීමේ ආඥාවක් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කරන ලද අධිකරණ ආඥාව මගින්, ණය පුනරුත්ථාපන ආඥාවේ දින සිට කාලසීමාවක් ඉකුත්වීමෙන් පසු ණයකරු ණය පුනරුත්ථාපන ආඥාවෙන් නිදහස් කිරීම සඳහා විධිවිධාන සැලැස්විය යුතු ය.

(5) ණය පුනරුත්ථාපන ආඥාවෙන් නිදහස් කිරීමේ දී, ණයකරුගේ ඇතුළත් කළ ණය අවලංගු විය යුතු අතර, එම ණය සම්බන්ධයෙන් ගෙවිය යුතු පොලිය, ගාස්තු හෝ අය කිරීම් ද ඇතුළුව, ණයෙන් කිසිදු කොටසක් ගෙවීමට ණයකරු යටත් නොවිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ ණය නිදහස් කිරීම මගින්, 37 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ බැහැර කරන ලද ණයක් ලෙස නිශ්චිතව දක්වා ඇති කිසිදු ණයකින් හෝ වගකීමකින් ණයකරු නිදහස් නොවිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ කරනු ලබන නිදහස් කිරීමකින්, නිදහස් කරන දිනයේ දී -

(අ) නිදහස් කළ ණයකරුගේ ව්‍යාපාරික හවුල්කරුවෙක්;

(ආ) නිදහස් කරන ලද ණයකරු සමඟ සම භාරකරුවකු;

(ඇ) නිදහස් කරන ලද ණයකරු සමඟ ඒකාබද්ධව බැඳී හෝ ගිවිසුම්ගත වූවකු; හෝ

(ඈ) නිදහස් කළ ණයකරුවකුගේ ඇපකරුවකු හෝ ඇපකරුවකුගේ ස්වභාවයෙන් යුතු තැනැත්තකු,

වූ අයකු සම්බන්ධයෙන් ණයකරු වෙත වන වගකීමෙන්, ණයකරුව නිදහස් නොකළ යුතු ය.

ණය පුනරුත්ථාපන ආඥාව නිල දේපළ භාරකරු විසින් අධීක්ෂණය කළ යුතු බව

**74.** (1) ණය පුනරුත්ථාපන ආඥාවක් ක්‍රියාත්මක වන අතරවාරයේ දී, 65 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කරුණු ඇතුළුව ණය පුනරුත්ථාපන ආඥා කාර්යය පටිපාටියේ ඉලක්ක ඉදිරියට ගෙන යාමේ දී, නිල දේපළ භාරගැනුම්කරු විසින් මෙම නඩුව කළමනාකරණය කරමින් ණයකරුගේ මූල්‍ය කටයුතු අධීක්ෂණය කළ යුතු ය.

(2) 32 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ණයකරුගේ ඉතිරි බැඳීම්වලට අමතරව, ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වූ ඉල්ලීමකින් පසුව සහ ණය පුනරුත්ථාපන ආඥාවක් බලාත්මක වීම නතර වන තෙක්, යම් වේලාවක දී ණයකරු විසින් -

(අ) නිල දේපළ භාරගැනුම්කරුට ස්වකීය කටයුතු පිළිබඳ තොරතුරු හෙළිදරව් කළ යුතු ය;

(ආ) නිල දේපළ භාරගැනුම්කරු සමඟ රැස්වීම්වලට සහභාගි විය යුතු ය;

(ඇ) එකී ණයකරුගේ ඉල්ලීමේ සඳහන් යම් වැදගත් තොරතුරක් වැරදි බව හෝ ණයකරුගේ තත්ත්වයන්ගේ යම් වැදගත් වෙනසක් සිදු වී ඇති බව ණයකරුට දැනගැනීමට ලැබුණහොත්, ඒ බව, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් නිල දේපළ භාරගැනුම්කරුට දැනුම්දිය යුතු ය; සහ

(ඈ) මේ වගන්තිය යටතේ නිල දේපළ භාරගැනුම්කරුගේ කර්තව්‍ය සිදු කරගෙන යාමේ කාර්යය සඳහා නිල දේපළ භාර ගැනුම්කරු විසින් සාමාන්‍යයෙන් අපේක්ෂා කරනු ලැබිය හැකි වෙනත් සියලු දේ ඉටු කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිල දේපළ භාරගැනුම්කරුගේ කර්තව්‍ය සිදුකරගෙන යාමේ කාර්ය සඳහා අවශ්‍ය බවට නිල දේපළ භාරගැනුම්කරුට පෙනී යන යම් කාරණයක් පිළිබඳ විමර්ශනයක් නිල දේපළ භාරගැනුම්කරු විසින් සිදු කළ හැකි ය.

(4) මේ වගන්තිය යටතේ නිල දේපළ භාරගැනුම්කරුගේ කර්තව්‍ය ඉටු කිරීමේ දී නිල දේපළ භාරගැනුම්කරුට අවශ්‍ය විය හැකි යම් තොරතුරු සහ සහාය ලබා දෙන ලෙසට නිල දේපළ භාරගැනුම්කරු විසින් යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී නිල දේපළ භාරගැනුම්කරු විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි පිළිබඳ වැඩිදුර විස්තර නියම කරනු ලැබිය හැකි ය.

(6) ණය පුනරුත්ථාපන ආඥාවක් සම්බන්ධයෙන් පැන නඟින යම් කරුණක් සම්බන්ධයෙන් විධාන හෝ ආඥාවක් සඳහා නිල දේපළ භාරගැනුම්කරු විසින් අධිකරණයට ඉල්ලීමක් කළ හැකි ය.

(7) (6) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කිරීමේ දී අධිකරණය විසින් -

(අ) නිල දේපළ භාරගැනුම්කරුට, අධිකරණය විසින් සුදුසු යයි සලකන පරිදි විධාන ලබා දිය හැකි ය;

(ආ) මේ පනතේ 32 වන වගන්තිය යටතේ පැන නඟින ණයකරුගේ යම් බැඳීමක් ක්‍රියාත්මක කිරීම සඳහා ආඥාවක් කරනු ලැබිය හැකි ය;

(ඇ) 76 වන වගන්තිය යටතේ වන ණය පුනරුත්ථාපන ආඥාව අවසන් කිරීම සඳහා වන ඉල්ලීමක් ලෙස එම ඉල්ලීම සළකනු ලැබිය හැකි ය;

(ඈ) 77 වන වගන්තිය යටතේ වන ණය පුනරුත්ථාපන ආඥාව පරිවර්තනය කිරීම සඳහා වූ ඉල්ලීමක් ලෙස එම ඉල්ලීම සළකනු ලැබිය හැකිය; හෝ

(ඉ) විමර්ශනයක් සම්පූර්ණ කිරීමට නිල දේපළ භාරගැනුම්කරුට අවසර දීමේ සීමිත කාර්ය සඳහා ණය පුනරුත්ථාපන ආඥාවේ කාලසීමාව දීර්ඝ කිරීමේ ආඥාවක් කරනු ලැබිය හැකි වන නමුත්-

(i) ආඥාවේ දින සිට අවුරුදු එකක ආරම්භක කාලසීමාව ගත වීමෙන් පසු දින අනූවක් ඇතුළත කරනු ලැබිය යුතු නිදහස් කිරීම සඳහා විකල්ප දිනයක් අධිකරණය විසින් නියම කළ යුතු ය; සහ

(ii) ආඥාවේ කාල සීමාව දීර්ඝ කිරීම නිසා ණයකරුට සිදු විය හැකි යම් අසාධාරණයක් සම්බන්ධයෙන් සහ එකී දීර්ඝ කිරීම මගින් 65 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඉලක්ක ද ඇතුළුව, ණය පුනරුත්ථාපන ආඥාවේ කාර්යපටිපාටියේ ඉලක්ක වැඩිදියුණු කළ හැකි ප්‍රමාණය පිළිබඳව ද අධිකරණය විසින් නිසි සැලකිල්ලක් දැක්විය යුතු ය.

.

ණය පුනරුත්ථාපන ආඥාවට ණයකරුගේ විරෝධතාව

**75.** (1) ඇතුළත් කළ ණයක් අය විය යුතු වන ණයහිමියකු විසින් අධිකරණයට-

(අ) ණය පුනරුත්ථාපන ආඥාව සම්බන්ධයෙන්; හෝ

(ආ) ණයහිමියාගේ ණය, ණය පුනරුත්ථාපන ආඥාව යටතේ ඇතුළත් කිරීම සම්බන්ධයෙන්,

විරෝධතාව පළ කිරීමේ ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ විරෝධතාවක් -

(අ) 70 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ වන ආඥාවට විරුද්ධ වීමට ඇති අයිතිය පිළිබඳව නිල දේපළ භාරගැනුම්කරු විසින් ණයහිමියන්ට දැනුම් දුන් දින සිට දින විසිඑකකට පසුව නොවන දිනයක දී ඉදිරිපත් කළ යුතු ය;

(ආ) ණයහිමියා විසින්, ණයකරුට සහ නිල දේපළ භාරගැනුම්කරුට ලිඛිත දැන්වීමක් සහිතව,

අධිකරණය හමුවේ ලිඛිත විරෝධතා දැන්වීමක් ගොනු කළ යුතු ය; සහ

(ඇ) (3) වන උපවගන්තියේ සඳහන් කර ඇති හේතු මත පදනම් විය යුතු ය.

(3) ආඥාවකට වන විරෝධතාවකට පදනම් විය යුතු හේතු, එනම් ආඥාවකට වන විරෝධතාවකට පදනම් විය යුතු හේතු පහත සඳහන් කරුණුවලට සීමා විය යුතු ය -

(අ) ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවේ දී 66 වන වගන්තිය යටතේ වන යෝග්‍යතා නිර්ණායක ණයකරු විසින් සපුරා නොමැති වීම; හෝ

(ආ) ණය පුනරුත්ථාපන ආඥාව සඳහා වන ඉල්ලීමේ සැලකිය යුතු සාවද්‍යතාවක් ඇති බව හෝ ඉල්ලීම සනාථ කිරීම සඳහා ණයකරු විසින් ඉදිරිපත් කර ඇති කරුණු මඟින් ඉල්ලුම්කරුට සැලකිය යුතු හානිදායක තත්ත්වයක් පැන නැඟීම,

ට සීමා විය යුතුය.

(4) ආඥාවකට එරෙහිව ඉල්ලීමක් ලැබීමෙන් පසු, ඉල්ලීම ලැබී දින අනුවක් ඇතුළත සිදු විය යුතු වන්නා වූ ඉල්ලීම විභාග කිරීම සඳහා අධිකරණය විසින් දිනයක් නියම කළ යුතු ය.

(5) ආඥාවකට විරුද්ධව ඉදිරිපත් කර ඇති ඉල්ලීම විභාග කිරීම පිළිබඳව අධිකරණය විසින් ණයකරු, ණයහිමියන්ට සහ නිල දේපළ භාරගැනුම්කරු වෙත නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් ලිඛිතව දැන්විය යුතු ය.

(6) ආඥාවකට විරෝධතාව දක්වමින් ඉල්ලීමක් ලැබීමෙන් පසු, අධිකරණය විසින් -

(අ) තීරණයකට එළඹීමේ දී අධිකරණයට සහාය විය හැකි තොරතුරු අධිකරණයට සපයන ලෙසට; හෝ

(ආ) තීරණයකට එළඹීමේ දී (for consistency) අදාළ යයි අධිකරණයට පෙනෙන යම් කරුණක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙසට,

නිල දේපළ භාරගැනුම්කරුට නියම කළ හැකි ය.

(7) ආඥාවකට විරුද්ධව ඉල්ලීමක් ලැබීමෙන් පසු, අධිකරණය විසින්, කාරණය නිසි ලෙස සලකා බැලීමේ කාර්ය සඳහා ආඥාවේ කාලසීමාව දීර්ඝ කළ හැකි ය. එසේ වුවද, -

(අ) එකී දීර්ඝ කිරීම නියෝගය බලපවත්වන මුල් කාලසීමාවෙන් දින අනූවක කාලයක් නො ඉක්මවිය යුතු ය; සහ

(ආ) අධිකරණය විසින් -

(i) ආඥාවේ කාලසීමාව දීර්ඝ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ණයකරුට සිදු වන යම් අසාධාරණයක් පිළිබඳව; සහ

(ii) දීර්ඝ කිරීමක් මඟින් 65 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඉලක්ක ද ඇතුළුව, ණය පුනරුත්ථාපන ආඥාව කාර්යපටිපාටියේ ඉලක්ක වැඩි දියුණු කළ හැකි ප්‍රමාණය පිළිබඳව,

නිසි සැලකිල්ලක් දැක්විය යුතු ය.

(8) ආඥාවකට විරෝධතාව දැක්වීම සඳහා වන ඉල්ලීමක් විභාග කිරීමේ දී, (3) වන උපවගන්තියෙහි සඳහන් කර ඇති හේතු තහවුරු කර නොමැති බව අධිකරණයට පෙනී යන්නේ නම් අධිකරණය විසින්-

(අ) විරෝධතාව නිෂ්ප්‍රභා කිරීම කළ යුතු ය; සහ

(ආ) ණයකරු විසින් දරන ලද වියදම් හෝ අධිකරණය විසින් අවශ්‍ය යයි සලකන වෙනත් මුදලක් ගෙවීමට විරෝධතාව දක්වන ණයහිමියාට නියම කළ යුතු ය.

(9) ආඥාවකට විරෝධතාව දැක්වීම සඳහා වන ඉල්ලීම විභාග කිරීමේ දී, (3) වන උපවගන්තියේ සඳහන් කර ඇති යම් හේතුවක් තහවුරු කර ඇති බව අධිකරණයට පෙනී යන්නේ නම්, අධිකරණය විසින් -

(අ) ණය පුනරුත්ථාපන ආඥාව අවසන් කළ හැකි ය; හෝ

(ආ) මේ වගන්තිය යටතේ විරෝධතාවට විෂය වූ ණය ඉවත් කිරීම ද ඇතුළුව, ණය පුනරුත්ථාපන ආඥාව සංශෝධනය කිරීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

ණය පුනරුත්ථාපන ආඥාව අවසන් කිරීම

**76.** (1) නිල දේපළ භාරගැනුම්කරු විසින්, ණය පුනරුත්ථාපන ආඥාව බලාත්මකව පවතින අතරවාරයේ දී, ණය පුනරුත්ථාපන ආඥාව අවසන් කරන ලෙසට අයදිමින් අධිකරණයට ඉල්ලීමක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් අවසන් කිරීම සඳහා වන ඉල්ලීමක් -

(අ) එම ඉල්ලීම නොමැති නම්, 72 වන වගන්තිය යටතේ අන්‍යාකාරයකින් නිදහස් කිරීම සිදු වන දිනට අවම වශයෙන් දින හතළිස්පහකට පෙර, ඉදිරිපත් කළ යුතු ය;

(ආ) නිල දේපළ භාරගැනුම්කරු විසින්, ණයකරුට සහ හඳුනන සියලුම ණයහිමියන්ට ලිඛිතව කරනු ලබන දැන්වීමකින් පසු ආඥාව අවසන් කිරීම සඳහා ඉල්ලා සිටිමින් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය; සහ

(ඇ) (3) වන උපවගන්තියේ සඳහන් කර ඇති හේතු මත පදනම් විය යුතු ය.

(3) ආඥාවක් අවසන් කිරීම සඳහා වන ඉල්ලීමකට තුඩුදෙන හේතු පහත සඳහන් කරුණුවලට සීමා වී ඒවා මත පදනම් විය යුතු ය:-

(අ) ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීමක් ඉදිරිපත් කරන අවස්ථාවේ දී 66 වන වගන්තිය යටතේ ඇති යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති වීම;

(ආ) ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීමේ හෝ ඉල්ලීම සනාථ කරමින්

ණයකරු විසින් සපයන යම් කරුණක සැලකිය යුතු සාවද්‍යතාවක් තිබීම; හෝ

(ඈ) නිල දේපළ භාරගැනුම්කරු සෑහීමකට පත් වන පරිදි 32 වන සහ 71 වන වගන්තිවල දක්වා ඇති ණයකරුගේ කාර්යභාරයට ණයකරු අනුකූලව ක්‍රියා කර නොතිබීම,

(4) ආඥාව අවසන් කිරීම සඳහා ඉල්ලීමක් ලැබීමෙන් පසුව, ඉල්ලීම ලැබීමෙන් පසු දින දාහතරක් ඇතුළත හෝ නියම කළ හැකි වෙනත් යම් කාලසීමාවක් තුළ දී විය යුතු, ඉල්ලීම විභාග කිරීම සඳහා දිනයක් අධිකරණය විසින් නියම කළ යුතු ය.

(5) ආඥාව අවසන් කිරීම සඳහා වන ඉල්ලීමක් විභාග කිරීමේ දී අධිකරණය විසින් ණයකරුට, ණයහිමියන්ට සහ නිල දේපළ භාරගැනුම්කරුට ලිඛිත දැන්වීමක් කළ යුතු ය.

(6) ආඥාව අවසන් කිරීම සඳහා ඉල්ලීමක් ලැබීමෙන් පසුව, අධිකරණය විසින් -

(අ) තීරණයකට එළඹීමේ දී අධිකරණයට සහාය විය හැකි තොරතුරු අධිකරණයට සපයන ලෙසට; හෝ

(ආ) තීරණයක් ගැනීමට අදාළ යයි අධිකරණයට පෙනෙන ඕනෑම කාරණයක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙසට,

නිල දේපළ භාරගැනුම්කරුට නියම කළ යුතු ය.

(7) ආඥාව අවසන් කිරීම සඳහා ඉල්ලීමක් ලැබුණු විට, එම කාරණය නිසි ලෙස සලකා බැලීමේ සීමිත කාර්ය සඳහා, අධිකරණය විසින්, ආඥාවේ කාලසීමාව දීර්ඝ කළ හැකි ය. එසේ වුව ද, -

(අ) එකී දීර්ඝ කිරීමක් ආඥාවේ ආරම්භක කාලසීමාවට වඩා දින අනූවක කාලයක් නොඉක්මවිය යුතු ය; සහ

(ආ) අධිකරණය විසින්-

(i) ණයහිමියකු හෝ ණයහිමියන් අන්‍යාකාරයකින් අසාධාරණ ලෙස අගතියකට පත් වන අවස්ථාවක දී විරෝධතාවක් පිළිබඳව උචිත පරීක්ෂණයක් පැවැත්වීමේ අවශ්‍යතාවය;

(ii) ආඥා කාලසීමාව දීර්ඝ කිරීම හේතුවෙන් ණයකරුට සිදු වන යම් අසාධාරණයක්; සහ

(iii) දීර්ඝ කිරීමක් මගින් 65 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඉලක්ක ද ඇතුළුව, ණය පුනරුත්ථාපන ආඥාව කාර්යපටිපාටියේ ඉලක්ක වැඩි දියුණු කළ හැකි ප්‍රමාණය,

පිළිබඳව නිසි සැලකිල්ලක් දැක්විය යුතු ය.

(8) ආඥාව අවසන් කිරීම සඳහා වන ඉල්ලීමක් විභාග කිරීමේ දී, (3) වන උපවගන්තියෙහි සඳහන් කර ඇති හේතු තහවුරු කර නොමැති බව අධිකරණයට පෙනී ගියහොත්, අධිකරණය විසින් ආඥාව අවසන් කිරීම සඳහා වන ඉල්ලීම නිෂ්ප්‍රභා කළ යුතු ය.

(9) ආඥාව අවසන් කිරීම සඳහා වන ඉල්ලීමක් විභාග කිරීමේ දී, (3) වන උපවගන්තියේ සඳහන් හේතු තහවුරු කර ඇති බවට අධිකරණයට පෙනී ගියහොත් අධිකරණය විසින්-

(අ) ණය පුනරුත්ථාපන ආඥාව අවසන් කළ හැකි ය;

(ආ) අධිකරණය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නියම මත සහ යම් වේලාවක දී ණය පුනරුත්ථාපන ආඥාව අවසන් කිරීම බලාත්මක විය යුතු බවට විධිවිධාන සැලැස්විය හැකි ය;

(ඇ) 77 වන වගන්තිය යටතේ ණය පුනරුත්ථාපන ආඥාව බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් බවට පරිවර්තනය කළ හැකි ය; හෝ

(ඇ) 32 වන සහ 71 වන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති ණයකරුගේ බැඳීමක් බලාත්මක කිරීම සඳහා ආඥාවක් කළ හැකි ය.

(10) (9) වන උපවගන්තිය යටතේ ණය පුනරුත්ථාපන ආඥාව අවසන් කිරීමේ දී -

(අ) ආඥාව කිරීමේ දී 71 වන වගන්තිය යටතේ බලාත්මක කළ නොහැකි වූ ණය බලාත්මක වේ; සහ

(ආ) එකතු වී ඇති යම් පොලී, ගාස්තු හෝ අය කිරීම් ගෙවීමට ණයකරු බැඳී සිටින්නේ ය.

බංකොලොත් භාවය පිළිබඳ ආඥාව බවට පරිවර්තනය කිරීම

**77.** (1) නිල දේපළ භාරගැනුම්කරු විසින්, ණය පුනරුත්ථාපන ආඥාව බලාත්මකව පවතින අතරවාරයේ දී, ණය පුනරුත්ථාපන ආඥාව බංකොලොත්භාවය පිළිබඳ ආඥාව බවට පරිවර්තනය කිරීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් පරිවර්තනය කිරීම සඳහා වන ඉල්ලීමක් -

(අ) එම ඉල්ලීම නොවන්නට, 72 වන වගන්තිය යටතේ අනායාකාරයෙන් නිදහස් කිරීමක් සිදුවන දිනට අවම වශයෙන් දින හතළිස්පහකට පෙර ඉදිරිපත් කළ යුතු ය;

(ආ) ණයකරුට සහ දන්නා සියලු ණයහිමියන්ට ලිඛිත දැන්වීම් සමඟ, පරිවර්තනය සඳහා වන අයැදුමක් ගොනුකරමින් නිල දේපළ භාරගැනුම්කරු විසින් අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය; සහ

(ඇ) (3) වන උපවගන්තියේ සඳහන් කර ඇති හේතු මත පදනම් විය යුතු ය.

(3) නිල දේපළ භාරගැනුම්කරු විසින් ආඥාවක් පරිවර්තනය කිරීම සඳහා -

(අ) ණයකරු, ස්වකීය මූල්‍ය තත්ත්වයන්ගේ වෙනස්වීම හේතුවෙන්, 66 වන වගන්තිය යටතේ යෝග්‍යතා නිර්ණායක තවදුරටත් සපුරා නොතිබීම;

(ආ) ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීමේ හෝ ඉල්ලීම සනාථ කරමින් ණයකරු විසින් සපයන යම් කරුණක සැලකිය යුතු සාවද්‍යතාවයක් තිබීම; හෝ

(ඇ) නිල දේපළ භාරගැනුම්කරු සෑහීමකට පත් වන පරිදි 32 වන සහ 71 වන වගන්තිවල දක්වා ඇති ණයකරුගේ හෝ ණයකරුවන්ගේ කාර්යභාරයට ණයකරු අනුකූලව ක්‍රියා කර නොතිබීම,

යන හේතු මත අධිකරණයට ඉල්ලීමක් කළ හැකි ය.

(4) ආඥාව පරිවර්තනය කිරීම සඳහා වන ඉල්ලීමක් ලැබීමෙන් පසු, ඉල්ලීම ලැබීමෙන් පසු දින දාහතරක් ඇතුළත ඉල්ලීම විභාග කිරීම සඳහා දිනයක් අධිකරණය විසින් නියම කළ යුතු ය.

(5) ආඥාව පරිවර්තනය කිරීම සඳහා වන ඉල්ලීමක් විභාග කිරීමේ දී අධිකරණය විසින් ණයකරුට, ණයහිමියන්ට සහ නිල දේපළ භාරගැනුම්කරුට ලිඛිත දැන්වීම් කළ යුතු ය.

(6) ආඥාව පරිවර්තනය කිරීම සඳහා වන ඉල්ලීමක් ලැබීමෙන් පසුව, අධිකරණය විසින් -

(අ) තීරණයකට එළඹීමේ දී අධිකරණයට සහාය විය හැකි තොරතුරු අධිකරණයට සපයන ලෙසට; හෝ

(ආ) තීරණයක් ගැනීමට අදාළ යයි අධිකරණයට පෙනෙන ඕනෑම කාරණයක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙසට,

නිල දේපළ භාරගැනුම්කරුට නියම කළ හැකි ය.

(7) ආඥාව පරිවර්තනය කිරීම සඳහා ඉල්ලීමක් ලැබීමෙන් පසුව, කාරණය නිසි ලෙස සලකා බැලීමේ සීමිත කාර්ය සඳහා, අධිකරණය විසින් ආඥාවේ කාලසීමාව දීර්ඝ කළ හැකි ය. එසේ වුව ද, –

(අ) එකී දීර්ඝ කිරීම ආඥාවේ ආරම්භක කාලසීමාවට වඩා දින අනූවක කාලයක් නොඉක්මවිය යුතු ය; සහ

(ආ) අධිකරණය විසින්-

(i) ණයහිමියකු හෝ ණයහිමියන් අන්‍යාකාරයකින් අසාධාරණ ලෙස අගතියකට පත් වන අවස්ථාවක දී, විරෝධතාවක් පිළිබඳව උචිත පරීක්ෂණයක් පැවැත්වීම;

(ii) ආඥා කාලය දීර්ඝ කිරීම හේතුවෙන් ණයකරුට සිදු වන යම් අසාධාරණයක්; සහ

(iii) දීර්ඝ කිරීම මගින් 65 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඉලක්ක ද ඇතුළුව, ණය පුනරුත්ථාපන ආඥාවේ කාර්යපටිපාටියේ ඉලක්ක වැඩි දියුණු කළ හැකි ප්‍රමාණය,

පිළිබඳව නිසි සැලකිල්ලක් දැක්විය යුතු ය.

(8) ආඥාව පරිවර්තනය කිරීම සඳහා වන ඉල්ලීමක් විභාග කිරීමේ දී, (3) වන උපවගන්තියෙහි සඳහන් කර ඇති හේතු තහවුරු කර නොමැති බව අධිකරණයට පෙනී ගියහොත්, අධිකරණය විසින් ආඥාව පරිවර්තනය කිරීම සඳහා වන ඉල්ලීම නිෂ්ප්‍රභා කළ යුතු ය.

(9) ආඥාව පරිවර්තනය කිරීම සඳහා වන ඉල්ලීමක් විභාග කිරීමේ දී, (3) වන උපවගන්තියේ සඳහන් හේතු තහවුරු කර ඇති බවට අධිකරණයට පෙනී ගියහොත් අධිකරණය විසින්-

(අ) ණය පුනරුත්ථාපන ආඥාව, බංකොලොත් භාවය පිළිබඳ ආඥාවක් බවට පරිවර්තනය කළ හැකි ය; හෝ

(ආ) ස්වකීය ණය ගෙවා බේරුම් කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීමට ණයකරුට අවස්ථාවක් ලබා දිය යුතු බව අධිකරණය සලකන්නේ නම්, අධිකරණය විසින්, III වන කොටස යටතේ අදාළ ආඥාව ණය ආරක්ෂණ කල් දැමීමේ ආඥාවක් බවට පරිවර්තනය කළ හැකි ය.

(10) (9) වන උපවගන්තිය යටතේ ණය ආඥාවක් පුනරුත්ථාපන ආඥාවක් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් බවට පරිවර්තනය කළ විට, 137 වන වගන්තිය යටතේ බංකොලොත්භාවයෙන් නිදහස් කිරීම සඳහා වන පොරොත්තු කාලය 70 වන වගන්තිය යටතේ ණය පුනරුත්ථාපන ආඥාව කිරීමේ දිනයේ දී ආරම්භ වූ ලෙසට සලකනු ලැබිය යුතු ය.

(11) (9) වන වගන්තියේ (ආ) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් ආඥාවක් කරනු ලබන අවස්ථාවක දී, 40 වන, 41 වන, 42 වන, සහ 43 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

නිල දේපළ භාරගැනුම්කරු විසින් දේපළ සංරක්ෂණ ආඥාවක් සඳහා ඉල්ලුම් කළ හැකි බව

**78.** (1) නිල දේපළ භාරගැනුම්කරු විසින් -

(අ) 76 වන වගන්තිය යටතේ ණය පුනරුත්ථාපන ආඥාව අවසන් කිරීම සඳහා ඉල්ලීමක් කිරීමට අදහස් කරන්නේ නම්;

(ආ) 77 වන වගන්තිය යටතේ පරිවර්තනය සඳහා ඉල්ලීමක් කිරීමට අදහස් කරන්නේ නම්;

(ඇ) 79 වන වගන්තිය යටතේ නිදහස් කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා ඉල්ලීමක් කිරීමට අදහස් කරන්නේ නම්; සහ

(ඇ) ණයකරු විසින් වත්කම් සඟවා ඇති බවට හෝ නිල දේපළ භාරගැනුම්කරු නොමඟ යවා ඇති බවට වූ මතයක් ඇති කරගෙන තිබේනම්,

මේ වගන්තිය අදාළ විය යුතු ය.

(2) නිල දේපළ භාරගැනුම්කරුගේ ඉල්ලීම මත, 76,77 වන හෝ 79 වන වගන්ති යටතේ අධිකරණය විසින් ආඥාවක් කරන තුරු ණයකරුගේ වත්කම් සංරක්ෂණය කිරීම සඳහා අධිකරණය විසින් ආඥාවක් කළ හැකි ය.

(3) ණයකරුගේ වත්කම් සංරක්ෂණය කිරීම සඳහා වන ආඥාවක් -

(අ) අවශ්‍ය විය හැකි යම් නියම සහ කොන්දේසි මත පදනම් විය හැකි ය; සහ

(ආ) අධිකරණය අන්‍යාකාරයෙන් තීරණය කරන්නේ නම් මිස, ආඥාව ලබා දුන් මොහොතේ සිට බලාත්මක විය යුතුය.

ණය පුනරුත්ථාපන ආඥාව නිදහස් කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

**79.** (1) නිල දේපළ භාරගැනුම්කරුගේ හෝ ණයහිමියකුගේ ඉල්ලීම මත සහ ණයකරුට කරනු ලබන ලිඛිත දැන්වීමකින් සහ නඩු විභාගයකින් පසුව, 73 වන වගන්තිය යටතේ ලබා දී ඇති නිදහස් කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට අධිකරණයට හැකි ය.

(2) මේ වගන්තිය යටතේ වන නිදහස් කිරීමක් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම සඳහා වන ඉල්ලීමක් 73 වන වගන්තිය යටතේ නිදහස් කිරීමේ දිනයට පසුව මාස දොළහක් ඉකුත්වීමට පෙර ඉදිරිපත් කළ යුතු ය.

(3) අධිකරණය විසින්-

(අ) ණයකරු වංචා කිරීමෙන් නිදහස් කිරීම ලබාගත් බවට; හෝ

(ආ) ණයකරු-

(i) ආදායම 36 වන වගන්තිය යටතේ ආරක්ෂිත ආදායමක් නොවන අවස්ථාවක; හෝ

(ii) දේපළ 34 වන වගන්තිය යටතේ ආරක්ෂිත දේපළක් නොවන අවස්ථාවකදී,

අධිකරණය සෑහීමට පත්වන්නේ නම්, වංචනික චේතනාවෙන්, නිල දේපළ භාරගැනුම්කරුට ආදායම හෝ දේපළ පිළිබඳව හෙළිදරව් කිරීමට අපොහොසත් වී ඇති බවට, පමණක් මෙම වගන්තිය යටතේ වන නිදහස් කිරීමක් ප්‍රත්‍යාදිෂ්ඨ කළ හැකි ය.

(4) නිදහස් කිරීම, ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම නොකළේ නම්, ණයකරු හැර වෙනත් යම් තැනැත්තකුට තිබිය හැකි වූ අයිතිවාසිකම් හෝ ප්‍රතිකර්මවලට, නිදහස් කිරීමක් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම මගින් අගතියක් හෝ බලපෑමක් සිදු නොවිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ නිදහස් කිරීමක් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම මත -

(අ) 73 වන වගන්තිය යටතේ අවලංගු කරන ලද ණය බලාත්මක විය යුතු ය; සහ

(ආ) ණයකරු විසින්, ණය පුනරුත්ථාපන ආඥාව ක්‍රියාත්මකව පවතින විට දී හෝ ණයකරු නිදහස් කිරීමෙන් පසුව එකතු වී ඇති යම් පොලී, ගාස්තු හෝ අය කිරීම් ගෙවීමට බැඳී සිටිය යුතු ය.

බලයලත් අතරමැදියන්

**80.** (1) අධිකාරිය විසින් ණය පුනරුත්ථාපන ආඥාව කාර්ය පටිපාටිය ක්‍රියාත්මක කිරීමේ දී බලයලත් අධිකාරිය විසින් අතරමැදියන් ඉටුකරන කාර්යභාරය සම්බන්ධයෙන් මේ පනතේ 4 වන වගන්තියට අනුකූලව, රීති, ප්‍රමිති සහ මාර්ගෝපදේශ නිකුත් කළ හැකි ය.

(2) අමාත්‍යවරයා විසින්, නියම කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකින් මේ පනත යටතේ බලයලත් අතරමැදියකු ලෙස ක්‍රියා කිරීමට යම් තැනැත්තකුට, ආයතනයකට හෝ මණ්ඩලයකට බලය පැවරිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී, අධිකාරිය විසින්, 65 වන වගන්තියේ නිශ්චිතව දක්වා

ඇති කාර්යපටිපාටියේ ඉලක්ක සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු අතර, බලයලත් අතරමැදියන්ට අදාළ යම් රීති, ප්‍රමිති සහ මාර්ගෝපදේශ මගින් අඩු ආදායම් සහ වත්කම් සහිත ණයකරුවන්ට කාර්යපටිපාටිය වෙත ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම ද සහතික කළ යුතු ය.

## VI වන කොටස

### බංකොලොත්භාවය

### 1 වන පරිච්ඡේදය

### බංකොලොත්භාවය පිළිබඳ ඉල්ලීම සහ බංකොලොත්භාවය පිළිබඳ ආඥාව

බංකොලොත් භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන ණයකරුගේ ඉල්ලීම

**81.** (1) ණයකරු සම්බන්ධයෙන් වන බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා මේ පරිච්ඡේදයට අනුකූලව ණයකරු විසින් අධිකරණයට ඉල්ලීමක් කළ හැකි ය.

(2) ණයකරුට බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා ඉල්ලීමක් කළ හැකි වනුයේ ණයකරුගේ ණය ගෙවීමට ණයකරුට නොහැකි වීමේ හේතුව මත පමණි.

(3) ණයකරු විසින්, මීට පෙර බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් ලබාගැනීම සඳහා වර්තමාන ඉල්ලීමේ දිනට පෙරාතුව මාස හයක කාලයක් තුළ පූර්ව ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී ණයකරුට බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කළ නොහැකි ය.

ණයකරු ශ්‍රී ලංකාවේ පදිංචිව සිටිය යුතු බව

**82**. ණයකරුවකු බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා සුදුසුකම් ලබන්නේ ණයකරු ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින්නේ නම් හෝ බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන ඉල්ලීම කරන දිනට පෙර වසර තුනක් ඇතුළත යම් අවස්ථාවක -

(අ) ශ්‍රී ලංකාවේ පදිංචිව සිටියේ නම් හෝ ශ්‍රී ලංකාවේ වාසස්ථානයක් තිබුණේ නම් ; හෝ

(ආ) හවුල් ව්‍යාපාරයක හෝ සමාගමක සාමාජිකත්වය මඟින්ද ඇතුළුව, ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පවත්වාගෙන ගිය තැනැත්තකු වූයේ නම්,

පමණි.

ණයකරුගේ ඉල්ලීම මත බංකොලොත් භාවය පිළිබඳ ආඥාවක් ලබාගැනීම සඳහා වූ නිර්ණායක

**83.** (1) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන ණයකරුවකුගේ ඉල්ලීමක -

(අ) 33 වන වගන්තියට අනුකූලව, ආකෘතිය නියම කරනු ලැබිය හැකි, ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශයක්; සහ

(ආ) අධිකරණය විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු,

ඇතුළත් විය යුතු ය.

(2) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන ඉල්ලීමක් කිරීම සහ බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කිරීම සම්බන්ධයෙන් අධිකරණ තීන්දුව අතර ඕනෑම අවස්ථාවක, ණයකරුට ස්වකීය ණය ගෙවීමට හැකියාවක් ලැබේනම්, ණයකරුවකු ඒ බව අධිකරණයට දැන්විය යුතු ය.

ණයකරුගේ ඉල්ලීම මත බංකොලොත් භාවය පිළිබඳ ආඥාවක් කිරීම

**84.** (1) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන ඉල්ලීමක් ලැබීමෙන් පසු, දින එකසිය අසූවක කාලසීමාවක් තුළ හෝ නියම කරනු ලැබිය සඳහා වන ඉල්ලීමක් හැකි වෙනත් කාලසීමාවක් තුළ අධිකරණය විසින් පහත දැක්වෙන කරුණු පිළිබඳව තීරණය කළ යුතු ය:-

(අ) 81 වන සහ 82 වන වගන්තිවල යෝග්‍යතා නිර්ණායක සපුරා තිබේ ද යන්න;

(ආ) ණයකරුට එකී ණය ගෙවීමට නොහැකි ද යන්න; සහ

(ඇ) අධිකරණ තීන්දුවේ දිනය වන විට ඉල්ලීමට විෂය වන යම් ණයක් සම්බන්ධයෙන් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් ලබා දී නොමැති බව.

(2) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන ඉල්ලීමක් ලැබීමෙන් පසු, බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කළ යුතු ද යන්න තීරණය කිරීමේ කාර්යය සඳහා අධිකරණය විසින් අවශ්‍ය යයි සලකන යම් තොරතුරක් ලබාදෙන ලෙසට අධිකරණය විසින් ඕනෑම අවස්ථාවක දී ණයකරුගෙන් ඉල්ලා සිටිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් අවශ්‍යතා සපුරා ඇති බවට අධිකරණය සෑහීමකට පත් වේනම්, අධිකරණය විසින් ණයකරු සම්බන්ධයෙන් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ අවශ්‍යතා සපුරා ඇති බවට අධිකරණය සෑහීමකට පත් නොවන්නේ නම්, අධිකරණය විසින් ණයකරු සම්බන්ධයෙන් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කිරීම ප්‍රතික්ෂේප කළ යුතු අතර -

(අ) ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ හේතු කවරේ ද යන්න; සහ

(ආ) (5) වන උපවගන්තිය යටතේ තීරණය සමාලෝචනය කිරීමේ හැකියාව,

පිළිබඳ ණයකරුට ලිඛිතව දැන්වීමක් ලබාදිය යුතු ය.

(5) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කිරීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී, පවතින තොරතුරු අධිකරණයෙන් සමාලෝචනය කරන ලෙසට ණයකරුට ඉල්ලා සිටිය හැකි අතර, මෙම සමාලෝචනය මත අධිකරණය විසින් -

(අ) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කිරීම ප්‍රතික්ෂේප කිරීම තහවුරු කළ යුතු ය; හෝ

(ආ) ණයකරු සම්බන්ධයෙන් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(6) අධිකරණය විසින් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කරනු ලබන අවස්ථාවක දී, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින්, අධිකරණය විසින් -

(අ) ආඥාවේ පිටපතක් ණයකරුට ලබා දිය යුතු ය;

(ආ) නියෝගයේ පිටපතක් නිල දේපළ භාරගැනුම්කරුට ලබා දිය යුතු ය; සහ

(ඇ) ණයකරුගේ සෑම දන්නා ණයහිමියකුටම නියෝගය පිළිබඳ ලිඛිත දැන්වීමක් ලබා දිය යුතු ය.

(7) අධිකරණය විසින් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කරන අවස්ථාවක දී, ණයකරුගේ නම, ලිපිනය සහ විස්තරය සහ ආඥාවේ දිනයද ඇතුළුව නියම කරනු ලැබිය හැකි බංකොලොත්භාවය පිළිබඳ ආඥාවේ යම් විස්තර-

(අ) පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ පළ කිරීමට; සහ

(ආ) ප්‍රසිද්ධ දැන්වීමක් මගින් පළ කිරීමට,

නිල දේපළ භාරගැනුම්කරු විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(8) (6) වන උපවගන්තිය යටතේ නිල දේපළ භාරගැනුම්කරු විසින් ලබා දිය යුතු දැන්වීමේ ආකෘතිය නියම කරනු ලැබිය හැකි ය.

(9) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවේ දිනය, මේ පනතේ කාර්ය සඳහා, බංකොලොත්භාවය ආරම්භ වන දිනය විය යුතු ය.

බංකොලොත් භාවය පිළිබඳ නියෝගය සඳහා වන පෙත්සම

**85.** (1) මේ පරිච්ඡේදයේ පහත සඳහන් විධිවිධානවලට අනුකූලව ණයකරුවකුට එරෙහිව බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා යම් පාර්ශ්වයකට ඉල්ලීමක් කළ හැකි ය.

(2) මේ පරිච්ඡේදය යටතේ ණයකරුවකුට එරෙහිව බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන පෙත්සමක් -

(අ) ණයහිමියකු විසින්;

(ආ) ණයහිමියන් දෙදෙනකු හෝ වැඩි ගණනක් සිටින විට ඒකාබද්ධව ණයහිමියන් විසින්; හෝ

(ඇ) නිල දේපළ භාර ගැනුම්කරු

විසින් ඉදිරිපත් කළ හැකි ය.

(3) ණයකරුවකුට එරෙහිව බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් ලබා ගැනීම සඳහා නිල දේපළ භාර ගැනුම්කරු විසින්-

(අ) 59 වන වගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් අවසන් කරමින් අධිකරණය විසින් ආඥාවක් කර ඇති අවස්ථාවක දී;හෝ

(ආ) 77 වන වගන්තිය යටතේ ණය පුනරුත්ථාපන ආඥාවක් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් බවට පරිවර්තනය කිරීම සඳහා කරන ලද ඉල්ලීමක් හරහා,

පෙත්සමක් ඉදිරිපත් කළ හැකි ය.

බංකොලොත් භාවය පිළිබඳ පෙත්සම: ණයකරුගේ කොන්දේසිය

**86.** (1) ණයකරුවකුට එරෙහිව බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන පෙත්සමක් ඉදිරිපත් කළ හැකි වනුයේ, ණයකරු 66 වන වගන්තිය යටතේ ණය පුනරුත්ථාපන නියෝගයක් සඳහා වන ඉල්ලීමට නුසුදුසු වූ විට පමණි.

(2) ණයකරුට එරෙහිව බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන පෙත්සමක් ඉදිරිපත් කළ හැකි වනුයේ, ණයකරු ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින්නේනම් හෝ බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන ඉල්ලීම කරන දිනට පෙර වසර තුනක් ඇතුළත යම් අවස්ථාවක -

(අ) ශ්‍රී ලංකාවේ පදිංචිව සිටියේ නම් හෝ ශ්‍රී ලංකාවේ වාසස්ථානයක් තිබුණේ නම්; හෝ

(ආ) හවුල් ව්‍යාපාරයක හෝ සමාගමක සාමාජිකත්වය මගින් ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ව්‍යාපාර, කටයුතු පවත්වාගෙන ගිය තැනැත්තකු වූයේ නම්,

පමණි.

බංකොලොත් භාවය පිළිබඳ පෙත්සම: ඉල්ලා අස්කර ගැනීමට, අත්හිටුවීම සහ නිශ්ප්‍රභ කිරීමට අධිකරණයට ඇති බලතල

**87.** (1) අධිකරණයේ අවසරයකින් තොරව, බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමක් ඉල්ලා අස්කර නොගත යුතු ය.

(2) බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමක් අධිකරණයට ඉදිරිපත් කරන විට, අධිකරණය විසින් සුදුසු යැයි සලකනු ලබන්නේ නම්, කාර්යපටිපාටික අවිධිමත්භාවය හෝ වෙනත් යම් හේතුවක් නිසා -

(අ) බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමක් නිෂ්ප්‍රභ කිරීම සඳහා; හෝ

(ආ) අවශ්‍ය යම් නියම සහ කොන්දේසි මත බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමක නඩු කටයුතු අත්හිටුවීමට,

අධිකරණයට බලය ඇත.

(3) බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමක් අධිකරණයට ඉදිරිපත් කරන විට සහ ණයකරුට ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීමට ඉඩ දීම සුදුසු යැයි අධිකරණය සලකන විට, අධිකරණය විසින් -

(අ) බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමේ නඩු කටයුතු අත්හිටුවනු ලැබිය හැකි ය; සහ

(ආ) III වන කොටස යටතේ ණය ආරක්ෂණ කල්දැමීමේ ආඥාවක් සඳහා වන ඉල්ලීමක් කිරීමට ණයකරුව කැඳවිය හැකි ය.

(4) පෙත්සමක් ඉදිරිපත් කිරීමෙන් පසුව සහ බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කිරීමට පෙර -

(අ) ණයකරුගේ දේපළ හෝ ණයකරුට එරෙහිව යම් නඩු කටයුත්තක්, ආඥාවක, ක්‍රියාත්මක කිරීමක් හෝ වෙනත් නීති කෘත්‍යයක් අධිකරණය විසින් අත්හිටුවිය හැකි ය; සහ

(ආ) ණයකරුට එරෙහිව යම් නඩු කටයුත්තක් විභාග වෙමින් පවතින යම් අධිකරණයකට, ණයකරුට එරෙහිව පෙත්සමක් ඉදිරිපත් කර ඇති බවට සාක්ෂියක් මත, නඩු කටයුතු අත්හිටුවීමට හෝ අධිකරණය විසින් අවශ්‍ය යැයි සලකන යම් නියම මත නඩු කටයුතු පවත්වාගෙන යාමට අධිකරණය විසින් ඉඩ දිය හැකි ය.

(5) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා පෙත්සම් එකකට වඩා තිබෙන අවස්ථාවක දී සහ එක් පෙත්සමක්

අධිකරණය විසින් අත්හිටුවා හෝ කල් තබා තිබේ නම් සහ අධිකරණයට පිළිගත හැකි හේතුවක් තිබේ නම් -

(අ) අත්හිටුවා හෝ කල් තබා නොමැති පෙත්සම සම්බන්ධයෙන් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කරනු ලැබිය හැකි ය; සහ

(ආ) අධිකරණය විසින් අවශ්‍ය යැයි සලකනු ලබන කොන්දේසි මත අත්හිටුවා ඇති හෝ කල් තබන ලද පෙත්සම නිෂ්ප්‍රභ කළ හැකි ය.

(6) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන ණයහිමියකුගේ පෙත්සම එක් ණයකරුවකුට වඩා අදාළ වන අවස්ථාවක දී, ඉතිරි ණයකරුට හෝ ණයකරුවන්ට පෙත්සම බල නොපාන පරිදි, ණයකරුවන්ගෙන් එක් අයකු හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් ආඥාවක් කිරීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.

ණයහිමියාගේ පෙත්සමේ පදනම

**88.** (1) ණයක් හෝ ණය සම්බන්ධයෙන් ණයහිමියකුගේ පෙත්සමක් අධිකරණයට ඉදිරිපත් කළ හැකි වනුයේ පෙත්සම ඉදිරිපත් කරන විට දී -

(අ) ණය ප්‍රමාණය හෝ ණයවල සමස්ත එකතුව රුපියල් මිලියන දෙකට සමාන හෝ ඊට වැඩි නම්;

(ආ) ණය ලබා දී ඇත්තේ ප්‍රමාණ කළ මුදලකට නම්;

(ඇ) ණය වහාම හෝ අනාගත දිනයක දී ගෙවිය යුතු වන්නේ පෙත්සම්කාර ණයහිමියාට හෝ පෙත්සම්කාර ණයහිමියන්ගෙන් එක් අයකුට හෝ වැඩි ප්‍රමාණයකට නම්;

(ඈ) ණය හෝ එක් එක් ණය, බංකොලොත් වීමට පෙර ගෙවීම පැහැර හැරීමක් සිදු වූ ණයක් වන්නේ නම්; සහ

(ඉ) ණය හෝ යම් ණයක් සම්බන්ධයෙන් බංකොලොත්භාවය පිළිබඳ දැන්වීමක් පසෙකලීම සඳහා කටයුතු අවසන් නොවූ ඉල්ලීමක් නොමැති නම්,

පමණි.

බංකොලොත් භාවය පිළිබඳ දැන්වීම සහ මුදල් ගෙවීමට ඇති නොහැකියාව

**89.** (1) නියම කළ හැකි ආකාරයේ ආකෘතියකින් යුතු වන බංකොලොත්භාවය පිළිබඳ දැන්වීමක් මඟින් -

(අ) එම දැන්වීම මගින් පෙත්සම්කාර ණයහිමියකුට ගෙවිය යුතු වන ණයක් සම්බන්ධයෙන් ණයකරුට,

(i) ගෙවිය යුතු යම් පොලියක් සහ වියදම් ඇතුළුව ද ණය මුදල ගෙවන ලෙසට;

(ii) පෙත්සම්කාර ණයහිමියා සෑහීමකට පත් වන පරිදි ගෙවීමට ඇති ණය මුදල සම්බන්ධයෙන් ඇප තබන ලෙසට; හෝ

(iii) පෙත්සම්කාර ණයහිමියා සෑහීමකට පත් වන පරිදි ණය මුදල සමථයකට පත් කරන ලෙසට,

නියම කරනු ලැබිය යුතු ය.

(ආ) බංකොලොත්භාවය පිළිබඳ, දැන්වීමට අනුකූලව ක්‍රියා නොකිරීමෙන් ඇති වන ප්‍රතිඵල පිළිබඳව සඳහන් කළ යුතු ය; සහ

(ඇ) ශ්‍රී ලංකාවේ සිටින ණයකරුට, නැතහොත් අධිකරණයේ අවසරය ඇතිව ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථානයක දී ණයකරුට භාර දිය යුතු ය.

(2) බංකොලොත්භාවය පිළිබඳ දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති මුදල සත්‍ය වශයෙන් ම ගෙවිය යුතු මුදලට වඩා වැඩි වීම මගින් බංකොලොත්භාවය පිළිබඳ දැන්වීමේ වලංගුතාව-

(අ) සත්‍ය වශයෙන් ම ගෙවිය යුතු මුදලට වඩා වැඩි මුදලක් බංකොලොත්භාවය පිළිබඳ දැන්වීමේ සඳහන් කර ඇති බැවින් බංකොලොත්භාවය පිළිබඳ දැන්වීමේ වලංගුතාව පිළිබඳ තමා හබ කරන බව ණයකරු විසින් ණයහිමියාට දැනුම් දෙන්නේ නම් මිස; සහ

(ආ) බංකොලොත්භාවය පිළිබඳ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම සඳහා බංකොලොත්භාවය පිළිබඳ දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති කාලය තුළ ණයකරු විසින් දැන්වීම කරන්නේ නම් මිස,

නැති නොවිය යුතු ය.

(3) 88 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ කාර්ය සඳහා, බංකොලොත් වීමට පෙර වූ පැහැර හැරීමක් සිදුව ඇත්තේ (4) වන හෝ (5) වන උප වගන්තිවල කොන්දේසි සපුරාලන්නේ නම් පමණි.

(4) රුපියල් මිලියන දෙකක් හෝ ඊට වැඩි ඇතුළත් කළ ණය මුදලක් ණයකරු විසින් පෙත්සම්කාර ණයහිමියාට ගෙවීමට ඇති අවස්ථාවක දී -

(අ) ණය අයවිය යුතු පෙත්සම්කාර ණයහිමියා විසින් ණයකරුට බංකොලොත්භාවය පිළිබඳ දැන්වීමක් ලබා දී තිබිය යුතු වීම;

(ආ) බංකොලොත්භාවය පිළිබඳ දැන්වීම ලබා දුන් දින සිට දින විසිඑකකට වඩා ගතවී තිබීම; සහ

(ඇ) බංකොලොත්භාවය පිළිබඳ දැන්වීමට -

(i) අනුකූල වී නො තිබීම; නැතහොත්

(ii) නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් පසෙකලා නොතිබීම.

මත බංකොලොත්භාවය පිළිබඳ ආඥාව අවලංගු වූ ලෙසට සලකනු ලැබිය යුතු ය.

(5) මේ උපවගන්තියේ අවශ්‍යතා විය යුත්තේ -

(අ) රුපියල් මිලියන දෙකක් හෝ ඊට වැඩි මුදලක් සඳහා ණයකරුට එරෙහිව ණයහිමියකු විසින් අවසාන නඩු තීන්දුවක් හෝ අවසාන ආඥාවක් ලබාගෙන තිබීම; සහ

(ආ) සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සපුරා නොමැති ණයක් සම්බන්ධයෙන් ඇස්කීසි කිරීමක් හෝ වෙනත් ක්‍රියා පටිපාටියක් අරඹා ඇත්නම්,

බංකොලොත් භාවය පිළිබඳ ආඥාව සඳහා වූ පෙත්සම පිළිබඳ අධිකරණ තීරණය

**90.** (1) බංකොලොත්භාවය පිළිබඳ ආඥාව සඳහා පෙත්සමක් ලැබීමේ දී, 86 වන 88 වන, සහ 89 වන වගන්තිවල සඳහන් කොන්දේසි සපුරා ඇති බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම් අධිකරණය විසින් බංකොලොත්භාවය පිළිබඳ නියෝගයක් කරනු ලැබිය හැකි ය.

(2) ණයකරුට ණයකරුගේ සියලුම ණය ගෙවිය හැකි බවට අධිකරණය සෑහීමකට පත් වන්නේ නම් හෝ -

(අ) පෙත්සම ඉදිරිපත් කර ඇත්තේ යම් ණය මුදලක් සඳහා ද එම ණය මුදල සඳහා ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ එම ණය මුදල සමථයකට පත් කිරීමට ණයකරු විසින් අර්පණයක් ඉදිරිපත් කර ඇති බවට;

(ආ) එම අර්පණය පිළිගනු ලැබුවහොත් පෙත්සම නිශ්ප්‍රභ කළ යුතු බවට; සහ

(ඇ) එම අර්පණය අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කර ඇති බවට,

අධිකරණය සෑහීමට පත් වන්නේනම්, අධිකරණය විසින් පෙත්සම නිෂ්ප්‍රභ කළ හැකි ය.

(3) (2) වන උපවගන්තියේ කාර්ය සඳහා ණයකරුට, ණයකරුගේ සියලුම ණය ගෙවීමට හැකි ද යන්න තීරණය කිරීමේ දී, පෙත්සම ඉදිරිපත් කරන දිනයේ දී ණයකරු යටත්ව සිටින වර්තමාන හෝ අනාගත හෝ ස්ථිර හෝ ස්ථිර නොවන සියලු ණය සහ බැරකම් අධිකරණය විසින් සැලකිල්ලට ගත යුතු ය.

(4) අධිකරණය විසින් බංකොලොත්භාවය පිළිබඳ ආඥාව කරන අවස්ථාවක දී, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් -

(අ) ආඥාවේ පිටපතක් ණයකරුට ලබා දිය යුතු ය;

(ආ) ආඥාවේ පිටපතක් නිල දේපළ භාර ගැනුම්කරුට ලබාදිය යුතු ය; සහ

(ඇ) ණයකරුගේ සෑම දන්නා ණයහිමියකුට ම ආඥාව පිළිබඳ ලිඛිත දැන්වීමක් ලබා දිය යුතු ය.

(5) අධිකරණය විසින් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කරන අවස්ථාවක දී, ණයකරුගේ නම, ලිපිනය සහ විස්තරය සහ ආඥාවේ දිනය ද ඇතුළුව නියම කරනු ලැබිය හැකි බංකොලොත්භාවය පිළිබඳ ආඥාවේ යම් විස්තර -

(අ) පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ පළ කිරීමට ද; සහ

(ආ) ප්‍රසිද්ධ දැන්වීමක් මගින් පළ කිරීමට ,

නිල දේපළ භාර ගැනුම්කරු විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් ලබා දිය යුතු දැන්වීමේ ආකෘතිය නියම කරනු ලැබිය හැකි ය.

අතුරු දේපළ භාර ගැණුම්කරු

**91.** (1) පෙත්සමක් ඉදිරිපත් කිරීමෙන් පසු සහ බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සෑදීමට පෙර යම් අවස්ථාවක, ණයකරුගේ දේපළ ආරක්ෂා කිරීම අවශ්‍ය බව අධිකරණය සලකන්නේනම් කරන්නේනම්, අධිකරණය විසින් නිල දේපළ භාර ගැනුම්කරු, අතුරු නිල දේපළ භාර ගැනුම්කරු ලෙස පත් කළ හැකි ය.

(2) අධිකරණය විසින් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කිරීමට පෙර ඕනෑම අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කළ හැකි ය.

(3) ආඥාවේ කොටසක් ලෙස හෝ ණයහිමියාගේ හෝ නිල දේපළ භාර ගැනුම්කරුගේ ඉල්ලීම මත, පසුව, අධිකරණය විසින්-

(අ) යම් දේපළක් සන්තකයේ තබා ගැනීම;

(ආ) ක්ෂණිකව බැහැර නොකළහොත් වටිනාකම සැලකිය යුතු ලෙස අඩුවීමට ඉඩ ඇති විනාශ වන භාණ්ඩයක් හෝ දේපළක් විකිණීම;

(ඇ) අධිකරණය විසින් විධානය කරනු ලබන පරිදි ණයකරුගේ ව්‍යාපාරය හෝ දේපළ පාලනය කිරීම; හෝ

(ඇ) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් ලබා දී ඇති ණයකරුවකු සම්බන්ධයෙන් 102 වන වගන්තිය යටතේ බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වෙත පවරා ඇති බලතල නිල දේපළ භාර ගැනුම්කරු විසින් ණයකරුට අදාළව ක්‍රියාත්මක කිරීම,

සඳහා නිල දේපළ භාර ගැනුම්කරුට බලය පවරනු ලැබිය හැකි ය.

(4) ණයකරුගේ දේපළ හෝ ව්‍යාපාරය මත නිල දේපළ භාර ගැනුම්කරුගේ පාලනය සඳහා වූ ආඥාවක් ක්‍රියාත්මක කිරීම, අධිකරණයේ මතය අනුව, අධිකරණය විසින් ණයකරුගේ දේපළ සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය වන කරුණට සීමා කළ යුතු ය.

(5) ණයකරුගේ දේපළෙහි අතුරු දේපළ භාර ගැනුම්කරු ලෙස නිල දේපළ භාර ගැනුම්කරු පත් කිරීම, ඔහු විසින් නියම කළ හැකි ආකාරයට ප්‍රචාරණය කළ යුතු ය.

(6) අතුරු නිල දේපළ භාර ගැනුම්කරු පත්කරනු ලැබූ අවස්ථාවක දී, 93 වන වගන්තිය, පත්කිරීම සහ, පෙත්සම සම්බන්ධයෙන් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් නිකුත් කිරීම අතර වූ කාලසීමාව සඳහා, එකී ආඥාව නිකුත් කිරීමට පසුව පත්වීම කළාසේ සලකා, අදාළ වේ.

(7) අන්තර්කාලීන නිල දේපළ භාර ගැනුම්කරු පත් කරන විට, ණයකරුට එරෙහිව බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කර ඇති ලෙසට 122 වන වගන්තිය යටතේ අදාළ විය යුතු ය.

## 2 වන පරිච්ඡේදය

### බංකොලොත්භාවය පිළිබඳ ආඥාවේ බලපෑම

බංකොලොත් භාවය ආරම්භ කිරීම

**92.** (1) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් ලබා ඇති ණයකරුගේ බංකොලොත්භාවය -

(අ) ආඥාව සිදු කරනු ලබන දින සිට ආරම්භ වේ; සහ

(ආ) මේ කොටස යටතේ තැනැත්තා නිදහස් කරන තෙක් දිගටම බලාත්මකව පවතී.

(2) ආරම්භ කළ දිනට පසුව යම් ක්‍රියාවක් සිදු කර ඇති බව හෝ ගනුදෙනුවක් සිදු කර හෝ බලාත්මක කර ඇති බව උපකල්පනය කළ යුතු නමුත්, ඊට පටහැනි දෙයක් ඔප්පු කළහොත්, එම උපකල්පනය අදාළ නොවේ.

(3) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් අභියාචනයකට විෂයය වන්නේ නම් මිස -

(අ) බංකොලොත්භාවය පිළිබඳ ආඥාව කිරීම වලංගු නොවන බව හෝ ආරම්භ කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවක් නොතිබූ බව යම් කෙනකුට පසුව ප්‍රකාශ කළ නොහැකි ය; සහ

(ආ) බංකොලොත්භාවය පිළිබඳ ආඥාව සියලු තැනැත්තන් කෙරෙහි බැඳීමක් ඇති කළ යුතු ය.

නීති කෘත්‍ය සහ ප්‍රතිකර්ම නැවැත්වීම

**93.** (1) මේ වගන්තියට යටත්ව, බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සෑදීමෙන් පසු, බංකොලොත්භාවයේදී ගෙවිය යුතු වන ණයක් හිමි බංකොලොත් ණයකරුගේ ණයහිමියා -

(අ) හට ණය සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිකර්මයක් නොමැති විය යුතු ය;

(ආ) විසින් ණය අයකර ගැනීමට හෝ බලාත්මක කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය; සහ

(ඇ) විශේෂයෙන් ම, පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් නොගත යුතු ය: -

(i) ණයකරුගේ ඉල්ලීම පරිදි හැර ඔප්පු කළ හැකි ණයක් ගෙවීම සම්බන්ධයෙන් බංකොලොත් ණයකරුවකු ඇමතීම;

(ii) ඔප්පු කළ හැකි ණයක් සම්බන්ධයෙන් බංකොලොත් ණයකරුට එරෙහිව යම් නීති කෘත්‍යයක් ආරම්භ කිරීම හෝ දිගටම පවත්වාගෙන යාම;

(iii) ඔප්පු කළ හැකි ණයක් රැස් කිරීම, සුරක්ෂිත කිරීම, අයකර ගැනීම හෝ ගෙවන ලෙස ඉල්ලා සිටීම;

(iv) බංකොලොත් ණයකරුට එරෙහිව අධිකරණයක හෝ විනිශ්චය සභාවක තීන්දුවක් හෝ ආඥාවක් ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීම;

(v) වරෙන්තුවක් ලබා ගැනීම;

(vi) (3) වන උපවගන්තියේ අවශ්‍යතා සපුරාලන්නේ නම් මිස, බංකොලොත් ණයකරු අදාළ ණයහිමියා සමග ඇතුළත් ඇති කුලී නිවැසිභාවය පිළිබඳ ගිවිසුමක් යටතේ බංකොලොත් ණයකරු පදිංචිව සිටින පරිශ්‍රයක සන්තකය ලබා ගැනීම;

(vii) (10) වන උපවගන්තියට යටත්ව, ණය හිමියා භාණ්ඩවල අයිතිකරු හෝ බදු දීමනාකරු වන අවස්ථාවක ණයකරු විසින් භාවිත කරන ණයකරුගේ

සන්තකයේ ඇති 34 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (අ),(ආ),(ඇ) සහ (ඈ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති යම් භාණ්ඩයක සන්තකය ආපසු ලබා ගැනීම; හෝ

(viii) ඉහත (i), (ii), (iii), (iv), (v), (vi), (vii), (viii) දක්වා ඡේදවල සඳහන් ඕනෑම ක්‍රියාවක් කිරීමට අනුයෝජිතයකුට උපදෙස් දීම.

(2) බංකොලොත් ණයකරුවකු සම්බන්ධයෙන් බංකොලොත් ආඥාවක් බලාත්මකව පවතින විට, අධිකරණයක් විසින් ණයහිමියකුට (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ දක්වා ඇති ක්‍රියා මාර්ගයක් ගැනීමට අධිකරණය විසින් -

(අ) ව්‍යතිරේක තත්ත්වයන් යන්නෙන් ණයහිමියාට පියවර ගැනීමට ඉඩ දීම සාධාරණ බවට අදහස් වන බව; සහ

(ආ) ක්‍රියාව මගින් -

(i) බංකොලොත් ණයකරුට අනවශ්‍ය හානියක් සිදු නොවන බව;

(ii) වෙනත් ණයහිමියකු අසාධාරණ ලෙස අගතියට පත් නොවන බව; හෝ

(iii) බංකොලොත් ක්‍රියාවලියේ අරමුණු සැලකිය යුතු ලෙස හැල්ලු කිරීමක් එමගින් නොවන බව,

සලකනු ලබන අවස්ථාවල දී අධිකරණය විසින් සුවිශේෂී අවසරයක් දිය හැකි ය.

(3) බංකොලොත් ණයකරුවකු සම්බන්ධයෙන් බංකොලොත් ආඥාවක් ක්‍රියාත්මක ව පවතින අතරවාරයේ දී, ණයකරු අදාළ ණයහිමියා සමග ඇතුළු වී ඇති කුලී නිවැසිභාවය පිළිබඳ ගිවිසුමක් යටතේ බංකොලොත් ණයකරු පදිංචිව සිටින පරිශ්‍රයක සන්තකය ලබා ගැනීමට අදාළ ණයහිමියකුට අධිකරණයකින් සුවිශේෂී අවසරයක්-

(අ) බංකොලොත් කාලය තුළ කුලී නිවැසිභාවය පිළිබඳ ගිවිසුමේ කාලය අවසන් වන්නේ නම්;

(ආ) ණයකරු මාස තුනකට වැඩි කුලී මුදලක් අදාළ ණයහිමියාට හිඟ තබා ඇති අවස්ථාවකදී, බංකොලොත්භාවයේ කාලසීමාව තුළ ගෙවල් කුලිය අඛණ්ඩව ගෙවීමට ණයකරුට නොහැකි වනු ඇතැයි අධිකරණය විසින් සළකනු ලබන්නේ නම්; හෝ

(ඇ) පරිශ්‍රය සන්තකයේ තබා ගැනීම සඳහා වූ අදාළ ණයහිමියාගේ ඉල්ලීම ණයකරුගේ කුලී නොගෙවීම හැර වෙනත් හේතු මත පදනම් වන්නේ නම්,

පමණක් ලබා දිය හැකි ය.

(4) (6) වන උපවගන්තියට යටත්ව, බංකොලොත් ණයකරුවෙකුගේ බංකොලොත් කාලය තුළදී කිසිඳු පුද්ගලයකු විසින් පහත දැක්වෙන අවස්ථාවලදී හැර සමාගමේ දේපළ කෙරෙහි පවතින පිළිබැඳීමක්: -

(අ) බංකොලොත් භාරකරුගේ පූර්ව ලිඛිත අවසරය ලබා ඇත්නම් මිස; හෝ

(ආ) අවශ්‍ය නියම සහ කොන්දේසි මත අධිකරණයේ අවසරය ලබා ඇත්නම් මිස,

ක්‍රියාත්මක නොකළ යුතු ය.

(5) (4) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ කැමැත්ත ලබා දීම ප්‍රතික්ෂේප කිරීමක් සම්බන්ධයෙන් බංකොලොත් භාරකරු අලාභ සඳහා වගකිව යුතු නොවේ.

(6) බංකොලොත් භාවයක් ආරම්භ වීමට පෙර සහ -

(අ) දේපළ මත ඇතිකරනු ලබන බැඳීමක් ; හෝ

(ආ) කුලී නිවැසිභාවය යටතේ අදාළ දේපළේ සන්තකය ලබා ගැනීමට අයිතිකරුට හෝ බදු දීමනාකරුට ඇති අයිතිය,

බලාත්මක කිරීමක් ලෙස නිල දේපළ භාර ගැණුම්කරු, පත්වීම්ලාභියා හෝ වෙනත් තැනැත්තෙකු විසින් සමාගමේ දේපළේ සන්තකය හෝ භාරකාරත්වය ලබා ගැනීම හෝ පාලනය ආරම්භ කිරීම හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් අදාළ බලතල ක්‍රියාත්මක කිරීම කළ හැකි ය:

එසේ වුව ද , (4) වන උපවගන්තියේ සහ 7 වන පරිච්ඡේදයේ විධිවිධාන කිසිවක් මගින් නිල දේපළ භාර ගැණුම්කරු, පත්වීම්ලාභියා හෝ වෙනත් තැනැත්තකු විසින් මේ වගන්තිය යටතේ දේපළට අදාළව බලතල ක්‍රියාත්මක කිරීමෙන් හෝ කර්තව්‍ය ඉටු කිරීමෙන් වළක්වනු නොලැබිය යුතු ය.

(7) (10) වන, (11) වන සහ (12) වන උපවගන්ති යටතේ, ණයහිමියා විසින් ණයකරුට අඛණ්ඩව අත්‍යවශ්‍ය භාණ්ඩ හෝ සේවා සපයා ඇති අවස්ථාවකදී බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් බංකොලොත්භාවයට අදාළ මුදලයෙන් හෝ බංකොලොත්කරුගේ ආදායමෙන් ඉහත කී සැපයුම් සඳහා අදාළ ණයහිමියාට මුදල් ගෙවීමට කටයුතු කළ යුතු ය.

(8) බංකොලොත් ණයකරුගේ යම් භාණ්ඩයක් කිසියම් පුද්ගලයකු විසින් ඇපයක්, උකසක් හෝ වෙනත් සුරැකුමක් ලෙසින් තබාගෙන සිටින අවස්ථාවකදී,

(අ) නිල දේපළ භාර ගැණුම්කරු විසින්, අදාළ තැනැත්තාට ලිඛිත දැන්වීමක් යවා, භාණ්ඩ පරීක්ෂා කිරීමට නිල දේපළ භාර ගැණුම්කරු අදහස් කරන බව, අදාළ තැනැත්තාට දැනුම් දිය යුතු ය; සහ

(ආ) යම් තැනැත්තෙකුට එවැනි ලිඛිත දැනුම්දීමක් ලබාදී ඇති අවස්ථාවක, එම පුද්ගලයා බංකොලොත් භාරකරුට පරීක්ෂා කිරීමට සාධාරණ අවස්ථාවක් ලබාදී නොමැති නම්, එම තැනැත්තාට අධිකරණයේ අවසරයකින් තොරව, ඇපයක්, උකසක් හෝ සුරැකුමක් ලබා ගැනීමට අයිතියක් නැත.

(9) මෙම වගන්තියට පටහැනිව ගනු ලබන ඕනෑම ක්‍රියාවක් ශුන්‍ය සහ බල රහිත විය යුතු ය.

(10) ණයකරුවෙකු සම්බන්ධයෙන් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් ක්‍රියාත්මක වන අතරවාරයේ දී, 34 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) හෝ (ඈ) ඡේද යටතේ නිශ්චිතව දක්වා ඇති වර්ගයේ භාණ්ඩවල සන්තකය ණයකරුට ලබා දෙන්නා වූ යම් කුලී සින්නක්කර ගිවිසුමක් ද ඇතුළු ගිවිසුමක් අවසන් කිරීමට, බදු දෙන්නෙකුට හෝ භාණ්ඩ හිමියකුට -

(අ) ණයකරු විසින් එවැනි ගිවිසුමක් යටතේ හිඟ මුදල් වශයෙන් මාස තුනක ගෙවීම්වලට වඩා වැඩි මුදලක් ගෙවිය යුතු වන නමුත් බංකොලොත්භාවයේ කාලය පුරාවට ණයකරුට අඛණ්ඩව ගෙවීම් සිදු කිරීමට නොහැකි වීමට බොහෝ දුරට ඉඩ ඇති බව අධිකරණය සලකන අවස්ථාවකදී; හෝ

(ආ) එවැනි ගිවිසුමක් අවසන් කිරීමට සහ ගිවිසුමට යටත් භාණ්ඩ සන්තකයට ගැනීමට හෝ වෙනත් ආකාරයකින් අයකර ගැනීමට එවැනි බදු දෙන්නෙකු හෝ හිමිකරුවකු විසින් කරනු ලබන ඉල්ලීමක් ගිවිසුම යටතේ ආපසු ගෙවීම් පැහැර හැරීම හැර වෙනත් හේතු මත පදනම් වන අවස්ථාවකදී,

අධිකරණය විසින් සුවිශේෂී අවසරක් දිය හැකි ය.

(11) ණයකරුවෙකු සම්බන්ධයෙන් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් ක්‍රියාත්මක වන අතර වාරයේ දී අත්‍යවශ්‍ය භාණ්ඩයක් හෝ සේවාවක් සපයන්නකු විසින් -

(අ) බංකොලොත්භාවය ආරම්භ වීමට පෙර කාල සීමාවකට අදාළව භාණ්ඩය හෝ සේවාව සඳහා ගෙවිය යුතු ගාස්තු ගෙවීමට ණයකරු පැහැර හැරීම හේතුවෙන්, ණයකරුට භාණ්ඩ හෝ සේවාව සැපයීම ප්‍රතික්ෂේප කිරීම;

(ආ) බංකොලොත්භාවය ආරම්භ වීමට පෙර කාල සීමාවකට අදාළව භාණ්ඩය හෝ සේවාව සඳහා ගෙවිය යුතු හිඟ ගාස්තු ගෙවීම සිදු කළ යුතු බව; ණයකරුට භාණ්ඩය හෝ සේවාව සැපයීමේ කොන්දේසියක් බවට පත් කිරීම; හෝ

(ඇ) බංකොලොත් භාරකරුගේ පූර්ව ලිඛිත අවසරය ඇතිව හැර, භාණ්ඩය හෝ සේවාව සැපයීම සඳහා ගිවිසුමේ බංකොලොත්භාවයට අදාළ නියම මත රඳා සිටීම,

නොකළ යුතු ය.

(12) බංකොලොත් භාරකරු විසින් බංකොලොත් ණයකරුගේ සහ සමස්තයක් වශයෙන් ණයහිමියන්ගේ අවශ්‍යතා සඳහා බංකොලොත්භාවයට අදාළ කාලසීමාව මත යැපීම සෑහීමකට පත්වන විට (11) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය යටතේ බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් කැමැත්ත ලබා දිය හැකි ය.

(13) (11) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ කැමැත්ත ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සඳහා බංකොලොත්භාවය පිළිබඳ භාරකරු අලාභහානිවලට වගකිව යුතු නොවේ.

ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශය

**94.** (1) බංකොලොත්භාවය ආරම්භවීමෙන් පසුව 83 වන වගන්තිය යටතේ දැනටමත් ප්‍රකාශයක් ගොනු කර ඇත්නම් මිස 33 වන වගන්තියට අනුකූලව ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශයක් ණයකරු විසින් නිල දේපළ භාර ගැනුම්කරු වෙත ගොනු කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රකාශයක් හෝ, නිල දේපළ භාර ගැනුම්කරුගේ මතය අනුව, මේ වගන්තිය හෝ 83 වන වගන්තිය යටතේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රමාණවත් ප්‍රකාශයක් ගොනු කර නොමැති නම්, බංකොලොත්භාවය ආරම්භ වූ පසු නිල දේපළ භාර ගැනුම්කරු විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් පහත දැක්වෙන කරුණු ඇතුළත් ලිඛිත ප්‍රකාශයක් බංකොලොත් ණයකරුට යැවිය යුතු අතර එහි -

(අ) බංකොලොත් ණයකරු විසින් නියම කළ හැකි ආකාරයේ ණයකරුගේ කටයුතු පිළිබඳ ප්‍රකාශයක් ගොනු කළ යුතු බව; සහ

(ආ) ප්‍රකාශය ගොනු කළ යුතු කාලය,

සඳහන් කළ යුතු ය.

(3) නිල දේපළ භාර ගැනුම්කරු විසින් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන පෙත්සමෙහි දක්වා ඇති බංකොලොත් ණයකරුගේ ලිපිනයට හෝ බංකොලොත් ණයකරුගේ අවසන් වරට සඳහන් ලිපිනයට සහ ණයකරුගේ අවසන් විද්‍යුත් තැපැල් ලිපිනයට (තිබේනම්) ලිඛිත දැන්වීම යැවිය යුතු ය.

(4) බංකොලොත් ණයකරු ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශය පහත දැක්වෙන කාල සීමාවලදී බංකොලොත් ණයකරු විසින් නිල දේපළ භාරගැනුම්කරු වෙත ගොනු කළ යුතු ය: -

(අ) බංකොලොත්භාවය ආරම්භ වී දින විසි එකකට කට පසුව; හෝ

(ආ) (2) උපවගන්තිය යටතේ දේපළ භාරගැනුම්කරු ලිඛිත දැන්වීම ලැබීමෙන් පසුව.

(5) දේපළ භාර ගැනුම්කරු වෙත මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශයක් ගොනු කිරීමෙන් පසු ඕනෑම අවස්ථාවක බංකොලොත් ණයකරුට අමතර හෝ සංශෝධිත ප්‍රකාශ හෝ පිළිතුරු ගොනු කළ හැකි ය.

සුවිශේෂ අවස්ථාවන්හි දී ණය හිමියන් හමුවීම

**95.** (1) දේපළ භාර ගැනුම්කරු බංකොලොත් භාවය ආරම්භ වූ පසු, බංකොලොත් ණයකරුගේ ණයහිමියන්ගේ රැස්වීමක් -

(අ) පරීක්ෂණයේ ණයහිමියන්ට බෙදා හැරීම සඳහා ලබා ගත හැකි වත්කම්වල සුවිශේෂී ඉහළ අගය හේතුවෙන්; හෝ

(ආ) සමානුපාතික සහ සාධාරණ විසඳුමක් සඳහා සේවය කරනු ඇති බව අදහස් වන වෙනත් සුවිශේෂී තත්ත්වයන් පැවතීම හේතුවෙන්,

දේපළ භාර ගැනුම්කරු විසින් එසේ කිරීම අවශ්‍ය යැයි සලකන්නේ නම්, කැඳවිය යුතු ය.

(2) දේපළ භාර ගැණුම්කරු ණයහිමියන්ගේ රැස්වීමක් කැඳවීමට තීරණය කරන්නේ නම්, බංකොළොත්භාවය ආරම්භ වීමෙන් පසු ප්‍රායෝගිකව හැකි ඉක්මනින් රැස්වීම කැඳවිය යුතු අතර, විශේෂ අවස්ථා තිබේනම්, ඉන් දින තිස් පහකට නොඅඩු කාලයකට පසුව, වේලාව පිළිබඳ ලිඛිත දැනුම්දීමක් යැවීමෙන් සහ රැස්වීම පැවැත්වෙන ස්ථානය පිළිබඳව -

(අ) ණයකරුගේ, අවසන් භෞතික හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට;

(ආ) ණයකරුගේ මූල්‍ය කටයුතු ප්‍රකාශයේ නම් කර ඇති එක් එක් ණයහිමියාට, මූල්‍ය කටයුතු ප්‍රකාශයේ දක්වා ඇති භෞතික හා විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ , ණයහිමියාගේ ලිපිනය යැයි දේපළ භාර ගැනුම්කරු විශ්වාස කරන වෙනත් ඕනෑම ලිපිනයකට; සහ

(ඇ) දේපළ භාර ගැනුම්කරු දන්නා වෙනත් ඕනෑම ණයහිමියකුට,

එම ලිඛිත දැන්වීම යැවීමෙන් කැඳවිය යුතු ය.

(3) යම් ණයහිමියන්ගේ රැස්වීමක් කැඳවීමට, පැවැත්වීමට සහ එහි කටයුතුවලට V වන උපලේඛනය අදාළ විය යුතු ය.

(4) නිල දේපළ භාර ගැනුම්කරු ණයහිමියන්ගේ පළමු රැස්වීමෙන් පසු ණයහිමියන්ගේ ඊළඟ රැස්වීම් කැඳවිය හැකි ය.

(5) තම ණය තහවුරු කර ඇති ණයහිමියන්ගේ සංඛ්‍යාවෙන් සහ වටිනාකමෙන් හතරෙන් එකකින් එසේ කිරීමට අවශ්‍ය නම් දේපළ භාර ගැනුම්කරු රැස්වීමක් කැඳවිය යුතු ය.

(6) ණයහිමියන්ගේ රැස්වීමක් සහ රැස්වීමේ දී සම්මත කරන ලද යෝජනා සමහර ණයහිමියන්ට රැස්වීමේ ලිඛිත දැනුම්දීම නොලැබුණත්, අධිකරණය වෙනත් ආකාරයකින් ආඥා නොකළහොත් වලංගු වේ.

විශේෂ අවස්ථාවලදී බංකොලොත් වීම පිළිබඳ මහජන පරීක්ෂාව

**96.** (1) බංකොලොත් ආඥාවක් ලබාදී ඇති අවස්ථාවක, නිල දේපළ භාර ගැනුම්කරු හෝ බංකොලොත් භාරකරු විසින් බංකොලොත් ණයකරු නිදහස් කිරීමට පෙර ඕනෑම වේලාවක බංකොලොත් ණයකරුගේ ප්‍රසිද්ධ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා, ණයහිමියන්ට බෙදා හැරීම සඳහා ලබා ගත හැකි වත්කම්වල සුවිශේෂී ඉහළ වටිනාකම හේතු කොටගෙන එසේ කිරීම අවශ්‍ය වන බවට නිල දේපල භාරගැනුම්කරු හෝ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ අදහස වන විට සහ: -

(අ) ප්‍රසිද්ධියේ ප්‍රශ්න කළ යුතු, ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශයේ දෝෂයක් තිබීම; හෝ

(ආ) බංකොලොත් ණයකරු 32, 94, 112 ,113 සහ 114 යන වගන්ති යටතේ හෝ මේ පනතේ වෙනත් විධිවිධාන යටතේ ණයකරුගේ නියෝජනවලට අනුකූලව කිරීමට ණයකරු අපොහොසත් වී තිබීම,

මත අධිකරණය වෙත ඉල්ලුම් කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඇති ඉල්ලීමක් මත, බංකොලොත් ණයකරු පිළිබඳ ප්‍රසිද්ධ විභාගයක් අධිකරණය විසින් පත් කරන ලද දිනකදී පැවැත්විය යුතු බවට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු අතර, බංකොලොත් ණයකරු එදිනට පැමිණිය යුතු අතර ඔහුගේ කටයුතු, ගනුදෙනු සහ දේපළ පිළිබඳව ප්‍රසිද්ධියේ පරීක්ෂා කළ යුතු ය.

(3) පහත සඳහන් අය බංකොලොත් ණයකරුගේ ප්‍රසිද්ධ විභාගයට සහභාගි විය හැකි අතර තමාගේ කටයුතු, ගනුදෙනු සහ දේපළ සම්බන්ධයෙන් ප්‍රශ්න කළ හැකි ය, එනම්-

(අ) නිල දේපළ භාර ගැණුම්කරු;

(ආ) බංකොලොත් භාරකරු, (බංකොලොත් භාරකරුගේ පත්වීම බලාත්මක වී ඇත්නම් ; සහ

(ඇ) බංකොලොත්භාවය පිළිබඳ සාක්ෂියක් ඉදිරිපත් කර ඇති බංකොලොත් පුද්ගලයාගේ යම් ණයහිමියෙක්.

(4) සාධාරණ නිදහසට කරුණක් නොමැතිව බංකොලොත් ණයකරුවෙකු මෙම වගන්තිය යටතේ ඔහුගේ ප්‍රසිද්ධ විභාගයට සහභාගීවීමට කිසියම් අවස්ථාවක අසමත් වුවහොත්, එම පුද්ගලයා සහ ඔහු සන්තකයේ ඇති යම් දෙයක් අධිකරණය ඉදිරියට ගෙන ඒම සඳහා අධිකරණය විසින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් වරෙන්තුවක් ඉදිරිපත් කළ හැකි ය:-

(අ) බංකොලොත් ණයකරු අත්අඩංගුවට ගැනීම සඳහා; සහ

(ආ) බංකොලොත් ණයකරු සන්තකයේ ඇති ඕනෑම පොත්, කඩදාසි, වාර්තා, මුදල් හෝ භාණ්ඩ තහනමට ගැනීම සඳහා.

(5) (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද වරෙන්තුවක් යටතේ අත්අඩංගුවට ගත් බංකොලොත් ණයකරු අත්අඩංගුවේ තබා ගැනීමටත්, එවැනි වරෙන්තුවක් යටතේ අල්ලා ගන්නා ඕනෑම දෙයක් වරෙන්තුව යටතේ අධිකරණයට ඉදිරිපත් කරන තෙක් රඳවා තබා ගැනීමටත් අධිකරණයට අවසර දිය හැකි ය.

(6) මෙම වගන්තිය යටතේ, නිල දේපළ භාර ගැනුම්කරු හෝ බංකොලොත් භාරකරුගේ ඉල්ලීම මත අධිකරණයට එය ඉදිරියේ පෙනී සිටින ලෙසට පහත දැක්වෙන තැනැත්තන් කැඳවිය හැකි ය;

(අ) බංකොලොත් ණයකරුගේ කලත්‍රයා, පෙර කලත්‍රයා හෝ කලින් කලත්‍රයා ;

(ආ) තම සන්තකයේ ඇති බංකොලොත් බූදලයේ යම් දේපළක් ඇති බව දන්නා හෝ විශ්වාස කරන ඕනෑ යම් තැනැත්තකු;

(ඇ) බංකොලොත් ණයකරුට ණයගැති යැයි දන්නා හෝ විශ්වාස කරන ඕනෑ යම් තැනැත්තෙක්; සහ

(ඈ) නීති උපදෙස්, වරප්‍රසාද හෝ නඩු පැවරීමේ වරප්‍රසාදයට යටත් ව බංකොලොත් ණයකරු හෝ බංකොලොත් ණයකරුගේ ගනුදෙනු, කටයුතු හෝ දේපළ පිළිබඳ තොරතුරු ලබා දීමට හැකි වන පරිදි අධිකරණයේ පෙනී සිටින යම් තැනැත්තෙක්.

(7) (6) වන උපවගන්තිය යටතේ තැනැත්තකුට පෙනී සිටින ලෙස අධිකරණය විසින් සිතාසි නිකුත් කර ඇති අවස්ථාවක, එම තැනැත්තා බංකොලොත් ණයකරුවකුනම් මෙම වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(8) මෙම වගන්තිය යටතේ ලබා ගන්නා ලද කිසියම් සාක්ෂියක් සලකා බැලීමෙන් පසු, ඕනෑම පුද්ගලයකුට බංකොලොත් බූදලයෙන් සමන්විත කිසියම් දේපළක් ඔහු සන්තකයේ ඇති බවට අධිකරණයට පෙනී යන අවස්ථාවකදී, නිල දේපළ භාර ගැනුම්කරුගේ හෝ බංකොලොත් භාරකරුගේ ඉල්ලීම මත එකී තැනැත්තාට එම දේපළ නිල දේපළ භාර ගැනුම්කරුගේ හෝ බංකොලොත් භාරකරුට අධිකරණය විසින් සුදුසු යැයි සලකන වේලාවකදී සහ එවැනි ආකාරයෙන් සහ අධිකරණය සුදුසු යැයි සලකන කොන්දේසි මත ලබා දෙන ලෙසට අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(9) යම් තැනැත්තකු බංකොලොත් ණයකරුට ණය බව මෙම වගන්තිය යටතේ ලබා ගන්නා ලද කිසියම් සාක්ෂියක් සලකා බැලීමෙන් අධිකරණය සලකන අවස්ථාවක, නිල දේපළ භාර ගැනුම්කරුගේ හෝ බංකොලොත් භාරකරුගේ ඉල්ලීම මත අධිකරණය විසින් එම තැනැත්තාට, නිල දේපළ භාර ගැනුම්කරු හෝ බංකොලොත් භාරකරුට අධිකරණය සුදුසු යැයි සලකන වේලාවක, ආකාරයෙන්, සහ කොන්දේසි මත, ගෙවිය යුතු මුදලෙන් සම්පූර්ණ හෝ ඉන් යම් කොටසක් නිල දේපළ භාර ගැනුම්කරුට හෝ බංකොලොත් භාරකරුට ගෙවන ලෙසට නියම කරනු ලැබිය හැකි ය.

### 3 වන පරිච්ඡේදය

### නිල දේපළ භාර ගැණුම්කරු සහ බංකොලොත් භාරකරු පත් කිරීම

නිල දේපළ භාර ගැනුම්කරු බංකොලොත් භාරකරු බවට පත්වීම

**97.** (1) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කිරීමේ දී, (2) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් වෙනත් පුද්ගලයකු පත් කරන්නේ නම් මිස, නිල දේපළ භාර ගැනුම්කරු (මෙහි මින් මතු "බංකොලොත් භාරකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) බංකොලොත් ණයකරුගේ දේපළ භාරකරු බවට පත් වන්නේ ය.

(2) බංකොලොත්භාවය පිළිබඳ ආඥාව නිකුත් කරන විට, IV වන කොටස යටතේ ණයකරු සම්බන්ධයෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙලෙහි පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවෙකු සිටී නම්, බංකොලොත්භාවය පිළිබඳ ආඥාව නිකුත් කිරීම මත, අධිකරණය විසින් පුද්ගලිකව වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු බංකොලොත් භාරකරු ලෙස පත් කරනු ලැබිය හැකි ය.

(3) තැනැත්තකු මෙම වගන්තිය යටතේ බංකොලොත් භාරකරු බවට පත් වූ විට, තැනැත්තා බංකොලොත් ණයකරුගේ ණයහිමියන්ට එම කාරණය ලිඛිතව දැනුම් දිය යුතු ය. හෝ, අධිකරණය එසේ ඉඩ දෙන්නේ නම්, අධිකරණයේ උපදෙස් අනුව ඒ බව ප්‍රසිද්ධ දැන්වීමකින් ප්‍රචාරය කළ යුතු ය.

භාරකරුවන් පත් කිරීම

**98.** (1) බංකොලොත් භාරකරු ලෙස නිල දේපළ භාර ගැනුම්කරු හැර, වෙනත් සුදුසු තැනැත්තකු ණයහිමියන්ගේ බහුතරයකගේ යෝජනාවක් මගින් පත් කිරීමට ණයහිමියන්ට හැකි විය යුතු ය.

(2) එම තැනැත්තා -

(අ) විෂමාචාරය හෝ රාජකාරිය නොසලකා හැරීම සම්බන්ධයෙන් බංකොලොත් භාරකාර කාර්යාලයෙන් මීට පෙර ඉවත් කර නොමැති අයකු නම්;

(ආ) බංකොලොත්භාවය ආරම්භ වූ දිනට පෙර වසර දෙකක කාලසීමාව තුළ ණයකරුගේ ණයහිමියකු නොවූ තැනැත්තකු නම්;

(ඇ) බංකොලොත්භාවය සම්බන්ධයෙන් ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කිරීමට සහ ක්‍රියා කිරීමට 12 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබා ඇති තැනැත්තකු නම්;

(ඈ) බංකොලොත්භාවය සම්බන්ධයෙන් ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කිරීමට සහ ක්‍රියා කිරීමට 12 වන වගන්තිය යටතේ එකී තැනැත්තා සුදුසුකම් ලබා ඇති බව ලිඛිතව සහතික කර ඇත්නම්; සහ

(ඉ) බංකොලොත් භාරකරුවෙකු ලෙස පත් කිරීම සඳහා ලිඛිතව කැමැත්ත පළ කර ඇති අතර පත් කරන අවස්ථාවේ දී කැමැත්ත ඉල්ලා අස්කර ගෙන නොමැතිනම්,

එම තැනැත්තා බංකොලොත් භාරකරු ලෙස කටයුතු කිරීමට සුදුසු යැයි සලකනු ලැබිය යුතු ය.

(3) බංකොලොත් ණයකරුගේ ණයහිමියා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත, අධිකරණය විසින් පහත දැක්වෙන පරිදි සලකනු බලන්නේ නම් මිස, එනම් -

(අ) ණයහිමියන් ඡන්දය දුන් බහුතරයක් විසින් පත් කිරීම සිදු කර නැති බව;

(ආ) පත් කරන ලද තැනැත්තා (2) උපවගන්තියට අනුව භාරකරු ලෙස කටයුතු කිරීමට සුදුසු නැති බව ; හෝ

(ඇ) තැනැත්තා සහ බංකොලොත් ණයකරු, බංකොලොත් ණයකරුගේ දේපළ හෝ ණයහිමියා අතර ඇති සම්බන්ධය නිසා තැනැත්තාට අපක්ෂපාතීව කටයුතු කිරීම සහ බංකොලොත්භාවය පිළිබඳ ක්‍රියාවලියේ ඉලක්ක ඉදිරියට ගෙන යාම දුෂ්කර බව,

අධිකරණයට පෙනී යන්නේ නම් මිස බංකොලොත් භාරකරුගේ පත් කිරීම අධිකරණය විසින් තහවුරු කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ තැනැත්තකු බංකොලොත් භාරකරු ලෙස පත් කිරීම සඳහා වන අයදුම්පතක් අනුමත කිරීමේ දී, මෙම පුද්ගලයාගේ පත්වීම තහවුරු කරන සහතිකයක් අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) බංකොලොත් භාරකරුවකු පත් කිරීම, සහතිකයේ දින සිට බලාත්මක විය යුතු ය.

(6) (2) වන උපවගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල අවශ්‍යතා කිසිවක් සපුරා නොමැති බව දනිමින් එම, තැනැත්තාගේ

කැමැත්ත ඇතිව, බංකොලොත් භාරකරුවෙකු ලෙස පත් කරන ලද හෝ ක්‍රියාකරන තැනැත්තකු, වරදකට වරදකරු වනු ඇත.

භාරකරු ඉවත් කිරීම සහ ධුරය අත්හැරීම

**99.** (1) මෙම වගන්තිය යටතේ, බංකොලොත් භාරකරු ලෙස පත් කර ඇති නිල දේපළ භාර ගැනුම්කරු හැර, වෙනත් අයකු එම තනතුරෙන් ඉවත් කළ හැකි ය.

(2) බංකොලොත් භාරකරුවෙකු ඉවත් කළ හැක්කේ -

(අ) අධිකරණයේ ආඥාවක් මගින්; හෝ

(ආ) භාරකරුවෙකු ඉවත් කිරීම සඳහා විශේෂයෙන් කැඳවන ලද රැස්වීමක දී ණයහිමියන්ගේ බහුතරයකගේ විසින් සම්මත කරන ලද යෝජනා සම්මතයක් මගින්,

පමණි.

(3) බංකොලොත් ණයකරුගේ ණයහිමියන් බංකොලොත් භාරකරුවෙකු ඉවත් කිරීමට තීරණය කරන විට, 98 වන වගන්තිය අනුව, ඔහු විසින් භාරකරු ලෙස ඔහුගේ තනතුරට වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ බංකොලොත් භාරකරුවෙකු ඉවත් කිරීමේ තීරණය ගනු ලැබුවහොත්, බංකොලොත් ණයකරුගේ ණයහිමියන් විසින් ඔහු වෙනුවට, වෙනත් තැනැත්තකු භාරකරු ලෙස පත් කරන තෙක් තීරණය බලාත්මක නොවන්නේ ය.

(5) නිල දේපළ භාර ගැනුම්කරු නොවන බංකොලොත් භාරකරුවකු -

(අ) 98 වන වගන්තිය අනුව සුදුසු පුද්ගලයෙකු වීම අවසන් වුවහොත්; හෝ

(ආ) නියම කරනු ලැබිය හැකි සුදුසුකම් සපුරාලීම අවසන් වුවහොත්,

එම තැනැත්තා බංකොලොත් භාරකරු ධුරයෙන් ඉවත් විය යුතු ය.

(6) බංකොලොත් ණයකරුවෙකු, ණයහිමියකු හෝ නිල දේපළ භාර ගැනුම්කරු විසින් කරන ලද ඉල්ලීමක් මත, විෂමාචාර ක්‍රියාවක් හෝ කාර්යභාරය අතපසු කිරීම සම්බන්ධයෙන්, අධිකරණය විසින් භාරකරුවෙකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) බංකොලොත් භාරකරු විසින් අධිකරණයට සහ නිල දේපළ භාර ගැනුම්කරුට ඔහුගේ ඉල්ලා අස්වීම පිළිබඳ ව ලිඛිතව දැනුම් දීමෙන් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(8) බංකොලොත් ආඥාව අවලංගු කළහොත් බංකොලොත් භාරකරු ධුරය අත්හැර යා යුතු ය.

(9) බංකොලොත් භාරකරු ධුරය හිස් වූ විට නිල දේපළ භාර ගැනුම්කරු බංකොලොත් භාරකරු ලෙස වැඩ බැලිය යුතු ය.

භාරකරු නිදහස් කිරීම

**100.** (1) නිල දේපළ භාර ගැනුම්කරු බංකොලොත් භාරකරු වීම නතර කර ඇති අවස්ථාවක සහ ඔහු වෙනුවට තැනැත්තකු පත් කරනු ලැබුවහොත්, අධිකරණය විසින් 98 වගන්තිය යටතේ බංකොලොත් භාරකරු පත්කිරීමේ සහතිකයක් නිකුත් කරන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිල දේපළ භාර ගැනුම්කරුට නිදහස් වීමක් ලබාගත හැකි විය යුතු ය.

(2) නිල දේපළ භාර ගැනුම්කරු භාරකරු වශයෙන් සිටියදී, ඔහු විසින් බංකොලොත් බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරණය එහි ප්‍රායෝගික ඉලක්ක සම්බන්ධයෙන් සම්පූර්ණ කර ඇති බවට අධිකරණයට ලිඛිත දැනුම් දීමක් කරන්නේ නම්, නිල දේපළ භාර ගැනුම්කරුව අධිකරණය විසින් තීරණය කළ හැකි කාලයක සිට ක්‍රියාත්මක වන පරිදි නිදහස් කරනු ලැබිය යුතු ය.

(3) බංකොලොත් භාරකරු ලෙස කටයුතු කිරීම නතර කර ඇති, නිල දේපළ භාර ගැනුම්කරු හැර වෙනත් යම් තැනැත්තකුට පහත සඳහන් වේලාවේ සිට බලපැවැත්වෙන පරිදි ධුරයේ කටයුතු වලින් නිදහස් විය යුතු ය:

(අ) අදාළ තැනැත්තා මිය ගොස් ඇති අවස්ථාවකදී, එම පුද්ගලයා ධුරය දැරීම අවසන් වී ඇති බවට අධිකරණයට සහ නිල දේපළ භාරගැනුම්කරු ලිඛිත දැනුම් දීමක් කරන අවස්ථාවේ සිට;

(ආ) පහත සඳහන් අවස්ථාවලදී, එම පුද්ගලයා ධුරය දැරීම අවසන් කර ඇති බවට අධිකරණයට සහ නිල දේපළ භාර ගැනුම්කරුට ලිඛිත දැනුම්දීමක් ලබා දුන් දින සිට දින විසි අටකට පසුව, එනම් -

(i) 99 වන වගන්තිය යටතේ බංකොලොත් ණයහිමියන්ගේ තීරණයක් මගින් තැනැත්තා තනතුරෙන් ඉවත් කර ඇති අතර ණයහිමියන් ඔහු නිදහස් කිරීමට එරෙහිව තීරණය කර නැත්නම්; හෝ

(ii) තැනැත්තා 99 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ ඉල්ලා අස්වී ඇත්නම්;

(ඇ) තැනැත්තා විසින් කරන ලද ඉල්ලීමක් මත අධිකරණය විසින් තීරණය කළ හැකි පහත සඳහන් අවස්ථාවලදී:-

(i) බංකොලොත් ණයහිමියන්ගේ තීරණයක් මගින් පුද්ගලයා තනතුරෙන් ඉවත් කර ඇති අතර ණයහිමියන් ඔහු නිදහස් කිරීමට එරෙහිව තීරණය කර ඇති අවස්ථාවක;

(ii) තැනැත්තා 99 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් වී ඇති අවස්ථාවක; හෝ

(iii) අධිකරණය විසින් එම තැනැත්තා තනතුරෙන් ඉවත් කර ඇති අවස්ථාවක.

(4) බංකොලොත් ණයකරුගේ ණයහිමියන්ගේ තීරණයක් මගින් තැනැත්තා තනතුරෙන් ඉවත් කරනු ලැබුවහොත්, එම තැනැත්තාව නිදහස් කළ යුතුද යන්න පිළිබඳව ණයහිමියන්ගේ බහුතරයකගේ යෝජනාවක් මගින් තීරණය කළ යුතු ය.

(5) බංකොලොත් භාවය පිළිබඳ ආඥාවක් අවලංගු කරන අවස්ථාවේ දී අධිකරණය විසින් තීරණය කළ හැකි කාලයක සිට බලපැවැත්වෙන පරිදි බංකොලොත් භාරකරුව නිදහස් කර ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

(6) මෙම වගන්තිය යටතේ නිල දේපළ භාර ගැනුම්කරු හෝ බංකොලොත් භාරකරු නිදහස් කර ඇති අවස්ථාවක, නිල දේපළ භාර ගැනුම්කරු හෝ බංකොලොත් භාරකරු, මෙම වගන්තියේ පෙර විධිවිධානවල නිශ්චිතව දක්වා ඇති වේලාවේ සිට, සියලු වගකීම්වලින් නිදහස් කළ යුතු ය.

## 4 වන පරිච්ඡේදය

### බංකොලොත් භාරකරුගේ කාර්යයන් සහ කර්තව්‍ය

බංකොලොත් භාරකරුගේ පොදු කර්තව්‍ය සහ නිල නාමය

**101.** (1) “බංකොලොත් භාරකරු” යනු බංකොලොත් භාවයට පත්වූ බූදලයේ භාරකරු වන අතර, ඔහුට මෙම වගන්තියේ සහ මෙම පනතේ වෙනත් විධිවිධානවල දක්වා ඇති විස්තර, කර්තව්‍ය, කාර්ය සහ බලතල තිබිය යුතු ය.

(2) පහත දැක්වෙන අවස්ථාවල දී වන බංකොලොත්භාවය සම්බන්ධයෙන් මෙම පරිච්ඡේදය අදාළ වේ :-

(අ) බංකොලොත් භාරකරු ලෙස තැනැත්තකු පත් කිරීම බලාත්මක වන අවස්ථාවකදී; හෝ

(ආ) නිල දේපළ භාර ගැනුම්කරු බංකොලොත් භාරකරු බවට පත් අවස්ථාවකදී.

(3) බංකොලොත් භාරකරුගේ කර්තව්‍ය වනුයේ මේ කොටසෙහි පහත දැක්වෙන විධිවිධානවලට අනුකූලව බංකොලොත් බූදලයට ප්‍රවේශ වීම, උපලබ්ධිය සහ බෙදා හැරීමයි, එම කර්තව්‍ය ඉටු කිරීමේ දී සහ බංකොලොත් බූදලය කළමනාකරණය කිරීමේ දී, බංකොලොත් භාරකරුට එම විධිවිධානවලට යටත්ව, ඔහුගේ අභිමතය පරිදි කටයුතු කිරීමට හිමිකම් ඇත.

(4) බංකොලොත් භාරකරුගේ කාර්ය වන්නේ, එම භාරකරු නිල දේපළ භාර ගැනුම්කරු නොවන්නේනම් බංකොලොත්භාවය සම්බන්ධයෙන් තම කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමට නිල දේපළ භාර ගැනුම්කරුට අවශ්‍ය වන -

(අ) තොරතුරු නිල දේපළ භාර ගැනුම්කරුට ඉදිරිපත් කිරීම;

(ආ) පොත්පත්, පුවත් පත් සහ වෙනත් වාර්තා නිල දේපළ භාර ගැනුම්කරු වෙත ඉදිරිපත් කර, ඒවා පරීක්ෂා කිරීමට අවසර දීම; සහ

(ඇ) වෙනත් සහය නිල දේපළ භාර ගැනුම්කරුට ලබා දීම,

වේ.

(5) බංකොලොත් භාරකරුවෙකුගේ නිල නාමය "බංකොලොත් ණයකරුට ණය ඇතුළත් කරන්නන්ගේ දේපළෙහි බංකොලොත් භාරකරු" විය යුතු අතර, එම නමින් බංකොලොත් භාරකරුට ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ වෙනත් ස්ථානයක-

(අ) සෑම විස්තරයකටම අයත් දේපළ දරා සිටීමට;

(ආ) ගිවිසුම්වලට ඇතුළුවීමට;

(ඇ) නඩු පැවරීමට සහ නඩු පවරනු ලැබීමට;

(ඈ) තමාට හෝ තමාට සහ තනතුරේ සිටින ඔහුගේ අනුප්‍රාප්තිකයින්ට බැඳී සිටින යම් කටයුත්තකට ඇතුළත් වීමට; සහ

(ඉ) ඔහුගේ ධුරයේ කටයුතු කිරීමේ දී අවශ්‍ය හෝ යෝග්‍ය වන සියලුම ක්‍රියා කිරීමට,

හැකිය.

බංකොලොත් භාරකරුගේ බලතල

**102.** (1) බංකොලොත් භාරකරුට පහත දක්වා ඇති යම් බලතල ක්‍රියාත්මක කළ හැකි ය:-

(අ) යම් නීති පැනවීමක් මගින් හෝ යටතේ පනවා ඇති යම් නියමයක් උල්ලංඝනය කිරීමෙන් තොරව ස්වකීය අර්ථලාභියා ඇවර කිරීම සඳහා අවශ්‍ය වන තාක්දුරට සහ බංකොලොත්

හාරකරුට එසේ ක්‍රියා කිරීමට හැකිවන තාක් දුරට බංකොලොත් භාරකරුට බංකොලොත් ණයකරුගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම සඳහා වූ බලය;

(ආ) බංකොලොත් බූදලය සංයුක්ත වන දේපළකට අදාළ නඩුවක් හෝ නීති කෘත්‍යයක් ඉදිරිපත් කිරීමට, පැවරීමට හෝ විත්තිවාචිකයක් ඉදිරිපත් කිරීමට ඇති බලය;

(ඇ) ණයහිමියන්ගේ කමිටුව හෝ අධිකරණය විසින් ඇප සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයකින් යෝග්‍ය බවට සලකන නියමයන්ට යටත්ව අනාගත දිනයකදී ගෙවිය යුතු මුදලක් වශයෙන් බංකොලොත් බූදලය සංයුක්ත වන දේපළක් විකිණීම සඳහා වූ ප්‍රතිෂ්ඨාව වශයෙන් මුදල් භාර ගැනීමේ බලය;

(ඈ) බංකොලොත් ණයකරුගේ ණය ගෙවීම සඳහා මුදල් රැස්කිරීමේ අරමුණින් යුතුව බංකොලොත් බූදලය සංයුක්ත වන දේපළෙහි කොටසක් උකස් කිරීමට හෝ ඔඩපනය කිරීමට ඇති බලය;

(ඉ) යම් අයිතිවාසිකමක්, විකල්ප තේරීමක් හෝ වෙනත් බලයක් බංකොලොත් බූදලයේ කොටසක් සංයුක්ත වන අවස්ථාවක දී, ණයහිමියන්ගේ ප්‍රතිලාභය වෙනුවෙන්, එම අයිතිවාසිකමේ, විකල්ප තේරීමේ හෝ බලයෙහි විෂය වන්නා වූ යම් දේපළක් ලබා ගැනීමේ අරමුණින් යුතුව ගෙවීම් කිරීම හෝ වගකීම් දැරීම සඳහා වූ බලය;

(ඊ) බංකොලොත්භාවයක දී ඔප්පු කළ හැකි ණය සම්බන්ධයෙන් ණයහිමියන් හෝ ණය හිමියන් බවට හිමිකම්පාන තැනැත්තන් සමඟ ඇතුළත්වීමට අවශ්‍ය බවට සලකනු ලබන යම් සම්මුතියක් හෝ වෙනත් වැඩපිළිවෙළක් සකස් කිරීම සඳහා වූ බලය;

(උ) යම් තැනැත්තකු විසින් බංකොලොත් භාරකරු සම්බන්ධයෙන් ඇති කරනු ලබන හෝ ඇති කිරීමට හැකියාව ඇති බංකොලොත් බූදලයක් තුළින් උපචිතවන හෝ බංකොලොත් බූදලයකට ආනුෂංගික වන යම් හිමිකම්පෑමක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට සලකනු ලබන යම් සම්මුතියක් හෝ වෙනත් වැඩපිළිවෙළක් සකස් කිරීම සඳහා වූ බලය;

(ඌ) යම් ව්‍යාපාරයක කීර්ති නාමය සහ පොත් ණය ඇතුළු බංකොලොත් දේපළ තත්කාලයේ දී සංයුක්ත වන දේපළෙහි කොටසක් විකිණීම සඳහා වූ බලය;

(එ) බංකොලොත් ණයකරු සහ බංකොලොත් ණයකරුට කිසියම් වගකීමක් දරා ඇති පුද්ගලයකු අතර පවතින හෝ පවතිනු ඇතැයි සිතිය හැකි ඕනෑම ණය, හිමිකම් හෝ වගකීම්, එකඟ විය හැකි කොන්දේසි මත බේරුම්කරණය වෙත යොමු කිරීම හෝ සම්මුතියකට යොමු කිරීම සඳහා වූ බලය;

(ඒ) බංකොලොත් භාරකරු විසින් යම් තැනැත්තකුට ලබාදෙන හෝ ලබාදීමේ හැකියාව පවතින බංකොලොත් බූදලය තුළින් හෝ එයට ආනුෂංගිකව උපචිත වන යම් හිමිකම්පෑමක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට සලකනු ලබන සම්මුතියක් හෝ වෙනත් යම් වැඩපිළිවෙළක් සකස් කිරීම සඳහා වූ බලය;

(ඔ) මුදල් ගෙවීම අදාළ වීම සම්බන්ධයෙන් වූ සියලු වගකීම්වලින් මුදල් ගෙවන තැනැත්තා නිසි ලෙස මුදාහරිනු ලබන රිසිට්පත් වන්නා වූ බංකොලොත් භාරකරු විසින් ලබා ගන්නා මුදල් සම්බන්ධයෙන් රිසිට්පත් ලබා දීම සඳහා වූ බලය;

(ඕ) ස්වකීය බූදලය සංයුක්ත වන බංකොලොත් ණයකරුට ලැබිය යුතු ණය සම්බන්ධයෙන්

වූ ලාභාංශයක් ඔප්පු කිරීම, ශ්‍රේණිගත කිරීම, හිමිකම්පෑම සහ ලාභාංශයක් ලබා ගැනීම සඳහා වූ බලය; සහ

(ක) බංකොලොත් බූදලය සංයුක්ත වන යම් දේපළකට අදාළ බලතල ක්‍රියාත්මක කිරීමේ සහ මේ පනතේ මේ කොටස යටතේ බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ හැකියාව සම්බන්ධයෙන් වූ බලය.

(2) බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට මේ කොටස යටතේ ඔහුගේ යම් බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා හෝ ඒ සම්බන්ධයෙන්, ඔහුගේ නිල නාමයෙන්-

(අ) සෑම විස්තරයකම වූ දේපළ දැරීම;

(ආ) ගිවිසුම් ඇති කර ගැනීම;

(ඇ) ඔහු විසින් නඩු පැවරීම සහ ඔහුට එදිරිව නඩු පවරනු ලැබීම;

(ඈ) තමා කෙරෙහි සහ බංකොලොත් බූදලය සම්බන්ධයෙන්, ඔහුගේ අනුප්‍රාප්තික ධුරදරන්නන් මත බැඳීමක් ඇති කරනු ලබන ගිවිසුම් වලට ඇතුළු වීම;

(ඉ) නියෝජිතයකු සේවයේ යෙදවීම;

(ඊ) යම් ඇටෝනි බලයක්, ඔප්පුවක් හෝ වෙනත් සාධන පත්‍රයක් ක්‍රියාත්මක කිරීම,

කළ හැකි අතර එකී භාරකරු, එම බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා හෝ ඊට අදාළව අවශ්‍ය හෝ සුදුසු වෙනත් යම් ක්‍රියාවක් කළ හැකි ය.

නිල දේපළ භාරකරු බංකොලොත් භාවය පිළිබඳ භාරකරු නොවන අවස්ථාවලදී ණයහිමියන්ගේ කමිටුව

**103.** (1) (2) වන සහ (3) වන උපවගන්තිවලට යටත්ව, බංකොලොත් ණයකරුගේ ණයහිමියන්, නියම කරනු ලැබිය හැකි යම් කාර්යපටිපාටියකට අනුව, මෙම පනත මගින් හෝ ඒ යටතේ එය වෙත පවරා ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා (මින්මතු “ණයහිමියන්ගේ කමිටුව” ලෙස සඳහන් කරනු ලබන) කමිටුවක් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) බංකොලොත් ණයකරුගේ ණයහිමියන් විසින්, නිල දේපළ භාරගැනුම්කරු බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වන ඕනෑම අවස්ථාවකදී, එවැනි කමිටුවක් ස්ථාපිත කිරීම හෝ එවැනි කමිටුවකට යම් කාර්යයක් පැවරීම නොකළ යුතු ය.

(3) ණයහිමියන්ගේ කමිටුවක් සම්බන්ධයෙන් පහත සඳහන් කාරණා, නියම කරනු ලැබිය හැකි යම් අවශ්‍යතා වලට, සීමා කිරීම් වලට සහ සීමාවන්ට යටත් විය යුතු ය :-

(අ) කමිටුවේ සාමාජිකත්වය සහ සාමාජිකත්වය අවසන් කිරීම;

(ආ) කමිටුව පිහිටුවීම සහ කමිටුවට අදාළ කාරණා පිළිබඳ දැන්වීම;

(ඇ) කමිටුවේ රැස්වීම් කැඳවීමේ කාර්යපටිපාටිය;

(ඈ) කමිටුවේ සාමාජිකයන් විසින් සිදු කරන ලද හෝ ගනු ලබන ක්‍රියා, මඟහැරීම් හෝ තීරණ සඳහා රැකවරණය ;

(ඉ) කමිටුවේ සාමාජිකයින්ගේ වියදම් ප්‍රතිපූර්ණය කිරීම; සහ

(ඊ) කමිටුවේ සාමාජිකයන් සහ ඔවුන්ගේ සම්බාධික පාර්ශ්ව වල ගනුදෙනු.

බංකොලොත් භාවය පිළිබඳ භාරකරුගේ ක්‍රියාව පිළිබඳ අධිකරණ සමාලෝචනය

**104**. (1) බංකොලොත් ණයකරු සහ ණයකරුගේ යම් ණයහිමියන් ඇතුළු යම් තැනැත්තකු බංකොලොත්භාවය පිළිබඳ භාරකරුවෙකුගේ ක්‍රියාවක්, මඟහැරීමක් හෝ තීරණයක් මගින් අතෘප්තියට පත් වන්නේ නම්, එම තැනැත්තා විසින් අධිකරණයට ඉල්ලීමක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් මත අධිකරණය විසින් –

(අ) බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ කිසියම් ක්‍රියාවක් හෝ තීරණයක් තහවුරු කිරීම, ආපසු හැරවීම හෝ වෙනස් කිරීම;

(ආ) බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට යම් විධාන කිරීම; හෝ

(ඇ) අවශ්‍ය පරිදි වෙනත් යම් ආඥාවක් කිරීම,

කළ හැකි ය.

(3) බංකොලොත්භාවය යටතේ පැන නඟින යම් කාරණාවක් සම්බන්ධයෙන් විධානයක් ලබා ගැනීම සඳහා බංකොලොත් භාරකරු විසින් අධිකරණයට ඉල්ලීම් කළ හැකි ය.

භාරකරුගේ පාරිශ්‍රමිකය, වියදම් සහ පිරිවැය

**105.** (1) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් ඔහුගේ කාර්ය ඉටුකිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා –

(අ) අධිකරණය විසින් තීරණය කරනු ලැබිය යුතු ; හෝ

(ආ) නියම කරනු ලැබිය හැකි, අනුප්‍රමාණවලින් වන ගාස්තු.

අය කරනු ලැබිය හැකිය.

(2) භාරකරුවන් නොවන නීතිඥවරුන්, කළමනාකරුවන්, ගණකාධිකාරිවරුන්, වෙන්දේසිකරුවන්, තැරැව්කරුවන් සහ වෙනත් පුද්ගලයින්ගේ සියලුම බිල්පත් සහ ගාස්තු සඳහා නියමිත නිලධාරියා විසින් ගෙවීම් සිදු කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් කිසිඳු ගෙවීමක් භාරකරු නොගෙවිය යුතු ය. එවැනි අයකිරීම් සම්බන්ධයෙන් පැනනගින විශේෂිත කරුණු සම්බන්ධයෙන් එවැනි නීතිඥයින් සහ වෙනත් පුද්ගලයින්ගේ සේවය නිසි ලෙස අනුමත කර ඇති බවට ගෙවීම් සිදුකිරීමේ නිලධාරියා එවැනි බිල්පත් පියවීමට පෙර සෑහීමකට පත්විය යුතු ය. අත්‍යවශ්‍ය අවස්ථාවක හැර මේ සඳහා පූර්ව අනුමැතිය ලබා ගත යුතු අතර, එවැනි අවස්ථාවලදී අවසරය ලබා ගැනීමේදී අනවශ්‍ය ප්‍රමාදයක් සිදු නොවූ බව පෙන්විය යුතු ය.

ණය පුනරුත්ථාපන ආඥාවක් සඳහා වන ඉල්ලීම

**106.** (1) යම් ණයහිමියකු විසින් නියම කරනු ලැබූ විට බංකොලොත්භාවය පිළිබඳ භාරකරු -

(අ) විසින් එක් එක් ණයහිමියාට ගෙවිය යුතු ණය ප්‍රමාණය පෙන්වන බංකොලොත්භාවයේ ණයහිමියන්ගේ ලැයිස්තුවක් ණයහිමියාට ලබා දිය යුතු ය; සහ

(ආ) ට නියම කළ හැකි මුදලක් එවැනි ලැයිස්තුවක් සඳහා අය කිරීමට හිමිකම් තිබිය යුතුය.

(2) වටිනාකමින් බහුතරයක් වන ණයහිමියන්ගේ යෝජනා සම්මතයක් මගින් ඉල්ලා සිටි විට, බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් -

(අ) එම ඉල්ලීම කරන දිනය දක්වා වූ ගිණුම් ප්‍රකාශයක්, එය ඉල්ලා සිටින යම් ණයහිමියකුට ලබා දිය යුතු ය; සහ

(ආ) අධිකරණය විසින් නියම කරනු ලැබුවහොත්, බංකොලොත් බූදලයෙන් යම් ණයහිමියකුට ආපසු ගෙවිය හැකි වන්නාවූ, නියම කරනු ලැබිය හැකි යම් මුදලක් එම ගිණුම් විස්තර ලබා දීම වෙනුවෙන් අය කිරීමට බංකොලොත් භාවය පිළිබඳ භාරකරුට හිමිකම් තිබිය යුතු ය.

(3) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට නිසි ගිණුම් වාර්තා තබා ගත යුතු ය.

(4) බංකොලොත් ණයකරුගේ යම් ණයහිමියකුට, අධිකරණයේ පාලනයට යටත්ව, (3) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන යම් ගිණුම් වාර්තාවක් පරීක්ෂා කළ හැක.

(5) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු නිල දේපළ භාර ගැනුම්කරු හැර වෙනත් තැනැත්තකු, වන අවස්ථාවකදී බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් කලින් කලට, නියම කරනු ලැබිය හැකි පරිදි, බංකොලොත්භාවය පවතින කාලය තුළ සෑම වසරකම එක් වරකට නොඅඩු වාරයක් බංකොලොත්භාවය අදාළ කාර්යපටිපාටි පිළිබඳ ප්‍රකාශයක් නිල දේපළ භාර ගැනුම්කරු වෙත සම්ප්‍රේෂණය කළ යුතු ය.

(6) (5) උපවගන්තිය යටතේ නිල දේපළ භාර ගැනුම්කරු විසින් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු විස්තර සහ එම ප්‍රකාශයට අදාළ ආකෘතිය නියම කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

(7) නිල දේපළ භාර ගැනුම්කරු විසින් -

(අ) (5) වන උපවගන්තිය යටතේ සම්ප්‍රේෂණය කරන ලද ප්‍රකාශ පරීක්ෂා කළ යුතු ය;

(ආ) එකී ප්‍රකාශවල හෝ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ ගිණුම්වල හෝ වෙනත් දෙයක

පෙන්නුම් කෙරෙන යම් වරදක්, නොසලකා හැරීමක් හෝ අත්හැරීමක් සම්බන්ධයෙන් හේතු දැක්වීමට බංකොලොත් භාරකරු කැඳවිය යුතු ය; සහ

(ඇ) යම් වැරදීමක්, නොසැලකිලිමත්කමක් හෝ අත්හැරීමක් මගින් බංකොලොත්භාවයට සිදු වූ අලාභය ගෙවා බේරුම් කරන ලෙස බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට නියම කරනු ලැබිය හැකි ය.

බංකොලොත් භාවය පිළිබඳ භාරකරුගේ ගිණුම් විගණනය කිරීම

**107.** (1) සෑම බංකොලොත්භාවය පිළිබඳ භාරකරුවකු විසින් ම, ඔහුගේ ධුර කාලය තුළ සෑම වසරකම දෙවතාවකට නොඅඩු වාර ගණනක දී නියම කරනු ලැබිය හැකි හෝ අධිකරණයකින් ආඥා කරනු ලැබිය හැකි කාලවලදී, ඔහුගේ ලැබීම් හා ගෙවීම් පිළිබඳ ගිණුම් විස්තරයක් නිල දේපළ භාර ගැනුම්කරු වෙත යැවිය යුතු ය.

(2) අදාළ ගිණුම් විස්තරය -

(අ) නියම කරන ලද පරිදි හෝ අධිකරණයක් විසින් ආඥා කරන ලද ආකෘතියක් අනුව විය යුතු ය; සහ

(ආ) නියමිත ආකෘතියකට අනුව වූ ව්‍යවස්ථාපිත ප්‍රකාශය මගින් තහවුරු කළ යුතු ය.

(3) නඩුවේ සමානුපාතික සහ සාධාරණ විසඳුමක් සඳහා එය අවශ්‍ය බව නිල දේපළ භාර ගැනුම්කරු සලකන්නේ නම්, එසේ ඉදිරිපත් කරන ලද ගිණුම් විගණනය කිරීමට සැලැස්විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ විගණනය කිරීමේ කාර්ය සඳහා, බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් විගණකවරයාට අවශ්‍ය වන තොරතුරු විගණකවරයාට ලබා දිය යුතු අතර, බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් පවත්වාගෙන යනු ලබන පොත් හෝ ගිණුම් ඉදිරිපත් කරන ලෙස විගණකවරයා විසින් යම් අවස්ථාවක ඉල්ලා සිටිය හැකි ය.

(5) එවැනි කිසියම් ගිණුමක් විගණනය කර ඇති විට, නිල දේපළ භාරගැනුම්කරු විසින් පිටපතක් ගොනු කර තබා ගත යුතු

අතර, තවත් පිටපතක් අධිකරණයේ ගොනු කළ යුතු ය. විගණනය කළ සෑම පිටපතක්ම ණයහිමියා, බංකොලොත් ණයකරු හෝ උනන්දුවක් දක්වන වෙනත් තැනැත්තකු විසින් පරීක්ෂා කිරීම සඳහා විවෘතව තැබිය යුතු ය.

**108.** (1) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් තමාට ලැබෙන සියලුම මුදල් බංකොලොත්භාවයට අදාළ කාර්ය සඳහා ඇති කළ එක් බැංකුවක හෝ ඊට වැඩි ගණනක, ගිණුමකට හෝ ගිණුම්වලට බැර කළ යුතු ය.

මුදල්වලට අදාළව බංකොලොත් භාවය පිළිබඳ භාරකරුගේ කාර්යභාරය

(2) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් බැංකු ගිණුමකට මුදල් බැර කිරීම සම්බන්ධයෙන් රීති නියම කරනු ලැබිය හැකි ය.

(3) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් බූදලයක් අද්මිනිස්ත්‍රාසි කිරීමේ දී වහාම ගෙවීමට අවශ්‍ය නොවන මුදල්, නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමාණයට (ඇත්නම්) සහ නියම සහ කොන්දේසිවලට යටත්ව ආයෝජනය කළ හැකි ය.

(4) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් ලද මුදල් කිසිවක් බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ පුද්ගලික බැංකු ගිණුමකට බැර නොකළ යුතු ය.

5 වන පරිච්ඡේදය

**බංකොලොත්භාවයේ දී ණය**

**109.** (1) 37 වන වගන්තිය යටතේ ඇතුළත් කළ ණය ලෙස අර්ථ දක්වා ඇති ණය පමණක් බංකොලොත්භාවයකදී ඔප්පු කළ යුතු ය.

බංකොලොත් භාවයේ දී ඔප්පු කළ හැකි ණය

(2) 37 වන වගන්තිය යටතේ බැහැර කරන ලද ණයක් ලෙස අර්ථ දක්වා ඇති ණයක් බංකොලොත්භාවයකදී ඔප්පු නොකළ යුතු ය.

(3) මෙම වගන්තියට යටත්ව, බංකොලොත්භාවයේ දී ඔප්පු කළ හැකි යම් ණයක් පිළිබඳ බංකොලොත් ණයකරුගේ සුරක්ෂිත හෝ සුරක්ෂිත නොවන ණයහිමියකු විසින් සාක්ෂි ඔප්පු ඉදිරිපත් කිරීම සහ යම් සාක්ෂියක් ඇතුළත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම ද 426 වගන්තියට අනුව සිදු විය යුතු ය.

(4) බංකොලොත් බූදලයේ දේපළ සම්බන්ධයෙන් ස්ථාවර සුරැකුමක් තබා ගන්නා සුරක්ෂිත ණයහිමියකු විසින් -

(අ) බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ සන්තකයේ හෝ පාලනයේ දේපළ තබන අතරම, සුරැකුම් මත විශ්වාසය තැබිය හැකි ය;

(ආ) සුරක්ෂිත ණයහිමියාට එසේ කිරීමට හිමිකම් ඇති අවස්ථාවලදී සුරැකුම බලාත්මක කළ හැකි ය; හෝ

(ඇ) සුරැකුමට යටත්ව ඇති දේපළ ණයහිමියන්ගේ ප්‍රයෝජනය සඳහා බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට සම්පූර්ණයෙන් භාර දී, සම්පූර්ණ ණය සඳහා සුරක්ෂිත නොවන ණයහිමියකු ලෙස හිමිකම් පෑම කළ හැකි ය.

(5) 34 වන වගන්තියේ (5) වන උපවගන්තියට යටත්ව (4) වන ඡේදයේ සඳහන් විකල්පය ක්‍රියාත්මක කරන සුරක්ෂිත ණයහිමියකු උපවගන්තියේ (අ) විසින් මුළු මුදලින් ඉතිරි මුදල බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට ගෙවිය යුතු ය. එසේ ගෙවිය යුතු වන්නේ -

(අ) බංකොලොත්භාවය ආරම්භයේදී තීරණය කරනු ලබන, සුරක්ෂිත ණයහිමියාගේ ස්ථාවර සුරැකුමට පෙර ප්‍රමුඛත්වය හිමි වන, දේපළෙහි යම් කොටසක් මත යම් ස්ථාවර සුරැකුමක් ලබාදීම හේතුවෙන් සුරැකුම ලබාදෙන්නාගේ යම් ණයක් ගෙවා බේරුම් කිරීමෙන් පසුව ; සහ

(ආ) බංකොලොත්භාවය ආරම්භයේ දී තීරණය කරන ලද සම්පූර්ණ ණය මුදල ගෙවා බේරුම් කිරීමෙන් පසුව,

ලද මුළු මුදලින් ඉතිරි මුදල පිළිබඳ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට ගිණුම් විස්තර ලබා දිය යුතු ය.

(6) බංකොලොත් භාරකරු, අවශ්‍ය යැයි සළකනු ලබන අවස්ථාවක දී, බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් සුරක්ෂිත ණයකරුට ලිඛිත දැන්වීමක් යවා එම දැන්වීම ලද දින සිට වැඩකරන දින විස්සක් ඇතුළත -

(අ) (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් විකල්පය හෝ (4) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් විකල්පය ක්‍රියාත්මක කරන

ලෙස සුරක්ෂිත ණයකරුට නියම කළ යුතු ය; සහ

(ආ) 6 වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ සඳහන් විකල්ප ණයකරු විසින් තෝරා ගන්නේ නම්, එය ක්‍රියාත්මක කළ යුතු ය.

(7) (6) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලබා ඇති සහ එම දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වී ඇති සුරක්ෂිත ණය හිමියකු -

(අ) විසින් සමස්තයක් වශයෙන් ණයහිමියන්ගේ ප්‍රතිලාභය උදෙසා, සුරැකුමට යටත්ව , බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට දේපළ භාර දුන් බවට සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) ට සම්පූර්ණ ණය සඳහා සුරක්ෂිත නොවන ණයහිමියකු ලෙස හිමිකම්පෑම කළ හැකි ය.

අන්‍යොන්‍ය ණය සහ හිලව් කිරීම

**110.** බංකොලොත් ණයකරුවකු සහ බංකොලොත්භාවයේදී හිමිකම්පාන සහ 427 වන වගන්තිය නොපැවතියේ නම් හිමිකම්පෑමක් කළ හැකිවන වෙනත් තැනැත්තකු අතර අන්‍යොන්‍ය ණයවර, අන්‍යෝන්‍ය ණය හෝ වෙනත් අන්‍යෝන්‍ය ගණුදෙනු පැවැති අවස්ථාවල දී 427 වන වගන්තිය අදාළ වේ.

බංකොලොත් භාවයේ දී ණයවල ප්‍රමුඛතාවය

**111.** (1) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින්, බංකොලොත් බූදලයෙන් ලද මුදල්, බංකොලොත්භාවය ආරම්භ කරනු ලැබූ අවස්ථාවේ දී හතරවන උපලේඛනයේ දක්වා ඇති පරිදි තීරණය කරන ලද හිමිකම්පෑම් පියවීම සඳහා එකී උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට සහ ප්‍රමුඛතාව අනුව යෙදවිය යුතුය.

(2) හතර වන උපලේඛනයේ 8 වැනි ඡේදයට අගතිවිරහිතව, (1) උපවගන්තියේ සඳහන් වන "බංකොලොත් බූදලය" ට, යම් පිළිබැඳීමකට යටත්වන දේපළ, එම දේපළ -

(අ) 109 වන වගන්තියේ (4) උප වන වගන්තිය යටතේ, සුරැකුමකට යටත්ව සුරක්ෂිත ණයකරු විසින් බාර දී ඇත්නම් මිස; හෝ

(ආ) 109 වන වගන්තියේ (4) වන හෝ (5) වන උපවගන්ති යටතේ ඇති සුරැකුමකට යටත්ව,

සුරක්ෂිත ණයකරු විසින් භාර දී නැතිනම් සහ සුරැකුම ක්‍රියාත්මක කිරීමට සුරක්ෂිත ණයකරු අදහස් නොකරන බව සුරක්ෂිත ණයකරු විසින් බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට දැනුම් දී ඇත්නම් මිස .

බංකොලොත් බූදලයට ඇතුළත් නොවිය යුතු ය.

(3) (1) උපවගන්තියට අනුකූලව හිමිකම්පෑම් සඳහා මුදල් ගෙවීමෙන් පසු, බංකොලොත්භාවය ආරම්භයේදී තීරණය කරන ලද සාමාන්‍ය හිමිකම් පෑම සඳහා මුදල් ගෙවීමට බංකොලොත් දේපළ විකිණීමෙන් ලැබෙන ආදායම බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් යොදා ගත යුතු ය.

(4) (3) උපවගන්තියේ දක්වා ඇති හිමිකම්පෑම් වල ප්‍රමුඛත්වය වන සමානව ශ්‍රේණිගත කර ඇති අතර බංකොලොත් බූදලය විකිණීමෙන් ලැබෙන ආදායම හිමිකම්පෑම සඳහා මුදල් ගෙවීමට ප්‍රමාණවත් නොවන්නේ නම් මිස සම්පූර්ණයෙන් පියවිය යුතු වන අතර මුදල් ප්‍රමාණවත් නොවන අවස්ථාවකදී දේපළ විකිණීමෙන් ලැබෙන මුදල් ප්‍රමාණානුකූලව එම හිමිකම්පෑම් සියල්ල සඳහා යොදාගත යුතු ය.

(5) (3) වන උපවගන්තියට අනුකූලව හිමිකම්පෑමේ, මුදල් ගෙවීමෙන් පසු, (1) සහ (3) උපවගන්තිවල සඳහන් කර ඇති හිමිකම්පෑම් සඳහා, නියම කරනු ලැබිය හැකි ආකාරයට බංකොලොත්භාවය ආරම්භයේ සිට ගණනය කරන ලද පොලිය ගෙවිය යුතු ය.

(6) (5) උපවගන්තියේ දක්වා ඇති හිමිකම්පෑම්, එම උපවගන්තියේ සඳහන් පොළිය සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය එක හා සමානව ශ්‍රේණිගත කර ඇති අතර, බංකොලොත් බූදලය විකිණීමෙන් ලැබෙන ආදායම එම හිමිකම්පෑම් ගෙවීමට ප්‍රමාණවත් නොවන්නේ නම් මිස සම්පූර්ණයෙන් පියවිය යුතුය. එසේ පියවීමට මුදල ප්‍රමාණවත් නොවන එම පොළිය සම්පූර්ණයෙන්ම ගෙවනු ලබන අවස්ථාවේහි දී, එම පොලී සම්බන්ධයෙන් එම උපවගන්තියේ සඳහන් කර ඇති සියලුම හිමිකම් අතර ආදායම අඩු විය යුතු ය.

(7) (5) උපවගන්තියට අනුකූලව හිමිකම් ගෙවීමෙන් පසු බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් බංකොලොත් දේපළ විකිණීමෙන් ලැබෙන අතිරික්ත මුදල බංකොලොත් ණයකරුට ලබා දිය යුතු ය.

(8) බංකොලොත්භාවය ආරම්භ වීමට පෙර, ණයහිමියකු විසින් එකඟතාවයක් නොතිබියේ නම් මෙම වගන්තිය යටතේ වෙනත් ආකාරයක ප්‍රමුඛතාවයක් ලැබිය යුතුව තිබුණා වූ ණයක් සම්බන්ධයෙන් පවත්නා ප්‍රමුඛතාවයට වඩා අඩු ප්‍රමුඛතාවයක් පිළිගැනීමට එකඟ වූ විට, මෙම වගන්තියේ කිසිවක් මගින් ගිවිසුමේ මේ නියම අනුව ගිවිසුම අනුව ක්‍රියාත්මක වීම නොවැළැක්විය යුතු ය.

## 6 වන පරිච්ඡේදය

### බංකොලොත්භාවයේ දී ණයකරුගේ කාර්යභාරය

බංකොලොත් භාවය පිළිබඳ ණයකරුගේ පොදු වගකීම්

**112.** බංකොලොත්භාවය පිළිබඳ ආඥාවකට යටත්වන බංකොලොත් ණයකරුවෙකු, 32 වන වගන්තිය යටතේ පුද්ගලික බංකොලොත්භාවය පිළිබඳ කාර්යපටිපාටි යටතේ වන ණයකරුවන්ගේ බැඳීම්වලට යටත් විය යුතු ය.

දේපළ එළිදරව් කිරීම සහ උපලබ්ධි වීම සම්බන්ධයෙන් ණයකරුගේ බැඳීම

**113.** (1) 32 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාර්යභාරයට අමතරව, තමා විෂයයෙහි බංකොලොත් නියෝගයක් නිකුත් කර ඇති බංකොලොත් ණයකරුවෙකු විසින්, සිය උපරිම ශක්තියෙන් බංකොලොත් දේපළ විකිණීමේදී ආධාර කිරීම සහ විකිණීමෙන් ලැබුණ මුදල් ණයහිමියන් අතර බෙදීමට බංකොලොත් භාරකරුගේ සහය ලබා දීම කළ යුතු වන අතර බංකොලොත් ණයකරු -

(අ) බංකොලොත් භාරකරු විසින් පෙනී සිටිය සේ නියම කරන ඕනෑම අවස්ථාවක් හි ඔහු ඉදිරියේ පෙනී සිටිය යුතු අතර බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් එසේ කිරීමට නියම කරන විට යම් ප්‍රකාශයක් දිවුරුම් ප්‍රකාශයක් මගින් තහවුරු කළ යුතු ය;

(ආ) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් නියම කරනු ලබන පරිදි, එම දේපළ සම්බන්ධයෙන් යම් ඇටෝර්නි බලයක්, පැවරීමක් හෝ සාධනපත්‍රයක් ක්‍රියාත්මක කර ලැබෙන මුදල ණය හිමියන් අතර බෙදා හැරීම කළ යුතු ය;

(ඇ) ණයහිමියන් අතර බෙදිය හැකි සහ බංකොලොත් ණයකරුගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින ආරක්ෂිත දේපළ හැර බංකොලොත් ණයකරුගේ ඕනෑම දේපළක් ඉල්ලා සිටීමේදී

බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට බාරදීම කළ යුතු ය;

(ඇ) බංකොලොත් ණයකරු නිදහස්වීමට පෙර අත්පත් කරගත් ආරක්ෂිත දේපළ හැර වෙනත් ඕනෑම දේපළක් බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් ඉල්ලා සිටිමේදී ලබා දිය යුතු ය; සහ

(ඉ) බංකොලොත්භාවය ආපසු ගෙවීමේ නියෝගයක් හෝ බංකොලොත්භාවය ආපසු ගෙවීමේ ගිවිසුමක් යටතේ ලැබිය යුතු සහ ගෙවිය යුතු ඕනෑම ආදායමක් බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට ඉල්ලා සිටිමේදී ලබා දිය යුතු ය.

(2) බංකොලොත් ණයකරුවෙකු බංකොලොත්භාවයෙන් නිදහස් වූ පසුව පවා, මෙම පනත යටතේ ඔහුගේ අවශ්‍ය කාර්යයන් ඉටු කිරීම සඳහා බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි ඕනෑම ඉල්ලීමක් සමඟ දිගටම සහයෝගයෙන් කටයුතු කළ යුතු ය.

මූල්‍ය තොරතුරු

**114.** (1) බංකොලොත් ණයකරුගේ බුදලයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් පිළියෙළ කිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය තොරතුරු සහ විස්තර බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට ලබා දිය යුතු ය.

(2) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් එහි අවශ්‍ය සහ සම්පත් සමානුපාතික ලෙස භාවිත කිරීම සලකන විට, භාරකරු විසින් බංකොලොත් ණයකරුගේ සම්පූර්ණ, සත්‍ය සහ සවිස්තරාත්මක ගිණුම් සහ බංකොලොත් ණයකරුගේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයන් සැකසීමට සහාය වීමට බංකොලොත් ණයකරුට අවශ්‍ය විය හැකි ය. එම විස්තරවලට පහත දැක්වෙන ලේඛන ඇතුළත් විය යුතු ය :-

(අ) බංකොලොත් ණයකරුගේ වෙළඳාම සහ තොග පිළිබඳ විස්තර; සහ

(ආ) ආරම්භයට පෙර වසර තුනක් තුළ ඕනෑම කාල පරිච්ඡේදයක් තුළ බංකොලොත් ණයකරුගේ ලාභය සහ පාඩුව පෙන්නුම් කරන විස්තරයක්;

(3) (2) උපවගන්තිය නිශ්චිතව දැක්වෙන පරිදි බංකොලොත් භාවය පිළිබඳ භාරකරු විසින් අවශ්‍ය වූ විට, බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් සාධාරණ කාලයක් තුළ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ ඉල්ලීමකට අනුව, බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට නිශ්චිතව දක්වා ඇති ගිණුම් සහ ප්‍රකාශ සකස් කිරීමට අවශ්‍ය තොරතුරු හැකිතාක් දුරට සූදානම් කර ලබා දිය යුතු ය.

(4) බංකොලොත් ණයකරුට (2) උපවගන්තියේ දක්වා ඇති ගිණුම් සහ ප්‍රකාශ සකස් කිරීම සඳහා -

(අ) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් බංකොලොත්භාවය පිළිබඳ භාරකරු සතුව ඇති බංකොලොත් ණයකරුගේ පොත් සහ පත්‍රිකා සඳහා ණයකරුට පූර්ණ ප්‍රවේශය ලබා දිය යුතු ය; සහ

(ආ) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු එය අවශ්‍ය යැයි සිතන්නේ නම්, බංකොලොත් ණයකරුට බංකොලොත් ණයකරුගේ දේපළෙහි වියදමෙන් ගණකාධිකාරීවරයකු විසින් ඊට සහය විය යුතු ය.

## 7 වන පරිච්ඡේදය

### බංකොලොත්භාවයේ ණයකරුගේ දේපළ

බංකොලොත් දේපළේ විස්තරය

**115.** (1) මේ පනතේ බංකොලොත් බූදලය ලෙස සඳහන් කර ඇති, ණයහිමියන් අතර බෙදිය හැකිය බංකොලොත් ණයකරුගේ දේපළ, 34 සහ 35 වන වගන්තිවල දක්වා ඇති ආරක්ෂිත දේපළින් සමන්විත නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියට යටත්ව, බංකොලොත් බූදලය පහත දැක්වෙන දේපළවලින් සමන්විත විය යුතු ය:-

(අ) බංකොලොත්භාවය ආරම්භයේදී බංකොලොත් ණයකරුට අයත් හෝ ඔහුට පවරා ඇති සියලුම දේපළ; සහ

(ආ) මෙම පරිච්ඡේදයේ පහත සඳහන් කවර හෝ විධිවිධානයක් ප්‍රකාරව, එම බූදලයේ කොටසක් වන හෝ එම බූදලයේ කොටසක් සාදනු ලබන ලෙසට සලකනු ලබන යම් දේපළක්.

(3) මෙම පරිච්ඡේදයේ, බංකොලොත් ණයකරු සම්බන්ධයෙන් වන විට දේපළ යන්නට, බංකොලොත් ණයකරුගේම ප්‍රතිලාභය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඒ ඉන් පිටත දේපළ කෙරෙහි ඒ සම්බන්ධයෙන් බංකොලොත් ණයකරු විසින් ක්‍රියාත්මක කළ හැකි යම් බලතල පිළිබඳ සඳහනක් ද ඇතුළත් වේ.

(4) මෙම පරිච්ඡේදයේ කාර්ය සඳහා, බංකොලොත් බූදලයේ කොටසක් සාදනු ලබන දේපළ -

(අ) බංකොලොත් ණයකරුට හැර වෙනත් ඕනෑම තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට යටත්, බූදලයේ කොටසක් වේ; සහ

(ආ) සුරක්ෂිත ණයහිමියකුට 109 වගන්තිය යටතේ යටත් වී ඇති ඕනෑම අයිතීන් නොසලකා හරිමින්, ඔහුට ආරක්ෂාවක් ඇති දේපළක් සන්තකයේ තබා ගැනීමට සහ විකිණීමට, සහ අන්‍යාකාරයකින් පිළිබඳ කටයුතු කිරීමට සුරක්ෂිත ණයහිමියාට හැකි ය.

(5) බංකොලොත් ණයකරුගේ බූදලයකින් යම් දේපළක් බැහැර කළ යුතු වනුයේ යම් පනතක් යටතේ ද මෙම වගන්තිය එම පනතකට අදාළ විය යුතු ය.

බංකොලොත් භාවය පිළිබඳ භාරකරුට දේපළ පැවරීම

**116.** (1) බංකොලොත්භාවය පිළිබඳ භාරකරුවකු පත් කරන තුරු-

(අ) 97 වන වගන්තියට අනුකූලව මේ පනතේ කාර්ය සඳහා නිල දේපළ භාර ගැනුම්කරු බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වශයෙන් කටයුතු කළ යුතු ය; සහ

(ආ) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් නිකුත් කළ වහාම, බංකොලොත් බූදලය නිල දේපළ භාර ගැනුම්කරු වෙත පවරනු ලැබිය යුතු ය.

(2) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු ලෙස නිල දේපළ භාර ගැනුම්කරු හැර වෙනත් පුද්ගලයකු පත්කිරීමේ දී, බංකොලොත් බූදලය වහාම, පත් කරන ලද බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වෙත පවරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ හෝ මෙම පරිච්ඡේදයේ වෙනත් යම් විධිවිධානයක් යටතේ, බංකොලොත් බූදලයේ ඇති, හෝ තිබිය යුතු යම් දේපළක් නිල දේපළ භාර ගැනුම්කරුට පවරනු ලැබ ඇත්නම්, එම පැවරීම කිසිදු ඔප්පුවකින් හෝ සතු කර දීමකින් හෝ සින්නක්කරයකින් මාරු තොරව නිල දේපළ භාර ගැනුම්කරුට පැවරිය යුතු ය.

(4) බංකොලොත් භාරකරුවෙකු පත්කිරීමේ සහතිකය, දේපළ පැවරීම හෝ ලියාපදිංචි කිරීම හෝ වාර්තා කිරීම අවශ්‍ය වන ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක ක්‍රියාත්මක වන ඕනෑම නීතියක සියලු කාර්ය සඳහා, දේපළ සතු කිරීම කිරීම හෝ පැවරීමක් ලෙස සලකනු ලැබේ. ඒ අනුව ලියාපදිංචි කිරීම සහ වාර්තා කිරීම සිදු කරනු ලැබේ.

පසුව අත් කරගත් දේපළ

**117.** (1) 34, 35 සහ 115 වන වගන්තිවලට යටත්ව, බංකොලොත්භාවය ආරම්භ වීම සහ ණයකරු නිදහස් කිරීම අතර වාරයේ දී ආරක්ෂිත දේපළ හැර, ණයකරු විසින් අත්කරගත් දේපළ හෝ ණයකරුට ලැබෙන සියලු දේපළ පසුව, අත්කර ගත් දේපළ විය යුතු ය.

(2) පසුව අත් කරගත් සියලු දේපළ බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වෙත පැවරිය යුතු ය.

(3) බංකොලොත් ණයකරුගේම ප්‍රතිලාභය සඳහා බංකොලොත් ණයකරු විසින් අත්කරගත් දේපළක දේපළ කෙරෙහි හෝ දේපළ සම්බන්ධයෙන් බංකොලොත් ණයකරු විසින් ක්‍රියාත්මක කළ හැකිව තිබූ බලතල බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වෙත පැවරිය යුතු ය.

(4) සැක දුරු කිරීමේ කාර්ය සඳහා -

(අ) බංකොලොත් ණයකරුගේ ආදායම මගින් පසුව අත් කරගත් දේපළක් සංයුක්ත නොවිය යුතු ය; සහ

(ආ) බංකොලොත් ණයකරුගේ ආදායම බංකොලොත් බූදලය සඳහා ඇතුළත් කළ යුත්තේ 125 සහ 126 යන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති ක්‍රමය හරහා පමණි.

භාරකරු විසින් දේපළ සන්තකයේ තබා ගැනීම

**118.** (1) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් හැකි ඉක්මනින්, බංකොලොත් ණයකරුගේ දේපළ හෝ කටයුතුවලට අදාළ-

(අ) බංකොලොත් ණයකරුට අයත් ; හෝ

(ආ) බංකොලොත් ණයකරුගේ සන්තකකයේ හෝ පාලනය යටතේ පවතින,

පොත්, ලේඛන සහ වෙනත් වාර්තා සන්තකයට ගත යුතු ය.

(2) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින්, බංකොලොත් බූදලය අත්කර ගැනීම හෝ එහි සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් සහ එම කාර්යය සඳහා, එම බංකොලොත්භාවය පිළිබඳ භාරකරු, අධිකරණය විසින් පත් කරන ලැබූ දේපළ භාර ගැනුම්කරුට සමාන තනතුරක සිටිය යුතු අතර, අධිකරණය වෙත කරන ලද ඉල්ලීමක් මත අධිකරණය විසින් එම අත්කර ගැනීම හෝ රඳවා තබා ගැනීම බලාත්මක කළ හැකි ය.

(3) බංකොලොත් බූදලයේ යම් කොටසක් සමාගමක තොග හෝ කොටස්වලින් හෝ නැවක කොටස්වලින් හෝ යම් සමාගමක, කාර්යාලයක හෝ පුද්ගලයකුගේ ලේඛන වලින් හිමිකම පැවරිය හැකි වෙනත් දේපළකින් සමන්විත වන අවස්ථාවක දී, බංකොලොත් ණයකරු බංකොලොත් නොවී සිටියේ නම්, ඔහු විසින් පැවරිය හැකිව තිබූ ප්‍රමාණයටම ඉහත කී දේපළ සම්බන්ධයෙන් බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින්ද පැවරීමේ අයිතිය ක්‍රියාත්මක කළ හැකි ය.

(4) බංකොලොත් බූදලයේ යම් කොටසක් අස්පෘශ්‍ය දේපළ අයිතිවාසිකම් වලින් සමන්විත වන අවස්ථාවක දී -

(අ) එවැනි දේ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට නිසි ලෙස පවරා ඇති බවට සලකනු ලැබේ; සහ

(ආ) බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ ප්‍රමුඛතාවය ආරක්ෂා කිරීම සඳහා, සලකනු ලැබූ පැවරුම බංකොලොත් ණයකරුගෙන් වන පැවරුමක් නම්, අවශ්‍ය වන තාක් දුරට හැර, සලකනු ලබන පැවරුම පිළිබඳ දැන්වීමක් කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(5) 112 වගන්තිය යටතේ බංකොලොත් ණයකරුගේ සාමාන්‍ය කාර්යයට අමතරව, බංකොලොත් ණයකරු විසින් බංකොලොත් ණයකරුගේ පාලනයේ සහ සන්තකයේ තිබූ කිසියම් දේපළක්, පොත්පත්, ලේඛන හෝ වෙනත් වාර්තා බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වෙත භාර දිය යුතු අතර, බංකොලොත්භාවය පිළිබඳ භාරකරු ඒවා සන්තකයේ තබාගත යුතු ය.

(6) බංකොලොත් ණයකරුගේ බැංකුකරුවකු හෝ අනුයෝජිතයකු වන යම් තැනැත්තෙක් හෝ බංකොලොත් ණයකරුගේ හෝ ඔහු වෙනුවෙන් යම් දේපළක් දරා සිටින වෙනත් තැනැත්තකු විසින් පහත දැක්වෙන දේපළ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට භාර දිය යුතු ය : –

(අ) බංකොලොත් බූදලයේ කොටසක් සංස්ථාපනය කරනු ලබන එම තැනැත්තාගේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති සියලුම දේපළ; සහ

(ආ) බංකොලොත් ණයකරුට හෝ බංකොලොත් භාවය පිළිබඳ භාරකරුට එරෙහිව රඳවා ගැනීමට නීතියෙන් හිමිකම් නොලබන දේපළ.

(7) බංකොලොත් භාරකරු විසින් සන්තකයේ තබා ගැනීමට අවශ්‍ය වන යම් දේපළ, පොත්පත්, ලේඛන හෝ වෙනත් වාර්තා පහත සඳහන් කිසිවකු, එනම්-

(අ) නිල දේපළ භාර ගැනුම්කරු;

(ආ) බංකොලොත් බූදලයේ භාරකරු වීම නතර වූ පුද්ගලයකු; හෝ

(ඇ) IV වන කොටස යටතේ බංකොලොත් ණයකරු සම්බන්ධයෙන් අනුමත කරන ලද ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙලක පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු ලෙස කටයුතු කළ අයකුගේ,

එම තැනැත්තා විසින් සන්තකයේ ඇති දේපළ, වාර්තා බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට භාර දිය යුතු ය.

(8) සාධාරණ හේතුවක් නොමැතිව යම් තැනැත්තකු මෙම වගන්තිය මගින් පනවන ලද යම් බැඳීමකට අනුකූල වීමට අපොහොසත් වන්නේ නම්, එකී තැනැත්තා යටත් විය යුතු වෙනත් යම් දඬුවමකට යටත්ව අධිකරණයට අපහාස කිරීම මේ වරදට වරදකරු වන අතර, ඒ අනුව දඬුවම් කරනු ලැබීමට යටත් විය යුතු වේ.

බංකොලොත් දේපළ තහනමට ගැනීම

**119.** (1) බංකොලොත් නියෝගයක් නිකුත් කිරීමෙන් පසු යම් අවස්ථාවක, නිල දේපළ භාර ගැනුම්කරු හෝ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ ඉල්ලීමක් මත, නිල දේපළ භාර ගැනුම්කරුට බංකොලොත්භාවය පිළිබඳ භාරකරු හෝ අධිකරණය විසින් බලය පවරන යම් නියෝජිතයකුට බංකොලොත් බූදලය සමන්විත වන යම් දේපළක් හෝ එම බූදලයට අදාළ සහ බංකොලොත් ණයකරුගේ සන්තකයේ හෝ පාලනයේ පවතින පොත්පත්, ලේඛන හෝ වාර්තා හෝ, බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට භාරදිය යුතු වෙනත් තැනැත්තකුගේ පාලනය යටතේ හෝ සන්තකය යටතේ හේ ඇති දේපළ පොත්පත්, ලේඛන හෝ වාර්තා තහනමට ගැනීම සහ අධිකරණය විසින් නිල දේපළ භාර ගැනුම්කරුට සම බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට හෝ ඔවුන්ගේ නියෝජිතයකුට බලය පවරමින් වරෙන්තුවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද වරෙන්තුවක් මගින් බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට බංකොලොත් භාවය පිළිබඳ භාරකරුගේ කර්තව්‍ය ඉටු කිරීමට සහ බංකොලොත් බූදලයේ පරිපාලනය සඳහා අවශ්‍ය විට බංකොලොත් ණයකරුගේ තැපැලට හා විද්‍යුත් තැපැලට සාධාරණ ප්‍රවේශයක් ලබා දිය යුතු බවට විධාන කළ හැකි ය.

(3) මේ වගන්තිය යටතේ වරෙන්තුවක් ක්‍රියාත්මක කරනු ලබන යම් තැනැත්තකුට බංකොලොත් බූදලයේ ඇති යම් දේපළක් හෝ බංකොලොත් බූදලයට අදාළ පොත්පත්, ලේඛන හෝ වාර්තා තහනමට ගැනීමේ කාර්යය සඳහා -

(අ) බංකොලොත් ණයකරු වාසය කරන පරිශ්‍රයක් හෝ වරෙන්තුව යටතේ අත් කර ගත හැකි බවට හෝ අත්කර ගත හැකි යයි විශ්වාස කරන ඕනෑම දෙයක් කඩා විවෘත කිරීමට; සහ

(ආ) එසේ තහනමට ගත හැකි යම් දෙයක් අඩංගු හෝ අඩංගු බවට විශ්වාස කරන බංකොලොත්

තැනැත්තාගේ යම් ග්‍රාහකයක් තහනමට ගැනීමට වරෙන්තුව ක්‍රියාත්මක කරනු ලබන තැනැත්තකුට බලය ඇත.

(4) බංකොලොත් ආඥාවක් ලබා දීමෙන් පසු, බංකොලොත් බූදලයට අයත් කිසියම් දේපළක් හෝ බංකොලොත් බූදලයට අදාළ පොත්පත්, ලේඛන හෝ වාර්තා බංකොලොත් ණයකරුට අයත් නොවන යම් පරිශ්‍රයක සඟවා ඇති බවට අධිකරණය සෑහීමකට පත්වේ නම්, අධිකරණය විසින් දේපළ, පොත්පත්, ලේඛන හෝ වාර්තා සඳහා එම පරිශ්‍රය සෝදිසි කිරීමට යම් පොලිස් නිලධාරියකුට හෝ අධිකරණයේ නිලධාරියකුට බලය පවරමින් වරෙන්තුවක් නිකුත් කළ හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ වරෙන්තුවක් එහි නියමයන්ට අනුකූලව මිස ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද වරෙන්තුවක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ කාර්යපටිපාටිය නියම කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

බැඳීම්, සහිත දේපළ පිළිබඳ අයිතිය අත්හැරීම

**120.** බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට 334 සහ 335 යන බරපතල වගන්තිවලට අනුව බරපතල බැඳීම් සහිත දේපළවල අයිතිය ප්‍රතික්ෂේප කළ හැකි ය.

දේපළ කළමනාකරණය කිරීමට ණයකරුට අවසර දීමේ බලය

**121.** (1) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු, අධිකරණයේ අවසරය ඇතිව හෝ ණයහිමියන් බහුතරයකුගේ යෝජනා සම්මතයක් අනුව බංකොලොත් ණයකරු-

(අ) බංකොලොත් බූදලය හෝ එහි යම් කොටසක කළමනාකරණය කිරීම සඳහා හෝ අධීක්ෂණය කිරීමට; හෝ

(ආ) ණයහිමියන්ගේ ප්‍රතිලාභය උදෙසා ව්‍යාපාර කටයුතු (ඇත්නම්) පවත්වාගෙන යාමට සහ බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විධාන කරන ආකාරයෙන් සහ නියමවලට අනුව වෙනත් යම් ආකාරයකින් දේපළ පරිපාලනය කිරීම සම්බන්ධයෙන් ආධාර කිරීමට;

(ඇ) එසේ කිරීම මගින් සමස්ත ණයහිමියන්ගේ අයිතිවාසිකම්වලට හානියක් නොවන බව බංකොලොත්භාවය පිළිබඳ භාරකරු සලකනු ලබන අවස්ථාවක දී,

පත්කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් අධිකරණයේ අවසරය ඉල්ලා ඇති අවස්ථාවක, එසේ අවසරදීම මගින් සමස්ත ණයහිමියන්ගේ අයිතිවාසිකම්වලට හානියක් නොවන බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවකදී, අධිකරණය විසින් එම අවසරය ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

කුලී සින්නක්කර ගිවිසුමක් මත මිලදී ගත් භාණ්ඩ

**122.** (1) (අ) බංකොලොත් ණයකරු විසින් බංකොලොත්භාවය ආරම්භ කිරීමට පෙරාතුව, කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ භාණ්ඩ බල සන්තකය අත්කරගනු ලැබූ අවස්ථාවක; සහ

(ආ) ණයහිමියකු විසින්-

(i) බංකොලොත්භාවය ආරම්භ වීමට පෙරාතුව වූ පෙර දින විසි එකක කාලය තුළ භාණ්ඩ සිය සන්තකයට ගෙන සහ බංකොලොත්භාවය ආරම්භ වීමෙන් පසු තව දුරටත් ඒවා සන්තකයේ තබාගෙන සිටින අවස්ථාවක; හෝ

(ii) බංකොලොත්භාවය ආරම්භ වීමෙන් පසු භාණ්ඩ සන්තකයට ගනු ලැබූ,

බංකොලොත්භාවය ආරම්භ වූ දින සිට දින විසි අටක් දක්වා, ණයහිමියා විසින් භාණ්ඩ හෝ කොටස් (ගබඩා කිරීම හෝ අලුත්වැඩියා කිරීම හැර) බංකොලොත් භාරකරු ණයහිමියා විසින් එකී භාණ්ඩ විකිණීම හෝ බැහැර කිරීමට ලිඛිතව එකඟ වන්නේ නම් මිස, විකිණීම හෝ සන්තකයෙන් බැහැර කිරීම නොකළ යුතු ය.

(2) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් කුලී සින්නක්කර ගිවිසුමේ යම් විධිවිධානයක් නොතකා –

(අ) බංකොලොත්භාවය ආරම්භ වූ දින සිට දින විසි අටක කාලයක් තුළ භාණ්ඩ සඳහා

ගැනුම්කරුවකු හඳුන්වා දිය හැකි අතර සහ ණයහිමියා වෙත, බංකොලොත් ණයකරුගේ ණයගැතිභාවය, ගැනුම්කරු විසින් ණයහිමියා වෙත ගෙවන ලද මුදලේ ප්‍රමාණයට අඩු කළ යුතු ය ; හෝ

(ආ) ණයහිමියා විසින් එම කාලසීමාව අවසන් වීමෙන් පසුව භාණ්ඩ විකිණීමට හෝ විකිණීමට එකඟ වීමට පෙර යම් අවස්ථාවක, බංකොලොත් ණයකරුගේ වගකීම් පියවා ණයකරුගේ බූදලයේ කොටසක් ලෙස භාණ්ඩ රඳවා තබා ගැනීම කළ යුතු ය.

(3) (අ) බංකොලොත් ණයකරුගේ බංකොලොත්භාවය ආරම්භ වීමට පෙර හෝ ඉන් පසුව කුලී සින්නක්කර මිලදී ගැනීමේ ගිවිසුමක් යටතේ මිලදී ගත් භාණ්ඩ ණයහිමියා විසින් සන්තකයට ගෙන ඇති අවස්ථාවක ; සහ

(ආ) බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් (2) උපවගන්තිය යටතේ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අවස්ථාවක,

බංකොලොත් ණයකරුගෙන් ණය හිමියාට අයකර ගැනීමට හිමිකම් ඇති මුදල, බංකොලොත්භාවය පිළිබඳ නඩුවක දී ණය හිමියා විසින් ඔප්පු කළ හැකි ය.

(4) (අ) බංකොලොත්භාවය ආරම්භ කිරීමට පෙර බංකොලොත් ණයකරු විසින් කුලී සින්නක්කර මිලදී ගැනීමේ ගිවිසුමක් යටතේ භාණ්ඩ මිලදී ගෙන ඇති අවස්ථාවක; සහ

(ආ) බංකොලොත්භාවය ආරම්භ වූ දිනයේ දී ණය දිනය හිමියා විසින්-

(i) භාණ්ඩ සන්තකයට ගෙන නොමැති අවස්ථාවක ; හෝ

(ii) ඒවා සන්තකයේ තබාගෙන එහෙත් ඒවා විකුණා හෝ බැහැර කර නොමැති හෝ ඒවායේ හෝ සන්තකය අත්හැර නොමැති අවස්ථාවක,

ණයහිමියා විසින් බංකොලොත් භාරකරු වෙත භාණ්ඩ පැවරිය හැකි අතර, එසේ කරන්නේ නම්, ගිවිසුම යටතේ ණයහිමියා වෙත ගෙවිය යුතු වන ශුද්ධ ශේෂය බංකොලොත්භාවය පිළිබඳ නඩුවක දී ඔප්පු කළ හැකි ය.

ඇතැම් අවස්ථාවල දී වගකීම්වලින් නිල දේපළ භාර ගැනුම්කරු සහ බංකොලොත් භාරකරු ආරක්ෂා කිරීම

**123.** (1) මේ වගන්තිය -

(අ) බංකොලොත් භාරකරු විසින් බංකොලොත් ණයගැතියකුගේ සන්තකයේ හෝ පරිශ්‍රයේ ඇති යම් දේපළක් තහනමට ගෙන හෝ බැහැර කර ඇති අවස්ථාවක;

(ආ) දේපළ සම්බන්ධයෙන් කිසිදු පුද්ගලයකු විසින් බංකොලොත් භාරකරුට කිසිදු හිමිකම්පෑමක් සිදුකර නැති අවස්ථාවක.

අදාළ වන්නේ ය.

(2) (1) එම දේපළට හිමිකම් පාන යම් තැනැත්තකු විසින් කරනු ලබන යම් තහනමට ගැනීමක් හෝ බැහැරකිරීමකින් පැනනඟින්නා වූ යම් අලාබයක් හෝ හානියක් සම්බන්ධයෙන් බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු අතර -

(අ) එම දේපළ සම්බන්ධයෙන් යම් හිමිකම්පෑමක් ඔප්පු කිරීම සඳහා වූ නඩු කටයුත්තක වියදම් ගෙවීමට;

(ආ) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති අවස්ථාවල දී බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් සද්භාවයෙන් දේපළ තහනමට ගෙන හෝ බැහැරකර ඇති වීම සහ ඉන් අනතුරුව, බංකොලොත්භාවය ආරම්භ වන දින වන විට දේපළ බංකොලොත් ණයකරුගේ දේපළක් නොවන බවට බංකොලොත්භාවය පිළිබඳ භාරකරු දැන්වීමක් කර ඇති විට,

බංකොලොත් භාරකරු වගකියනු නොලැබිය යුතු ය.

දෙවන බංකොලොත්භාවය

**124.** (1) නිදහස් කිරීමකට පෙර, බංකොලොත් ණයකරු සම්බන්ධයෙන් බංකොලොත් ආඥාවක් දෙවන වරටත් කරනු ලබන අවස්ථාවක-

(අ) (2) වන උපවගන්තියට යටත්ව, දෙවන බංකොලොත්භාවයෙන් පසු අත්කර ගත් හෝ ලද දේපළක් ද ඇතුළුව, පළමු බංකොලොත්භාවයේ සිට බංකොලොත් ණයකරු විසින් අත්කරගත් හෝ ඔහු විසින් ලද දේපළක්, බංකොලොත් භාරකරු වෙත පවරනු ලැබිය යුතු ය;

(ආ) දෙවන බංකොලොත්භාවයේ යම් අතිරික්තයක් පළමු බංකොලොත්භාවයේ දී බුදලයේ වත්කමක් වන අතර, එය පළමු බංකොලොත්භාවයේ දී බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වෙත ගෙවනු ලැබිය යුතු ය.

(2) අධිකරණය විසින් එය සුදුසු යැයි සලකනු ලබන්නේ නම්, පහත සඳහන් වත්කම් හෝ ඒවායේ ආදායම පළමු බංකොලොත්භාවයේ දී බංකොලොත් භාරකරු වෙත පවරනු ලැබිය යුතු බවට නියෝග කළ හැකි ය : –

(අ) අධිකරණයේ මතය අනුව, දෙවන බංකොලොත්භාවයේ දී ණයහිමියාගෙන් ස්වාධීනව අත්කර ගනු ලැබුවා වූ දෙවන බංකොලොත්භාවයේ වත්කම්; සහ

(ආ) බංකොලොත් ණයකරු පවරනු ලැබුවා වූ දෙවන බංකොලොත්භාවයේ වත්කම්.

(3) ණයහිමියකු විසින් දෙවන බංකොලොත්භාවයක් සඳහා පෙත්සමක් ගොනු කර ඇති බවට බංකොලොත් භාරකරුට ලිඛිත දැනුම්දීමක් ලැබුණු විට, ඔහු විසින් -

(අ) බංකොලොත් ණයකරු විසින් පළමු බංකොලොත්භාවයේ සිට අත්පත් කරගත් හෝ ඔහු විසින් ලද දේපළ දෙවන බංකොලොත්භාවය සඳහා වන ඉල්ලීම සම්බන්ධයෙන් තීරණය කරනු ලබන තෙක් තම සන්තකයේ තබා ගත යුතු ය; සහ

(ආ) ණයහිමියාගේ පෙත්සම හේතුකොට ගෙන දෙවන බංකොලොත්භාවයක් පැනනැගුණු විට හෝ ණයකරු විසින්ම කළ ඉල්ලීමක් මත ණයකරු සම්බන්ධයෙන් බංකොලොත් ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක දී, දෙවන බංකොලොත්භාවයේ දී බංකොලොත් භාරකරුගේ ගාස්තු, පිරිවැය, වෙනත් ගාස්තු සහ වියදම් අඩු කර, දේපළ සහ එහි ආදායම දෙවන බංකොලොත්භාවයේ භාරකරු වෙත පවරනු ලැබිය යුතු ය.

ණය ආපසු ගෙවීමේ ආඥාව

**125.** (1) ණය ආපසු ගෙවීමේ ආඥාවක් බලාත්මකව පවතින කාලසීමාව සඳහා වන බංකොලොත් ණයකරුගේ ආදායමෙන්, 36 වන වගන්තිය යටතේ වන බංකොලොත්කරුගේ ආරක්ෂිත ආදායම ඉක්මවා යන ප්‍රමාණයක්, බංකොලොත් බූදලයට හිමිවන ලෙසට අධිකරණය විසින් ණය ආපසු ගෙවීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) 36 වන වගන්තියට අනුකූලව, අධිකරණය විසින් ණයකරුගේ ආදායමට වඩා ණයකරුගේ ආරක්ෂිත ආදායම අඩුවීමේ බලපෑම ඇති කරනු ලබන්නා වූ ණය ආපසු ගෙවීමේ ආඥාවක් අධිකරණය විසින් නොකළ යුතු ය.

(3) අදාළ විය යුතු යම් ආදායම් ගෙවීමක් සම්බන්ධයෙන් වන ණය ආපසු ගෙවීමේ ආඥාවක් –

(අ) එම ආඥාවෙන් හිමිකම් පාන මුදලට සමාන මුදලක් බංකොලොත් ණයකරු විසින් බංකොලොත් භාරකරුට ගෙවිය යුතු බවට; හෝ

(ආ) හිමිකම් පාන මුදල බංකොලොත් ණයකරු වෙනුවට බංකොලොත් භාරකරු වෙත ගෙවන ලෙසට ගෙවීම සිදු කරන තැනැත්තාට,

නියම කළ යුතු ය.

(4) ණය ආපසු ගෙවීමේ ආඥාවක් යටතේ බංකොලොත් භාරකරුවකුට ලැබෙන මුදල් බංකොලොත් බූදලයේ කොටසක් වන්නේ ය.

(5) ණය ආපසු ගෙවීමේ ආඥාවක් මගින් එය බලපැවැත්විය යුතු කාලසීමාව නිශ්චිතව දැක්විය යුතු අතර, බංකොලොත් ණයකරු නිදහස් කිරීමෙන් පසු එම කාලය අවසන් නොවිය හැකි ය.

(6) මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, බංකොලොත් භාරකරුගේ හෝ බංකොලොත් ණයකරුගේ ඉල්ලීමක් මත ණය ආපසු ගෙවීමේ නියෝගයක් වෙනස් කරනු ලැබිය හැකි ය.

ණය ආපසු ගෙවීමේ ගිවිසුම

**126.** (1) මේ වගන්තියේ "ණය ආපසු ගෙවීමේ ගිවිසුම" යන්නෙන්-

(අ) බංකොලොත් ණයකරු විසින් බංකොලොත් ණයකරුගේ ආදායමෙන් නිශ්චිතව දක්වනු ලබන කොටසකට හෝ අනුපාතයකට සමාන මුදලක් බංකොලොත් භාරකරුට නිශ්චිත ව දක්වනු ලබන කාලයක් සඳහා ගෙවිය යුතු බවට; හෝ

(ආ) බංකොලොත් භාරකරු සහ බංකොලොත් ණයකරු විසින් තුන්වන පාර්ශ්වයකට නිසි ලෙස දැන්වීමක් කර ඇති අවස්ථාවක, තුන්වන පාර්ශ්වයක් විසින් බංකොලොත් ණයකරුට නිශ්චිතව දක්වා ඇති කාල සීමාවක් සඳහා ආදායමක් ආකාරයෙන් ණයකරු වෙත ගෙවිය යුතු මුදල්වලින් නිශ්චිත ව දක්වනු ලබන අනුපාතයක් බංකොලොත් භාරකරු වෙත ගෙවිය යුතු බවට,

විධිවිධාන සලස්වනු ලබන බංකොලොත් ණයකරු සහ බංකොලොත්භාවය පිළිබඳ භාරකරු සහ බංකොලොත්භාවය පිළිබඳ භාරකරු අතර වන ලිඛිත ගිවිසුමක් අදහස් වේ.

(2) (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති ආකාරයේ ණය ආපසු ගෙවීමේ ගිවිසුමක විධිවිධානයක් ණය ආපසු ගෙවීමේ ආඥාවක විධිවිධානයක් ලෙස බලාත්මක කළ හැකි ය.

(3) ණය ආපසු ගෙවීමේ ගිවිසුමක් යටතේ බංකොලොත් භාවය පිළිබඳ භාරකරු විසින් ලද මුදල් බංකොලොත් බූදලයේ කොටසක් වන්නේ ය.

(4) ණය ආපසු ගෙවීමේ ගිවිසුමක් මගින් එය බලාත්මක විය යුතු කාල සීමාව නිශ්චිත ව දැක්විය යුතු අතර, බංකොලොත් ණයකරු නිදහස් කිරීමෙන් පසු එම කාලය අවසන් නොවිය හැකි ය.

(5) 36 වන වගන්තියට අනුකූලව, ණය ආපසු ගෙවීමේ වැඩපිළිවෙළේ නියම මගින්, බංකොලොත් ණයකරුගේ ආරක්ෂිත ආදායමට වඩා ඔහුගේ ආදායම අඩු කිරීමේ බලපෑමක් නොතිබිය යුතු ය.

(6) ණය ආපසු ගෙවීමේ ගිවිසුමක්, මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව -

(අ) පාර්ශ්ව අතර ලිඛිත ගිවිසුමක් මගින්; හෝ

(ආ) බංකොලොත් ණයකරු හෝ බංකොලොත් භාවය පිළිබඳ භාරකරු විසින් කරනු ලබන ඉල්ලීමක් මත අධිකරණය විසින්,

වෙනස් කළ හැකි ය.

(7) අධිකරණය විසින් -

(අ) බංකොලොත් ණයකරුගේ සහ ඔහුගේ යැපෙන්නන්ගේ ගෘහස්ථ සාධාරණ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා බංකොලොත් ණයකරුගේ ආදායම අඩු කිරීමේ බලපෑමක් ඇති කරන ආකාරයේ විධිවිධාන ඇතුළත් වන පරිදි ණය ආපසු ගෙවීමේ ගිවිසුමක් සුළු වශයෙන් වෙනස් කිරීම නොකළ හැකි ය; සහ

(ආ) බංකොලොත් ණයකරුගේ සහ ඔහුගේ යැපෙන්නන්ගේ සාධාරණ ගෘහස්ථ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා බංකොලොත් ණයකරුගේ ආදායම අඩු කිරීමේ බලපෑම වළක්වා ගැනීම සඳහා සුළු වෙනස්කමක් කිරීම අවශ්‍ය වන බව අධිකරණය සලකන්නේ නම් සහ වෙනස්කම අවශ්‍ය වන ප්‍රමාණයට ණය ආපසු ගෙවීමේ ගිවිසුමක් සුළු වශයෙන් වෙනස් කිරීම සඳහා ඉල්ලීමක් සඳහා අවසර ලබා දිය යුතු ය.

**127.** වස්තුභංගත්වයට භාජන වී මිය යන තැනැත්තකුගේ බංකොලොත් බූදලය කළමනාකරණය කිරීම හයවන උපලේඛනයට අනුකූලව ම සහ නියම කරනු ලබන පරිදි විය යුතු ය.

වස්තුභංගත්වයට පත්වී මිය යන තැනැත්තකුගේ බූදලය

## 8 වන පරිච්ඡේදය

### සමහර ගනුදෙනු සඳහා බංකොලොත්භාවයේ බලපෑම

**128.** (1) ණයකරුවකු විසින් කරනු ලබන ගනුදෙනුවක් 412, 415, 416 සහ 417 යන වගන්තිවලට අනුකූලව අවලංගු කළ හැකි මනාපයක් ලෙස සළකා අධිකරණය විසින් අවලංගු කළ හැකි ය.

(2) ණය ගැතියකු විසින් කරනු ලබන ගනුදෙනුවක් 413, 415, 416 සහ 417 යන වගන්තිවලට අනුකූලව අවලංගු කළ හැකි බැඳීම් ලෙස සළකා අධිකරණය විසින් අවලංගු කළ හැකි ය.

(3) ණයකරුවකු විසින් කරන ලද ගනුදෙනුවක්, 414, 415, 416 සහ 417 යන වගන්තිවලට අනුකූලව ණයහිමියකුට බාධා කිරීම, ප්‍රමාද කිරීම හෝ පරාජය කිරීමේ චේතනාවෙන් දේපළ අන්සතු කිරීමක් ලෙස අධිකරණය විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

ණයහිමියකුට හිංසා කිරීම ප්‍රමාද කිරීම හෝ පරාජය කිරීම යන අරමුණු සහිතව දේපළ අවලංගු කළ හැකි ප්‍රමුඛතා අවලංගු කළ හැකි බැඳීම් සහ අන්සතු කිරීම

**129.** බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් 418 වන වගන්තියට අනුකූලව වටිනාකම අඩුවෙන් දක්වාලනු ලැබූ ගනුදෙනුවක් ලබන්නකුගෙන් අතිරික්ත වටිනාකම අයකර ගනු ලැබිය හැකි ය.

වටිනාකම අඩුවෙන් දක්වන ලද ගනුදෙනු

**130.** (1) මේ වගන්තිය, 134 වන වගන්තිය යටතේ ලියා අත්සන් කිරීමක් හෝ සම්බන්ධ කිරීමක් මත බංකොලොත්භාවයේ බලපෑම සම්බන්ධයෙන් වන මේ පනතේ විධිවිධානවලට යටත් වන අතර, ප්‍රමුඛතා සහ අඩු වටිනාකමකින් යුත් ගනුදෙනු සම්බන්ධයෙන් 412 ,413 ,414 සහ 418 යන වගන්ති අදාළ වේ.

දැනුම් දීමකින් තොරව සද්භාවයෙන් ගනුදෙනු ආරක්ෂා කිරීම

(2) බංකොලොත්භාවය ආරම්භ වීමෙන් පසු, බංකොලොත් ණයකරු විසින් දේපළක් අත්කර ගනු ලබන්නා වූ හෝ යම් දේපළක් බංකොලොත් ණයකරුට පැවරෙන බංකොලොත් ණයකරු සහ අන් තැනැත්තකු අතර වන ගනුදෙනුවක්, එනම් -

(අ) අනෙක් තැනැත්තා බංකොලොත් ණයකරු සමඟ සද්භාවයෙන් සහ වටිනාකම සඳහන් ගනුදෙනුව කරනු ලබන්නේ නම්; සහ

(ආ) බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ මැදිහත් වීමකින් තොරව ගනුදෙනුව සම්පූර්ණ කරනු ලබන්නේ නම්,

එම ගනුදෙනුව බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට එරෙහිව වලංගු වන්නේය.

(3) එකී අනෙක් තැනැත්තා බංකොලොත් ණයකරුගේ බැංකුව වන විට, වටිනාකම සඳහා බංකොලොත් ණයකරු සමග ඇතිකර ගන්නා ගනුදෙනුවකට –

(අ) බංකොලොත් ණයකරුගෙන් හෝ බංකොලොත් ණයකරුගේ අණකරය හෝ විධානය මත කිසියම් මුදල්, ඇපකරයක් හෝ ගනුදෙනු කළ හැකි සාධන පත්‍රයක් බැංකුවකින් ලැබීම ඇතුළත් වන්නේ ය;

(ආ) බංකොලොත් ණයකරුට බැංකුව විසින් මුදල් ගෙවීම හෝ බංකොලොත් ණයකරුගේ අණකරය හෝ විධානය මත බැංකුව විසින් මුදල් ගෙවීම ඇතුළත් වන්නේ ය; සහ

(ඇ) බැංකුව විසින් ඇපයක් හෝ ගනුදෙනු කළ හැකි සාධන පත්‍රයක් බංකොලොත් ණයකරුට ලබාදීම හෝ බංකොලොත් ණයකරුගේ අණකරය හෝ විධානය යටතේ එවැනි සාධනපත්‍රයක් ලබාදීම ඇතුළත් වේ.

(4) බංකොලොත් ණයකරුගේ පුද්ගලික නීති නියෝජිතයකු විසින් හෝ බංකොලොත් ණයකරුගේ විධානය මත මුදල් ගෙවීම හෝ දේපළ භාරදීම වටිනාකමක් සඳහා ගනුදෙනු කිරීමක් වන්නේය.

බංකොලොත් ණයකරුට සහ පැවරුම්ලාභියා කරනු ලබන ඇතැම් ගෙවීම්වල වලංගුභාවය

**131.** (1) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් පසුකාලීනව සිදු කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද එම තැනැත්තා වෙත හෝ එකී තැනැත්තා විසින් පවරනු ලැබීමෙන් හිමිකම්පාන තැනැත්තකු වෙත, යම් තැනැත්තකු විසින් මුදල් ගෙවීමක් සිදු කරනු ලබන අවස්ථාවක දී හෝ දේපළ භාර දෙනු ලබන අවස්ථාව දී මෙම වගන්තිය අදාළ වේ.

(2) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් -

(අ) බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමක් හෝ ඉල්ලීමක් ඉදිරිපත් කිරීම පිළිබඳ දැන්වීමක් කිරීමෙන් තොරව කරනු ලබන අවස්ථාවක දී; සහ

(ආ) සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුර දී කරනු ලබන අවස්ථාවක දී හෝ සද්භාවයෙන් අන්‍යාකාරයෙන් කරනු ලබන අවස්ථාවක දී,

එකී ආඥාව සත්‍ය වශයෙන් කරනු ලබන දිනයට පෙර මුදල් ගෙවීම හෝ දේපළ භාර දීම සිදු කරනු ලබන්නේ නම්, එසේ මුදල් ගෙවනු ලබන හෝ භාරදෙනු ලබන තැනැත්තා සම්බන්ධයෙන් එම මුදල් ගෙවීම හෝ දේපළ බාරදීම මගින් හොඳ නිදහස් කිරීමක් සංස්ථාපනය වන්නේ ය.

පොත් ණය පිළිබඳ පොදුවේ පැවරුම්

**132.** (1) කිසියම් ව්‍යාපාරයක නියැලී සිටින තැනැත්තකු, විසින් එකී තැනැත්තාගේ පවතින හෝ අනාගත පොත් ණය හෝ ඒවායින් ඕනෑම පන්තියක් වෙනත් අයකුට පොදුවේ පවරණු ලබන විට සහ පසුව, එකී තැනැත්තා සම්බන්ධයෙන් බංකොලොත් ආඥාවක් සිදු කරන විට පහත කරුණු අදාළ වන්නේ ය.

(2) පැවරුම (117 වන අධිකාරය) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ හෝ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇත්නම් මිස, බංකොලොත්භාවය ආරම්භ වීමේ දී පොත් ණය ගෙවා නැත්නම්, බංකොලොත් ණයකරු විසින් පොත් ණය පැවරීම, බංකොලොත්භාවය පිළිබඳ භාරකරු සම්බන්ධයෙන් අවලංගු වේ.

(3) මේ කොටසෙහි කාර්ය සඳහා, ''පැවරුම'' යන්නට, පොත් ණය මත වන සුරැකුමක් හෝ වෙනත් ගාස්තු වශයෙන් කරනු ලබන පැවරීමක් ද ඇතුළත් වේ.

(4) මේ කොටසේ කාර්ය සඳහා, ''සාමාන්‍ය පැවරුමක්'' යන්නට -

(අ) නිශ්චිත ණයකරුවන්ගෙන් පැවරීම හෝ නිශ්චිත කොන්ත්‍රාත්තු යටතේ වර්ධනය වන ණය පැවරීම සිදු කළ දිනට ගෙවීමට නියමිත පොත් ණය පිළිබඳ පැවරීමක්; හෝ

(ආ) සද්භාවයෙන් සහ වටිනාකමක් සඳහා කරන ලද ව්‍යාපාරයක පැවරීමකට පොදුවේ හෝ ණයහිමියන්ගේ ප්‍රයෝජනය සඳහා වත්කම් පැවරීමක ඇතුළත් වන පොත් ණය පිළිබඳ යම් පැවරීමක්,

ද අයත් වේ.

බංකොලොත් ණයකරුට සහ පැවරුම්ලාභියාට කරනු ලබන ඇතැම් ගෙවීම්වල වලංගුභාවය

**133.** (1) ණය ලබාදීමේ ගනුදෙනුවක පාර්ශ්වකරුවකු වන හෝ එවැනි ගනුදෙනුවක සම්බන්ධිත ණයකරුවකුට එරෙහිව බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කර ඇති අවස්ථාවකදී මේ වගන්තිය අදාළ වේ.

(2) ගනුදෙනුව අසාධාරණ වන්නේ නම් හෝ වූයේ නම් සහ බංකොලොත්භාවය ආරම්භවීමට වසර දෙකකට වැඩි කාලයකට පෙර ගනුදෙනුවකට එළඹ නොතිබියේ නම්, අධිකරණය විසින්, බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ ඉල්ලීම මත ගනුදෙනුව සම්බන්ධයෙන් ආඥාවක් සිදුකරනු ලැබිය හැකිය.

(3) මෙම වගන්තියේ කාර්ය සඳහා, ණය ලබා දෙන තැනැත්තා විසින් පිළිගෙන ඇති අවදානම පිළිබඳ සලකා බැලීමෙන් -

(අ) ණය සැපයීම සම්බන්ධයෙන් කොන්දේසි විරහිතව හෝ හදිසි අවස්ථාවලදී අතිශයින් අසාධාරණ ගෙවීම් සිදු කළ යුතු බවට නියම කරන නියම තිබේ නම් හෝ තිබුණි නම්: හෝ

(ආ) එය වෙනත් ආකාරයකින් සාධාරණ ගනුදෙනුවක සාමාන්‍ය මූලධර්මවලට දැඩි ලෙස පටහැනි නම්,

අසාධාරණ වන අතර, ඊට පටහැනි නම් මිස, මෙම වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන ගනුදෙනුවක් බව ඔප්පු කරන්නේ නම් අවස්ථාවෝචිත පරිදි අසාධාරණ වන හෝ වූ බවට උපකල්පනය කළ යුතු ය.

(4) යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් මෙම වගන්තිය යටතේ වන ආඥාවක අවශ්‍ය පරිදි, පහත සඳහන් කාරණා එකක් හෝ කිහිපයක් අඩංගු විය හැකි ය:-

(අ) ගනුදෙනුව මගින් නිර්මාණය කරන ලද කිසියම් බැඳීමක් සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් බැහැර කරනු ලබන විධිවිධාන;

(ආ) අන්‍යාකාරයකින් ගනුදෙනුවේ නියම සුළු වශයෙන් වෙනස් කරන හෝ ගනුදෙනුවේ කාර්ය සඳහා තබා ඇති ඇපයක නියම සුළු වශයෙන් වෙනස් කරන විධිවිධාන;

(ඇ) බංකොලොත් ණයකරු විසින් ගනුදෙනුව ප්‍රකාරව ගනුදෙනුවේ පාර්ශ්වකරුවකු වූ හෝ වන යම් තැනැත්තකුට ගෙවන ලද යම් මුදලක් එකී තැනැත්තා විසින් බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වෙත ගෙවනු ලැබීමට නියම කරනු ලබන විධිවිධාන;

(ඈ) ගනුදෙනුවේ කාර්ය සඳහා යම් තැනැත්තකු විසින් සුරැකුමක් ලෙස ඔහු වෙත තබා ගනු ලබන යම් දේපළක් බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වෙත භාර දීමට නියම කරනු ලබන විධිවිධාන;

(ඉ) යම් තැනැත්තන් සම්බන්ධයෙන් ගත යුතු ගිණුම් පිළිබඳ විධානය කරනු ලබන විධිවිධාන.

(5) මේ වගන්තිය යටතේ ආඥාවක් අනුව බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වෙත ගෙවිය යුතු හෝ භාර දිය යුතු වන මුදලකින් හෝ දේපළකින් බංකොලොත් බූදලය සමන්විත වේ.

(6) මෙම වගන්තිය මගින් ලබා දී ඇති බලතල, යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් මේ පනත යටතේ ක්‍රියාත්මක කළ හැකි යම් බලතලවලට සමගාමීව එම ගනුදෙනුව සම්බන්ධයෙන් එම ගනුදෙනු වටිනාකම අඩුවෙන් දක්වන ලද ගනුදෙනුවක් ලෙස සළකා ක්‍රියාත්මක කළ හැකි ය.

**134.** (1) අවශ්‍ය යම් නියම සහ කොන්දේසි මත අධිකරණයේ අවසරය ඇතිව හැර බංකොලොත්භාවය ආරම්භ වීමට දින එකසිය අසූවකට පෙර, ඇස්කිසි කිරීම හෝ වෙනත් නෛතික ක්‍රියාවලියක් අවසන් කළේ නම් මිස, (2) වන උපවගන්තියට යටත්ව, බංකොලොත් ණයකරුවකුට හෝ බංකොලොත් ණයකරුගේ දේපළට එරෙහිව වන ඇස්කිසි කිරීමක හෝ වෙනත් නෛතික ක්‍රියාවලියක ප්‍රතිලාභ ලබා ගැනීමට ණයහිමියාට හිමිකම් නොලැබෙන්නේ ය. බංකොලොත් භාවයට පෙර අවසන් කරනු ලැබුවේ නම් මිස, ඇස්කිසි කිරීමකින් වෙනත් ක්‍රියාවලියකින් ප්‍රතිලාභ නොතිබීම

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා-

(අ) චංචල හෝ නිශ්චල දේපළවලට එරෙහිව වන ආඥාවක් ක්‍රියාවේ යෙදවීමක් දේපළ භාරගැනුම්කරු හෝ පත්වීම්ලාභියකු හෝ ඇස්කිසි කිරීම භාරව සිටින තැනැත්තකු විසින් තහනමට ගැනීමෙන් හෝ සන්තකය ලබා ගැනීමෙන් සහ විකිණීම සම්පූර්ණ කිරීම මගින්; සහ

(ආ) ණයකට ඇති තහනම ණය ගෙවීම මගින් අවසන් වේ;

(3) බංකොලොත් ණයකරුගේ දේපළ -

(අ) ආඥාවක් ක්‍රියාවේ යෙදවීම භාරව සිටින පිස්කල්වරයකුගෙන්; හෝ

(ආ) යම් තහනම් ගාස්තුවක් ගෙවීම මගින්,

සද්භාවයෙන් අත්කර ගනු ලබන යම් තැනැත්තකු බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට සහ බංකොලොත් ණයකරුට එරෙහිව මනා අයිතියක් ලබා ගන්නේ ය.

(4) මෙම වගන්තියේ සඳහන් කිසිවක් මගින් 412,413,414,415,416,417,418 හෝ 419 වන වගන්ති අදාළ වීම කෙරෙහි කිසිඳු බලපෑමක් හෝ සීමා කිරීම සිදු නොකරනු ලැබිය යුතු ය.

**135.** (1) බංකොලොත්භාවය ආරම්භ වීමට දින එකසිය අසූවකට පෙර 134 වන වගන්තියේ අර්ථානුකූලව ක්‍රියාත්මක කිරීමේ ගාස්තුවක් ගෙවන ලද නමුත් ක්‍රියාත්මක කිරීම අවසන් නොකරන ලද බංකොලොත් ණයකරුගේ දේපළට එරෙහිව ආඥාවක් ක්‍රියාවේ යෙදවීමේ ක්‍රියාවලියකට මෙම වගන්තිය අදාළ වේ. බංකොලොත් භාවයේ දී පිස්කල්ගේ කාර්යභාරය

(2) වෙනත් යම් ප්‍රඥප්තියක පටහැනිව කුමක් සඳහන් වුවද, (3) වන උපවගන්තියට යටත්ව සහ ඇස්කීසි ණයහිමිගේ ඉල්ලීම මත අධිකරණය විසින් අන්‍යාකාරයෙන් ආඥා කර ඇත්නම් මිස පිස්කල්වරයා විසින් බංකොලොත්භාවය ආරම්භ වීමෙන් පසු ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් -

(අ) ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස පිස්කල්වරයාගේ සන්තකයේ පවතින හෝ සන්තකයට පත්වන හෝ භාරකාරත්වයට ලැබෙන හෝ පිස්කල්වරයාගේ පාලනය යටතට ගැනෙන බංකොලොත් ණයකරුගේ යම් දේපළක් බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වෙත භාරදිය යුතු ය; සහ

(ආ) පහත දැක්වෙන මුදල්, එනම් -

(i) ඇස්කීසි ක්‍රියාවලිය යටතේ බංකොලොත් ණයකරුගේ දේපළවලින් උපලබ්ධි වී ඇති යම් ආදායමක්;

(ii) ඇස්කීසි ක්‍රියාවලිය යටතේ ලද හෝ තහනමට ගත් බංකොලොත් ණයකරුගේ යම් මුදලක්; සහ

(iii) ඇස්කීසි ක්‍රියාවලිය යටතේ බංකොලොත් ණයකරුගේ දේපළ තහනමට ගැනීම හෝ විකිණීම වැළැක්වීම සඳහා ගෙවන ලද යම් මුදලක්,

එකී ඇස්කීසි මුදල හෝ මුදල් පිස්කල්වරයාගේ සන්තකයේ හෝ භාරකත්වයේ පවතින හෝ සන්තකයට පත් වන පාලනය යටතට ගැනනෙ හෝ අධිකරණය ගෙවනු ලැබූ සහ මේ වන විට අධිකරණය විසින් ගෙවීම් කර නොමැති දේපළ විකිණීමෙන් ලද මුදල් හෝ මුදල් වන විට, බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වෙත ගෙවනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) පිස්කල්වරයා විසින් -

(අ) (1) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ භාරදුන් දේපළෙන් අවස්ථාවෝචිත පරිදි, ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය හෝ තහනමට

ගැනීම සඳහා පිස්කල්වරයා විසින් දරන ලද වියදම්වලට වටිනාකමට සමාන බවට පිස්කල්වරයා විසින් සාධාරණව තීරණය කරනු ලබන දේපළක්; හෝ

(ආ) (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ ගෙවන ලද දේපළ විකුණා ලද ආදායමෙන් හෝ මුදල්වලින් පිස්කල්වරයා විසින් දරනු ලැබූ, අවස්ථාවෝචිත පරිදි, ආඥාව ක්‍රියාවේ යෙදවීම හෝ තහනමට ගැනීම සඳහා වැය වූ ගාස්තුවක්,

රඳවා ගත හැකි ය. නැතහොත් රඳවා ගැනීමට කටයුතු සැලැස්විය හැකි ය.

## 9 වන පරිච්ඡේදය

### දේපළ බෙදා හැරීම

බංකොලොත් භාවයේ දී බෙදාහැරීම

**136.** 111 වන වගන්තියට සහ හතරවන උපලේඛනයට අනුකූලව හිමිකම්පෑම් සඳහා මුදල් ගෙවීමේ කාර්ය සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් බංකොලොත් භාරකරු වෙත ඇති, ඕනෑම අවස්ථාවක දී සහ බංකොලොත්භාවයේ දී වියදම් ඕනෑම අවස්ථාවක දී පියවීම සඳහා අවශ්‍ය වන මුදලක් තමා වෙත රඳවා ගැනීමට යටත්ව, බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් 429 වන වගන්තියට අනුකූලව එකී මුදල් බෙදා හරිනු ලැබිය යුතු ය.

## 10 වන පරිච්ඡේදය

### බංකොලොත්භාවය අවසන්වීම

බංකොලොත් භාවයේ කාල සීමාව

**137.** (1) 138 වන වගන්තිය යටතේ හා බංකොලොත්භාවය පිළිබඳ ආඥාවේ දින සිට අවුරුදු තුනක කාලයක් ගතවීමෙන් පසු, හැකිතාක් ඉක්මනින් කළ යුතු වන නිදහස් කිරීමේ ආඥාවක් කරනු ලබන තෙක් බංකොලොත්භාවය දිගට ම බලපවත්වනු ලැබිය යුතු ය.

(2) (1) උපවගන්තියේ දක්වා ඇති කාලයට වඩා දිගු කාලයක් සඳහා බංකොලොත්භාවය දිගට ම පැවතිය හැකි ය. ණයකරුගේ ඇතුළත් කළ ණය ප්‍රමාණය රුපියල් මිලියන දහයක් ඉක්මවන්නේ නම්, බංකොලොත්භාවය වසර හතකට නොවැඩි සමස්ත කාලයක් සඳහා බලපැවැත්විය යුතු ය.

(3) අධිකරණය විසින් 141 වන හෝ 143 වන වගන්ති යටතේ නිදහස් කිරීම අත්හිටවනු ලැබූ විට දී (1) වන හෝ (2) වන උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති කාලසීමාවන්ට වඩා වැඩි කාලයක් බංකොලොත්භාවයක් දිගටම පැවතිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් නිදහස් කිරීම අත්හිටුවන විට, අධිකරණය විසින් නිදහස් කිරීම සඳහා විකල්ප දිනයක් නියම කළ යුතු අතර, එය -

(අ) (1) වන උපවගන්තිය අදාළ වන විට, ආඥාවේ දින සිට වසර තුනක කාලයක්; හෝ

(ආ) (2) වන උපවගන්තිය අදාළ වන විට, බංකොලොත් ආඥාවේ දින සිට වසර හතක කාලයක්,

ඉකුත් වන දින සිට අවුරුද්දක කාලයකට නොවැඩි විය යුතු දිනයක් විය යුතු ය.

නිදහස් කිරීම

**138.** (1) බංකොලොත්භාවයෙන් ආඥාවේ දින සිට වසර තුනක කාලයක් ඉකුත්වීමේ දී ඇතුළත් කළ ණයවල වටිනාකම රුපියල් මිලියන දහයකට නොවැඩි ණය වන විට, බංකොලොත් භාවය පිළිබඳ භාරකරු විසින් අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් බංකොලොත් ණයකරු නිදහස් කිරීම සඳහා ආඥාවක් ඉල්ලා සිටිනු ලැබිය යුතු ය.

(2) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවේ දින සිට අවුරුදු තුනක කාලයක් ගතවීමෙන් පසු දින තිහක් ඇතුළත බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර නොමැති විට, බංකොලොත් ණයකරු විසින් බංකොලොත් ණයකරු නිදහස් කිරීම තහවුරු කිරීමේ ආඥාවක් සඳහා අධිකරණයට ඉල්ලීමක් කළ හැකි ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු, 140 වන වගන්තිය යටතේ නිදහස් කිරීම අභියෝගයට ලක් කරන ඉල්ලීමක් ලැබී ඇත්නම් මිස, අධිකරණය විසින් දින අනූවක් ඇතුළත නිදහස් කිරීමේ ආඥාවක් කළ හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කරන ලද අධිකරණ ආඥාව මගින් බංකොලොත් ණයකරු බංකොලොත් ආඥාවේ දින සිට වසර තුනක කාලයක් ඉකුත්වීමෙන් පසු නිදහස් කිරීමට විධිවිධාන සලසා තිබිය යුතු ය.

(5) බංකොලොත් ආඥාවෙන් නිදහස් කිරීමේ දී, බංකොලොත් ණයකරුගේ ඇතුළත් ණය අවලංගු විය යුතු අතර, බංකොලොත් ණයකරු විසින් ණයට අදාළව ගෙවිය යුතු දඩ මුදල්, පොලී සහ වෙනත් මුදල්ද ඇතුළුව ණය වලින් යම් කොටසක් ගෙවීමට බංකොලොත් ණයකරු බැඳී නොමැත්තේ ය.

(6) මෙම වගන්තිය යටතේ ණයෙන් නිදහස් කිරීම මගින් 37 වන වගන්තිය යටතේ බැහැර කරන ලද ණයක් ලෙස නිශ්චිතව දක්වා ඇති කිසිඳු ණයකින් හෝ වගකීමකින් බංකොලොත් ණයකරු නිදහස් නොකළ යුතු ය.

(7) මෙම වගන්තිය යටතේ නිදහස් කිරීමක් මගින් නිදහස් කරනු ලබන දිනට -

(අ) නිදහස් කළ ණයකරුගේ ව්‍යාපාරික හවුල්කරුවකු වන යම් තැනැත්තකු;

(ආ) නිදහස් කළ ණයකරුගේ හවුල් භාරකරුවකු වන යම් තැනැත්තකු;

(ඇ) නිදහස් කළ ණයකරු සමග එක්ව හෝ ගිවිසුමකට යටත්ව සිටින තැනැත්තකු; හෝ

(ඈ) නිදහස් කළ ණයකරුගේ ඇපකරුවකු හෝ ඇපකරුවකුගේ ස්වභාවයේ වන තැනැත්තකු,

යම් වගකීමකින් නිදහස් කරනු නොලැබිය යුතු ය.

නිදහස් කිරීම: අධි වටිනාකමකින් යුතු බංකොලොත් භාවය

**139.** (1) ණයකරුගේ ඇතුළත් ණය ප්‍රමාණය රුපියල් මිලියන දහය ඉක්මවන අවස්ථාවක දී නම්, බංකොලොත් ආඥාවේ දින සිට වසර හතක කාලයක් ඇතුළත දී බංකොලොත් භාවය පිළිබඳ භාරකරු විසින් බංකොලොත් තැනැත්තා නිදහස් කිරීම තහවුරු කරන ආඥාවක් සඳහා ඉල්ලීමක් අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය.

(2) බංකොලොත්භාවයේ භාරකරු බංකොලොත්භාවය පිළිබඳ ආඥාවේ දින සිට වසර හතක කාලයක් ඉකුත්වී දින තිහක් ඇතුළත (1) වන උපවගන්තිය යටතේ තවමත් ඉල්ලීමක් ඉදිරිපත් කර නොමැති නම්, බංකොලොත් ණයකරු විසින් අධිකරණයට අයදුම්පතක් ඉදිරිපත් කර බංකොලොත් ණයකරු නිදහස් කිරීම සඳහා ආඥාවක් ඉල්ලා සිටිමින් අධිකරණයට ඉල්ලීමක් කළ හැකිය.

(3) (1) වන හෝ (2) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු, අධිකරණය විසින් දින අනූවක් ඇතුළත, 140 වන වගන්තිය යටතේ නිදහස් කිරීම අභියෝගයට ලක් කර ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත්නම් මිස, නිදහස් කිරීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(4) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවේ දින සිට වසර හතක කාලයක් ඉකුත් වීමෙන් පසු බංකොලොත් ණයකරු නිදහස් වන බවට (3) වන උපවගන්තිය යටතේ වූ අධිකරණ ආඥාව මගින් විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය.

(5) බංකොලොත් ආඥාවෙන් නිදහස් කරනු ලැබීමෙන් පසු බංකොලොත් ණයකරුගේ ඇතුළත් ණය අවලංගු විය යුතු අතර, ණයට අදාළව ගෙවිය යුතු යම් දඩ මුදල්, පොලී සහ වෙනත් මුදල් ඇතුළුව ණයවලින් යම් කොටසක් ගෙවීමේ වගකීමට බංකොලොත් ණයකරු බැඳී නොමැත්තේ ය.

(6) මේ වගන්තිය යටතේ ණයවලින් නිදහස්වීම මගින් 37 වන වගන්තිය යටතේ බැහැර කරන ලද ණයක් ලෙස නිශ්චිතව දක්වා ඇති කිසිදු ණයක් හෝ වගකීමකින් බංකොලොත් ණයකරු නිදහස් නොකළ යුතු ය.

(7) මේ වගන්තිය යටතේ වන නිදහස් කිරීමක් මගින්, නිදහස් කරනු ලබන දිනට -

(අ) නිදහස් කළ ණයකරුගේ ව්‍යාපාරික හවුල්කරුවකු වන යම් තැනැත්තකු;

(ආ) නිදහස් කළ ණයකරුගේ සම භාරකරුවකු වන යම් තැනැත්තකු;

(ඇ) නිදහස් කළ ණයකරු සමග එක්ව බැඳීමකට හෝ ගිවිසුමකට යටත්ව සිටින තැනැත්තකු; හෝ

(ඈ) නිදහස් කළ ණයකරුගේ ඇපකරුවකු වන හෝ ණයකරුගේ ඇපකරුවකුගේ ස්වභාවයේ වන යම් තැනැත්තකු,

යම් වගකීමකින් නිදහස් කරනු නොලැබිය යුතු ය.

නිදහස් කිරීම අභියෝගයට ලක් කිරීම සඳහා වූ ඉල්ලීම

**140.** (1) බංකොලොත් ණයකරුවකු නිදහස් කිරීමකට හබ කිරීම සඳහා භාරකරුවකු හෝ ණයහිමියකු විසින් අධිකරණයට ඉල්ලීමක් කළ කළ හැකි ය.

(2) බංකොලොත් ණයකරු නිදහස් කිරීම සම්බන්ධයෙන් හබ කිරීම සඳහා අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් නිදහස් කිරීම වන දිනට දින එකසිය අසූවකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

(3) ඉල්ලීමට අදාළ හේතු ද ඇතුළුව, නිදහස් කිරීම හබ කිරීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳව, ඉල්ලුම්කරු විසින්, බංකොලොත් ණයකරු වෙත ලිඛිත දැන්වීමක් යැවිය යුතු ය.

(4) ඉල්ලුම්කරු බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වන විට, ඉල්ලුම්කරු විසින් ණයහිමියන් වෙත ඉල්ලීම් පිළිබඳ ලිඛිත දැන්වීමක් සැපයිය යුතු ය.

(5) ඉල්ලුම්කරු ණයහිමියකු වන විට, ඉල්ලුම්කරු විසින් බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට ඉල්ලුම් පත්‍රය පිළිබඳ ලිඛිත දැන්වීමක් සැපයිය යුතු ය.

(6) නිදහස් කිරීමක් පිළිබඳ හබ කිරීම සඳහා අධිකරණයට කරනු ලබන ඉල්ලීමක්, 32, 112 , 113 සහ 114 යන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති බැඳීම්වලට අනුකූල වීමට බංකොලොත් ණයකරු අපොහොසත් වීම මත පදනම් විය යුතු ය.

(7) බංකොලොත් ණයකරු නිදහස් කිරීමට විරුද්ධ වීම සඳහා ඉල්ලීමක් ලැබීමෙන් පසු, එම ඉල්ලීම විභාග කිරීම සඳහා අධිකරණය විසින් ඉල්ලීම ලැබීමෙන් පසු දින හතළිස්පහක් ඇතුළත විය යුතු දිනයක් නියම කළ යුතු ය.

(8) නිදහස් කිරීම අභියෝගයට ලක් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීම විභාග කරනු ලබන බවට අධිකරණය විසින් බංකොලොත් ණයකරු වෙත සහ ණයහිමියන්ට ලිඛිතව දැන්විය යුතු ය.

නිදහස් කිරීම: අතුරු අත්හිටුවීම

**141.** (1) බංකොලොත් ණයකරුගේ නිදහස් කිරීම අභියෝගයට ලක් කරන ඉල්ලීමක් ලැබීමෙන් පසු, නඩු විභාගයකින් පසුව නිදහස් කිරීම අත්හිටුවීමේ ආඥාවක් කරනු ලැබිය හැකි බවට නිගමනය කිරීමට සාධාරණ හේතු ඇති බවට

අධිකරණය සෑහීමකට පත් වේ නම්, අධිකරණය විසින්, නඩු විභාගය අවසන් වන තෙක් බංකොලොත් ණයකරුගේ නිදහස් කිරීම තාවකාලිකව අත්හිටුවමින් අතුරු නියෝගයක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අතුරු නියෝගයක් කරනු ලබන විට, 32, 112, 113 සහ 114 යන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති පුද්ගලික වස්තු බංකොලොත්භාවයට අදාළ කාර්යවලට ණයකරු විසින් කොපමණ දුරට අනුකූල වී ඇත්දැයි විමර්ශනය කරන ලෙසට බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට, අධිකරණය විසින් නියෝග කරනු ලැබිය හැකිය.

(3) බංකොලොත් ණයකරුගේ නිදහස් කිරීම හබ කිරීම සඳහා වූ ඉල්ලීමක් 140 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් කාලසීමා ඉක්මවන භාරකරුවකු හෝ ණයහිමියකු විසින් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, අධිකරණය විසින් -

(අ) ඉල්ලීම ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය සිදුවී ඇත්තේ ඉල්ලුම්කරුගේ පාලනයෙන් තොර විශේෂ අවස්ථානුගත කරුණු නිසා බවට; හෝ

(ආ) 140 වන වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ දී ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති කරුණු දැන නොසිටි බවට,

අධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක, අධිකරණය විසින්, ප්‍රමාද වූ ඉල්ලීම ඉදිරිපත් කිරීමට අවසර දෙනු ලැබිය හැකි ය.

(4) නිදහස් කිරීමක් පිළිබඳ හබ කිරීම සඳහා වූ ඉල්ලීම විභාග කිරීමට පෙර බංකොලොත් ණයකරුගේ කටයුතු පිළිබඳව බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් පවත්වන විමර්ශනය තවදුරටත් පැවැත්විය යුතු බවට අධිකරණයට ඒත්තු ගොස් ඇති විට අධිකරණය විසින් තවදුරටත් අතුරු ආඥාවක් නිකුත් කරමින් -

(අ) බංකොලොත් ණයකරුගේ නිදහස් කිරීම තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය; සහ

(ආ) විමර්ශනය සිදු කිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය කාලසීමාවක් සඳහා නඩු විභාගය කල් දැමිය හැකි ය.

(5) (1) වන සහ (4) වන උපවගන්ති යටතේ අතුරු නියෝගයක් නිකුත් කරනු ලැබිය යුතු ද හෝ (3) වන උපවගන්තිය යටතේ ප්‍රමාද වූ ඉල්ලුම් පත්‍රයක් සඳහා අවසර ලබා දෙනු ලැබිය යුතු ද යන්න තීරණය කිරීමේ දී, අධිකරණය විසින් ඒ අනුව බංකොලොත් කාලය දීර්ඝ වීමෙන් බංකොලොත් ණයකරුට සිදු විය හැකි යම් අසාධාරණයක් සම්බන්ධයෙන් සැලකිල්ලට යොමුකරනු ලැබිය යුතුය.

බංකොලොත් වාර්තාව: නිදහස් කිරීම අභියෝගයට ලක් කිරීමේ ඉල්ලීම

**142.** (1) 140 වන වගන්තිය යටතේ නිදහස් කිරීම අභියෝගයට ලක් කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති විට බංකොලොත් භාරකරු විසින් බංකොලොත්භාවය පිළිබඳ වාර්තාවක් සකස් කර එය අධිකරණයේ ගොනු කළ යුතු ය.

(2) බංකොලොත් භාරකරු විසින් පහත දැක්වෙන කරුණු පිළිබඳව වාර්තා කළ යුතු ය:-

(අ) බංකොලොත් ණයකරුගේ කටයුතු පිළිබඳව;

(ආ) මේ පනත යටතේ පනවා ඇති ණයකරුගේ බැඳීම් බංකොලොත් ණයකරු විසින් සිදු කර ඇති ආකාරය සහ/හෝ බංකොලොත් ණයකරු අධිකරණයේ නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීම;

(ඇ) නිදහස් කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතුවක් තිබේ ද යන්න පිළිබඳව භාරකරුගේ මතය; සහ

(ඇ) බංකොලොත් ණයකරුගේ නිදහස් කිරීම සම්බන්ධයෙන් අධිකරණය විසින් තීරණය කිරීමේ දී අධිකරණයට සහාය වන බවට බංකොලොත් භාරකරු විශ්වාස කරන බංකොලොත්භාවයට අදාළ වෙනත් යම් කරුණක්.

(3) බංකොලොත් ණයකරු නිදහස් කිරීම හබ කිරීම සඳහා වූ ඉල්ලීම විභාග කිරීමට දින විසිඑකකට කලින් ඉදිරිපත්

කරන බංකොලොත්භාවය පිළිබඳ වාර්තාව සම්බන්ධයෙන් ලිඛිත දැන්වීමක් බංකොලොත් භාරකරු විසින් ණයකරුට සහ ණයහිමියන්ට ඉදිරිපත් කළ යුතු ය.

(4) ණයහිමියකු විසින් බංකොලොත් වාර්තාවේ නිශ්චිතව දක්වා ඇති කරුණු හැර වෙනත් හේතු මත ණයකරු නිදහස් කිරීමත් අභියෝගයට ලක් කරන්නේ නම්, ණයහිමියා විසින්, බංකොලොත් භාරකරු සහ බංකොලොත් ණයකරු ලිඛිත දැන්වීමක් මගින් නිදහස් කිරීම අභියෝගයට ලක් කරන එම හේතු, ඉල්ලීම විභාග කරන දිනයට දින දහයකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

නිදහස් කිරීම අභියෝගයට ලක් කිරීම සඳහා වූ ඉල්ලීම පිළිබඳව අධිකරණ තීරණය

**143.** (1) නිදහස් කිරීම අභියෝගයට ලක් කිරීම සඳහා වූ ඉල්ලීම විභාග කිරීමේ දී, අධිකරණය විසින්, අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන-

(අ) වහාම සහ කොන්දේසි විරහිතව බංකොලොත් ණයකරු නිදහස් කළ යුතු ය; නැතහොත්

(ආ) බංකොලොත් ණයකරු නිදහස් කර එම ආඥාව නිශ්චිත කාලයකට අත්හිටුවනු ලැබිය යුතු ය.

(2) නිදහස් කිරීමේ ආඥාවක් අධිකරණය විසින් අත්හිටුවනු ලබන අවස්ථාවක දී, එම ආඥාවේ බලපෑම විය යුත්තේ -

(අ) 137 වන වගන්තියේ සහ 138 වන වගන්තියේ (1) වන උපවගන්තිය අදාළ වන අවස්ථාවක දී බංකොලොත් ආඥාවේ දින සිට අවුරුදු තුනක කාලයක් ගත වීමෙන්; හෝ

(ආ) 137 වන සහ 139 වන වගන්තිවල (2) වන උපවගන්තිය අදාළ වන අවස්ථාවක දී බංකොලොත් ආඥාවේ දින සිට අවුරුදු හතක් ගත වීමෙන්,

අවුරුදු එකකට නොඅඩු කාලයකට පෙර බංකොලොත් ණයකරු නිදහස් කළ යුතු බව ය.

බංකොලොත්භාවය නිදහස් කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

**144.** (1) අධිකරණය විසින්, බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ හෝ ණයහිමියාගේ ඉල්ලීම මත සහ බංකොලොත් ණයකරුට දැනුම් දීමකින් සහ නඩු විභාගයකින් පසුව, 138 වන හෝ 139 වන වගන්ති යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබිය හැකි ය.

(2) නිදහස් කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම සඳහා මේ වගන්තිය යටතේ වන ඉල්ලීමක්, නිදහස් කිරීම කළ දින සිට අවුරුදු එකක කාලයක් තුළදී පමණක් සිදු කළ හැකි ය.

(3) අධිකරණය විසින් -

(අ) බංකොලොත් ණයකරු විසින් වංචනිකව සහ නිදහස් කිරීම ලබාගත් බවට සහ එම නිදහස් කිරීම කරන තෙක් එම වංචාව පිළිබඳව ඉල්ලුම්කරු දැන නොසිටි බවට අධිකරණය සෑහීමට පත්වන්නේ නම්; හෝ

(ආ) 34 වන, 35 වන, 36 වන යන වගන්තිවල රීති යටතේ ණයකරුගේ ආදායම සහ දේපළ ණයහිමියන්ට බෙදා හැරීමෙන් නිදහස් කරනු නොලබන අවස්ථාවක දී එම ආදායම සහ දේපළ පිළිබඳව බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට වාර්තා කිරීම ණයකරු විසින් පැහැර හැර ඇති බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම්,

මේ වගන්තිය යටතේ නිදහස් කිරීමක් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබිය හැකි ය.

(4) නිදහස් කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ කරනු නොලැබුවේ නම්, මේ වගන්තිය යටතේ නිදහස් කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම මගින්, බංකොලොත් ණයකරුට හැර, වෙනත් තැනැත්තකුට තිබූ අයිතිවාසිකම් හෝ ප්‍රතිකර්මවලට අගතියක් සිදු නොවන්නේ ය.

(5) නිදහස් කිරීමෙන් පසු බංකොලොත් ණයකරු විසින් අත්කර ගනු ලැබූ සහ ප්‍රත්‍යාදිෂ්ඨ කරන දිනයේ දී බංකොලොත් ණයකරු වෙත පැවරී තිබූ දේපළ -

(අ) යම් පිළිබැඳීම්වලට යටත්ව, බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වෙත පැවරෙනු ලබන්නේ ය; සහ

(ආ) නිදහස් කිරීමේ දින සිට බංකොලොත් ණයකරු විසින් ලබාගත් ණය ගෙවීම සඳහා ඉහත කී දේපළ බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් යොදා ගත යුතු ය.

බංකොලොත් භාවය පිළිබඳ නියෝගය අවලංගු කිරීම

**145.** (1) කවර හෝ අවස්ථාවක දී -

(අ) ආඥාව කරනු ලැබූ අවස්ථාවේ පැවති කිසියම් හේතුවක් මත, එම ආඥාව සිදු නොකළ යුතු ව තිබුණු බව; හෝ

(ආ) බංකොලොත්භාවය පිළිබඳ ආඥාව කිරීමෙන් පසු බංකොලොත්භාවයට අදාළ ඔප්පු කළ හැකි ණය සහ වියදම් සියල්ල, අධිකරණය සෑහීමට පත් වන පරිදි, ගෙවා ඇති බව හෝ ඒ සඳහා සුරැකුම් තබා ඇති බව,

අධිකරණයට පෙනී යන්නේ නම්, බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) බංකොලොත් ණයකරු බංකොලොත්භාවයෙන් නිදහස් කර තිබුණ ද, එසේ නැති වුව ද අධිකරණය විසින් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් අවලංගු කළ හැකි ය.

(3) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් අධිකරණය විසින් අවලංගු කරන අවස්ථාවක -

(අ) මේ කොටසේ යම් විධිවිධානයක් යටතේ හෝ නිල දේපළ භාරගැනුම්කරු බංකොලොත්භාවය පිළිබඳ භාරකරු මගින් හෝ අධිකරණයේ නිල දේපළ භාරගැනුම්කරුගේ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ හෝ අධිකරණයේ අධිකාරය යටතේ දේපළ, විකිණීම හෝ බැහැර කිරීම, මුදල් ගෙවීම හෝ යථා පරිදි නමුත් කරන වෙනත් දේ යන ක්‍රියා වලංගු විය යුතු ය;

(ආ) කිසියම් බංකොලොත් බූදලයට අයත් යම් දේපළක් එවැනි යම් විධිවිධානයක් යටතේ පවරනු ලැබුවහොත් බංකොලොත් භාරකරුවකු විසින් එම දේපළ අධිකරණය විසින් පත් කරනු ලබන තැනැත්තකු වෙත පවරනු ලැබිය යුතු අතර, එවැනි පත් කිරීමක් කරනු නොලැබුවහොත් අධිකරණය විසින් විධාන කරනු ලබන නියමයන් මත එම දේපළ බංකොලොත් ණයකරු වෙත ආපසු පවරනු ලැබිය යුතු ය.

බංකොලොත්භාවය අතරතුර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා ඉල්ලීමක් කිරීම

**146.** (1) IV වන කොටස යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වූ යෝජනාවක් පිළියෙල කිරීමේ කාර්ය සඳහා, බංකොලොත්භාවය අද්මිනිස්ත්‍රාසි කිරීම දින අනුවක සීමිත කාලයක් සඳහා අත්හිටුවීමේ ආඥාවක් ලබා ගැනීම සඳහා බංකොලොත් ණයකරු විසින් අධිකරණයට ඉල්ලුම් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකරණයක් විසින් නියෝගයක් ලබා දී ඇති අවස්ථාවක, ණයකරු විසින් IV වන කොටසෙහි නිශ්චිතව දක්වා ඇති කාර්යපටිපාටිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා යෝජනාවක් සකස් කළ යුතු ය.

(3) 52 වන වගන්තිය යටතේ බංකොලොත් ණයකරුවකු සම්බන්ධයෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වන යෝජනාවක් ණයහිමියන් විසින් අනුමත කරනු ලැබ 54 වන වගන්තිය යටතේ අධිකරණය විසින් එම යෝජනාව තහවුරු කර ඇති අවස්ථාවක දී -

(අ) එම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ IV වන කොටසේ විධිවිධාන ප්‍රකාරව බලාත්මක විය යුතු ය; සහ

(ආ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ තහවුරු කිරීම සඳහා අධිකරණය විසින් කරන ලද ආඥාව මගින් 145 වන වගන්තියට අනුකූලව බංකොලොත්භාවය පිළිබඳ ආඥාව අවලංගු කිරීම සඳහා ද විධිවිධාන සැලැස්විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ අධිකරණයක් විසින් බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් අවලංගු කර ඇති අවස්ථාවක දී එම අවලංගු කිරීම සම්බන්ධයෙන් 145 වන වගන්තියේ (3) වන උපවගන්තියේ දක්වා ඇති බලපෑම් තිබිය යුතු ය.

## 11 වන පරිච්ඡේදය

### නිල දේපළ භාර ගැනුම්කරු

බංකොලොත්භාවයේ දී ණයකරුගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් නිල දේපළ භාරගැනුම්කරුගේ බලතල

**147.** (1) නිල දේපළ භාරගැනුම්කරු විසින් බංකොලොත් ණයකරුගේ ක්‍රියාකලාපය විමර්ශනය කර -

(අ) මේ පනත යටතේ හෝ මේ පනත මගින් ඉවත් කරන ලද පනතක් යටතේ වරදක් සංයුක්ත වන ක්‍රියාවක්; හෝ

(ආ) බංකොලොත් ණයකරු නිදහස් කිරීම කරනු ලැබීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කිරීම හෝ අත්හිටුවීම සාධාරණීකරණය කරන යම් ක්‍රියාවක්,

බංකොලොත් ණයකරු විසින් සිදු කර තිබේ ද යන්න විශ්වාස කිරීමට හේතු තිබේ ද යන්න දක්වමින් අධිකරණය වෙත වාර්තා කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ විමර්ශනයක් අනවශ්‍ය බවට නිල දේපළ භාරගැනුම්කරු සලකනු ලබන අවස්ථාවකට, (1) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

(3) අධිකරණය විසින් විධානය කරනු ලබන පරිදි බංකොලොත් ණයකරුගේ ක්‍රියාකලාපයට අදාළ වෙනත් යම් වාර්තා නිල දේපළ භාරගැනුම්කරු විසින් පිළියෙල කළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ නිල දේපළ භාරගැනුම්කරු විසින් පිළියෙල කරනු ලබන වාර්තාවක් යම් නඩු කටයුත්තක දී බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(5) බංකොලොත් ණයකරු පිළිබඳ ප්‍රසිද්ධ පරීක්ෂණයන් කිරීම සඳහා අධිකරණයට ඉල්ලුම් කිරීමට නිල දේපළ භාරගැනුම්කරුට ඇති බලය සම්බන්ධයෙන් නිල දේපළ භාරගැනුම්කරු විසින් 96 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(6) 96 වන වගන්තිය යටතේ බංකොලොත් ණයකරුව ප්‍රසිද්ධියේ පරීක්ෂා කිරීමේ දී නිල දේපළ භාරගැනුම්කරු විසින් අවශ්‍ය යයි සලකනු ලබන ආකාරයට, නිල දේපළ භාරගැනුම්කරු විසින් ඒ සඳහා සහභාගි විය යුතු ය.

(7) මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමට අදාළව නීතිපතිවරයා විසින් විධානය කළ හැකි යම් සහායක් නිල දේපළ භාරගැනුම්කරු විසින් නීතිපතිවරයාට ලබා දිය යුතු ය.

බංකොලොත් භාවය සම්බන්ධයෙන් නිල දේපළ භාරගැනුම්කරුගේ පොදු කාර්යභාරය

**148.** (1) 97 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අවස්ථානුගත කාරණාවල දී නිල දේපළ භාරගැනුම්කරු බංකොලොත්භාවය පිළිබඳ භාරකරු ලෙස ක්‍රියා කළ යුතු ය.

(2) 91 වන වගන්තියේ දක්වා ඇති අවස්ථානුගත කරුණුවල දී නිල දේපළ භාරගැනුම්කරු විසින් අන්තර් කාලීන දේපළ භාරගැනුම්කරුවකු ලෙස ක්‍රියා කළ යුතු ය.

(3) මේ පනත යටතේ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීමට හෝ දැන්වීම් කිරීමට අවශ්‍ය විය හැකි සියලු ම කාරණා සම්බන්ධයෙන් නිල දේපළ භාරගැනුම්කරු විසින් ප්‍රසිද්ධ දැන්වීම් පළ කර දැන්විය යුතු ය.

12 වන පරිච්ඡේදය

**බංකොලොත්භාවයේ හවුල්කාරිත්වය**

හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් බංකොලොත්භාවය පිළිබඳ ඉල්ලීම් සහ බංකොලොත්භාවය පිළිබඳ පෙත්සම්

**149.** (1) හවුල් ව්‍යාපාරයක සියලු හවුල්කරුවන්ට එරෙහිව බංකොලොත් පෙත්සමක් ඉදිරිපත් කිරීමට යම් ණයහිමියකුගේ ණය ප්‍රමාණවත් වන අවස්ථාවක, එම ණයහිමියා විසින් 85 වන වගන්තිය යටතේ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් එක් අයකුට හෝ වැඩි ප්‍රමාණයකට එරෙහිව බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමක් ඉදිරිපත් කළ හැකි ය.

(2) 81 වන සහ 82 වන වගන්ති යටතේ බංකොලොත් ආඥාවක් ලබා ගැනීමට සියලු ණයකරුවන් සුදුසුකම් ලබා ඇත්නම්, හවුල් ව්‍යාපාරයක කොටස්කරුවන් වන ණයකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනෙකු විසින්, 81 වන වගන්තිය යටතේ බංකොලොත්භාවය පිළිබඳ ඒකාබද්ධ ඉල්ලීමක් ගොනු කළ හැකි ය.

(3) බංකොලොත්භාවය පිළිබඳ ඒකාබද්ධ ඉල්ලීමක් සම්බන්ධයෙන් 84 වන වගන්තිය යටතේ බංකොලොත් ආඥාවක් කරනු ලැබූ විට, එම ආඥාව ණයකරුවන්ට එක්ව හා වෙන් වෙන්ව අදාළ වන්නේ ය.

අධිකරණය විසින් පෙත්සම නිෂ්ප්‍රභ කිරීම

**150.** බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමකට වග උත්තරකරුවන් එක් අයකුට වඩා වැඩියෙන් සිටින අවස්ථාවකදී නම්, අධිකරණය විසින්, අනෙක් වගඋත්තරකරුවන්ට එරෙහිව ඇති පෙත්සමේ ඇති බලපෑම අගති විරහිතව වගඋත්තරකරුවන් එක් අයකු හෝ කිහිප දෙනකුගේ පෙත්සම සම්බන්ධයෙන් නිෂ්ප්‍රභ කළ හැකි ය.

හවුල්කරුවන්ගේ දේපළ එකම භාරකරු වෙත පැවරිය යුතු බව

**151.** (1) හවුල් ව්‍යාපාරයක එක් සාමාජිකයකුට එරෙහිව වන බංකොලොත්භාවය පෙත්සමකට අදාළව 90 වන වගන්තිය යටතේ බංකොලොත් ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක-

(අ) එම හවුල් ව්‍යාපාරයේ සාමාජිකයකුට එරෙහිව හෝ සාමාජිකයකු විසින් ගොනු කරනු ලබන වෙනත් බංකොලොත් පෙත්සමක් හෝ ඉල්ලීමක් පළමුව සඳහන් කළ පෙත්සම සමඟ ගොනු කළ යුතු ය;

(ආ) අධිකරණය විසින් අන්‍යාකාරයකින් විධාන කරන්නේ නම් මිස, පළමුව සඳහන් කළ හවුල් ව්‍යාපාරයේ සාමාජිකයාගේ බංකොලොත් බූදලය සම්බන්ධයෙන් පත් කරනු ලැබිය හැකි, පරිදි එම බංකොලොත් භාරකරුම ඒ සඳහා පත් කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) අධිකරණය විසින්, එය සුදුසු යැයි සලකනු ලබන පරිදි නඩු කටයුතු ඒකාබද්ධ කිරීම සඳහා යම් විධාන කරනු ලැබිය හැකි ය.

(2) හවුල් ව්‍යාපාරයක එක් සාමාජිකයකු විසින් කරන ලද බංකොලොත්භාවය පිළිබඳ ඉල්ලීමක් සම්බන්ධයෙන් 84 වන වගන්තිය යටතේ බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක -

(අ) එම ව්‍යාපාරයේ සාමාජිකයකුට එරෙහිව හෝ එම සාමාජිකයා විසින් කරනු ලබන වෙනත් බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමක් හෝ ඉල්ලීම, පළමුව සඳහන් කළ ඉල්ලීම සමඟ ගොනු කළ යුතු ය;

(ආ) අධිකරණය විසින් අන්‍යාකාරයකින් ආඥාව කරන්නේ නම් මිස, පළමුව සඳහන් කළ හවුල් ව්‍යාපාරයේ සාමාජිකයාගේ බංකොලොත් බූදලය සම්බන්ධයෙන් පත් කරනු ලැබිය හැකි පරිදි, එම බංකොලොත් භාරකරුවම ඒ සඳහා පත් කරනු ලැබිය යුතුය; සහ

(ඇ) අධිකරණය විසින් එය සුදුසු යයි සලකන පරිදි නඩු කටයුතු ඒකාබද්ධ කිරීම සඳහා යම් විධානයක් කරනු ලැබිය හැකිය.

බංකොලොත් භාරකරු විසින් සහ බංකොලොත් ණයකරුගේ හවුල්කරු විසින් ගනු ලබන ක්‍රියාමාර්ග

**152.** (1) හවුල් ව්‍යාපාරයක සාමාජිකයකු සම්බන්ධයෙන් බංකොලොත් ආඥාවක් කරනු ලැබ ඇති අවස්ථාවක, බංකොලොත්භාවය පිළිබඳ භාරකරුගේ සහ බංකොලොත් ණයකරුගේ හවුල්කරුගේ නම්වලින් යම් නඩුකරයක් ආරම්භ කිරීමට සහ නඩු පැවරීමට අධිකරණය විසින් බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට බලය පවරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ නඩු කටයුත්තක් ආරම්භ කිරීමට සහ නඩු පැවරීමට අධිකරණය විසින් බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට බලය පවරා ඇති අවස්ථාවක, එම නඩුකරයට අදාළ එවැනි බංකොලොත් ණයකරුගේ හවුල්කරු එම ක්‍රියාවට අදාළ ණයෙන් හෝ ඉල්ලීමෙන් නිදහස් කිරීම වලංගු නොවිය යුතු ය.

(3) බංකොලොත්භාවය පිළිබඳ භාරකරුවකු විසින් (1) වන උපවගන්තිය යටතේ නඩු කටයුත්තක් ආරම්භ කිරීමට සහ නඩු පැවරීමට අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කරන අවස්ථාවක දී, බංකොලොත්භාවය පිළිබඳ භාරකරු විසින් බංකොලොත් ණයකරුගේ හවුල්කරුට, එම ඉල්ලීම පිළිබඳ ලිඛිත දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

(4) බංකොලොත්භාවය පිළිබඳ භාරකරුවකු විසින් (1) වන උපවගන්තිය යටතේ නඩු කටයුත්තක් ආරම්භ කිරීමට සහ නඩු පැවරීමට අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කරන අවස්ථාවක දී, බංකොලොත් ණයකරුගේ හවුල්කරුට සාධාරණ හේතුවක් පෙන්වමින් ඉල්ලීම අභියෝගයට ලක් කළ හැකි ය.

(5) බංකොලොත් ණයකරුගේ හවුල්කරුවකු (4) වන උපවගන්තිය යටතේ ඉල්ලීම අභියෝගයට ලක් කරනු ලබන අවස්ථාවක දී -

(අ) අධිකරණය විසින්, අවශ්‍ය පරිදි, එවැනි හවුල්කරුවකුට නඩු ගාස්තුවෙන් ඔහුගේ නියමිත කොටස ලබාදෙන ලෙසට ආඥා කළ හැකි ය; සහ

(ආ) එම හවුල්කරු එයින් කිසිදු ප්‍රතිලාභයක් ඉල්ලා නොසිටින්නේ නම්, එම හවුල්කරුට අධිකරණය විසින් විධානය කරනු ලබන පරිදි ඒ සම්බන්ධයෙන් ගාස්තුවට එරෙහිව හානි පූර්ණය කරනු ලැබිය යුතු ය.

ඒකාබද්ධ කොන්ත්‍රාත්වලට එරෙහිව නඩු

**153.** බංකොලොත් ණයකරුවකු, යම් තැනැත්තකු හෝ තැනැත්තන් සමඟ ඒකාබද්ධව යම් කොන්ත්‍රාත්තුවක කොන්ත්‍රාත්කරුවකු වන අවස්ථාවක දී, බංකොලොත් ණයකරු සම්බන්ධ නොකර ගනිමින් කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් එම තැනැත්තා හෝ තැනැත්තන් විසින් එම තැනැත්තාට හෝ තැනැත්තන්ට එරෙහිව නඩු පැවරීමට හෝ නඩු පවරනු ලැබීමට හැකි ය.

හවුල් ව්‍යාපාරයේ නමින් නඩු කටයුතු පවත්වාගෙන යාම

**154.** (1) හවුල්කරුවන් වීම හේතුවෙන් යම් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් හෝ හවුල් ව්‍යාපාර නාමයක් යටතේ ව්‍යාපාර කරගෙන යන යම් තැනැත්තෙක්, විසින් හවුල් ව්‍යාපාරයේ නාමයෙන් මෙම පනත යටතේ නඩු පැවරීමට හෝ නඩු පවරනු ලැබීමට හැකි ය.

(2) (1) වන උපවගන්තියේ අදාළ වන අවස්ථානුගත කරුණු මත, උනන්දුවක් දක්වන යම් තැනැත්තකුගේ ඉල්ලීමක් මත, එවැනි සමාගමක හවුල්කරුවන් වන තැනැත්තන්ගේ නම් හෝ එම හවුල්කරුගේ නම අධිකරණය විසින් විධානය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකින් හෙළිදරව් කිරීමට හෝ දිවුරුමක් මත සත්‍යාපනය කිරීමට ආඥා කරනු ලැබිය හැකිය.

## VII කොටස

### පුද්ගලික බංකොලොත් ලේඛනය

අධිකාරිය විසින් පුද්ගලික බංකොලොත් ලේඛනය පවත්වාගෙන යා යුතු බව

**155.** (1) අධිකාරිය විසින් පුද්ගලික බංකොලොත්භාවය පිළිබඳ ලේඛනයක් සකස් කර පවත්වාගෙන යා යුතු ය.

(2) පුද්ගලික බංකොලොත්භාවය පිළිබඳ ලේඛනය ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් සහ අධිකාරිය තීරණය කරනු ලබන වෙනත් ආකාරයක් ඇත්නම් ඒ ආකාරයෙන් පැවතිය යුතු ය.

පුද්ගලික බංකොලොත්භාවය පිළිබඳ ලේඛනයේ කාර්ය

**156.** (1) පුද්ගලික බංකොලොත්භාවය පිළිබඳ ලේඛනයක්, පුද්ගලික බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් ක්‍රියාත්මක වන්නේ යම් ණයකරුවන් සම්බන්ධයෙන් ද එම ණයකරුවන් පිළිබඳ වාර්තා සහ තොරතුරු පවත්වාගෙන යාමේ කාර්යය සඳහා පැවතිය යුතු ය.

(2) පුද්ගලික බංකොලොත් ලේඛනයෙහි අමතර කාර්ය වනුයේ –

(අ) මේ පනත යටතේ නිල දේපළ භාර ගැනුම්කරුගේ, අධිකාරියේ, අධිකරණවල, පුද්ගලික වස්තු බංකොලොත් නිලධරයන්ගේ හෝ වෙනත් තැනැත්තකුගේ අනුකූලතාව, විගණනය සහ වෙනත් උපකාරක හා පරිපාලන කාර්යයන් සඳහා පහසුකම් සැලසීම;

(ආ) මේ පනත යටතේ නිල දේපළ භාර ගැනුම්කරුගේ, අධිකාරියේ, අධිකරණවල, පුද්ගලික වස්තු බංකොලොත් නිලධරයන්ගේ හෝ වෙනත් තැනැත්තකු සතු විධිවිධාන බලාත්මක කිරීමේ කර්තව්‍ය සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම; සහ

(ඇ) පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියට අදාළ සංඛ්‍යානමය තොරතුරු සැපයීම සහ පර්යේෂණ කාර්ය සඳහා තොරතුරු සැපයීම,

ය.

පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ සටහන් කළ යුතු තොරතුරු

**157.** පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියකට යටත් වන්නාවූ ණයකරුවකු සම්බන්ධයෙන් පහත දැක්වෙන තොරතුරු මෙන්ම නියම කළ හැකි වෙනත් යම් තොරතුරක් පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ අඩංගු විය යුතු ය:-

(අ) ණයකරුගේ සම්පූර්ණ නම;

(ආ) ණයකරු විසින් භාවිත කරන සහ නිල දේපළ භාරගැනුම්කරු විසින් හෝ අධිකාරිය විසින් දන්නා (අන්වර්ථ හෝ වාණිජ කාර්යයන් සඳහා වූ) වෙනත් යම් නමක්;

(ඇ) ණයකරුගේ ලිපිනය;

(ඈ) ණයකරු සම්බන්ධයෙන් පුද්ගලික වස්තුභංගත්ව ආඥාවක් පවතින බව;

(ඉ) ණයකරු සම්බන්ධයෙන් කරන ලද පුද්ගලික වස්තුභංගත්ව ආඥාවේ වර්ගය;

(ඊ) ණයකරු සම්බන්ධයෙන් පුද්ගලික වස්තු භංගත්ව ආඥාවක් නිකුත් කළ දිනය;

(උ) පුද්ගලික වස්තුභංගත්ව ආඥාවෙන් නිදහස් කිරීමට නියමිත දිනය;

(ඌ) ණයකරු සම්බන්ධයෙන් පුද්ගලික වස්තුභංගත්ව ආඥාවක් නිකුත් කළ අධිකරණය;

(එ) පුද්ගලික වස්තුභංගත්ව ආඥාව හා සම්බන්ධ; (ඇත්නම්;) එම නඩු අංකය;

(ඒ) ණයකරුගේ නඩුව සම්බන්ධයෙන් කටයුතු කරන බලයලත් මැදිහත්කරුවකුගේ, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ සහ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුවකුගේ නම, ලිපිනය සහ ඇමතුම් තොරතුරු;

(ඔ) ණයකරුගේ නඩුව සම්බන්ධයෙන් කටයුතු කරන නිල දේපළ භාරගැනුම්කරුගේ කාර්යාලයේ ලිපිනය සහ ඇමතුම් තොරතුරු;

(ඕ) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් යටතේ පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ ඇතුළත් කිරීමට අවශ්‍ය වෙනත් තොරතුරු; සහ

පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයෙන් තොරතුරු ඉවත් කිරීම

**158.** (1) පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියකින් ණයකරුවකු නිදහස් කිරීමේදී අධිකාරිය විසින්, ණයකරුට අදාළ සියලු තොරතුරු පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයෙන් ඉවත් කළ යුතු ය.

(2) පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයෙන් ණයකරුට අදාළ තොරතුරු ඉවත් කිරීමෙන් පසු අධිකාරිය විසින්, ණයකරුගේ නඩුවට අදාළ සියලුම වාර්තා වසර හයක කාලයක් සඳහා ගොනුවේ තබා ගත යුතු ය.

(3) 79 හෝ 144 දක්වා වූ වගන්ති යටතේ නිදහස් කිරීමක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ දී අධිකාරිය විසින් -

(අ) 157 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ණයකරුට අදාළ තොරතුරු පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ නැවත පළ කරනු ලැබිය යුතුය; සහ

(ආ) ප්‍රත්‍යාදිෂ්ය කිරීමේ ආඥාවක් කිරීම පිළිබඳව සහ ප්‍රත්‍යාදිෂ්ට ආඥාවක් සිදු කරනු ලැබූ දිනය පිළිබඳව පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ සටහන් කළ යුතු ය.

(4) ණයකරු සම්බන්ධයෙන් අවස්ථා දෙකක දී හෝ වැඩි ගණනක දී පුද්ගලික වස්තු භංගත්ව ආඥාවක් නිකුත් කර ඇති අවස්ථාවක, අධිකාරිය විසින්-

(අ) ණයකරු දෙවන හෝ පසුකාලීන පුද්ගලික වස්තුභංගත්ව පටිපාටියකින් නිදහස් වීමෙන් පසු වසර දෙකක කාලයක් සඳහා හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කාලයක් සඳහා ණයකරුට පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ අදාළ තොරතුරු සඳහා පවත්වාගෙන යා යුතු ය; සහ

(ආ) ණයකරු සහ එක් එක් වස්තුභංගත්ව සිදුවීම පිළිබඳ මෙම පනත මගින් නියම කර ඇති තොරතුරු පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ අඩංගු බවට සහතික විය යුතු ය.

**පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයට ප්‍රවේශය**

**159.** (1) තැනැත්තකුට පුද්ගලික වස්තුභංගත්ව ලේඛනය පරීක්ෂා කිරීම සිදු කළ හැක්කේ මෙම පනතට, නියම කරනු ලැබිය හැකි කාර්ය පටිපාටි පරිදි හෝ අධිකාරිය මගින් සාදනු ලබන රීතිවලට අනුකූලව පමණි.

(2) මහජනයා සියලු සාධාරණ වේලාවලදී පුද්ගලික වස්තුභංගත්ව ලේඛනය පරීක්ෂා කළ හැකි ය.

(3) පුද්ගලික වස්තුභංගත්ව ලේඛනය පරීක්ෂා කිරීම සඳහා අධිකාරිය විසින් මහජනයාගෙන් ගාස්තුවක් අය කරනු ලැබිය හැකි ය.

(4) පුද්ගල වස්තුභංගත්ව ලේඛනය, යම් තැනැත්තකු විසින් හෝ එම තැනැත්තාගේ කැමැත්ත ඇතිව ක්‍රියා කරන යම් පාර්ශ්වයක් විසින්, එකී තැනැත්තා පිළිබඳ තොරතුරු සෙවීමේ කාර්ය සඳහා පරීක්ෂා කිරීම කරනු ලැබිය හැකි ය.

(5) පුද්ගලික වස්තුභංගත්ව ලේඛනය යම් තැනැත්තකු විසින් පහත අවස්ථාවලදී පරීක්ෂා කරනු ලැබිය හැකිය :-

(අ) යම් තැනැත්තකුගේ ව්‍යාපාර කටයුත්තක දී වෙනත් යම් තැනැත්තකුට ණය ලබා ගැනීමට ඇති හැකියාව හෝ ඔහුගේ ණය තත්ත්වය තක්සේරු කර ගැනීමට හෝ තහවුරු කර ගැනීමට අවශ්‍ය වන විටදී එකී වෙනත් තැනැත්තා සම්බන්ධයෙන් පුද්ගලික වස්තුභංගත්ව නියෝගයක් ක්‍රියාත්මක වේ ද යන්න තහවුරු කර ගැනීමේ කාර්ය සඳහා ;

(ආ) ණයකරුවකු සම්බන්ධයෙන් අවස්ථා දෙකක දී හෝ ඊට වැඩි ගණනක දී පුද්ගලික වස්තුභංගත්ව ආඥාවක් කර තිබේ ද යන්න සොයා බැලීම සඳහා;

(ඇ) පුද්ගලික වස්තුභංගත්ව කාර්ය පටිපාටියක ණයකරුගේ සහභාගීත්වය සම්බන්ධ ඕනෑම කාර්යයන් සඳහා;

(ඇ) මේ පනත යටතේ නිල දේපළ භාර ගැනුම්කරුගේ අධිකාරියේ, අධිකරණවල, පුද්ගලික වස්තුභංගත්ව නිලධරයන්ගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ අනුකූලතාව, විගණනය සහ වෙනත් උපකාරක සහ පරිපාලන කර්තව්‍යයන් සඳහා පහසුකම් සැලසීමේ කාර්ය සඳහා;

(ඉ) මේ පනත යටතේ නිල දේපළ භාරගැනුම්කරු, අධිකාරියේ, අධිකරණවල හෝ වෙනත් ඕනෑම තැනැත්තකුගේ කර්තව්‍යයන් බලාත්මක කිරීම සඳහා සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීමේ කාර්ය සඳහා;

(ඊ) පුද්ගලික වස්තුභංගත්ව කාර්ය පටිපාටි සම්බන්ධයෙන් සංඛ්‍යානමය තොරතුරු සැපයීමේ සහ පර්යේෂණ කටයුතු සඳහා තොරතුරු සැපයීමේ කාර්ය සඳහා.

(6) පහත දැක්වෙන නිර්ණායකවලට අදාළව පමණක් පුද්ගලික වස්තුභංගත්ව ලේඛනය පරීක්ෂා කළ හැකි වන්නේ ය -

(අ) ණයකරුගේ නම;

(ආ) පුද්ගලික වස්තුභංගත්ව ආඥාව හා සම්බන්ධ නඩු අංකය ඇත්නම් (තිබේ නම්)

(ඇ) අධිකරණයේ නම;

(ඇ) පුද්ගලික වස්තුභංගත්ව ආඥාවේ දිනය;

(ඉ) (අ) සිට (ඇ) දක්වා ඡේදවල ඇති නිර්ණායකවල කිසියම් සංයෝජනයක්; හෝ

(ඊ) නියම කරනු ලැබිය හැකි වෙනත් නිර්ණායක.

යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් අධිකාරිය සහ නිල දේපළ භාරගැනුම්කරු වගකීමකට යටත් නොවන බව

**160.** (1) මේ කොටස යටතේ ප්‍රසිද්ධ ලේඛනයක් පවත්වාගෙන යාමට අදාළව සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් ගන්නා ලද හෝ ගන්නා ලදැයි අදහස් කරනු ලබන තීරණයක් සම්බන්ධයෙන් නිල දේපළ භාරගැනුම්කරුට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) මේ කොටස යටතේ ප්‍රසිද්ධ ලේඛනයක් පවත්වාගෙන යාමට අදාළව සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් හෝ සද්භාවයෙන් ගනු ලැබූ හෝ ගනු ලැබුවේ යයි අදහස් කරනු ලබන තීරණයක් සම්බන්ධයෙන් අධිකාරියට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

පුද්ගලික වස්තුභංගත්ව ලේඛනය සහ ණය තොරතුරු කාර්යාංශය

**161.** (1) 1990 අංක 18 දරන ණය තොරතුරු කාර්යාංශය පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ ණයකරුවකු සම්බන්ධයෙන් වන තොරතුරු, ණය තොරතුරු කාර්යාංශයේ වාර්තාවල ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(2) පුද්ගලික වස්තුභංගත්ව ලේඛනයේ ඇති තොරතුරු, ණය තොරතුරු කාර්යාංශයේ වාර්තාවල ඇතුළත් කිරීමේ ආකෘතිය හා ආකාරය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) 158 වන වගන්තිය යටතේ ණයකරුවකු පුද්ගලික වස්තුභංගත්ව කාර්ය පටිපාටියෙන් නිදහස් කිරීම මත, ණයකරුට අදාළ සියලු තොරතුරු ලේඛනයෙන් ඉවත් කිරීමේදී ණය තොරතුරු කාර්යාංශයේ වාර්තාවලට ඇතුළත් කරන ලද ණයකරුගේ පුද්ගලික වස්තු භංගත්වයට අදාළ තොරතුරු -

(අ) ණයකරු නිදහස් කළ දින සිට මාස හයක කාලයක් ඇතුළත; හෝ

(ආ) නියම කළ හැකි වෙනත් කාලසීමාවක් ඇතුළත,

ණය තොරතුරු කාර්යාංශයේ එකී වාර්තාවලින් ඉවත් කරනු ලැබිය යුතු ය.

## VIII වන කොටස

## පුද්ගලික වස්තුභංගත්ව වැරදි

### 1 වන පරිච්ඡේදය

### වැරදි පිළිබඳ පොදු විධිවිධාන

චේතනාව

**162.** වරදක් සංස්ථාපනය කරන ක්‍රියාව සිදු කරන අවස්ථාවේ දී, යම් තැනැත්තකුට -

(අ) වංචාවක් සිදු කිරීමේ;

(ආ) රැවටීමේ;

(ඇ) ඔහුගේ හෝ ඇයගේ යම් ක්‍රියාකලාපයක තත්ත්වය සැඟවීමේ; හෝ

(ඈ) නීතිය ව්‍යර්ථ කිරීමේ,

චේතනාව තිබූ බවට ඔප්පු කරන්නේ නම් මිස, එම තැනැත්තා මෙම කොටස යටතේ වරදකට වරදකරු නොවන්නේ ය.

මේ කොටස යටතේ වැරදි සඳහා දඬුවම්

**163.** මේ කොටස යටතේ වරදක් සිදු කරන යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

නිදහස් කිරීමෙන් පසු සාපරාධී වගකීම

**164.** (1) තදනන්තර පුද්ගලික වස්තුභංගත්වයක් සම්බන්ධයෙන් ණයකරුවකුට ඇති වගකීමට අගති විරහිතව, පුද්ගලික වස්තුභංගත්ව වැඩපිළිවෙළකින් ණයකරු නිදහස් කිරීමෙන් පසු සිදු කරන ලද යම් දෙයක් සම්බන්ධයෙන්, මේ කොටස යටතේ ණයකරුවකු වරදක් සිදු නොකරනු ලබන්නේය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටියකින් ණයකරුවකු නිදහස් කිරීමට පෙර ණයකරු විසින් සිදු කරන ලද වරදක් සඳහා, නිදහස් කරනු ලැබූ ණයකරුවකු එරෙහිව නඩු පවරනු ලැබීම මේ කොටසේ කිසිවක් මගින් වළක්වනු නොලැබිය යුතුය.

(3) බංකොලොත්භාවය පිළිබඳ නියෝගය නිෂ්ප්‍රභ කරනු ලැබුව ද, එසේ නැති වුව ද, 3 වන පරිච්ඡේදය අදාළ විය යුතුය. එනමුත් 2 වන පරිච්ඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් එසේ නිෂ්ප්‍රභ කිරීමෙන් පසු නඩු පැවරීමක් සිදු නොකළ යුතු ය.

## 2 වන පරිච්ඡේදය

### පුද්ගලික වස්තුභංගත්ව වැරදි

පුද්ගලික වස්තුභංගත්ව ක්‍රියාපටිපාටියේ අදාළ වීම: අසත්‍ය තොරතුරු

**165.** (1) මේ වගන්තිය අදාළ වන්නා වූ යම් ඉල්ලීමක් හෝ යෝජනාවක් ඉදිරිපත් කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද එකී තැනැත්තා විසින් -

(අ) දැන දැනම හෝ නොසැලකිලිමත් ලෙස, සැලකිය යුතු තරමේ අසත්‍ය හෝ නොමඟ යවන සුළු තොරතුරු ඉදිරිපත් කර ඇත්නම්; හෝ

(ආ) තැනැත්තාගේ මූල්‍ය කටයුතුවලට අදාළව මේ පනත යටතේ කරන ලද යම් ප්‍රකාශයක, දැන දැනම හෝ නොසැලකිලිමත් ලෙස කරුණු මඟහැරීමක් සිදු කර ඇත්නම්,

එම තැනැත්තා එම වරදට වරදකරු වන්නේ ය.

(2) මේ වගන්තිය -

(අ) 50 වන වගන්තිය යටතේ ණය ආරක්ෂණ කල්දැමීමේ ආඥාවක් ;

(ආ) 44 වන වගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් ;

(ඇ) 67 වන වගන්තිය යටතේ ණය පුනරුත්ථාපන ආඥාවක්; හෝ

(ඈ) 81 වන වගන්තිය යටතේ බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක්,

සඳහා වූ ඉල්ලීමකට හෝ යෝජනාවකට අදාළ වන්නේ ය.

පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටිය: ණයකරුවන් වගකීම්වලට අනුකූලව ක්‍රියා නොකිරීම

**166.** (1) ණය ආරක්ෂණ කල්දැමීමේ ආඥාවකට ණයකරුවකු ලෙස පාර්ශ්වකරුවකු වන තැනැත්තකු විසින් -

(අ) 32 වන සහ 42 වන වගන්ති යටතේ වන අනුකූලවීම චේතනාන්විතව පැහැර හරින්නේ නම්; හෝ

(ආ) සැලකිය යුතු තරමින් අසත්‍ය හෝ නොමඟ යවනසුලු බව දැන දැනම එම අදාළ තොරතුරු අධිකරණයට හෝ නිල දේපළ භාරගැනුම්කරුට සපයන්නේ නම්,

එම තැනැත්තා වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) IV වන කොටස යටතේ ණය ප්‍රතිව්‍යූහගත කිරීමේ වැඩපිළිවෙළකට ණයකරුවකු ලෙස පාර්ශ්වකරුවකු වන ණයකරුවකු විසින් -

(අ) 32 වන සහ 56 වන වගන්ති යටතේ වනපිළිබැඳීමකට අනුකූල වීම චේතනාන්විතව පැහැර හරින්නේ නම්; හෝ

(ආ) සැලකිය යුතු තරමින් අසත්‍ය හෝ නොමඟ යවනසුලු බව දැන දැනම එම අදාළ තොරතුරු අධිකරණයට, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාට, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට හෝ නිල දේපළ භාරගැනුම්කරුට සපයන්නේ නම්,

එම තැනැත්තා වරදක් සිදු කරන්නේ ය.

(3) V වන කොටස යටතේ, ණයකරුවකු ලෙස ණය පුනරුත්ථාපන ආඥාවකට පාර්ශ්වකරුවකු වන තැනැත්තකු -

(අ) 32 වන සහ 71 වන වගන්ති යටතේ වූ පිළිබැඳීම්වලට අනුකූල වීම චේතනාන්විතව පැහැර හරින්නේ නම්; හෝ

(ආ) යම් වැදගත් අසත්‍ය හෝ නොමඟ යවනසුලු බව දැන දැනම, එම බැඳීමට අදාළ යම් තොරතුරු සැලකිය යුතු තරමේ ආකාරයකින් අධිකරණයට හෝ නිල දේපළ භාරගැනුම්කරුට සපයන්නේ නම්,

එම තැනැත්තා වරදක් සිදු කරන්නේ ය.

පුද්ගලික වස්තුභංගත්ව කාර්යපටිපාටි: ලේඛන සහ වාර්තා

**167.** (1) මේ වගන්තිය අදාළ වන තැනැත්තකු විසින් -

(අ) ණය ආරක්ෂණ කල් දැමීමේ ආඥාවක් ලබා ගැනීම;

(ආ) 32 වන සහ 42 වන වගන්ති යටතේ වූ බැඳීමක් මග හැරීම;

(ඇ) 54 වන වගන්තිය යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් බලාත්මක වී ඇති බව ස්ථිර කරමින් ආඥාවක් ලබා ගැනීම;

(ඈ) 32 වන සහ 56 වන වගන්ති යටතේ වූ බැඳීමක් මගහැරීම;

(ඉ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් අවසන් කිරීම මගහැරීම;

(ඊ) ණය පුනරුත්ථාපන ආඥාවක් ලබා ගැනීම;

(උ) 32 වන සහ 71 වන වගන්ති යටතේ වූ බැඳීමක් මගහැරීම;

(ඌ) ණය පුනරුත්ථාපන ආඥාවක් අවසන් කිරීම හෝ පරිවර්තනය කිරීම මගහැරීම; හෝ

(එ) මේ පනත යටතේ වූ වෙනත් යම් බැඳීමක් මගහැරීම,

සඳහා එකී තැනැත්තා විසින් (2) වන උපවගන්තියේ සඳහන් යම් ක්‍රියාවක් සිදු කරනු ලබන අවස්ථාවක දී එකී තැනැත්තා වරදකට වරදකරු වන්නේ ය.

(2) යම් තැනැත්තකු විසින් -

(අ) අධිකරණයේ හෝ නිල දේපළ භාර ගැනුම්කරුගේ ඉල්ලීම මත, එම තැනැත්තාගේ සන්තකයේ හෝ පාලනයේ ඇති සියලුම මූල්‍ය වාර්තා සැපයීමට අපොහොසත් වන අවස්ථාවක දී;

(ආ) මූල්‍ය වාර්තාවක් අධිකරණයට හෝ නිල දේපළ භාරගැනුම්කරුට ඉදිරිපත් කිරීම වළක්වන අවස්ථාවක දී;

(ඇ) යම් මූල්‍ය වාර්තාවක් වංචනික ලෙස ඉවත් කිරීම, වෙනස් කිරීම හෝ එහි යම් කරුණක් සඳහන් නොකිරීම හෝ එවැන්නක් වංචනික ලෙස ඉවත් කිරීම, වෙනස් කිරීම හෝ යම් කරුණක් එහි සඳහන් නොකිරීම සඳහා අනුබල දීම සිදු කිරීමේ දී,

ඒ තැනැත්තා වරදක් සිදු කරන්නේ ය.

(3) මේ වගන්තිය -

(අ) 38 වන, 50 වන හෝ 67 වන වගන්ති යටතේ ඉල්ලීමක් හෝ යෝජනාවක් කරනු ලබන තැනැත්තකු; හෝ

(ආ) ණය ආරක්ෂණ කල්දැමීමේ ආඥාවක්, ණය පුනරුත්ථාපන ආඥාවක් හෝ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් කරන ආඥාවක් සිදු කර ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද එම තැනැත්තාට,

අදාළ වන්නේ ය.

(4) මේ වගන්තිය අදාළ වන තැනැත්තකු සම්බන්ධයෙන් “මූල්‍ය වාර්තාව” යන්නෙන්, එම තැනැත්තාගේ මූල්‍ය කටයුතුවලට අදාළ යම් පොතක්, ලේඛනයක් හෝ වාර්තාවක් අදහස් වේ.

පුද්ගලික වස්තුභංගත්ව කාර්ය පටිපාටි: දේපළ බැහැර කිරීම

**168.** (1) මේ වගන්තිය අදාළ වන ණයකරුවකු පහත දැක්වෙන කාර්ය සඳහා (2) වන උපවගන්තියේ සඳහන් ක්‍රියාවක් සිදු කරනු එනම් -

(අ) ණය ආරක්ෂණ කල් දැමීමේ ආඥාවක් ලබා ගැනීම;

(ආ) 32 වන සහ 42 වන වගන්ති යටතේ වූ බැඳීමක් මගහැරීම;

(ඇ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් ලබා ගැනීම;

(ඈ) 32 වන සහ 56 වන වගන්ති යටතේ වූ බැඳීමක් මගහැරීම;

(ඉ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙලක් අවසන් කිරීම මගහැරීම;

(ඊ) ණය පුනරුත්ථාපන ආඥාවක් ලබා ගැනීම;

(උ) 32 වන සහ 71 වන යන වගන්ති යටතේ වූ බැඳීමක් මගහැරීම;

(ඌ) ණය පුනරුත්ථාපන ආඥාවක් අවසන් කිරීම හෝ පරිවර්තනය කිරීම මග හැරීම; හෝ

(එ) මේ පනත යටතේ වූ වෙනත් යම් බැඳීමක් මගහැරීම,

සිදු කරනු ලබන අවස්ථාවක දී, වරදකට වරදකරු වන්නේ ය.

(2) (3) වන උපවගන්තියට යටත්ව, ණයකරු විසින් කරගෙන යනු ලබන සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී හෝ ණයකරුගේ සාමාන්‍ය පවුල් කටයුතුවල දී හැර-

(අ) ණයකරුගේ කිසියම් දේපළක් වෙනත් තැනැත්තකුට තෑගි කරයි නම් හෝ තෑගි කිරීමට සලස්වන්නේ නම්;

(ආ) නොඑසේ නම්, ණයකරුට කිසිදු ප්‍රතිෂ්ඨාවක් නොලැබෙන පරිදි විධිවිධාන සලසනු ලබන නියමයක් මත, වෙනත් තැනැත්තකුට ණයකරුගේ දේපළක් පවරන්නේ නම් හෝ පැවරීමට කටයුතු සලස්වන්නේ නම්; හෝ

(ඇ) ණයකරුගේ කිසියම් දේපළක් යම් වෙනත් තැනැත්තකුට හෝ තුන්වන පාර්ශ්වයකට එකී තුන්වන පාර්ශ්වය අදාළ ගනුදෙනුවේ පාර්ශ්වකරුවකු වුවද නොවුවද සහ දේපළේ මූල්‍ය වටිනාකම, මුදල් හෝ මුදලේ වටිනාකම වශයෙන් සලකා බැලීමේදී එකී වෙනත් තැනැත්තා විසින් සපයන ලද ප්‍රතිෂ්ඨාවේ වටිනාකමට, වඩා සැලකිය යුතු ලෙස වැඩි වන්නා වූ පැවරීමක් කරන්නේ නම්,

ණයකරුවකු විසින් මෙම උපවගන්තියෙහි සඳහන් යම් ක්‍රියාවක් සිදු කරනු ලබන්නේ ය.

(3) (2) වන උපවගන්තිය, රුපියල් පනස්දහසකට අඩු වටිනාකමකින් යුත් හෝ නියම කළ හැකි වෙනත් වටිනාකමින් යුත් දේපළකට අදාළ නොවේ.

(4) මේ වගන්තිය -

(අ) 38 වන, 50 වන සහ 67 වන වගන්ති යටතේ වූ ඉල්ලීමක් හෝ යෝජනාවක් ඉදිරිපත් කර ඇති ණයකරුවකුට; හෝ

(ආ) ණය ආරක්ෂණ කල්දැමීමේ ආඥාවක්, ණය පුනරුත්ථාපන ආඥාවක් හෝ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් බලාත්මක වීම ස්ථිර කිරීමේ ආඥාවක් සිදු කර ඇත්තේ යම් ණයකරුවකු සම්බන්ධයෙන් ද එම ණයකරුට,

අදාළ වේ.

පුද්ගලික වස්තුභංගත්ව කාර්ය පටිපාටි: ණය සහ ව්‍යාපාර

**169.** (1) යම් ණයකරුවකු, තනිව හෝ වෙනත් යම් තැනැත්තකු සමඟ, ණය ගනු ලබන්නේ යම් තැනැත්තෙකුගෙන්ද ඒ තැනැත්තාට -

(අ) අදාළ ණය ආරක්ෂණ කල්දැමීමේ ආඥාවේ, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි හෝ අදාළ ණය පුනරුත්ථාපන ආඥාවේ නිශ්චිතව දක්වා ඇති පරිදි ණයකරුගේ නම; සහ

(ආ) ණයකරු, ණය ආරක්ෂණ කල්දැමීමේ ආඥාවකට, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළකට හෝ ණය පුනරුත්ථාපන ආඥාවකට යටත්ව සිටින්නේය යන කරුණ,

දැනුම්දීමකින් තොරව, රුපියල් ලක්ෂයකට වැඩි මුදලක් හෝ නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමාණයක මුදලක් ණයට ලබා ගන්නේ නම් එකී ණයකරු වරදක් සිදු කරන්නේ ය.

(2) මේ වගන්තියෙහි "ණයකරු" යන්නෙන් -

(අ) ණය ආරක්ෂණ කල්දැමීමේ ආඥාවක් බලාත්මකව පවතින තාක් දුරට, ණය ආරක්ෂණ කල්දැමීමේ ආඥාවක් සිදු කර ඇත්තේ;

(ආ) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ බලාත්මකව පවතින තාක් දුරට, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ බලාත්මකව පවතින බව ස්ථිර කරන ආඥාවක් සිදු කර ඇත්තේ; හෝ

(ඇ) යම් ණය පුනරුත්ථාපන ආඥාව බලාත්මකව පවතින තාක් දුරට, එම ණය පුනරුත්ථාපන ආඥාවක් කර ඇත්තේ,

යම් ණයකරුවකු සම්බන්ධයෙන් ද එම ණයකරු අදහස් වේ.

(3) ණය ලබා ගන්නා ණයකරුවකුට (1) වන උපවගන්තියේ කරනු ලබන සඳහනට -

(අ) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ ණයකරුවකුට භාණ්ඩ කුලියට දෙනු ලබන අවස්ථාවක් හෝ කොන්දේසි සහිත විකිණීමේ ගිවිසුමක් යටතේ ණයකරුවකුට භාණ්ඩ විකිණීමට එකඟ වී ඇති අවස්ථාවක් ද; සහ

(ආ) භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා ණයකරුට අත්තිකාරම් වශයෙන් මුදල් හෝ අන්‍යාකාරයෙන් ගෙවීමක් කර ඇති අවස්ථාවක් ද ,

ඇතුළත් වන්නේ ය.

3 වන පරිච්ඡේදය

**බංකොලොත්භාවය පිළිබඳ වැරදි**

බංකොලොත්භාවය පිළිබඳ වැරදි: හෙළිදරව් නොකිරීම සහ අසත්‍ය නියෝජනය

**170.** (1) බංකොලොත් ණයකරු -

(අ) ඔහුගේ උපරිම දැනුම හා විශ්වාසය අනුව, බංකොලොත් බූදලය සංයුක්ත වන සියලුම දේපළ නිල දේපළ භාරගැනුම්කරුට හෝ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට හෙළිදරව් නොකරන්නේ නම්; හෝ

(ආ) බැහැර කිරීමක් නොකළේ නම් යම් ප්‍රමාණයකින් සංයුත්ත වන්නාවූ යම් දේපළක්, බැහැර කළේ කෙසේ ද, කවදා ද, කාට ද සහ කුමන ප්‍රතිෂ්ඨාවක් සඳහා ද යන්න සඳහන් කරමින්, එසේ සංයුක්ත වන කිසියම් දේපළක් බැහැර කිරීමක් පිළිබඳව නිල දේපළ භාරගැනුම්කරුට හෝ බංකොලොත් භාරකරුට දැනුම් නොදී සිටින්නේ නම්,

එකී බංකොලොත් ණයකරු විසින් වරදක් සිදු කරන්නේ ය.

(2) බංකොලොත් ණයකරු විසින් සිය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුරදී සිදු කරන ලද බැහැර කිරීමකට හෝ බංකොලොත් ණයකරුගේ හෝ ඔහුගේ පවුලේ අයගේ සාමාන්‍ය වියදම් සඳහා මුදල් ගෙවීමකට (1) වන උපවගන්තියේ (ආ) ඡේදය අදාළ නොවිය යුතු ය.

(3) බංකොලොත් ණයකරුගේ දේපළ හෝ මූල්‍ය කටයුතු සම්බන්ධ ගිවිසුමකට ණයහිමියන්ගේ කැමැත්ත ලබා ගැනීමේ අරමුණින් බංකොලොත් ණයකරු, ව්‍යාජ නියෝජනයක් ඉදිරිපත් කරන්නේ නම් හෝ වංචාවක් කරන්නේ නම් හෝ එකී බංකොලොත් ණයකරු විසින් වරදක් සිදු කරන්නේ ය.

බංකොලොත් භාවය පිළිබඳ වැරදි: දේපළ

**171.** (1) බංකොලොත් ණයකරු -

(අ) ස්වකීය සන්තකයේ හෝ ස්වකීය පාලනය යටතේ පවතින ඔහුගේ දේපළවලින් යම් කොටසක් සහ සන්තකයේ පවතින දේපළ එසේ භාර දීමට නීතියෙන් ණයකරුට නියම කර ඇති විට, නිල දේපළ භාරගැනුම්කරුට

හෝ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට හෝ නිල දේපළ භාරගැනුම්කරු හෝ භාරකරු විසින් විධාන කරනු ලැබිය හැකි පරිදි භාර නොදෙන්නේ නම්; හෝ

(ආ) ඔහු විසින් ගෙවිය යුතු යම් ණයක් හෝ ඔහුගෙන් අයවිය යුතු ණයක් පිළිබඳව තොරතුරු සඟවා සිටින්නේ නම් හෝ දේපළ භාරගැනුම්කරුට හෝ බංකොලොත් භාරකරුට සන්තකය භාර දීමට ණයකරුට නියම කරනු ලැබ ඇති රුපියල් ලක්ෂයකට හෝ නියම කරනු ලැබිය හැකි යම් මුදලකට වඩා අඩු නොවන්නා වූ ද වටිනාකමකින් යුත් දේපළක්, සඟවාගෙන සිටින්නේ නම්,

එකී බංකොලොත් ණයකරු විසින් වරදක් සිදු කරන්නේ ය.

(2) බංකොලොත් ණයකරු විසින් නිල දේපළ භාරගැනුම්කරුට හෝ බංකොලොත් භාරකරුට සන්තකය භාරදිය යුතු වූ හෝ භාර දීමට නියමිතව තිබුණා වූ ද, වටිනාකම රුපියල් ලක්ෂයකට හෝ නියම කරනු ලැබිය හැකි යම් මුදලකට වඩා අඩු නොවන්නා වූ ද, වටිනාකමින් යුත් දේපළක් බංකොලොත් ණයකරු විසින් ස්වකීය සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී හෝ බංකොලොත් ණයකරුගේ සාමාන්‍ය පවුලේ කටයුතු අතරතුර දී හැර, බැහැර කරන්නේ නම්, බංකොලොත් ණයකරු විසින් වරදක් සිදු කරන්නේ ය.

(3) බංකොලොත් ණයකරු විසින් -

(අ) ණයහිමියන්ට බාධා කිරීමේ, ප්‍රමාද කිරීමේ හෝ ඔවුන්ව පරාජය කිරීමේ අදහසින්; සහ

(ආ) ඔහු විසින් සිදු කරනු ලබන සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුර දී හෝ සාමාන්‍ය පවුලේ කටයුතු අතරතුර දී හැර, ස්වකීය දේපළ යම් තෑගි කිරීමකට හෝ පැවරීමකට හෝ ඒ වන යම් අය කිරීමකට ලක් කරන්නේ නම් හෝ එසේ කිරීමට කටයුතු සලස්වන්නේ නම්,

එකී බංකොලොත් ණයකරු විසින් වරදක් සිදු කරන්නේ ය.

බංකොලොත්භාවය පිළිබඳ වැරදි: ලේඛන

**172.** (1) බංකොලොත් ණයකරු විසින් බංකොලොත් ණයකරු සන්තකයේ හෝ පාලනයේ ඇති යම් මූල්‍ය වාර්තාවක සන්තකය, නිල දේපළ භාරගැනුම්කරු හෝ බංකොලොත්භාවය පිළිබඳ

භාරකරු විසින් විධානය කරනු ලැබිය හැකි පරිදි, නිල දේපළ භාරගැනුම්කරු හෝ බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වෙත භාර නොදුන්නේ නම්, බංකොලොත් ණයකරු විසින් වරදක් සිදු කරන්නේ ය.

(2) බංකොලොත් ණයකරු විසින් -

(අ) යම් මූල්‍ය වාර්තාවක් ඉදිරිපත් කිරීම වළක්වන්නේ නම්;

(ආ) මූල්‍ය වාර්තාවක් වංචනික ලෙස ඉවත් කර, වෙනස් කර හෝ එහි යම් කරුණක් සඳහන් නොකර ඇත්නම් හෝ යම් මූල්‍ය වාර්තාවක් හෝ වංචනික ලෙස ඉවත් කිරීම, විනාශ කිරීම, වෙනස් කිරීම හෝ එහි යම් කරුණක් සඳහන් නොකිරීම සඳහා සම්බන්ධ වී හෝ අනුබල දී ඇත්නම්; හෝ

(ඇ) යමෙකුගේ දේපළෙහි කිසියම් කොටසක් සඳහා ව්‍යාජ පාඩු හෝ වියදම් දක්වාලීමට උත්සාහ කරන්නේ නම්,

එකී බංකොලොත් ණයකරු විසින් වරදක් සිදු කරන්නේ ය.

(3) බංකොලොත් ණයකරු විසින් යම් මූල්‍ය වාර්තාවක් බැහැර කිරීම හෝ වෙනස් කිරීම හෝ එහි සැලකිය යුතු කරුණු සඳහන් නොකිරීම හෝ එසේ බැහැර කිරීමට හෝ වෙනස් කිරීමට හෝ සැලකිය යුතු කරුණු සඳහන් නොකිරීමට කටයුතු සලසන්නේ නම් හෝ ඉඩ සලසන්නේ නම්, බංකොලොත් ණයකරු විසින් වරදක් සිදු කරන්නේ ය.

(4) මේ වගන්තිය අදාළ වන්නා වූ තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, මේ වගන්තියේ "මූල්‍ය වාර්තාව" යන්නෙන් -

(අ) බංකොලොත් බූදලයේ කොටසක් සංයුක්ත වන්නා වූ ඔප්පු කළ හැකි ණයකට හෝ දේපළට; සහ

(ආ) බංකොලොත්භාවය ආරම්භ වූ දා සිට කාල සීමාව හෝ බංකොලොත්භාවය ආරම්භවීම සමඟ අවසන් මාස දොළහක කාලයට;

ඍජුව අදාළ පොතක්, ලේඛනයක් හෝ වාර්තාවක් අදහස් වේ.

බංකොලොත් භාවය පිළිබඳ වැරදි: ණය සහ ණයට ගැනීම

**173.** (1) බංකොලොත් ණයකරු විසින් -

(අ) බංකොලොත් ණයකරු සම්බන්ධයෙන් බංකොලොත් ආඥාවක් බලපවත්වන බව ණයහිමියාට නොදන්වා, බංකොලොත් ණයකරු විසින් තනිව හෝ වෙනත් තැනැත්තකු සමඟ එක් වී රුපියල් පනස්දහසක් හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් මුදල් ප්‍රමාණයක් ණයහිමියකුගෙන් ණයට ලබා ගන්නේ නම්; හෝ

(ආ) බංකොලොත් ආඥාවේ නිශ්චිතව දක්වා ඇති බංකොලොත් ණයකරුගේ නම ණයකරු සමඟ යම් ව්‍යාපාරික ගණුදෙනුවකට එළඹෙන සියලුම තැනැත්තන්ට හෙළිදරව් නොකර, බංකොලොත් ආඥාවේ නිශ්චිතව දක්වා ඇති නම හැර වෙනත් නමකින්, ඍජුව ම හෝ වක්‍රාකාරයෙන් යම් ව්‍යාපාරයක නිරත වන්නේ නම්,

එකී බංකොලොත් ණයකරු විසින් වරදක් සිදු කරන්නේ ය.

(2) බංකොලොත්භාවය ආරම්භ වීමෙන් පසු -

(අ) බංකොලොත් ණයකරු විසින් දේපළ සඳහා මුදල් ගෙවීමකින් තොරව ණයට දේපළ ලබා ගන්නේ නම්; සහ

(ආ) බංකොලොත් ණයකරු -

(i) අසත්‍ය නියෝජනයක් හෝ වෙනත් වංචාවක් මඟින්;

(ii) බංකොලොත් ණයකරුගේ මූල්‍ය තත්ත්වය පිළිබඳ අසත්‍ය ප්‍රකාශයක් සිදු කිරීම මඟින් හෝ බංකොලොත් ණයකරුගේ කටයුතු පිළිබඳ වෙනත් අසත්‍ය ප්‍රකාශයක් සිදු කිරීම මඟින්; හෝ

(iii) ව්‍යාපාර ගනුදෙනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වල යෙදෙමින් සිදු කරන බවට ව්‍යාජ ලෙස පෙන්නුම් කරමින්,

ණයට දේපළ ලබා ගන්නේ නම්, බංකොලොත් ණයකරු විසින් වරදක් සිදු කරන්නේ ය.

(3) බංකොලොත් ණයකරු විසින් ණය ලබා ගැනීම සම්බන්ධයෙන් කරනු ලබන සඳහනට -

(අ) ඔහුට හෝ ඇයට කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ බංකොලොත් ණයකරුට භාණ්ඩ කුලියට දීම හෝ කොන්දේසි සහිත විකුණුම් ගිවිසුමක් යටතේ බංකොලොත් ණයකරුට භාණ්ඩ විකිණීමට එකඟ වීම; සහ

(ආ) මුදලින් හෝ අන්‍යාකාරයකින් භාණ්ඩ හෝ සේවා සැපයීම සම්බන්ධයෙන් බංකොලොත් ණයකරුට අත්තිකාරම් ගෙවීම,

යන අවස්ථා ද ඇතුළත් වන්නේ ය.

බංකොලොත් භාවය පිළිබඳ වැරදි: ව්‍යාජ හිමිකම්පෑම්

**174.** බංකොලොත් ණයකරු, බංකොලොත්භාවය යටතේ කිසියම් තැනැත්තකු විසින් ව්‍යාජ ණයක් සාධනය කරනු ලැබ ඇති බව දනිමින් හෝ විශ්වාස කරමින් ඒ බව බංකොලොත් ණයකරු විසින් මාසයක කාලයක් තුළ දී බංකොලොත් භාරකරුට දැනුම් දීමට අසමත් වුවහොත් බංකොලොත් ණයකරු විසින් වරදක් සිදු කරන්නේ ය.

බංකොලොත් භාවය පිළිබඳ වැරදි: ශ්‍රී ලංකාව හැර යාම

**175.** බංකොලොත් ණයකරු -

(අ) 162 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති චේතනාව ඇතිව; සහ

(ආ) ඔහු විසින් කරගෙන යන සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුරදී හෝ බංකොලොත් ණයකරුගේ සාමාන්‍ය පවුල් කටයුතු අතරතුරදී හැර,

නිල දේපළ භාර ගැනුම්කරුට හෝ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට හෝ සන්තකයට භාර දිය යුතු රුපියල් පනස්දහසක හෝ නියම කරනු ලැබිය හැකි යම් මුදලකට වඩා අඩු නොවන්නා වූද වටිනාකමකින් යුක්ත යම් දේපළක් රැගෙන බංකොලොත් ණයකරු ශ්‍රී ලංකාව හැර යන්නේ නම් හෝ හැර යාමට උත්සාහ කරන්නේ නම් හෝ හැර යාමට සූදානම් වන්නේ නම්, ඔහු විසින් වරදක් සිදු කරන්නේ ය.

බංකොලොත් භාවය පිළිබඳ වැරදි: වගකීම්වලට අනුකූලව ක්‍රියා නොකිරීම

**176.** (1) බංකොලොත් ණයකරු විසින් -

(අ) චේතනාන්විතව සහ සාධාරණ හේතුවක් නොමැතිව 32 වන, 112 වන, 113 වන සහ 114 වන වගන්ති යටතේ වන යම් බැඳීමකට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන්නේ නම්;

(ආ) සැලකිය යුතු අන්දමින් යම් තොරතුරු අසත්‍ය බව හෝ නොමඟ යවනසුලු බව දනිමින්, 32 වන, 112 වන, 113 වන සහ 114 වන වගන්ති යටතේ වූ බැඳීමක් සම්බන්ධයෙන්, එකී තොරතුරු අධිකරණයට, බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට හෝ නිල දේපළ භාරගැනුම්කරුට ලබා දෙන්නේ නම්; හෝ

(ඇ) මේ පනත යටතේ පවත්වනු ලබන යම් පරීක්ෂණයක දී බංකොලොත් ණයකරුගෙන් අසනු ලබන සියලු අදාළ ප්‍රශ්නවලට චේතනාන්විතව සහ සාධාරණ හේතුවක් නොමැතිව සම්පූර්ණයෙන්ම සහ සත්‍ය ලෙස පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන්නේ නම්,

බංකොලොත් ණයකරු විසින් වරදක් සිදු කරන්නේ ය.

බංකොලොත්භාවය පිළිබඳ වැරදි: සැඟවීමේ චේතනාවෙන් නිසි වාර්තා තැබීම පැහැර හැරීම

**177**. බංකොලොත්භාවය පිළිබඳ ඉල්ලීමක් කිරීමට පෙර හෝ බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමක් ඉදිරිපත් කිරීමට පෙර මාස දොළහක කාල සීමාවක් ඇතුළත දී, ස්වකීය මූල්‍ය කටයුතුවල සත්‍ය තත්ත්වය සැඟවීමේ චේතනාවෙන් බංකොලොත් ණයකරු විසින් බංකොලොත් ණයකරුගේ ගනුදෙනු පිළිබඳ නිසි පරිදි වාර්තාවක් තබා ගැනීමට සලස්වා ආරක්ෂා කිරීමට අපොහොසත් වී ඇත්නම්, බංකොලොත් ණයකරු විසින් වරදක් සිදු කරන්නේ ය.

## IX වන කොටස

## සමාගම් බේරා ගැනීම අද්මිනිස්ත්‍රාසි කිරීම

### 1 වන පරිච්ඡේදය

### අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරය

අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරය

**178.** අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින සමාගමක අද්මිනිස්ත්‍රාසිකරු -

(අ) සතුව සමාගමේ කටයුතු, ව්‍යාපාර සහ දේපළ පාලනය පවතින්නේ ය;

(ආ) විසින් සමාගමේ කටයුතු, ව්‍යාපාර සහ දේපළ අද්මිනිස්ත්‍රාසි කිරීම කළ හැකි වන්නේ ය;

(ඇ) විසින් සමාගමේ කටයුතු විමර්ශනය කිරීම කළ යුතු වන්නේ ය;

(ඈ) සතුව පහත දැක්වෙන අරමුණු, එනම් -

(i) සමාගමේ කටයුතු, ව්‍යාපාර සහ දේපළ, සමාගමට උපරිම අවස්ථා ලැබෙන ආකාරයෙන් හෝ එහි ව්‍යාපාරය හැකි තාක් දුරට අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි වන පරිද්දෙන් අද්මිනිස්ත්‍රාසි කිරීම; සහ

(ii) සමාගමට හෝ එහි ව්‍යාපාරයට අඛණ්ඩව පැවතීමට නොහැකි නම්, ණයහිමියන්ට සහ කොටස් හිමියන්ට ක්ෂණිකව ඇවර කිරීමකින් ලැබෙන ප්‍රතිලාභයට වඩා හොඳ ප්‍රතිලාභයක් ලබා ගැනීමට හැකි වන ආකාරයෙන් සමාගමේ කටයුතු, ව්‍යාපාර සහ දේපළ අද්මිනිස්ත්‍රාසි කිරීම,

ඇත්තේ ය.

(ඉ) විසින් මේ පනතේ අදාළ විධිවිධානවලට යටත්ව, සමාගමේ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම

හෝ එහි කොටසක් වසා දැමීම හෝ බැහැර කිරීම සහ සමාගමේ දේපළ සියල්ල හෝ ඉන් කොටසක් බැහැර කිරීම කළ හැකි වන්නේ ය; සහ

(ඊ) විසින් සමාගම අද්මිනිස්ත්‍රාසි කරමින් නොපවතින්නේ නම් සමාගමට හෝ එහි යම් අධ්‍යක්ෂවරුන්ට හෝ වෙනත් නිලධරයන්ට ඉටු කළ හැකි හෝ ක්‍රියාත්මක කළ හැකි කර්තව්‍යයක් හෝ බලතලයක් ඉටු කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට හැකි ය.

## 2 වන පරිච්ඡේදය

### අද්මිනිස්ත්‍රාසිකරණයේ කාර්යපටිපාටිය

අද්මිනිස්ත්‍රාසි කරණය ආරම්භ වීම

**179.** සමාගමක් අද්මිනිස්ත්‍රාසි කිරීම, ආදේශක අද්මිනිස්ත්‍රාසිකරු හැර වෙනත් අද්මිනිස්ත්‍රාසිකරුවකු මේ කොටස යටතේ පත් කරනු ලබන දිනයේ සහ එම අවස්ථාවේ සිට ආරම්භ වන්නේ ය.

අද්මිනිස්ත්‍රාසි කිරීමේ ක්‍රියා මාර්ග

**180.** (1) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ වීමෙන් පසුව, සහ (4) වන උපවගන්තියට සහ මේ පනතේ අනෙකුත් අදාළ විධිවිධානවලට හා ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක යටත්ව, අද්මිනිස්ත්‍රාසිකරු විසින්-

(අ) (i) ආරම්භක රැස්වීමක් කැඳවිය යුතු ය; සහ

(ii) පසුව, ප්‍රතිඵල රැස්වීමක් කැඳවිය යුතු ය; හෝ

(ආ) යෝජිත සමාගම් ඔප්පු වැඩපිළිවෙළකට අදාළව-–

(i) ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීමක් කැඳවිය යුතු ය;

(ii) ඔප්පු සමාලෝචන විභාගයක් සඳහා අධිකරණයට ඉල්ලීමක් කළ යුතු ය; සහ

(iii) ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීමේ දී මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කරන ලද ණයහිමියන්ගේ අදහස් විමසීමෙන් පසු -

(අ) ඔප්පු සමාලෝචන විභාගය ආරම්භ කළ යුතු ය; හෝ

(ආ) ප්‍රතිඵල රැස්වීමක් කැඳවිය යුතු ය.

(2) මේ වගන්තියේ -

"සම්මත මාර්ගය" යන්නෙන්, (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විස්තර කර ඇති ක්‍රියාමාර්ගය අදහස් වේ;

"කඩිනම් කරන ලද මාර්ගය" යන්නෙන්, (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විස්තර කර ඇති ක්‍රියාමාර්ගය අදහස් වේ;

(3) සම්මත මාර්ගයේ දී -

(අ) ආරම්භක රැස්වීමක අරමුණට, මේ පනතේ අදාළ විධිවිධානවලට යටත්ව-

(i) අද්මිනිස්ත්‍රාසිකරු ප්‍රතියෝජනය කළ යුතු ද නැද්ද යන්න; සහ

(ii) අද්මිනිස්ත්‍රාසිකරණයේ දී ණය හිමියන්ගේ කමිටුවක් පත් කළ යුතු ද නැද්ද යන්න සහ එසේ පත් කරන්නේ නම්, එම කමිටුවේ සාමාජිකයන් ලෙස පත් කළ යුත්තේ කවුරුන් ද යන්න,

තීරණය කිරීමට ණයහිමියන්ට අවස්ථාවක් සැලසීම ඇතුළත් වේ;

(ආ) ප්‍රතිඵල රැස්වීමක අරමුණුවලට, මෙම පනතේ අදාළ විධිවිධානවලට යටත්ව -

(i) යෝජිත සමාගම් ඔප්පු වැඩපිළිවෙළ අනුමත කළ යුතු ද නැද්ද යන්න;

(ii) සමාගම දැනටමත් ඇවර කරමින් පවතින්නේ නම් මිස, ඇවර කරන්නකු පත් කළ යුතු ද නැද්ද යන්න; හෝ

(iii) අද්මිනිස්ත්‍රාසි කිරීම වෙනත් ආකාරයකින් අවසන් කළ යුතු ද නැද්ද යන්න,

පිළිබඳව ණයහිමියන් විසින් යෝජනා සම්මතයක් ඇති කර ගැනීම ඇතුළත් වේ.

(4) කඩිනම් මාර්ගය අනුව -

(අ) ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීමක අරමුණුවලට -

(i) (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් ආරම්භක රැස්වීමක අරමුණු; සහ

(ii) මෙම පනතේ අදාළ විධිවිධානවලට යටත්ව, යෝජිත සමාගම් ඔප්පුව වැඩපිළිවෙළක් අනුමත කළ යුතු ද නැද්ද යන්න පිළිබඳව ණයහිමියන් විසින් යෝජනා සම්මතයක් ඇති කර ගැනීම,

ඇතුළත් වන්නේ ය; සහ

(ආ) ඔප්පු සමාලෝචන විභාගයක අරමුණු වනුයේ ණයහිමියන් විසින් අනුමත කරන ලද සමාගම් ඔප්පු වැඩපිළිවෙළ මගින් බැදීමක් ඇති කළ යුතුද නැද්ද? යන්න පිළිබඳව මෙම පනතේ අදාළ විධිවිධානවලට යටත්ව, අධිකරණය විසින් තීරණය කරනු ලැබීම ය.

(5) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ වූ වහාම සහ (6) වන උපවගන්තියට යටත්ව, අද්මිනිස්ත්‍රාසිකරු විසින් -

(අ) සම්මත මාර්ගය අනුගමනය කළ යුතු ද? නැද්ද ? යන්න තීරණය කළ යුතු ය; හෝ

(ආ) කඩිනම් මාර්ගය අනුගමනය කළ යුතු ද? නැද්ද? යන්න තීරණය කළ යුතු ය.

(6) අද්මිනිස්ත්‍රාසිකරු විසින් -

(අ) 219 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශයක් අද්මිනිස්ත්‍රාසිකරුට ලබා දී ඇත්නම් මිස; සහ

(ආ) අද්මිනිස්ත්‍රාසිකරු -

(i) ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීමේ දී යෝජිත සමාගම් ඔප්පු වැඩපිළිවෙළ අනුමත කිරීම සඳහා ණයහිමියන්ගෙන් ප්‍රමාණවත් සහයෝගයක් ඇති බවට; සහ

(ii) (i) වන ඡේදයේ සඳහන් යෝජිත සමාගම් ඔප්පු වැඩපිළිවෙළ බලාත්මක වීමට නම්, එය 223 වන වගන්තියේ අවශ්‍යතාවලට අනුකූල විය යුතු බවට,

සෑහීමකට පත්වන්නේ නම් මිස කඩිනම් මාර්ගය අනුගමනය කිරීමට තීරණය නොකළ හැකි ය.

(7) මේ කොටසෙහි -

"ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීම" යන්නෙන්, 215 වන වගන්තියේ විස්තර කර ඇති ආකාරයේ ණයහිමියන්ගේ රැස්වීමක් අදහස් වේ;

"කැඳවීම් කාලසීමාව" යන්නෙන්, අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කිරීමෙන් පසු වැඩ කරන දින විස්සක කාලසීමාව අදහස් වන අතර, ඊට 213 වන වගන්තියේ (3) වන හෝ (4) වන උපවගන්තිය යටතේ දීර්ඝ කරනු ලබන යම් කාලසීමාවක් ද ඇතුළත් වේ;

"ඔප්පු සමාලෝචන විභාගය" යන්නෙන්, 216 වන වගන්තියේ විස්තර කර ඇති අධිකරණ නඩු විභාගයක් අදහස් වේ;

“ආරම්භක රැස්වීම” යන්නෙන්, 212 වන වගන්තියේ විස්තර කර ඇති ණයහිමියන්ගේ රැස්වීමක් අදහස් වේ;

“ප්‍රතිඵල රැස්වීම” යන්නෙන්, 213 වන වගන්තියේ විස්තර කර ඇති ණයහිමියන්ගේ රැස්වීමක් අදහස් වේ.

3 වන පරිච්ඡේදය

**අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීම**

අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත් කරනු ලැබිය හැකි, ක්‍රියා කරනු ලැබිය හැකි වනුයේ කවුරුන්ද යන වග

**181.** (1) යම් තැනැත්තකු සමාගමක අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත් කරනු හෝ කටයුතු කරනු ලැබීමට හැකිවනුයේ එම තැනැත්තා-

(අ) අද්මිනිස්ත්‍රාසි කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ධුරයක් දරන්නකු ලෙස 12 වන වගන්තිය යටතේ පත් කරනු ලැබීමට හෝ කටයුතු කරනු ලැබීමට හෝ සුදුසුකම් ලබන තැනැත්තකු නම්;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත් කරනු ලැබීමට හෝ කටයුතු කරනු ලැබීමට 182 වන වගන්තිය යටතේ නුසුදුසු නොවන තැනැත්තකු නම්;

(ඇ) විසින් එම තැනැත්තාව -

(i) අද්මිනිස්ත්‍රාසි කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ධුරයක් දරන්නකු ලෙස 12 වගන්තිය යටතේ පත්කරනු ලැබීමට සහ කටයුතු කරනු ලැබීමට සුදුසුකම් ලබන තැනැත්තකු බවට; සහ

(ii) අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත් කරනු ලැබීමට හෝ කටයුතු කරනු ලැබීමට 182 වගන්තිය යටතේ නුසුදුසු නොවන තැනැත්තකු වන බවට,

ලිඛිතව සහතික තිබේ නම්; සහ

(ඇ) අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත් කරනු ලැබීමට ලිඛිතව කැමැත්ත ප්‍රකාශ කර පත් කරනු ලබන අවස්ථාව වන විට එම කැමැත්ත ඉල්ලා අස්කර ගෙන නොතිබෙන තැනැත්තකු නම්,

පමණි.

(2) (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල අවශ්‍යතා කිසිවක් සපුරා නොමැති බව දැනගෙන, ස්වකීය කැමැත්ත ඇතිව, සමාගමක අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත් කරනු ලබන හෝ කටයුතු කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරන්නේ ය.

**182.** (1) පහත සඳහන් තැනැත්තන් සහ ඔවුන්ට සම්බන්ධ පාර්ශ්ව සමාගමක අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත් කරනු ලැබීමට හෝ කටයුතු කරනු ලැබීමට නුසුදුස්සන් විය යුතු ය; එනම් - අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත්කරනු ලැබීමට හෝ කටයුතු කරනු ලැබීමට නුසුදුසුකම්

(අ) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කළ දිනට පෙරාතුවම වූ අවුරුදු දෙකක කාලසීමාව තුළ සමාගමෙහි ඇවරකරුවකු ලෙස හැර, සමාගමේ ණයහිමියකු වූ හෝ වන තැනැත්තකු;

(ආ) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කළ දිනට පෙරාතුවම වූ අවුරුදු දෙකක කාලසීමාව තුළ සමාගමේ හෝ සම්බන්ධිත සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධාරියකු හෝ විගණකවරයකු හෝ සේවා නියුක්තයකු වූ හෝ වන තැනැත්තකු;

(ඇ) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කළ දිනට පෙරාතුවම වූ අවුරුදු දෙකක කාලසීමාව තුළ -

(i) සමාගම විසින් හෝ සම්බන්ධිත සමාගමක් විසින් නිකුත් කරන ලද කොටසකට සෘජු බැඳියාවක්; හෝ

(ii) සමාගම විසින් හෝ සම්බන්ධිත සමාගමක් විසින් නිකුත් කරන ලද යම් පන්තියක කොටස් වලින් සියයට පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයකට වක්‍ර බැඳියාවක්; හෝ

තිබූ හෝ තිබෙන තැනැත්තකු,

(ඈ) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කළ දිනට පෙරාතුවම වූ අවුරුදු තුනක කාලසීමාව තුළ සමාගමේ දේපළ සම්බන්ධයෙන් දේපළ භාර ගැනුම්කරුවකු ලෙස සිටි හෝ පත්වීම් ලාභියෙකු වූ තැනැත්තකු.

(2) (1) වන උපවගන්තිය යටතේ නුසුදුස්සකු වූ තැනැත්තකු අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත් කරනු ලබන විට හෝ කටයුතු කරනු ලබන විට, ඔහු වරදක් කරන්නේ ය.

අද්මිනිස්ත්‍රාසිකරුව පත් කළ හැක්කේ කවුරුන්ටද?

**183.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අද්මිනිස්ත්‍රාසිකරුවකු-

(අ) 185 වන වගන්තිය යටතේ සමාගම විසින්;

(ආ) 186 වන වගන්තිය යටතේ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්;

(ඇ) 188 වන වගන්තිය යටතේ ඇවරකරුවකු හෝ තාවකාලික ඇවරකරුවකු විසින් ;

(ඈ) 189 වන වගන්තිය යටතේ සුරක්ෂිත ණයහිමියකු හෝ දේපළ භාර ගැනුම්කරුවකු විසින්; හෝ

(ඉ) 190 වන වගන්තිය යටතේ අධිකරණය විසින්,

පත් කරනු ලැබිය හැකි ය.

(2) සමාගම දැනටමත් අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින්නේ නම්, අද්මිනිස්ත්‍රාසිකරුවකු-

(අ) 254 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ, ණයහිමියන් විසින් ඉවත් කරන ලද අද්මිනිස්ත්‍රාසිකරුවකු වෙනුවට ප්‍රතියෝජක අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස ණයහිමියන් විසින් ;

(ආ) 253 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පළමු අද්මිනිස්ත්‍රාසිකරුගේ පත් කරන්නා විසින් ;

(ඇ) අධිකරණය විසින්; හෝ

(ඈ) 253 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) අනුඡේදය යටතේ අධිකරණය විසින් නිශ්චිතව දක්වනු ලබන ක්‍රියාවලියකින් පසුව,

හැර පත්කරනු නොලැබිය යුතු ය.

තැනැත්තන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අද්මිනිස්ත්‍රාසිකරුවන් ලෙස පත්කිරීම

**184.** (1) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම සඳහා මේ කොටස මගින් විධිවිධාන සලස්වනු ලබන කවර හෝ අවස්ථාවක දී, අද්මිනිස්ත්‍රාසිකරුවන් ලෙස තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් පත් කරනු ලැබිය හැකි ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරුවන් ලෙස තැනැත්තන් දෙදෙනකු හෝ වැඩි ප්‍රමාණයක් පත්කරනු ලබන අවස්ථාවක-

(අ) පත්කිරීම කරනු ලබන යෝජනා සම්මතයේ, සාධන පත්‍රයේ හෝ නියෝගයේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ බලතල සහ කර්තව්‍ය අද්මිනිස්ත්‍රාසිකරුවන්ගෙන් එක් අයකු විසින් හෝ දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් එක්ව හෝ ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම, සිදුකළ හැකි ය;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුවන් ලෙස එම තැනැත්තන් තනිව සහ වෙන් වෙන්ව වගකිව යුතු ය; සහ

(ඇ) මේ පනතා යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවකුට කරන ලද සඳහනක් අවශ්‍යතාව පරිදි, යම් අද්මිනිස්ත්‍රාසිකරුවකුට හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන් කිහිප දෙනකුට කරන ලද සඳහනක් අදහස් වේ.

සමාගමක් විසින් අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම

**185.** (1) යෝජනා සම්මතයක් මගින් -

(අ) යෝජනා සම්මතයට ඡන්දය ප්‍රකාශ කරනු ලබන කොටස් හිමියන්ගේ මතය අනුව, සමාගම වස්තුභංගත්වයට පත්ව ඇති බව හෝ පත්වීමට ඉඩ ඇති බවට; සහ

(ආ) සමාගමේ අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කළ යුතු බවට,

සමාගම විසින් තීරණය කරන ලද අවස්ථාවක දී, 187 වගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමක් විසින් සාමාන්‍ය යෝජනා සම්මතයක් මගින්, අද්මිනිස්ත්‍රාසිවරයකු පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන පත්වීමක් ලිඛිතව විය යුතු ය.

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීම

**186.** (1) යෝජනා සම්මතයක් මඟින් -

(අ) යෝජනා සම්මතයට ඡන්දය ප්‍රකාශ කරනු ලබන අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව, සමාගම වස්තුභංගත්වයට පත්ව ඇති බව හෝ පත්වීමට ඉඩ ඇති බවට; සහ

(ආ) සමාගමේ අද්මිනිස්ත්‍රාසිකරුවකු පත්කළ යුතු බවට,

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලද අවස්ථාවක දී, 187 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මතයක් මගින් අද්මිනිස්ත්‍රාසිවරයකු පත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන පත්වීමක් ලිඛිත විය යුතු ය.

(3) සමාගමේ ව්‍යවස්ථාවලිය මගින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කළමනාකාරිත්වය පවරා දෙනු ලබන අවස්ථාවක දී (1) උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කර ඇති කාරණය සම්බන්ධයෙන් හෝ අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් පත් කළ යුත්තේ කවරෙක් ද යන්න පිළිබඳව කොටස් හිමියන්ගේ මතය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අතර ගැටුමක් ඇති විට, අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය බලපැවැත්විය යුතු ය.

සමාගම හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීම මත වන සීමාව

**187.** (1) ඇවර කිරීමක් ආරම්භ වීමෙන් පසු, 185 වන වගන්තිය හෝ 186 වන වගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවකු පත්කළ නොහැකි ය.

(2) 190 වන වගන්තිය යටතේ හෝ 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර, සමාගම වෙත භාර දී එය සලකා බලමින් සිටින අතර වාරයේ දී, 185 වන වගන්තිය හෝ 186 වන වගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම, -

(අ) සමාගම වෙත ඉල්ලීම භාර දී වැඩ කරන දින හතක් ඇතුළත එකී පත් කිරීම කරනු ලබන්නේ නම්;

(ආ) ස්වකීය පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව 190 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය හෝ 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ණයහිමියකු විසින් ඉල්ලීම කර ඇත්නම්;

(ඇ) අධිකරණයේ අවසරය ඇතිව; හෝ

(ඈ) කලින් සිටි අද්මිනිස්ත්‍රාසිකරු-

(i) මේ උපවගන්තියේ පූර්වගාමී ඡේදයකට අනුකූලව; හෝ

(ii) මේ ඡේදයට අනුකූලව,

පත් කරනු ලැබූ අවස්ථාවක දී, අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම සඳහා ප්‍රතියෝජක අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන්,

මිස කළ නොහැකි ය.

(3) සමාගමේ දේපළ සහ ව්‍යාවසාය සම්පූර්ණයෙන් හෝ සැහෙන ප්‍රමාණයෙන් දේපළ භාර ගැනුම් භාරකාරත්වයක පවතින විටදී, 185 වන හෝ 186 වන වගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවකු, -

(අ) දේපළ භාරගැනුම්කරු පත් කරනු ලැබුවේ යම් තැනැත්තකු විසින් ද, හෝ යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් වෙනුවෙන් ද එම තැනැත්තාගේ පූර්ව ලිඛිත කැමැත්ත ඇතිව;

(ආ) අධිකරණයේ අවසරය ඇතිව; හෝ

(ඇ) කලින් සිටි අද්මිනිස්ත්‍රාසිකරු-

(i) මේ උපවගන්තියේ පූර්වගාමී ඡේදයකට අනුකූලව; හෝ

(ii) මේ ඡේදයට අනුකූලව,

පත් කරනු ලැබූ අවස්ථාවක දී, අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම සඳහා ප්‍රතියෝජක අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන්, මිස කළ නොහැකි ය.

ඇවරකරුවකු විසින් හෝ තාවකාලික ඇවරකරුවකු විසින් හෝ අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීම

**188.** (1) සමාගමක ඇවරකරුවකු හෝ තාවකාලික ඇවරකරුවකු විසින් -

(අ) සමාගම වස්තුභංගත්වයට පත්ව ඇති බව හෝ පත්වීමට ඉඩ ඇති බව; සහ

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරනු ලබන්නේ නම් -

(i) සමාගම බේරාගත හැකි බව හෝ එහි ව්‍යාපාර කටයුතු සම්පූර්ණයෙන් හෝ කොටසක් සාක්ෂාත් කරගත හැකි බව; හෝ

(ii) ණයහිමියන්ට සහ කොටස් හිමියන්ට වැඩි ලාභයක් ලැබිය හැකි බව,

සිතන්නේ නම් එකී ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු විසින් (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) උපවගන්තිය යටතේ වන පත්වීමක් ලිඛිත විය යුතු ය.

(3) ඇවරකරුවකු හෝ ඇවරකරුවකුට සම්බන්ධිත පාර්ශ්වයක්, ප්‍රථමයෙන් -

(අ) යෝජනා සම්මතයක් මගින් ණයහිමියන්ගේ අනුමතය ලබා ගැනීමෙන්; හෝ

(ආ) අධිකරණයේ අවසරය ලබා ගැනීමෙන්,

තොරව, අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත් කරනු නොලැබිය යුතු ය:

(4) (1) වන උපවගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම මගින්, අවස්ථාවෝචිත පරිදි, ඇවරකරුගේ හෝ තාවකාලික ඇවරකරුගේ සමාගම වෙනුවෙන් ක්‍රියා කිරීමේ බලතල ද ඇතුළත්ව, ඇවරකිරීම හෝ තාවකාලික ඇවර කිරීම අත්හිටුවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ සඳහන් කිසිවක් මගින්, අවස්ථාවෝචිත පරිදි, ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු, (1) වන උපවගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීමත් සමගම ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු බවට අදහස් නොවිය යුතු ය.

**189.** (1) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සමාගමක දේපළ හෝ ව්‍යවසාය සම්පූර්ණයෙන් හෝ සැලකිය යුතු කොටසක් මත බැඳීමක් ඇති සුරක්ෂිත ණයහිමියකු විසින් හෝ එම තැනැත්තා විසින් පත් කරන ලද දේපළ භාර ගැනුම්කරුවෙකු විසින්, එකී බැඳීම බලාත්මක බවට පත්ව ඇති සහ තවමත් බලාත්මක කළ හැකි අවස්ථාවක දී අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කළ හැකි ය.

සුරක්ෂිත ණයහිමියකු විසින් අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීම

(2) (1) වන උපවගන්තිය යටතේ වන පත්වීමක් ලිඛිත විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරනු ලබන සුරක්ෂිත ණයහිමියකු විසින්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් සහ පත්වීමෙන් පසු ඊළඟ වැඩ කරන දිනය අවසන් වීමට පෙර කවර හෝ අවස්ථාවක දී එකී පත්වීම පිළිබඳ සමාගමට ලිඛිත දැනුම් දීමක් කළ යුතු ය.

(4) සමාගම දැනටමත් ඇවර කිරීමට ලක්ව ඇත්නම්, සුරක්ෂිත ණයහිමියා හෝ දේපළ භාරගැනුම්කරු විසින් අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කළ නොහැකි ය.

**190.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අධිකරණය විසින්-

අධිකරණය විසින් අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීම

(අ) සමාගමක්;

(ආ) සමාගමේ අධ්‍යක්ෂවරුන් එක් අයකු හෝ වැඩි ගණනක්;

(ඇ) සමාගමේ සහදායකයකු;

(ඇ) සමාගමේ (අවිනිශ්චිත හෝ අනාගත ණයහිමියකු ද ඇතුළුව) ණයහිමියකු;

(ඉ) සමාගම ඇවර කරනු ලබන්නේ නම්, ඇවරකරු;

(ඊ) තාවකාලික ඇවරකරුවකු පත් කර ඇති අවස්ථාවක, තාවකාලික ඇවරකරු;

(උ) රෙජිස්ට්‍රාර්වරයා; හෝ

(ඌ) අධිකාරිය,

විසින් කරනු ලබන ඉල්ලීමක් මත, අද්මිනිස්ත්‍රාසිවරයකු පත් කළ හැකි ය.

(2) අධිකරණය විසින්, -

(අ) සමාගම වස්තුභංගත්වයට පත්ව ඇති හෝ පත්වීමට ඉඩ ඇති නමුත්, අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරනු ලැබුවහොත් –

(i) සමාගම බේරාගත හැකි බව හෝ එහි ව්‍යාපාර කටයුතු සම්පූර්ණයෙන් හෝ කොටසක් සාක්ෂාත් කරගත හැකිවන බවට; හෝ

(ii) සමාගම ඇවර කිරීම වහාම ආරම්භ කිරීමට වඩා එමඟින්, ණයහිමියන්ට සහ කොටස් හිමියන්ට වැඩි ලාභයක් ලැබිය හැකි බවට; හෝ

(ආ) එසේ කිරීම සාධාරණ සහ යුක්ති සහගත බවට,

සෑහීමට පත් වන්නේ නම්, අධිකරණය විසින් අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරනු ලැබිය හැකි ය.

අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කළ බව සටහන් කළ යුතු බව

**191.** (1) 185 වන වගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරනු ලබන අවස්ථාවකදී අද්මිනිස්ත්‍රාසිකරුවා පත් කරනු ලබන යෝජනා සම්මතයේ, යෝජනා සම්මතය සම්මත කරගනු ලැබූ දිනය සහ වේලාව සමාගම විසින් සටහන් කළ යුතු ය.

(2) 186 වන වගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරනු ලබන අවස්ථාවක දී, අද්මිනිස්ත්‍රාසිකරුවා පත් කරනු ලබන යෝජනා සම්මතයේ, යෝජනා සම්මතය සම්මත කරගනු ලැබූ දිනය සහ වේලාව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සටහන් කළ යුතු ය.

(3) 188 වන වගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවෙකු පත් කරනු ලබන අවස්ථාවක දී අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරනු ලබන සාධන පත්‍රයේ, සාධන පත්‍රය ලියා අත්සන් කරනු ලැබූ දිනය හා වේලාව අවස්ථාවෝචිත පරිදි, ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු විසින් සටහන් කළ යුතු ය.

(4) 189 වන වගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරනු ලබන අවස්ථාවක දී, අද්මිනිස්ත්‍රාසිකරුවෙකු පත් කරනු ලබන සාධන පත්‍රයේ, සාධන පත්‍රය ලියා අත්සන් කරනු ලැබූ දිනය සහ වේලාව සුරක්ෂිත ණයහිමියා හෝ දේපළ භාර ගැනුම්කරු විසින් සටහන් කළ යුතු ය.

(5) 190 වන වගන්තිය යටතේ අධිකරණය විසින් අද්මිනිස්ත්‍රාසිකරුවෙකු පත් කරනු ලබන අවස්ථාවක දී, ඇවරකරුවකු පත් කරමින් කරනු ලැබූ නියෝගයේ, එම නියෝගය කරනු ලැබූ දිනය සහ වේලාව අධිකරණය විසින් සටහන් කළ යුතු ය.

අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීමට නොහැකි බව

**192.** අද්මිනිස්ත්‍රාසිවරයකු පත් කිරීම -

(අ) අධිකරණය විසින්; හෝ

(ආ) මේ කොටස යටතේ ණයහිමියන් විසින්,

අද්මිනිස්ත්‍රාසිකරු ඉවත් කරනු ලබන අවස්ථාවකදී හැර, ප්‍රත්‍යාදිෂ්ඨ කළ නොහැකි ය.

අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීම පිළිබඳ දැන්වීම සහ විස්තර

**193.** (1) අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින්-

(අ) අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීමෙන් පසු එළඹෙන ඊළඟ වැඩ කරන දිනය අවසන්වීමට පෙර පත්වීම පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට ලිඛිතව දැන්විය යුතු ය;

(ආ) ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් සහ පත්කිරීමෙන් පසු එළඹෙන ඊළඟ වැඩ කරන දිනය අවසන්වීමට පෙර සමාගමේ දේපළ හෝ ව්‍යවසාය සම්පූර්ණයෙන් හෝ සැළකිය යුතු කොටසක් සම්බන්ධයෙන් බැඳීමක් ඇති එක් එක් තැනැත්තාට පත්වීම පිළිබඳ ලිඛිතව දැන්විය යුතු ය; සහ

(ඇ) පත් කිරීමෙන් පසු වැඩ කරන දින දෙකක් ඇතුළත -

(i) අද්මිනිස්ත්‍රාසිකරුගේ පත්වීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් කළ යුතු ය ; සහ

(ii) ප්‍රසිද්ධ දැන්වීමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත යැවිය යුතු ය.

(2) ප්‍රසිද්ධ දැන්වීමේ අන්තර්ගතයට -

(අ) අද්මිනිස්ත්‍රාසිකරුගේ සම්පූර්ණ නම ;

(ආ) පත් කරනු ලැබූ දිනය;

(ඇ) අද්මිනිස්ත්‍රාසිකරු පත් කළ තැනැත්තාගේ අනන්‍යතාවය සහ, පත් කරනු ලැබුවේ අධිකරණය වන අවස්ථාවක දී පත් කිරීම සිදුකිරීම සඳහා ඉල්ලීමක්

ඉදිරිපත් කළ තැනැත්තාගේ අනන්‍යතාවය; සහ

(ඈ) අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යාල ලිපිනය සහ සාමාන්‍ය වැඩ කරන වේලාවන්හි දී, විමසීම් යොමු කළ හැකි අද්මිනිස්ත්‍රාසිකරුගේ දුරකථන අංකය ද,

ඇතුළත් විය යුතු ය.

(3) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරනු ලබන්නේ දැනටමත් ධුරය දරන අද්මිනිස්ත්‍රාසිකරුවකුට අමතරව වන්නේනම් හෝ ධුරය හැර ගිය අද්මිනිස්ත්‍රාසිකරුවකු වෙනුවට නම්, (1) උපවගන්තිය යටතේ වන එක් එක් දැන්වීමෙහි එම කරුණ සඳහන් කළ යුතු ය.

(4) අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යාලයීය ලිපිනයේ හෝ දුරකථන අංකයේ යම් වෙනසක් සිදු වුවහොත්, අද්මිනිස්ත්‍රාසිකරු විසින්, වැඩ කරන දින දෙකක් ඇතුළත -

(අ) අවස්ථාවෝචිත පරිදි, නව ලිපිනය හෝ නව දුරකථන අංකය පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් කළ යුතු ය; සහ

(ආ) ප්‍රසිද්ධ දැන්වීමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත යැවිය යුතු ය.

(5) මේ වගන්තියේ විධිවිධානවලට අනුව කටයුතු කිරීමට අපොහොසත් වීම මගින් යම් තැනැත්තෙකු අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත්කිරීමේ වලංගුභාවයට බලපෑමක් සිදු නොවිය යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධානවලට අනුව කටයුතු කිරීමට අපොහොසත් වන අද්මිනිස්ත්‍රාසිකරුවකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

අද්මිනිස්ත්‍රාසි කිරීම පිළිබඳව ලේඛනවල සඳහන්කළ යුතු බව

**194.** (1) යම් සමාගමක් අද්මිනිස්ත්‍රාසි කරනු ලබමින් පවතින තාක් දුරට, අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් -

(අ) සමාගම විසින් හෝ අද්මිනිස්ත්‍රාසිකරු විසින් හෝ නිකුත් කරනු ලබන හෝ අත්සන් කරනු ලබන සෑම ලේඛනයකම සමාගමේ නම පළමුවරට සඳහන් කරනු ලබන අවස්ථාවේ දී සමාගමේ නමට පසුව “අද්මිනිස්ත්‍රාසිකරමින් පවතින” යන වචන තිබෙන බවට; සහ

(ආ) සමාගමට වෙබ් අඩවි එකක් හෝ කිහිපයක් තිබේ නම්, එක් එක් වෙබ් අඩවියේ සෑම පිටුවකම සමාගම අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින බව ප්‍රකටව පෙනෙන ලෙස සඳහන්ව ඇති බවට,

සහතික විය යුතු ය.

(2) (1) වන උපවගන්තියට අනුව කටයුතු කිරීමට අපොහොසත්වීම මගින්-

(අ) යම් පුද්ගලයකු අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත් කිරීමේ වලංගුභාවයට; හෝ

(ආ) යම් ලේඛනයක වලංගු භාවයට,

බලපෑමක් සිදු නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියට අනුව කටයුතු කිරීමට අපොහොසත් වන සෑම තැනැත්තකුම වරදක් සිදු කරනු ලබන්නේ ය.

අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින ලේඛනවල සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව සඳහන් විය යුතු බව.

**195.** (1) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කිරීමට මාස හයකට අඩු කාලයක් තුළ දී අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින සමාගමක් එහි නම වෙනස් කරනු ලැබ ඇති අවස්ථාවකදී, අද්මිනිස්ත්‍රාසිකරු විසින් -

(අ) සමාගම විසින් හෝ අද්මිනිස්ත්‍රාසිකරු විසින් නැතහොත් සමාගම වෙනුවෙන් හෝ අද්මිනිස්ත්‍රාසිකරු වෙනුවෙන් නිකුත් කරන ලද හෝ අත්සන් කරන සෑම ලේඛනයකම සමාගමේ පෙර පැවැති නම ඇතුළත් කළ යුතු ය; සහ

(ආ) සමාගමට වෙබ් අඩවි එකක් හෝ කිහිපයක් තිබේනම්, එක් එක් වෙබ් අඩවියේ සෑම පිටුවකම සමාගමේ පෙර පැවැති නම ඇතුළත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියට අනුව කටයුතු කිරීමට අපොහොසත් වීම මගින් –

(අ) යම් පුද්ගලයකු අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත් කිරීමේ වලංගුභාවයට; හෝ

(ආ) යම් ලේඛනයක වලංගුභාවයට,

බලපෑමක් සිදු නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියට අනුව කටයුතු කිරීමට අපොහොසත් වන සෑම තැනැත්තකුම වරදක් සිදු කරනු ලබන්නේ ය.

4 වන පරිච්ඡේදය

**අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපෑම්**

**196**. (1) 202 වන හා 203 වන වගන්තිවල විධිවිධාන වලට යටත්ව සමාගමක් අද්මිනිස්ත්‍රාසි කිරීම සිදු කරන කාලය තුළ කිසිදු පුද්ගලයකු විසින්- අද්මිනිස්ත්‍රාසි කිරීම සිදුවන කාලය තුළ පිළිබැඳීම් ක්‍රියාත්මක නොකළ යුතු බව

(අ) සමාගමේ දේපළ මත යම් පිළිබැඳීමක්; හෝ

(ආ) සමාගමේ යම් ණයක්, බැරකමක් හෝ වෙනත් බැඳීමක් සම්බන්ධයෙන් ලබාදී ඇති තුන්වන පාර්ශ්වයක දේපළ මත ඇති පිළිබැඳීමක්,

ක්‍රියාත්මක කිරීම;

(ඇ) අද්මිනිස්ත්‍රාසිකරුගේ පූර්ව ලිඛිත අවසරය ඇතිව මිස; හෝ

(ඈ) අවශ්‍ය පරිදි යම් නියම සහ කොන්දේසි මත අධිකරණයේ අවසරය ඇතිව මිස,

නොකළ යුතු ය.

(2) පිළිබැඳීම් ක්‍රියාත්මක කිරීම මගින් සමස්තයක් ලෙස ණයහිමියන්ගේ අයිතිවාසිකම්වලට හානියක් සිදු නොවන බවට අද්මිනිස්ත්‍රාසිකරු සෑහීමකට පත්වන අවස්ථාවක දී (1)වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ අද්මිනිස්ත්‍රාසිකරු විසින් කැමැත්ත ලබා දිය හැකි ය.

(3) අද්මිනිස්ත්‍රාසිකරු විසින් (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ කැමැත්ත ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අලාභ ගෙවීමකට යටත් නොවිය යුතු ය.

(4) එසේ නොකළේ නම් සැලකිය යුතු අසාධාරණයක් සිදුවන බවට අධිකරණය සෑහීමකට පත්වන අවස්ථාවක දී (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය යටතේ අධිකරණය විසින් අවසර ලබා දිය හැකි ය.

අද්මිනිස්ත්‍රාසි කිරීම සිදුවන කාලය තුළ දේපළ ආපසු ලබා නොගත යුතු බව

**197.** (1) 202 වන සහ 203 වන වගන්තිවල විධිවිධාන වලට යටත්ව සමාගමක් අද්මිනිස්ත්‍රාසි කිරීම කරනු ලබන කාලය තුළ දී, කුළී සින්නක්කර ගිවිසුමක් යටතේ ද ඇතුළුව සමාගමේ සන්තකය දරා සිටින හෝ දේපළ භාවිත කරනු ලබන හෝ පදිංචි වී සිටින යම් දේපළක හිමිකරු හෝ බදු දීමනාකරු විසින් -

(අ) අද්මිනිස්ත්‍රාසිකරුගේ පූර්ව ලිඛිත අවසරය ඇතිව මිස; හෝ

(ආ) අවශ්‍ය පරිදි යම් නියම සහ කොන්දේසි මත අධිකරණයේ අවසරය ඇතිව මිස,

එම දේපලේ සන්තකය ආපසු ලබා ගැනීම නැතහොත් දේපළ ආපසු ගැනීම නොකළ යුතු ය.

(2) දේපළ සන්තකයේ තබා ගැනීම මගින් නැතහොත් දේපළ ආපසු ගැනීම මගින් සමස්තයක් වශයෙන්, ණයහිමියන්ගේ අයිතිවාසිකම්වලට හානියක් නොවන බවට අද්මිනිස්ත්‍රාසිකරු සෑහීමකට පත්වන අවස්ථාවක දී (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ අද්මිනිස්ත්‍රාසිකරු විසින් කැමැත්ත ලබා දිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කැමැත්ත ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසිකරු අලාභ ගෙවීමට යටත් නොවන්නේ ය.

(4) එසේ නොකළේ නම් අන්‍යාකාරයකට සැලකිය යුතු අසාධාරණයක් සිදුවන බවට අධිකරණය සෑහීමකට පත්වන අවස්ථාවක දී (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අධිකරණය විසින් අවසර ලබා දිය හැකි ය.

අද්මිනිස්ත්‍රාසි කිරීම අතරතුර දී නඩු කටයුතු ආරම්භ කිරීම හෝ පවත්වා ගෙන යාම නොකළ යුතු බව

**198.** (1) සමාගමක අද්මිනිස්ත්‍රාසි කිරීම අතරතුර දී -

(අ) අද්මිනිස්ත්‍රාසිකරුගේ පූර්ව ලිඛිත කැමැත්ත ඇතිව මිස; හෝ

(ආ) අවශ්‍ය පරිදි යම් නියම සහ කොන්දේසි මත අධිකරණයේ අවසරය ඇතිව මිස,

සමාගමට හෝ එහි දේපළවලට එරෙහිව කිසිදු විධිමත් නඩු කටයුත්තක් ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(2) (1) උපවගන්තියේ කාර්ය සඳහා, “විධිමත් නඩු කටයුතු” යන්නට-

(අ) යම් නීති කෘත්‍යයක්; සහ

(ආ) යම් සමථකරණයක් හෝ බේරුම්කරණයක් හෝ වෙනත් ප්‍රතිකූල ක්‍රියාවලියක්,

අදහස් වේ.

(3) නඩු කටයුතු ආරම්භ කිරීම හෝ දිගටම පවත්වාගෙන යාම මගින්, සමස්තයක් ලෙස ණයහිමියන්ගේ අයිතිවාසිකම්වලට හානියක් සිදු නොවන බවට අද්මිනිස්ත්‍රාසිකරු සෑහීමට පත්වන අවස්ථාවක දී, (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ අද්මිනිස්ත්‍රාසිකරු විසින් කැමැත්ත ලබා දිය හැකි ය.

(4) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කැමැත්ත ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසිකරු අලාභ ගෙවීමකට යටත් නොවන්නේ ය.

(5) එසේ නොකළේ නම් සැළකිය යුතු අසාධාරණයක් සිදු වන බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක දී, (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අධිකරණයට අවසර ලබා දිය හැකි ය.

අද්මිනිස්ත්‍රාසි කිරීම පවතින කාලය තුළ දී ක්‍රියාවේ යෙදවීම හෝ වෙනත් ක්‍රියාවලියක් සිදු නොකළ යුතු බව

**199.** 202 වන සහ 203 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව සමාගමක් අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින කාලය තුළ දී අවශ්‍ය පරිදි යම් නියම හා කොන්දේසි මත අධිකරණයේ අවසරය ඇතිව මිස, සමාගමට එරෙහිව හෝ එහි යම් දේපළකට එරෙහිව යම් තීන්දුවක් ක්‍රියාත්මක කිරීමක් හෝ නීතිමය ක්‍රියාවලියක් හෝ බදු ප්‍රතිකර්ම මුදලක් අයකිරීමක් හෝ ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

අද්මිනිස්ත්‍රාසි කිරීමට පෙර අවසන් කළහොත් මිස තීන්දුවක් ක්‍රියාත්මක කිරීමකින් හෝ වෙනත් ක්‍රියාවලියකින් ප්‍රතිලාභ අත්කර නොගත යුතු බව

**200.** (1) අවශ්‍ය පරිදි යම් නියම හා කොන්දේසි මත අධිකරණයේ අවසරය ඇතිව මිස, අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කිරීමට පෙර යම් තීන්දුවක් ක්‍රියාත්මක කිරීමක් හෝ වෙනත් නීතිමය ක්‍රියාවලියක් හෝ ප්‍රතිකර්ම ක්‍රියාවලියක් අවසන් කරනු ලැබුවහොත් මිස, අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින සමාගමකට හෝ එහි යම් දේපළකට එරෙහිව ඇති එකී තීන්දුව ක්‍රියාත්මක කිරීමකින් හෝ වෙනත් නීතිමය ක්‍රියාවලිය හෝ ප්‍රතිකර්ම ක්‍රියාවලිය මගින් ප්‍රතිලාභ අත්කර ගැනීමට (2) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව ණයහිමියකුට හිමිකමක් නොමැති විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා -

(අ) වංචල හෝ නිශ්චල දේපළවලට එරෙහිව තීන්දුවක් ක්‍රියාත්මක කිරීමක්, තහනමට ගැනීමක් මගින් හෝ දේපළ භාර ගැනුම්කරුවකු හෝ පත් කරනු ලැබූ තැනැත්තකු විසින් හෝ තීන්දුව ක්‍රියාවේ යෙදවීම භාර තැනැත්තකු විසින් දේපළේ සන්තකයට ලබාගැනීම සහ සම්පූර්ණ වූ විකිණීමක් මගින් අවසන් වේ; සහ

(ආ) යම් ණයක් ගෙවීමෙන් එම ණය පිළිබඳ බැරකම අවසන් වේ.

(3) (අ) තීන්දුවක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය භාරව සිටින පිස්කල්වරයකුගෙන්; හෝ

(ආ) ප්‍රතිකර්මයක් අය කරන ලද,

සමාගමේ දේපළක් සත්භාවයෙන් අත්පත් කරගන්නා තැනැත්තකු විසින් සමාගමට සහ අද්මිනිස්ත්‍රාසිකරුට එරෙහිව එම දේපළේ මනා අයිතියක් ලබා ගනී.

(4) මේ කොටසේ ඇති කිසිවක් මගින් 412 වන, 413 වන, 414 වන, 415 වන, 416 වන, 417 වන, 418 වන සහ 419 වන වගන්තිවල අදාළ වීමට බලපෑමක් හෝ සීමා කිරීමක් සිදු නොවිය යුතු ය.

අද්මිනිස්ත්‍රාසි කිරීමේ දී පිස්කල්වරයාගේ කාර්යභාරය

**201.** (1) මේ වගන්තිය, අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කිරීමට පෙර 200 වන වගන්තියේ අර්ථානුකූලව, අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින සමාගමක දේපළට එරෙහිව ඇති එහෙත් සම්පූර්ණ නොකළ වූ තීන්දුවක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියකට අදාළ වේ.

(2) වෙනත් යම් ප්‍රඥප්තියක කුමක් සඳහන් වුව ද, (3) උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සහ තීන්දුවක් ක්‍රියාත්මක කරනු ලබන ණය හිමියාගේ ඉල්ලීමක් මත අධිකරණය අන්‍යාකාරයකට නියෝග කරන්නේ නම් මිස, පිස්කල්වරයා විසින්, අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කළ පසු හැකිතාක් ඉක්මනින් -

(අ) තීන්දුව ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පිස්කල්වරයාගේ සන්තකයට පත් වූ හෝ භාරකාරත්වයට පත් වූ හෝ පාලනයට යටත් වූ සමාගමේ දේපළක්, අද්මිනිස්ත්‍රාසිකරුට භාර දිය යුතු ය; සහ

(ආ) තීන්දුව ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය යටතේ-

(i) සමාගමේ දේපළ උපලබ්ධි වීමෙන් ලැබෙන යම් ලාභ ;

(ii) ලැබුණු හෝ පරිග්‍රහණ තහනමට ගනු ලැබූ සමාගමේ යම් මුදලක්; සහ

(iii) සමාගමේ දේපළ තහනමට ගැනීම හෝ විකිණීම වැළැක්වීම සඳහා ගෙවන ලද යම් මුදලක්,

එකී ලාභ හෝ මුදල් පිස්කල්වරයාගේ සන්තකයේ හෝ භාරකාරිත්වයේ හෝ පාලනයේ පවතින විට හෝ සන්තකයට හෝ භාරකාරත්වයට හෝ පාලනයට පත්ව ඇති විට යටතේ පවතින විට, හෝ එකී මුදල් අධිකරණයට ගෙවා ඇති විට සහ ඉන් ගෙවීමක් සිදුකර නොමැති විට අද්මිනිස්ත්‍රාසිකරුට ගෙවීමට කටයුතු සැළැස්විය යුතු ය:

(3) පිස්කල්වරයා විසින් -

(අ) (2) වන උපවගන්තියේ (අ)ඡේදය යටතේ ලබාදී ඇති දේපළෙන්, තීන්දුව ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ දී පිස්කල්වරයා විසින් දරන ලද වියදමට සමාන බවට පිස්කල්වරයා විසින් සාධාරණ ලෙස නිශ්චය කරනු ලබන වටිනාකමකට සමාන දේපළක්; හෝ

(ආ) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ගෙවන ලද ලාභ හෝ මුදල් වලින්, තීන්දුව ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සඳහා පිස්කල් වරයා විසින් දරන ලද වියදම්,

රඳවා තබා ගැනීම හෝ රඳවා තබා ගැනීමට සැලැස්වීම කළ හැකි ය.

අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කිරීමට පෙර ක්‍රියාත්මක කරනු ලබන බලතල

**202.** (1) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කිරීමට පෙර-

(අ) දේපළ මත පිළිබැඳීම ක්‍රියාත්මක කිරීම මගින්; හෝ

(ආ) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ ද ඇතුළුව දේපළක සන්තකය ලබා ගැනීම හෝ අන්‍යාකාරයෙන් ආපසු ලබා ගැනීම සඳහා එම දේපළේ අයිතිකරුට හෝ බදු දීමනාකරුට ඇති අයිතියක් ක්‍රියාත්මක කිරීමක් මගින්,

දේපළ භාර ගැනුම්කරුවකු, පත්වීම්ලාභියකු හෝ වෙනත් තැනැත්තකු සමාගමේ හෝ තුන්වන පාර්ශ්වයක දේපළකට එහි සන්තකය ලබා ගැනීමට හෝ භාරකාරත්වය හෝ පාලනය ලබාගැනීමට හැකි අවස්ථාවක දී හෝ දේපළට සම්බන්ධයෙන් වෙනත් යම් බලතලයක් ක්‍රියාත්මක කරන අවස්ථාවක දී, 196 වන, 197 වන, 199 වන සහ 208 වන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති කිසිවක් මගින් එම දේපළට අදාළව, දේපළ භාරගැනුම්කරු, පත්වීම්ලාභියා හෝ වෙනත් තැනැත්තෙකු බලතල ක්‍රියාත්මක කිරීම කර්තව්‍ය ඉටුකිරීම සහ වළක්වනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් දේපළකට බලපාන්නා වූ සහ දේපළ භාර ගැනුම්කරුවකු හෝ පත්වීම්ලාභියකු හෝ (1) වන උපවගන්තියේ සඳහන් වෙනත් තැනැත්තකුගේ කර්තව්‍යයක් ඉටු කිරීම සම්බන්ධයෙන් හෝ බලතලයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එළඹිය යුතු වන්නා වූ ගිවිසුමකට, පැවරීමකට හෝ ගනුදෙනුවකට 208 වන වගන්තිය අදාළ නොවිය යුතු ය.

ස්ථාවර සුරකුම් බලාත්මක කිරීමට අවසර ලබාදීම සඳහා වූ තීරණ කාලය තුළ කරනු ලබන ඉල්ලීම

**203.** (1) මේ වගන්තියේ "තීරණ කාලය" යන්නෙන් අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින සමාගමක දේපළ මත ස්ථිර සුරකුමක් දීමනා ලාභියකු සම්බන්ධයෙන් වන විට -

(අ) (i) 193 වන වගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීම පිළිබඳ දැන්වීම දීමනාලාභියාට යැවිය යුතු නම්, දැන්වීම ලබාදීමට නියමිත වන්නේ දැන්වීම ලබන දිනයෙන් ආරම්භ වන්නා වූ; හෝ

(ii) වෙනත් ඕනෑම අවස්ථාවක දී, අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භවන දිනයෙන් ආරම්භ වන්නා වූ ; සහ

(ආ) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භවීමෙන් පසු දහවන වැඩ කරන දිනයේ අවසානයේ දී අවසන් වන්නා වූ,

කාලසීමාව අදහස් වේ.

(2) අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින සමාගමක දේපළක් සම්බන්ධයෙන් වන ස්ථිර සුරකුමක දීමනාලාභියකු විසින්, තීරණ කාලය තුළ, ස්ථිර සුරකුම ක්‍රියාවේ යෙදවීම සඳහා අවසර ලබා දෙන ලෙසට ආඥාවක් ලබා ගැනීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අධිකරණයට ඉල්ලීමක් කරනු ලබන ස්ථිර සුරකුමක දීමනාලාභියකු විසින් අධිකරණය වෙත ඉල්ලීම කරනු ලබන දිනයේ දී එම ඉල්ලීම පිළිබඳව අද්මිනිස්ත්‍රාසිකරුට ලිඛිත දැන්වීමක් කළ යුතු ය.

(4) (3) උපවගන්තිය යටතේ වූ දැන්වීමක් ලද දින සිට වැඩ කරන දින පහක් ඇතුළත, අද්මිනිස්ත්‍රාසිකරු විසින් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත -

(අ) ඉල්ලීමට අද්මිනිස්ත්‍රාසිකරු සහාය දක්වන්නේද හෝ එදිරිවන්නේ ද යන්න පිළිබඳව අධිකරණයට දැනුම් දෙන දැන්වීමක්;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුගේ දන්නා පරිදි සමාගමේ දේපළ, ණය සහ වෙනත් බැරකම් පිළිබඳ වාර්තාවක් සහ අද්මිනිස්ත්‍රාසිකරුගේ දැනුම අනුව එම වාර්තාව අසම්පූර්ණ විය හැකි බව සහ එසේ වන්නේ නම් කවරක් සම්බන්ධයෙන් ද වන වග දක්වන ප්‍රකාශයක්; සහ

(ඇ) ඉල්ලීමට සහාය දැක්වීම හෝ එදිරිවීමට හේතු ඇතුළත් ප්‍රකාශයක්,

ගොනු කරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ සඳහන් ලේඛන ලැබීමෙන් පසු, අධිකරණය විසින් විභාගයක් පැවැත්විය යුතු අතර-

(අ) ඉල්ලීම පිළිබඳ තීරණයක් ගැනීමට කටයුතු කළ යුතු ය; නැතහොත්

(ආ) ඉල්ලීම පිළිබඳ තීරණය කිරීම සඳහා දීමනාලාභියාගේ හෝ අද්මිනිස්ත්‍රාසිකරුගෙන් වැඩිදුර තොරතුරු ලබා ගැනීම අත්‍යවශ්‍ය බව අධිකරණය සලකනු ලබන අවස්ථාවක දී -

(i) තත්කාර්යය සඳහා විභාගය කල් තැබිය යුතු ය; සහ

(ii) ඉල්ලීම පිළිබඳ පසුව තීරණය කළ යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ තීරණයක් ගැනීමේ දී-

(අ) ඉල්ලීම ප්‍රදානය කරනු ලැබුවහොත් 178 වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් කර ඇති අරමුණු සපුරා ගැනීමට සැලකිය යුතු තරමේ හෝ අහිතකර බලපෑමක් නොවන බවට; සහ

(ආ) අවස්ථානුගත සියලු කාරණාවල දී ඉල්ලීමට අවසර ලබා නොදුන්නේ නම්, සමාගම කෙරෙහි උනන්දුවක් ඇති වෙනත් පුද්ගලයින්ට ඇති වන

අගතියට වඩා වැඩි අගතියක් ඉල්ලීමට අවසර ලබා නොදීම මගින් දීමනාකරු කෙරෙහි ඇති වන බවට,

අධිකරණය සෑහීමකට පත් වන්නේ නම් දීමනාකරුගේ ස්ථිර සුරැකුම බලාත්මක කිරීමට අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(7) (6) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් -

(අ) අධිකරණයේ වැඩිදුර ආඥාවක් මගින් අවසර දී ඇත්නම් මිස, දේපළ භාර ගැනුම්කරුවකු හෝ බලාත්මක කිරීමට සම්බන්ධ වෙනත් තැනැත්තකු විසින්, නිශ්චිතව දක්වනු ලබන කර්තව්‍ය හෝ බලතල ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ආ) නිශ්චිතව දක්වන ලද දේපළකට බලාත්මක කිරීම සීමා කිරීම;

(ඇ) විකිණීමකින් බලාත්මක කිරීම අධිකරණය විසින් නියම කරන ලද ආකාරයට හෝ අධිකරණයේ වැඩිදුර අවසරය පරිදි හෝ විධිවිධාන යටත්ව සිදු කළ යුතු බවට නියෝග කිරීම,

ඇතුළු යම් නියම සහ කොන්දේසිවලට යටත්ව කළ යුතු බවට නියෝග කළ හැකි ය.

(8) (6) වන උපවගන්තිය යටතේ අවසර ලබා ඇති දීමනා ලාභියකු විසින්, මාස තුනක් නොඉක්මවන කාල පරාසයන්හිදී, ස්ථාවර සුරැකුම බලාත්මක කිරීම පිළිබඳව නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ නියම කරනු ලැබිය හැකි මට්ටමින් සවිස්තරාත්මක අද්මිනිස්ත්‍රාසිකරු වෙත වාර්තා කළ යුතු ය.

(9) නරක් වන සුළු වන දේපළ සම්බන්ධයෙන් වන විට දී (2) උපවගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් මත, නරක්වන දේපළ සම්බන්ධයෙන් වූ ස්ථිර සුරැකුමක් වන තාක් දුරට වන ස්ථිර සුරැකුමක් බලාත්මක කිරීමට සහ, ඉන් ලබාගත් යම් ආදායමක්, (5) වන උපවගන්තිය යටතේ නඩු විභාගයක් පැවැත්වෙන තෙක් සහ (6) උපවගන්තිය යටතේ ආඥාවක් කරනතෙක් අද්මිනිස්ත්‍රාසිකරු වෙනුවෙන් භාරයක් වශයෙන් රඳවා ගැනීමට දීමනා ලාභියාට අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

**204.** මේ කොටසේ සඳහන් කිසිවක් මගින් සමාගමකට -

දැන්වීමක් කිරීම සඳහා කැමැත්ත හෝ අවසරයක් අවශ්‍ය නොවන බව

(අ) සමාගම විසින් භාවිත කරනු ලබන හෝ වාසයට ගෙන සිටින හෝ සන්තකය දරන දේපළක් සම්බන්ධයෙන් වන ගිවිසුමක්; හෝ

(ආ) සුරැකුම් ගිවිසුමක්,

සම්බන්ධයෙන් දැන්වීමක් කිරීමට අද්මිනිස්ත්‍රාසිකරුගේ කැමැත්ත හෝ අධිකරණයේ අවසරය අවශ්‍ය නොවිය යුතු ය.

**205.** (1) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීමෙන් සමාගමේ අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ ධුරයෙන් ඉවත් නොකරන්නේ ය.

සමාගමේ අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් අනුයෝජිතයන් කෙරෙහි අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපෑම

(2) (3) වන සහ (4) වන උපවගන්තිවලට යටත්ව, අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින සමාගමක අධ්‍යක්ෂවරයෙකු විසින් පහත සඳහන් කාරණා වලදී හැර එම සමාගමේ නිලධාරියෙකුගේ කර්තව්‍ය ඉටු කිරීම කිරීම හෝ බලතල ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍ය ඉටු කිරීමට හෝ බලතල ක්‍රියාත්මක කිරීමට අදහස් නොකරනු ලැබිය හැකිය :-

(අ) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත්කරමින් 190 වගන්තිය යටතේ කරන ලද නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් නියම කරනු ලැබිය හැකි ආකාරයකට, යම් කාලසීමාවක් තුළ සහ අභියාචනා කිරීමේ අරමුණ දැන්වීම සඳහා වන යම් අවශ්‍යතා අනුව මිස, සිදු නොකිරීම; එනමුත් අභියාචනයක් අවසානයේ දී අධිකරණය විසින් කරනු ලබන යම් ආඥාවකට යටත්ව එකී අභියාචනය සම්බන්ධයෙන් සමාගමේ දේපළවලට යම් අයිතියක් එකී අධ්‍යක්ෂවරයාට නොතිබිය යුතු ය ;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුගේ පූර්ව ලිඛිත අවසරය ඇතිව මිස සිදු නොකිරීම; හෝ

(ඇ) මෙම කොටස මගින් ප්‍රකාශිතවම අවසර දී ඇත්නම් මිස සිදු නොකිරීම.

(3) අධ්‍යක්ෂවරයා විසින් කර්තව්‍ය ඉටු කිරීම හෝ බලය ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබන්නේ සමස්තයක් වශයෙන්, ණයහිමියන්ගේ යහපත උදෙසා බවට අද්මිනිස්ත්‍රාසිකරු සෑහීමකට පත්වන අවස්ථාවක දී, අද්මිනිස්ත්‍රාසිකරු විසින්, (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කැමැත්ත ලබා දිය හැකි ය.

(4) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කැමැත්ත ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසිකරු අලාභ ගෙවීමේ වගකීමකට යටත් නොවන්නේ ය.

(5) අද්මිනිස්ත්‍රාසිකරු පත්කිරීම මගින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ ඒ වෙනුවෙන් පත් කරන ලද සමාගමේ යම් අනුයෝජිතයකුගේ අධිකාරිය ප්‍රත්‍යාදිෂ්ඨ වන්නේ ය.

අද්මිනිස්ත්‍රාසිකරුට තොරතුරු ලබා දිය යුතු බව

**206.** (1) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරනු ලබන අවස්ථාවක දී, සමාගමේ සෑම අධ්‍යක්ෂකවරයකුම සහ අනෙකුත් සෑම නිලධාරියකු විසින් ම -

(අ) ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් සහ අද්මිනිස්ත්‍රාසිකරු පත් කළ දින සිට වැඩ කරන දින පහක් ඇතුළත, යම් තැනැත්තකුගේ සන්තකයේ හෝ භාරකාරත්වයේ යටතේ හෝ පාලනය යටතේ ඇති සමාගමේ කටයුතුවලට ව්‍යාපාරවලට, දේපළට, සහ මූල්‍ය කටයුතුවලට අදාළ සියලු පොත්පත්, වාර්තා සහ වෙනත් ලේඛන, අද්මිනිස්ත්‍රාසිකරුට භාර දිය යුතු ය;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරු විසින්, එසේ කිරීමට අවශ්‍ය බවට දක්වන්නේ නම්, පොත්, වාර්තා සහ ලේඛන සම්පූර්ණ සහ නිවැරදි බවට සාධාරණ කාලසීමාවක් තුළ දිවුරුම් ප්‍රකාශයක් මගින් සත්‍යාපනය කළ යුතු ය;

(ඇ) සමාගමට පොදු මුද්‍රාවක් තිබේ නම්, අද්මිනිස්ත්‍රාසිකරුගේ භාවිතය සඳහා පොදු මුද්‍රාව කඩිනමින් ලබා දිය යුතු ය; සහ

(ඈ) අද්මිනිස්ත්‍රාසිකරු විසින් සාධාරණ ලෙස ඉල්ලා සිටින සහායක් අද්මිනිස්ත්‍රාසිකරුට ලබා දිය යුතු ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරුගේ ඉල්ලීම මත, අධිකරණය විසින්, (1) වන උපවගන්තියට අනුකූල වන ලෙසට සමාගමේ අධ්‍යක්ෂ හෝ වෙනත් නිලධාරියකුට නියම කරමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) සත්‍යායනය කරන තැනැත්තා විසින් -

(අ) පොත්, වාර්තා සහ ලේඛන සම්පූර්ණ සහ නිවැරදි ඒවා ලෙස නොසලකන විට; හෝ

(ආ) සත්‍යායනය කිරීමට අවශ්‍ය දැනුම ඔහුට නොමැති විට,

පොත්, වාර්තා සහ ලේඛනවල ඇති නිශ්චිත කාරණා සම්බන්ධයෙන් (1) උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වූ සත්‍යායනයක් තහවුරු කරනු ලැබිය යුතු ය.

සේවා නියුක්තයන් කෙරෙහි අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපෑම

**207.** අද්මිනිස්ත්‍රාසිකරුවකු පත්කිරීම මගින්, සමාගම පාර්ශ්වකරුවකු වන සේවා නියුක්තිය පිළිබඳ ගිවිසුමක් ස්වයංක්‍රීයව අවසන්වීම සිදු වන්නේ ය.

දේපළ සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ දී අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපෑම

**208.** (1) 202 වන වගන්තියට යටත්ව අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින සමාගමක් විසින් හෝ සමාගමක් වෙනුවෙන් වෙනත් තැනැත්තෙකු විසින් සමාගමේ දේපළට බලපාන යම් ගිවිසුමක්, පැවරුමක් හෝ ගනුදෙනුවක් එකී ගිවිසුම, පැවරුම හෝ ගනුදෙනුව -

(අ) සමාගම වෙනුවෙන් අද්මිනිස්ත්‍රාසිකරු විසින් ඇති කර ගන්නා ලද්දේ නම් මිස;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුගේ පූර්ව ලිඛිත කැමැත්ත ඇතිව මිස; හෝ

(ඇ) අධිකරණයේ ආඥාවක් යටතේ මිස,

වලංගු නොවන්නේ ය.

(2) ගිවිසුම, පැවරුම හෝ ගනුදෙනුව හෝ සමස්තයක් වශයෙන් ණයහිමියන්ගේ යහපත සඳහා වන බවට අද්මිනිස්ත්‍රාසිකරු සෑහීමකට පත්වන විට (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ අද්මිනිස්ත්‍රාසිකරු විසින් ඒ සඳහා කැමැත්ත ලබා දිය හැකිය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කැමැත්ත ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසිකරු අලාභ ගෙවීමේ වගකීමට යටත් නොවන්නේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වලංගු නොවන ගිවිසුමක්, පැවරුමක් හෝ ගනුදෙනුවක් අධිකරණය විසින් ආඥාවක් මගින් බලාත්මක කළ හැකි ය.

(5) (1) වන උපවගන්තිය, බැංකුවක් විසින් -

(අ) සමාගමට බැංකුවේ ඇති ගිණුමකින්;

(ආ) සද්භාවයෙන් යුතුව සහ බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී; සහ

(ඇ) (i) අද්මිනිස්ත්‍රාසිකිරීම ආරම්භ කළ බවට අද්මිනිස්ත්‍රාසිකරු විසින් බැංකුවට කළ ලිඛිත දැන්වීමක් ලද දිනට; සහ

(ii) සමාගම අද්මිනිස්ත්‍රාසි කරන බව විශ්වාස කිරීමට බැංකුවට හේතු වූ දිනයට,

කලින් හෝ ඊට පෙර කරන ලද ගෙවීමකට, අදාළ නොවිය යුතු ය.

(6) (අ) (1) වන උපවගන්තිය යටතේ වලංගු නොවන ගිවිසුමකට, පැවරුමකට හෝ ගනුදෙනුවකට සමාගම වෙනුවෙන් ඇතුළත්වීම අභිලාෂය වන; හෝ

(ආ) (1) උපවගන්තිය යටතේ වලංගු නොවන ගිවිසුමකට, ගනුදෙනුවකට, පැවරුමකට හෝ අන්‍යාකාරයෙන් සම්බන්ධව ඇති හෝ පාර්ශ්වකරුවකු වන ,

සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධාරියකු වරදකට වරදකරු වන්නේ ය.

(7) (6) වැනි උපවගන්තිය යටතේ වරදකට වරදකරු වන අධ්‍යක්ෂවරයකුට හෝ වෙනත් නිලධාරියකුට, එම වරද සංයුක්ත කරන ක්‍රියාවේ හෝ නොකර හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් හෝ පාඩු ලැබූ සමාගම ඇතුළු යම් තැනැත්තකුට වන්දි ගෙවන ලෙසට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය කළ හැකි ය.

(8) සමාගමේ දේපළවලට බලපාන ගිවිසුමක්, පැවරුමක් හෝ ගනුදෙනුවක් අද්මිනිස්ත්‍රාසිකරු පත් කළ වේලාවට පෙර හෝ පසුව ඇති කර ගත්තේද යන්න පිළිබඳව කිසියම් ගැටළුවක් මතු වුවහොත්, එම ගිවිසුම, පැවරුමක් හෝ ගනුදෙනුව, ඊට පටහැනිව ඔප්පු කරන්නේ නම් මිස, අද්මිනිස්ත්‍රාසිකරු පත් කළ දිනයෙන් පසුව ඇතුලු වූ බවට උපකල්පනය කළ යුතු ය.

(9) වෙනත් යම් ප්‍රඥප්තියක කුමක් සඳහන් වුව ද සමාගමේ පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් සම්බන්ධයෙන් කිසිදු තැනැත්තකු විසින් අද්මිනිස්ත්‍රාසිකරුට එරෙහිව, කැප අයිතියක් සම්බන්ධයෙන් හිමිකම්පෑමක් නොකළ යුතු ය.

කොටස් පැවරීම මත අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපෑම

**209.** (1) මෙම වගන්තියට යටත් ව -

(අ) අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින සමාගමක යම් කොටසක් පැවරීම නොකළ යුතු ය; සහ

(ආ) අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින සමාගමක කොටස් හිමියකුගේ බැරකම් පිළිබඳ තත්ත්වය වෙනස් නොකළ හැකි ය.

(2) අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින සමාගමක කොටසක් පැවරීම, සමස්තයක් වශයෙන් ණයහිමියන්ගේ යහපත සඳහා වන බවට අද්මිනිස්ත්‍රාසිකරු සෑහීමකට පත්වන අවස්ථාවක දී කොටස් පැවරීම සඳහා අද්මිනිස්ත්‍රාසිකරු එකඟ විය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කැමැත්ත ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසිකරු අලාභ ගෙවීමේ වගකීමට යටත් නොවේ.

(4) එසේ නොකිරීමෙන් අසාධාරණයක් සිදුවනු ඇතැයි අධිකරණය සෑහීමකට පත්වන අවස්ථාවක, අධිකරණය විසින් -

(අ) අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින සමාගමක කොටසක් පැවරීම සඳහා ; හෝ

(ආ) අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින සමාගමක බැරකම්වලට අදාළව කොටස් හිමියෙකුගේ තත්ත්වය වෙනස් කරමින්,

ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින් සමාගම් පනතේ 46 වන වගන්තිය අදාළ වීම සම්බන්ධයෙන් බලපෑමක් හෝ සීමා කිරීමක් නොවිය යුතු ය.

අද්මිනිස්ත්‍රාසි කිරීමට යටත්ව ඇති අත්‍යවශ්‍ය සේවා

**210.**(1) ‘‘මේ වගන්තියෙහි, ‘‘වස්තු භංගත්වයට අදාළ නියමයක්’’ යනු සමාගමකට අත්‍යවශ්‍ය භාණ්ඩයක් හෝ සේවාවක් සැපයීම සඳහා වන ගිවිසුමක හා ඒ යටතේ -

(අ) සමාගම අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භවීම හේතුවෙන් ගිවිසුම හෝ සැපයුම අවසන් වන හෝ වෙනත් යම් දෙයක් සිදු වන;

(ආ) සමාගම අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ වන බැවින්, ගිවිසුම හෝ සැපයුම අවසන් කිරීමට හෝ වෙනත් දෙයක් කිරීමට සැපයුම්කරුට හිමිකම් ලබා දෙන,

විධිවිධානයක් වේ.

(2) වෙනත් නීතියක කුමක් සඳහන් වුවද, අත්‍යවශ්‍ය භාණ්ඩයක් හෝ සේවාවක් සපයන්නෙකු විසින් -

(අ) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භවීමට පෙර කාල සීමාවකට අදාළව භාණ්ඩය හෝ සේවාව සඳහා ගෙවිය යුතු ගාස්තු ගෙවීම පැහැර හැරීම හේතුවෙන් අද්මිනිස්ත්‍රාසිකරුට හෝ අද්මිනිස්ත්‍රාසිකරණය කරමින් පවතින සමාගමකට භාණ්ඩ හෝ සේවාව සැපයීම ප්‍රතික්ෂේප කිරීම නොකළ යුතු ය;

(ආ) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භවීමට පෙර කාල සීමාවකට අදාළව සැපයූ භාණ්ඩ හෝ සේවා සඳහා නොගෙවූ ගාස්තු ගෙවීම මත භාණ්ඩය හෝ සේවාව ලබා දෙනු ලබන බවට අද්මිනිස්ත්‍රාසිකරුට හෝ අද්මිනිස්ත්‍රාසි කරමින් පවතින සමාගමට කොන්දේසියක් පනවනු නොලැබිය යුතු ය; හෝ

(ඇ) අද්මිනිස්ත්‍රාසිකරුගේ පූර්ව ලිඛිත අවසරය ඇතිව මිස, භාණ්ඩය හෝ සේවාව සැපයීම සඳහා ගිවිසුමේ වස්තුභංගත්වයට අදාළ නියමයක් මත විශ්වාසය නොතැබිය යුතු ය.

(3) වස්තු භංගත්වය අදාළ නියමයක් මත රඳා කටයුතු කිරීම, සමස්තයක් වශයෙන් ණයහිමියන්ගේ යහපත සඳහා හේතු වන බවට අද්මිනිස්ත්‍රාසිකරු සෑහීමකට පත්වන විට, අද්මිනිස්ත්‍රාසිකරු විසින් (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ කැමැත්ත ලබා දිය හැකි ය.

(4) (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ කැමැත්ත ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසිකරු අලාභ ගෙවීමේ වගකීමකට යටත් නොවන්නේ ය.

(5) හතරවන උපලේඛනයේ කාර්ය සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩයක් හෝ සේවාවක් සැපයීම සඳහා අද්මිනිස්ත්‍රාසිකරු විසින් දරනු ලබන වියදමක් අද්මිනිස්ත්‍රාසි කිරීමේ වියදමක් වන්නේ ය.

## 5 වන පරිච්ඡේදය

### අද්මිනිස්ත්‍රාසි කිරීමේ මාර්ග

*අ- සම්මත සහ කඩිනම් කරන ලද මාර්ගවලට අදාළ විධිවිධාන*

**සම්මත සහ කඩිනම් කරන ලද මාර්ගවලට අදාළ විධිවිධාන**

**211.** (1) අද්මිනිස්ත්‍රාසිකරු විසින් 180 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ සම්මත මාර්ගය අනුගමනය කිරීමට තීරණය කර ඇත්නම්, එවිට 212, 213 සහ 214 වන වගන්ති අදාළ විය යුතු ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරු විසින් 180 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ කඩිනම් මාර්ගය අනුගමනය කිරීමට තීරණය කර ඇත්නම්, එවිට, 215 සහ 216 වන වගන්ති අදාළ විය යුතු ය.

*ආ - සම්මත මාර්ගය*

**ආරම්භක රැස්වීම**

**212.** (1) මෙම වගන්තිය, 211 (1) වන වගන්තියේ (1)වන උපවගන්තියේ සඳහන් අවස්ථානුගත කරුණුවල දී අදාළ වේ.

(2) අද්මිනිස්ත්‍රාසිකරු විසින්, අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කිරීමෙන් පසු වැඩ කරන දින දහයක් ඇතුළත ආරම්භක රැස්වීමක් පැවැත්විය යුතු ය.

(3) ආරම්භක රැස්වීමේ දී පහත සඳහන් කටයුතු සිදු කළ යුතු ය;-

(අ) රැස්වීමේ දී සහාගත කරන ලද ලේඛන ණයහිමියන් විසින් සලකා බැලීම;

(ආ) 254 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ අද්මිනිස්ත්‍රාසිකරු ප්‍රතියෝජනය කළ යුතු වේ ද නොවේ ද නැද්ද යන්න පිළිබඳව ණයහිමියන්ගේ යෝජනා සම්මතයක්; සහ

(ඇ) අද්මිනිස්ත්‍රාසිකරණයේ දී ණයහිමියන්ගේ කමිටුවක් පිහිටුවීමට අද්මිනිස්ත්‍රාසිකරු අපේක්ෂා කරන්නේ නම්,

(i) 217 වන වගන්තිය යටතේ එවැනි කමිටුවක් පිහිටුවිය යුතු වේ ද නොවේ ද යන්න; සහ

(ii) එවැනි කමිටුවක් පිහිටුවන්නේ නම්, එම කමිටුවේ සාමාජිකයන් ලෙස පත් කළ යුත්තේ කවුරුන්ද යන්න,

පිළිබඳ ව ණයහිමියන්ගේ යෝජනා සම්මත එකක් හෝ වැඩි ප්‍රමාණයක් සාදනු ලැබීම

(4) ආරම්භක රැස්වීමේ දී අද්මිනිස්ත්‍රාසිකරු විසින් -

(අ) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන්ගේ ක්‍රියාකලාපය සහ කාර්ය සාධනය අධිකාරිය විසින් අධීක්ෂණය කරනු ලබන බවට සහ අධිකාරියේ ඇමතුම් තොරතුරු සපයන බවට වූ ප්‍රකාශයක්;

(ආ) 181 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ලිඛිත සහතිකය:

(ඇ) 181 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ලිඛිත කැමැත්ත;

(ඇ) 30 වන වගන්තියට අනුකූලව අද්මිනිස්ත්‍රාසිකරු විසින් අත්සන් කරන ලද, අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශයක්;

(ඉ) නොගෙවන ලද අද්මිනිස්ත්‍රාසි ගාස්තු ගෙවනු ලැබීම අද්මිනිස්ත්‍රාසිකරු අපේක්ෂා කරන්නේ නම්, 31 වන වගන්තියට අනුකූලව අද්මිනිස්ත්‍රාසිකරු විසින් අත්සන් තබන ලද පූර්ව අද්මිනිස්ත්‍රාසි වියදම් පිළිබඳ ප්‍රකාශයක්;

(ඊ) අද්මිනිස්ත්‍රාසිකරු යෝජිත පාරිශ්‍රමිකය සඳහා, අදාළ වන පදනම හෝ පදනම්, අදාළ වන්නේ නම් පැයක් සඳහා අයකරන මුදල සහ ගාස්තු අනුපාතයේ හෝ අනුපාතවල ප්‍රතිශතය සහ නියමිත මට්ටම හෝ මට්ටම්;

(උ) 219 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශයක් අද්මිනිස්ත්‍රාසිකරු වෙත සපයා ඇති අවස්ථාවක, එම ප්‍රකාශය.

(5) (2) වන උපවගන්තිය යටතේ රැස්වීම පැවැත්විය යුතු වන දිනට අවම වශයෙන් වැඩ කරන දින හතකට පෙර, අද්මිනිස්ත්‍රාසිකරු විසින්-

(අ) ප්‍රායෝගිකව හැකිතාක් දුරට, සමාගමේ ණයහිමියන්ට උපරිමයකට ආරම්භක රැස්වීම පිළිබඳ ලිඛිත දැනුම්දීමක් කිරීම මගින්; සහ

(ආ) එම රැස්වීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කිරීම මගින්,

ආරම්භක රැස්වීම කැඳවිය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වන දැන්වීමක -

(අ) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කර ඇති බව සඳහන් විය යුතු ය;

(ආ) පහත සඳහන් කරුණු, එනම්-

(i) අද්මිනිස්ත්‍රාසිකරුගේ සම්පූර්ණ නම;

(ii) පත්වීම සිදු කළ දිනය ;

(iii) අද්මිනිස්ත්‍රාසිකරු පත් කරන්නාගේ අනන්‍යතාවය සහ පත් කරන්නා අධිකරණය වන අවස්ථාවක, එම පත්කිරීමට අදාළ ඉල්ලීම කරන ලද තැනැත්තාගේ අනන්‍යතාවය; සහ

(iv) සාමාන්‍ය වැඩ කරන වේලාවන්හි දී විමසීම් යොමු කරනු ලැබිය හැකි අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යාලීය ලිපිනය සහ දුරකථන අංකය,

සඳහන් විය යුතු ය.

(ඈ) (i) එම රැස්වීමේ දී සභාගත කළ යුතු ලේඛන කවරේ ද යන්න; සහ

(ii) එම රැස්වීමේ දී සිදු කළ යුතු කටයුතු කවරේ ද යන්න;

නිශ්චිතව දක්වා තිබිය යුතු ය.

(ඈ) අද්මිනිස්ත්‍රාසිකරු විසින් අද්මිනිස්ත්‍රාසිකරණයේ ණය හිමියන්ගේ කමිටුවක් පිහිටුවීමට අපේක්ෂා කරන්නේ නම්-

(i) 217 වන වගන්තියේ සඳහන් කර ඇති කාරණා සංෂිප්ත කර දක්වා තිබිය යුතු ය; සහ

(ii) එවැනි කමිටුවක සාමාජිකත්වය සඳහා නාමයෝජනා කැඳවා තිබිය යුතු ය.

(7) ආරම්භක රැස්වීමක් සම්බන්ධයෙන් පස් වන උපලේඛනය අදාළ විය යුතු ය.

(8) ආරම්භ රැස්වීම පැවැත්වීමෙන් පසු වැඩ කරන දින දෙකක් ඇතුළත, අද්මිනිස්ත්‍රාසිකරු විසින්-

(අ) (4) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් ප්‍රකාශයේ පිටපතක ;

(ආ) (4) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් අයිතිවාසිකම් ප්‍රකාශයේ පිටපතක්; සහ

(ඇ) (5) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් දැන්වීමේ පිටපතක්,

රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත යවනු ලැබිය යුතු ය.

(9) (2) වන, (5) වන, (6) වන හෝ (8) වන උප වගන්තියට අනුකූලවීමට අපොහොසත් වන අද්මිනිස්ත්‍රාසිකරුවකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

ප්‍රතිඵල රැස්වීම

**213.** (1) 211 වන වගන්තියේ (1) වන උප වගන්තියේ සහ 216 වන වගන්තියේ (3) වන උප වගන්තියේ සඳහන් අවස්ථානුගත කරුණුවල දී මේ වගන්තිය අදාළ විය යුතු ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරු විසින් කැඳවීමේ කාල සීමාව තුළදී ප්‍රතිඵල රැස්වීමක් කැඳවිය යුතු ය.

(3) අද්මිනිස්ත්‍රාසිකරුගේ ඉල්ලීම මත, අධිකරණය විසින් කැඳවීමේ කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි නමුත්, ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබුවේ කැඳවීම් කාලය ඉකුත්වීමෙන් පසුව නම්, අධිකරණය විසින් කාලය දීර්ඝ කරනු නොලැබිය යුතු ය.

(4) ණයහිමියන් විසින් යෝජනා සම්මතයක් මගින් කැඳවීමේ කාලය දීර්ඝ කළ හැකි නමුත්, එසේ දීර්ඝ කිරීම කැඳවීමේ කාලය අවසන් වූ පසු නොකළ යුතු ය.

(5) කැඳවීමේ කාලසීමාව (3) වන උපවගන්තිය හෝ (4) උපවගන්තිය යන උපවගන්ති එකක් හෝ දෙකම යටතේ දැනටමත් දීර්ඝ කර හැකි විටෙක එම කාලය (3) වන හෝ (4) වන වගන්ති යටතේ දීර්ඝ කළ හැකි විය යුතු ය.

(6) (8) වන උපවගන්තිය යටතේ රැස්වීම පැවැත්වීමට අවශ්‍ය වන දිනට අවම වශයෙන් වැඩ කරන දින හතකට පෙර, අද්මිනිස්ත්‍රාසිකරු විසින්-

(අ) ප්‍රායෝගිකව හැකිතාක් දුරට, සමාගමේ ණයහිමියන්ට උපරිමයකට ප්‍රතිඵල රැස්වීම පිළිබඳ ලිඛිත දැනුම්දීමක් කිරීම මගින් ; සහ

(ආ) රැස්වීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කිරීම මගින්,

ප්‍රතිඵල රැස්වීම කැඳවිය යුතු ය.

(7) අද්මිනිස්ත්‍රාසිකරු විසින් (6) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ දැන්වීමක් සමග පහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතු ය:-

(අ) ප්‍රකාශය ආරම්භක රැස්වීමේ දී සභාගත නොකළේ නම්, 219 වගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුට ලබාදුන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය;

(ආ) පහත සඳහන් කාරණා පිළිබඳව අද්මිනිස්ත්‍රාසිකරුගේ වාර්තාවක්-

(i) සමාගමේ කටයුතු, ව්‍යාපාර, දේපළ සහ මූල්‍ය තත්ත්වයන් පිළිබඳ වාර්තාවක්;

(ii) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කිරීමෙන් පසු සමාගමේ දේපළවලට බලපාන පරිදි ඇතුළත් වූ සියලු ගිවිසුම්, පැවරුම් සහ ගනුදෙනු ; සහ

(iii) රැස්වීමේදී සලකා බැලිය යුතු ණයහිමියන්ගේ තීරණවලට වැදගත් වෙනත් යම් කාරණා;

(ඇ) හේතු සහිතව-

(i) සමාගමේ ඔප්පු වැඩපිළිවෙළක් පිළිබඳ ඔප්පුවක් සමාගම විසින් සකස් කිරීම ණයහිමියන්ගේ යහපත උදෙසා වන්නේද යන්න;

(ii) ඇවරකරුවකු පත් කිරීම ණය හිමියන්ගේ යහපත උදෙසා වන්නේද යන්න; හෝ

(iii) අද්මිනිස්ත්‍රාසි කිරීම අනාාාකාරයකින් අවසන් කිරීම ණයහිමියන්ගේ යහපත උදෙසා වන්නේද යන්න,

පිළිබඳ අද්මිනිස්ත්‍රාසිකරුගේ මතය දැක්වෙන ප්‍රකාශයක්,

(ඇ) සමාගමේ වැඩපිළිවෙළ පිළිබඳව ඔප්පුවක් යෝජනා කර ඇති අවස්ථාවකදී,

(i) යෝජිත ඔප්පුවේ නියමයන් දක්වාලන;

(ii) යෝජිත ඔප්පුව අනුමත කිරීමේ බලපෑම සහ විශේෂයෙන්ම, එහි වාණිජමය බලපෑම පැහැදිලි කරනු ලබන; සහ

(iii) නියම කළ හැකි වෙනත් තොරතුරු අඩංගු වන,

අද්මිනිස්ත්‍රාසිකරුගේ ප්‍රකාශයක්.

(8) අද්මිනිස්ත්‍රාසිකරු විසින් කැඳවීමේ කාලය අවසන්වීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත ප්‍රතිඵල රැස්වීම කැඳවිය යුතු ය.

(9) ප්‍රතිඵල රැස්වීම පැවැත් වූ පළමු දිනට පසුව වැඩ කරන දින තිහකට නොවැඩි දිනයකට, අද්මිනිස්ත්‍රාසිකරුගේ ඉල්ලීම මත අධිකරණය විසින් එම රැස්වීම පවත්වන දිනය ඊට වැඩි දින ගණනකට කල් තබනු ලබන්නේ නම් මිස, කල් තැබිය හැකි ය.

(10) (2)වන, (6)වන සහ (8)වන උපවගන්තිවලින් යම් උපවගන්තියකට අනුකූල වීමට අපොහොසත් වන අද්මිනිස්ත්‍රාසිකරුවකු වරදක් සිදු කරන්නේ ය.

**214.** (1) මේ වගන්තිය 211 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සහ 216 වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් අවස්ථානුගත කරුණුවලට අදාළ වන්නේ ය. ප්‍රතිඵල රැස්වීමේ කටයුතු

(2) ප්‍රතිඵල රැස්වීමේ දී ණයහිමියන් විසින් -

(අ) යෝජනා සම්මතයේ නිශ්චිතව දක්වා ඇති නියමයන් 213 වන වගන්තියේ (7) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් අද්මිනිස්ත්‍රාසිකරුගේ ප්‍රකාශයේ සඳහන් නියමයන්ට වඩා වෙනස් වුව ද එම යෝජනා සම්මතයේ නිශ්චිතව දක්වා ඇති සමාගම් ඔප්පු වැඩපිළිවෙළ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබිය හැකි ය;

(ආ) සමාගම දැනටමත් ඈවර කිරීමට භාජනය වී ඇත්නම් මිස, යෝජනා සම්මතයක් මගින් ඈවරකරුවකු පත් කරනු ලැබිය හැකි ය; හෝ

(ඇ) යෝජනා සම්මතයක් මගින් අන්‍යාකාරයකට අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් කරනු ලැබිය හැකි ය.

(3) ප්‍රතිඵල රැස්වීමක් සම්බන්ධයෙන් පස්වන උපලේඛනය අදාළ විය යුතු ය.

(4) රැස්වීමේ දී ඡන්දය ලබාදිය යුතු වන්නා වූ යෝජනා සම්මතයක් මත යම් ණයහිමියකු විසින් ඡන්දය ලබා දිය යුතු ආකාරය පිළිබඳව, අවස්ථාවෝචිත පරිදි, අද්මිනිස්ත්‍රාසිකරු හෝ අධ්‍යක්ෂවරයකු විසින් දන්නා යම් ඡන්දය ලබා දීමේ වැඩපිළිවෙළක් පිළිබඳව, යෝජනා සම්මතය මත ඡන්දය දීමට පෙර, සමාගමේ අද්මිනිස්ත්‍රාසිකරු විසින් හෝ අධ්‍යක්ෂවරයකු විසින් රැස්වීමට දැනුම් දිය යුතු ය.

(5) 2 වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ණයහිමියන් විසින් අනුමත කරන ලද සමාගම් ඔප්පු වැඩපිළිවෙළක් එම සමාගමේ ඔප්පු වැඩපිළිවෙළ පිළිබඳ යෝජනා සම්මතය සම්මත කර ගනු ලැබූ දිනයේ සහ වේලාවේ සිට බලාත්මක විය යුතු ය.

(6) (7) වන උපවගන්තියට යටත්ව, සමාගමේ අධ්‍යක්ෂවරුන් ප්‍රතිඵල රැස්වීමට, කල් තබන රැස්වීම්වලටද ඇතුළුව, සහභාගී විය යුතු නමුත් ඔවුන් එම රැස්වීමේදී ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අවශ්‍ය නොවේ.

(7) අධ්‍යක්ෂවරයකු -

(අ) ප්‍රතිඵල රැස්වීමට සහභාගි නොවීමට වලංගු හේතුවක් ඇති විට;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරු විසින් හෝ ණයහිමියන් විසින්, යෝජනා සම්මතය මගින් අධ්‍යක්ෂවරයා ප්‍රතිඵල රැස්වීමට නොපැමිණීම අනුමත කර ඇති විට,

එම රැස්වීමට නොපැමිණ සිටිය හැකි ය.

(8) ණයහිමියන් විසින් යෝජනා සම්මතයක් මගින් අධ්‍යක්ෂවරයා එසේ කරනු තීරණය කරනු ලැබුවහොත්, ප්‍රතිඵල රැස්වීමට පැමිණ සිටින අධ්‍යක්ෂවරයකුට සම්පූර්ණ රැස්වීමෙන් හෝ එහි යම් කොටසක දී පිටත්ව යා හැකි ය;

(9) (2) වන උපවගන්තිය යටතේ ණයහිමියන් විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා සම්මතය සම්මත කර ගනු ලැබූ දිනය සහ වේලාව අද්මිනිස්ත්‍රාසිකරු විසින් එම යෝජනා සම්මතයේ වාර්තාගත කළ යුතු ය.

(10) ප්‍රතිඵල රැස්වීම පැවැත්වීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත දී අද්මිනිස්ත්‍රාසිවරයා විසින් -

(අ) (2) වන උපවගන්තිය යටතේ ණයහිමියන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතයේ ප්‍රතිඵල පිළිබඳව අද්මිනිස්ත්‍රාසිකරු විසින්, ප්‍රායෝගිකව හැකිතාක් දුරට, සමාගමේ ණයහිමියන් වෙත ලිඛිත දැන්වීමක් කළ යුතු ය.

(ආ) එම ප්‍රතිඵල පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් කළ යුතු ය.

(ඇ) (අ) වන ඡේදයේ සඳහන් දැන්වීමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට ලබා දිය යුතු ය.

*ඇ - කඩිනම් මාර්ගය*

**215.** (1) මේ වගන්තිය 211 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් අවස්ථානුගත කරුණුවලට අදාළ වේ.

(2) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කිරීමෙන් පසු වැඩ කරන දින දහයක් ඇතුළත දී අද්මිනිස්ත්‍රාසිකරු විසින් ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීමක් පැවැත්විය යුතු ය.

(3) ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීමේ දී පහත සඳහන් කටයුතු සිදු කරනු ලැබිය යුතු ය -

(අ) 212 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් කටයුතු; සහ

(ආ) යෝජනා සම්මතයේ නිශ්චිතව දක්වා ඇති සමාගම් ඔප්පුවක් වැඩපිළිවෙළ අනුමත කිරීම පිළිබඳව ණයහිමියන්ගේ යෝජනා සම්මත.

(4) 212 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (අ), (අ), (ඇ), (ඉ) සහ (ඊ) ඡේදවල සඳහන් ලේඛන ඒකාබද්ධ ආරම්භක රැස්වීමේ දී සහ ප්‍රතිඵල රැස්වීමේ දී අද්මිනිස්ත්‍රාසිකරු විසින් සභාගත කළ යුතු ය.

(5) (2) වන උපවගන්තියේ නියම කර ඇති පරිදි රැස්වීම පැවැත්වීමට වැඩ කරන දින හතකට පෙර අද්මිනිස්ත්‍රාසිකරු විසින් -

(අ) ප්‍රායෝගිකව හැකිතාක් දුරට සමාගමේ ණයහිමියන් හැකි උපරිමයකට ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීම පිළිබඳ ලිඛිත දැන්වීමක් කිරීම මගින්; සහ

(ආ) රැස්වීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් කිරීම මගින්,

ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය.

(6) (5) වගන්තියේ (අ) ඡේදය යටතේ වූ දැන්වීමක -

(අ) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කර ඇති බව සඳහන් විය යුතු ය;

(ආ) පහත සඳහන් කරුණු සඳහන් විය යුතු ය-

(i) අද්මිනිස්ත්‍රාසිකරුගේ සම්පූර්ණ නම;

(ii) පත්වීම් සිදු කළ දිනය;

(iii) අද්මිනිස්ත්‍රාසිකරුව පත් කළ තැනැත්තාගේ අනන්‍යතාවය සහ පත් කළ තැනැත්තා, අධිකරණය වන අවස්ථාවක දී, පත් කිරීම සිදු කිරීම සඳහා ඉල්ලීම ඉදිරිපත් කළ තැනැත්තාගේ අනන්‍යතාවය; සහ

(iv) සාමාන්‍ය වැඩ කරන වේලාවන්හි දී විමසීම් යොමු කළ හැකි අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යාල ලිපිනය සහ දුරකථන අංකය;

(ඇ) පහත දැක්වෙන කරුණු නිශ්චිතව සඳහන් විය යුතු ය; -

(i) රැස්වීමේ දී සභාගත කළ යුතු ලේඛන; සහ

(ii) රැස්වීමේ දී පැවැත්වීමට නියමිත රැස්වීම් කටයුතු;

(ඈ) අද්මිනිස්ත්‍රාසිකරණයේ දී ණයහිමියන්ගේ කමිටුවක් පිහිටුවීමට අද්මිනිස්ත්‍රාසිකරු අපේක්ෂා කරන්නේ නම් -

(i) 217 වන වගන්තියේ සඳහන් කාරණා සංක්ෂිප්ත වශයෙන් ඉදිරිපත් කළ යුතු ය; සහ

(ii) අද්මිනිස්ත්‍රාසිකරණයේදී ණයහිමියන්ගේ කමිටුවක සාමාජිකත්වය සඳහා නාමයෝජනා කැඳවිය යුතු ය.

(7) (5) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ වූ දැන්වීමක් සහිතව පහත දැක්වෙන ලේඛන අද්මිනිස්ත්‍රාසිකරු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය : -

(අ) 219 වන වගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුට සපයන ලද අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය;

(ආ) පහත දැක්වෙන කරුණු පිළිබඳව අද්මිනිස්ත්‍රාසිකරුගේ වාර්තාවක් :-

(i) සමාගමේ කටයුතු, ව්‍යාපාර කටයුතු, දේපළ සහ මූල්‍ය තත්ත්ව පිළිබඳ වාර්තාවක්;

(ii) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කිරීමෙන් පසු එළඹි සමාගමේ දේපළවලට බලපාන සියලුම ගිවිසුම්, පැවරුම් සහ ගනුදෙනු පිළිබඳ වාර්තාවක්; සහ

(iii) රැස්වීමේ දී සලකා බැලිය යුතු ණයහිමියන්ගේ තීරණවලට වැදගත් වූ වෙනත් කාරණා;

(ඇ) සමාගම් ඔප්පු වැඩපිළිවෙළ සකස් කරන ලද්දේ ණයහිමියන්ගේ යහපත සඳහා බවට වූ අද්මිනිස්ත්‍රාසිකරුගේ මතය සහ ඒ මතය සඳහා පදනම් වූ හේතු දැක්වෙන ප්‍රකාශයක් ;

(ඈ) පහත දැක්වෙන කරුණු පිළිබඳ අද්මිනිස්ත්‍රාසිකරුගේ ප්‍රකාශයක් -

(i) යෝජිත සමාගම් ඔප්පු වැඩපිළිවෙළෙහි නියම සඳහන් කරනු ලබන ප්‍රකාශයක්;

(ii) යෝජිත සමාගම් ඔප්පු වැඩපිළිවෙළ අනුමත කිරීමේ බලපෑම, සහ විශේෂයෙන් ම එහි වාණිජමය බලපෑම් පැහැදිලි කරන ප්‍රකාශයක්;

(iii) නියම කරනු ලැබිය හැකි වෙනත් තොරතුරු ඇතුළත් ප්‍රකාශයක්; සහ

(ඉ) නියම කරනු ලැබිය හැකි කඩිනම් කිරීමේ කාර්යපටිපාටිය පිළිබඳ තොරතුරු ඇතුළත් ප්‍රකාශයක්.

(8) ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීම්වලට පස්වන උපලේඛනය අදාළ විය යුතු ය.

(9) (10) වන උපවගන්තියට යටත්ව, ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීම් කල් තබන අවස්ථාවක් ද ඇතුළුව, එම රැස්වීම්වලට සමාගමේ අධ්‍යක්ෂවරුන් සහභාගි විය යුතු නමුත්, එම රැස්වීමේ දී ඔවුන්ගෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අවශ්‍ය නොවන්නේ ය.

(10) ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීම්වලට අධ්‍යක්ෂවරයකු පැමිණීම -

(අ) එම රැස්වීමට සහභාගී නොවීමට වලංගු හේතුවක් ඇති; හෝ

(ආ) අද්මිනිස්ත්‍රාසිකරු අවසර දී ඇති විට හෝ ණයහිමියන් යෝජනා සම්මතයක් මගින් අධ්‍යක්ෂවරයාට සහභාගීවීමෙන් නිදහස් කර,

අවස්ථාවල දී අවශ්‍ය වන්නේ ය.

(11) ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීමට පැමිණෙන අධ්‍යක්ෂවරයකු සම්පූර්ණ රැස්වීමෙන් හෝ රැස්වීමේ ඉතිරි කොටසින් පිටව යා යුතු බවට ණයහිමියන්,යෝජනා සම්මතයක් මගින් තීරණය කරන්නේ නම්, අධ්‍යක්ෂවරයා එසේ පිටත්ව යා යුතු ය.

(12) (2) වන, (5) වන හෝ (6) වන උපවගන්තියකට අනුව ක්‍රියා නොකරනු ලබන අද්මිනිස්ත්‍රාසිකරුවකු වරදක් සිදු කරන්නේ ය.

ඔප්පු සමාලෝචක විභාගය

**216.** (1) මෙම වගන්තිය, 211 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් අවස්ථානුගත කරුණුවලට අදාළ වේ.

(2) ඒකාබද්ධ ආරම්භ සහ ප්‍රතිඵල රැස්වීමේ දී මෙම කාරණය සම්බන්ධයෙන් ණයහිමියන් ප්‍රකාශ කරන මතයට සවන්දීමෙන් පසු, අද්මිනිස්ත්‍රාසිකරු විසින් -

(අ) 215 වන වගන්තියේ (7) වන උපවගන්තියේ (ඇ) වන ඡේදයේ දක්වා ඇති, අද්මිනිස්ත්‍රාසිකරුගේ ප්‍රකාශයේ නියමයන්, සමාගම් ඔප්පු වැඩපිළිවෙළෙහි අන්තර්ගත නියමයන්වලට වඩා වෙනස් වුව ද, ණයහිමියන් විසින් අවශ්‍ය බහුතරය ඇතිව, යෝජිත සමාගම් ඔප්පු වැඩපිළිවෙළ අනුමත කරන්නේ නම් -

(i) ඔප්පු සමාලෝචන විභාගයක් සඳහා වහාම අධිකරණය වෙත ඉල්ලුම් කළ යුතු ය; හෝ

(ii) එසේ අනුමත කිරීම නොතකා, 178 වන වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් අද්මිනිස්ත්‍රාසිකරුගේ අරමුණු ඉටු කර ගැනීම සඳහා යෝජිත ඔප්පුව මූලික වශයෙන් අනනුකූල බවට අද්මිනිස්ත්‍රාසිකරු සලකන්නේ නම් කඩිනම් මාර්ග වෙනුවට වහාම සාමාන්‍ය මාර්ගය අනුගමනය කළ යුතු අතර ප්‍රතිඵල රැස්වීමක් කැඳවිය යුතු ය; හෝ

(ආ) ණයහිමියන් විසින් අවශ්‍ය බහුතරය ඇතිව, යෝජනා සම්මතයක් මගින් යෝජිත සමාගම් ඔප්පු වැඩපිළිවෙළ අනුමත නොකරන්නේ නම් -

(i) වහාම ක්‍රියාත්මක වන පරිදි කඩිනම් මාර්ගය වෙනුවට සම්මත මාර්ගය අනුගමනය කළ යුතුය;

(ii) ප්‍රතිඵල රැස්වීම කැඳවිය යුතු ය.

(3) මෙම වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුට ප්‍රතිඵල රැස්වීමක් කැඳවීමට නියමිතව ඇත්නම්, ඒ සඳහා 213 වන සහ 214 වන වගන්ති අදාළ විය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) අනුඡේදය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසුව සහ ඉල්ලීම අධිකරණය විසින් විභාග හමාර කරනතෙක් අද්මිනිස්ත්‍රාසිකරු තම ධූරයේ තවදුරටත් සිටිය යුතු ය.

(5) (2) උපවගන්තියේ (අ) වන ඡේදයේ (i) අනුඡේදය යටතේ වූ ඉල්ලීමක් සමඟ පහත දැක්වෙන ලේඛනවල පිටපත්, එනම් -

(අ) ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීමේ දී ඉදිරිපත් කළ අද්මිනිස්ත්‍රාසිකරු සම්බන්ධයෙන් වන අයිතිවාසිකම් ප්‍රකාශනයේ පිටපතක්;

(ආ) යෝජිත ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු, අද්මිනිස්ත්‍රාසිකරු නොවන්නේ නම්, ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීමේ දී හෝ ණයහිමියන්ගේ වෙනත් රැස්වීමක දී සභාගත කරන ලද ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට අදාළ අයිතිවාසිකම් ප්‍රකාශයේ පිටපතක් ;

(ඇ) අද්මිනිස්ත්‍රාසි කිරීමට පෙර ගාස්තු වශයෙන් ගෙවා නොමැති මුදල්, අද්මිනිස්ත්‍රාසිකරු විසින් ඉල්ලා සිටින්නේ නම්, ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීමේ දී සභාගත කරන ලද පූර්ව අද්මිනිස්ත්‍රාසි වියදම් පිළිබඳ ප්‍රකාශයේ පිටපතක්;

(ඈ) 215 වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීමේ දැන්වීම සමඟ අමුණනු ලද ලේඛනවල පිටපතක්;

(ඉ) ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීමේ රැස්වීම් වාර්තා සටහන්වල පිටපත්; සහ

(ඊ) නියම කළ හැකි වෙනත් තොරතුරු,

ඉදිරිපත් කළ යුතු ය.

(6) ඔප්පු සමාලෝචන විභාගයක දී -

(අ) යෝජිත සමාගම් ඔප්පු වැඩපිළිවෙළ බලාත්මක වන්නේ නම්, එම වැඩපිළිවෙළ 223 වන වගන්තියේ අවශ්‍යතාවලට අනුකූල වන බවට අධිකරණය සෑහීමකට පත් වන විට, යෝජිත ඔප්පුවෙන් බැඳීමක් ඇති කරනු ලබන බවට බැඳී පවතින බවට අධිකරණය විසින් ආඥාව කරනු ලැබිය යුතු ය;

(ආ) යෝජිත සමාගම් ඔප්පු වැඩපිළිවෙළ බලාත්මක වන්නේ නම් එම වැඩපිළිවෙළ, 223 වන වගන්තියේ අවශ්‍යතාවලට අනුකූල වන බවට අධිකරණය සෑහීමකට පත් නොවන්නේ නම්, අවශ්‍ය බහුතරය නියෝජනය කරන ණයහිමියන්ගේ

මතය සැලකිල්ලට ගෙන අධිකරණය විසින් අවශ්‍ය පිරිදි ආඥාවක් නිකුත් කළ යුතු ය.

(7) (6) වන උපවගන්තිය යටතේ නියෝගයක් කිරීමේ දී, අධිකරණය විසින් අවශ්‍ය පරිදි -

(අ) යම් නියමයක් හෝ කොන්දේසියක් පනවනු ලැබිය හැකි ය; සහ

(ආ) වෙනත් යම් ආනුෂංගික ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(8) (6) වන උපවගන්තිය යටතේ ආඥාවක් නිකුත් කිරීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත අද්මිනිස්ත්‍රාසිකරු විසින් -

(අ) ප්‍රායෝගිකව හැකිතාක් දුරට සමාගමේ ණයහිමියන් හැකි තරම් ප්‍රමාණයකට එම ආඥාව පිළිබඳ ලිඛිතව දැන්වීමක් කළ යුතු ය;

(ආ) ආඥාව පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් පළකර (ආ) ඡේදයේ සඳහන් දැන්වීමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරිය වෙත යැවිය යුතු ය.

(9) (6) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම ආඥාවක ම පිටපතක්, ආඥාව නිකුත් කිරීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත, අධිකරණය විසින් රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත යැවිය යුතු ය.

(10) (6) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් යටතේ සමාගම් ඔප්පු වැඩපිළිවෙළ මගින් බැඳීමක් ඇති අවස්ථාවක, එම ඔප්පුව -

(අ) ආඥාව කරනු ලැබූ දිනය සහ එම වේලාව සිට; හෝ

(ආ) අධිකරණය විසින් ආඥාකරනු ලබන යම් දිනයක සහ වේලාවක සිට,

සමාගම විසින් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

*ඇ - මාර්ග ද්විත්වය සඳහා ම අදාළ වන කාරණා*

අද්මිනිස්ත්‍රාසි කිරීම පිළිබඳ ණයහිමියන්ගේ කමිටුව

**217.** (1) අද්මිනිස්ත්‍රාසි කිරීම සිදු කරන අතරතුර කවර හෝ අවස්ථාවක දී සහ දැනටමත් අද්මිනිස්ත්‍රාසිකරණයේ දී ණයහිමියන්ගේ කමිටුවක් පත්කර නැත්නම්, අද්මිනිස්ත්‍රාසිකරු විසින් (2) වන උපවගන්තියට යටත්ව, එවැනි කමිටුවක් පත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරණයේ ණයහිමියන්ගේ කමිටුවක් පිහිටුවීමේ දී සහ එවැනි කමිටුවකට සාමාජිකයන් පත් කිරීමේ දී එක් ණයහිමියකු හෝ වැඩි දෙනෙකු විසින් පහත අවස්ථාවල දී යෝජනා සම්මත කරගත යුතු ය -

(අ) ආරම්භක රැස්වීමක දී;

(ආ) ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීමක දී; හෝ

(i) මෙම වගන්තියේ සඳහන් කර ඇති කරුණු සංක්ෂිප්ත ලෙස දක්වා ඇති බවට; සහ

(ii) අද්මිනිස්ත්‍රාසි ණයහිමියන්ගේ කමිටුවේ සාමාජිකත්වය සඳහා නාමයෝජනා කැඳවා ඇති බවට,

දැන්වීමේ දන්වා තිබිය යුතු ය.

(3) (2) උපවගන්තියේ වන්නා වූ වෙනත් රැස්වීමක් (ඇ) ඡේදයේ සඳහන් රැස්වීමක් සම්බන්ධයෙන් පස්වන උපලේඛනය අදාළ විය යුතු ය.

(4) අද්මිනිස්ත්‍රාසි ණයහිමියන්ගේ කමිටුවක් පිහිටුවනු ලැබූ විට, එම කමිටුව-

(අ) ට පහත සඳහන් කර්තව්‍යයන් තිබිය යුතු ය: -

(i) අද්මිනිස්ත්‍රාසි කිරීමට අදාළ කාරණා සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසිකරුගෙන් විමසීම; සහ

(ii) (5) වන උපවගන්තිය යටතේ එවන ලද අද්මිනිස්ත්‍රාසිකරුගේ වාර්තා සලකා බැලීමට; සහ

(ආ) මගින් අද්මිනිස්ත්‍රාසිකරුට විධාන ලබාදිය නොහැකි ය.

(5) අද්මිනිස්ත්‍රාසිකරණයේ දී ණයහිමියන්ගේ කමිටුවක් පිහිටුවනු ලැබූ විට, නියම කරනු ලැබිය හැකි තොරතුරු නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ නියම කරනු ලැබිය හැකි කාලයක් තුළ අද්මිනිස්ත්‍රාසිකරු විසින් කමිටුවට වාර්තා එවිය යුතු ය.

(6) යම් තැනැත්තකු -

(අ) ණයහිමියකු බවට;

(ආ) සාමාන්‍ය ඇටෝර්නි බලපත්‍රයක් යටතේ යම් තැනැත්තකු ණයහිමියකුගේ නියෝජිතයකු වන බවට; හෝ

(ඇ) සාමාජිකයකු වීම සඳහා ණයහිමියකු විසින් ලිඛිතව බලය පවරා ඇති බවට,

අද්මිනිස්ත්‍රාසිකරු සෑහීමට පත් වන්නේ නම් මිස, එම තැනැත්තා අද්මිනිස්ත්‍රාසිකරණයේ දී ණයහිමියන්ගේ කමිටුවේ සාමාජිකයකු වීමට සුදුස්සකු නොවිය යුතු ය.

(7) අද්මිනිස්ත්‍රාසිකරණයේ දී ණයහිමියන්ගේ කමිටුවක් සම්බන්ධයෙන් වන විට පහත දැක්වෙන නියම කරනු ලැබිය හැකි ය නියමයන්ට, සීමා කිරීම්වලට සහ සීමාවලට යටත්ව කරුණු විය යුතුය :-

(අ) කමිටුවේ සාමාජිකත්වය සහ එම සාමාජිකත්වය අහිමි කිරීම;

(ආ) කමිටුව පිහිටුවීම පිළිබඳ දැන්වීම සහ කමිටුවට අදාළ වෙනත් කාරණා;

(ඇ) කමිටුවේ රැස්වීම් කැඳවීමේ කාර්යපටිපාටිය;

(ඈ) කමිටුවේ සාමාජිකයන් විසින් සිදුකරන ලද හෝ කරන ලද ක්‍රියා, අත්හැරීම් හෝ තීරණ සම්බන්ධයෙන් ආරක්ෂාව;

(ඉ) කමිටුවේ සාමාජිකයින්ගේ වියදම් ප්‍රතිපූර්ණය කිරීම; සහ

(ඊ) කමිටුවේ සාමාජිකයන් සහ ඔවුන් සම්බන්ධ පාර්ශ්වයන් විසින් කරන ලද ගනුදෙනු.

(8) අද්මිනිස්ත්‍රාසිකරණයේ දී ණයහිමියන්ගේ කමිටුවේ සාමාජිකයින්ගේ සුදුසුකම්වල, නාමයෝජනාවල හෝ පත්වීම්වල දෝෂ තිබේනම් ඒ සම්බන්ධයෙන් පැන නගින්නා වූ ප්‍රතිවිපාක නියම කළ හැකි පරිදි විය යුතු ය.

(9) පිහිටුවන ලද අද්මිනිස්ත්‍රාසි කමිටුවේ පුරප්පාඩු හේතුවෙන්, කමිටුවට ක්‍රියා කිරීමට නොහැකි වූ විට, අද්මිනිස්ත්‍රාසිකරු විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් දන්නා සෑම ණයහිමියකුට ම එම කරුණ ලිඛිතව දැක්විය යුතු ය.

කොටස් හිමියන්ගේ, ණයහිමියන්ගේ සහ කමිටු පිළිබඳ අද්මිනිස්ත්‍රාසි කිරීමේ රැස්වීම්

**218.** (1) අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් වනතුරු අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් සියලු අවස්ථාවල දී -

(අ) අද්මිනිස්ත්‍රාසිකරු විසින් සුදුසු යයි සලකනු ලබන කොටස් හිමියන්ගේ රැස්වීම් ඇත්නම්, ඒ රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය; සහ

(ආ) අද්මිනිස්ත්‍රාසිකරු විසින් සුදුසු යයි සලකනු ලබන ණයහිමියන්ගේ රැස්වීම් ඇත්නම්, ඒ රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය.

(ඇ) (i) අද්මිනිස්ත්‍රාසිකරු විසින් සුදුසු යයි සලකනු ලබන;

(ii) කමිටුව විසින් සාධාරණ ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට එම ඉල්ලීම ලැබී වැඩ කරන දින පහක් ඇතුළත වන,

අද්මිනිස්ත්‍රාසිකරණයේ ණයහිමියන්ගේ කමිටුවේ රැස්වීම් ඇත්නම් කැඳවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් රැස්වීම්වලට පස්වන උපලේඛනය අදාළ විය යුතු ය.

(3) දැන්වීම් සඳහා වූ නියමයන් සහ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ කැඳවනු ලබන රැස්වීම්වල කටයුතු පවත්වන ආකාරය නියම කරන පරිදි විය යුතු ය.

අද්මිනිස්ත්‍රාසි කිරීමේ දී අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශ

**219.** (1) සමාගමක් අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ වී වැඩ කරන දින පහක් ඇතුළත හෝ (3) වන උපවගන්තිය යටතේ දීර්ඝ කරන ලද කාලයක් ඇතුළත සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින්, සමාගමේ කටයුතු, ව්‍යාපාර කටයුතු දේපළ සහ මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරන සම්පූර්ණ ප්‍රකාශයක් අද්මිනිස්ත්‍රාසිකරුට ලබා දිය යුතු අතර, එම ප්‍රකාශය ලබා දීමට, ප්‍රථමයෙන් ප්‍රායෝගිකව ආසන්නතම දිනයට දැක්විය හැකි ආකාරයට පහත දැක්වෙන කරුණු එයට ඇතුළත් විය යුතු ය:-

(අ) ස්කන්ධ පිළිබඳ ලැයිස්තුවක් සහ එම ස්කන්ධ ලැබීමට අපේක්ෂිත සම්පූර්ණ මුදල ඇතුළත් සමාගමේ දේපළ පිළිබඳ විස්තරයක්;

(ආ) සමාගමේ ණය සහ වෙනත් බැරකම්;

(ඇ) එක් එක් ණයහිමියන්ගේ නම සහ ලිපිනය;

(ඈ) ඇත්නම්, එක් එක් ණයහිමියා වෙත ඇති පිළිබැඳීමක් හෝ පිළිබැඳීම්; සහ

(ඉ) එක් එක් පිළිබැඳීම් ඇති කර ගත් දිනය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ප්‍රකාශයක් සමාගමේ අධ්‍යක්ෂවරුන්ගෙන් නැතහොත් අද්මිනිස්ත්‍රාසිකරු විසින් සාධාරණව ඉල්ලා සිටින පහත දැක්වෙන තැනැත්තන් විසින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශ මගින් සනාථ කළ යුතු ය;

(අ) සමාගමේ නිලධරයකු ලෙස සේවය කරන හෝ සේවයේ සිටින අධ්‍යක්ෂවරයකු නොවන තැනැත්තකු;

(ආ) අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ කළ දිනට පෙරාතුවම වූ මාස දොළහක කාලය තුළ සමාගම පිහිටුවීම, ප්‍රවර්ධනය කිරීම හෝ කළමනාකරණය කිරීම යන කටයුතුවලට සහභාගි වූ තැනැත්තකු; හෝ

(ඇ) එම කාලසීමාව තුළ යම් සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු හෝ

සේවානියුක්තයකු වශයෙන් සේවය කළ සහ සමාගමට අදාළ සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු හෝ සේවානියුක්තයකු ලෙස කටයුතු කළ තැනැත්තකුට.

(3) (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයක් ලබා දීමට දී ඇති කාලසීමාව අද්මිනිස්ත්‍රාසිකරු හෝ අධිකරණය විසින් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(4) යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තියට හෝ (2) වන උපවගන්තියට අනුකූල වීමට අපොහොසත් වන්නේ නම් එම තැනැත්තා වරදක් සිදු කරන්නේ ය.

අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් වන්නේ කවර අවස්ථාවක දී ද යන වග

**220.** (1) පහත දැක්වෙන දිනයේ දී සහ පහත දැක්වෙන වේලාවේ දී, අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් වන්නේ ය: -

(අ) පහත අවස්ථාවල දී ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත්නම් මිස, රැස්වීම් කැඳවීමේ කාලසීමාව තුළ ප්‍රතිඵල රැස්වීමක් කැඳවනු නොලැබූ විට: -

(i) 213 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ; හෝ

(ii) 216 වන වගන්තියේ (2) උප වගන්තියේ(අ) ඡේදයේ (i) අනුඡේදය යටතේ;

(ආ) 213 වන වගන්තියේ 3 වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති නමුත් ඉල්ලීම ඉදිරිපත් කිරීමෙන් පසු රැස්වීම කැඳවීමේ කාලය කල් ඉකුත් වී ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබූ විට;

(ඇ) ප්‍රතිඵල රැස්වීමක් කැඳවනු ලැබුව ද 213 වන වගන්තියේ (8) වන උපවගන්තියේ සඳහන් කාලසීමාව තුළ එය පවත්වා නැති විට;

(ඇ) ණයහිමියන් විසින් ප්‍රතිඵල රැස්වීමක දී යෝජනා සම්මතයක් මගින් 214 වන වගන්තියේ (2)වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ යෝජිත සමාගම් ඔප්පු වැඩපිළිවෙළ අනුමත කර ඇති අවස්ථාවක දී;

(ඉ) ණයහිමියන් විසින් ප්‍රතිඵල රැස්වීමක දී යෝජනා සම්මතයක් මගින් 214 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ ඈවරකරුවකු පත් කරනු ලැබූ විට හෝ අනාහාකාරයකට ඈවරකරුවකු පත් කරනු ලැබූ විට;

(ඊ) ණයහිමියන් විසින් ප්‍රතිඵල රැස්වීමක දී යෝජනා සම්මතයක් මගින් 214 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) වන වන ඡේදය යටතේ අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් කළ විට;

(උ) සමාගම විසින් 216(10) වන උපවගන්තිය යටතේ සමාගම් ඔප්පු වැඩපිළිවෙළක් සකස් කර ඇති බවට සලකනු ලබන විට; හෝ

(ඌ) 263 වන වගන්තිය යටතේ අධිකරණය විසින් අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් කරනු ලැබූ විට හෝ අධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි වෙනත් බලතල ක්‍රියාත්මක කරමින් අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් කළ විට.

(2) (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඉ) සහ (ඌ) ඡේද යටතේ අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් වූ විට අද්මිනිස්ත්‍රාසි කිරීමට පෙර පැවැති තත්ත්වය, එනම් සමාගමක ඈවර කිරීමට භාජන වී තිබුණ තත්ත්වය හෝ ඈවර කිරීමට භාජනය නොවී තිබුණ තත්ත්වය ප්‍රතිස්ථාපනය වන්නේ ය.

## 6 වන පරිච්ඡේදය

### සමාගම් ඔප්පු වැඩපිළිවෙළ සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන්

*අ - සමාගම් ඔප්පු වැඩපිළිවෙළ*

ඔප්පුවක අන්තර්ගත කරුණු

**221.** (1) 217 වන වගන්තියේ (7) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ (i) වන අනු ඡේදයේ හෝ 215 වන වගන්තියේ (7) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ (i) වන අනු ඡේදයේ යන ඡේද යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් කරනු ලබන ප්‍රකාශයක ඇතුළත් කළ යුතු නියමයන් ඇතුළුව සමාගම් ඔප්පු වැඩපිළිවෙළෙහි නියමයන්ට පහත දැක්වෙන කරුණු තිබිය යුතු ය. එනම් -

(අ) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ අනන්‍යතාවය;

(ආ) ඔප්පුව ක්‍රියාත්මකවීම සඳහා වන කොන්දේසි ඇත්නම් ඒවා;

(ඇ) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ කර්තව්‍ය, බලතල සහ කාර්ය;

(ඈ) අධ්‍යක්ෂවරුන්ගේ කර්තව්‍ය සහ බලතල;

(ඉ) සමාගමේ ණය සහ අනෙකුත් බැරකම්වලින් සමාගම නිදහස් කරන්නේනම් ඒ කවර ප්‍රමාණයකට ද යන වග;

(ඊ) සමාගමේ ණය සහ වෙනත් බැරකම්වල නියමයන්වලට කරනු ලබන සංශෝධන;

(උ) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු විසින් ණයහිමියන්ට වාර්තා කිරීම;

(ඌ) ඔප්පුව වෙනස් කළ හැකි වනුයේ කවර නියමයන් යටතේ ද යන වග; සහ

(එ) ඔප්පුව අවසන් වන්නේ කවර අවස්ථානුගත කරුණු යටතේ ද යන වග.

(2) ඔප්පුව ප්‍රකාශිතව ප්‍රතික්ෂේප කරන කොන්දේසි හැර, සමාගමක ඔප්පු වැඩපිළිවෙළක නියම කරනු ලැබිය හැකි නියමයන් ඇතුළත් වී තිබිය යුතු ය.

ඔප්පුවක් යටතේ තුන්වන පාර්ශ්වයන් නිදහස් කිරීම

**222.** (1) අද්මිනිස්ත්‍රාසිකරු විසින් අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත, සමාගම් ඔප්පු වැඩපිළිවෙළක් අනුමත කළහොත්, එම ඔප්පුව සමඟ ප්‍රමාණවත් සම්බන්ධතාවයක් ඇති අදාළ සමාගම් සහ ඒවායේ අධ්‍යක්ෂවරුන් ඇතුළුව එක් අයකු හෝ වැඩි ගණනක් වගකීමෙන් නිදහස් කළ යුතු බවට අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(2) (1) උපවගන්තියේ කාර්ය සඳහා යම් තැනැත්තකු සමාගම් ඔප්පුව වැඩපිළිවෙළකට ප්‍රමාණවත් ලෙස සම්බන්ධ වී සිටිනවා ද නැද්ද යන්න තීරණය කිරීමේ දී, අධිකරණය විසින් -

(අ) යෝජිත නිදහස් කිරීම ඔප්පුවේ වැදගත් කොටසක් වන්නේ ද නැද්ද යන්න;

(ආ) එම තැනැත්තා ඔප්පුව යටතේ දායක වන්නේ ද නැද්ද; සහ

(ඇ) මුදාහැරීමක් නොමැති අවස්ථාවක, එම තැනැත්තා විසින් සමාගමට එරෙහිව හානිපූරණ හිමිකම්පෑමක් ඉදිරිපත් කරන්නේ ද නැද්ද යන

කරුණු සැලකිල්ලට ගත යුතු ය.

ඔප්පුවක් සඳහා වන අවශ්‍යතා

**223.** (1) (3) වන උපවගන්තියට යටත්ව, සමාගම් ඔප්පු වැඩපිළිවෙළක් යටතේ එක් එක් ණයහිමියාට ලැබෙන පිළියම අවම වශයෙන් ඔප්පුව බලාත්මකවීමට පෙරාතුව ආරම්භ වූ සමාගමෙහි ඈවර කිරීම මගින් අදාළ ණයහිමියාට ලැබෙන පිළියම හැකිතාක් සමාන වන්නේ ය.

(2) (3) වන සහ (4) වන උපවගන්තිවලට යටත්ව, සමාගම් ඔප්පු වැඩපිළිවෙළක් මගින් -

(අ) (i) එම වරණීය හිමිකම්පෑම පසුපස ඇති වෙනත් වරණීය හිමිකම්පෑමක; හෝ

(ii) වරණීය හිමිකම්පෑමක් නොවන හිමිකම් පෑමක්,

වන වරණීය හිමිකම්පෑමක් සඳහා ප්‍රමුඛත්වය ලබාදීම හැර අන්‍යාකාරයකින් එය ගෙවීමට අවස්ථාව ලබා නොදිය හැකි ය.

(ආ) සමානුපාතිකව එක හා සමාන ප්‍රමුඛත්වයක් හිමිවන හිමිකම්පෑමක මුදලට වඩා සැලකිය යුතු තරමේ අඩු වටිනාකමකින් යුත් හිමිකම් පෑමක් ගෙවීමට විධිවිධාන සැලැස්වීම නොකළ යුතු ය;

(ඇ) සමාගමෙහි කොටස් මාරු කරන, සමාගමේ අයිතිය කොටස්වලට බද්ධ වී ඇති අයිතියක් වෙනස් කරන හෝ සමාගමේ කොටස් හිමියන්ගේ වගකීම් වෙනස් කරන හෝ වගකීම් අඩු කිරීම සිදු නොවිය යුතු ය.

(3) (අ) සමාගම් ඔප්පු වැඩපිළිවෙළ යටතේ අදාළ ණයහිමියා කැමැත්ත පළ කරන පිළියම්වලට;

(ආ) X වන කොටස යටතේ එකඟවීමක් සඳහා වූ යෝජනාවකට,

(1) වන උපවගන්තිය සහ (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද අදාළ නොවේ.

(4) තත්කාර්ය සඳහා කැඳවන ලද රැස්වීමක දී විශේෂ යෝජනා සම්මතයක් මගින් අනුමත කරන ලද සමාගමේ කොටස් හිමියන්ට අදාළ වන හෝ අදාළ කොටස් හිමියන් වර්ගයට අදාළ වන යම් පැවරීමකට, සුළු වෙනස් කිරීමකට, අඩු කිරීමකට (2)(ඇ) වන උපවගන්තිය අදාළ නොවේ.

(5) (1) වන සහ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ අවශ්‍යතාවලට අනුකූලව වී ඇති බවට, පදනම -

(අ) සාධාරණ උපකල්පන මත; සහ

(ආ) අදාළ දිනය වන විට හිමිකම්පෑම පිළිබඳ තීරණයට අනුව,

තක්සේරු කළ යුතු ය.

(6) පහත දැක්වෙන කාර්ය සඳහා තීරණය කිරීමේ දී, එනම්-

(අ) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, ඔප්පුව බලාත්මක වීමට පෙර ඇවර කිරීම වහාම ආරම්භ වූයේ නම්, ණයහිමියකුට ලැබෙන පිළියම; සහ

(ආ) (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා හිමිකම්පෑම් වලට සමාන ලෙස ප්‍රමුඛතා ලබා දී තිබේ ද යන,

තීරණය කිරීමේ දී ණයක් සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් ලැබීමට තිබූ ප්‍රමාණයට වඩා අඩු ප්‍රමුඛතාවයක් පිළිගැනීමකට ණයහිමියා එකඟ වී ඇති ගිවිසුමක් සැලකිල්ලට ගත යුතු ය.

(7) සමාගම් ඔප්පු වැඩ පිළිවෙලක් -

(අ) ණයහිමියන් එක් අයකුට හෝ වැඩි පිරිසකට අසාධාරණ ලෙස අගතිගාමී නොවිය යුතු අතර, හෝ එහි අසාධාරණ ලෙස වෙනස්කම් නොතිබිය යුතු ය;

(ආ) සමස්තයක් වශයෙන් ණය හිමියන්ගේ අයිතිවාසිකම් වලට පටහැනි නොවිය යුතු ය.

ඔප්පුවෙන් බැඳී සිටින ප්‍රමාණය

**224.** (1) සමාගම් ඔප්පු වැඩපිළිවෙළක් මගින් සමාගම සහ සමාගමේ එක් එක් අධ්‍යක්ෂවරයා සහ එක් එක් කොටස් හිමියා ද, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ද, ඔප්පුව අනුමත කරමින් ණයහිමියන්ගේ යෝජනා සම්මතයේ දී ඡන්දය දීමට හිමිකම් ඇති එක් එක් තැනැත්තා ද බැඳී සිටියි.

(2) ඔප්පුව මගින් ප්‍රදානලාභියා පිළිබැඳීම ක්‍රියාත්මක නොකරන බවට විධිවිධාන සලස්වා ඇති තාක් දුරට -

(අ) පිළිබැඳීම ලැබූ තැනැත්තා ඔප්පුව අනුමත කරන යෝජනා සම්මතයට පක්ෂපාතීව ඡන්දය ලබා දී ඇතිතාක් දුරට හැර; හෝ

(ආ) (4) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් අන්‍යාකාරයකට නියෝග කර ඇති තාක් දුරට හැර,

පිළිබැඳීමක් ලබා ඇති තැනැත්තකු එය ක්‍රියාත්මක කිරීම මෙම වගන්තිය මගින් වළක්වනු නොලැබිය යුතු ය.

(3) (අ) කුලී සින්නක්කර ගිවිසුමක් ඇතුළු, අවස්ථාවෝචිත පරිදි, දේපළ අයිතිකරු හෝ බදුකරු එම දේපළ සන්තකය ලබා නොගන්නා බවට ඔප්පුව මගින් විධිවිධාන සලසා ඇතිතාක් දුරට සහ ඔප්පුව අනුමත කරන යෝජනා සම්මතයට පක්ෂව එම දේපළෙහි අයිතිකරු හෝ බදුකරු ඡන්දය ලබා දී ඇතිතාක් දුරට හැර; හෝ

(ආ) (4) වන උපවගන්තිය යටතේ අධිකරණය අනායාකාරයකට නියෝග කර ඇතිතාක් දුරට හැර,

කුලී සින්නක්කර ගිවිසුමක් ඇතුළු දේපළක අයිතිකරු හෝ බදුකරු එම දේපළෙහි සන්තකය ලබා ගැනීම හෝ අනායාකාරයකින් එය ලබා ගැනීම මේ වගන්තිය මගින් වළක්වනු නොලැබිය යුතු ය.

(4) (5) වන උපවගන්තියට යටත්ව, ධුරය දරන අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ ඉල්ලීම මත සමාගම විසින් සමාගම් ඔප්පු වැඩපිළිවෙළ සාදනු ලැබූ දින සිට සහ වේලාවේ සිට සහ ආඥාවේ සඳහන් කාලය සඳහා එනම්, නිශ්චිත කාලයක් සඳහා හෝ නිශ්චිතව දැක්වෙන කාලයක් සඳහා හෝ සිදුවීම සිදුවනතුරු-

(අ) පිළිබැඳීමක් ලැබූ තැනැත්තා එම පිළිබැඳීම ක්‍රියාත්මක නොකළ යුතු ය;

(ආ) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ යම් දේපළක හිමිකරුවකු හෝ බදුකරුවකු එම දේපළේ සන්තකය ලබා නොගත යුතු අතර, එම දේපළ අත්කර නොගත යුතු ය.

(5) පහත දැක්වෙන කරුණු පිළිබඳව අධිකරණය විසින් සෑහීමකට පත් වන අවස්ථාවක, එනම් -

(අ) ඉල්ලීම ප්‍රදානය කරනු ලැබුවහොත් ඔප්පුවේ කාර්ය ඉටු කර ගැනීම සඳහා සැලකිය යුතු හෝ හිතකර බලපෑමක් සිදු නොවන බවට; සහ

(ආ) ඉල්ලීම, ප්‍රදානය කරනු නොලැබුවහොත් අවස්ථාවෝචිත පරිදි, දීමනාලාභියා, අයිතිකරු හෝ බදුකරු නොවන සමාගමට සම්බන්ධිත තැනැත්තකුට එයින් වන අගතියට වඩා අගතියක් ඉල්ලීම ප්‍රදානය කිරීමෙන් දීමනාලාභියාට, අයිතිකරුට හෝ බදුකරුට සිදු වන බවට,

අධිකරණය විසින් (4) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(6) (4) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක් අවශ්‍ය පරිදි එවැනි නියමයන් සහ කොන්දේසිවලට යටත්ව සිදු කළ හැකි ය.

*ආ - ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන්*

ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු

**225.** (1) අද්මිනිස්ත්‍රාසිකරු සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු යන දෙදෙනාම එකම තැනැත්තකු නොවන අවස්ථාවක -

(අ) සමාගමේ ඔප්පු වැඩපිළිවෙළ සෑදීමෙන් පසු ඔප්පුවට යටත් සමාගමේ කටයුතු, ව්‍යාපාර සහ දේපළ පාලනය ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට භාර දීමට අවශ්‍ය කටයුතු, අද්මිනිස්ත්‍රාසිකරු විසින් ඉටු කළ යුතු ය; සහ

(ආ) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු විසින් සමාගමේ කටයුතු, ව්‍යාපාර සහ දේපළ පාලනය භාර ගැනීමෙන් පසු, ප්‍රායෝගිකව හැකි ඉක්මනින් -

(i) මෙම පනත යටතේ අද්මිනිස්ත්‍රාසිකරු විසින් නිසි පරිදි දරන ලද වියදම්, ගාස්තු සහ වියදම් සහ පාරිශ්‍රමිකය; සහ

(ii) 248 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ හානිපූරණය කරන ලද බැරකම් අද්මිනිස්ත්‍රාසිකරුට ගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ඉතිරි මුදල සංයුක්ත වන යම් මුදලක් සම්බන්ධයෙන්, සමාගම් ඔප්පු වැඩපිළිවෙළට යටත්ව, අද්මිනිස්ත්‍රාසිකරුට සමාගමේ දේපළ පිළිබඳ කැප අයිතියක් තිබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඇති කැප අයිතියට 248 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කැප අයිතියට ප්‍රදානය කර ඇති ප්‍රමුඛතාවයට සමාන ප්‍රමුඛතාවයක් තිබිය යුතු ය.

ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත් කර ක්‍රියා කළ හැක්කේ කවුරුන් ද යන වග

**226.** (1) යම් තැනැත්තකු-

(අ) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත් කරනු ලැබීමට කැමැත්ත ප්‍රකාශ කර පත්වීම සිදු කරන අවස්ථාවේ දී එම කැමැත්ත ඉල්ලා අස්කර ගෙන නැත්නම් මිස;

(ආ) සමාගම් පනතේ 213 වන වගන්තිය යටතේ ධුර දරන්නකු ලෙස පත් කරනු ලැබීම හෝ ක්‍රියා කරනු ලැබීම තහනම් කර ඇත්නම් මිස හෝ සමාගම් පනතේ 214 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් තැනැත්තාට නිලතල දරන්නකු ලෙස පත් කරනු ලැබීම හෝ ක්‍රියා කරනු ලැබීම වළක්වනු ලැබූ ඇත්නම් මිස;

(ඇ) නියම කරන ලද යම් නියමයකට එම තැනැත්තා අනුකූලව ක්‍රියා කර ඇත්නම් මිස; සහ

(ඈ) එම තැනැත්තා සම්බන්ධයෙන් -

(i) (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ලිඛිත කැමැත්ත;

(ii) 30 වන වගන්තියට අනුකූලව එම තැනැත්තා විසින් අයිතිය පිළිබඳ ප්‍රකාශය; සහ

(iii) නියම කළ හැකි වෙනත් ලේඛන,

ආරම්භක රැස්වීමක දී, ප්‍රතිඵල රැස්වීමක දී, ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵල රැස්වීමක දී හෝ ණයහිමියන්ගේ වෙනත් රැස්වීමක දී සභාගත කර ඇත්නම් මිස,

එම තැනැත්තා සමාගමේ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත් නොකරනු ලැබිය යුතු ය හෝ ක්‍රියා නොකරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල අවශ්‍යතා කිසිවක් සපුරා නොමැති බව දනිමින්ම යම් තැනැත්තකුගේ කැමැත්ත ඇතිව, සමාගමක ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත් කරනු ලබන හෝ ක්‍රියා කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරන්නේ ය.

*ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් පත් කිරීම*

**227.** (1) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම සඳහා මේ කොටස මගින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන් වශයෙන් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත් කරනු ලැබිය හැකි ය.

(2) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් පත් කර ඇති අවස්ථාවක -

(අ) සමාගම් ඔප්පු වැඩපිළිවෙළ මගින් අන්‍යාකාරයකට විධිවිධාන සලස්වා ඇත්නම් මිස ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ බලතල සහ කර්තව්‍ය, ඔවුන් අතරින් එක් අයකු හෝ දෙදෙනකු විසින් එක්ව හෝ බලතල ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ හැකි ය;

(ආ) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන් වශයෙන් එම තැනැත්තන්ගේ වගකීම් එක්ව හා වෙන් වෙන්ව විය යුතු ය; සහ

(ඇ) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට මෙම පනත යටතේ කරනු ලබන යම් සඳහනක් අවස්ථාවෝචිත පරිදි, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන් එක් අයකුට හෝ වැඩි ගණනකට කරන ලද සඳහනක් ලෙසට අදහස් වේ.

*ඔප්පු අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ වනුයේ සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු පත් කරන්නේ කවර අවස්ථාවක දී ද යන වග*

**228.** (1) සමාගමක ඔප්පු අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ වන්නේ (2) වන උපවගන්තිය යටතේ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම බලාත්මක වන දිනයේ සහ එම වේලාවේ සිට වන්නේ ය.

(2) (අ) 214 වන වගන්තියේ (2) උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ ණයහිමියන් විසින් අනුමත කර ඇති විට;

(ආ) 216 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ කරන ලද නියෝගයක් ප්‍රකාරව බැඳී සිටින විට,

සමාගම් ඔප්පු වැඩපිළිවෙළක නිශ්චිතව දැක්වෙන ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ පත් කිරීම සමාගම් ඔප්පු වැඩපිළිවෙළ සාදනු ලැබූ දිනයේ සිට සහ එසේ සාදන ලද වේලාවේ සිට බලාත්මක විය යුතු ය.

ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම සඳහා ඇප

**229**. සමාගම් ඔප්පු වැඩපිළිවෙළ මගින් ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ පත්වීම සඳහා ඇප තබන ලෙස ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට නියම කරනු ලැබිය හැකි ය.

ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ නොකළ යුතු බව

**230.** 256 වන වගන්තියට අගති විරහිතව ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු අධිකරණය විසින් ඉවත් කරනු ලබන අවස්ථාවක දී හැර, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ පත් කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ කළ නොහැකි ය.

*ඇ - සමාගම් ඔප්පු වැඩපිළිවෙළක වලංගුතාව, වැඩපිළිවෙළ වෙනස් කිරීම හා අවසන් කිරීම.*

ඔප්පුවක වලංගුවීම පිළිබඳව ආඥාවක් අධිකරණය විසින් පැනවිය හැකි බව

**231.** (1) මෙහි (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ ඉල්ලීම මත අධිකරණය විසින් -

(අ) බලාත්මකව පවතින සමාගම් ඔප්පු වැඩපිළිවෙළක් සම්බන්ධයෙන් වන විට ඔප්පුව වලංගු නොවන බවට ආඥාවක් කළ හැකි ය; හෝ

(ආ) යෝජිත සමාගම් ඔප්පු වැඩපිළිවෙළක් සම්බන්ධයෙන් වන විට, ඇතැම් කොන්දේසිවලට යටත්ව, යෝජිත ඔප්පුව බලාත්මක වන විට අවසර දීම ද ඇතුළුව, අවශ්‍ය පරිදි, එවැනි වෙනත් ආඥාවක් කරනු ලැබිය හැකි ය;

(2) අධිකරණයක් -

(අ) ඔප්පුවක් සම්බන්ධයෙන් වන විට -

(i) සමාගම් ඔප්පු වැඩපිළිවෙළ සඳහා අනුමතය ලබා ගැනීමේ දී සැලකිය යුතු මට්ටමේ අවිධිමත්භාවයක් තිබුණ බවට;

(ii) ඔප්පුව 223 වන වගන්තියේ නියමයන්ට අනුකූල නොවන බවට;

(iii) ඔප්පුවෙන් බැඳීමක් ඇති තැනැත්තකු විසින් ඔප්පුව බෙහෙවින් උල්ලංඝනය කිරීමක් සිදු කර ඇති බව; හෝ

(iv) නීතියට අනුව ඔප්පුව වලංගු නොවන බවට ප්‍රකාශ කළ යුතු වන බවට; හෝ

(ආ) යෝජිත ඔප්පුව සම්බන්ධයෙන් වන විට, එය බලාත්මක වන විට, 223 වන වගන්තියේ නියමයන්ට අනුකූල නොවන බවට,

සෑහීමකට පත්විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ -

(අ) අද්මිනිස්ත්‍රාසිකරු විසින්;

(ආ) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත් කිරීමට නියමිත තැනැත්තකු විසින්;

(ඇ) ණයහිමියකු විසින්;

(ඈ) සමාගම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන වෙනත් යම් තැනැත්තකු විසින්; හෝ

(ඉ) අධිකාරිය විසින්,

අධිකරණයට ඉල්ලීමක් කළ හැකි ය.

(4) (1) ආඥාවේ වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ආඥාවක් සඳහා කරනු ලබන ඉල්ලීමක් නියම කරනු ලැබිය හැකි කාලසීමාවක් තුළ ඉදිරිපත් කළ යුතු ය.

(5) සමාගම් ඔප්පු වැඩපිළිවෙලක් අවලංගු බවට ප්‍රකාශ කරමින්, අධිකරණය (1) වන වගන්තියේ (අ) වන උපවගන්තිය යටතේ ආඥාවක් කිරීමේ දී එම ආඥාවේ බලපෑම එම ආඥාවේ සඳහන් කළ යුතු ය.

7 වන පරිච්ඡේදය

**අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල**

අද්මිනිස්ත්‍රාසි කරුගේ බලතල

**232.** (1) සමාගමේ කටයුතු, ව්‍යාපාර සහ දේපළ අද්මිනිස්ත්‍රාසි කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය වන සියලු දේ අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් ඉටු කළ යුතු ය.

(2) හත්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බලතල අද්මිනිස්ත්‍රාසිකරුට ඇති අතර, ඔහු විසින් එම බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

(3) අද්මිනිස්ත්‍රාසිකරු තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය කිරීමේ දී තම සමාගමේ අනුයෝජිතයකු වන අතර යම් තැනැත්තකු සද්භාවයෙන් සහ වටිනාකමක් සඳහා අද්මිනිස්ත්‍රාසිකරු සමඟ කටයුතු කරනු ලබන විට එම තැනැත්තා විසින් අද්මිනිස්ත්‍රාසිකරු තම බලතල යටතේ කටයුතු කරන්නේ ද යන්න විමසීමට අවශ්‍ය නොවන්නේ ය.

සහය ලබාදෙන ලෙස අද්මිනිස්ත්‍රාසි කරුවකු විසින් කරනු ලබන ඉල්ලීම

**233.** (1) අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් ලිඛිත ඉල්ලීමක් මගින් -

(අ) 438 වන වගන්තියට යටත්ව, අද්මිනිස්ත්‍රාසිකරු විසින් තීරණය කරනු ලබන පරිදි අද්මිනිස්ත්‍රාසි කිරීමට අදාළව සමාගමේ අධ්‍යක්ෂවරයකුගේ හෝ කොටස්හිමියකුගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ සන්තකයේ හෝ භාරකාරත්වය යටතේ හෝ පාලනය යටතේ ඇති යම් පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් අද්මිනිස්ත්‍රාසිකරුට භාරදෙන ලෙස සමාගමේ අධ්‍යක්ෂවරයකු ගෙන් හෝ කොටස් හිමියකුගෙන් හෝ වෙනත් යම් තැනැත්තකු ගෙන් ඉල්ලා සිටිය හැකි ය; සහ

(ආ) (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියා සාධාරණ වනතාක් දුරට එම ක්‍රියා ඉටු කරන ලෙස අද්මිනිස්ත්‍රාසිකරු විසින් පහත දැක්වෙන තැනැත්තන්ගෙන් ඉල්ලා සිටිය හැකි ය :-

(i) සමාගම පිහිටුවීමට, ප්‍රවර්ධනය කිරීමට හෝ කළමනාකරණය කිරීමට සහභාගී වී ඇති තැනැත්තකුගෙන්;

(ii) සමාගමේ අතීත හෝ වත්මන් කොටස් හිමියකුගෙන්;

(iii) සමාගමේ අතීත හෝ වත්මන් අධ්‍යක්ෂවරයකුගෙන් හෝ වෙනත් නිලධරයකුගෙන්;

(iv) සමාගමේ දේපළ සම්බන්ධයෙන් අතීතයේ හෝ වර්තමාන දේපළ භාර ගැනුම්කරුවකුගෙන් හෝ පත්වීම් ලාභියකුගෙන්;

(v) සමාගමේ සේවා නියුක්තයකුගෙන් සේවානියුක්තයකු වශයෙන් සිටි තැනැත්තකුගෙන්;

(vi) නීති උපදෙස්, වරප්‍රසාදවලට, නඩු පැවරීමේ වරප්‍රසාදවලට යටත්ව, සමාගමේ නීතිඥවරයකුගෙන් හෝ නීතිඥවරයකු ලෙස කටයුතු කළ තැනැත්තකුගෙන්;

(vii) සමාගමේ ගණකාධිකාරිවරයකු හෝ විගණකවරයකුගෙන්; හෝ

(viii) සමාගමේ කටයුතු පිළිබඳව දැනුමක් ඇති වෙනත් තැනැත්තකුගෙන්.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති සෑම තැනැත්තකුම -

(අ) අද්මිනිස්ත්‍රාසිකරු නියම කරන වේලාවක දී එසේ නියම කරන ස්ථානයකට පැමිණීම;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරු විසින් ඉල්ලා සිටින පරිදි සමාගමේ කටයුතු ව්‍යාපාර, දේපළ සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු අද්මිනිස්ත්‍රාසිකරුට ලබා දීම;

(ඇ) නියම කරනු ලබන සාක්ෂි පිළිබඳව රීති යටතේ හෝ කාර්ය යටතේ සමාගමේ කටයුතු, ව්‍යාපාර දේපළ හෝ මූල්‍ය තත්ත්වය පිළිබඳව අද්මිනිස්ත්‍රාසිකරු විසින් දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් මත සාක්ෂි විමසීම;

(ඈ) යම් තැනැත්තකුගේ උපරිම හැකියාව අනුව අද්මිනිස්ත්‍රාසිකරුට සහාය ලබා දීම,

කරනු ලැබිය යුතුය.

(3) (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ කරන ලද ඉල්ලීමකට අනුකූලව ක්‍රියා කිරීමේ දී, සමාගමේ සේවානියුක්තයකු නොවන තැනැත්තකු සහ (1) වන වගන්තියේ (ආ) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු විසින් දරන ලද වියදම් අද්මිනිස්ත්‍රාසිකරු විසින් එම තැනැත්තාට ගෙවනු ලැබිය යුතු ය.

(4) මෙම වගන්තිය යටතේ සද්භාවයෙන් තොරතුරු හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට එරෙහිව කිසිඳු සිවිල් හෝ අපරාධ නඩුවක්, හෝ (වෘත්තීය ක්‍රියාකලාපය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති වෘත්තීය මණ්ඩලයක් හෝ අධිකාරියක් විසින් පවත්වන විනය ක්‍රියාමාර්ගයක් ඇතුළු) වෙනත් නීති කෘත්‍යයක් පවරනු නොලැබිය යුතු ය.

(5) මෙම වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසිකරු විසින් කරනු ලබන ඉල්ලීමක් මත -

(අ) ඉල්ලීමට අනුකූලව ක්‍රියා කරන ලෙස; හෝ

(ආ) අධිකරණයට පැමිණ නියම කරනු ලැබිය හැකි සාක්ෂි නීතිවලට හෝ කාර්ය පටිපාටික රීතිවලට අනුව දිවුරුමක් මත අධිකරණයේ සාක්ෂි දීමට, එම තැනැත්තාට නියම කරන ලෙස සහ -

අධිකරණය සෑහීමට පත් වන විට; -

(i) 178 වන වගන්තියේ (ඈ) ඡේදයේ දක්වා ඇති අරමුණු ඉටු කර ගැනීමට එසේ කිරීම හෝ සාක්ෂි දීමට අවශ්‍ය බවට; සහ

(ii) එය එම තැනැත්තාට අනවශ්‍ය ලෙස පීඩාකාරී නොවන බවට, ඉල්ලීමට අනුකූලව ක්‍රියා කරන ලෙසට,

අධිකරණය විසින් එම තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

දේපළ භාර ගැනුම්කාරිත්වය හෝ පත්වීම අවසන් විය යුතු බවට අද්මිනිස්ත්‍රාසිකරුගේ දැන්වීම

**234.** (1) දේපළ භාරගැනුම්කරුට හෝ පත්වීම්ලාභියාට නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ ආකෘති පත්‍රයට අනුව ලිඛිත දැන්වීමක් ලබාදීම මගින් අද්මිනිස්ත්‍රාසිකරු විසින් දේපළ භාර ගැනුම්කාරිත්වය හෝ පත්වීමක් අවසන් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් ලබා දීමෙන් පසු එළඹෙන ඊළඟ වැඩ කරන දිනය අවසානයේ දී දේපළ භාරගැනුම්කාරිත්වය හෝ පත්වීම්ලාභියකුගේ පත්වීම අවසන් වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ දැනුම් දීමක් ලැබීමෙන් පසු, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් සහ යම් සිදුවීමක දී දේපළ භාරගැනුම්කරුගේ කාලය අවසන් වන විට හෝ පත්වීම්ලාභියා පත් කිරීම අවසන් වන විට, දේපළ භාරගැනුම්කරු හෝ පත්වීම්ලාභියා විසින් දේපළ භාරගැනුම්කාරිත්වය සම්බන්ධව දේපළ සම්බන්ධ සියලු කටයුතු කිරීම නතර කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ දේපළ භාරගැනුම්කරුවකුට දැන්වීමක් ලැබුණු පසු -

(අ) දේපළ භාරගැනුම්කරු විසින් 382 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වැඩිදුර පියවර ගැනීමට අවශ්‍ය වන්නේ ය;

(ආ) අවස්ථාවෝචිත පරිදි, 385 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ හෝ 386 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) වන ඡේදය අදාළවීම අවසන් වන නමුත්, ඒ යටතේ දැනටමත් කර ඇති ඕනෑම බෙදා හැරීමකට, එම පදනම මත බාධා නොකළ යුතු ය;

(ඇ) හතරවන උපලේඛනයේ කාර්ය සඳහා මෙම පනත යටතේ දේපළ භාරගැනුම්කරු විසින් නිසි පරිදි දරන ලද පිරිවැය, ගාස්තු සහ වියදම් සහ 395 වන වගන්තිය යටතේ දේපළ භාරගැනුම්කරුගේ හානිපූරණය කිරීම, අද්මිනිස්ත්‍රාසිකරුගේ වියදමක් ලෙස සැලකිය යුතු ය.

අද්මිනිස්ත්‍රාසිකරු විසින් කොටස් සඳහා ඇමතුම්

**235.** සමාගම අද්මිනිස්ත්‍රාසිකරණයේ නොසිටියේ නම්, නොකැඳ වූ ප්‍රාග්ධනය සහ අනෙකුත් වගකීම් සම්බන්ධයෙන් දායක මුදල් ඇමතුම් ලබා ගැනීමට සහ ඇමතුම් සඳහා පොලී අය කිරීමට සහ ගෙවීම් ඉල්ලා සිටීමට සමාගමේ අධ්‍යක්ෂවරුන්ට තිබූ බලතල, අද්මිනිස්ත්‍රාසිකරුට තිබිය යුතු ය.

අද්මිනිස්ත්‍රාසිකරු විසින් ලේඛන ලියා අත්සන් කිරීම

**236.** (1) අද්මිනිස්ත්‍රාසිකරු බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික සියලුම ලේඛන අද්මිනිස්ත්‍රාසිකරු විසින් සමාගමේ නමින් සහ සමාගම වෙනුවෙන් ලියා අත්සන් කළ හැකි ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරු සමාගමක් වෙනුවෙන් අත්සන් කරන ලද ලේඛනයක් සමාගම් පනතේ 19 වන වගන්තියේ කාර්ය සඳහා සමාගම වෙනුවෙන් නිසි ලෙස අත්සන් තබන ලද බව සලකනු ලැබිය යුතු ය.

(3) වෙනත් යම් නීතියක හෝ සමාගමේ ව්‍යවස්ථාවලියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, අද්මිනිස්ත්‍රාසිකරු විසින් සමාගමේ නමින් සහ සමාගම වෙනුවෙන් සමාගමේ පොදු මුද්‍රාව තබා එම ලේඛන මත සහතික කිරීමෙන් එම ලේඛන ලියා අත්සන් කළ හැකි ය.

(4) (3) වන උපවගන්තියේ විස්තර කර ඇති ආකාරයට ලියා අත්සන් කරන ලද ලේඛනයක් සමාගම් පනතේ 19 වන වගන්තියේ කාර්ය සඳහා සමාගම විසින් නිසි ලෙස අත්සන් තබන ලද බව සලකනු ලැබිය යුතු ය.

**පිළිබැඳීමකට යටත් යම් දේපළක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අද්මිනිස්ත්‍රාසිකරුට ඇති බලතල**

**237.** (1) (අ) චල සෘණ භාරයකට යටත් සමාගමේ දේපළක් සම්බන්ධයෙන්; හෝ

(ආ) සමාගම් පනතේ 431 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ චල සෘණ භාරයකට පසුව ඇති ස්ථිර ඇපයක් සම්බන්ධයෙන්,

එම දේපළ පිළිබැඳීමකට යටත්කර නොමැති වන්නේ නම් අද්මිනිස්ත්‍රාසිකරු විසින් එම දේපළ බැහැර කිරීම හෝ ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් අද්මිනිස්ත්‍රාසිකරු බලතල ක්‍රියාත්මක කිරීම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දේපළ බැහැර කරනු ලබන අවස්ථාවක දී, පිළිබැඳීමකට යටත් ව ඇති දේපළ සම්බන්ධව ප්‍රදානලාභියකුට, සමාගමේ අධ්‍යක්ෂවරයන් සතුව තිබූ පරිදි බැහැර කරන ලද දේපළ සෘජුව හෝ වක්‍රව නියෝජනය කිරීම සම්බන්ධව වූ ප්‍රමුඛතාවය හා සමාන ප්‍රමුඛතාවක් ඇත්තේ ය.

(3) අද්මිනිස්ත්‍රාසිකරු විසින්, වෙනත් දේපළ සමඟ හෝ නැතිව -

(අ) (1) වන උපවගන්තිය අදාළ නොවන පිළිබැඳීමකට යටත්ව, සමාගමේ කිසියම් දේපළක්; හෝ

(ආ) කුලී සින්නක්කර මිල දී ගැනීමේ ගිවිසුමක් යටතේ සමාගම සතුව ඇති යම් භාණ්ඩයක්,

බැහැර කිරීම සඳහා අවසර ලබාදෙන ආඥාවක් සඳහා අධිකරණයට ඉල්ලුම් කළ හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ඇති ඉල්ලීමක් මත, අධිකරණය විසින් ආඥාවක් මගින් අද්මිනිස්ත්‍රාසිකරුට පහත දැක්වෙන කරුණු සඳහා බලය පැවරිය හැකි ය:-

(අ) දේපළ, පිළිබැඳීමකට යටත් නොවූ දේපළක් ලෙස සලකා, එම දේපළ බැහැර කිරීම සඳහා; හෝ

(ආ) කුලී සින්නක්කර මිල දී ගැනීමේ ගිවිසුම යටතේ අයිතිකරුගේ හෝ බදු දෙන්නාගේ සියලු අයිතීන් සමාගමට පවරා ඇති පරිදි, භාණ්ඩ බැහැර කිරීම සඳහා ;

(ඇ) අධිකරණය පහත දැක්වෙන කරුණු පිළිබඳව සෑහීමට පත් වන අවස්ථාවක දී -

(i) බැහැර කිරීම මගින් 178 වන වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් කර ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තවදුරටත් ඉඩ දීමක් සිදු වන බවට; සහ

(ii) නඩුවේ සියලු අවස්ථානුගත කරුණුවලදී, අවස්ථාවෝචිතව, පිළිබැඳීමක ප්‍රදාන ලාභියා හෝ හිමිකරු හෝ කුලී සින්නක්කර ගිවිසුමක බදු දෙන්නා හැර, සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන වෙනත් තැනැත්තකු කෙරෙහි, ඉල්ලීම ප්‍රදානය කිරීමෙන් සිදුවන අගතියට වඩා අගතියක්,

(5) (8) වන උපවගන්තියට අගති විරහිතව -

(අ) බැහැර කිරීමේ දී ලැබෙන සියලු ආදායම සම්බන්ධයෙන්; සහ

(ආ) එම දේපළ විකිණීමෙන් ලැබෙන ආදායම බවට අධිකරණය විසින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයට වඩා දේපළ විකිණීමෙන් ලැබෙන මුදල් ප්‍රමාණය අඩු වන අවස්ථාවක, අද්මිනිස්ත්‍රාසි කිරීමේ දී දේපළ හෝ භාණ්ඩවල හැකිතාක් ප්‍රමාණයෙන් අපේක්ෂා කළ හැකි විකිණීමකින් සාධාරණව අවබෝධ කර ගැනීමට හැකි වීම සම්බන්ධයෙන්,

අවස්ථාවෝචිත පරිදි, දේපළ හෝ භාණ්ඩ සම්බන්ධයෙන් ප්‍රදානලාභියා හෝ හිමිකරුට දේපළ හෝ භාණ්ඩ සම්බන්ධයෙන් එම ප්‍රදානලාභියා හෝ අයිතිකරුට තිබූ ප්‍රමුඛතාවය ම ප්‍රදානලාභියා හෝ හිමිකරුට තිබිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ පනවන ලද කොන්දේසියක්, වගකීම් දෙකකට හෝ ඊට වැඩි ගණනකට යටත්ව, දේපළ බෑහැර කිරීමකට අදාළ නම්, එම කොන්දේසිය මගින් ප්‍රදානලාභියන්ගේ අදාළ ප්‍රමුඛතා ආරක්ෂා කළ යුතු ය.

(7) (4) වන උපවගන්තිය යටතේ ආඥාවක් කිරීමේ දී, අධිකරණයට, අවශ්‍ය පරිදි -

(අ) කිසියම් නියමයක් හෝ කොන්දේසියක් පැනවීම;

(ආ) වෙනත් ආධාරක ආඥාවක් කිරීම,

අධිකරණය විසින් අවශ්‍ය පරිදි ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(8) (4) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද සෑම ආඥාවකට ම පිටපතක්, ආඥාව නිකුත් කිරීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත, අධිකරණය විසින් රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත එවිය යුතු ය.

## 8 වන පරිච්ඡේදය

### අද්මිනිස්ත්‍රාසිකරුගේ සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරය

*අ - විමර්ශනය කිරීම සඳහා වූ කාර්යභාරය*

සමාගමේ කටයුතු විමර්ශනය කිරීමට අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්යය භාරය

**238.** (1) සමාගමක අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ වූ වහාම, අද්මිනිසිත්‍රාසිකරු විසින් -

(අ) සමාගමේ කටයුතු විමර්ශනය කළ යුතු ය;

(ආ) සමාගම අවලංගු කළ හැකි ගනුදෙනුවකට හෝ අඩු අගයක ගනුදෙනුවකට පාර්ශ්වකරුවකු වී ඇති ද යන්න සලකා බලා, සහ එවැනි

ගනුදෙනුවක් පහත කරුණු මත ණයහිමියන්ගේ යහපත උදෙසා වූවක් ද නැද්ද යන්න නිශ්චය කළ යුතු ය : -

(i) එම ගනුදෙනු සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම; සහ

(ii) 415 වන වගන්තිය යටතේ අධිකරණයට ඉල්ලුම් කිරීම සහ 129 වන වගන්තිය යටතේ අය කර ගැනීම;

(ඇ) (i) සමාගම් විසින් සමාගම් ඔප්පු වැඩපිළිවෙළක් සකස් කිරීමේ දී;

(ii) ඇවරකරුවකු පත් කිරීමේ දී;

(iii) අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් කිරීමේ දී,

එය ණයහිමියන්ගේ යහපත උදෙසා වන්නේ ද යන්න පිළිබඳ මතයක් පළ කළ යුතු ය.

*ආ - වාර්තා කිරීම සඳහා කාර්යභාරය*

වැරදි ක්‍රියා වාර්තා කිරීම සඳහා අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරය

**239.** (1) යම් සම්බන්ධිත පාර්ශ්වයක් වැරදි ලෙස යොදවා හෝ රඳවා තබාගෙන හෝ සමාගමෙහි මුදල් හෝ වෙනත් දේපළ සඳහා වගකිව යුතු හෝ වගවීම හෝ නොසැලකිලිමත්කම, පැහැර හැරීම හෝ කාර්ය කඩ කිරීම සම්බන්ධයෙන් වරදකරු වී ඇති බවට අද්මිනිස්ත්‍රාසිකරු විශ්වාස කරන්නේ නම් හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබේ නම් හෝ සමාගම සම්බන්ධයෙන් විශ්වාසයක් තිබේනම්, අද්මිනිස්ත්‍රාසිකරු විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් එම කාරණය රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත වාර්තා කළ යුතු ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරු විසින් (1) වන උපවගන්තිය යටතේ වාර්තාවක් සාදන අවස්ථාවක, අද්මිනිස්ත්‍රාසිකරු විසින් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට සාධාරණ ලෙස ඉල්ලා සිටිය හැකි සහාය, එනම් -

(අ) තොරතුරු සැපයීම;

(ආ) ලේඛනවලට ප්‍රවේශය; සහ

(ඇ) ලේඛන පරීක්ෂා කිරීම සහ පිටපත් කිරීම සඳහා පහසුකම්,

ලබා දිය යුතු ය.

(3) (1) වන උපවගන්තියට හෝ (2) වන උපවගන්තියට අනුකූල වීමට අපොහොසත් වන අද්මිනිස්ත්‍රාසිකරු වරදක් සිදු කරන්නේ ය.

සිදු කරන ලද වරදක් වාර්තා කිරීමට අද්මිනිස්ත්‍රාසිකරු සතු කාර්යභාරය

**240.** (1) සමාගම හෝ සම්බන්ධ ඕනෑම පාර්ශ්වයක් වරදක් කර ඇති බවට අද්මිනිස්ත්‍රාසිකරු විශ්වාස කරන පෙන්නුම් හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබේ නම් -

(අ) මෙම පනත යටතේ;

(ආ) සමාගම් පනත යටතේ; හෝ

(ඇ) 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ,

අද්මිනිස්ත්‍රාසිකරු විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් මෙම කාරණය පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත වාර්තා කළ යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය විසින් (1) වන උපවගන්තිය යටතේ වාර්තා කරන ලද කරුණක්, නීතිය ක්‍රියාත්මක කිරීමේ සුදුසු අධිකාරියක් වෙත යොමු කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරියකට වාර්තා කරන (1) වන උපවගන්තිය යටතේ යම් කරුණක් සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසිකරු වාර්තාවක් ඉදිරිපත් කරන යම් අවස්ථාවක, අද්මිනිස්ත්‍රාසිකරු විසින් -

(අ) තොරතුරු සැපයීම මගින්;

(ආ) ලේඛන සඳහා ප්‍රවේශය ලබා දීම; සහ

(ඇ) ලේඛන පරීක්ෂා කිරීම සහ පිටපත් කිරීම සඳහා පහසුකම් සැලසීම මගින්,

අධිකාරියට සහාය ලබා දිය යුතු ය.

(4) මෙම වගන්තියේ සඳහන් කිසිවක් මගින් -

(අ) (1) වන උපවගන්තියේ සඳහන් යම් ආකාරයක වරදක් සිදු කර තිබේ ද යන්න විමර්ශනය කිරීම සඳහා අද්මිනිස්ත්‍රාසිකරුට යම් කාර්යභාරයක් පවරනු නොලැබිය යුතු ය; හෝ

(ආ) වෙනත් යම් නීතියක් යටතේ අද්මිනිස්ත්‍රාසිකරුට පවරා ඇති යම් කාර්යයකට බලපෑමක් හෝ සීමාවක් නොවිය යුතු ය.

(5) (1) වන උපවගන්තියට හෝ (3) වන උපවගන්තියට අනුකූලවීමට අපොහොසත් වන අද්මිනිස්ත්‍රාසිකරුවකු වරදක් සිදු කරන්නේ ය.

ගිණුම් සකස් කිරීම සඳහා අද්මිනිස්ත්‍රාසි කරුට ඇති කාර්ය

**241.** (1) අද්මිනිස්ත්‍රාසිකරු හෝ අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් වීමෙන් පසු වූ අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් සිටි තැනැත්තකු විසින් -

(අ) අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීමෙන් පසු වහාම මාස හයක කාලයක් හෝ ඊට අඩු කාලයක දී හෝ, අද්මිනිස්ත්‍රාසිකරු විසින් තීරණය කරන ඊට අඩු කාලසීමාවක් ඇතුළත;

(ආ) අනතුරුව අද්මිනිස්ත්‍රාසිකරු ධුරය දරන සෑම මාස හයකට වරක්ම ;

(ඇ) (1)(ආ) වන උපවගන්තියේ සඳහන් කාලසීමාව සහ අද්මිනිස්ත්‍රාසිකරු ධුරය අත්හැර යාම අතර කාලසීමාව තුළ,

එම ගිණුම පිළියෙල කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් අදාළ කාලසීමාව අවසන් වීමෙන් පසු වැඩ කරන දින විස්සක් ඇතුළත, එකී තැනැත්තා විසින් -

(අ) නියම කළ හැකි ආකාරයට, (1) වන උපවගන්තියේ සඳහන් ගිණුම දන්නා වූ එක් එක් ණයහිමියා සහ කොටස් හිමියා වෙත යැවිය යුතු ය;

(ආ) ගිණුමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට යැවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් ගිණුම් තැබීම් නියම කරනු ලැබිය හැකි ආකෘතියේ විය යුතු අතර -

(අ) එමගින් එක් එක් කාලසීමාව සඳහා අද්මිනිස්ත්‍රාසිකරුට ලැබුණු මුදල් සහ ගෙවීම් පෙන්විය යුතු ය; සහ

(ආ) එමගින් පළමු කාලසීමාව හැර අද්මිනිස්ත්‍රාසිකරු පත් කළ දිනයේ සිට එක් එක් කාලසීමාව සඳහා අද්මිනිස්ත්‍රාසිකරුගේ ලැබීම් සහ ගෙවීම්වල එකතුව පෙන්විය යුතු ය; සහ

(ඇ) එයට, (1)(ඇ) වන උපවගන්තියේ සඳහන් ගිණුම සම්බන්ධයෙන් හැර, 30 වන වගන්තියට අනුකූල වන අද්මිනිස්ත්‍රාසිකරු විසින් අත්සන් කරන ලද යාවත්කාලීන කරන ලද අයිතිවාසිකම් වල ප්‍රකාශයක් ඇතුළත් විය යුතු ය.

(4) මෙම වගන්තියට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන්නේ ය.

(5) මෙම වගන්තිය මගින්, නියම කරනු ලැබ ඇත්නම්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට අදාළ විය යුතු ය.

අවසන් වාර්තාව යැවීමට ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්යභාරය

**242.** (1) අද්මිනිස්ත්‍රාසි කිරීමක් අවසානයේ දී අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් සිටි තැනැත්තකුට මෙම වගන්තිය අදාළ වේ.

(2) අද්මිනිස්ත්‍රාසිකරු විසින් අදාළ තැනැත්තාගේ අනෙකුත් සියලුම කාර්යන් ඉටු කළ පසු සහ අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් වී වැඩ කරන දින විස්සක් ඇතුළත ඕනෑම අවස්ථාවක, තැනැත්තකු විසින් එවැනි අවසන් වාර්තාවක් රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත, නියම කරනු ලැබිය හැකි, තොරතුරු හා නියම කර ඇති ආකාරයට එවිය යුතු ය.

(3) මෙම වගන්තියට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන්නේ ය.

අවසාන වාර්තාව යැවීමට අද්මිනිස්ත්‍රාසිකරු වෙත වන කාර්යභාරය

**243.** (1) ඔප්පු අද්මිනිස්ත්‍රාසි කිරීම අවසානයේ දී, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් සිටි තැනැත්තකුට මෙම වගන්තිය අදාළ වේ.

(2) ඔප්පු අද්මිනිස්ත්‍රාසි කිරීම සම්බන්ධයෙන් වන තැනැත්තාගේ අනෙකුත් සියලුම කාර්ය ඉටු කිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින් සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් වී වැඩ කරන දින විස්සක් ඇතුළත කවර හෝ අවස්ථාවක, තැනැත්තා විසින් නියම කරනු ලැබිය හැකි තොරතුරු අඩංගු අවසන් වාර්තාවක් රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත, නියම කරනු ලැබිය හැකි ආකාරයට යැවිය යුතු ය.

(3) මෙම වගන්තියට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන්නේ ය.

*ඇ - විවිධ කාර්ය*

මුදල්වලට අදාළව අද්මිනිස්ත්‍රාසිකරුට ඇති කාර්යභාරය

**244.** (1) (2) වන සහ (3) වන උපවගන්ති වලට යටත්ව සහ අධිකරණය විසින් කරනු ලබන ආඥාවකට යටත්ව, යම් ගිණුමකට හෝ බැංකු එකක හෝ වැඩි ප්‍රමාණයක ආරම්භ කර ඇති ගිණුම්වලට අද්මිනිස්ත්‍රාසිකරුට ලැබුණ සියලු මුදල් වහාම බැර කළ යුතු ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරුගේ පුද්ගලික බැංකු ගිණුමකට ලැබුණු මුදල්, අද්මිනිස්ත්‍රාසිකරු විසින් බැර කරනු නොලැබිය යුතු ය.

(3) මූල්‍ය එල අද්මිනිස්ත්‍රාසි කිරීමේ දී අද්මිනිස්ත්‍රාසිකරුට ලැබෙන මුදල් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයට සහ නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, අද්මිනිස්ත්‍රාසිකරු විසින් ආයෝජනය කළ හැකි ය.

(4) මෙම වගන්තියට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන අද්මිනිස්ත්‍රාසිකරුවකු, මෙම උපවගන්තිය යටතේ වරදක් කරනු ලැබ ඇති අතර එසේ වරදකරුවීමේ දී රුපියල් මිලියනයකට නොඅඩු සහ රුපියල් මිලියන දෙකහමාරකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු පහකට වැඩි නොවන බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම ඔහු යටත් විය යුතු ය.

(5) (2) වන උපවගන්තියට අදාළ යම් වරදක් අද්මිනිස්ත්‍රාසි කරුවකු සිදු කරනු ලබන අවස්ථාවක දී, ඔහුට පනවනු ලැබිය

හැකි දඩය හෝ බන්ධනාගාරගත කිරීමට අමතරව, අධිකරණය විසින්, (2) වන උපවගන්තියට පටහැනිව ගෙවන ලද මුදල් සහ ඒ මත අය වන පොලිය හෝ ලාභ-

(අ) දඩයක් අය කර ගන්නා ආකාරයට අය කර ගත යුතු ය; සහ

(ආ) අධිකරණය වෙනත් ආකාරයකින් ආඥා නොකළහොත්, (1) වන උපවගන්තිය යටතේ පිහිටුවා ඇති ගිණුමකට ගෙවිය යුතු ය.

ගිණුම් වාර්තා වලට අදාළව අද්මිනිස්ත්‍රාසි කරුට සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසි කරුට ඇති කාර්යය

**245.** (1) සමාගමේ දේපළවලට සහ ව්‍යාපාරවලට අදාළ සියලු ලදුපත්, ගෙවීම සහ වෙනත් ගනුදෙනු පිළිබඳව අද්මිනිස්ත්‍රාසිකරුගේ කාලසීමාවට අදාළව, හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ කාලසීමාවට අදාළව, නිවැරදිව වාර්තාගත කර ඇති සහ පැහැදිලි කරන, ගිණුම් වාර්තා අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් සාදනු ලැබිය යුතු ය.

(2) උනන්දුවක් දක්වන තැනැත්තකු විසින් අධිකරණයට කරන ලද ඉල්ලීමක් මත අදාළ ඉල්ලුම්කරුට (1) වන උපවගන්තියේ සඳහන් ගිණුම් වාර්තා, අවශ්‍ය පරිදි, නියම කළ හැකි කොන්දේසි මත පරීක්ෂා කළ හැකි බවට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් ගිණුම් වාර්තා, අද්මිනිස්ත්‍රාසි කිරීම හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසි කිරීම අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් වී, අවස්ථාවෝචිත පරිදි, අවම වශයෙන් වසර හයක් ගතවනතුරු අද්මිනිස්ත්‍රාසිකරු විසින් හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු විසින් රඳවා තබා ගත යුතු ය.

(4) මෙම වගන්තියට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවන් වරදක් සිදු කරන්නේ ය.

9 වන පරිච්ඡේදය

## අද්මිනිස්ත්‍රාසිකරුගේ සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ පාරිශ්‍රමිකය සහ අද්මිනිස්ත්‍රාසි කිරීමේ ගාස්තු අනුමත කිරීම

අද්මිනිස්ත්‍රාසි කරුගේ සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසි කරුගේ පාරිශ්‍රමිකය

**246.** (1) 262 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයට යටත්ව -

(අ) නියම කරනු ලැබිය හැකි ආකාරයට ණයහිමියන් විසින් එකඟ විය හැකි පරිදි; හෝ

(ආ) (අ) ඡේදය යටතේ ණයහිමියන්ගේ එකඟත්වයක් නොමැති විට, අධිකරණය විසින් තීරණය කරනු ලබන පරිදි,

යම් පදනමක් හෝ කිහිපයක් මත සහ පැයකට හෝ ප්‍රතිශත අනුපාත සහ ස්ථාවර මට්ටම් එකකට හෝ වැඩි ගණනකට අනුව පාරිශ්‍රමිකය ලැබීමට අද්මිනිස්ත්‍රාසිකරුට හිමිකම් තිබිය යුතු ය.

(2) 246 (1) (අ) වන වගන්තියට යටත්ව -

(අ) නියම කරනු ලැබිය හැකි ආකාරයට, ණයහිමියන් විසින් එකඟ විය හැකි පරිදි; හෝ

(ආ) (අ) ඡේදය යටතේ ණයහිමියන්ගේ එකඟත්වයක් නොමැති විට, අධිකරණය විසින් නිශ්චිත කළ හැකි පරිදි,

යම් පදනමක් හෝ පදනම් කිහිපයක් මත සහ පැයකට හෝ ප්‍රතිශත අනුපාත සහ ස්ථාවර මට්ටම් එකකට හෝ වැඩි ගණනකට අනුව පාරිශ්‍රමිකය ලැබීමට ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට හිමිකම් තිබිය යුතු ය.

(3) පාරිශ්‍රමිකයට අමතරව 245 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ රඳවා තබා ගැනීමට නියමිත වාර්තා කර තබා ගැනීම සම්බන්ධයෙන් ගබඩා සාධාරණ ගාස්තුවක් ද ලබා ගැනීමට අද්මිනිස්ත්‍රාසිකරුට හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට හිමිකම් තිබිය යුතු ය.

පූර්ව අද්මිනිස්ත්‍රාසි කිරීමේ ගාස්තු අනුමත කිරීම

**247.** (අ) නියම කරනු ලැබිය හැකි ආකාරයට ණයහිමියන් විසින් එකඟ විය හැකි පරිදි; හෝ

(ආ) ණයහිමියන්ගේ එකඟත්වයක් නොමැති විට අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි,

පූර්ව අද්මිනිස්ත්‍රාසි ගාස්තු වශයෙන් මුදල් ගෙවීමක් ලබා ගැනීමට අද්මිනිස්ත්‍රාසිකරුට හිමිකම් තිබිය යුතු ය.

## 10 වන පරිච්ඡේදය

### අද්මිනිස්ත්‍රාසිකරුගේ සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ බැරකම

අද්මිනිස්ත්‍රාසි කරුගේ හානිපූරණය

**248.** (1) සමාගමේ දේපළ සම්බන්ධයෙන් වන විට-

(අ) 249 වන සහ 250 වන වගන්ති යටතේ අද්මිනිස්ත්‍රාසිකරුගේ බැරකම් සම්බන්ධයෙන්; සහ

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අද්මිනිස්ත්‍රාසිකරු විසින් දරන ලද බැරකම් සම්බන්ධයෙන්;

(ඇ) 246 (1) වන වගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසි කරුගේ පාරිශ්‍රමිකය සම්බන්ධයෙන්,

අද්මිනිස්ත්‍රාසිකරුවකුට හානිපූරණය සඳහා අයිතියක් ඇත්තේ ය.

(2) සමාගම ඇවර කිරීමක දී, (1) වන උපවගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුගේ හානිපූරණයට, හතරවන උපලේඛනයේ 1 වන ඡේදයේ (ආ) සහ (ඇ) අනුඡේද යටතේ අද්මිනිස්ත්‍රාසිකරුගේ පාරිශ්‍රමික වලට සහ අද්මිනිස්ත්‍රාසිකරු විසින් නිසි පරිදි දරන ලද පිරිවැය, ගාස්තු සහ වෙනත් වියදම්වලට, එම ඡේදවල සඳහන් වෙනත් අනුරූප කරුණුවලට එරෙහිව ප්‍රමුඛතාවය ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ හානිපූරණය සුරක්ෂිත කිරීම සඳහා අද්මිනිස්ත්‍රාසිකරුට සමාගමේ දේපළ මත කැප අයිතියක් තිබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ඇති කැප අයිතියට බැඳීමක් මගින් සුරක්ෂිත කර ඇති ණය, වගකීම් සහ බැඳීම්වලට එරෙහිව ප්‍රමුඛත්වය ඇත.

පෙර පැවති රැකියා ගිවිසුම් යටතේ අද්මිනිස්ත්‍රාසි කරුගේ වගකීම

**249.** (1) අද්මිනිස්ත්‍රාසිකරුගේ පත්වීමට පෙර අත්සන් කරන ලද රැකියා කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් ගෙවීම් සිදු කිරීමට -

(අ) අද්මිනිස්ත්‍රාසිකරු විසින් ලිඛිත ගිවිසුම ප්‍රකාශිතව පිළිගන්නේ නම් මිස; හෝ

(ආ) (2) වන උපවගන්තිය අදාළ වන්නේ නම් මිස ,

අද්මිනිස්ත්‍රාසිකරු වගකීමකට යටත් නොවිය යුතු ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීමට පෙර ඇතුළත් වූ සේවා නියුක්තිය පිළිබඳ ගිවිසුමට අදාළව -

(අ) පඩි හෝ වැටුප්;

(ආ) අත්තිකාරම් පුද්ගලික ආදායම් බද්ද;

(ඇ) අය වීමට ඇති අර්ථසාධක අරමුදල්;

(ඈ) ව්‍යවස්ථාපිත පාරිතෝෂිකය; සහ

(ඉ) අය වීමට ඇති සේවක භාරකාර අරමුදල්;

(ඊ) අද්මිනිස්ත්‍රාසිකරු පත් කරනු ලැබූ දින සිට -

(i) අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් වන දිනය දක්වා;

(ii) අද්මිනිස්ත්‍රාසිකරු එම ධුරය දැරීම අවසන් වන දිනය දක්වා; සහ

(iii) ගිවිසුම අවසන් වන දිනය දක්වා,

සඳහා මුදල් ගෙවීම සම්බන්ධයෙන් වගකීමට යටත් වන්නේ ය ;

(3) අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීමේ දිනට කලින් උපචිත වන්නා වූ ද -

(i) අද්මිනිස්ත්‍රාසි කිරීම අවසාන කිරීමට පෙර; සහ

(ii) අද්මිනිස්ත්‍රාසිකරු එම තනතුරු දැරීම අවසන් වන දිනයේ දී,

ගිවිසුම අවසන් කිරීම පිළිබඳ දැන්වීම අද්මිනිස්ත්‍රාසිකරු ලබා නොදෙන්නේ නම් සහ පත්වීමේ දින සිට වැඩ කරන දින

දහයක් ඇතුළත සේවා නියුක්තිය අවසන් කිරීමට අදාළ නීතියට අනුකූලව ගිවිසුම අවසන් කිරීම පිළිබඳ දැන්වීම අද්මිනිස්ත්‍රාසිකරු ලබා නොදෙන්නේ නම්, අද්මිනිස්ත්‍රාසිකරු පත්වීමට පෙර ඇතුළත් වූ සේවා නියුක්තිය පිළිබඳ ගිවිසුමට අදාළව මුදල් ගෙවීම සඳහා අද්මිනිස්ත්‍රාසිකරු යටත් වන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ (ඊ) සහ (උ) ඡේදවල සඳහන් වැඩ කරන දින දහයේ කාලසීමාව අවසන් වීමට පෙර කරන ලද අද්මිනිස්ත්‍රාසිකරුගේ ඉල්ලීම මත අධිකරණය විසින් එම නියමයන් සහ කොන්දේසි මත එම කාලය දීර්ඝ කළ හැකි ය.

වෙනත් ගිවිසුම් මත සහ කුලිය සඳහා අද්මිනිස්ත්‍රාසිකරුගේ වගකීම

**250.** (1) අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අද්මිනිස්ත්‍රාසිකරු ඇතුළත වන කවර හෝ ගිවිසුමක් සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසිකරු වගකීමකට යටත් විය යුතු ය.

(2) පටහැනිව වෙනත් ගිවිසුමක කුමක් සඳහන් වුව ද, එය නොතකා, (1) වන උපවගන්තිය බලාත්මක වන නමුත් සමාගමට හෝ වෙනත් යම් තැනැත්තකුට එරෙහිව අද්මිනිස්ත්‍රාසිකරුගේ අයිතිවාසිකම්වලට එමගින් අගතියක් සිදු නොවිය යුතු ය.

(3) (4) වන සහ (5) වන උපවගන්තිවලට යටත්ව, සමාගම විසින් දේපළ භාවිත කිරීමට, පදිංචි වී සිටීම හෝ සන්තකයේ තබා ගැනීමට සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසිකරු පත් කරන දිනයේ පවතින ගිවිසුමක් යටතේ අය වීමට ඇති කුලිය සහ වෙනත් ගෙවීම් සඳහා අද්මිනිස්ත්‍රාසිකරු වගකිව යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුගේ වගකීම අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීමෙන් පසු වැඩ කරන දින දහයක සිට ආරම්භ වන සහ -

(අ) අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් වන දිනයේ දී අවසන් වන;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරු එම තනතුර දැරීම අවසන් වන දින; සහ

(ඇ) සමාගම විසින් දේපළ භාවිත කිරීම, පදිංචි වී සිටීම හෝ සන්තකය දැරීම අවසන් වන දිනය අතර කාලය සඳහා,

ඒ කාලසීමාවට ආරෝපණය කළ හැකි කුලියට හෝ වෙනත් ගෙවීම්වලට සීමා වන්නේ ය.

(5) අද්මිනිස්ත්‍රාසිකරුගේ ඉල්ලීමක් මත, අධිකරණය විසින් -

(අ) (4) වන උපවගන්තියේ දක්වා ඇති ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකට අද්මිනිස්ත්‍රාසිකරුගේ වගකීම සීමා කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) (3) වන උපවගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරු වගකීමෙන් සම්පූර්ණයෙන්ම මුක්ත කරනු ලැබිය හැකි ය.

(6) (3) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ සඳහන් කිසිවක් මගින් -

(අ) (3) වන උපවගන්තියේ සඳහන් ගිවිසුමක අද්මිනිස්ත්‍රාසිකරු විසින් සම්මත කර ගැනීමක් ලෙස නොසැලකිය යුතු ය; හෝ

(ආ) එවැනි ගිවිසුමක් යටතේ වෙනත් වගකීමක් ඉටු නොකිරීම සම්බන්ධයෙන් අද්මිනිස්ත්‍රාසිකරු වගකිව යුතු නොවේ.

**දෝෂයක් ඇති අවස්ථාවක වගකීමෙන් නිදහස් වීම**

**251.** (1) අධිකරණය පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් සෑහීමකට පත් වන අවස්ථාවක අද්මිනිස්ත්‍රාසි කිරීම අතරතුර දී -

(අ) අවස්ථාවෝචිත පරිදි, පත් කරනු ලැබූ නියෝගයේ හෝ යෝජනා සම්මතයේ දෝෂයක් තිබීමේ හේතුව නිසා අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු වගකීම දැරීමට සිදු වූ බවට; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු අවංකව සහ සාධාරණව ක්‍රියා කළ අතර, එම අවස්ථානුගත තත්ත්වයන් මත වගකීමෙන් නිදහස් කළ යුතු බවට,

අධිකරණය සෑහීමකට පත්වන අවස්ථාවක දී, එම අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් ක්‍රියා කරනු ලැබූ තැනැත්තා අධිකරණය විසින් එම වගකීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(2) අවශ්‍ය වන නියම සහ කොන්දේසිවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ අධිකරණයට එහි බලතල ක්‍රියාත්මක කළ හැකි ය.

## 11 වන පරිච්ඡේදය

### අද්මිනිස්ත්‍රාසිකරණය සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරණය - විවිධ

*අද්මිනිස්ත්‍රාසිකරුගේ යම් නඩුවක් ඉවත් කිරීම*

**252.** (1) අද්මිනිස්ත්‍රාසිකරණය තුළ සමාගමක අද්මිනිස්ත්‍රාසිකරු සද්භාවයෙන් හෝ කැමැත්ත ඇතිව කරන ලද ගෙවීමක්, ඇතුළත්වන ලද ගනුදෙනුවක් හෝ සිදු කරන ලද වෙනත් දෙයක්, සමාගම ඈවර කිරීමක දී ඉවත් නොකළ යුතු ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරණයට හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරණයට හෝ භාජන වී ඇති සමාගමක ගනුදෙනුවක් -

(අ) අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු විසින් හෝ ඔහුගේ අධිකාරිය යටතේ සිදු කරනු ලැබුවේ නම්; හෝ

(ආ) සමාගම් ඔප්පු වැඩපිළිවෙළ මගින් බලය පවරන ලද හෝ අවසර දෙන ලදුව අද්මිනිස්ත්‍රාසිකරු විසින් සිදු කරනු ලැබුවේ නම්,

එවැනි ගනුදෙනුවකට 412, 413, 414, 415, 416, 417 සහ 418 යන වගන්ති අදාළ නොවිය යුතු ය.

*අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරය පුරප්පාඩු වීම*

**253**. අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ලෙස ධුරයේ සිටින තැනැත්තකු -

(අ) (2) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉල්ලා අස්වුවහොත්; හෝ

(ආ) මිය ගියහොත්;

(ඇ) අධිකරණය විසින් එම ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්;

(ඈ) වස්තුභංගත්ව වෘත්තිකයකු සම්බන්ධයෙන් වන විට, වස්තුභංගත්ව වෘත්තිකයකු ලෙස එහි ලියාපදිංචිය අත්හිටුවා හෝ අවලංගු කර ඇති අවස්ථාවක;

(ඉ) අද්මිනිස්ත්‍රාසිකරුවකු සම්බන්ධයෙන්, 242 වන වගන්තිය යටතේ අවසන් වාර්තාවක් යවා ඇති අවස්ථාවක;

(ඊ) අද්මිනිස්ත්‍රාසිකරුවකු 254 වන වගන්තිය යටතේ ණයහිමියන් විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇති අවස්ථාවක;

(උ) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු සම්බන්ධයෙන් 243 වන වගන්තිය යටතේ අවසන් වාර්තාවක් යවා ඇති අවස්ථාවක; හෝ

(ඌ) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු සම්බන්ධයෙන් වන විට, සමාගම් ඔප්පු වැඩපිළිවෙළ ප්‍රකාරව ණයහිමියන් හෝ සමාගම විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇති අවස්ථාවක,

අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරය පුරප්පාඩු වන්නේ ය.

(2) අද්මිනිස්ත්‍රාසිකරුගේ ඉල්ලා අස්වීම පිළිබඳ චේතනාව පිළිබඳව නියම කරනු ලැබිය හැකි ආකාරයට වැඩ කරන දින පහකට පෙරාතුව සිදු කරනු ලබන ලිඛිත දැන්වීමක් -

(අ) අද්මිනිස්ත්‍රාසිකරුගේ පත්වීම සිදු කළ තැනැත්තාට සහ අධිකරණය විසින් පත්වීම සිදු කර ඇති අවස්ථාවක, අධිකරණය වෙත ඉල්ලීමක් කළ තැනැත්තා වෙත භාර දීම මගින්;

(ආ) ණයහිමියන් වෙත භාර දීම මගින්,

අද්මිනිස්ත්‍රාසිකරුවකුට එම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(3) ඉල්ලා අස්වීම පිළිබඳව ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ චේතනාව නියම කරනු ලැබිය හැකි ආකාරයට ලිඛිත දැන්වීමක් මගින් වැඩ කරන දින පහකට පෙරාතුව සිදු කරනු ලබන දැන්වීමක් -

(අ) සමාගම වෙත; සහ

(ආ) ණයහිමියන් වෙත,

ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) (අ) අධිකරණයේ යම් ආඥාවකට යටත්ව; සහ

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීමට මෙම කොටස යටතේ වූ නියමයන්ට යටත්ව,

අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරයේ පුරප්පාඩුව පිරවීම සඳහා අද්මිනිස්ත්‍රාසිකරු පත් කරන ලද තැනැත්තා විසින් ප්‍රතියෝජන අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කරනු ලැබිය හැකි ය.

(5) (අ) කිසියම් හේතුවක් නිසා අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරය හිස්ව ඇති අවස්ථාවක දී -

(i) සුදුසු ප්‍රතියෝජන අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීමට; හෝ

(ii) සුදුසු ප්‍රතියෝජන අද්මිනිස්ත්‍රාසිකරුවකු පත්කිරීම සඳහා ක්‍රියාවලියක් නිශ්චිතව දැක්වීමට, සහ

අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය;

(ආ) සමාගම් ඔප්පු වැඩපිළිවෙළක් ක්‍රියාත්මකව පවතින අවස්ථාවක අවශ්‍ය පරිදි -

(i) සුදුසු ප්‍රතියෝජන ඔප්පු අද්මිනිස්ත්‍රාසි කරුවකු පත් කරමින් හෝ සුදුසු ප්‍රතියෝජන ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම සඳහා යෝජනාවලියක් නිශ්චිතව දක්වමින්; සහ

(ii) ප්‍රතියෝජන ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීමේ දී දැනට සිටින ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ඉවත් කරමින්,

(6) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ ඉල්ලීමක් මත අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් පහත දැක්වෙන තැනැත්තන් විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය: -

(අ) ණයහිමියකු;

(ආ) සමාගම ගැන උනන්දුවක් දක්වන වෙනත් යම් තැනැත්තකු;

(ඈ) රෙජිස්ට්‍රාර්වරයා; හෝ

(ඇ) අධිකාරිය.

(7) (1) වන උපවගන්තියේ (ඉ) හෝ (උ) ඡේදය යටතේ හැර, අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරයේ පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක, ධුරය අත්හරිනු ලබන තැනැත්තා විසින් හෝ එම තැනැත්තාට දැන්වීම ලබා දීමට නොහැකි වන්නේ නම්, ඔහුගේ නීති නියෝජිතයා විසින් හැකිතාක් ඉක්මනින් එම පුරප්පාඩුව පිළිබඳ ලිඛිත දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත ලබා දිය යුතු ය.

(8) (1) වන උපවගන්තියේ (ඉ) හෝ (උ) ඡේදය යටතේ හැර, අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් ධුරය හිස් කරන තැනැත්තකු විසින් ප්‍රායෝගිකව හැකිතාක් දුරට, එම තොරතුරු සැපයිය යුතු අතර, සාධාරණ ලෙස එම තැනැත්තාගේ අනුප්‍රාප්තිකයා විසින් කරනු ලැබිය හැකි ඉල්ලීමකට අනුව අවශ්‍ය සහාය ලබා දිය යුතු ය.

(9) අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ තනතුරේ පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරන ලද තැනැත්තකුගේ ඉල්ලීමක් මත, අධිකරණය විසින් අවස්ථානුකූලව අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මත කිරීම සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම, අවශ්‍ය බවට සලකනු ලබන යම් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(10) (7) වන හෝ (8) වන උපවගන්තිවලට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන සෑම තැනැත්තකුට වරදක් සිදු කරනු ලබන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(11) (9) වන උපවගන්තිය යටතේ කරන ලද කිසියම් අධිකරණ ආඥාවකට අනුකූල වීමට අපොහොසත් වන සෑම තැනැත්තකු ම මෙම උපවගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙලක්ෂ පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

ණයහිමියන් විසින් අද්මිනිස්ත්‍රාසිකරු ධූරයෙන් ඉවත් කිරීම

**254.** (1) (2) වන උපවගන්තියට සහ මෙම පනතේ අදාළ විධිවිධානවලට යටත්ව -

(අ) ආරම්භක රැස්වීමක් හෝ ඒකාබද්ධ ආරම්භක සහ ප්‍රතිඵලදායී රැස්වීමක දී සම්මත කර ගන්නා ලද; හෝ

(ආ) 255 වන වගන්තිය යටතේ කැඳවන ලද ණයහිමියන්ගේ රැස්වීමක දී සම්මත කර ගන්නා ලද,

ණයහිමියන්ගේ යෝජනා සම්මතයක් මගින් අද්මිනිස්ත්‍රාසිකරුවකු ධූරයෙන් ඉවත් කළ හැකි ය.

(2) (අ) ණයහිමියන් විසින් යෝජනා සම්මතයක් මගින් ප්‍රතියෝජන අද්මිනිස්ත්‍රාසිකරු ලෙස වෙනත් තැනැත්තකු පත් කරනු ලබන්නේ නම්, වෙනත් තැනැත්තා පත් කිරීම -

(i) දැනට සිටින අද්මිනිස්ත්‍රාසිකරු ඉවත් කිරීම මත බලාත්මක වන්නේ නම් මිස; සහ

(ii) එම පත් කිරීම 181 වන වගන්තිය උල්ලංඝනය නොකරන්නේ නම් මිස; සහ

(ආ) (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදයේ සඳහන් වන රැස්වීමක දී එම වෙනත් තැනැත්තකු විසින් -

(i) 181වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ලිඛිත සහතිකයක් ඉදිරිපත් කර ඇත්නම් මිස; හෝ

(ii) 181 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ලිඛිත අනුමත ලබා දී ඇත්නම් මිස; සහ

(iii) 30 වන වගන්තියට අනුකූල වන සම්බන්ධතා ප්‍රකාශයක් එම තැනැත්තා විසින් අත්සන් කර ඇත්නම් මිස,

අද්මිනිස්ත්‍රාසිකරු ණයහිමියන්ගේ යෝජනා සම්මතයක් මගින් ඉවත් කරනු නොලැබිය යුතු ය.

ප්‍රතියෝජන අද්මිනිස්ත්‍රාසිකරු

**255**. (1) 254 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ ණයහිමියන් විසින්, හෝ අධිකරණය විසින් පත් කරනු ලැබුවහොත් මිස, ප්‍රතියෝජන අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීමෙන් පසු වැඩ කරන දින දහයක් ඇතුළත ණයහිමියන්ගේ රැස්වීමක් පැවැත්විය යුතු අතර -

(අ) එම රැස්වීමේ දී ප්‍රතියෝජන අද්මිනිස්ත්‍රාසිකරු ඉවත් කිරීම සඳහා ණයහිමියන් විසින් ඡන්දය භාවිත කළ හැකි ය; සහ

(ආ) එම රැස්වීමේ දී ණයහිමියන් විසින් ප්‍රතියෝජන අද්මිනිස්ත්‍රාසිකරු වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති රැස්වීමට අවම වශයෙන් වැඩ කරන දින හතකට පෙර, ප්‍රතියෝජන අද්මිනිස්ත්‍රාසිකරු විසින් -

(අ) (i) ප්‍රායෝගිකව හැකිතාක් දුරට, සමාගමේ ණයහිමියන්ට රැස්වීම පිළිබඳ ලිඛිත දැන්වීමක් ලබා දීම මගින්; සහ

(ii) එම රැස්වීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් පළ කිරීම මගින්,

රැස්වීම කැඳවනු ලැබිය හැකි අතර;

(ආ) (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේදය සඳහන් දැන්වීමේ පිටපතක් රෙජිස්ට්‍රාර් සහ අධිකාරිය වෙත යැවිය යුතු ය.

(3) ප්‍රතියෝජන අද්මිනිසිත්‍රාසිකරු විසින් 30 වන වගන්තියට අනුකූලව අත්සන් කරන ලද අයිතිවාසිකම් ප්‍රකාශයක් (1) වන උපවගන්තියේ සඳහන් වන රැස්වීමේ දී සභාගත කළ යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් රැස්වීමකට පස්වන උපලේඛනය අදාළ විය යුතු ය.

(5) මෙම වගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම වරදක් සිදු කරනු ලබන්නේ ය.

ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ඉවත් කිරීම සහ ප්‍රතියෝජනය කිරීම

**256.** (1) සමාගම් ඔප්පු වැඩපිළිවෙළක නියම යටතේ විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක ණයහිමියන් හෝ සමාගම විසින් ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(2) සමාගම් ඔප්පු වැඩපිළිවෙළක නියම යටතේ විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, එම වැඩපිළිවෙළ යටතේ ප්‍රතියෝජන ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු පත් කරනු ලැබිය හැකි ය.

ඇවර කිරීම හෝ තාවකාලික ඇවර කිරීම නැවත ආරම්භ කිරීම සඳහා ආඥාව

**257.** ඇවර කිරීමේ හෝ තාවකාලික ඇවර කිරීමේ ක්‍රියාවලියේ පවතින සමාගමකට 188 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අද්මිනිස්ත්‍රාසිකරුවකු, අවස්ථානුකූලව ඇවර කිරීම හෝ තාවකාලික ඇවර කිරීම නැවත ආරම්භ කිරීම සඳහා ආඥාවක් ලබා ගැනීමට අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු නිදහස් කිරීම

**258.** (1) යම් තැනැත්තකු අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු වීම අවසන් වන අවස්ථාවක දී, එම තැනැත්තා -

(අ) (i) ඉල්ලා ඇති නිදහස් කිරීම පිළිබඳව ණයහිමියන් ප්‍රතිරෝධය දැක්විය හැකි ආකාරය පැහැදිලි කරමින් එක් එක් ණයහිමියාට නියම කරනු ලැබිය හැකි ලේඛන ඇතුළත්ව සහ එවැනි ආකාරයකට දැන්වීමක් ලබා දිය හැකි අවස්ථාවක දී; සහ

(ii) නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ එම කාලසීමාව තුළ ණයහිමියන් විසින් ප්‍රතිරෝධය දක්වනු නොලබන අවස්ථාවක දී; හෝ

(ආ) අධිකරණයේ අවසරය ඇතිව නියම කරනු ලැබිය හැකි කාර්යපටිපාටිය අනුගමනය කිරීමෙන් පසු ව,

නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද නිදහස් කිරීමක් මගින්, 419 වන වගන්තිය යටතේ වූ වගකීමක් හැර, සමාගමේ අද්මිනිස්ත්‍රාසිකරණය හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරණය අතරතුර එම තැනැත්තාගේ යම් ක්‍රියාවක්, අත්හැරීමක් හෝ තීරණයක් සම්බන්ධයෙන් එම තැනැත්තා සියලු වගකීම් වලින් මුදාහරිනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු නිදහස් කිරීමක් ලබා ගෙන ඇති අවස්ථාවක, එම තැනැත්තා විසින් වැඩ කරන දින දහයක් ඇතුළත එම නිදහස් කිරීම පිළිබඳ ලිඛිත දැන්වීමක් අධිකාරියට ලබා දිය යුතු ය.

ලේඛන මගින් ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරණය පිළිබඳව සඳහන් කළ යුතු බව

**259.** (1) යම් සමාගමක් ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරණයට යටත්ව සිටින තාක් දුරට, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු විසින් පහත දැක්වෙන කරුණු පිළිබඳව තහවුරු කළ යුතු ය:-

(අ) සමාගම විසින් හෝ ඒ වෙනුවෙන් නිකුත් කරන ලද හෝ අත්සන් කරන ලද සෑම ලේඛනයක ම සමාගමේ නමට පසුව “සමාගම් ඔප්පු වැඩපිළිවෙළට යටත්ව” යන වචන සමාගමේ නම පළමුව දෘෂ්‍යමාන වන අවස්ථාවේ දී සඳහන් කර තිබිය යුතු ය; සහ

(ආ) සමාගමට වෙබ් අඩවි එකක් හෝ ඊට වැඩි ගණනක් තිබේනම්, එක් එක් වෙබ් අඩවියේ සෑම පිටුවකම සමාගම් ඔප්පු වැඩපිළිවෙළ බලාත්මක වන බව ප්‍රකටව පෙනෙන පරිදි සඳහන් කර තිබිය යුතු ය.

(2) සමාගම විසින් හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, එම ඉල්ලීම ප්‍රදානය කරනු නොලැබුවහොත් ඔප්පුවේ කාර්යය සාක්ෂාත් කර ගැනීමට සැලකිය යුතු ලෙස අහිතකර බලපෑමක් ඇති වන බවට අධිකරණය විසින් සලකනු ලබන අවස්ථාවක, (1) වන උපවගන්තියේ සඳහන් අවශ්‍යතාවයන්ගෙන් ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු මුක්ත කිරීම අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම මගින් -

(අ) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ පත්වීමේ වලංගුභාවයට; හෝ

(ආ) යම් ලේඛනයක වලංගුභාවයට,

බලපෑමක් සිදු නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම වරදක් සිදු කරනු ලබන්නේ ය.

ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරණය අවසන්වන්නේ කවර අවස්ථාවක දී ද යන වග

**260**. සමාගම් ඔප්පු වැඩපිළිවෙළ අවසන් වන දිනයේ දී සහ එම වේලාවේ දී ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරණය අවසන් වන්නේ ය.

## 12 වන පරිච්ඡේදය

## අද්මිනිස්ත්‍රාසිකරණය සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරණයේ දී අධිකරණය සතු බලතල

අද්මිනිස්ත්‍රාසිකරු විසින් හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු විසින් විධාන සඳහා කරනු ලබන ඉල්ලීම

**261.** (1) අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ අධිකාරිය විසින් කරනු ලබන ඉල්ලීමක් මත අධිකරණය විසින් -

(අ) අවස්ථාවෝචිත පරිදි අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් පැන නඟින යම් කරුණකට අදාළව අධිකරණය විසින් විධාන ලබා දිය හැකි ය;

(ආ) එවැනි විධාන අධිකරණය විසින් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම හෝ වෙනස් කිරීම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවරනු ලැබ ඇති බලතල -

(අ) අධිකරණය විසින් ක්‍රියාත්මක කළ හැකි වෙනත් බලතලවලට අමතරව වන්නේ ය; සහ

(ආ) එම බරපතළ ඉල්ලීම ඉදිරිපත් කරන අවස්ථාවේ දී අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු එම ධුරවල ක්‍රියා කර තිබුණ ද, නොතිබුණ ද එම බලතල අධිකරණය විසින් ක්‍රියාත්මක කළ හැකි ය.

(3) අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු (1) වන උපවගන්තිය යටතේ දෙන ලද විධානයට අනුකූලව ක්‍රියා කළ බව අවස්ථානුකූලව අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ යම් ක්‍රියාවකට, අත්හැරීමකට හෝ තීරණයකට අදාළව අවස්ථානුකූලව අද්මිනිස්ත්‍රාසිකරුවකුට හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකුට එරෙහිව ඇති හිමිකම්පෑමකට විත්තිවාචකයක් වන්නේ ය.

අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ පාරිශ්‍රමිකය හෝ පත්වීම සම්බන්ධයෙන් වූ ආඥාව

**262.** (1) (2) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකුගේ ඉල්ලීමක් මත -

(අ) 246 වන වගන්තියේ අවස්ථානුකූලව (1) හෝ

(2) උපවගන්ති යටතේ අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ යම් ක්‍රියාවක් හෝ කාලයක් සම්බන්ධයෙන් පාරිශ්‍රමික තීරණය කර නොමැති අවස්ථාවක, අධිකරණය විසින් අවස්ථානුගත කරුණු අනුව සාධාරණ වන මට්ටමකට, එම පාරිශ්‍රමිකය නියම කරනු ලැබිය හැකි ය;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසි කරුවකු වලංගු ලෙස පත් කළේ ද නැද්ද යන්න අධිකරණය විසින් ප්‍රකාශ කළ හැකි ය.

(2) මෙහි (1) වන උපවගන්තිය යටතේ -

(අ) අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් පත් කිරීමට නියමිත තැනැත්තකු;

(ආ) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් පත් කිරීමට නියමිත තැනැත්තකු;

(ඇ) ඇවරකරුවකු හෝ තාවකාලික ඇවරකරුවකු;

(ඈ) දේපළ භාරගැනුම්කරුවකු සම්බන්ධයෙන්;

(ඉ) ණයහිමියකු;

(ඊ) සමාගම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන වෙනත් යම් තැනැත්තකු;

(උ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ රෙජිස්ට්‍රාර්වරයා;හෝ

(ඌ) අධිකාරිය විසින් අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(3) ඉල්ලීම ඉදිරිපත් කරන අවස්ථාවේ දී අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් ක්‍රියා කිරීම අවසන් කර තිබුණ ද නොතිබුණ ද (1) වන උපවගන්තිය යටතේ පවරා දී ඇති බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

**අද්මිනිස්ත්‍රාසිකරණයේදී සහ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරණයේ දී අධිකරණයේ සාමාන්‍ය බලතල**

**263**. (1) (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ ඉල්ලීමක් මත, යම් සමාගමකට අදාළව මෙම කොටසේ විධිවිධාන අදාළ වන ආකාරය සම්බන්ධයෙන් අධිකරණය විසින් අවශ්‍ය යයි සලකනු ලබන ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ -

(අ) අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත්කිරීමට නියමිත තැනැත්තකු;

(ආ) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත් කිරීමට නියමිත තැනැත්තකු;

(ඇ) ඇවරකරුවකු හෝ තාවකාලික ඇවරකරුවකු;

(ඈ) දේපළ භාරගැනුම්කරුවකු;

(ඉ) ණයහිමියකු;

(ඊ) අධිකරණයේ අවසරය ඇතිව, සමාගම පිළිබඳ උනන්දුවක් දක්වන වෙනත් තැනැත්තකු;

(උ) රෙජිස්ට්‍රාර්වරයා;

(ඌ) අධිකාරිය; හෝ

(එ) අධිකරණයේ අවසරය ඇතිව උනන්දුවක් දක්වන වෙනත් තැනැත්තකු,

විසින් අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක දී පහත සඳහන් දේ හේතුවෙන් අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් විය යුතු බවට අධිකරණයට සෑහීමට පත් වන විට, එනම් -

(අ) මේ කොටසේ විධිවිධාන දැඩි ලෙස හෝ අයුතු ලෙස භාවිත කිරීම; හෝ

(ආ) වෙනත් යම් හේතුවක් අනුව අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන්වීම සාධරණ සහ යුක්ති සහගත වන විට,

අධිකරණය විසින් අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම ආඥාවක ම පිටපතක්, ආඥාව සිදු කිරීමෙන් වැඩ කරන දින පහක් ඇතුළත අධිකරණය විසින් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට යවනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කිරීමේ දී අධිකරණය විසින් අවශ්‍ය අවස්ථාවල දී -

(අ) යම් නියම හෝ කොන්දේසි පනවනු ලැබිය හැකි ය; සහ

(ආ) වෙනත් යම් ආනුෂංගික ආඥාවක් කරනු ලැබිය හැකි ය.

අද්මිනිස්ත්‍රාසි කරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසි කරුගේ කාර්ය බලාත්මක කිරීම සඳහා වූ නියෝගය

**264**. (1) මෙම වගන්තියේ අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු සම්බන්ධයෙන් වන විට, " අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වීම" යන්නෙන් අවස්ථාවෝචිත පරිදි, අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු (ක්‍රියාවක් මගින් හෝ නොකර හැරීමක් මගින්) -

(අ) මෙම පනත යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ උපචිත වන කාර්යයකට අනුකූලව ක්‍රියා කිරීමට අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු අපොහොසත් වීම; හෝ

(ආ) මෙම වගන්තිය යටතේ සිදු කරන ලද නියෝගයකට අනුකූලව ක්‍රියාකිරීම හැර, අධිකරණයේ යම් ආඥාවක් හෝ විධානයක් යටතේ ක්‍රියා කිරීමට අපොහොසත් වීම,

අදහස් වන අතර, ''අනුකූලව'' යන්නට, ඊට අනුරූප අර්ථයම තිබිය යුතු ය.

(2) (3) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකුගේ ඉල්ලීමක් මත සහ අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන බවට හෝ අපොහොසත් වී ඇති බවට අධිකරණය සෑහීමකට පත් වූ අවස්ථාවක, අධිකරණය විසින් -

(අ) කාර්යය කිරීම කඩ කිරීම සම්බන්ධයෙන් පවත්නා වෙනත් යම් අයිතිවාසිකමකට හෝ ප්‍රතිකර්මයකට අගතියක් නොවන පරිදි, එම ආඥාවේ සඳහන් කර ඇති පරිදි අදාළ කාර්යයට අනුකූලව ක්‍රියා කරන ලෙස අවස්ථාවෝචිත පරිදි අද්මිනිස්ත්‍රාසිකරුට හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට ආඥාකරනු ලැබිය හැකි ය; හෝ

(ආ) අදාළ කාර්යය සමග සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් අනුකූලව ක්‍රියා කිරීමට අවස්ථාවෝචිත පරිදි, කාර්යය කිරීමට නියමිත අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු වෙත සහන බලපානු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ පහත සඳහන් කවර හෝ තැනැත්තකු, එනම් -

(අ) දේපළ භාරගැනුම්කරුවකු;

(ආ) ණයහිමියකු;

(ඇ) සමාගම කෙරෙහි සම්බන්ධතාවයක් ඇති වෙනත් යම් තැනැත්තකු;

(ඈ) ඇවරකරුවකු හෝ තාවකාලික ඇවරකරුවකු;

(ඉ) රෙජිස්ට්‍රාර්වරයා; හෝ

(ඊ) අධිකාරිය,

විසින් අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) ඉල්ලීම ඉදිරිපත් කිරීමට යටත් පිරිසෙයින් වැඩ කරන දින

දහයකට පෙර අද්මිනිස්ත්‍රාසිකරුම හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට අනුකූල වීමට අපොහොසත් වීම පිළිබඳ දැන්වීම භාර දී ඇත්නම් සහ ඉල්ලීම කරනු ලබන දිනයේ දී අනුකූලව ක්‍රියා කිරීමට දිගටම අපොහොසත් වීමක් තිබේනම් මිස, නිසා (2) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු නොහැකි විය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද සෑම ආඥාවක ම පිටපතක්, එම ආඥාව නිකුත් කිරීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත, අධිකරණය විසින් අධිකාරිය වෙත එවනු ලැබිය යුතු ය.

අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ඉවත් කිරීම අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් ක්‍රියා කිරීම 181 වන වගන්තිය යටතේ අවසර දීම නවතා ඇති බවට

**265.** (1) 264 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ ඉල්ලීමක් මත සහ පහත දැක්වෙන කරුණු පිළිබඳව, එනම් -

(අ) 264 වන වගන්තියේ (2)(අ) ඡේදය යටතේ කරන ලද ආඥාවකට අනුකූලව ක්‍රියා කිරීමට අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු අපොහොසත් වී ඇති බවට;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත් කරනු ලැබීම හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු වශයෙන් ක්‍රියා කිරීම 181 වන වගන්තිය යටතේ අවසර දීම නවතා ඇති බවට; හෝ

(ඇ) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත්කරනු ලැබීමට හෝ කටයුතු කිරීමට 226 වන වගන්තිය යටතේ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු අවසර දීම නවතා ඇති බවට,

අධිකරණය සෑහීමකට පත්ව ඇති අවස්ථාවක, අධිකරණය විසින් -

(i) අවස්ථාවෝචිත පරිදි අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ධූරයෙන් ඉවත් කිරීමට ආඥාවක් කරනු ලැබිය හැකි ය; සහ

(ii) එවැනි ආඥාවක් කිරීමේ දී, අවශ්‍ය පරිදි වෙනත් යම් ආනුෂංගික ආඥාවක් ද කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම ආඥාවක ම පිටපතක්, ආඥාව නිකුත් කිරීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත, අධිකරණය විසින් රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත යවනු ලැබිය යුතු ය.

**266**. අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු ධුරයෙන් ඉවත් කරනු ලබන හෝ ඉවත් කිරීමේ බලපෑම ඇතිකරනු ලබන ආඥා අධිකරණය විසින් නියෝගයක් කරනු ලබන විට අවශ්‍ය පරිදි පහත දැක්වෙන දේ සඳහා ද විධිවිධාන සලස්වමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය :- (ව්‍යාපාර හෝ දේපළ ආරක්ෂා කිරීම සඳහා වූ ආඥා)

(අ) සමාගමේ ව්‍යාපාරය හෝ දේපළ ආරක්ෂණය කිරීම සඳහා වන ආඥා; සහ

(ආ) එම කාර්ය සඳහා ධුරයෙන් ඉවත් කළ තැනැත්තාට පහත දැක්වෙන පරිදි නියම කරමින් -

(i) ආඥාවේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි අවස්ථාවෝචිත පරිදි අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ සන්තකයේ හෝ භාරකාරත්වයේ හෝ පාලනය යටතේ ඇති යම් ලේඛන ආඥාවෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි තැනැත්තා වෙත භාර දීමට; සහ

(ii) අවශ්‍ය විය හැකි පරිදි වෙනත් ක්‍රියාමාර්ග ගැනීමට.

**267.** (1) (3) වන උපවගන්තියට යටත්ව, අද්මිනිස්ත්‍රාසි කිරීම හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසි කිරීම කරන කාලය තුළ, කවර හෝ වේලාවක, සමාගමේ හෝ අධිකාරියේ ණයහිමියකුට හෝ කොටස් හිමියකුට පහත දැක්වෙන හේතු මත මෙම වගන්තිය යටතේ ආඥාවක් ලබා ගැනීම සඳහා, එනම් - (ණයහිමියන්ගේ සහ කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම)

(අ) සමාගමේ කටයුතු, ව්‍යාපාර හෝ දේපළ, පාලනය කිරීම හෝ කරගෙන යාම ණය හිමියන් සහ කොටස් හිමියන්ගෙන් එක් අයකුට හෝ වැඩි ගණනකට අසාධාරණ ලෙස අගතියක් වන හෝ අසාධාරණ ලෙස වෙනස් කොට සැලකීමක් වන අයුරින් අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු විසින් සිදු කරනු ලබන බව; හෝ

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුගේ හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ කිසියම් දැනට පවත්නා ක්‍රියාවක් හෝ යෝජිත ක්‍රියාවක් හෝ නොසලකා හැරීමක් ණයහිමියන් සහ කොටස් හිමියන්ගෙන් එක් අයකුට හෝ වැඩි ගණනකට එරෙහිව අසාධාරණ ලෙස අගතියක් හෝ අසාධාරණ ලෙස වෙනස් කොට සැලකීමක් විය හැකි බව,

යන හේතු මත ආඥාවක් ලබා ගැනීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය.

(2) මෙම වගන්තිය යටතේ වූ ඉල්ලීමක් මත, එසේ කිරීම සාධාරණ සහ යුක්ති සහගත වන අවස්ථාවක, (3) වන උපවගන්තියට යටත් ව පහත දැක්වෙන ආඥා ඇතුළුව අවශ්‍ය පරිදි අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය. එනම් -

(අ) අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු විසින් සමාගමේ කටයුතු, ව්‍යාපාර සහ දේපළ සම්බන්ධයෙන් අනාගත අද්මිනිස්ත්‍රාසිකරණය විධිමත් කරමින් කරනු ලබන ආඥා; හෝ

(ආ) අයදුම්කරු විසින් පැමිණිලි කරන ලද ක්‍රියාවක් කිරීමෙන් හෝ අඛණ්ඩව කරගෙන යාමෙන් වැළකී සිටින ලෙස අද්මිනිස්ත්‍රාසිකරුට හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට නියම කරමින් හෝ අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු විසින් කිරීමට අතපසු කරන ලද ක්‍රියාවක් කරන ලෙස නියම කරමින් කරනු ලබන ආඥා.

(3) (අ) IX වන කොටසේ 6 වන පරිච්ඡේදය යටතේ (සැබෑ හෝ යෝජිත) සමාගම් ඔප්පු වැඩපිළිවෙල මත; පිළිබඳව, යම් පැමිණිල්ලක්; හෝ

(ආ) X වන කොටස යටතේ වූ (සැබෑ හෝ යෝජිත) එකඟත්වයක් මත,

නියමයන් පිළිබඳ පැමිණිල්ලක්, මෙම වගන්තිය යටතේ සිදු නොකළ යුතු අතර, මේ පනතේ වෙනත් යම් විධිවිධාන මගින් අවසර දී ඇති අවස්ථාවකදී, එකී වෙනත් විධිවිධාන යටතේ සිදු කළ හැකි ය.

**268**. සමාගමක් අද්මිනිස්ත්‍රාසිකරණය වෙමින් පවතිද්දී රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ අධිකාරියේ ඉල්ලීමක් මත, සමස්තයක් ලෙස ණයහිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

අද්මිනිස්ත්‍රාසිකරණයේ දී ණයහිමියන් ආරක්ෂා කිරීම සඳහා කරනු ලබන ආඥා

## X වන කොටස

### සමස්ථයකට එළඹීම

**269**. මෙම කොටසෙහි පද සම්බන්ධයෙන් අනන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

අර්ථ නිරූපණය

(1) "එකඟතාවය" යන්නෙන්, සමාගමක් සහ එහි ණයහිමියන් අතර හෝ ණයහිමියන්ගේ යම් පංතියක් අතර එකඟතාවයක් අදහස් වන අතර, පහත දැක්වෙන එකඟතාවය ද ඊට ඇතුළත් වේ:-

(අ) සමාගමේ සියලු ණය හෝ එහි යම් කොටසක් හෝ බැරකම් අවලංගු කිරීම සඳහා වූ එකඟතාවයක්;

(ආ) සමාගමේ හෝ වෙනත් බැරකම් සම්බන්ධයෙන් ණයහිමියන්ට ඇති අයිතිවාසිකම් හෝ ඊට අදාළ නියමයන් වෙනස් කිරීම සඳහා වූ එකඟතාවයක්; හෝ

(ඇ) සමාගමේ ණය ගෙවීමට ඇති හැකියාව කෙරෙහි බලපාන සමාගමේ ව්‍යවස්ථාව වෙනස් කිරීමට අදාළ එකඟත්වයන්; සහ

(2) "යෝජක" යන්නෙන්, අදහස් වන්නේ මෙම කොටස (එකඟතාවය) අනුව එකඟතාවයක් යෝජනා කරන 270 වන වගන්තියේ සඳහන් වන තැනැත්තකු අදහස් වේ.

**270.** (1) එම තැනැත්තාට සමාගමක් වස්තුභංගවීමට හෝ එසේ වීමට ඉඩ ඇති බවට විශ්වාස කිරීමට හේතු තිබේ නම් -

එකඟතාව පිළිබඳ යෝජනාව

(අ) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයක් මගින්;

(ආ) සමාගමේ දේපළ සහ පොරොන්දු සම්බන්ධයෙන් සම්පූර්ණ හෝ සැලකිය යුතු ලෙස සමස්ථය සම්බන්ධයෙන් පත් කරනු ලබන දේපළ භාර ගැනුම්කරුවකු විසින්;

(ඇ) සමාගමේ අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින්;

(ඈ) සමාගමේ ඈවරකරුවකු විසින්; හෝ

(ඉ) අධිකරණයේ අවසරය ඇතිව, සමාගමේ ණයහිමියකු විසින් හෝ සමාගමේ කොටස් හිමියකු විසින් පත් කරන ණයහිමියකු හෝ දේපළ භාර ගන්නකු,

මෙම කොටස යටතේ එකඟතාවයක් යෝජනා කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (ඉ) වන ඡේදය යටතේ අධිකරණය විසින් ණයහිමියකුට, දේපළ භාර ගැණුම්කරුවට හෝ කොටස් හිමියෙකුට අවසර ලබා දෙන අවස්ථාවක දී, ඒකී ණයහිමියාට, දේපළ භාර ගැනුම්කරුට හෝ කොටස් හිමියාට සමථයක් යෝජනා කිරීමට හැකි වන පරිදි, එක් එක් ණයහිමියා වෙත සමාගමේ ණය, වගකීම් සහ ආඥාවේ නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් තොරතුරු ද සඳහන් කරමින්, සමාගමේ ණය හිමියන්ගේ නම් සහ ලිපින ලැයිස්තුවක් ණය හිමියන්, දේපළ භාරගැනුම්කරු හෝ කොටස් හිමියන් වෙත යවන ලෙසට සමාගමට විධානය කරමින් අධිකරණය විසින් ආඥාවක් කළ හැකිය.

(3) යෝජකයා විසින් කැඳවන ලද වෙන් වෙන් වශයෙන් වූ රැස්වීමක දී ණයහිමියන්ගේ එක් එක් පන්තිය සඳහා සමථයක් යෝජනා කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ කාර්ය සඳහා -

(අ) තම පොදු අවශ්‍යතා සඳහා ක්‍රියා කිරීමේ අරමුණින් බුද්ධිමත්ව එකට එක්ව සාකච්ඡා කළ නොහැකි තරම් අසමාන වූ අවශ්‍යතා සහිත ණයහිමියන් විවිධ පන්තිවල ගොනුවක ආකාරයට යෝජකයා විසින් ණයහිමියන් පන්තිවලට වෙන්කළ යුතු ය; සහ

(ආ) යම් පන්තියක සාමාජිකයන් වන ණයහිමියන්ට සමාගමේ ආර්ථිකය කෙරෙහි සැබෑ උනන්දුවක් නොමැති නම්, එම පන්තියේ රැස්වීමක් කැඳවීමට අවශ්‍ය නොවේ.

(5) යෝජකයාගේ හෝ සමාගමේ ඉල්ලීම මත සහ (3) වන උපවගන්තිය යටතේ රැස්වීමක් කැඳවීමට පෙර යම් අවස්ථාවක, (4) වන උපවගන්තියේ සඳහන් යම් කාරණාවක් සම්බන්ධයෙන් අධිකරණය විසින් විධාන ලබා දිය හැකිය.

(6) යෝජකයාගේ හෝ සමාගමේ ඉල්ලීම මත, සහ 272 වන වගන්තිය යටතේ ණයහිමියන් හෝ යම් පන්තියක වූ ණයහිමියන් විසින් සමථයකට එළඹීමේ යෝජනාවක් අනුමත කිරීමට පෙර යම් අවස්ථාවක, 274 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ සකස් කර ඇත්නම්, අදාළ වන හෝ විය හැකි යම් කාරණාවක් සම්බන්ධයෙන් අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය.

(7) (5) වන උපවගන්තියට අගති විරහිතව (4) වන උපවගන්තියේ සඳහන් කරුණුවලට (6) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

(8) (5) වන සහ (6) වන උපවගන්තිවල විෂයය කරුණු සම්බන්ධයෙන් සමාගමේ ස්ථාවරයේ ඇති වැදගත්කම සැලකිල්ලට ගනිමින්, ඉහත කී උපවගන්ති දෙකෙන් එකක් යටතේ ඉල්ලීම පිළිබඳව හැකිතාක් ඉක්මනින් තීරණය කළ යුතු ය.

යෝජිත සමථය පිළිබඳ දැනුම්දීම

**271.** (1) 270 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කැඳවනු ලබන එක් එක් රැස්වීමකට සහභාගී වීමට හිමිකම් ඇති යෝජකයා දන්නා ණයහිමියන්ගේ ලැයිස්තුවක් යෝජකයා විසින් සම්පාදනය කළ යුතු අතර, එක් එක් ණයහිමියා වෙත සමාගමේ ණය හෝ වගකීම් ප්‍රමාණය හෝ ඇස්තමේන්තුගත ණය හෝ වගකීම් ප්‍රමාණය එම ලැයිස්තුවේ සඳහන් කළ යුතු ය.

(2) යෝජකයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට -

(අ) සමාගමේ දන්නා එක් එක් ණයහිමියාට;

(ආ) සමාගමට;

(ඇ) යම් දේපළ භාර ගැනුම්කරුවකුට;

(ඇ) යම් අද්මිනිස්ත්‍රාසිකරුවකුට;

(ඉ) යම් ඇවරකරුවකුට; සහ

(ඊ) රෙජිස්ට්‍රාර්වරයාට,

අවස්ථාවෝචිත පරිදි රැස්වීමට හෝ රැස්වීම්වලට අවම වශයෙන් වැඩ කරන දින විස්සකට පෙර, යෝජනා සම්මතයට ඡන්දය දීමේ කාර්යය සඳහා ණයහිමියන්ගේ හෝ යම් ණයහිමියන්ගේ රැස්වීමක් හෝ යම් පන්තිවලට අයත් ණයහිමියන්ගේ පංති රැස්වීම් පැවැත්වීමේ අදහස පිළිබඳව පස්වන උපලේඛනයට අනුකූලව ලිඛිත දැන්වීමක් යැවිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමකට යෝජකයා විසින් පහත සඳහන් ලේඛන අමුණා තිබිය යුතු ය:-

(අ) පහත දැක්වෙන කරුණු ඇතුළත් වන; එනම් -

(i) යෝජකයාගේ නම සහ ලිපිනය සහ යෝජකයා ක්‍රියා කරන කවර තත්ත්වය කින්ද යන්න ඇතුළත් වන ;

(ii) සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරන වේලාවන්හි දී විමසීම් කළ හැකි ලිපිනය සහ දුරකථන අංකය ඇතුළත් වන;

(iii) යෝජිත සමථයකට එළඹීමේ නියම සහ ඊට හේතු ඇතුළත් ප්‍රකාශයක්;

(iv) යෝජිත සමථයකට එළඹීම අනුමත කිරීමේ බලපෑම සහ විශේෂයෙන් ම එහි වාණිජමය බලපෑම පැහැදිළි කරන;

(v) යෝජිත සමථයේ දී සමාගමේ අධ්‍යක්ෂවරයකුගේ හෝ වෙනත් නිලධරයකුගේ කිසියම් වැදගත් සම්බන්ධතාවක් දක්වන (අධ්‍යක්ෂ වශයෙන් හෝ වෙනත් නිලධරයකු හෝ වෙනත් ආකාරයකින්) සහ එම සම්බන්ධතා, වෙනත් තැනැත්තන්ගේ ඒ හා සමාන සම්බන්ධතා කෙරෙහි ඇති බලපෑමට වඩා යෝජිත සමථය කෙරෙහි කොතෙක් දුරට වෙනස් වන්නේ ද යන්න දක්වන, හෝ;

(vi) යෝජිත සමථය 272 වන වගන්තියට අනුව අනුමත කරන්නේ නම්, එය සියලුම ණයහිමියන් හෝ එම පන්තියේ සියලුම ණයහිමියන් කෙරෙහි බැඳීමක් ඇති කරන බව පැහැදිලි කරන;

(vii) යෝජිත සමථය අනුමත කරනු නොලැබුවහොත් සමාගමේ විකල්ප පිළිබඳ විස්තර ඇතුළත් වන;

(viii) යෝජිත සමථය අනුමත කරනු ලැබීමෙන් පසුව එම සමථය වෙනස් කිරීම සඳහා එහි කොටසක් ලෙස යෝජිත යම් කාර්ය පටිපාටියක විස්තර ඇතුළත් වන; සහ

(ix) නියම කළ හැකි වෙනත් තොරතුරු ඇතුළත් වන; සහ

යෝජිතයාගේ ප්‍රකාශයක්;

(ආ) 270 වන වගන්තියේ (ආ) වන ඡේදයේ සඳහන් වන පරිදි, යම් පන්තියක ණය හිමියන්ට සමාගමේ ආර්ථිකය කෙරෙහි සැබෑ උනන්දුවක් නොමැති බව යන පදනම මත, ණයහිමියන්ගේ යම් පන්තියක රැස්වීමක් නොකැඳවිය යුතු අවස්ථාවක, පහත දැක්වෙන කරුණු, එනම් -

(i) සමාගමේ ණය හෝ එම පන්තියේ ණයහිමියන්ගේ වෙනත් එක් එක් පන්තිවල ණය හා සාමාජිකයන් වෙත වන වෙනත් වගකීම්වලට සාපේක්ෂව එම පන්තියේ ණයහිමියන්ගේ සාමාජිකයින් වෙත වන්නා වූ සමාගමේ ණය හෝ වෙනත් වගකීම්වල ශ්‍රේණිගත කිරීම පිළිබඳ වන විස්තර කරන;

(ii) එම පංතියේ සාමාජිකයින්ට සමාගමේ ආර්ථිකය කෙරෙහි සැබෑ ණය හිමියන්ගේ උනන්දුවක් නොමැති බවත්, ඒ අනුව එම පංතියේ රැස්වීමක් නොකැඳවන බවත් සඳහන් කරන,

යෝජිතයාගේ ප්‍රකාශයක්;

(ඇ) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති ණයහිමියන්ගේ ලැයිස්තුවේ හෝ ලැයිස්තුවල පිටපතක්.

සමථයකට එළඹීමේ බලපෑම

**272**. (1) ණයහිමියන් හෝ යම් පන්තියක ණයහිමියන් විසින් සමථයකට එළඹීම, එම ණයහිමියන් හෝ එම ණයහිමියන්ගේ පන්තිය කැඳවා පවත්වනු ලබන රැස්වීමක දී අනුමත කර ගනු ලබන අතර පස්වන උපලේඛනයට අනුකූලව, එම උපලේඛනයට අනුකූලව සම්මත වූ යෝජනා සම්මතයක් මගින්, එම සමථය අනුමත කරගනු ලබන්නේ ය.

(2) මේ කොටස අනුව සමාගමක ණයහිමියන් හෝ යම් ණයහිමියන් පන්තියක් විසින් සහ සමාගම, ඈවරකරු (සමාගම ඈවර කරන්නේ නම්) හෝ අද්මිනිස්ත්‍රාසි (සමාගම පරිපාලනයේ සිටී නම්), මෙම කොටස විසින් අනුමත කරන ලද සමථයක් මඟින්-

(අ) සමාගම; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි සියලුම ණය හිමියන් හෝ එම පන්තියේ සියලුම ණයහිමියන් හෝ,

වෙත බැඳීමක් ඇති කරන්නේ ය.

(3) 270 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු විසින් අධිකරණයට කරනු ලබන ඉල්ලීමක් මත, සමථයක් අනුමත කරනු ලැබුවහොත්, අදාළ සමාගම් සහ සමාගමේ අධ්‍යක්ෂවරුන් ඇතුළුව සමථයට ප්‍රමාණවත් අන්දමින් සබඳතාවක් තිබෙන තැනැත්තන් එක් අයකු හෝ වැඩි දෙනෙකු වගකීමෙන් නිදහස් කළ යුතු බවට අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(4) (3) වන උපවගන්තියේ කාර්ය සඳහා යම් තැනැත්තකු සමථය සමඟ ප්‍රමාණවත් ලෙස සම්බන්ධ වී තිබේ ද නැද්ද යන්න තීරණය කිරීමේ දී -

(අ) යෝජිත මුදා හැරීම සමථයේම කොටසක් ද නැද්ද යන්න;

(ආ) තැනැත්තා සමථය යටතේ දායක වන්නේ ද නැද්ද යන්න; සහ

(ඇ) මුදාහැරීමක් නොමැති අවස්ථාවක, තැනැත්තකු එසේ කළ යුතු යැයි ඉල්ලා සිටින විට එම

තැනැත්තාට සමාගමට එරෙහිව හානිපූර්ණ හිමිකම්පෑමක් තිබේද යන්න,

අධිකරණය විසින් සැලකිල්ලට ගත යුතු ය.

(5) සමථයක් යෝජනා කරන යෝජනා සම්මතයක් ණයහිමියන් පන්ති එකකට වඩා වැඩි ගණනකට ඉදිරිපත් කරන අවස්ථාවක දී, පටහැනිව යෝජනා සම්මතයේ සඳහන් කර ඇත්නම් මිස, සමථය අනුමත කිරීම යෝජනා සම්මතයට ඡන්දය දෙන වෙනත් පන්ති සියල්ල විසින් සමථය අනුමත කරනු ලැබීමේ කොන්දේසියට යටත් වන්නේ ය.

(6) යෝජකයා විසින්, නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ කාලසීමාවක් තුළ, ඡන්දය ප්‍රකාශ කිරීමේ සංඛ්‍යාත්මක ප්‍රතිඵල පිළිබඳව -

(අ) එක් එක් ණයහිමියන්;

(ආ) සමාගම;

(ඇ) යම් දේපළ භාර ගැනුම්කරුවකු;

(ඈ) යම් අද්මිනිස්ත්‍රාසිකරුවකු;

(ඉ) යම් ඇවරකරුවකු; සහ

(ඊ) රෙජිස්ට්‍රාර්වරයා,

වෙත ලිඛිත දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

(7) (6) වන උපවගන්තියට අනුව රෙජිස්ට්‍රාර්වරයාට දැන්වීමක් කිරීමෙන් අනුමත සමථයක් බලාත්මක වන්නේ ය.

**273**. (1) 272 වන වගන්තිය යටතේ අනුමත කරන ලද සමථයකට එළැඹීමක්:- සමථයක් වෙනස් කිරීම

(අ) අනුමත කරන ලද පරිදි සමථයේ ඇතුළත් කර ඇති, වෙනස් කිරීම සඳහා වන යම් කාර්යපටිපාටියකට අනුකූලව; හෝ

(ආ) ඒ සඳහා, යම් යෝජිත වෙනසක් යෝජිත සමථයකට එළඹීමක් ලෙස සලකා, අවශ්‍ය විය හැකි වෙනස් කිරීම් සහිතව මේ කොටසෙහි විධිවිධාන සලසා ඇති නියමයන්ට අනුකූලව සමථය වෙනස් කිරීම අනුමත කිරීමෙන්, .

වෙනස් කරනු ලැබිය යුතු ය.

(2) මේ කොටස මේ වගන්තියට අනුව වෙනස් කරන ලද යම් සමථයකට අදාළ විය යුතු ය.

**274.** (1) යෝජකයාගේ හෝ සමාගමේ ඉල්ලීම මත අධිකරණය විසින් -

සමථයන්ට අදාළව අධිකරණය සතු බලතල

(අ) මේ කොටස යටතේ කාර්යපටිපාටිමය නියමයක් සම්බන්ධයෙන් හෝ එවැනි නියමයක් අත්හැරීම හෝ වෙනස් කිරීම සාධාරණ යයි අධිකරණය සෑහීමකට පත් වන විට එසේ කිරීම සම්බන්ධයෙන් විධානයක් කරනු ලැබිය හැකිය; හෝ

(ආ) යෝජිත සමථයක් අනුමත කිරීම සඳහා ණයහිමියන්ගෙන් ප්‍රමාණවත් සහයෝගයක් ඇති බවට අධිකරණය සෑහීමකට පත් වන අවස්ථාවක, අධිකරණය විසින් නියෝගයක් කරමින් ඒ නියෝගයේ සඳහන් නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ, යෝජිත සමථය පිළිබඳ දැන්වීමක් ලබා දුන් දින සිට ආරම්භ වී ඡන්ද ප්‍රතිඵලය පිළිබඳ දැන්වීම ලබා දුන් දිනයට පසු එළඹෙන වැඩ කරන දින විස්සකට වැඩි නොවන කාලයක දී -

අධිකරණයේ අවසරය ඇතිව මිස -

(i) සමාගමට අයත් ණයකට සම්බන්ධ නඩු කටයුතු නැවැත්විය යුතු බවට හෝ තහනම් කළ යුතු බවට; සහ

(ii) පිළිබැඳීමක් බලාත්මක කිරීම හෝ දේපළක සන්තකය ලබා ගැනීම හෝ දේපළ අන්‍යාකාරයෙන් ආපසු ලබා ගැනීම ඇතුළු සමාගමට අයත් ණයක් අය කර ගැනීම සඳහා ණයහිමියකු විසින් වෙනත් යම් පියවර ගැනීම වළක්වාලමින්,

අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

(2) අධිකරණය සෑහීමකට පත් වන අවස්ථාවක, සමථයකට එළඹීම සඳහා ඡන්දය දීමට හිමිකම් ඇති සමාගමක ණයහිමියකු විසින් -

(අ) එකී ණය හිමියාට රැස්වීම පිළිබඳ ප්‍රමාණවත් දැනුම්දීමක් නොමැති වීම හෝ ඒ ණය හිමියා සම්බන්ධයෙන් 271 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන පිළිසැදීමට අපොහොසත්ව ඇති බවට;

(ආ) සමථයේ අනුමතය ලබා ගැනීමේ දී වෙනත් යම් සැලකිය යුතු තරමේ අක්‍රමිකතාවක් සිදු වූ බවට; හෝ

(ඇ) සමථයට එරෙහිව ඡන්දය දුන් ණයහිමියකු සම්බන්ධයෙන් වන විට, සමථය, එම ණයහිමියාට හෝ එම ණයහිමියා අයත් වන ණයහිමියන්ගේ පන්තියට අසාධාරණ ලෙස අගති සහිත වන බවට,

කරනු ලබන ඉල්ලීමක් මත අධිකරණය විසින් එවැනි ණයහිමියකු සමථයෙන් බැඳී නොසිටින බවට ආඥාවක් හෝ අවශ්‍ය පරිදි වෙනත් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීමක් නියම කරනු ලැබිය හැකි කාලසීමාවක් තුළ ඉදිරිපත් කළ යුතු ය.

**275.** අධිකරණය විසින් අන්‍යාකාරයකට ආඥා කරන්නේ නම් මිස, යෝජිත සමථයට ඡන්දය දීමේ කාර්ය සඳහා ණයහිමියන්ගේ රැස්වීමක් සංවිධානය කිරීම සහ පැවැත්වීම සඳහා දරන ලද වියදම් - සමථයේ පිරිවැය

(අ) සමාගම විසින් දැරිය යුතු ය;

(ආ) ඇවරකරු විසින් දරනු ලැබුවහොත්, එය ඇවර කිරීමේ වියදමක් ලෙස සැලකිය යුතු ය;

(ඇ) අද්මිනිස්ත්‍රාසිකරු විසින් දරනු ලැබුවහොත්, එය අද්මිනිස්ත්‍රාසිකරණයේ වියදමක් ලෙස සලකනු ලැබිය යුතු ය; හෝ

(ඈ) වෙනත් කිසියම් තැනැත්තකු විසින් දරනු ලැබුවහොත්, එම තැනැත්තාට සමාගමෙන් ගෙවිය යුතු ණයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඇවර කිරීමක දී, හතරවන උපලේඛනයේ දක්වා ඇති ප්‍රමුඛතා අනුපිළිවෙළට අනුව එය ගෙවනු ලැබි ය යුතුය.

## XI වන කොටස

### ක්ෂුද්‍ර කුඩා මධ්‍යම පරිමාණ ව්‍යවසාය (එම්.එස්.එම්.ඊ) සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ

එම්.එස්.එම්.ඊ සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ

**276.** (1) මේ කොටස මගින් එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්යපටිපාටියක් ස්ථාපනය කරනු ලබන, ඒ යටතේ කුඩා සමාගමකට පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකුගේ හෝ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ සහාය ඇතිව, සමාගමේ නොගෙවූ බැරකම් ගෙවීම සඳහා, සමාගමේ ණයහිමියන් සමඟ ආපසු මුදල් ගෙවීමේ නම්‍යශීලී වැඩපිළිවෙළක් පිළිබඳව සාකච්ඡා කරනු ලැබිය හැකි ය.

(2) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්යපටිපාටිය මගින් ඈවර කිරීම සහ අද්මිනිස්ත්‍රාසිකරණයේ අනවශ්‍යය වියදම් සහිත සංකීර්ණත්වය මඟහරිමින් කුඩා සමාගම්වලට ආර්ථික පුනරුත්ථාපනය ලබා ගැනීමට හැකියාව සැලසීම අරමුණු කරන්නේ ය.

(3) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාපටිපාටිය මගින් සමාගම් සහ ණයහිමියන් අතර සාකච්ඡා මාර්ගයෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් එම්.එස්.එම්.ඊ. සමාගම් පුනරුත්ථාපනය කිරීම සහ මුදාගැනීම හැකියාව සැලසීම අරමුණු කරන්නේ ය.

එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: සාමාන්‍ය කොන්දේසි

**277**. (1) මේ කොටසේ කාර්ය සඳහා, "එම්.එස්.එම්.ඊ. ණයකරු" යන්නෙන්, 282 වන වගන්තිය යටතේ නිල දේපළ භාරකරුට යෝජනාවක් ඉදිරිපත් කරන අවස්ථාවේ සමස්තය රුපියල් මිලියන පනහක් නොඉක්මවන සුරක්ෂිත හා අනාරක්ෂිත ණය ඇති සමාගමක් විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධානවලට යටත්ව, 278 වන වගන්තියේ දක්වා ඇති යෝග්‍යතා නිර්ණායක සපුරාලන එම්.එස්.එම්.ඊ. ණයකරුවකුට, එම්.එස්.එම්.ඊ. ණයකරුගේ ණය ගෙවීම් සම්ප්‍රේෂණය කිරීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම් සම්බන්ධයෙන් එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා ණයහිමියන්ට යෝජනාවක් කරනු ලැබිය හැකි ය.

(3) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා වූ යෝජනාවක් එම්.එස්.එම්.ඊ. ණයකරු විසින් හෝ එම්.එස්.එම්.ඊ. ණයකරු වෙනුවෙන් පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු විසින් මෙම කොටසෙහි විධිවිධානවලට සහ නියම කරනු ලැබිය හැකි යම් කාර්යපටිපාටියකට අනුකූලව සකස් කිරීම සහ ඉදිරිපත් කළ හැකි ය.

(4) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකුට, එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් බලාත්මක වූ පසු, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස ක්‍රියා කළ හැකි ය.

(5) මෙම කොටස යටතේ පුද්ගලික වස්තුභංගත්ව යෝජකයින්ගේ සහ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවන්ගේ කර්තව්‍ය නියාමනය කරමින් අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(6) එම්.එස්.එම්.ඊ. සමාගම් දෙකක් හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් වන එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළවල් දෙකක් හෝ වැඩි ගණනක් වන යෝජනා සම්බන්ධයෙන් පහත දැක්වෙන අවස්ථාවල දී එක් යෝජනාවක් ලෙසට කරනු ලැබිය හැකි ය:-

(අ) ඒවාට සම්බන්ධ වී ඇති එම්.එස්.එම්.ඊ. ණයකරුවන්ගේ මූල්‍ය සම්බන්ධතාව නිසා එම යෝජනා එකට සලකා බැලිය හැකි බවට පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා සලකනු ලබන අවස්ථාවක දී,; සහ

(ආ) වැඩපිළිවෙළවල් එක්ව පරිපාලනය කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳව -

(i) ඒකාබද්ධ හා ඒකපුද්ගල වත්කම් සම්බන්ධයෙන් සහ සැලකීම සහ ඒකාබද්ධ හා ඒක පුද්ගල ණය සම්බන්ධයෙන් සැලකිය යුතු ආකාරය;

(ii) එක් එක් වැඩපිළිවෙළක අනුමතය වෙනත් වැඩපිළිවෙළක අනුමතය මත සම්භාව්‍ය විය යුතු ද යන්න;

(iii) එක් වැඩපිළිවෙළක් අසාර්ථකවීමේ හෝ කලින් අවසන් කිරීමේ බලපෑම වෙනත් වැඩපිළිවෙළකට බලපාන්නේ ද යන්න; සහ

(iv) එම්.එස්.එම්.ඊ. ණයකරුවන් දෙදෙනකු හෝ වැඩි ගණනක් විසින් සිදු කරන ලද ඒකාබද්ධ ගෙවීම් ණයහිමියන් අතර බෙදා හැරිය යුතු ආකාරය,

විස්තර යෝජනාවේ නියම මගින් නිශ්චිතව දක්වනු ලබන අවස්ථාවක දී,

(7) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් මගින් පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකුට-

(අ) එම්.එස්.එම්.ඊ. ණයකරු වෙනුවෙන් හෝ ණයකරුගේ නමින් එම්.එස්.එම්.ඊ. ණයකරුගේ ව්‍යාපාරය කරගෙන යාම හෝ වෙළඳාම් කිරීම;

(ආ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ වත්කම් විකුණා මුදල් ලබා ගැනීම; හෝ

(ඇ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ යම් අරමුදල් එකතු කිරීම, පරිපාලනය කිරීම හෝ බැහැර කිරීම,

සඳහා බලය පැවරීම හෝ නියම කිරීම කළ හැකිය.

එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: යෝග්‍යතා නිර්ණායක

**278.** එම්.එස්.එම්.ඊ. ණයකරු, පහත සඳහන් සියලු නිර්ණායක සපුරාලන විට එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට ඇතුළත් වීමට සුදුසුකම් ලැබිය යුතු ය -

(අ) 409 වන වගන්තියට අනුව, සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලියේ දී ගෙවිය යුතු ණය සමහරක් හෝ සම්පූර්ණයෙන් ගෙවීම සඳහා එම්.එස්.එම්.ඊ. ණයකරුවකුට නොහැකි විට හෝ නොහැකි වීමට ඉඩ තිබීම; සහ

(ආ) එම්.එස්.එම්.ඊ. ණයකරු දැනට ඇවර කිරීමේ ක්‍රියාවලියකට භාජන නොවී සිටීම.

එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: අනිවාර්ය ප්‍රතිපාදනය

**279.** (1) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් මගින් 294 වන වගන්තියට අනුකූලව, වැඩපිළිවෙළ සම්බන්ධයෙන් පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු ලෙස ක්‍රියා කිරීමට තැනැත්තකුට, සමාගමකට හෝ ව්‍යාපාර ආයතනයකට අවසර දිය යුතුය.

(2) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළත් වෙනත් ඕනෑම ණයක් ගෙවීමට පෙර, වැඩපිළිවෙළට අදාළව නිසි පරිදි දරනු ලබන පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාගේ සහ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුගේ ගාස්තු සහ වියදම් ගෙවිය යුතු ය.

(3) පහත දැක්වෙන එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් මගින් වරණීය හිමිකම්පෑමක් සඳහා -

(අ) අනුපිළිවෙළට වූ යම් වරණීය හිමිකම්පෑමක් පිටුපසින් ඇති වෙනත් වරණීය හිමිකම්පෑමක් සඳහා මුදල් ගෙවීම; හෝ

(ආ) වරණීය හිමිකම්පෑමක් නොවන හිමිකම්පෑමක් සඳහා මුදල් ගෙවීම,

සම්බන්ධයෙන් වන හිමිකම්පෑම්වලට ප්‍රමුඛත්වය ලබා දීම සඳහා හැර, සහ එම වරණීය හිමිකම්පෑමක් කරනු ලබන තැනැත්තා විසින් එම හිමිකම්පෑමකට වෙනත් ආකාරයකට කටයුතු කිරීමට ලිඛිතව කැමැත්ත ලබා දී ඇත්නම් මිස, මුදල් ගෙවනු නොලැබිය යුතු ය.

(4) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් මගින් පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින් එම්.එස්.එම්.ඊ. ණයකරුගේ අවස්ථානුගත කරුණු මාස හයකට නොවැඩි කාල පරාසයකින් සමාලෝචනය කිරීම සඳහා විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: සුරක්ෂිත ණයහිමියන් සහ දේපළ හිමිකම්

**280.** (1) මේ කොටසෙහි විධිවිධාන යටතේ හැර, එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළකට එකඟ වීමට පාර්ශ්වයන්ට ඇති හැකියාව සීමා නොකරමින්, අනාරක්ෂිත හා සුරක්ෂිත ණය ගෙවීම, ගෙවා නිම කිරීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම හෝ කුලී සින්නක්කර ගිවිසුම්වල ප්‍රතිපාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් නියම සඳහා ඇතුළත් විය හැකි ය.

(2) 284 වන වගන්තිය යටතේ එම්.එස්.එම්.ඊ. ණයකරුගේ යෝජනාව සඳහා ණයහිමියන්ගේ අනුමතය පිළිබඳ රීතිවලට යටත්ව, එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළකට, සුරැකුමකට හෝ කුලී සින්නක්කර ගිවිසුමකට යටත් වන යම් දේපළක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට විධිවිධාන සලස්වන්නා වූ -

(අ) දේපළ විකිණීම හෝ බැහැර කිරීම;

(ආ) එම්.එස්.එම්.ඊ.ණයකරුට දේපළ භාර දීම; හෝ

(ඇ) සුරක්ෂිත ණයහිමියා විසින් හෝ දේපළට අදාළ කුලී සින්නක්කර මිලදී ගැනීමේ ගිවිසුමේ ප්‍රතිපාර්ශ්වය විසින් දේපළ රඳවා තබා ගැනීම,

යන කරුණු ඇතුළත් නියම ඇතුළත් විය හැකිය.

(3) 284 වන වගන්තිය යටතේ වන එම්.එස්.එම්.ඊ. ණයකරුගේ යෝජනාවක් සඳහා ණයහිමියන්ගේ අනුමැතිය පිළිබඳ රීතිවලට යටත්ව, එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළකට-

(අ) සුරක්ෂිත ණයහිමියකුගේ හෝ කුලී සින්නක්කර මිලදී ගැනීමේ ගිවිසුමේ ප්‍රතිපාර්ශ්වයක අයිතිවාසිකම් වෙනස් කිරීම පිළිබඳ වන; හෝ,

(ආ) වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන අතරතුර සුරක්ෂිත ණයහිමියකු හෝ කුලී සින්නක්කර ගිවිසුම් ප්‍රතිපාර්ශ්වයක් විසින් එහි සුරැකුම හෝ දේපළ තහනමට ගැනීම හෝ මුදල් කර ගැනීම නොකරන බවට වන විධිවිධාන සලස්වන,

නියම ඇතුළත් විය හැකි ය.

(4) 284 වන වගන්තිය යටතේ වන එම්.එස්.එම්.ඊ. ණයකරුගේ යෝජනාවක් සඳහා ණයහිමියන්ගේ අනුමතය පිළිබඳ රීතිවලට යටත්ව, එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළකට සුරක්ෂිත ණයක් හෝ කුලී සින්නක්කර ගිවිසුමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු මුල් මුදල අඩු කිරීම සඳහා වන නියම, එසේ අඩු කරනු ලබන මුල් මුදලේ ප්‍රමාණය සුරැකුම්පතේ වටිනාකමට වඩා අඩු නොවන්නේ නම් පමණක්, ඇතුළත් විය හැකිය.

(5) 284 වන වගන්තිය යටතේ වන එම්.එස්.එම්.ඊ. ණයකරුගේ යෝජනාවක් සඳහා ණයහිමියන්ගේ අනුමතය පිළිබඳ රීතිවලට යටත්ව, එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළකට -

(අ) යම් පැහැර හැරීමක් සම්බන්ධව සාධාරණ කාලයක් තුළ ප්‍රතිකර්ම යෙදීම සඳහා; සහ

(ආ) වැඩපිළිවෙළ සම්පූර්ණ කිරීමෙන් පසුවද අවසන් ගෙවීමක් සඳහා යම් සුරක්ෂිත ණය ගෙවිය යුතු වන්නා වූ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන අතරතුර දී ගෙවීම් සිදු කරගෙන යාම සඳහා,

විධිවිධාන සලස්වන නියම ඇතුළත් විය හැකි ය.

(6) 284 වන වගන්තිය යටතේ වන එම්.එස්.එම්.ඊ. ණයකරුගේ යෝජනාවක් සඳහා ණයහිමියන්ගේ අනුමතය පිළිබඳ රීතිවලට යටත්ව, එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළකට -

(අ) යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් සාධාරණ කාලයක් තුළ ප්‍රතිකර්ම යෙදීම සඳහා; සහ

(ආ) එම්.එස්.එම්.ඊ. ණයකරු අදාළ ණයහිමියා සමඟ ඇතුළත් වී ඇති කුලී නිවැසිභාවය පිළිබඳ ගිවිසුමක් යටතේ වැඩපිළිවෙළ ක්‍රියාත්මකව පවතින අතරතුර දී කුලිය ගෙවීම සිදුකරගෙන යාම සඳහා,

විධිවිධාන සලස්වනු ලබන නියම ඇතුළත් විය හැකි ය.

එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: පුද්ගලික වස්තුභංගත්ව යෝජනාකරුවකු පත් කිරීම

**281.** (1) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා යෝජනාවක් කිරීමට එම්.එස්.එම්.ඊ. ණයකරු අදහස් කරන අවස්ථාවක, 293 වන වගන්තිය ප්‍රකාරව පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු ලෙස ක්‍රියා කිරීම සඳහා එය විසින් තැනැත්තකු, සමාගමක් හෝ ආයතනයක් පත් කරනු ලැබිය යුතු ය.

(2) එම්.එස්.එම්.ඊ. ණයකරු සහ පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා එසේ එකඟ වන්නේනම්, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා වශයෙන් ක්‍රියා කිරීමට පත් කරන ලද තැනැත්තා සමාගම හෝ ආයතනය යෝජිත එම්.එස්.එම්.ඊ. සමාගම් ණය

ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු ලෙස ද ක්‍රියා කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ විට පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින් -

(අ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා වූ යෝජනාව සම්බන්ධයෙන් පුද්ගලික වස්තුභංගත්ව යෝජනාකරුගේ භූමිකාව ඉටු කිරීමට පුද්ගලික වස්තුභංගත්ව යෝජනාකරු කැමති බව, එම්.එස්.එම්.ඊ. ණයකරුට ලිඛිතව තහවුරු කළ යුතුය;

(ආ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වීමේ දී පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු ලෙස ක්‍රියා කිරීමට පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා එකඟ වන්නේ නම්, එම්.එස්.එම්.ඊ. ණයකරු වෙත ලිඛිතව තම කැමැත්ත තහවුරු කළ යුතු ය; සහ

(ඇ) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු සහ අදාළ වන අවස්ථාවල දී පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස ක්‍රියා කිරීම සඳහා පත් කරනු ලැබූ බව නිල දේපළ භාර ගැනුම්කරුට දැනුම් දිය යුතු ය.

(4) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමේ දී එම්.එස්.එම්.ඊ. ණයකරුට සහාය වීමට එකඟ වන පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු විසින් -

(අ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ මූල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් තක්සේරු කිරීමට හැකි වන පරිදි එම්.එස්.එම්.ඊ. ණයකරුගේ දේපළ සහ මූල්‍ය කටයුතු පිළිබඳව යම් සාධාරණ විමසීම් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක්, මේ කොටස මගින් නිශ්චිතව දක්වා ඇති ආකාරයට සහ නියම කරනු ලැබිය හැකි ආකෘති පත්‍රයෙන් සකස් කරනු ලැබිය යුතු ය.

(5) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සඳහා වූ යෝජනාවක් පිළියෙළ කිරීමට සහාය වීමට පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකුට ඉඩ සැලසීමේ කාර්ය සඳහා, එම්.එස්.එම්.ඊ. සමාගම් ණයකරු විසින් පුද්ගලික වස්තුභංගත්ව යෝජනාකරු වෙත, එම්.එස්.එම්.ඊ. හි අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනුම අනුව, එම්.එස්.එම්.ඊ. ණයකරුගේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සම්පූර්ණයෙන් හෙළිදරව් කරන ප්‍රකාශයක් 33 වන වගන්තියට අනුකූලව ඉදිරිපත් කළ යුතු ය.

(6) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය පුනරුත්ථාපන නියෝගයක් සඳහා යෝජනාවක් සකස් කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී එම්.එස්.එම්.ඊ. ණයකරුට සහායවීමේ දී පුද්ගලික වස්තුභංගත්ව යෝජකයන්ගේ කර්තව්‍ය සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති, ප්‍රමිති, ප්‍රායෝගික උපදෙස්, චර්යා සංග්‍රහ හෝ මාර්ගෝපදේශ සකස් කරනු ලැබිය හැකි ය.

එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: එම්.එස්.එම්.ඊ. ණයකරුගේ යෝජනාව සකස් කිරීම

**282.** (1) 278 වන වගන්තියේ නිර්ණායක සපුරාලන එම්.එස්.එම්.ඊ. ණයකරු විසින්, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකුගේ සහාය ඇතිව, එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා යෝජනාවක් සකස් කරනු ලැබිය හැකි ය.

(2) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වූ යෝජනාවක ආකෘතිය නියම කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

(3) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වන යෝජනාවක් -

(අ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ බලයලත් නියෝජිතයකු විසින් අත්සන් කළ යුතු ය;

(ආ) (i) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු ලෙස ක්‍රියා කරන තැනැත්තකු, සමාගමක් හෝ ආයතනයක් විසින්; සහ

(ii) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ

ක්‍රියාත්මක වන විට පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස ක්‍රියා කිරීමට කැමති තැනැත්තකු, සමාගමක් හෝ ආයතනයක් විසින්.

බලයලත් එම නියෝජිත තැනැත්තාගේ සමාගමේ හෝ ආයතනයේ නම යෝජනාව මත පිටසන් කළ යුතු ය.

(4) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වන යෝජනාවකට, පහත සඳහන් කරුණු තහවුරු කරමින්, පුද්ගලික වස්තුභංගත්ව යෝජනාකරුගේ ප්‍රකාශයක් ඇතුළත් විය යුතු ය:-

(අ) එම්.එස්.එම්.ඊ. ණයකරු 278 වන වගන්තියේ සුදුසුකම් සපුරා ඇති බව;

(ආ) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාගේ උපරිම දැනුමට අනුව, එම්.එස්.එම්.ඊ. ණයකරුගේ මූල්‍ය කටයුතු ප්‍රකාශයේ අඩංගු තොරතුරු සම්පූර්ණ සහ නිවැරදි වන බව;

(ඇ) යෝජනාව අනුමත කර ක්‍රියාත්මක කිරීමට සාධාරණ අපේක්ෂාවක් ඇති බව; සහ

(ඈ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ යෙදවිය හැකි දේපළ හා ආදායමෙන් ණයහිමියන්ට දායක මුදල් ගෙවීමට ඉඩ සලසමින් එම්.එස්.එම්.ඊ. ණයකරුගේ ආර්ථික පුනරුත්ථාපනය සඳහා පහසුකම් සැලසීමේ සාධාරණ ක්‍රමෝපායක් මෙම යෝජනාව මගින් ඉදිරිපත් කර ඇති බව.

(5) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වන යෝජනාවට, නියම කරනු ලැබිය හැකි අවශ්‍යතාවලට අමතරව, එම්.එස්.එම්.ඊ. ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශයක් ද ඇතුළත් විය යුතු ය.

(6) (5) වන උපවගන්තිය ප්‍රකාරව අවශ්‍ය වන්නා වූ එම්.එස්. එම්.ඊ. ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශය, 33 වන වගන්තියට අනුකූල විය යුතු ය.

(7) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වන යෝජනාවට -

(අ) එම්.එස්.එම්.ඊ. ණයකරු 278 වන වගන්තියේ නිශ්චිත ව දක්වා ඇති සුදුසුකම් නිර්ණායක සපුරාලන්නේ ද යන්න පිළිබඳව තීරණය කිරීම සඳහා අවශ්‍ය වන්නේ යැයි නිල දේපළ භාරගැනුම්කරු සලකනු ලබන කරුණු නිල දේපළ භාරකරු විසින් විමසා සිටීම සඳහා;

(ආ) නිල දේපළ භාරගැනුම්කරුට එවැනි විමසීම් සඳහා සතුටුදායක පිළිතුරු ලැබෙන තෙක් එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ නිල දේපළ භාරගැනුම්කරු විසින් සලකා බැලීම කල් දැමීම සඳහා; සහ

(ඇ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය පුනරුත්ථාපන වැඩපිළිවෙළක් සෑදීම සහ සලකා බැලීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට එම්.එස්.එම්.ඊ. ණයකරුගේ දත්ත නිල දේපළ භාරගැනුම්කරු විසින් ණයහිමියන්ට සහ අනෙකුත් තෙවන පාර්ශ්වයන්ට හෙළිදරව් කිරීම සඳහා; සහ

(ඇ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය පුනරුත්ථාපන වැඩපිළිවෙළ සෑදීම සහ සලකා බැලීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණයට, එම්.එස්.එම්.ඊ. ණයකරුගේ දත්ත, ණයහිමියන්, රාජ්‍ය ආයතන හෝ වෙනත් අදාළ තෙවන පාර්ශ්වයන් විසින් නිල දේපළ භාරගැනුම්කරුට හෙළිදරව් කිරීම සඳහා,

එම්.එස්.එම්.ඊ. ණයකරුගේ කැමැත්ත පිළිබඳ ප්‍රකාශයක් ද ඇතුළත් විය යුතු ය.

(8) මේ කොටසේ අවශ්‍යතා සපුරාලන යෝජනාවක් පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාගේ සහාය ඇතිව එම්.එස්.එම්.ඊ. ණයකරු විසින් සකස් කිරීම මත, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින් නිල දේපළ භාරගැනුම්කරු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: සාකච්ඡා රැස්වීම

**283.** (1) 282 වන වගන්තිය යටතේ නිල දේපළ භාර ගැනුම්කරු වෙත යෝජනාව ඉදිරිපත් කිරීමෙන් පසු, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින් එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වන යෝජනාව අනුමත කරන්නේ ද යන්න පිළිබඳව එම්.එස්.එම්.ඊ. ණයකරුගේ ණයහිමියන්ගෙන් තීරණයක් ඉල්ලා සිටිනු ලැබිය යුතු ය.

(2) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ ණයහිමියන් විසින් යෝජනාව අනුමත කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ගනු ලබන තීරණය එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළේ සාකච්ඡා රැස්වීමක් මගින් ගත යුතු ය.

(3) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින්, පෞද්ගලිකව හෝ ඩිජිටල් සන්නිවේදන මාධ්‍යයන් හරහා පැවැත්විය හැකි සාකච්ඡා රැස්වීම සඳහා දිනය සහ ස්ථානය නියම කිරීමේ දී ණයහිමියන්ගේ සහ එම්.එස්.එම්.ඊ. ණයකරුගේ පහසුව සලකා බැලිය යුතු ය.

(4) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින් සෑම දන්නා ණයහිමියකුට ම:

(අ) සාකච්ඡා රැස්වීම පිළිබඳ දැන්වීම;

(ආ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වූ යෝජනාවේ පිටපතක්;

(ඇ) ණයහිමියාගේ හිමිකම්පෑමේ ආකෘති පත්‍රය;

(ඈ) තැපැල් ඡන්ද ආකෘති පත්‍රය සහ විද්‍යුත් තැපැල් ඡන්ද ආකෘතියක්;

(ඉ) යෝජිත එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අනුමත කරන්නේ ද, ප්‍රතික්ෂේප කරන්නේ ද යන්න තීරණය කරන ලෙසට එක් එක් ණයහිමියාගෙන් ඉල්ලා සිටින ප්‍රකාශයක්;

(ඊ) ප්‍රකාශය යැවීමෙන් අවම වශයෙන් දින විසිඑකකට පසුව වන සාකච්ඡා, රැස්වීම පැවැත්වෙන දිනය පිළිබඳ ප්‍රකාශයක්; සහ

(උ) සාකච්ඡා රැස්වීමට නොපැමිණෙන හෝ තැපැල් ඡන්දයක් මඟින් හෝ විද්‍යුත් තැපෑලෙන් ඡන්දය

ප්‍රකාශ නොකරන ණයහිමියකු, එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වූ යෝජනාව පිළිගත්තා සේ සලකනු ලබන බවට වන ප්‍රකාශයක්.

යැවිය යුතු ය.

(5) නියම කරනු ලැබිය හැකි අවශ්‍යතා සපුරාලන ආකාරයට ණයහිමියාගේ හිමිකම් ආකෘති පත්‍රයක් ඉදිරිපත් කර ඇති ණයහිමියකු විසින් යෝජනාවට

(අ) සාකච්ඡා රැස්වීමේ දී හෝ ඊට පෙර පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා වෙත ලැබෙන පරිදි තැපැල් ඡන්දයක් යැවීම මගින්;හෝ

(ආ) සාකච්ඡා රැස්වීමේ දී හෝ ඊට පෙර පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා වෙත ලැබෙන පරිදි විද්‍යුත් තැපැල් ඡන්දයක් යැවීම මගින්.

ඡන්දය ලබා දිය හැකි ය.

(6) නියම කරනු ලැබිය හැකි පරිදි රැස්වීමට පෙර හෝ රැස්වීමේ දී කැමැත්ත හෝ අකමැත්ත පළ කරන තැපැල් ඡන්දයක් හෝ වෙනත් සන්නිවේදනයක් පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාට ලැබෙන්නේ නම්, එම ඡන්දය හෝ සන්නිවේදනය මගින් ණයහිමියා රැස්වීමට පැමිණ ඡන්දය ප්‍රකාශ කර ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ණයහිමියා විසින් අනුමත කිරීම

**284.** (1) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින් එම්. එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට පහසුකම් සැලසිය යුතු අතර එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(2) මේ වගන්තියේ සඳහන් රැස්වීමක් පැවැත්වීම සම්බන්ධයෙන් වන විට, මේ කොටසෙහි විධිවිධානවලට සහ නියම කළ හැකි යම් රීතිවලට යටත්ව, පහත සඳහන් කරුණු සඳහා පස්වන උපලේඛනය අදාළ විය යුතු ය:-

(අ) ප්‍රතියුක්ත ලිපිය;
(ආ) සභාපතිවරයා;
(ඇ) ගණපූරණය;
(ඈ) කල් දැමූ රැස්වීම්;
(ඉ) විවිධ කරුණු.

(3) සාකච්ඡා රැස්වීමේ දී, ණයහිමියන් විසින් -

(අ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ මූල්‍ය තත්ත්වයන් පැහැදිලි කිරීම සඳහා සාධාරණ වන පරිදි එම්.එස්.එම්.ඊ. ණයකරුගේ නිලධරයන්ගේ සාක්ෂි විමසීම පැවැත්වීම;

(ආ) වටිනාකමකින් බහුතරයක් වන ණයහිමියන් විසින් යෝජනාවක් සම්මත කරගනු ලැබීමෙන් එම්.එස්.එම්.ඊ. ණයකරුගේ කටයුතු තවදුරටත් විමර්ශනය කිරීමට ඉඩ සැලසීම සඳහා උපරිම වැඩ කරන දින දහයක කාලයකට රැස්වීම කල් තැබීම;

(ඇ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි අවසාන නියමයන් දක්වා ඇති යෝජනාව 282 වගන්තියේ (4) වන, (5) වන හෝ (6) වන උපවගන්තියට අනුව යෝජනා සම්මතයක් සම්මත කිරීමෙන් පිළිගැනීම;

(ඈ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ කැමැත්ත ඇතිව, එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි අවසාන නියමයන් දක්වා ඇති යෝජනාව 282 වගන්තියේ (4) වන, (5) වන හෝ (6) වන උපවගන්තියට අනුව යෝජනා සම්මතයක් සම්මත කිරීමෙන් සුළු වශයෙන් වෙනස් කිරීම හෝ වෙනස් කිරීම;

(ඉ) එම්.එස්.එම්.ඊ.සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා හෝ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු ලෙස ක්‍රියා කිරීමට කැමති වෙනත් තැනැත්තකු, සමාගමක් හෝ ආයතනයක් පත් කිරීම;

(ඊ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ කැමැත්ත ඇතිව, ණයකරුගේ කටයුතු අධීක්ෂණය සම්බන්ධයෙන් එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට ඔවුන්ට සුදුසු යයි හැඟෙන පරිදි යම් නියම ඇතුළත් කිරීම.

(4) (5) වන සහ (6) වන උපවගන්තිවලට යටත්ව, යෝජනාවට පක්ෂව ඡන්දය දෙන ණයහිමියන්ගේ හිමිකම්, ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතිය ඇති සියලුම ණයහිමියන්ගේ හිමිකම්වලින් තුනෙන් දෙකක වටිනාකමින් බහුතරයක් නියෝජනය කරන විට දී යෝජනාවක්, අනුමත විය යුතු ය.

(5) 280 වන වගන්තියේ හෝ නිශ්චිතව දක්වා ඇති ආකාරයට හෝ අන්‍යාකාරයකින් සුරක්ෂිත ණයහිමියන්ගේ අයිතිවාසිකම් වෙනස් කරනු ලබන හෝ සීමා කරනු ලබන නියම යෝජනාවට ඇතුළත් වන විට, යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන සුරක්ෂිත ණයහිමියන්ගේ හිමිකම්, ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතිය ඇති සුරක්ෂිත ණය හිමියන්ගේ හිමිකම්වලින් තුනෙන් දෙකකට වඩා නියෝජනය කරන විට, යෝජනාව අනුමත වන්නේ ය.

(6) 280 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට හෝ අන්‍යාකාරයට කුලී සින්නක්කර මිල දී ගැනීමේ ගිවිසුම්, මූල්‍ය කල්බදු හෝ ඒ හා සමාන යම් ගිවිසුමක් යටතේ වන ණයහිමියන්ගේ අයිතිවාසිකම් වෙනස් කරනු ලබන හෝ සීමා කරනු ලබන නියමයන් යෝජනාවට ඇතුළත් වන විට, යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරනු ලබන ණයහිමියන්ගේ හිමිකම්, ඡන්දය ප්‍රකාශය කිරීමට අයිතිය ඇති ණයහිමියන්ගේ හිමිකම්වල වටිනාකමෙන් තුනෙන් දෙකකට වඩා වැඩි ප්‍රමාණයක් නියෝජනය කරන විට, යෝජනාව අනුමත වේ.

(7) සුරක්ෂිත ණයහිමියකුගේ හෝ කුලී සින්නක්කර ගිවිසුම් ප්‍රතිපාර්ශ්වයකගේ අයිතිවාසිකම් වෙනස් කරනු ලබන හෝ සීමා කරනු ලබන නියම යෝජනාවට ඇතුළත් නොවන්නේ නම්, එවැනි සුරක්ෂිත ණයහිමියා හෝ කුලී සින්නක්කර ගිවිසුම් ප්‍රති පාර්ශ්වකරු යෝජනාවට ඡන්දය නොදිය සිටිය හැකි ය:

කෙසේ වෙතත්, ණයකරු (89 වන අධිකාරිය වූ) උකස් පනතේ 47A වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කර ඇත්නම්, එවැනි සුරක්ෂිත ණයහිමියකුට ණයෙහි සුරක්ෂිත නොවන

කොටසේ ප්‍රමාණයට සුරක්ෂිත නොවන ණයහිමියකු ලෙස රැස්වීමට සහභාගී විය හැකි ය.

(8) (අ) සාකච්ඡා රැස්වීමට සහභාගී නොවන;

(ආ) තැපැල් ඡන්දයක් ප්‍රකාශ නොකරන; හෝ

(ඇ) විද්‍යුත් තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ නොකරන,

ණයහිමියකු එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වූ යෝජනාවට පක්ෂව ඡන්දය දුන් ලෙසට සලකනු ලැබිය යුතු ය.

(9) කිසිදු ණයහිමියකු ඡන්දය නොදෙන විට, යෝජිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ මෙම වගන්තිය යටතේ අනුමත වූ ලෙසට සලකනු ලැබිය යුතු ය.

(10) සැකදුරු කිරීම සඳහා, මේ කොටසෙහි විධිවිධානවලට අනුකූලව ලිඛිත දැනුම්දීමක් ලබා දී ඇති -

(අ) 283 වන වගන්තිය යටතේ ණයහිමියාගේ හිමිකම් ආකෘතිය ඉදිරිපත් නොකරන;

(ආ) මේ වගන්තිය යටතේ සාකච්ඡා රැස්වීමට සහභාගී නොවන;

(ඇ) මේ වගන්තිය යටතේ තැපැල් ඡන්දය ප්‍රකාශ නොකරන; හෝ

(ඈ) මේ වගන්තිය යටතේ විද්‍යුත් තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ නොකරන,

ණයහිමියකුට 288 වන වගන්තිය යටතේ වැඩපිළිවෙළ බලාත්මක වීම කරන අධිකරණ ආඥාවකට විරෝධය පළ කරන ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට හිමිකමක් නොමැති විය යුතුය .

(11) සාකච්ඡා රැස්වීමක දී ණයහිමියන් විසින් යෝජනාව පිළිනොගන්නා අවස්ථාවක -

(අ) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින් "ණයහිමියන් විසින් පිළිනොගන්නා ලදී" යයි යෝජනාව පිටසන් කර එය නිල දේපළ භාර ගැනුම්කරු වෙත ආපසු යැවිය යුතු ය; සහ

(ආ) එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්යපටිපාටිය අවසන් කළ යුතු ය.

අනුමත එම්.එස්. එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ නිල දේපළ භාරගැනුම්කරු වෙත ඉදිරිපත් කිරීම

**285.** (1) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වූ යෝජනාව ණයහිමියන් විසින් පිළිගත් පසු, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින් ප්‍රායෝගිකව හැකි ඉක්මනින් -

(අ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සාකච්ඡා රැස්වීමේ දී ණයහිමියන්ගේ ඡන්දයේ ප්‍රතිඵලය පිළිබඳ ලිඛිත දැන්වීමක්; සහ

(ආ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළේ අවසාන නියම,

නිල දේපළ භාරගැනුම්කරු වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති ලේඛන ලැබීමෙන් පසු, එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි නියමයන් මඟින් මේ කොටසෙහි විධිවිධාන සපුරාලන බවට නිල දේපළ භාරගැනුම්කරු විසින් තහවුරු කළ යුතු ය.

(3) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි නියම මඟින් මේ කොටසෙහි විධිවිධාන සපුරාලන බවට තහවුරු කිරීමෙන්, පසු නිල දේපළ භාරගැනුම්කරු විසින් එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් නිර්දේශ කරන සහතිකයක් නිකුත් කළ යුතු ය.

(4) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ නිර්දේශ කරන සහතිකයක් නිකුත් කරනු ලැබීමේ දී, නිල දේපළ භාරගැනුම්කරු විසින් -

(අ) එම සහතිකය, සාකච්ඡා රැස්වීමේ දී ණයහිමියන්ගේ ඡන්දයේ ප්‍රතිඵලය සහ එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි අවසාන

නියම පිළිබඳ දැන්වීමක් සමඟ සුදුසු අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) සහතිකය නිකුත් කිරීම පිළිබඳව එම්.එස්.එම්.ඊ. ණයකරුට, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාට සහ වැඩපිළිවෙළෙහි ලැයිස්තුගත කර ඇති සියලුම ණයහිමියන්ට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) නිල දේපළ භාරගැනුම්කරු විසින් එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ නිර්දේශ කරමින් සහතිකයක් නිකුත් කිරීම -

(අ) එම වැඩපිළිවෙළ මගින් මෙම කොටසෙහි විධිවිධාන සපුරාලනු නොලබන්නේ නම්;

(ආ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශයේ හෝ ඒ සමඟ ඇති ලේඛනවල සැලකිය යුතු තරමේ සාවද්‍ය කරුණක් ඇති බව නිල දේපළ භාරගැනුම්කරුට දැනගැනීමට ලැබෙන්නේ නම්;

(ඇ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශයේ හෝ ඒ සමඟ ඇති ලේඛනවල සාධාරණ ලෙස පුරෝකථනය කළ නොහැකි වූ එම්.එස්. එම්.ඊ. ණයකරුගේ අවස්ථානුගත කරුණුවල වන සැලකිය යුතු තරමේ වෙනසක් පිළිබඳව නිල දේපළ භාරගැනුම්කරුට දැනගැනීමට ලැබෙන්නේ නම්;

(ඈ) එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි නියම එම්.එස්.එම්.ඊ. ණයකරුට සහ ණයහිමියන්ට සාධාරණ නොවන බව නිල දේපළ භාර ගැනුම්කරුගේ මතය වන්නේ නම්,

පමණක්, ප්‍රතික්ෂේප කළ හැකි ය.

(6) එම්.එස්.එම්.ඊ. සමාගම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් නිර්දේශ කරන සහතිකයක් නිකුත් කිරීම නිල දේපළ භාරගැනුම්කරු විසින් ප්‍රතික්ෂේප කරන්නේ නම්, නිල දේපළ භාරගැනුම්කරු විසින් -

(අ) එම ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු එම්.එස්.එම්.ඊ. ණයකරුට, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාට සහ ණයහිමියන්ට ඉදිරිපත් කළ යුතු ය; සහ

(ආ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වීම අධිකරණය විසින් ස්ථිර නොකරනු ලැබිය යුතු බවට වූ නිර්දේශයක් උචිත අධිකරණය වෙත දැනුම් දිය යුතු ය.

එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අධිකරණයෙන් ස්ථිර කිරීම

**286**. (1) 285 වන වගන්තිය යටතේ එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට අදාළව නිල දේපළ භාරගැනුම්කරුගෙන් අධිකරණයට නිර්දේශයක් ලැබුණ විට, අධිකරණය විසින් නිර්දේශය සලකා බැලිය යුතු අතර, ඒ සමඟ ඇති ලේඛන ද සලකා බැලිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ නිර්දේශයක් සලකා බැලීමේ දී, එහි සහතික කර ඇති කරුණු පිළිබඳ සාක්ෂියක් ලෙස 285 වන වගන්තිය යටතේ නිල දේපළ භාරගැනුම්කරු විසින් නිකුත් කරන ලද සහතිකයක් සැලකිල්ලට ගැනීමට අධිකරණයට හිමිකමක් තිබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිර්දේශයක් සලකා බැලීමේ දී, ණයහිමියා, එම්.එස්.එම්.ඊ. ණයකරු හෝ පුද්ගලික වස්තුභංගත්ව යෝජකයා විසින් කරන ලද නිර්දේශයට ඇති යම් විරෝධතාවයක් අධිකරණය විසින් විභාග කළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ විරෝධතාවක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක හෝ තීරණයකට එළැඹීම සඳහා වැඩිදුර තොරතුරු හෝ සාක්ෂි අවශ්‍ය වූ විට, අධිකරණය විසින් විභාගයක් පැවැත්විය හැකි අතර, එම විභාගය පිළිබඳ දැන්වීම් නිල දේපළ භාරගැනුම්කරුට පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාට එම්.එස්. එම්.ඊ. ණයකරුට සහ ණයහිමියන්ට ලබා දිය යුතු ය.

(5) නිර්දේශය සලකා බැලීමෙන් පසුව,-

(අ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ මගින් මේ කොටසෙහි නිර්ණායක සපුරාලන බව; සහ

(ආ) එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සකස් කිරීම මේ කොටසෙහි කාර්යපටිපාටි පිළිබඳ නියමයන්ට අනුකූල වන බව,

අධිකරණය විසින් සලකනු ලබන්නේ නම්, අධිකරණය විසින් එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වීම තහවුරු කරමින් ආඥාවක් කළ යුතු ය.

(6) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන බව තහවුරු කිරීමේ දී, නියම කළ හැකි පරිදි ඕනෑම ආකාරයකට අනුව, නිල දේපළ භාරගැනුම්කරුට පහත දැක්වෙන කරුණු පිළිබඳව අධිකරණය විසින් ආඥා කළ යුතු ය:-

(අ) අධිකරණ ආඥාව පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කළ යුතු බවට; සහ

(ආ) එම දැන්වීමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට යැවිය යුතු බවට.

(7) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ස්ථිර කරන ආඥාවක් කිරීමෙන් පසු පහත දැක්වෙන තැනැත්තන්ට ලිඛිත දැන්වීම් ලබා දෙන ලෙස අධිකරණය විසින් නිල දේපළ භාරගැනුම්කරුට විධාන කළ යුතු ය:-

(අ) ආඥාව නිකුත් කිරීම පිළිබඳව සහ එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ බලාත්මක වීම පිළිබඳව එම්.එස්.එම්.ඊ. ණයකරුට, පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාට සහ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට;

(ආ) ආඥාව නිකුත් කිරීම පිළිබඳව සහ එම්.එස්. එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ බලාත්මක වී ඇති බව එම්.එස්. එම්.ඊ. ණයකරුගේ සෑම ණය හිමියකුට ම; සහ

(ඇ) 288 වන වගන්තිය යටතේ එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට විරෝධය පළ කිරීමට ණයහිමියන්ට අයිතියක් ඇති බවට එක් එක් ණයහිමියාට.

එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අධිකරණය විසින් තහවුරු කිරීමේ බලපෑම

**287.** (1) අධිකරණය විසින් අනුමත කරනු ලබන එම්.එස්. එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් මගින් එම වැඩපිළිවෙළෙහි නියමයන් මගින් බලපෑමට ලක්වන සියලු ණයහිමියන්ව බැඳීමට ලක් කරන්නේ ය.

(2) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන බව තහවුරු කරනු ලබන අධිකරණ ආඥාව, වැඩපිළිවෙළෙහි වලංගුභාවය පිළිබඳ තීරණාත්මක සාක්ෂියක් වන්නේ ය.

(3) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන බව තහවුරු කරන අධිකරණ ආඥාවෙන් පසුව, එම වැඩපිළිවෙළ එහි නියමයන්ට අනුකූලව -

(අ) 291 වන වගන්තියේ නියමයන්, අනුකූලව සම්පූර්ණ කරන තුරු; හෝ

(ආ) 290 වන වගන්තිය යටතේ එය අවසන් කරනතුරු,

බලාත්මකව පැවතිය යුතුය.

(4) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන අතරතුර, එම වැඩපිළිවෙළෙහි නියමයන් මගින් බලපෑමක් සිදු වී ඇති ණයක් ලබා දී ඇති ණයහිමියකු විසින් -

(අ) එම ණය අය කර ගැනීමට හෝ බලාත්මක කිරීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය; සහ

(ආ) විශේෂයෙන්, පහත දැක්වෙන කරුණු සඳහා, එනම් -

(i) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ හෝ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුගේ ඉල්ලීම පරිදි හෝ වැඩපිළිවෙළේ නියමයන්ට අනුකූලව මිස, ඇතුළත් කළ ණයක් ගෙවීම සම්බන්ධයෙන් එම්.එස්.එම්.ඊ. ණයකරු සම්බන්ධ කර ගැනීම සඳහා;

(ii) ඇතුළත් කළ ණයකට අදාළව එම්.එස්.එම්.ඊ. ණයකරුට එරෙහිව යම් නඩු කටයුත්තක් ආරම්භ කිරීම හෝ දිගටම කරගෙන යාම සඳහා;

(iii) ඇතුළත් කළ ණයක් එකතු කිරීම, සුරක්ෂිත කිරීම, අයකර ගැනීම හෝ ගෙවීම ඉල්ලා සිටීම සඳහා;

(iv) (6) වන උපවගන්තියට යටත්ව, එම්.එස්. එම්.ඊ. ණයකරුට එරෙහිව අධිකරණයක හෝ විනිශ්චය සභාවක තීන්දුවක් හෝ ආඥාවක් ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීම සඳහා;

(v) වරෙන්තුවක් ලබා ගැනීම සඳහා;

(vi) එම්.එස්.එම්.ඊ. ණයකරු විසින් ණය පැහැර හැරීම හෝ ණයකරු වස්තුභංගත්වයට පත්වීම මත අත්‍යවශ්‍ය භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා වූ ගිවිසුමක් අවසන් කිරීම සඳහා;

(vii) වැඩපිළිවෙළෙහි නියමයන් යටතේ හැර, එම්.එස්.එම්.ඊ. ණයකරු අදාළ ණයහිමියා සමඟ ඇතුළු වී ඇති ගෙවල් කුලිය පිළිබඳ ගිවිසුමක් යටතේ එම්.එස්.එම්.ඊ. ණයකරු පදිංචි වී සිටින පරිශ්‍රයක සන්තකය ලබා ගැනීම සඳහා;

(viii) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අදාළ වන එම්.එස්.එම්.ඊ. ණයකරුවකු සමඟ ඒකාබද්ධව වගකීමට බැඳී සිටින වෙනත් තැනැත්තකුට එරෙහිව, මේ උපවගන්තියේ සඳහන් යම් ක්‍රියාමාර්ග සඳහා වැඩපිළිවෙළ මගින් විධිවිධාන සලස්වා ඇත්නම් එම ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා;

(ix) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අදාළ එම්.එස්.එම්.ඊ. ණයකරුවකුගේ ණයවලට ඇප වී ඇති වෙනත් තැනැත්තකුට එරෙහිව, මේ උපවගන්තියේ සඳහන් යම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා වැඩපිළිවෙළ මඟින් විධිවිධාන සලස්වා ඇත්නම් එම ක්‍රියාමාර්ගය ගැනීම සඳහා;

(x) (i), (ii), (iii), (iv), (v), (vi) හෝ (vii) ඡේදවල සඳහන් යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට නියෝජිතයකුට උපදෙස් දීම සඳහා,

කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය.

(5) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන අතරතුර දී-

(අ) විශේෂ අවස්ථාවල දී ණයහිමියකුට අවශ්‍ය පියවර ගැනීම සඳහා අවසර දීම සාධාරණ වන බවට;

(ආ) එම පියවර මඟින් -

(i) වැඩපිළිවෙළ අදාළ වන එම්.එස්.එම්.ඊ. ණයකරුට අනිසි නඩුවක් සිදු නොවන බවට;

(ii) වෙනත් යම් ණයහිමියකුට අසාධාරණ ලෙස අගතියක් සිදු නොවන බවට; හෝ

(iii) වැඩපිළිවෙළෙහි අරමුණු සැලකිය යුතු ලෙස අවතක්සේරු නොවන බවට,

අධිකරණය සලකනු ලබන අවස්ථාවකදී, අධිකරණය විසින් ණය හිමියකුට (4) වන උපවගන්තියේ ලැයිස්තුගත කර ඇති යම් පියවරයක් ගැනීමට අවසර දෙනු ලැබිය හැකි ය.

(6) එම්.එස්.එම්.ඊ. ණයකරුවකුට හෝ එම්.එස්.එම්.ඊ. ණයකරුගේ දේපළට එරෙහිව වන යම් ඇස්කීසි කිරීමක් හෝ වෙනත් නෛතික ක්‍රියාවලියක් හෝ දේපළ තහනමක් මඟින් ප්‍රතිලාභ ලැබීම සඳහා ණයහිමියාට ඇති අයිතියට, තහනමක් එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන බව තහවුරු කරනු ලබන අධිකරණ නියෝගය

අවම වශයෙන් දින එකසිය අසූවකට පෙර එම ඇස්කීසි කිරීම හෝ වෙනත් නෛතික ක්‍රියාවලිය හෝ දේපළ තහනම අවසන් කරන ලද්දේ නම් සහ -

(අ) චංචල හෝ නිශ්චල දේපළවලට එරෙහිව ඇස්කීසි කිරීමක්, තහනමට ගැනීම මගින් හෝ දේපළ භාර ගැනුම්කරුවකු හෝ පත්වීම්ලාභියකු හෝ ඇස්කීසි කිරීම භාරව සිටින තැනැත්තකු විසින් සන්තකය ලබා ගැනීම මඟින් සහ සම්පූර්ණ කරන ලද විකිණීමක් මඟින් අවසන් කරනු ලබන අවස්ථාවකදී; සහ

(ආ) ණය මුදල ගෙවීම මගින් ණය මුදලට ඇති තහනම අවසන් කරනු ලබන අවස්ථාවක දී,

මේ වගන්තියේ කිසිවක් මගින් කිසිදු බලපෑමක් සිදු නොවන්නේ ය.

(7) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන විට, අත්‍යවශ්‍ය භාණ්ඩ හෝ සේවා සපයන්නකු විසින් -

(අ) වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට පෙර වූ කාලසීමාවකට අදාළව භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා එම්.එස්.එම්.ඊ. ණයකරුවකු විසින් ගාස්තු ගෙවීම පැහැර හැරීමේ හේතුව මත එම්.එස්.එම්.ඊ. ණයකරුට භාණ්ඩ හෝ සේවා සැපයීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය;

(ආ) වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට පෙර වූ කාලසීමාවකට අදාළව භාණ්ඩ හෝ සේවා සඳහා වූ නොගෙවූ ගාස්තු ගෙවිය යුතු බවට එම්.එස්.එම්.ඊ. ණයකරුවකුට කොන්දේසියක් පැනවීම නොකළ යුතු ය; හෝ

(ඇ) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකුගේ පූර්ව ලිඛිත අවසරය ඇතිව මිස, භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා වූ ගිවිසුමක ඇති වස්තුභංගත්වයට අදාළ කොන්දේසියක් මත විශ්වාසය නොතැබිය යුතු ය.

(8) එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට සහ එහි අරමුණු ඉටු කිරීමට වස්තුභංගත්වයට සම්බන්ධව නියමය මත විශ්වාසය තැබීම අවශ්‍ය බවට පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු සෑහීමකට පත් වන අවස්ථාවක දී, (7) උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින් කැමැත්ත ලබා දිය හැකි ය.

(9) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු (7) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ කැමැත්ත ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අලාභ ගෙවීමකට යටත් නොවන්නේ ය.

(10) ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ මගින් එම්.එස්.එම්.ඊ. ණයකරුවකුගේ නිලධරයකුට එරෙහිව කිසියම් අපරාධ නඩු කටයුතු පැවරීම හෝ අඛණ්ඩව පවත්වාගෙන යාම වැළැක්වීම සිදු නොවිය යුතුය.

(11) මේ වගන්තියට පටහැනිව ගනු ලබන ඕනෑම ක්‍රියාවක් ශුන්‍ය සහ බල රහිත විය යුතු ය.

(12) මෙම වගන්තියට පටහැනිව ණයහිමියකු හෝ ණයහිමියාගේ නියෝජිතයකු විසින් ගනු ලැබූ ක්‍රියාවකින් පැන නැගුණු ණයහිමියකු සමඟ ගනුදෙනුවක් යටතේ යම් තැනැත්තකු දේපළ හෝ වෙනත් අයිතියක් සඳහා පොළියක් ලබාගෙන තිබේ නම්, එම ක්‍රියාවෙහි ශුන්‍යභාවය හේතුවෙන් එම තැනැත්තා අගතියට පත් නොවිය යුතු ය.

(13) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට සුරක්ෂිත ණයහිමියකුගේ හෝ කුලී සින්නක්කර ගිවිසුමකට ප්‍රතිවිරුද්ධ පාර්ශ්වකරුවකුගේ අයිතිවාසිකම් වෙනස් කරන හෝ සීමා කරන කොන්දේසි ඇතුළත් නොවන අවස්ථාවක, සුරකුමට හෝ කුලී සින්නක්කර ගිවිසුමකට යටත්ව දේපළ සම්බන්ධයෙන් ඇති අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට සුරක්ෂිත ණයහිමියකුට ඇති අයිතිවාසිකම්වලට හෝ කුලී සින්නක්කර ගිවිසුමේ ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයට ඇති අයිතිවාසිකම්වලට මෙම වගන්තියේ සඳහන් කිසිවක් මගින් බලපෑමක් සිදු නොවිය යුතු ය.

(14) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළකට 280 වන වගන්තියේ දක්වා ඇති ආකාරයට හෝ වෙනත් ආකාරයකින් සුරක්ෂිත ණයහිමියකුගේ හෝ කුලී සින්නක්කර මිල දී ගැනීමේ ගිවිසුමක ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයක හිමිකම් වෙනස් කිරීම හෝ සීමා කිරීම ඇතුළත් වන්නේ නම්, දේපළ පිළිබඳ සුරක්ෂිත ණයහිමියාට හෝ ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයට තම අයිතිය බලාත්මක කළ හැක්කේ වැඩපිළිවෙළෙහි නියමයන්ට අනුකූලව සුරැකුමට හෝ කුලී සින්නක්කර ගිවිසුමට යටත්ව පමණි.

(15) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙලට අදාළව, "වස්තුභංගත්වයට අදාළ නියමයන්" යනු

(අ) එම්.එස්.එම්.ඊ.සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ කාර්යපටිපාටිය ආරම්භ වීම හේතුවෙන් ගිවිසුම හෝ සැපයුම අවසන් වීම හෝ වෙනත් යමක් සිදු වන; හෝ

(ආ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි කාර්යපටිපාටිය ආරම්භ වන බැවින්, ගිවිසුම හෝ සැපයුම අවසන් කිරීමට හෝ වෙනත් ඕනෑම දෙයක් කිරීමට සැපයුම්කරුට ලැබෙන,

එම්.එස්.එම්.ඊ. ණයකරුවකුට අත්‍යවශ්‍ය භාණ්ඩයක් හෝ සේවාවක් සැපයීම සඳහා වන ගිවිසුමක විධිවිධානයන් වේ.

එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට අභියෝග කිරීම

**288.** (1) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ හා බැඳී සිටින ණයහිමියකුට වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන බව තහවුරු කරන අධිකරණ ආඥාවකට විරෝධය පළ කිරීමට අධිකරණය වෙත ඉල්ලුම් කළ හැකි ය.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට විරුද්ධ වීමට ණයහිමියාගේ ඉල්ලුම්පත පහත සඳහන් කරුණු එකක් හෝ කිහිපයක් මත පදනම් විය යුතු ය. එනම්-

(අ) සමාගම එම්.එස්.එම්.ඊ. ණයකරුගේ නොවීම හෝ සමාගම, එම්.එස්.එම්.ඊ. ණයකරුවකු නම්, 278 වන වගන්තියේ සුදුසුකම් නිර්ණායක සපුරා නොතිබීම;

(ආ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ 279 වන වගන්තියේ දක්වා ඇති අනුගමන විධිවිධානවලට අනුකූල නොවීම;

(ඇ) එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සැකසීම සහ ස්ථිර කිරීම මෙම කොටසෙහි කාර්යපටිපාටි අවශ්‍යතාවලට අනුකූල නොවීම;

(ඈ) එම්.එස්.එම්.ඊ. ණයකරු සිය මූල්‍ය කටයුතු ප්‍රකාශය කිරීමේ දී හෝ ඒ ආශ්‍රිත තොරතුරු සැපයීමේ දී යම් ප්‍රමාණාත්මක ව්‍යාජ නියෝජනයක් හෝ අතපසුවීමක් සිදු කර තිබීම; හෝ

(ඉ) එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ණයහිමියාගේ අයිතිවාසිකම්වලට අසාධාරණ අගතියක් ඇති කිරීම.

(3) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට විරුද්ධවීමට ණයහිමියකුගේ ඉල්ලීමක් එම්.එස්. එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන දින සිට දින විසිඅටක කාලසීමාවක් ඇතුළත අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(4) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළකට විරෝධය දැක්වීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳව, ණයහිමියා විසින් එම්.එස්.එම්.ඊ. ණයකරුට සහ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට, ඉල්ලීම සඳහා පදනම් වූ හේතු ද ඇතුළත්ව ලිඛිතව දැන්විය යුතුය.

(5) ඉහත (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කිසියම් හේතුවක් සම්බන්ධයෙන් මෙම වගන්තිය යටතේ ඇති ඉල්ලීමක් සම්බන්ධයෙන් අධිකරණය සෑහීමකට පත් වේනම්, අධිකරණයට පහත සඳහන් දේවලින් එකක් හෝ සියල්ලම කළ හැකි ය. එනම් -

(අ) එසේ කිරීමෙන් වෙනත් ණයහිමියකුට අසාධාරණ ලෙස අගතියක් නොවන පරිදි, එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අධිකරණයට ඉල්ලුම් කළ ණයහිමියාට අදාළ නොවන බවට ආඥාවක් නිකුත් කිරීම;

(ආ) සංශෝධිත යෝජනාවක් අනුමත කරන්නේ ද යන්න පිළිබඳව ණයහිමියන්ගෙන් තීරණයක් ගැනීමට පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට යොමු කිරීම; හෝ

(ඇ) ඇතුළත් කර ඇති වෙනත් ණය හෝ ණයහිමියකු සම්බන්ධයෙන් එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අවලංගු කිරීමේ නියෝගයක් කිරීම.

(6) අධිකරණය විසින් (5) වන උපවගන්තිය යටතේ ආඥාවක් කර ඇති අවස්ථාවක, එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කරන කාලසීමාව තුළ ඇතුළත් කළ ණයක් සම්බන්ධයෙන් උපචිත යම් පොලී, ගාස්තු හෝ වෙනත් ගාස්තු ගෙවීමට එම්.එස්. එම්.ඊ. ණයකරුට, අධිකරණය විසින් නියෝග කළ හැකි ය.

(7) ඇතුළත් කර ඇති සියලුම ණය සහ සියලුම ණයහිමියන් සම්බන්ධයෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අවලංගු කිරීමේ බලපෑම ඇතිව අධිකරණය විසින් (5) වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ ආඥාවක් ලබා දී ඇති අවස්ථාවක, අධිකරණය විසින් ණයහිමි ප්‍රතිකර්මයට අදාළව දින විසිඑකක කාලයක් පැවතිය යුතු තාවකාලික ණය කල්දැමීමක් ස්ථාපිත කිරීමට ආඥාවක් ද කළ යුතු අතර එය 287 වන වගන්තිය යටතේ ණය ආරක්ෂණ කල්දැමීමේ ආඥාවට සමාන බලපෑමක් තිබිය යුතුය.

(8) (5) වන හෝ (6) වන උපවගන්ති යටතේ අධිකරණය විසින් ආඥාවක් කරන අවස්ථාවක, (5) වන උපවගන්තිය යටතේ වූ ආඥාව පිළිබඳව එම්.එස්.එම්.ඊ. ණයකරුට සහ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට, නිල දේපළ භාර ගැනුම්කරුවකුට සහ ණයහිමියන්ට අධිකරණය විසින් ඒ බව දැනුම් දිය යුතු ය.

(9) (8) වන උපවගන්තිය යටතේ අධිකරණයක් නිල දේපළ භාරගැනුම්කරුට දැනුම් දෙන අවස්ථාවක, නිල දේපළ භාර ගැනුම්කරු විසින් දින දාහතරක කාලයක් ඇතුළත සහ නියම කළ හැකි ආකාරයට අනුකූලව -

(අ) අධිකරණ ආඥාව පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කළ යුතු ය;

(ආ) එම දැන්වීමක පිටපතක් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට යැවිය යුතු ය; සහ

(ඇ) (5) වන උපවගන්තිය යටතේ කරන ලද අධිකරණ ආඥාව සහ (6) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද යම් නියමයක් පිළිබඳව පීඩාවට පත් වූ ණයහිමියකුට ලිඛිත දැනුම් දීමක් කළ යුතු ය.

එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කිරීම

**289.** (1) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන බවට අධිකරණයක් විසින් ස්ථිර ආඥාවක් ලබා දී ඇති අවස්ථාවක, එම වැඩපිළිවෙළ මෙම වගන්තියට යටත්ව, එහි නියමයන්ට අනුකූලව වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු ස්වකීය මෙහෙයවීම මත හෝ එම්.එස්.එම්.ඊ. ණයකරුගේ හෝ ණයහිමියකුගේ ඉල්ලීම මත, එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට - එනම්,

(අ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ තත්ත්වයන්හි ප්‍රමාණාත්මක වෙනසක් සිදු වී ඇති බව පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට පෙනී යන්නේ නම්; සහ

(ආ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ ණයහිමියන් විසින් එම අවස්ථාවන්වලට අනුකූලව වෙනස්වීමක් අනුමත කරන බවට ඉඩ ප්‍රස්ථා ඇති බවට පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු සෑහීමකට පත් වන්නේ නම්,

ඒ වෙනස් කිරීම පිළිබඳව යෝජනාවක් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ කොන්දේසි අදාළ වන විට, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු සාධාරණ ලෙස ප්‍රායෝගිකව කළ හැකි ඉක්මනින් -

(අ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ යාවත්කාලීන ප්‍රකාශයක් සම්පූර්ණ කරන ලෙස එම්.එස්.එම්.ඊ. ණයකරුට නියම කළ යුතු ය;

(ආ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ විධිවිධානයේ සුළු වෙනස්කමක් කිරීම සඳහා යෝජනාවක් සකස් කිරීමේ දී එම්.එස්.එම්.ඊ. ණයකරුට සහාය ලබා දිය යුතු ය;

(ඇ) යෝජනාව සඳහා එම්.එස්.එම්.ඊ. ණයකරුගේ කැමැත්ත ලබා ගැනීම සහ යෝජනාව සඳහා ණයහිමියාගේ අනුමතය ලබා ගැනීම ද සිදු කළ යුතු ය; සහ

(ඈ) යෝජනාව පිළිගත යුතු ද නැද්ද යන්න සඳහන් කරමින් දැනුම් දෙන ලෙස එක් එක් ණයහිමියා වෙත ඉල්ලීමක් යැවිය යුතු ය.

(4) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ විධිවිධාන වෙනස් කිරීමේ යෝජනාවක් සම්බන්ධයෙන් (3) වන උපවගන්තිය යටතේ බලපෑමට ලක් වූ එක් එක් ණයහිමියා වෙත ලියන විට, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් -

(අ) පහත දැක්වෙන ලේඛනවල පිටපතක් ණයහිමියාට ලබා දිය යුතු ය :-

(i) යෝජනාව; සහ

(ii) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ යාවත්කාලීන කළ ප්‍රකාශයක්;

(ආ) පහත දැක්වෙන කරුණු පිළිබඳව ප්‍රකාශයක්:-

(i) එම්.එස්.එම්.ඊ. ණයකරු 278 වන වගන්තියේ සුදුසුකම් සපුරා ඇති බවට;

(ii) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාගේ උපරිම දැනුමට අනුව, එම්.එස්.එම්.ඊ. ණයකරුගේ යාවත්කාලීන කරන ලද මූල්‍ය කටයුතු ප්‍රකාශයේ අඩංගු තොරතුරු සම්පූර්ණ සහ නිවැරදි බවට;

(iii) මේ යෝජනා එම්.එස්.එම්.ඊ. ණයකරුගේ තත්ත්වයන්හි අදාළ වෙනස ආමන්ත්‍රණය කිරීමේ සාධාරණ මාධ්‍යයක් බවට; සහ

(iv) යෝජනාව අනුමත කර ක්‍රියාත්මක කරන බවට සාධාරණ අපේක්ෂාවක් ඇති බවට,

ණයහිමියා වෙත ප්‍රකාශයක් ලබා දිය යුතු ය;

(ඇ) යෝජනාව පිළිගත යුතු ද යන්න සඳහන් කරමින් සාමාන්‍ය හෝ විද්‍යුත් තැපෑලෙන් ලිඛිත පිළිතුරක් ලබා දෙන ලෙස ණයහිමියාගෙන් ඉල්ලා සිටිය යුතු ය; සහ

(ඈ) (6) වන උපවගන්තියේ සඳහන් දැන්වීම පිළිබඳව ණයහිමියාට දැනුම් දී අදාළ අවසාන දිනය පිළිබඳව පුද්ගලික වස්තුභංගත්ව වෘත්තිකයාට පිළිතුරක් එවන ලෙස ඉල්ලා සිටිය යුතු ය.

(5) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කිරීම සඳහා වූ යෝජනාවකට -

(අ) වැඩපිළිවෙළෙහි එසේ වෙනස් කිරීම පිළිබඳව එම්.එස්.එම්.ඊ. ණයකරු විසින් ලිඛිතව කැමැත්ත පළ කර ඇත්නම්;

(ආ) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින් මෙම වගන්තිය යටතේ එම්.එස්.එම්.ඊ. ණයකරුගේ බලපෑමට ලක් වූ ණයහිමියන්ට ලිපියක් යවා ඇත්නම්;

(ඇ) වැඩපිළිවෙළට බැඳී ඇති සියලුම ණයහිමියන්ගේ හිමිකම්වලින් සියයට තුනෙන් දෙකක වටිනාකමකින් යුත් හිමිකම්වලින් බහුතරයක් නියෝජනය කරන ණයහිමියන් විසින් (4) වන උපවගන්තියේ දක්වා ඇති අවසන් දිනයට පෙර යෝජනාව පිළිගනිමින් පිළිතුරු සපයනු ලබන්නේ, නම්;

(ඈ) සුරක්ෂිත ණයහිමියන්ගේ සහ කුලී සින්නක්කර මිල දී ගැනීමේ ගිවිසුම් ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සුළු වශයෙන් වෙනස් කිරීමේ හෝ සීමා කිරීමේ නියමයන් ඇතුළත් වන විට, එවැනි හිමිකම් ඇති ඕනෑම ණයහිමියකු විසින් (4) වන උපවගන්තියේ දක්වා ඇති අවසාන දිනයට පෙර, යෝජනාව වෙනස් කිරීම පිළිගැනීමේ පිළිතුරු සපයනු ලැබ ඇත්නම්,

එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කිරීම සඳහා වූ යෝජනාවක් පිළිගනු ලැබිය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ කාර්ය සඳහා, (4) වන උපවගන්තිය යටතේ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු වෙත අවසන් දිනයට පෙර ප්‍රතිචාරයක් ලබා නොදෙන ණයහිමියකු එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කිරීමේ යෝජනාව පිළිගත යුතු බව සඳහන් කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සුළු වශයෙන් වෙනස් කිරීමේ යෝජනාවක් පිළිගෙන ඇති විට, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු සාධාරණ ලෙස හැකි ඉක්මනින්, නිල දේපළ භාරගැනුම්කරු වෙත -

(අ) එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කිරීම සම්බන්ධයෙන් ණයහිමියාගේ ප්‍රතිචාර පිළිබඳ දැන්වීමක්; සහ

(ආ) වෙනස් කරන ලද ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි අවසාන නියමයන්,

ඉදිරිපත් කළ යුතු ය.

(8) (7) වන උපවගන්තියේ දක්වා ඇති ලේඛන ලැබීමෙන් පසු, සුළු වශයෙන් වෙනස් කරන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ස්ථිර කිරීම සඳහා නිල දේපළ භාරගැනුම්කරු විසින් නිර්දේශ කිරීම සඳහා සහතිකයක් නිකුත් කළ යුතු ය.

(9) සුළු වශයෙන් වෙනස් කරන ලද ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් ස්ථිර කිරීම නිර්දේශ කරන සහතිකයක් නිකුත් කිරීමේ දී, නිල දේපළ භාරගැනුම්කරු විසින් -

(අ) සහතිකය සමඟ එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කිරීමේ යෝජනාවට ණයහිමියාගේ අනුමතය ලබා දීමේ දැන්වීම සහ වෙනස් කරන වැඩපිළිවෙළෙහි අවසාන නියමයන්, විසින් උචිත අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය; සහ

(ආ) සහතිකය නිකුත් කිරීම පිළිබඳව එම්.එස්.එම්.ඊ. ණයකරුට, පුද්ගලික වස්තුභංගත්ව

අද්මිනිස්ත්‍රාසිකරුට සහ වැඩපිළිවෙළෙහි ලැයිස්තුගත කර ඇති සියලුම ණයහිමියන්ට දැනුම් දිය යුතු ය.

(10) (9) වන උපවගන්තිය යටතේ එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි වෙනසක් සම්බන්ධයෙන් අධිකරණයට නිල දේපළ භාරගැනුම්කරුගෙන් නිර්දේශයක් ලැබුණු විට, අධිකරණය එම නිර්දේශය සලකා බලා, වෙනස් කිරීම බලාත්මක වන බව ස්ථිර කරමින් ආඥාවක් නිකුත් කළ යුතු ය.

(11) (10) වන උපවගන්තිය යටතේ වෙනස් කරන ලද වැඩපිළිවෙළ බලාත්මක වීම ස්ථිර කරන අධිකරණය විසින් ආඥාවක් නිකුත් කරන අවස්ථාවක දී, වෙනස් කරන ලද වැඩපිළිවෙළ 289 වන වගන්තිය යටතේ ස්ථිර කරන ලද වැඩපිළිවෙළක් ලෙස සලකා වෙනස් කරන ලද වැඩපිළිවෙළට මෙම කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අවසන් කිරීම

**290.** (1) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු සමඟ ක්‍රියා කරන එම්.එස්.එම්.ඊ. ණයකරු සහ ණයහිමියන් විසින් එම්.එස්.එම්.ඊ. ණයකරු විසින් කරන ලද යෝජනාවක් ණයහිමියන්ගේ තුනෙන් දෙකක බහුතරයකින් පිළිගැනීමෙන් ඕනෑම අවස්ථාවක එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අවසන් කළ හැකි ය.

(2) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් අවසන් කිරීමේ ආඥාවක් සඳහා පහත සඳහන් යම් තැනැත්තකුට අධිකරණයට ඉල්ලීමක් කළ හැකි ය. එනම් -

(අ) එම්.එස්.එම්.ඊ. ණයකරු;

(ආ) ණයහිමියා;

(ඇ) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු; හෝ

(ඈ) නිල දේපළ භාරගැනුම්කරු.

(3) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් අවසන් කිරීමේ නියෝගයක් සඳහා එම්.එස්.එම්.ඊ.ණයකරුවකු හෝ ණයහිමියකු විසින් කරන ලද ඉල්ලීමකට

එම්.එස්.එම්.ඊ. ණයකරුට එරෙහිව බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් සඳහා වන ඉල්ලීමක් ද ඇතුළත් විය හැකි ය.

(4) (2) වන උපවගන්තිය යටතේ අයදුම්පතක් පහත සඳහන් කරුණුවලින් එකක් මත පදනම් විය යුතු ය:-

(අ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රකාශයේ ව්‍යාජ නියෝජනයක් හෝ අතපසුවීමක් සොයාගෙන ඇති අතර, එය ණයහිමියකුට සැලකිය යුතු හානියක් සිදු කරන බව;

(ආ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සකස් කිරීම සහ ස්ථිර කිරීම මෙම කොටසෙහි ක්‍රියාපටිපාටි අවශ්‍යතාවලට අනුකූල නොවන බව;

(ඇ) සමාගම, 282 වන වගන්තිය යටතේ නිල දේපළ භාරගැනුම්කරුට යෝජනාවක් ඉදිරිපත් කරන අවස්ථාවේ දී සමාගම එම්.එස්.එම්.ඊ. ණයකරුවකු නොවන බව;

(ඈ) එම්.එස්.එම්.ඊ. ණයකරු, 282 වන වගන්තිය යටතේ නිල දේපළ භාරගැනුම්කරු යෝජනාවක් ඉදිරිපත් කරන අවස්ථාවේ දී 282 වන වගන්තිය යටතේ සුදුසුකම් නිර්ණායක සපුරා නොතිබුණ බව;

(ඉ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ එම්.එස්.එම්.ඊ. ණයකරුට පනවා තිබූ බැඳීම්වලට එම්.එස්.එම්.ඊ. ණයකරු අනුකූලව ක්‍රියා නොකරන බව;

(ඊ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ මාස තුනකට නොඅඩු කාලසීමාවකට අනුරූප වන මුදලක් ගෙවීම් සම්බන්ධයෙන් එම්.එස්.එම්.ඊ. ණයකරුට හිඟ තබා ඇති බව;

(උ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට සාධාරණ ලෙස අවශ්‍ය කිසිඳු ක්‍රියාමාර්ගයක් ගැනීමට එම්.එස්.එම්.ඊ. ණයකරු අපොහොසත් වී ඇති බව; හෝ

(ඌ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි සුළු වෙනසක් කිරීම සඳහා කැමැත්ත ලබා දීම එම්.එස්.එම්.ඊ. ණයකරු විසින් අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කර ඇති බව.

(5) (2) වන උපවගන්තිය යටතේ ඇති ඉල්ලීමක් විභාග කිරීමේ දී, අධිකරණය විසින්-

(අ) ඉල්ලීමක් නිෂ්ප්‍රභ කළ හැකි ය;

(ආ) එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අවසන් කළ හැකි ය; හෝ

(ඇ) 289 වන වගන්තිය යටතේ එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට සුළු වෙනසක් කිරීම සඳහා යෝජනාවක් පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින් පිළියෙල කරනු ලැබිය යුතු බවට නියෝග කරනු ලැබිය හැකි ය.

(6) අධිකරණය විසින් (5) වන උපවගන්තිය යටතේ ආඥාවක් කර ඇති අවස්ථාවක, එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කරන කාලසීමාව තුළ ඇතුළත් කළ ණයක් සම්බන්ධයෙන් උපචිත කිසියම් පොලී, ගාස්තු හෝ වෙනත් ගාස්තු ගෙවීමට එම්.එස්.එම්.ඊ. ණයකරුට අධිකරණය විසින් නියම කරනු ලැබිය යුතු ය.

(7) (5) වන හෝ (6) වන උපවගන්තිය යටතේ ආඥාවක් නිකුත් කරන යම් අවස්ථාවක, අධිකරණය විසින් එම්.එස්.එම්.ඊ. ණයකරුට සහ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට නිල දේපළ භාරගැනුම්කරුට සහ (5) උපවගන්තිය යටතේ ආඥාව අදාළ වන ණයහිමියන්ට ලිඛිත දැනුම් දීමක් ලබා දිය යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් නිල දේපළ භාරගැනුම්කරුට දැනුම් දෙන අවස්ථාවක, එම දැනුම් දුන් දින සිට දාහතරක කාලයක් ඇතුළත සහ නියම කරනු ලැබිය හැකි ආකාරයට නිල දේපළ භාරගැනුම්කරු විසින් -

(අ) අධිකරණ ආඥාව පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කළ යුතු ය; සහ

(ආ) එම දැන්වීමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට යැවිය යුතු ය.

එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සම්පූර්ණ කිරීම

**291.** (1) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ 290 වන වගන්තිය යටතේ කලින් අවසන් කර ඇත්නම් මිස, එය විසින් නිර්මාණය කරන ලද සියලුම පිළිබැඳීම් ඉටු කර ඇති විට, එම වැඩපිළිවෙළ අවසන් වේ.

(2) (1) වන උපවගන්තිය යටතේ වැඩපිළිවෙළක් සම්පූර්ණ කළ විට, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින්, සම්පූර්ණ කිරීමෙන් පසු දින විසිඑකක් ඇතුළත -

(අ) එම්.එස්.එම්.ඊ. ණයකරුට සම්පූර්ණ කිරීමේ සහතිකයක් ලබා දිය යුතු ය; සහ

(ආ) වැඩපිළිවෙළ අවසන් කිරීමේ සහතිකය පිළිබඳව නිල දේපළ භාරගැනුම්කරුට ලිඛිතව දැන්වීමක් ලබා දිය යුතු ය.

(3) වැඩපිළිවෙළ අවසන් කිරීම පිළිබඳ සහතිකය බැලූබැල්මට එහි දක්වා ඇති කරුණු පිළිබඳ සාක්ෂියක් විය යුතු ය.

(4) මෙහි පහත විධිවිධාන සලසා ඇති පරිදි හැර, (1) වන උපවගන්තිය යටතේ එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් අවසන් කරනු ලැබූ විට, වැඩපිළිවෙළ මගින් බලපෑමට ලක් වූ ණය අවලංගු වන අතර, එම්.එස්.එම්.ඊ. ණයකරු යම් දණ්ඩන මුදලක් පොලිය සහ එම ණයට අදාළව ගෙවිය යුතු වෙනත් මුදලක් ඇතුළුව ණයවලින් කොටසක් ගෙවීමට එම්.එස්.එම්.ඊ. ණයකරු බැඳීමකට යටත් නොවිය යුතු ය.

(5) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සම්පූර්ණ කිරීම, මගින් වැඩපිළිවෙළෙහි නියමවල දක්වා ඇති ප්‍රමාණවලට හැර -

(අ) එම්.එස්.එම්.ඊ. ණයකරු සමඟ ඒකාබද්ධව ගෙවිය යුතු ණයකින් වෙනත් අයකු නිදහස් කිරීම; හෝ

(ආ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ ණය සඳහා ඇපකරු ලබා දුන් ඇපකරයෙන් ඇපකරුවකු නිදහස් කිරීම,

සිදු නොකළ යුතු ය.

(6) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සම්පූර්ණ කිරීම, මගින් වැඩපිළිවෙළක නියමවල දක්වා ඇති ප්‍රමාණයට හැර, එම්.එස්.එම්.ඊ. ණයකරු කිසියම් කුලී සින්නක්කර මිල දී ගැනීමේ ගිවිසුමක් හෝ සුරක්ෂිත ණයක් යටතේ වගකීම්වලින් නිදහස් නොවන්නේ ය.

(7) ඉහත (2) වන උපවගන්තියේ දක්වා ඇති සම්පූර්ණ කිරීමේ සහතිකය නිල දේපළ භාරගැනුම්කරුට ලද විට, නිල දේපළ භාරගැනුම්කරු විසින් සම්පූර්ණ කිරීමේ සහතිකය ලැබීමෙන් දින දාහතරක් ඇතුළත -

(අ) අධිකරණ ආඥාව පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කළ යුතු ය; සහ

(ආ) එම දැන්වීමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට යැවිය යුතු ය.

(8) සැකදුරු කිරීමේ කාර්ය සඳහා, (1) වන උපවගන්තිය යටතේ එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සම්පූර්ණ කළ විට, එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ තවදුරටත් ක්‍රියාත්මක නොවිය යුතු අතර, 287 වන වගන්තිය යටතේ ණයහිමියන්ගේ ප්‍රතිකර්ම පිළිබඳ තහනම අදාළ වීම අවසන් විය යුතු ය.

එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරය

**292.** (1) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යභාරයට -

(අ) සාමාන්‍යයෙන් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම;

(ආ) වැඩපිළිවෙළ නිශ්චිතව දක්වා ඇති ආකාරයට එම්.එස්.එම්.ඊ. ණයකරුගේ දේපළ සම්බන්ධයෙන් කටයුතු කිරීම;

(ඇ) සාධාරණ තොරතුරු ලබා දෙන ලෙස එම්.එස්.එම්.ඊ. ණයකරු ඉල්ලීමක් කළ විට වැඩපිළිවෙළ පරිපාලනය පිළිබඳව එම්.එස්. එම්.ඊ. තොරතුරු ලබා දීම;

(ඈ) (i) වැඩපිළිවෙළෙහි පාර්ශ්වකරුවකු වන ණයහිමියකුට;

(ii) තොරතුරු සඳහා සාධාරණ ඉල්ලීමක් කරන ණයහිමියකුට,

වැඩපිළිවෙළෙහි පරිපාලනය පිළිබඳ තොරතුරු ලබා දීම;

(ඉ) වැඩපිළිවෙළෙහි පරිපාලනය පිළිබඳ තොරතුරු නිල දේපළ භාරගැනුම්කරුට ලබා දීම.

(2) එම වියදම් එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සඳහා වන අදාළ යෝජනාවේ නිශ්චිතව දක්වා ඇති ආකාරයේ නම් මිස, වැඩපිළිවෙළ පරිපාලනය කිරීමේ දී දරන ලද වියදම් සඳහා පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු වෙත පූරණය නොකළ යුතු ය.

(3) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ එම්. එස්.එම්.ඊ. ණයකරු විසින් ගෙවනු ලබන සියලුම මුදල් ලබා ගැනීම සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන යා යුතු අතර, එසේ නොමැතිව ගිණුමෙන් පහත දැක්වෙන කාර්ය සඳහා මුදල් නොගෙවිය යුතු ය:-

(අ) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි පරිපාලනය සම්බන්ධ කාර්ය සඳහා ;

(ආ) මෙම පනතට අනුව; හෝ

(ඇ) අධිකරණයේ විධානයට අනුව,

(4) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින් එම්.එස්. එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ එම්.එස්.එම්.ඊ. ණයකරුවන් විසින් ගෙවනු ලබන මුදල් නියමිත වේලාවට එකඟ වූ අනුපාතයට ණයහිමියන් වෙත සම්ප්‍රේෂණය කළ යුතු ය.

(5) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු එම්.එස්.එම්.ඊ. ණයකරුගෙන් ලැබුණු මුදල් සහ එම්.එස්.එම්.ඊ. සමාගම් ණය

පියවීමේ ගිවිසුමක් යටතේ ණයහිමියන්ට ලබා දුන් මුදල් පිළිබඳ සම්පූර්ණ සහ නිවැරදි වාර්තා පවත්වාගෙන යා යුතු ය.

(6) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු එම්.එස්.එම්.ඊ. ණයකරු සමඟ නිරන්තර සම්බන්ධතා පවත්වා ගත යුතු අතර-

(අ) අවම වශයෙන් සෑම මාස 6 ක කාලසීමාවකට වරක්; සහ

(ආ) වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය වන වෙනත් වාර ගණනත්,

එම්.එස්.එම්.ඊ. සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ පිළිබඳව සමාලෝචනයක් පැවැත්විය යුතු ය.

(7) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ තත්ත්වයන් සැලකිය යුතු පරිදි වෙනස් වී ඇති අවස්ථාවක, පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු, එම්.එස්.එම්.ඊ. ණයකරු සමඟ සාකච්ඡා කර, 289 වන වගන්තිය යටතේ එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළෙහි සුළු වශයෙන් වෙනස් කිරීමේ ක්‍රියා පටිපාටිය කළ යුතු ද යන්න පිළිබඳව නිසි සැලකිල්ලක් දැක්විය යුතු ය.

**පුද්ගලික වස්තුභංගත්ව යෝජනාවන්: එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ**

**293.** (1) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු, මෙම කොටස යටතේ පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු වශයෙන් ක්‍රියා කරන විට -

(අ) එම යෝජකයා, එම්.එස්.එම්.ඊ. ණයකරුගේ නියෝජිතයකු නොවිය යුතු ය;

(ආ) යම් ණයහිමියකුගේ හෝ ණයහිමියන්ගේ නියෝජිතයකු නොවිය යුතු ය;

(ඇ) එම්.එස්.එම්.ඊ. ණයකරුට සහ ණයහිමියන්ට සෑහීමට පත් වන පරිදි විසඳුමක් ලබා ගැනීම සඳහා පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාගේ වෘත්තීයමය තත්ත්වයෙන්, එම්.එස්.එම්.ඊ. ණයකරු සහ ණයහිමියන් සමඟ ක්‍රියා කළ යුතු ය; සහ

(ඇ) මෙම පනතේ විධිවිධාන සහ 4 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් සාදන ලද යම් ආඥා, රීති, ප්‍රමිතීන්, චර්යාධර්ම සංග්‍රහ, ප්‍රායෝගික උපදෙස් හෝ මාර්ගෝපදේශ සම්බන්ධයෙන් වෘත්තීය ස්වාධීන විනිශ්චයක් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) තැනැත්තකුට පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු ලෙස සේවය කළ හැකි වනුයේ එම තැනැත්තා -

(අ) යෝජිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට අදාළව ප්‍රධාන නිලධරයකු ලෙස පත් කිරීමට සහ ක්‍රියා කිරීමට 12 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබා ඇත්නම්;

(ආ) යෝජිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට අදාළව ප්‍රධාන නිලතල දරන්නකු ලෙස පත් කිරීමට සහ ක්‍රියා කිරීමට අදාළ තැනැත්තා 12 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබා ඇති බව ලිඛිතව ස්ථිර කර ඇත්නම්; සහ

(ඇ) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු ලෙස පත් කිරීම සඳහා ලිඛිතව එකඟ වී ඇති අතර, පත් කරන අවස්ථාවේ දී කැමැත්ත ඉල්ලා අස්කර ගෙන නොමැති නම්,

පමණකි.

(2) යම් තැනැත්තකුගේ කැමැත්ත ඇතිව, පුද්ගල වස්තුභංගත්ව යෝජකයකු ලෙස පත් කරනු ලබන යම් තැනැත්තකු (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවල අවශ්‍යතා කිසිවක් සපුරා නොමැති බවට දැනුමක් ඇති විට, මෙම වගන්තිය යටතේ වරදක් සිදු කරන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්ලක්ෂයකට නොඅඩු සහ රුපියල් මිලියන දෙකකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකට ම එම තැනැත්තා යටත් විය යුතු ය.

පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු: එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ

**294.** (1) මෙම කොටස යටතේ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු ලෙස කටයුතු කරන පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු -

(අ) එම්.එස්.එම්.ඊ. ණයකරුගේ නියෝජිතයකු නොවිය යුතු ය;

(ආ) යම් ණයහිමියකුගේ හෝ ණයහිමියන්ගේ නියෝජිතයකු නොවිය යුතු ය;

(ඇ) එම්.එස්.එම්.ඊ. ණයකරුට සහ ණයහිමියන්ට සෑහීමට පත් වන පරිදි විසඳුමක් ලබා ගැනීම සඳහා පුද්ගලික වස්තුභංගත්ව යෝජකයාගේ වෘත්තීයමය තත්ත්වයෙන්, එම්.එස්.එම්.ඊ. ණයකරු සහ ණයහිමියන් සමඟ ක්‍රියා කළ යුතු ය; සහ

(ඈ) මෙම පනතේ විධිවිධාන සහ 4 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් සාදන ලද යම් ආඥා, රීති, ප්‍රමිතීන්, චර්යාධර්ම සංග්‍රහ, ප්‍රායෝගික උපදෙස් හෝ මාර්ගෝපදේශ සම්බන්ධයෙන් වෘත්තීයමය ස්වාධීන විනිශ්චයක් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) යම් තැනැත්තකුට පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස සේවය කළ හැකි වනුයේ එම තැනැත්තා -

(අ) යෝජිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ අදාළව ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කිරීමට සහ ක්‍රියා කිරීමට 12 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබා ඇත්නම්;

(ආ) යෝජිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළට අදාළව ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කිරීමට සහ ක්‍රියා කිරීමට අදාළ තැනැත්තා 12 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබා ඇති බව ලිඛිතව සහතික කර ඇත්නම්; සහ

(ඇ) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත් කිරීම සඳහා ලිඛිතව එකඟ වී ඇති අතර, පත් කරන අවස්ථාවේ දී කැමැත්ත ඉල්ලා අස්කර ගෙන නොමැති නම්,

පමණකි.

යම් තැනැත්තකුගේ කැමැත්ත ඇතිව පුද්ගල වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස පත් කරනු ලබන යම් තැනැත්තකු (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) යන ඡේදවල අවශ්‍යතා කිසිවක් සපුරා නොමැති බවට දැනුමක් ඇති විට, මෙම වගන්තිය යටතේ වරදක් සිදු කරන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්ලක්ෂයකට නොඅඩු සහ රුපියල් මිලියන දෙකකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකට ම එම තැනැත්තා යටත් විය යුතු ය.

එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ: අධිකරණ විධාන

**295.** (1) එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් සම්බන්ධයෙන් පැන නගින යම් කරුණක් සම්බන්ධයෙන් උපදෙස් හෝ නියෝගයක් සඳහා නිල දේපළ භාර ගැනුම්කරු විසින් හෝ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරු විසින් අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් මත, අධිකරණය විසින්-

(අ) උචිත යයි සලකනු ලබන විධාන නිල දේපළ භාර ගැනුම්කරුට හෝ පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට ලබා දිය හැකි ය;

(ආ) 290 වන වගන්තිය යටතේ එම්.එස්.එම්.ඊ. සමාගමේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ සන් කිරීම සඳහා වන ඉල්ලීමක් ලෙස එම ඉල්ලීම සලකනු ලැබිය හැකි ය; හෝ

(ඇ) 289 වන වගන්තිය යටතේ එම්.එස්.එම්.ඊ. සමාගම් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ වෙනස් කිරීම සඳහා වූ ක්‍රියාපටිපාටිය ආරම්භ කරන ලෙස පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුට ආඥා කරනු ලැබිය හැකි ය.

# XII වන කොටස

## ඇවර කිරීම

### 1 වන පරිච්ඡේදය

### ඇවරකරුගේ කාර්යභාරය

ඇවරකරුගේ කාර්යභාරය

**296.** 337 වන වගන්තියට යටත්ව, සහ මේ පනතේ අදාළ වන විධිවිධානවලට යටත්ව ඇවර කිරීමට භාජනය වී ඇති සමාගමක ඇවරකරුවකුට පහත දැක්වෙන අරමුණු තිබේ; එනම් -

(අ) සමාගමේ දේපළ මත පාලනය ක්‍රියාත්මක කිරීම;

(ආ) සමාගමේ දේපළ ආරක්ෂා කිරීම;

(ඇ) සමාගමේ දේපළ නැවත අත්කර ගැනීම; සහ

(ඈ) (i) සමාගමේ දේපළ විකිණීමෙන් ලැබෙන ආදායම; සහ

(ii) අදාළ වන අවස්ථාවලදී සමාගමේ දේපළ බෙදා හැරීම,

පනතේ අදාළ විධිවිධානවලට යටත් විය යුතු ය.

### 2 වන පරිච්ඡේදය

### ඇවර කිරීමේ ක්‍රියාවලිය

ඇවර කිරීම ආරම්භ වන්නේ කවර අවස්ථාවක ද යන වග

**297.** සමාගමක් ඇවර කිරීම ප්‍රතියෝජන ඇවරකරුවකු හැර මෙම කොටස යටතේ වෙනත් ඇවරකරුවෙකු පත්කරනු ලබන දිනයෙකදී සහ පත් කරනු ලබන වේලාවකදී ආරම්භ වන්නේ ය.

**298.** (1) (අ) යම් නම් කළ තැනැත්තකු ඇවරකරුවකු ලෙස පත් කිරීමෙන්; හෝ

ඇවරකරු පත් කිරීම

(ආ) නිල දේපළ භාරගැනුම්කරුවකු ඇවරකරුවකු ලෙස පත් කිරීම මගින්,

සමාගමක් ඇවර කිරීමට යටත් වන්නේ ය.

(2) ඇවරකරුවකු පත් කිරීම -

(අ) විශේෂ යෝජනා සම්මතයක් මගින් සමාගම විසින් සිදු කළ හැකි ය;

(ආ) සමාගමේ ව්‍යවස්ථාවලියේ නිශ්චිතව දක්වා ඇති යම් සිද්ධියක් සිදුවීමක් සම්බන්ධයෙන් යෝජනා සම්මතයක් මගින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය;

(ඇ) (i) සමාගමේ ඉල්ලීමක් මත;

(ii) සමාගමේ අධ්‍යක්ෂවරුන් එක් අයකුගේ හෝ කිහිප දෙනකුගේ ඉල්ලීම මත;

(iii) සමාගමේ සහදායකයකුගේ ඉල්ලීමක් මත;

(iv) සමාගමේ ණයහිමියකුගේ ඉල්ලීමක් මත (අනපේක්ෂිත හෝ අනාගත ණයහිමියකු ඇතුළුව);

(v) සමාගම අද්මිනිස්ත්‍රාසි සනයට භාජනය වී ඇත්නම් අද්මිනිස්ත්‍රාසිකරුගේ ඉල්ලීම මත;

(vi) දේපළ භාරගැනුම්කරුවකුගේ ඉල්ලීමක් මත;

(vii) රෙජිස්ට්‍රාර්වරයාගේ ඉල්ලීම මත; හෝ

(viii) අධිකාරියේ ඉල්ලීම මත,

අධිකරණය විසින් පත් කරනු හෝ ලැබිය හැකි ය; හෝ

(ඇ) 214 වන වගන්තිය යටතේ ප්‍රතිඵල රැස්වීමක දී සම්මත කරන ලද ණයහිමියන්ගේ යෝජනා සම්මතයක් මත කරනු ලැබිය හැකි ය.

(3) පහත සඳහන් අවස්ථාවල දී හැර, එනම්-

(අ) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ, සමාගමේ කොටස්වලට අදාළ ඡන්ද අයිතිය නිල දේපළ භාරගැනුම්කරු විසින් භාවිත කිරීම හේතුවෙන් විශේෂ යෝජනා සම්මතයක් සම්මත කර ඇති අවස්ථාවක -

(i) බංකොලොත්භාවය පිළිබඳ ආඥාවක් කර ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද එම තැනැත්තා; හෝ

(ii) නිල දේපළ භාරගැනුම්කරු ඇවරකරු වන වෙනත් සංස්ථාපිත මණ්ඩලයක් සම්බන්ධයෙන්; හෝ

(ආ) අධිකරණය විසින් ඇවරකරුවකු පත් කරනු ලැබූ අවස්ථාවක,

නිල දේපළ භාරගැනුම්කරු ඇවරකරු ලෙස පත් කරනු නොලැබිය හැකි ය.

(4) පහත දැක්වෙන පරිදි, එනම් -

(අ) 303 වන වගන්තිය සැලකිල්ලට ගැනීමේ දී සමාගම වස්තුභංගත්වයට පත් වී ඇති බවට; හෝ

(ආ) සමාගම ඇවර කිරීමට භාජනය කිරීම සාධාරණ හා යුක්ති සහගත බවට,

අධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක, අධිකරණය විසින් 2 වන උපවගන්තියේ (ඇ) වන ඡේදය යටතේ ඇවරකරුවකු පත් කරනු ලැබිය හැකි ය.

(5) පහත දැක්වෙන අවස්ථාවල දී, එනම් -

(අ) අවශ්‍ය පරිදි වියදම් සඳහා ඇප සපයා ඇත්නම් මිස; සහ

(ආ) ඇවර කිරීම සඳහා බැලුබැල්මට පෙනෙන නඩුවක් ස්ථාපිත කර ඇති බවට අධිකරණය සෑහීමකට පත් වන අවස්ථාවක හැර,

දැනට සිටින හෝ අනාගත ණයහිමියකු විසින් (2) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය යටතේ කරනු ලබන ඉල්ලීමක් අධිකරණය විසින් භාර නොගත යුතු ය.

(6) (2) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදය යටතේ කරන පත්වීමක් ලිඛිතව කළ යුතු ය.

(7) සමාගම් පනතේ 97 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය සහ 177 වන වගන්තියේ (3) වන උපවගන්තිය ද ඇතුළුව, (2) වන උපවගන්තියේ (ඇ) වන ඡේදයේ අඩංගු බලයක් නොවන බලයක් යටතේ සමාගමක් ඇවර කිරීමට ආඥා කරනු ලැබ ඇති අවස්ථාවක දී ඇවරකරු පත් කිරීම, (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (vii) වන අනුඡේදය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් කරන ලද ඉල්ලීමක් මත සියලු කාර්ය සඳහා එම උපවගන්තියේ (ඇ) වන ඡේදය යටතේ සිදු කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

සමාගම විසින් හෝ මණ්ඩලය විසින් ඇවරකරු පත් කිරීම පිළිබඳ සීමා කිරීම

**299.** 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර එය සමාගමට භාර දී ඇති අවස්ථාවක සහ එම කටයුතු අවසන් වී නොමැති විට, පහත සඳහන් අවස්ථාවල දී හැර, එනම් -

(අ) සමාගම වෙත ඉල්ලීම භාර දී වැඩ කරන දින හතක් ඇතුළත ඉල්ලීම ඉදිරිපත් කරන්නේ නම්;

(ආ) ණයහිමියාගේ පූර්ව ලිඛිත අවසරය ඇතිව 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ණයහිමියකු විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත්නම්;

(ඇ) අධිකරණයේ අවසරය ලබා ඇත්නම්; හෝ

(ඈ) පෙර ඇවරකරු පහත සඳහන් පරිදි, එනම් -

(i) මෙම උපවගන්තියේ පෙර ඡේදවලින් එකකට අනුකූලව; හෝ

(ii) මෙම ඡේදයට අනුකූලව,

පත් කරනු ලැබ ඇති විටෙක, ඇවරකරුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම සඳහා ප්‍රතියෝජක ඇවරකරුවකු ලෙස හෝ හැර 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදය යටතේ ඇවරකරුවකු පත් කරනු නොලැබිය හැකි ය.

ඇවර කිරීමේ ආරම්භය සටහන් කළ යුතු බව

**300.** (1) 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඇවරකරුවකු පත් කරනු ලැබූ අවස්ථාවකදී සමාගම විසින්, ඇවරකරු පත් කරනු ලබන විශේෂ යෝජනාවේ එය සම්මත කර ගනු ලැබූ දිනය සහ වේලාව සටහන් කළ යුතු ය.

(2) 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඇවරකරුවකු පත් කරනු ලැබූ අවස්ථාවකදී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම යෝජනා සම්මත කරන ලද දිනය සහ වේලාව ඇවරකරු පත් කරනු ලැබූ යෝජනා සම්මතයේ සටහන් කළ යුතු ය.

(3) 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ඇවරකරුවකු පත් කරනු ලැබූ අවස්ථාවක අධිකරණය විසින්, ඇවරකරු පත් කරනු ලැබූ ආඥාවේ නියෝජනය කරන ලද දිනය සහ වේලාව සටහන් කළ යුතු ය.

ප්‍රතිඵල රැස්වීමේ දී ඇවරකරු පත් කිරීම

**301.** (1) 214 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඇවරකරුවකු ප්‍රතිඵල රැස්වීමක දී යෝජනාවක් මගින් ණයහිමියන් විසින් පත් කිරීමේ දී -

(අ) යෝජනා සම්මතය මගින්, පත් කිරීම සඳහා යම් තැනැත්තකු නිශ්චිතව නම් කර නැති අවස්ථාවක; හෝ

(ආ) පත් කිරීම සඳහා යෝජනා සම්මතයේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තාගේ පත් කිරීම මගින් 312 වන වගන්තිය උල්ලංඝනය වන අවස්ථාවක,

නිල දේපළ භාරගැනුම්කරු ඇවරකරු විය යුතු ය.

(2) 214 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ණයහිමියන් විසින් ප්‍රතිඵල රැස්වීමක දී යෝජනා සම්මතයක් යටතේ ඇවරකරු පත් කරනු ලබන අවස්ථාවක අද්මිනිස්ත්‍රාසි කිරීම අවසානයේ දී අද්මිනිස්ත්‍රාසිකරු ලෙස ක්‍රියා කළ තැනැත්තා -

(අ) (1) වන උපවගන්තිය අදාළ ද නැද්ද යන්න රැස්වීමේ දී ස්ථිර කළ යුතු ය; සහ

(ආ) (1) වන උපවගන්තිය අදාළ වන්නේ නම්, නියම කරනු ලැබිය හැකි ආකාරයට, එම කාරණය නිල දේපළ භාරගැනුම්කරුට වහාම දැනුම් දිය යුතු ය.

**302.** (1) (4) වන උපවගන්තියේ (අ) ඡේදයට යටත්ව - බුන්වත් බව පිළිබඳ ප්‍රකාශය

(අ) 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදය යටතේ ඇවරකරුවකු පත් කරනු ලබන අවස්ථාවක දී; සහ

(ආ) එම පත්වීම සිදු කිරීමට පෙර, (2) වන උපවගන්තියේ කොන්දේසි සපුරාලන ලිඛිත ප්‍රකාශයක් -

(i) සමාගමේ සියලුම අධ්‍යක්ෂවරුන් විසින් ලබා දී ඇති අවස්ථාවක දී; හෝ

(ii) අධ්‍යක්ෂවරුන් දෙදෙනකුට වඩා සිටින සමාගමක නම්, සමාගමේ අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයක් එම ප්‍රකාශය කර ඇති අවස්ථාවක දී; සහ

එම ප්‍රකාශය රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත ගොනු කර ඇති අවස්ථාවක දී,

මේ වගන්තිය එවැනි සමාගමකට අදාළ වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කොන්දේසි විය යුත්තේ අදාළ ප්‍රකාශයෙහි-

(අ)(i) එම ප්‍රකාශය ලබා දෙන අධ්‍යක්ෂවරුන් විසින් සමාගමේ කටයුතු පිළිබඳ සම්පූර්ණ පරීක්ෂණයක් කර ඇති බව; සහ

(ii) එසේ කිරීමෙන් පසු, සමාගම ඇවර කිරීමක් ආරම්භ කර මාස දොළහකට නොවැඩි කාලයක් ඇතුළත සමාගමට සිය ණය සම්පූර්ණයෙන් ම ගෙවීමට හැකි වනු ඇති බවට වූ මතයක් එම අධ්‍යක්ෂවරුන් ඇති කරගෙන ඇති බව සඳහන් කර තිබීම;

(ආ) එම ප්‍රකාශය කිරීමට පෙර ප්‍රායෝගිකව හැකි මුල්ම දිනය වන විට ප්‍රකාශය කිරීමට පෙර සමාගමේ කටයුතු, ව්‍යාපාර කටයුතු සහ දේපළ සහ සමාගමේ මූල්‍යමය අවස්ථා පෙන්නුම් කරනු ලබන සම්පූර්ණ ප්‍රකාශයක් ඊට ඇතුළත් විය යුතු අතර, එම ප්‍රකාශය සිදු කිරීමට පෙර පෙන්විය හැකි මෑත ප්‍රායෝගික දිනයක් -

(i) යම් තොග පිළිබඳ ලැයිස්තුවක් සහ එම තොග විකිණීමෙන් ලබා ගැනීමට අපේක්ෂිත සම්පූර්ණ මුදල;

(ii) සමාගමේ ණය සහ අනෙකුත් බැරකම්;

(iii) එහි එක් එක් ණයහිමියන්ගේ නම සහ ලිපිනය;

(iv) එක් එක් ණයහිමියා විසින් දරනු ලබන පිළිබැඳීමක් හෝ පිළිබැඳීම් (ඇත්නම්);

(v) එක් එක් පිළිබැඳීමක් නිර්මාණය කළ දිනය;

(vi) ඇවර කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය, ගාස්තු සහ වියදම් සහ ඇවරකරුගේ ඇස්තමේන්තුගත පාරිශ්‍රමිකය; සහ

(vii) එම ප්‍රකාශ කරන දිනයේ දී සමාගමේ අධ්‍යක්ෂවරුන් වශයෙන් සිට තැනැත්තන් එක් අයකු හෝ වැඩි පිරිසක් විසින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක් ද,

ඇතුළුව එහි දේපළ පිළිබඳ විස්තරයක්;

(ඇ) එකී ප්‍රකාශය සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමක දී ඉදිරිපත් කරනු ලබන විට; සහ

(ඈ) ඇවරකරු පත් කළ දින සිට වැඩ කරන දින විස්සක් ඇතුළත ප්‍රකාශය කරනු ලබන බව,

එම ප්‍රකාශය කළ යුතු ය.

(3) ප්‍රකාශයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ සමාගමට සිය ණය සම්පූර්ණයෙන් ම ගෙවීමට හැකි වනු ඇතැයි යන මතය සඳහා සාධාරණ හේතු නොමැතිව(1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ප්‍රකාශයක් කරන අධ්‍යක්ෂවරයකු වරදක් සිදු කරන්නේ ය.

(4) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඉදිරිපත් කර ගොනු කරන ලද ප්‍රකාශයක නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ සමාගමට සිය ණය සම්පූර්ණයෙන් ම ගෙවීමට නොහැකි වනු ඇතැයි ඇවරකරුවකු විශ්වාස කරන හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබෙන විට -

(අ) මෙම වගන්තිය සමාගමට අදාළ වීම අවසන් වන නමුත් එයින් (3) වන උපවගන්තියට බලපෑමක් සිදුනොවිය යුතු අතර සීමා කිරීමක් ද සිදු නොවිය යුතුය; සහ

(ආ) ඇවරකරු ප්‍රායෝගිකව හැකි ඉක්මනින්, මෙම වගන්තිය තවදුරටත් සමාගමට අදාළ නොවන බවට රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට ලිඛිත දැනුම් දීමක් කළ යුතු ය.

(5) (4) වන උපවගන්තියේ (ආ) ඡේදයට අනුකූලවීමට අපොහොසත් වන ඇවරකරු වරදක් සිදු කරන්නේ ය.

(6) (1) වන උපවගන්තිය ප්‍රකාර, මෙම වගන්තියේ අදාළ වීම 306, 308, 310, 317, 319, 326, 330, 336, 338, 353, 357, 358, 421 සහ 426 යන වගන්ති යටතේ බලපෑම් ඇති කරනු ලැබේ.

ණය ගෙවීමට නොහැකි වීම පිළිබඳව සාක්ෂි

**303.** 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ වූ ඉල්ලීමක කාර්ය සඳහා ව්‍යවස්ථාපිත ඉල්ලීමක් බාර දුන් දින සිට දින විසිඑකක් සඳහා ඉල්ලුමට අනුකූල වීම සඳහා අපොහොසත් වූ එකී ඉල්ලීමට වූ බවට සාක්ෂි, සමාගම වස්තුභංගත්ව බවට සහ උපකල්පිත සාක්ෂි ලෙස පිළිගත නොහැකි ය. 409 වන වගන්තියේ (4) වන උපවගන්තියේ, ඉල්ලීමට අනුකූල වීම සඳහා අවසන් දිනට පසුව වැඩ කරන දින තිහක් ඇතුළත ඉල්ලීම ඉදිරිපත් කරන්නේ නම් මිස, එවැනි අසාර්ථක වීමක් හේතුවෙන් අදාළ නොවේ.

තාවකාලික ඇවරකරුවකු පත් කිරීම

**304.** (1) 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරන විට, එහි දී -

(අ) ඉල්ලුම්පත විභාග කරන විට ඇවරකරුවකු පත් කිරීම සඳහා නියෝගයක් නිකුත් කිරීමට ඉඩ ඇති බව අධිකරණය සලකන අවස්ථාවක දී; සහ

(ආ) ඉල්ලීම නිශ්චය කිරීමට තිබියදී සමාගමේ දේපළ හෝ සමාගමේ කටයුතු අනතුරකට භාජන වී ඇති බවට ප්‍රබල සාක්ෂි මත අධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක,

නිල දේපළ භාරගැනුම්කරු තාවකාලික ඇවරකරු ලෙස අධිකරණය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියෝගයක් දීමේ දී, එම නියෝගය නිකුත් කරන ලද දිනය සහ වේලාව අධිකරණය විසින් සටහන් කළ යුතු ය.

(3) සමාගමක තාවකාලික ඇවර කිරීම, (4) වන උපවගන්තිය යටතේ තාවකාලික ඇවරකරුවකු පත් කිරීම බලාත්මක වන දින සහ එම වේලාවේ දී ආරම්භ විය යුතු ය.

(4) තාවකාලික ඇවරකරුවකු පත් කිරීම, (1) වන උපවගන්තිය යටතේ නියෝගයක් කරනු ලබන දිනයේ දී සහ එම වේලාවේ දී බලාත්මක වන්නේ ය.

(5) තාවකාලික ඇවරකරුවකු විසින් හැකිතාක් ඉක්මනින් සහ කෙසේ වුව ද පත්කරනු ලැබීමෙන් වැඩ කරන දින පහක් ඇතුළත, එම පත් කිරීම පිළිබඳ දැන්වීම නියම කරනු ලැබිය හැකි තැනැත්තන්ට සහ නියම කරනු ලැබිය හැකි ආකාරයට ලබා දිය යුතු ය.

(6) තාවකාලික ඇවරකරුවකුගේ පත් කිරීම -

(අ) (i) තාවකාලික ඇවරකරුවකුගේ ඉල්ලීමක් මත;හෝ

(ii) 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තකුගේ ඉල්ලීමක් මත,

අවසන් කරනු ලැබිය හැකිය;

(ආ) (i) ඇවරකරුවකු පත් කිරීම සඳහා නියෝගයක් කිරීමේ දී; හෝ

(ii) 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ යටතේ වූ ඉල්ලීමක් අධිකරණය විසින් ප්‍රතික්ෂේප කිරීමේ දී,

අවසන් විය යුතු ය.

(7) (6) වන උපවගන්තිය යටතේ නියෝගයක් කිරීමේ දී අධිකරණය විසින් අවශ්‍ය පරිදි වෙනත් ඕනෑම අනුපූරක නියෝගයක් කරනු ලැබිය හැකි ය.

(8) තාවකාලික ඇවරකරුවකු පත් කිරීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත, තාවකාලික ඇවරකරුගේ පත්වීම අවසන් වන්නේ ය. තාවකාලික ඇවරකරු විසින් එම සේවය අවසන් වීම පිළිබඳව නියම කරනු ලැබිය හැකි තැනැත්තන්ට සහ එවැනි ආකාරයට දැනුම් දිය යුතු ය.

(9) (6) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනු ඡේදය යටතේ තාවකාලික ඇවරකරුවකුගේ සේවය අවසන් වනු ලබන අවස්ථාවේ දී, සමාගමේ කටයුතු, ව්‍යාපාර සහ දේපළ පාලනය ඇවරකරුගේ පාලනයට පත්කිරීම සඳහා අවශ්‍ය සියලු කටයුතු තාවකාලික ඇවරකරු විසින් වහාම කරනු ලැබිය යුතු ය.

ඇවර කිරීමේ දී අධ්‍යක්ෂ වරුන්ගේ ප්‍රකාශය

**305.** (1) නියම කරනු ලැබිය හැකි යම් අවස්ථාවල දී, මෙම වගන්තිය අදාළ නොවන්නේ ය.

(2) සමාගමක් ඈවර කිරීම ආරම්භ වීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත හෝ (4) වන උපවගන්තිය යටතේ යම් දීර්ඝ කරනු ලැබූ කාලසීමාවක් ඇතුළත සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් ගත් ප්‍රකාශය කිරීමට පෙර ප්‍රායෝගිකව හැකි ප්‍රථම දිනයේ දී සමාගමේ කටයුතු, ව්‍යාපාර, දේපළ සහ මූල්‍ය තත්ත්වයන් පෙන්නුම් කරන සම්පූර්ණ ප්‍රකාශයක්, ඒ ප්‍රකාශය කිරීමට පෙරාතුව වූ ප්‍රායෝගිකව හැකිතාක් ආසන්නම දිනයක් සඳහා පහත දැක්වෙන විස්තර, එනම් -

(අ) තොග පිළිබඳ ලැයිස්තුවක් සහ එම තොග මගින් ලැබීමට අපේක්ෂිත මුදල ඇතුළු සමාගමේ දේපළ පිළිබඳ විස්තරයක්;

(ආ) සමාගමේ ණය සහ වෙනත් බැරකම්;

(ඇ) සමාගමේ එක් එක් ණයහිමියන්ගේ නම සහ ලිපිනය;

(ඈ) එකී එක් එක් ණයහිමියා විසින් දරනු ලබන පිළිබැඳීමක් හෝ පිළිබැඳීම් (ඇත්නම්); සහ

(ඉ) එක් එක් පිළිබැඳීම් ඇති කර ගනු ලැබූ දිනය,

දක්වාලමින්, ඈවරකරුට ලබා දිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ ප්‍රකාශයක්, සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඈවරකරු විසින් සාධාරණ ලෙස ඉල්ලුම් කරනු ලබන පරිදි, පහත සඳහන් තැනැත්තන්ගෙන් එක් අයකු හෝ කිහිප දෙනකු විසින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කළ යුතු ය. එනම් -

(අ) සමාගමේ අධ්‍යක්ෂවරයකු නොවන, සමාගමේ නිලධරයකු වන්නාවූ හෝ එසේ කටයුතු කරනු ලැබූ තැනැත්තකු,

(ආ) ඈවර කිරීම ආරම්භ කළ දිනට පෙරාතුවම වූ මාස දොළහක කාලය තුළ යම් අවස්ථාවක සමාගම පිහිටුවීම, ප්‍රවර්ධනය හෝ කළමනාකරණය සඳහා සහභාගී වූ යම් තැනැත්තකු; හෝ

(ඇ) එකී කාලය ඇතුළත ආයතනයක අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු හෝ එම කාලසීමාව තුළ සේවයේ නියුක්තව සිටින හෝ එම කාලසීමාව

තුළ සිටි හෝ එම කාලය තුළ ප්‍රකාශය අදාළ වන සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු.

(4) ඇවරකරු විසින් හෝ අධිකරණය විසින්, (2) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයක් සැපයීම සඳහා වූ කාලසීමාව දීර්ඝ කළ හැකි ය.

(5) (2) වන උපවගන්තියට හෝ (3) වන උපවගන්තියට අනුකූල වීමට අපොහොසත් වන යම් තැනැත්තෙක් වරදක් සිදු කරන්නේ ය.

ඇවරකරු විසින් ණයහිමියන්ගේ රැස්වීම කැඳවිය යුතු බව

**306.** (1) ඇවරකරු විසින් පහත දැක්වෙන අවස්ථාවල දී, එනම්-

(අ) 302 වන වගන්තිය සමාගමට අදාළ නොවන අවස්ථාවක දී ඇවර කිරීම ආරම්භ වී වැඩ කරන දින දහයක් ඇතුළත; හෝ

(ආ)302 වන වගන්තිය සමාගමට අදාළ වීම අවසන් වන අවස්ථාවක දී, එම අවසන් වීමේ දින සිට වැඩ කරන දින දහයක් ඇතුළත,

ණයහිමියන්ගේ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(2) එකී රැස්වීමේ දී පහත සඳහන් කටයුතු සිදු කළ යුතු ය:-

(අ) රැස්වීමේ දී සහාගත කරන ලද ලේඛන ණයහිමියන් විසින් සලකා බැලීම;

(ආ) ඇවරකරු ප්‍රතියෝජනය කළ යුතු ද නැද්ද යන්න පිළිබඳව ණයහිමියන්ගේ යෝජනා සම්මතයක්; සහ

(ඇ) ඇවරකරු ඇවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුවක් පිහිටුවීමට අපේක්ෂා කරන්නේ නම් -

(i) 308 වන වගන්තිය යටතේ එවැනි කමිටුවක් ස්ථාපිත කරන්නේ ද නැද්ද යන්න පිළිබඳව; සහ

(ii) එවැනි කමිටුවක් පිහිටුවන්නේ නම්, එම කමිටුවේ සාමාජිකයන් ලෙස පත් කළ යුත්තේ කවුරුන්ද යන්න පිළිබඳව,

ණයහිමියන්ගේ යෝජනා සම්මත එකක් හෝ වැඩි ප්‍රමාණයක්.

(3) ඇවරකරු විසින් පහත දැක්වෙන ලිපි ලේඛන රැස්වීමේදී සභාගත කරනු ලැබිය යුතුය:-

(අ) වස්තුභංගත්වය පිළිබඳ වෘත්තිකයන්ගේ කාර්යපටිපාටිය සහ කාර්යසාධනය අධිකාරිය විසින් අධීක්ෂණය කරනු ලබන බවට සහ අධිකාරිය සමග සම්බන්ධ වීමට අවශ්‍ය තොරතුරු ලබා දෙන බවට ප්‍රකාශයක්;

(ආ) 312 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ලිඛිත සහතික කිරීම ;

(ඇ) 312 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ලිඛිත අනුමතය;

(ඈ) ඇවරකරු විසින් අත්සන් කරන ලද, 30 වන වගන්තියට අනුකූලව අයිතිවාසිකම් ප්‍රකාශයක් වූ; සහ

(ඉ) ඇවරකරුගේ යෝජිත පාරිශ්‍රමිකය පිළිබඳ පදනම හෝ පදනම් සහ අදාළ වන පරිදි ඇවරකරුගේ යෝජිත පාරිශ්‍රමික පිළිබඳ පැය ගණන සහ ප්‍රතිශතය අනුව ගණනය කළ අනුප්‍රමාණ හෝ අනු ප්‍රමාණයන් සහ නිශ්චිත මට්ටම හෝ මට්ටම්.

(4) (2) වන උපවගන්තිය යටතේ රැස්වීම පැවැත්වීමට අවශ්‍ය දිනට අවම වශයෙන් වැඩ කරන දින හතකට පෙර, ඇවරකරු විසින් -

(අ) සාධාරණ ලෙස ප්‍රායෝගිකව හැකි ප්‍රමාණයක වූ සමාගමේ ණයහිමියන්ට රැස්වීම පිළිබඳ ලිඛිත දැන්වීමක් දීම මගින්; සහ

(ආ) රැස්වීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කිරීම මගින්,

ඇවරකරු විසින් රැස්වීම කැඳවනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වන දැන්වීමක -

(අ) ඇවරකරු පත් කර ඇති බව සඳහන් කළ යුතු ය;

(ආ) පහත සඳහන් කාරණා, එනම් -

(i) ඇවරකරුගේ සම්පූර්ණ නම;

(ii) ඇවරකරු පත් කළ දිනය;

(iii) ඇවරකරු පත් කළ තැනැත්තාගේ අනන්‍යතාවය සහ ඇවරකරු පත් කරනු ලැබුවේ අධිකරණය විසින් නම්, පත් කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ ඉල්ලීම මතද, එකී තැනැත්තාගේ අනන්‍යතාවය; සහ

(iv) ඇවරකරුගේ කාර්යාල ලිපිනය සහ සාමාන්‍ය වැඩ කරන වේලාවන්හි දී, විමසීම් කළ හැකි දුරකතන අංකය,

එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කළ යුතු ය;

(ඇ) එම දැන්වීමෙහි -

(i) රැස්වීමේ දී සභාගත කිරීමට අපේක්ෂිත ලේඛන; සහ

(ii) රැස්වීමේ දී සිදු කළ යුතු කටයුතු,

නිශ්චිතව දැක්විය යුතු ය.

(ඈ) 308 වන වගන්තියේ සඳහන් කර ඇති කාරණා සාරාංශ කළ යුතු අතර, ඇවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුවක් පිහිටුවීමට ඇවරකරු අපේක්ෂා කරන්නේ, නම්, එවැනි කමිටුවක සාමාජිකත්වය සඳහා ඔහු විසින් නාමයෝජනා කැඳවිය යුතු ය.

(6) (2) වන උපවගන්තියේ සඳහන් රැස්වීමකට පස්වන උපලේඛනය අදාළ විය යුතු ය.

(7) රැස්වීම පැවැත්වීමෙන් පසු වැඩ කරන දින දෙකක් ඇතුළත, ඇවරකරු විසින් පහත දැක්වෙන ලේඛන, එනම් -

(අ) (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් ප්‍රකාශයේ පිටපතක්;

(ආ) (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් අයිතිවාසිකම් ප්‍රකාශයේ පිටපතක්; සහ

(ඇ) (4) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් දැන්වීමේ පිටපතක්,

රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත යැවිය යුතු ය.

(8) (1), (3), (4), (5) හෝ (7) යන උපවගන්තිවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැරහරින ඇවරකරුවකු වරදක් සිදු කරන්නේ ය.

ප්‍රතියෝජක ඇවරකරු

**307.** (1) ඇවරකරු ප්‍රතියෝජනය කළ යුතු බවට වූ යෝජනා සම්මතයක් 306 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ සම්මත කර ගනු ලබන අවස්ථාවක, ප්‍රතියෝජක ඇවරකරුවකු පත් කිරීම සඳහා ඇවරකරු විසින් වහාම අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(2) මේ වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් මත -

(අ) (i) සුදුසු ප්‍රතියෝජන ඇවරකරුවකු පත් කරමින්; හෝ

(ii) සුදුසු ප්‍රතියෝජක ඇවරකරුවකු පත් කිරීම සඳහා වූ කාර්යපටිපාටිය නිශ්චිතව දක්වමින්; සහ

(ආ) ප්‍රතියෝජන ඇවරකරු පත් කිරීමේ දී දැනට සිටින ඇවරකරු ඉවත් කරමින්,

අධිකරණය විසින් ආඥාවක් කළ හැකි ය.

(3) ප්‍රතියෝජක ඇවරකරුවකු විසින්, පත් කරනු ලැබීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත, 30 වන වගන්තියට අනුකූල වන පරිදි ඇවරකරු විසින් අත්සන් කරන ලද සම්බන්ධතාවය පිළිබඳ ප්‍රකාශයක්, එක් එක් ණයහිමියා වෙත යැවිය යුතු ය.

ඇවර කිරීමක දී ණයහිමියන්ගේ කමිටුව

**308.** (1) 302 වන වගන්තිය සමාගමට අදාළ වන තාක් කල් මෙම වගන්තිය සමාගමකට අදාළ නොවිය යුතු ය.

(2) ඇවර කිරීමක් සිදුකෙරෙමින් පවතිද් දී ඕනෑම අවස්ථාවක සහ ඇවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුවක් ඒ වන විටත් පිහිටුවා නොමැති නම්, ඇවරකරුවකු විසින් -

(අ) ණයහිමියකු විසින් නියම කරනු ලැබිය හැකි ඇවර කිරීම පිළිබඳ ඒ සඳහා ඉල්ලා සිටින්නේ නම්, ඇවර කිරීම පිළිබඳ, ණයහිමියන්ගේ කමිටුවක් පිහිටුවීමට ඉල්ලා සිටිය යුතු ය; හෝ

(ආ) ඇවරකරුගේ ම යෝජනාව මත ඇවර කිරීම පිළිබඳ ණයහිමියන්ගේ කමිටුවක් පිහිටුවීමට ඉල්ලා සිටිය හැකි ය.

(3) ඇවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුවක් පිහිටුවීම සඳහා සහ එවැනි කමිටුවකට කරනු ලබන පත් කිරීම් සඳහා ණයහිමියන්ගේ රැස්වීමක දී සම්මත කරගත් ණයහිමියන්ගේ යෝජනා සම්මත එකක් හෝ කිහිපයක් අවශ්‍ය වන අතර -

(අ) (2)වනඋපවගන්තියේ(අ)ඡේදයයටතේකරනලද ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට, ඇවරකරුට ඉල්ලීමක් ලැබීමෙන් පසු වැඩ කරන දින හතක් ඇතුළත ඇවරකරු එම රැස්වීම පැවැත්විය යුතු ය; සහ

(ආ) ඒ පිළිබඳ දැන්වීමෙහි -

(i) මෙම වගන්තියේ සඳහන් කර ඇති කාරණා සංක්ෂිප්ත ලෙස දැක්විය යුතු ය; සහ

(ii) ඇවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුවේ සාමාජිකත්වය සඳහා නාමයෝජනා කැඳවිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් රැස්වීමකට පස්වන උපලේඛනය අදාළ විය යුතු ය.

(5) ඇවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුවක් පිහිටුවනු ලැබුවහොත් -

(අ) එම කමිටුවට පහත සඳහන් කාර්යයන් තිබිය යුතු ය, එනම් -

(i) ඇවර කිරීමට සම්බන්ධ කාරණා පිළිබඳව ඇවරකරු විමසීම; සහ

(ii) (6) වන උපවගන්තිය යටතේ ඇවරකරු විසින් එවන ලද වාර්තා සලකා බැලීම; සහ

(ආ) එම කමිටුව විසින් ඇවරකරුට විධාන ලබා දීම නොකරනු ලැබිය හැකිය.

(6) ඇවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුවක් පිහිටුවනු ලැබුවහොත් නියම කළ හැකි ආකාරයට වූ තොරතුරු ඇතුළත් වාර්තා නියම කළ හැකි කාලසීමාවක් තුළ නියම කරනු ලැබිය හැකි ආකාරයට ඇවරකරු විසින් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(7) යම් තැනැත්තකු -

(අ) ණයහිමියකු බවට;

(ආ) සාමාන්‍ය ඇටෝර්නි බලයක් යටතේ ණයහිමියකුගේ නියෝජිතයකු වන බවට; හෝ

(ඇ) සාමාජිකයකු වීමට ණයහිමියකු විසින් ලිඛිතව අවසර දී ඇති තැනැත්තකු බවට,

ඇවරකරු සෑහීමට පත් වන්නේ නම් මිස, එම තැනැත්තා ඇවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුවක සාමාජිකයකු වීමට සුදුස්සකු නොවන්නේ ය.

(8) ඇවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුවක් සම්බන්ධයෙන් වන විට, පහත සඳහන් කාරණා, එනම් -

(අ) කමිටුවේ සාමාජිකත්වය සහ සාමාජිකත්වය අවසන් කිරීම;

(ආ) කමිටුව පිහිටුවීම සහ කමිටුවට අදාළ කාරණා පිළිබඳ දැනුම් දීම;

(ඇ) කමිටුවේ රැස්වීම් කැඳවීමේ කාර්යපටිපාටිය;

(ඈ) කමිටුවේ සාමාජිකයන් විසින් සිදු කරන ලද හෝ ගනු ලබන ක්‍රියා, අත් හැරීම් හෝ තීරණ ආරක්ෂා කිරීම;

(ඉ) කමිටුවේ සාමාජිකයින්ගේ වියදම් ප්‍රතිපූරණය කිරීම; සහ

(ඊ) කමිටුවේ සාමාජිකයන් සහ ඔවුන්ගේ ආශ්‍රිත පාර්ශ්වයන් විසින් කරනු ලබන ගනුදෙනු,

නියම කළ හැකි අවශ්‍යතා, සීමා කිරීම් සහ සීමාවන්ට යටත් විය යුතු ය.

(9) ඈවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුවක සාමාජිකයන්ගේ සුදුසුකම්, නාමයෝජනා කිරීමේ හෝ තෝරා පත් කර ගැනීම්වල ඇති දෝෂවල ප්‍රතිඵල, නියම කළ හැකි පරිදි විය යුතු ය.

(10) ඈවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුවක ඇති පුරප්පාඩු හේතුවෙන්, කමිටුවට ක්‍රියා කිරීමට නොහැකි වූ විට, ඈවරකරු ප්‍රායෝගිකව හැකි ඉක්මනින් දන්නා සෑම ණයහිමියකුට ම ඒ බව ලිඛිතව දැනුම් දිය යුතු ය.

ඈවර කිරීමේ දී සහදායකයන්ගේ කමිටුව

**309.** (1) ඈවර කිරීමක දී යම් අවස්ථාවක සහ ඈවර කිරීමේ සහදායක කමිටුවක් දැනටමත් පිහිටුවා නොමැති නම්, ඈවරකරුවකු විසින් -

(අ) ඈවර කිරීමේ සහදායක කමිටුවක් ස්ථාපිත කිරීම සඳහා, නියම කරනු ලැබිය හැකි ආකාරයට සහදායකයකු විසින් ඉල්ලා සිටින්නේ නම්, ඈවර කිරීමේ සහදායක කමිටුවක් පිහිටුවීමට ඈවරකරු කටයුතු කළ යුතු ය; හෝ

(ආ) ඇවරකරුගේ ම මෙහෙයවීමෙන් ඇවර කිරීමේ සහදායක කමිටුවක් පිහිටුවීමට ඇවරකරුට කටයුතු කළ හැකි ය.

(2) ඇවර කිරීමේ සහදායක කමිටුවක් පිහිටුවීම සහ එවැනි කමිටුවකට පත් කිරීම සිදු කිරීම සඳහා සහදායකයන්ගේ රැස්වීමක දී සම්මත කර ගනු ලබන සහදායකයන්ගේ යෝජනා සම්මත එකක් හෝ කිහිපයක් අවශ්‍ය විය යුතු ය, ඒ සඳහා -

(අ) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට, එම ඉල්ලීම ඇවරකරුට ලැබුණු දින සිට වැඩ කරන දින හතක් ඇතුළත ඇවරකරු විසින් එම රැස්වීම පැවැත්විය යුතු ය; සහ

(ආ) ඒ පිළිබඳ එම දැන්වීම මගින් -

(i) මෙම වගන්තියේ සඳහන් කාරණා සංක්ෂිප්ත ලෙස දක්වා තිබිය යුතු ය; සහ

(ii) ඇවර කිරීමේ සහදායක කමිටුවේ සාමාජිකත්වය සඳහා නාමයෝජනා කැඳවනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් රැස්වීමකට පස්වන උපලේඛනය අදාළ විය යුතු ය.

(4) ඇවර කිරීමේ සහදායක කමිටුවක් පිහිටුවනු ලැබුවහොත් -

(අ) එම කමිටුවට-

(i) ඇවර කිරීම සම්බන්ධ කාරණා පිළිබඳව ඇවරකරු සමග සාකච්ඡා කිරීම; සහ

(ii) (5) වන උපවගන්තිය යටතේ ඇවරකරු විසින් එවන ලද වාර්තා සලකා බැලීම; සහ

යන කර්තව්‍ය තිබිය යුතු ය.; සහ

(ආ) ඇවර කිරීමේ සහදායක කමිටුවක් විසින් ඇවරකරුට විධාන ලබා නොදිය හැකි ය.

(5) ඇවර කිරීමේ සහදායක කමිටුවක් පිහිටුවනු ලැබුවහොත් ඇවරකරු විසින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ තොරතුරු ඇතුළත් වාර්තා නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ නියම කරනු ලැබිය හැකි කාල සීමාවක් ඇතුළත කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(6) යම් තැනැත්තකු -

(අ) සහදායකයකු බවට;

(ආ) සාමාන්‍ය ඇටෝර්නි බලයක් යටතේ සහදායකයකුගේ නියෝජිතයකු වන බවට; හෝ

(ඇ) සාමාජිකයකු වීමට සහදායකයකු විසින් ලිඛිතව අවසර දී ඇති තැනැත්තකු බවට,

ඇවරකරු සෑහීමට පත් වන්නේ නම් මිස, එම තැනැත්තා ඇවර කිරීමේ සහදායකයන්ගේ කමිටුවක සාමාජිකයකු වීමට සුදුස්සකු නොවන්නේ ය.

(7) ඇවර කිරීමේ සහදායක කමිටුවක් සම්බන්ධයෙන් පහත දක්වා ඇති කාරණා, එනම් -

(අ) කමිටුවේ සාමාජිකත්වය සහ සාමාජිකත්වය අවසන් කිරීම;

(ආ) කමිටුව පිහිටුවීම සහ කමිටුවට අදාළ කාරණා පිළිබඳ දැනුම් දීම;

(ඇ) කමිටුවේ රැස්වීම් කැඳවීමේ කාර්යපටිපාටිය;

(ඈ) කමිටුවේ සාමාජිකයන් විසින් සිදු කරන ලද හෝ ගනු ලැබූ ක්‍රියා, අතපසු වීම් හෝ තීරණ ආරක්ෂා කිරීම;

(ඉ) කමිටුවේ සාමාජිකයින්ගේ වියදම් ප්‍රතිපූරණය කිරීම; සහ

(ඊ) කමිටුවේ සාමාජිකයන් සහ ඔවුන්ගේ සම්බන්ධිත පාර්ශ්වයන් විසින් කරනු ලබන ගනුදෙනු,

නියම කළ හැකි පරිදි වූ අවශ්‍යතා, පරිසීමා කිරීම් සහ සීමාවන්ට යටත්ව සිදු විය යුතු ය.

(8) ඇවර කිරීමේ සහදායක කමිටුවක සාමාජිකයන්ගේ සුදුසුකම්, නාමයෝජනා හෝ තෝරා පත් කිරීම්වල දෝෂයන්හි ප්‍රතිඵල, නියම කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

(9) ඇවර කිරීමේ සහදායක කමිටුවක ඇති පුරප්පාඩු හේතුවෙන්, කමිටුවට ක්‍රියා කිරීමට නොහැකි වූ විට, ඇවරකරු විසින් ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මනින් සෑම සහදායකයකුට ම ඒ බව ලිඛිතව දැනුම් දිය යුතු ය.

ඇවර කිරීමකදී කොටස් හිමියන්ගේ, ණයහිමියන්ගේ, සහදායකයින්ගේ සහ කමිටුවල රැස්වීම්

**310.** (1) ඇවරකරු විසින් ඇවර කිරීම අවසන් වන තුරු සෑම විටම -

(අ) සමාගමට 302 වන වගන්තිය අදාළ වන විට,

(i) අවම වශයෙන් කොටස් හිමියන් පස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින්; හෝ

(ii) සියලුම කොටස් හිමියන්ගේ මුළු ඡන්ද අයිතියෙන් සියයට දහයකට නොඅඩු කොටසක් නියෝජනය කරන කොටස් හිමියකු හෝ කොටස් හිමියන් විසින්

කරනු ලබන ඉල්ලීමක් මත කොටස් හිමියකු හෝ කොටස් හිමියන් විසින් කරන ලද ඉල්ලීම ලැබීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත කොටස් හිමියන්ගේ එම රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය;

(ආ) ඇවරකරු විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයට ණයහිමියන්ගේ රැස්වීම් කැඳවිය යුතු ය;

(ඇ) ඇවරකරු විසින් සුදුසු යයි සලකනුලබනආකාරයට කොටස් හිමියන්ගේ රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය;

(ඈ) ඇවරකරු විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයට සහදායකයින්ගේ රැස්වීම් කැඳවිය යුතු ය;

(ඉ) ඇවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුවක රැස්වීම් (ඇත්නම්) -

(i) ඇවරකරු විසින් සුදුසු යයි සලකන පරිදි කැඳවිය යුතු ය;

(ii) එම කමිටුව සාධාරණ ලෙස ඉල්ලා සිටින පරිදි එම කමිටුවේ ඉල්ලීම ලැබී වැඩ කරන දින පහක් ඇතුළත කැඳවිය යුතුය; සහ

(ඊ) ඇවර කිරීමේ සහදායක කමිටුවක යම් රැස්වීම් (ඇත්නම්) -

(i) ඇවරකරු සුදුසු යයි සලකන පරිදි කැඳවීම කළ යුතු ය;

(ii) එම කමිටුව සාධාරණ ලෙස ඉල්ලා සිටින පරිදි එම කමිටුවේ ඉල්ලීම ලැබී වැඩ කරන දින පහක් ඇතුළත කැඳවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදයන්හි සඳහන් රැස්වීම්වලට පස්වන උපලේඛනය අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ඉ) සහ (ඊ) ඡේද යටතේ කැඳවනු ලබන රැස්වීම්වල දැනුම්දීම සහ කටයුතු පැවැත්වීම සඳහා වන නියමයන්, නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(4) මෙම වගන්තිය යටතේ කැඳවනු ලබන රැස්වීමක දී සම්මත කරනු ලබන යෝජනා සම්මතයක දක්වා ඇති අදහස් සම්බන්ධයෙන් ඇවරකරු සැලකිල්ල දැක්විය යුතු ය.

(5) සමාගමක එකම කොටස් හිමියා හෝ එකම සහදායකයා විසින්, අවස්ථාවෝචිත පරිදි කොටස් හිමියන්ගේ හෝ සහදායකයින්ගේ රැස්වීමක දී තීරණය කරනු ලැබිය හැකි වූ යම් කාරණයක් පිළිබඳ අදහසක් ඇවරකරුට ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එම අදහස අවස්ථාවෝචිත පරිදි කොටස් හිමියන්ගේ හෝ සහදායකයින්ගේ රැස්වීමක දී සම්මත කරන ලද යෝජනාවක දක්වා ඇති අදහසක් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

**311.** යම් ඇවර කිරීමක් - ඇවර කිරීමේ අවසානය

(අ) ඇවර කිරීම ආරම්භ වන විට තිබූ පරිදි වූ සමාගමේ සියලුම දේපළ උපලබ්ධව බෙදා හරින ලැබ හෝ ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අතර ඒ දේපළ උපලබ්ධ වී ලැබෙන ආදායම, ප්‍රායෝගිකව, හැකි ප්‍රමාණයන් බෙදා හරිනු ලැබ ඇති; හෝ

(ආ) අධිකරණය විසින් 362 වන වගන්තිය (3) වන උපවගන්තිය යටතේ හෝ අධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි වෙනත් බලයක් ක්‍රියාත්මක කිරීමේ දී අධිකරණය විසින් ඇවර කිරීම අවසන කරනු ලබන හෝ දිනයේදී සහ වේලාවේ දී අවසන් වේ.

## 3 වන පරිච්ඡේදය

### ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු පත් කිරීම

**312.** (1) නිල දේපළ භාරගැනුම්කරු හැර, වෙනත් යම් තැනැත්තකු - ඇවරකරු ලෙස පත් කළ හැක්කේ සහ ක්‍රියා කළ හැක්කේ කවුරුන් ද යන වග

(අ) ඇවර කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන නිලධරයකු ලෙස පත් කරනු ලැබීමට සහ ක්‍රියා කිරීමට 12 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබා ඇත්නම්;

(ආ) 313 වන වගන්තිය යටතේ ඇවරකරුවකු ලෙස පත් කරනු ලැබීමට හෝ ක්‍රියා කිරීමට නුසුදුස්සකු නොවන්නේ නම්;

(ඇ) එම තැනැත්තා -

(i) ඇවර කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන තනතුරකට පත් කරනු ලැබීමට සහ එම තනතුරේ ක්‍රියා කිරීමට 12 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබා ඇති බව; සහ

(ii) ඇවරකරුවකු ලෙස පත් කරනු ලැබීමට හෝ එවැන්නකු එය ක්‍රියා කිරීමට 313 වන

වගන්තිය යටතේ නුසුදුස්සකු නොවන බව ලිඛිතව සහතික කරනු ලැබ ඇත්නම්; සහ

(ඇ) එම තැනැත්තා, පත් කිරීම පිළිබඳව ලිඛිතව කැමැත්ත පළ කර ඇත්නම් සහ පත් කිරීම සිදු කරන අවස්ථාවේ දී එම කැමැත්ත ඉල්ලා අස්කර ගෙන නැත්නම්,

එම තැනැත්තා සමාගමක ඈවරකරු ලෙස පත් කරනු ලැබීමට හෝ එවැන්නකු ලෙස ක්‍රියා කිරීමට හැකි වේ.

(2) (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් කවර හෝ අවශ්‍යතාවක් සපුරා නොමැති බව දනිමින් ම, නිල දේපළ භාරගැනුම්කරු නොවන යම් තැනැත්තකු, එම තැනැත්තාගේ කැමැත්ත ඇතිව සමාගමක ඈවරකරුවකු ලෙස පත් කරනු ලැබ ඇති හෝ එවැන්නකු ලෙස කටයුතු කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන්නේ ය.

ඈවරකරුවකු ලෙස කටයුතු කිරීමට හෝ ක්‍රියා කරනු ලැබීමට නුසුදුසුකම්

**313.** (1) නිල දේපළ භාරගැනුම්කරු හැර, පහත සඳහන් තැනැත්තන් සහ ඔවුන්ගේ ආශ්‍රිත පාර්ශ්වයන් සමාගමක ඈවරකරු ලෙස කරනු ලැබීමට හෝ ඔවුන් වෙනුවෙන් ක්‍රියා කිරීමට නුසුදුස්සන් වන්නෝ ය. එනම් -

(අ) සමාගමෙහි ඈවර කිරීම ආරම්භ කිරීමේ දිනයට පෙරාතුවම වූ අවුරුදු දෙකක කාලසීමාවක් ඇතුළත, සමාගමෙහි අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස හැර, ණයහිමියකු වශයෙන් සිටින හෝ සිටිනු ලැබූ තැනැත්තකු;

(ආ) සමාගමෙහි ඈවර කිරීම ආරම්භ කළ දිනට පෙරාතුවම වූ අවුරුදු දෙකක කාලසීමාවක් ඇතුළත, සමාගමෙහි හෝ සම්බන්ධිත සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු හෝ විගණකවරයකු හෝ සේවකයකුව සිටින හෝ වූ තැනැත්තකු;

(ඇ) ඈවර කිරීම ආරම්භ කළ දිනට වූ පෙරාතුවම අවුරුදු දෙකක කාලයක් ඇතුළත -

(i) සමාගම විසින් හෝ සම්බන්ධිත සමාගමක් විසින් නිකුත් කරන ලද කොටසකට ඍජු සම්බන්ධතාවයක් ඇත්තා වූ හෝ ඇතිව සිටි තැනැත්තකු; හෝ

(ii) සමාගම විසින් හෝ සම්බන්ධිත සමාගමක් විසින් නිකුත් කරන ලද ඕනෑම පංතියක කොටස්වලින් සියයට පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයකට ඍජු නොවන සම්බන්ධයක් ඇත්තා වූ හෝ ඇතිව සිටි තැනැත්තකු; හෝ

(ඈ) ඇවර කිරීම ආරම්භ කළ දිනට පෙරාතුවම වූ අවුරුදු තුනක කාලසීමාව තුළ සමාගමේ දේපළ සම්බන්ධයෙන් දේපළ භාරගැනුම්කරුවකු හෝ පත්වීම්ලාභියකු වන තැනැත්තකු,

නුසුදුස්සකු වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නුසුදුස්සකු වූ විට, ඇවරකරු ලෙස පත් කරනු ලබන හෝ ක්‍රියා කරන තැනැත්තකු වරදක් සිදු කරන්නේ ය.

ඇවරකරුවන් හෝ තාවකාලික ඇවරකරුවන් දෙදෙනෙක් හෝ වැඩි ගණනක් පත් කිරීම

**314.** (1) මෙම කොටස ඇවරකරුවකු පත් කිරීම සඳහා විධිවිධාන සපයන යම් අවස්ථාවක දී තැනැත්තන් දෙදෙනකු හෝ වැඩි ගණනක් ඇවරකරුවන් ලෙස පත් කළ හැකි ය.

(2) තැනැත්තන් දෙදෙනකු හෝ වැඩි ගණනක් ඇවරකරුවන් ලෙස පත් කරනු ලබන අවස්ථාවක දී-

(අ) ඇවරකරුවන් පත් කිරීම සඳහා වූ යෝජනා සම්මතයේ හෝ නියෝගයේ අන්‍යාකාරයකට විධිවිධාන සලසා ඇත්නම් මිස, ඇවරකරුවකු ගේ කර්තව්‍යයන් සහ බලතල ඔවුන්ගෙන් එක් අයකු විසින් හෝ දෙදෙනකු හෝ වැඩි ගණනක් එක්ව හෝ විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය;

(ආ) ඇවරකරුවන් වශයෙන් එම තැනැත්තන්ගේ යම් වගකීමක් එක්ව සහ වෙන් වෙන්ව විය යුතු ය; සහ

(ඇ) මෙම පනතේ ඇවරකරුට කරන යම් සඳහනක් මගින් අවස්ථාවට අවශ්‍ය පරිදි, ඇවරකරුවන් එක් අයකු හෝ වැඩි ගණනකට කරන සඳහනක් වන්නේ ය .

ඇවරකරුගේ පත්වීමේ දැනුම් දීම සහ විස්තර

**315.** (1) ඇවරකරුවකු විසින් -

(අ) පත්වීමෙන් පසු ඊළඟ වැඩ කරන දිනය අවසන් වීමට පෙර, රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට පත්වීම පිළිබඳ ලිඛිත දැනුම් දීමක් කළ යුතු ය;

(ආ) පත්වීමෙන් පසු වැඩ කරන දින දෙකක් ඇතුළත පහත දැක්වෙන විස්තර ඇතුළු ව, ඇවරකරුගේ පත්වීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක්, එනම් -

(i) ඇවරකරුගේ සම්පූර්ණ නම;

(ii) පත්වීමේ දිනය;

(iii) ඇවරකරු පත් කළ තැනැත්තාගේ අනන්‍යතාවය සහ ඇවරකරු පත් කරනු ලැබුවේ අධිකරණය විසින් නම්, පත් කිරීම සඳහා ඉල්ලුම් කරනු ලැබූ තැනැත්තාගේ අනන්‍යතාවය;

(iv) ඇවරකරුගේ කාර්යාල ලිපිනය සහ සාමාන්‍ය වැඩ කරන වේලාවන්හි දී, ඇවරකරුට විමසීම් යොමු කරනු ලැබිය හැකි දුරකථන අංකය; සහ

(v) සාකච්ඡා කර, ඇවරකරුගෙන් ලැබුණු වාර්තා සලකා බැලීම සඳහා ණයහිමියන්ගේ සහ සහදායකයින්ගේ කමිටු පිහිටුවීම පිණිස නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් ඉල්ලීම් කළ හැකි බවට වූ ප්‍රකාශයක්;

ඇතුළත් ප්‍රසිද්ධ දැන්වීමක් පළ කළ යුතු ය.

(ඇ) ප්‍රසිද්ධ දැන්වීමේ පිටපතක් -

(i) දන්නා එක් එක් ණයහිමියාට සහ සහදායකයාට;

(ii) රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට යැවිය යුතුය; සහ

(ඈ) පත්වීමෙන් පසු වැඩ කරන දින විස්සක් ඇතුළත -

(i) සමාගමේ කටයුතු, ව්‍යාපාර, දේපළ සහ මූල්‍ය තත්ත්වයන් පිළිබඳ වාර්තාවක් සකස් කළ යුතු ය;

(ii) නියම කරනු ලැබිය හැකි ආකාරයට, (i) වන ඡේදයේ සඳහන් වාර්තාව දන්නා, එක් එක් ණයහිමියාට සහ සහදායකයාට යැවිය යුතු ය; සහ

(iii) එම වාර්තාවේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට යැවිය යුතු ය.

(2) ඇවරකරුවකුගේ පත් කිරීම දැනටමත් වැදගත් ධුරය දරන ඇවරකරුවකුට අමතරව හෝ ඇවරකරුවකු ලෙස ධුරයෙන් ඉවත් වූ තැනැත්තකු වෙනුවට වන අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ ඇති සෑම දැන්වීමක ම එම කාරණය සඳහන් කළ යුතු ය.

(3) ඇවරකරුගේ කාර්යාලයේ ලිපිනයේ හෝ සම්බන්ධතා අංකයේ යම් වෙනසක් සිදු වුවහොත්, ඇවරකරු විසින් වැඩ කරන දින දෙකක් ඇතුළත -

(අ) අවස්ථාවෝචිත පරිදි නව ලිපිනය හෝ සම්බන්ධතා අංකය පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් කළ යුතු ය; සහ

(ආ) එම ප්‍රසිද්ධ දැන්වීමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට යැවිය යුතු ය.

(4) මෙම වගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම මගින් ඇවරකරුවකු ලෙස යම් තැනැත්තකුගේ පත්වීමේ වලංගුභාවයට බලපෑමක් සිදු නොවන්නේ ය.

(5) මෙම වගන්තියට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන ඇවරකරුවකු වරදක් සිදු කරන්නේ ය.

ලේඛනවල ඇවර කිරීම පිළිබඳව සඳහන් කළ යුතු බව

**316.** (1) සමාගමක් ඇවර කිරීමට භාජනය වී තිබෙන තාක් කල්, ඇවරකරු විසින් පහත දැක්වෙන කාරණා පිළිබඳව එනම් -

(අ) සමාගම වෙනුවෙන් හෝ ඇවරකරු වෙනුවෙන් නිකුත් කරන ලද හෝ අත්සන් කරන ලද සෑම ලේඛනයක ම සමාගමේ නම මුලින්ම සඳහන් වන අවස්ථාවේදී, සමාගමේ නමට පසුව "ඇවර කිරීමට භාජනය වී ඇති" යන වචන තිබිය යුතු බවට; සහ

(ආ) සමාගමට වෙබ් අඩවි එකක් හෝ කිහිපයක් තිබේ නම්, එක් එක් වෙබ් අඩවියේ සෑම පිටුවක ම සමාගම ඇවර කිරීමට භාජනය වී ඇති ඇති බව ප්‍රකටව පෙනෙන පරිදි සඳහන් කළ යුතු බවට,

සහතික විය යුතුය.

(2) (1) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වීම මගින් -

(අ) ඇවරකරු වශයෙන් යම් තැනැත්තකුගේ පත් කිරීමේ; හෝ

(ආ) යම් ලේඛනයක; හෝ

වලංගුභාවයට බලපෑමක් සිදු නොවන්නේ ය.

(3) (1) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන්නේ ය.

## 4 වන පරිච්ඡේදය

### ඇවර කිරීමේ බලපෑම

ඇවර කිරීමක් තුළ දී පිළිබැඳුමක් බලාත්මක නොකළ යුතු බව

**317.** (1) 302 වන වගන්තිය යම් සමාගම ට අදාළ වන තාක් කල් මෙම වගන්තිය එම සමාගමට අදාළ නොවිය යුතු ය.

(2) සමාගමක් ඇවර කිරීමේ දී, 322 වන වගන්තියට යටත්ව -

(අ) ඇවරකරුගේ පූර්ව ලිඛිත කැමැත්ත; හෝ

(ආ) අවශ්‍ය විය හැකි පරිදි වූ යම් නියමයන් සහ කොන්දේසි මත අධිකරණයේ අවසරය,

ඇතිව මිස, සමාගමේ දේපළ මත වූ පිළිබැඳුමක් කිසිම තැනැත්තකු විසින් බලාත්මක නොකළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කැමැත්ත ලබා දීම ප්‍රතිපෝෂණය කිරීම සම්බන්ධයෙන් ඇවරකරුවකු අලාභ ගෙවීමට යටත් නොවිය යුතු ය.

ඇවර කිරීම සිදුවෙමින් පවතිද්දී කිසිදු සාමාන්‍ය නඩු කටයුත්තක් ආරම්භ කිරීම හෝ ඉදිරියට ගෙන යාම නොකළ යුතු බව

**318.** (1) සමාගමක් ඇවර කිරීම සිදුවෙමින් පවතිද්දී සමාගමට හෝ සමාගමක දේපළවලට එරෙහිව යම් විධිමත් නඩු කටයුත්තක් ආරම්භ කිරීම හෝ ඉදිරියට ගෙන යාම -

(අ) ඇවරකරුගේ පූර්ව ලිඛිත කැමැත්ත ඇතිව මිස; හෝ

(ආ) අවශ්‍ය පරිදි වූ නියම සහ කොන්දේසි මත අධිකරණයේ අවසරය ඇතිව මිස,

නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, "විධිමත් නඩු කටයුත්ත" යන්නට -

(අ) යම් නීති කෘත්‍යයක්; සහ

(ආ) යම් සමථකරණයක් හෝ බේරුම් කිරීමේ ක්‍රියාවලියක් හෝ වෙනත් විධිමත් ප්‍රතිකූල ක්‍රියාවලියක්,

ඇතුළත් වේ.

(3) (1) වන උපවගන්තිය (අ) ඡේදය යටතේ කැමැත්ත ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ඇවරකරු අලාභ ගෙවීමට යටත් නොවිය යුතු ය.

ඇවර කිරීමේ දී තහනමට ගැනීමක් හෝ වෙනත් ක්‍රියාවලියක් නොකළ යුතු බව

**319.** (1) යම් සමාගමකට 302 වන වගන්තිය අදාළ වන තාක් දුරට, එම සමාගමට මෙම වගන්තිය අදාළ නොවිය යුතු ය.

(2) සමාගමක් ඇවර කිරීමේ දී 322 වන වගන්තියට යටත්ව, පහත දැක්වෙන අවස්ථාවල දී හැර, සමාගමට එරෙහිව හෝ එහි යම් දේපළකට එරෙහිව කිසිදු තහනමට ගැනීමක් හෝ වෙනත් නෛතික ක්‍රියාවලියක් හෝ විපත් බදු පැනවීමක් ආරම්භ කිරීම හෝ දිගටම පවත්වාගෙන යාම -

(අ) ඇවරකරුගේ පූර්ව ලිඛිත කැමැත්ත ඇතිව මිස; හෝ

(ආ) අවශ්‍ය පරිදි වූ යම් නියම සහ කොන්දේසි මත අධිකරණයේ අවසරය ඇතිව මිස,

නොකළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කැමැත්ත ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ඇවරකරු අලාභ ගෙවීමට යටත් නොවන්නේ ය.

ඇවර කිරීම ආරම්භ කිරීමට පෙර අවසන් කරනු ලැබුවේ නම් මිස තහනමට ගැනීමේ හෝ වෙනත් ක්‍රියාවලියක ප්‍රතිලාභ අත්නොවන බව

**320.** (1) (2) වන උපවගන්තියට යටත්ව, යම් තහනමට ගැනීමක් හෝ වෙනත් නෛතික ක්‍රියාවලියක් හෝ විනිග්‍රහණයක් ඇවර කිරීම ආරම්භ කිරීමට පෙර සම්පූර්ණ කරනු ලැබුවේ නම් මිස, සමාගමකට හෝ එහි යම් දේපළකට එරෙහිව යම් තහනමට ගැනීමකින් හෝ වෙනත් නෛතික ක්‍රියාවලියකින් හෝ විනිග්‍රහණයකින් ප්‍රතිලාභ ලබා ගැනීමට, අවශ්‍ය විය හැකි පරිදි වූ නියම හා කොන්දේසි මත අධිකරණයේ අවසරය ඇතිව හැර, ණයහිමියකුට හිමිකමක් නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා -

(අ) චංචල හෝ නිශ්චල දේපළවලට එරෙහි යම් තහනමකට ගැනීමක් පරිග්‍රහණයකින් හෝ දේපළ භාරගැනුම්කරුගේ හෝ පත්වීම්ලාභියකුගේ හෝ තහනමට ක්‍රියාත්මක කිරීම භාරව සිටින තැනැත්තකුගේ සන්තකයට ඇතුළු වීම මගින් සහ පූර්ණ විකුණුමක් මගින් සම්පූර්ණ විය යුතුය; සහ

(ආ) ණයක් සම්බන්ධයෙන් ඇති තහනමක් එම ණය ගෙවා නිම කිරීම මගින් සම්පූර්ණ විය යුතුය;

(3) (අ) ඇස්කීසි කිරීමේ ක්‍රියාවලිය භාරව සිටින පිස්කල්වරයකුගෙන්; හෝ

(ආ) ආපදා අය කර ගනු ලැබ ඇති දේපළකින්,

සද්භාවයෙන් සමාගමක දේපළ අත්කර ගෙන ඇති තැනැත්තකු සමාගමකට සහ ඇවරකරුට එරෙහිව නිරවුල් හිමිකමක් අත්කර ගනු ලබන්නේ ය.

(4) මෙම වගන්තියේ සඳහන් කිසිවක් මගින් 412 සිට 419 දක්වා වූ වගන්තිවල අදාළ වීමට බලපෑමක් හෝ සීමා කිරීමක් සිදු නොවන්නේ ය.

ඇවර කිරීමේ දී පිස්කල්ගේ කාර්යභාරය

**321.** (1) ඇවර කිරීම ආරම්භ කිරීමට පෙර 320 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අර්ථය තුළ සම්පූර්ණ නොකරනු ලැබූ එහෙත් අයකරනු ලැබූ ඇවර කරමින් පවතින සමාගමක දේපළවලට එරෙහිව වූ ඇස්කීසි කිරීමේ ක්‍රියාවලියකට මේ වගන්තිය අදාළ වන්නේ ය.

(2) වෙනත් යම් ප්‍රඥප්තියක කුමක් සඳහන් වුව ද, (3) වන උපවගන්තියට යටත්ව සහ ඇස්කීසි ණයහිමියකුගේ ඉල්ලීමක් මත, අධිකරණය විසින් අන්‍යාකාරයකින් නියෝග කරන්නේ නම් මිස, ඇවර කිරීම ආරම්භ කිරීමෙන් පසු පිස්කල්වරයා විසින් ප්‍රායෝගිකව හැකි ඉක්මනින් -

(අ) ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස පිස්කල්වරයාගේ සන්තකයේ පවතින හෝ සන්තකයට පත්වන හෝ භාරකාරත්වයට පත්වන හෝ පාලනයට යටත් වන සමාගමෙහි කිසියම් දේපළක් ඇවරකරු වෙත භාර දීම කළ යුතු ය; සහ

(ආ) පහත දැක්වෙන මුදල් එනම් -

(i) ඇස්කීසි ක්‍රියාවලිය යටතේ පවතින සමාගමේ දේපළවලින් උපලබ්ධි වී ඇති යම් ආදායමක්;

(ii) ඇස්කීසි ක්‍රියාවලිය යටතේ ලැබුණු හෝ තහනමට ගත් සමාගමේ යම් මුදලක්; සහ

(iii) තහනමට ගැනීමේ ක්‍රියාවලිය යටතේ සමාගමේ දේපළ තහනමට ගැනීම හෝ විකිණීම වැළැක්වීම සඳහා ගෙවන ලද යම් මුදලක්,

එකී විකිණීමෙන් ලත් මුදල් හෝ මුදල් පිස්කල්වරයාගේ සන්තකයේ හෝ භාරකාරත්වය යටතේ ඇති මුදල්; හෝ පිස්කල්වරයාගේ පාලනය යටතේ ඇති මුදල් හෝ අධිකරණයට ගෙවා ඇති (ඒ වන විටත් බැහැරව ගෙවා නැති) මුදල් වූ විට, ඇවරකරුට ගෙවීමට කටයුතු සැලැස්විය යුතුය.

(3) පිස්කල්වරයා විසින් -

(අ) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ලබා දී ඇති දේපළවලින්, අවස්ථාවෝචිත පරිදි, ඇස්කීසි ක්‍රියාවලිය හෝ තහනමට ගැනීම සම්බන්ධයෙන් පිස්කල් විසින් දරන ලද වියදම් නියෝජනය කරනු ලබන ලෙස සාධාරණ ලෙස නිශ්චය කරනු ලබන වටිනාකමක් සහිත දේපළ; හෝ

(ආ) (1) උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ගෙවන ලද ආදායමෙන් හෝ මුදල්වලින්, අවස්ථාවෝචිත පරිදි ඇස්කීසි ක්‍රියාවලිය හෝ තහනමට ගැනීම සඳහා පිස්කල්වරයාට උපචිත වූ වියදම්,

රඳවා තබා ගැනීම හෝ රඳවා ගැනීමට සැලැස්වීම කරනු ලැබිය හැකි ය.

**322.** (1) ඇවර කිරීමක් ආරම්භ කිරීමට පෙර සහ - ඇවර කිරීම ආරම්භ කිරීමට පෙර ක්‍රියාත්මක කරන ලද බලතල

(අ) දේපළ මත වූ පිළිබැඳීමක් ; හෝ

(ආ) දේපළ සන්තකයට ගැනීමට හෝ අනාාකාරයකින් එය අය කර ගැනීම සඳහා කුලී සින්නක්කර මිල දී ගැනීමේ ගිවිසුමක්

යටතේ ඇතුළුව, දේපළෙහි අයිතිකරුට හෝ බදු දීමනාකරුට ඇති අයිතියක්;

(ඇ) දේපළ භාර ගැනුම්කරුවකු හෝ පත්වීම්ලාභියකු හෝ වෙනත් තැනැත්තකු විසින් -

(i) සමාගමේ දේපළ සන්තකයට හෝ භාරකාරත්වයට ගැනීමක්; හෝ පාලනයට ගැනීමක්; හෝ

(ii) සමාගමේ දේපළවලට අදාළව වෙනත් යම් බලතල ක්‍රියාත්මක කිරීමක්,

බලාත්මක කරන විට 317, 319 සහ 325 වන වගන්තිවල සඳහන් කිසිවක් මගින් දේපළ භාරගැනුම්කරු, පත්වීම්ලාභියා හෝ වෙනත් තැනැත්තා විසින් සමාගමේ දේපළවලට අදාළව යම් බලතල ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍ය ඉටු කිරීම වළක්වනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබ ඇති වූ ද, (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබ ඇති යම් දේපළ භාර ගැනුම්කරුවකුගේ හෝ පත්වීම්ලාභියකුගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ කර්තව්‍ය හෝ බලතල කිසිවක් ඉටු කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී ඇතුළත් වනු ලැබුවා වූ ද, යම් එකඟතාවන්ට හෝ ගනුදෙනුවකට හෝ වෙළෙඳාමකට 325 වන වගන්තිය අදාළ නොවිය යුතු ය.

සමාගමේ අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් අනුනියෝජිතයින් මත ඇවර කිරීමේ බලපෑම

**323.** (1) ඇවරකරුවකු පත් කිරීම මගින් සමාගමේ අධ්‍යක්ෂවරුන් තනතුරෙන් ඉවත් කිරීම සිදු නොවන්නේ ය.

(2) ඇවර කරමින් පවත්නා යම් සමාගමක අධ්‍යක්ෂවරයකු විසින් -

(අ) යම් අභියාචනයක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාට සමාගමේ දේපළට කවර හෝ සම්බන්ධතාවක් නොතිබිය යුතු නමුත්, නියම කරනු ලැබිය හැකි ආකාරයට එවැනිම වූ කාලයක් ඇතුළත සහ අභියාචනා කිරීමට අදහස් කරනු ලබන බවට වූ අදහස දැනුම් දීම සඳහා වූ අවශ්‍යතාවක් පිළිපදිමින් අදාළ ආකාරයට අදාළ කාලයක් ඇතුළත 298 වන වගන්තියේ (2) වන

උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ අධිකරණයේ නියෝගයකට එරෙහිව අභියාචනය කිරීම සඳහා; හෝ

(ආ) මේ කොටසින් ප්‍රකාශිතව අවසර දී ඇති පරිදි; හෝ

හැර, එසේ සමාගමේ නිලධරයකු වශයෙන් යම් කර්තව්‍යයක් කිරීම හෝ යම් බලතල ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරනු ලබන බවට අරමුණු කිරීම හෝ නොකළ හැකි වේ.

(3) ඇවරකරුවකු පත් කිරීම මගින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ ඒ වෙනුවෙන් පත් කරන ලද සමාගමේ යම් අනුයෝජිතයකුගේ අධිකාරි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලබන්නේ ය.

ඇවරකරු හට තොරතුරු සැපයීමට ඇති නියමය

**324.** (1) ඇවරකරුවකු පත් කරනු ලබන අවස්ථාවක දී, සමාගමේ සෑම අධ්‍යක්ෂවරයකු ම සහ අනෙකුත් නිලධරයකු ම විසින් -

(අ) ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මනින් සහ කෙසේ වුව ද පත්කරනු ලැබීමෙන් වැඩ කරන දින පහක් ඇතුළත, තැනැත්තා සන්තකයේ හෝ භාරකාරත්වයේ හෝ පාලනය යටතේ ඇති සමාගමේ කටයුතු, ව්‍යාපාර, දේපළ සහ මූල්‍ය තත්ත්වයන්ට අදාළ සියලුම පොත්, වාර්තා සහ ලේඛන ඇවරකරු වෙත ලබා දිය යුතු ය;

(ආ) එසේ කිරීම ඇවරකරු විසින් අවශ්‍ය කරනු ලබන්නේ නම් පොත්, වාර්තා සහ ලේඛන සම්පූර්ණ සහ නිවැරදි බව සාධාරණ කාලසීමාවක් තුළ දිවුරුම් ප්‍රකාශයක් මගින් තහවුරු කළ යුතු ය;

(ඇ) සමාගමට පොදු මුද්‍රාවක් තිබේ නම්, ඇවරකරු විසින් භාවිත කරනු ලැබීම සඳහා වහාම පොදු මුද්‍රාව ලබා දිය යුතු ය; සහ

(ඈ) ඇවරකරු විසින් සාධාරණ ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි සහාය ඇවරකරුට ලබා දිය යුතු ය.

(2) ඇවරකරුගේ ඉල්ලීම මත, (1) වන උපවගන්තියට අනුකූල වීමට සමාගමේ අධ්‍යක්ෂ හෝ වෙනත් නිලධරයකු හට අධිකරණය විසින් නියෝගයක් කරනු ලැබිය හැකි ය.

(3) සත්‍යායනය ලබාදෙන තැනැත්තා -

(අ) විසින්, පොත්, වාර්තා සහ ලේඛන සම්පූර්ණ කළ යුතු හෝ නිවැරදි කළ යුතු බවට සලකනු නොලබන විට; හෝ

(ආ) සතුව සත්‍යායනය කිරීම සඳහා අවශ්‍ය දැනුම නොමැති විට,

දී (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කරනු ලබන සත්‍යායනය කිරීමක් එකී පොත්, වාර්තා සහ ලේඛනවල සඳහන් විශේෂිත කාරණාවලට අදාළව පමණක් කිරීමට සීමා විය හැකි ය.

දේපළ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ඇවර කිරීමේ බලපෑම

**325.** (1) 322 වන වගන්තියට යටත්ව, ඇවර කරමින් පවත්නා යම් සමාගමක් හෝ එකී සමාගම වෙනුවෙන් යම් තැනැත්තකු විසින් හෝ කරනු ලබන එකී සමාගමේ දේපළට බලපාන්නා වූ යම් ගිවිසුමක්, ගනුදෙනුවක් හෝ වෙළෙඳාමක් එකී ගිවිසුමට, ගනුදෙනුවට හෝ වෙළෙඳාමට පහත සඳහන් පරිදි, එනම් -

(අ) සමාගම වෙනුවෙන් ඇවරකරු විසින්; හෝ

(ආ) ඇවරකරුගේ පූර්ව ලිඛිත කැමැත්ත ඇතිව; හෝ

(ඇ) 381 වන වගන්තියේ (1) වන උපවගන්තියට අනුකූලව; හෝ

(ඈ) අධිකරණ නියෝගයක් යටතේ,

ඇතුළත් වී ඇත්නම් මිස ශූන්‍ය විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කැමැත්ත ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ඇවරකරු අලාභ ගෙවීමට යටත් නොවන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ශූන්‍ය වන ගිවිසුමක්, ගනුදෙනුවක් හෝ වෙළෙඳාමක් අධිකරණය විසින් නියෝගයක් මගින් බලාත්මක කරනු ලැබිය හැකි ය.

(4) යම් බැංකුවක් විසින් කරන ලද යම් ගෙවීමක්, එකී ගෙවීම කරනු ලැබුවේ -

(අ) සමාගම විසින් බැංකුව සමග පවත්වාගෙන යන ගිණුමකින්;

(ආ) සද්භාවයෙන් සහ බැංකුවේ සාමාන්‍ය බැංකු ව්‍යාපාර කටයුතු අතරතුර දී; සහ

(ඇ) පහත දැක්වෙන දිනවලින් කලින් එළඹෙන දින හෝ එදිනට පෙර, එනම්-

(i) ඈවර කිරීම ආරම්භ වී ඇති බව ඈවරකරු විසින් බැංකුවට ලිඛිතව දැනුම් දුන් දිනය හෝ එදිනට පෙර;

(ii) සමාගම ඈවර කිරීමට භාජනය වී ඇති බව විශ්වාස කිරීමට බැංකුවට හේතු තිබූ දිනය හෝ එදිනට පෙර,

වන්නේ නම්, බැංකුවක් විසින් කරන ලද මුදල් ගෙවීමකට (1) වන උපවගන්තිය අදාළ නොවේ.

(5) (අ) (1) වන උපවගන්තිය යටතේ ශූන්‍ය වන යම් ගිවිසුමකට, ගනුදෙනුවකට හෝ වෙළඳාමකට සමාගම වෙනුවෙන් ඇතුළත් වනු ඇති බවට අදහස් කරන සමාගම් යම් අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු; හෝ

(ආ) (1) වන උපවගන්තිය යටතේ ශූන්‍ය වන යම් ගිවිසුමක්, ගනුදෙනුවක් හෝ වෙළඳාමක් පිළිබඳව වෙනත් යම් ආකාරයකින් සම්බන්ධ වන හෝ පාර්ශ්වකරුවකු වන සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු,

වරදක් සිදු කරන්නේ ය.

(6) (5) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු වූ අධ්‍යක්ෂවරයකුට හෝ වෙනත් නිලධරයකුට, වරද සංයුක්ත වන ක්‍රියාව හෝ නොකර හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පාඩු ලැබූ සමාගම ඇතුළු ඕනෑම තැනැත්තකුට වන්දි ගෙවීමට අධිකරණය විසින් නියෝග කළ හැකි ය.

(7) ඈවරකරුවකු පත් කළ දිනයේ දී, සමාගමේ දේපළවලට බලපාන යම් ගිවිසුමකට, ගනුදෙනුවකට හෝ වෙළඳාමකට ඇතුළු වූයේ ඈවරකරු පත් කරනු ලැබූ වේලාවේ දී නැත්නම්

ඊට පෙර ද යන ප්‍රශ්නය පැන නඟින්නේ නම්, ඊට පටහැනිව සාධනය කරන්නේ නම් මිස, එම කාලයෙන් පසුව ඇතුළු වූ බවට උපකල්පනය කළ යුතු ය.

(8) වෙනත් යම් පනතක කුමක් සඳහන් වුව ද එය නොතකා, ඇවරකරුට එරෙහිව, සමාගමෙහි පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් මත කිසිම තැනැත්තකුට කැප අයිතියක් ඉල්ලා සිටිය නොහැකි ය.

කොටස් පැවරීම මත ඇවර කිරීමේ බලපෑම

**326.** (1) මෙම වගන්තියට යටත්ව -

(අ) ඇවර කරමින් පවත්නා සමාගමක කොටසක් පැවරීම නොකළ යුතු ය; සහ

(ආ) ඇවර කරමින් පවත්නා සමාගමක කොටස් හිමියකුගෙන් තත්ත්වය, එහි වගකීම් සම්බන්ධයෙන්, වෙනස් නොකළ හැකි ය.

(2) (අ) 302 වන වගන්තිය සමාගමට අදාළ නොවන අවස්ථාවක දී; සහ

(ආ) ඇවර කරමින් පවත්නා සමාගමේ කොටසක් පැවරීම සමස්තයක් වශයෙන් ණයහිමියන්ගේ යහපත සඳහා වන බවට ඇවරකරු සෑහීමකට පත් වන අවස්ථාවක,

ඇවරකරු විසින් කොටස් පැවරීමට කැමැත්ත දෙනු ලැබිය හැකි වේ.

(3) (2) වන උපවගන්තිය යටතේ කැමැත්ත ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ඇවරකරු අලාභ ගෙවීමට යටත් නොවන්නේ ය.

(4) අන්‍යායාකාරයකදී සැලකිය යුතු අසාධාරණයක් සිදු වන බවට අධිකරණය සෑහීමකට පත් වන අවස්ථාවක, අධිකරණය විසින් පහත දැක්වෙන පරිදි, එනම් -

(අ) ඇවර කරමින් පවත්නා සමාගමක කොටසක් පැවරීම සඳහා; හෝ

(ආ) ඇවර කරමින් පවත්නා සමාගමක කොටස් හිමියකුගේ තත්ත්වය, එහි වගකීම් සම්බන්ධයෙන් වෙනස් කරමින් නියෝගයක් කළ හැකිය.

(5) මෙම වගන්තියේ සඳහන් කිසිවක් මගින් සමාගම් පනතේ 46 වන වගන්තියේ අදාළ වීමට බලපෑමක් හෝ සීමා කිරීමක් සිදු නොවන්නේ ය.

ඇවර කිරීමේදී අත්‍යවශ්‍ය සේවා

**327.** (1) වෙනත් යම් ප්‍රඥප්තියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අත්‍යවශ්‍ය භාණ්ඩ හෝ සේවා සපයන්නකු විසින් -

(අ) ඇවර කිරීම ආරම්භ කිරීමට පෙර කාලසීමාවකට අදාළව භාණ්ඩය හෝ සේවාව සඳහා අය විය යුතු ගාස්තු ගෙවීම සමාගම විසින් පැහැර හැරීම හේතුවෙන් ඇවර කරන්නකුට හෝ ඇවර කිරීමට යටත් සමාගමකට භාණ්ඩය හෝ සේවාව සැපයීම ප්‍රතික්ෂේප කිරීම නොකළ යුතු ය; හෝ

(ආ) ඇවර කිරීම ආරම්භ කිරීමට පෙර කාලසීමාවකට අදාළව භාණ්ඩය හෝ සේවාව සඳහා ගෙවිය යුතු හිඟ ගාස්තු ගෙවීම සිදු කළ යුතු ය යන්න, ඇවරකරුවකුට හෝ ඇවර කිරීමට යටත් සමාගමකට භාණ්ඩය හෝ සේවාව සැපයීමේ කොන්දේසියක් නොකළ යුතු ය.

(2) අත්‍යවශ්‍ය භාණ්ඩයක් හෝ සේවාවක් සැපයීම සඳහා ඇවරකරුට උපචිත වනු ලබන ගාස්තු හතරවන උපලේඛනයේ කාර්ය සඳහා ඇවර කිරීමේ වියදමක් වන්නේ ය.

තාවකාලික ඇවර කිරීමේ දී මෙම පරිච්ඡේදය අදාළ වීම (ඇති කිරීමේ බලපෑම)

**328.** 304 වන වගන්තිය යටතේ කරන ලද නියෝගයක් මගින් තාවකාලික ඇවරකරුවකු පත් කරනු ලබන අවස්ථාවක දී අධිකරණ නියෝගයක් අන්‍යාකාරයකින් විධිවිධාන සලසන්නේ නම් මිස, පහත සඳහන් වගන්තිවල ඇවරකරුවකුට හෝ ඇවරකිරීමකට කරනු ලබන යම් සඳහනක් අවස්ථාවෝචිත පරිදි එකී සඳහන පිළිවෙළින් තාවකාලික ඇවරකරුවකුට හෝ තාවකාලික ඇවරකිරීමකට අදාළව කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය:-

(අ) 317 වන වගන්තිය;

(ආ) 318 වන වගන්තිය;

(ඇ) 319 වන වගන්තිය;

(ඈ) 322 වන වගන්තිය;

(ඉ) 323 වන වගන්තිය: මේ වගන්තියේ කාර්ය සඳහා 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයට 325 වන වගන්තියේ කරනු ලැබ ඇති සඳහන, 304 වන වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස කියවනු ලැබිය යුතු ය;

(ඊ) 325 වන වගන්තිය;

(උ) 326 වන වගන්තිය; සහ

(ඌ) 327 වන වගන්තිය.

5 වන පරිච්ඡේදය

**ඇවරකරුගේ බලතල**

**329.** (1) ඇවරකරුවකු විසින් 296 වන වගන්තියේ සඳහන් කර ඇති සියලු කාරණා සඳහා අවශ්‍ය විය හැකි හෝ උපයෝගී කරගනු ලැබිය හැකි සියලු දේ කරනු ලැබිය හැකි ය. ඇවරකරුගේ බලතල

(2) ඇවරකරුවකුට නවවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බලතල තිබිය යුතු ය.

(3) පහත දැක්වෙන දේ සඳහා, එනම් -

(අ) (i) ණයහිමියන්ගේ;

(ii) කොටස් හිමියන්ගේ;

(iii) සහදායකයන්ගේ;

(iv) ඇවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුවක; හෝ

(v) ඇවර කිරීමේ සහදායක කමිටුවක අනුමතය;

(ආ) අධිකරණයේ අවසරය,

සඳහා නියම කරනු ලැබිය හැකි පරිදි වූ නියමයන්ට යටත්ව,(2) වන උපවගන්තියේ සඳහන් බලතල ඇවරකරුවකු විසින් ක්‍රියාත්මක කළ හැකි ය.

(4) යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ කර්තව්‍යයක් ඉටු කිරීමේ දී ඇවරකරු සමාගමේ අනුයෝජිතයා විය යුතු ය. සද්භාවයෙන් සහ අගයක් සඳහා ඇවරකරු සමග කටයුතු කරන තැනැත්තකු විසින් ඇවරකරු, ඇවරකරුගේ බලතල තුළ ක්‍රියා කරන්නේ ද යන්න විමසීම අවශ්‍ය නොවන්නේ ය.

**සහයෝගය සඳහා ඇවරකරු විසින් ඉල්ලීම් සිදු කිරීම**

**330.** (1) 302 වන වගන්තිය සමාගමට අදාළ වන තාක් (2)වන උපවගන්තියේ (ආ) ඡේදය එම සමාගමට අදාළ නොවන්නේ ය.

(2) ඇවරකරුවකු විසින්, ලිඛිත දැන්වීමක් මගින් -

(අ) 438 වන වගන්තියට යටත්ව, ඇවරකරු විසින් නිශ්චය කරනු ලබන පරිදි, ඇවර කිරීමට අදාළ, සමාගමේ අධ්‍යක්ෂවරයකුගේ හෝ කොටස් හිමියකුගෙන් හෝ වෙනත් තැනැත්තකුගේ සන්තකයේ හෝ භාරකාරත්වය යටතේ හෝ පාලනය යටතේ ඇති සමාගමේ පොත්පත්, වාර්තා හෝ ලේඛන ඇවරකරුට භාර දෙන ලෙස ඇවරකරු විසින් එම අධ්‍යක්ෂවරයාගෙන් හෝ කොටස් හිමියාගෙන් හෝ වෙනත් තැනැත්තාගෙන් ඉල්ලා සිටිය හැකි ය; සහ

(ආ) සාධාරණ වන්නේ නම් සහ සාධාරණ වන තාක් දුරට, (3) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාරණා කරන ලෙස ඇවරකරු විසින් පහත දැක්වෙන තැනැත්තකුගෙන්; එනම් -

(i) සමාගම පිහිටුවීමේ දී, ප්‍රවර්ධනය කිරීමේ දී හෝ කළමනාකරණය කිරීමේ දී සහභාගී වූ තැනැත්තකුගෙන්;

(ii) සමාගමේ පූර්ව හෝ වත්මන් හෝ කොටස් හිමියකුගෙන්;

(iii) සමාගමේ පූර්ව හෝ වත්මන් අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකුගෙන්;

(iv) සමාගමේ දේපළ සම්බන්ධයෙන් පූර්ව හෝ වත්මන් දේපළ භාරගැනුම්කරුවකු හෝ පත්වීම්ලාභියකුගෙන්;

(v) ආයතනයේ දැනට සිටින සේවානියුක්තයකුගෙන් හෝ සේවානියුක්තයකුව සිටි තැනැත්තකුගෙන්;

(vi) සමාගම සඳහා නීතිඥයකු ලෙස ක්‍රියා කරනු ලබන හෝ කවර හෝ අවස්ථාවක ක්‍රියා කර ඇති තැනැත්තකුගෙන්; හෝ (නමුත් නීති උපදෙස් වරප්‍රසාද හෝ නඩු පැවරීමේ වරප්‍රසාදයට යටත්ව)

(vii) සමාගමේ ගණකාධිකාරිවරයකු හෝ විගණකවරයකුගෙන්; හෝ

(viii) සමාගමේ කටයුතු පිළිබඳ දැනුමක් ඇති වෙනත් යම් තැනැත්තකුගෙන්,

ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කාරණා -

(අ) ඇවරකරු විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි වේලාවක සහ ස්ථානයකදී ඇවරකරු හමුවීම;

(ආ) ඇවරකරු විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි පරිදි සමාගමේ කටයුතු, ව්‍යාපාර, දේපළ හෝ මූල්‍ය

තත්ත්වයන් පිළිබඳ තොරතුරු ඇවරකරුට ලබා දීම;

(ඈ) සමාගමෙහි කටයුතු, ව්‍යාපාර, දේපළ හෝ මූල්‍ය තත්ත්වයන් සම්බන්ධ ඕනෑම කාරණයක් සම්බන්ධයෙන් ඇවරකරු විසින් දිවුරුම්දීමක් මත, නියම කරනු ලැබිය හැකි සාක්ෂිමය සහ වෙනත් කාර්යපටිපාටි රීති යටතේ, විභාග කරනු ලැබීම; සහ

(ඇ) ඇවර කිරීමේ දී ඇවරකරුට හැකි උපරිමයෙන් සහාය වීම,

සඳහා වන්නේ ය.

(4) ඇවරකරු විසින්, සමාගමේ සේවානියුක්තයකු නොවන (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් තැනැත්තකුට, එකී උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමකට අනුකූල වීමේ දී උපචිත වන්නා වූ සාධාරණ ගමන් වියදම් සහ වෙනත් පටිපාටිමය වියදම් ගෙවිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ තොරතුරු සද්භාවයෙන් හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් කිසිදු නඩුවක්, නඩු කටයුත්තක් හෝ වෙනත් නීතිමය හෝ වෙනත් ක්‍රියාදාමයක් (වෘත්තීය හැසිරීම සම්බන්ධයෙන් අධිකරණ බලයක් ඇති කිසියම් වෘත්තීය ආයතනයක් හෝ අධිකාරියක් විසින් සිදු කරන විනය පටිපාටි ඇතුළුව) කිසිදු තැනැත්තකුට විරුද්ධව නොපැවරිය යුතු ය.

(6) මෙම වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමකට අනුකූල වීම පැහැර හැර ඇති තැනැත්තකුට ඇවරකරුගේ ඉල්ලීම මත, අධිකරණය විසින් -

(අ) එම ඉල්ලීමට අනුකූලව ක්‍රියා කරන ලෙස; හෝ

(ආ) නියම කරනු ලැබිය හැකි පරිදි වූ සාක්ෂිමය හෝ වෙනත් කාර්ය, පටිපාටි රීති යටතේ අධිකරණයට පැමිණ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් යටතේ පරීක්ෂා කරනු ලැබීමට,

පහත සඳහන් අවස්ථාවල දී, එනම්, අවස්ථාවෝචිත පරිදි එසේ අනුකූලව ක්‍රියා කිරීම හෝ පරීක්ෂා කරනු ලැබීම-

(ඇ) 296 වන වගන්තියේ දක්වා ඇති පරමාර්ථය තවදුරටත් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය බවට; සහ

(ඈ) එකී තැනැත්තාට අසාධාරණ ලෙස පීඩාකාරී නොවන බවට,

අධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක දී නියම කරනු ලැබිය හැකි ය.

දේපළ භාර ගැනුම්කාරිත්වය හෝ පත්වීම්ලාභියකුගේ පත්වීම අවසන් විය යුතු බවට ඇවරකරුගේ දැන්වීම

**331.** (1) නියම කරනු ලැබිය හැකි ආකාරයට අනුව වූ ලිඛිත දැන්වීමක් අවස්ථාවෝචිත පරිදි දේපළ භාර ගැනුම්කරුට හෝ පත්වීම්ලාභියකුට ලබා දීම මගින් දේපළ භාර ගැනුම්කාරිත්වය හෝ පත්වීම්ලාභියකුගේ පත්වීමක් අවසන් වන බවට ඇවරකරුවකු විසින් නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලබා දීමෙන් පසු ඊළඟ වැඩ කරන දිනය අවසානයේ දී අවස්ථාවෝචිත පරිදි, දේපළ භාර ගැනුම්කාරීත්වය හෝ පත්වීම්ලාභියකුගේ පත්වීමක් අවසන් වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ දැනුම්දීමක් ලැබීමෙන් පසු ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මනින් සහ කෙසේ වුවද දේපළ භාර ගැනුම්කාරිත්වය හෝ පත්වීම්ලාභියාගේ පත්වීම අවසන් වීමෙන් පසු අවස්ථාවෝචිත පරිදි, දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත්ව ඇති දේපළ සම්බන්ධයෙන් හෝ පත්වීම්ලාභියා පත් කරනු ලැබුවේ යම් දෙයක් සම්බන්ධයෙන් ද, එකී දේ සම්බන්ධයෙන් දේපළ භාර ගැනුම්කරු හෝ පත්වීම්ලාභියා ක්‍රියා කිරීම අවසන් විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දේපළ භාර ගැනුම්කරුට ලැබීමෙන් පසු -

(අ) 382 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වැඩිදුර පියවර ගැනීමට දේපළ භාර ගැනුම්කරුට නියම කරනු නොලැබිය යුතු ය;

(ආ) අවස්ථාවෝචිත පරිදි, 385 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ 386 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදය අදාළ වීම අවසන් වන නමුත්, ඒ හේතුව මත, දැනටමත් කර ඇති යම් බෙදා හැරීමකට බාධා නොකළ යුතු ය; සහ

(ඇ) හතරවන උපලේඛනයේ කාර්ය සඳහා මෙම පනත යටතේ දේපළ භාර ගැනුම්කරුට නිසි පරිදි උපචිත වන ලද පිරිවැය ගාස්තු සහ වියදම් සහ පාරිශ්‍රමික සහ 395 වන වගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරුගේ හානිපූරණය,ඇවර කිරීමේ වියදමක් ලෙස සලකනු ලැබිය යුතුය.

ඇවරකරු විසින් ලේඛන ලියා අත්සන් කිරීම

**332.** (1) ඇවරකරුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය හෝ ආනුෂංගික වන සියලු ලේඛන, සමාගමේ නමින් සහ සමාගම වෙනුවෙන්, ඇවරකරු විසින් ලියා අත්සන් කළ හැකි ය.

(2) සමාගම් පනතේ 19 වන වගන්තියේ කාර්ය සඳහා, ඇවරකරු විසින් සමාගමක් වෙනුවෙන් අත්සන් කරන ලද ලේඛනයක් සමාගම වෙනුවෙන් නිසි පරිදි ඇතුළත් වූ බවට සලකනු ලබන්නේ ය.

(3) වෙනත් යම් ලිඛිත නීතියක හෝ සමාගමේ ව්‍යවස්ථාවෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද ඇවරකරුවකු පත් කිරීමේ යෝජනා සම්මතය හෝ නියෝගය මගින් ඇවරකරුට ලේඛන ලියා අත්සන් කිරීමට සහ එම කාර්යය සඳහා සමාගමේ පොදු මුද්‍රාව භාවිත කිරීමට බලය ලබා දෙන ලද අවස්ථාවක දී, ඇවරකරු විසින් ලේඛනවලට සමාගමේ පොදු මුද්‍රාව තැබීම මගින් සහ පොදු මුද්‍රාව තැබීම සාක්ෂ්‍යකරණය කිරීම මගින් සමාගම නමින් සහ සමාගම වෙනුවෙන් ලේඛන ලියා අත්සන් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තියේ විස්තර කර ඇති ආකාරයට ලියා අත්සන් කරන ලද ලේඛනයක්, සමාගම් පනතේ 19 වන වගන්තියේ කාර්ය සඳහා සමාගම විසින් විධිමත් ලෙස ඇතුළත්ව ඇති බවට සලකනු ලබන්නේ ය.

පිළිබැඳුමකට යටත්ව දේපළක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඇවරකරුට ඇති බලතල

**333.** (1) පහත දැක්වෙන අවස්ථාවල දී, එනම් -

(අ) බැඳුමක් ස්ථිර ඇපයක් වන අවස්ථාවක දී සහ අටවන උපලේඛනයේ 1 වන ඡේදය (ආ) උප ඡේදය යටතේ දේපළ භාර දී ඇති අවස්ථාවක හෝ එම උපලේඛනයේ 4 වන ඡේදය යටතේ දේපළ භාර දීම සඳහා ලබාගනු ලැබ (අ) උපඡේදය අවස්ථාවක;

(ආ) පිළිබැඳුම ස්ථිර ඇපයක් වන සහ (අ) ඡේදය අදාළ නොවන අවස්ථාවක සහ එසේ වුවත්, පිළිබැඳුම ලැබූ තැනැත්තා එම බැඳීම ක්‍රියාත්මක කිරීමට තමා අදහස් නොකරන බවට ඇවරකරුට ස්ථිර ලෙස දැනුම් දී ඇති අවස්ථාවක;

(ඇ) පිළිබැඳුම සෘණ භාරයක් වන අවස්ථාවක;

(ඈ) පිළිබැඳුම සමාගම් පනතේ 431 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ චල භාරයකට පසුව ශ්‍රේණිගත වූ ස්ථිර ඇපයක් වන අවස්ථාවක්; හෝ

(ඉ) පිළිබැඳුම කැප අයිතියක් වන අවස්ථාවක,

එම පිළිබැඳුමට යටත් දේපළ සම්බන්ධයෙන් ඇවරකරු විසින් යම් බලතල ක්‍රියාත්මක කිරීම හෝ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දේපළ බැහැර කරනු ලබන විට, පිළිබැඳුමට යටත් දේපළ සම්බන්ධයෙන් ප්‍රදානලාභියා සතුව තිබිය හැකි වූ ප්‍රමුඛතාවට සමාන ප්‍රමුඛතාවයක්, බැහැර කරන ලද දේපළ සෘජුව හෝ අන්‍යාකාරයෙන් නියෝජනය කරන සමාගමේ යම් දේපළක් සම්බන්ධයෙන් පිළිබැඳුමේ ප්‍රදානලාභියාට ඇත්තේ ය.

දුර්වාහ්‍ය දේපළ පිළිබඳ හිමිකම් නොපෑම

**334.** (1) මෙම වගන්තියේ , "දුර්වාහ්‍ය දේපළ" යන්නෙන් -

(අ) ලාභ නොලබන කොන්ත්‍රාත්තුවක්; හෝ

(ආ) විකිණිය නොහැකි හෝ පහසුවෙන් විකිණිය නොහැකි හෝ මුදල් ගෙවීමක් හෝ යම්

දුෂ්කර ක්‍රියාවක් කිරීම මඟින් බැරකමකට ඉඩ සැලසිය හැකි යම් දේපළක්,

අදහස් වේ.

(2) (3) වන උපවගන්තියට යටත්ව, වස්තුභංගත්ව භාරකරුවකු (බංකොලොත් භාවයක) හෝ ඇවරකරුවකු හෝ විසින් (ඇවර කිරීමක දී) දුර්වාහ්‍ය දේපළ වියාවනය කරනු ලැබිය හැකි ය.

(3) බංකොලොත් භාරකරුවකු හෝ ඇවරකරුවකු විසින්, දුර්වාහ්‍ය දේපළක් මහජන සෞඛ්‍යයට හෝ මහජන ආරක්ෂාවට, ආසන්න සහ බරපතළ අවදානමක් ඉදිරිපත් කරන අවස්ථාවක හෝ පාරිසරික වගකීමක් සහිත වන විට, එම දේපළ වියාවනය කිරීම නොකළ හැකි වේ.

(4) යම් ගිවිසුමක්, බංකොලොත් භාරකරු හෝ ඇවරකරු විසින් එය පැවරීමට උත්සාහ කර ඇත්නම් හෝ ඊට අදාළ වූ හෝ එය හා ආශ්‍රිත යම් දේපළක් සම්බන්ධයෙන් අයිතිවාසිකම් ක්‍රියාත්මක කර ඇත්නම් හෝ වුව ද (2) වන උපවගන්තිය යටතේ එම ගිවිසුම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(5) බංකොලොත් භාරකරු හෝ ඇවරකරු දේපළක සන්තකය ලබාගෙන තිබේ නම්, එය විකිණීමට උත්සාහ කර ඇත්නම් හෝ ඊට අදාළව වෙනත් ආකාරයකින් හිමිකාරීත්වයේ අයිතිය ක්‍රියාත්මක කර ඇත්නම් වුව ද (2) වන උපවගන්තිය යටතේ යම් දේපළක් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(6) (2) වන උපවගන්තිය යටතේ හිමිකම්පෑමක් ප්‍රතික්ෂේප කිරීමක් මගින් -

(අ) ප්‍රතික්ෂේප කරන ලද දේපළ සම්බන්ධයෙන් ණයකරුගේ අයිතිවාසිකම්, සම්බන්ධතා සහ වගකීම්, හිමිකම් පෑම ප්‍රතික්ෂේප කළ මොහොතේ සිට අවසන් වන්නේ ය; නමුත්

(ආ) ණයකරු වගකීමකින් නිදහස් කිරීමට අවශ්‍ය විය හැකිතාක් දුරට හැර, වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට හෝ වගකීම්වලට බලපෑම් ඇති කිරීමක් හෝ සීමා කිරීමක් සිදු නොවන්නේ ය.

(7) දුර්වාභ්‍ය දේපළක් වියාචනය කරන බංකොලොත් භාරකරුවකු හෝ ඇවරකරුවකු, ප්‍රායෝගිකව හැකි ඉක්මනින් සහ කෙසේ වුව ද වියාචනය කිරීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත, නියම කරනු ලැබිය හැකි තොරතුරු ඇතුළත් ලිඛිත දැන්වීමක් අවස්ථාවෝචිත පරිදි, තමා දැනුම්වත් ව සිටින්නා වූ එම වියාචනය කිරීම මගින් බලපෑමකට ලක් වූ එක් එක් තැනැත්තාට ඒ පිළිබඳව ලිඛිතව දැනුම් දිය යුතු ය.

(8) (2) වන උපවගන්තිය යටතේ වියාචනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අලාභයක් දරන්නා වූ තැනැත්තකුට -

(අ) (8)(ආ) ඡේදය යටතේ කරන ලද නියෝගයක බලපෑම සැලකිල්ලට ගනිමින් අලාභයේ ප්‍රමාණය සඳහා ණයහිමියකු ලෙස හිමිකම්පෑමක් ඉදිරිපත් කළ හැකි ය;

(ආ) වියාචනය කරන ලද දේපළ එම තැනැත්තාට භාර දීම හෝ පැවරීම පිළිබඳ නියෝගයක් ලබා ගැනීම සඳහා අධිකරණයට ඉල්ලීමක් කළ හැකි ය.

(9) එම දේපළ අයදුම්කරුට බාරදීම හෝ පැවරීම සාධාරණ බවට අධිකරණය සෑහීමකට පත්වන අවස්ථාවක දී මෙම වගන්තිය යටතේ අධිකරණය එලෙස නියෝගයක් කළ හැකි ය.

(10) මෙම වගන්තිය යටතේ නියෝගයක් කිරීමේ දී, අධිකරණය විසින් අවශ්‍ය පරිදි -

(අ) කිසියම් නියමයක් හෝ කොන්දේසියක් පැනවිය හැකි ය; හෝ

(ආ) වෙනත් අනුපූරක නියෝගයක් කරනු ලැබිය හැකි ය.

වියාචනය කළ යුතු ද නැද්ද යන්න තෝරා ගැනීමේ අවශ්‍යතාවය

**335.** දුර්වාභ්‍ය දේපළක් වියාචනය කිරීම මගින් (දුර්වාභ්‍ය දේපළකට හිමිකම් නොපෑමක් මගින්) තම අයිතීන්ට බලපෑමක් සිදුවනු ලබන තැනැත්තකු විසින් බංකොලොත්භාවයකදී භාරකරුට හෝ ඇවරකිරීමක දී ඇවරකරුට එකී දැන්වීම ලැබූ දිනයට පසු දින විස්සකට අඩු නොවන දිනයක් වූ ද එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් වූ ද දිනයක් නිමවීමට පෙර දුර්වාභ්‍ය දේපළ

වියාමනය කළ යුතුද නැද්ද යන්න තෝරාගැනීමට නියම කරමින් බංකොලොත් භාරකරුට හෝ ඇවරකරුට ලිඛිත දැන්වීමක් දෙනු ලැබීමේ දී, බංකොලොත් භාරකරු හෝ ඇවරකරු විසින් දිනය නිමවීමට පෙර එසේ කළහොත් මිස බංකොලොත් භාරකරු හෝ ඇවරකරු විසින් දුර්වාහ්‍ය දේපළට වියාවනය කිරීම නොකළ හැකි වන්නේ ය.

තාවකාලික ඇවර කිරීමේ දී මෙම පරිච්ඡේදයේ අදාළ වීම

**336.** 304 වන වගන්තිය යටතේ කරන ලද නියෝගයක් යටතේ තාවකාලික ඇවරකරුවකු පත් කරනු ලබන අවස්ථාවක දී, 330 වන වගන්තියේ (6) වන උපවගන්තියේ (ඇ) ඡේදයට කරනු ලබන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඇවරකරුට කරනු ලබන ඇවරකිරීමට කරන ලද සඳහන් කිරීමක් තාවකාලික ඇවරකරුවකුට කරන ලද සඳහන් කිරීමක් ලෙස ද, ඇවර කිරීමකට කරනු ලබන සඳහන් කිරීමක් තාවකාලික ඇවරකරුවකුට කරන ලද සඳහන් කිරීමක් ලෙස ද ගෙන තාවකාලික ඇවරකරුවකුට සහ තාවකාලික ඇවරකිරීමකට මෙම පරිච්ඡේදය අදාළ වන ප්‍රමාණය, නියෝගයේ නිශ්චිතව සඳහන් පරිදි විය යුතු ය.

## 6 වන පරිච්ඡේදය

### ඇවරකරුගේ කාර්යභාරය

*අ - සාමාන්‍ය*

ඇතැම් අවස්ථාවල දී ඇවරකරු ක්‍රියා කිරීම අවශ්‍ය නොවන බව

**337.** (1) මෙම කොටසෙහි වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුවත් මෙම වගන්තිය අදාළ වන්නේ ය.

(2) 333 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේද අදාළ වන අවස්ථාවක දී හැර, ඇවරකරුවකු විසින් ස්ථිර ඇපයකට යටත්ව ඇති දේපළකට අදාළව කර්තව්‍යයක් ඉටු කිරීම හෝ බලතල ක්‍රියාත්මක කිරීම නොවන්නේ ය.

(3) පහත සඳහන් සියලු කාරණා අදාළ වන අවස්ථාවක දී, එනම් -

(අ) 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ කරන ලද නියෝගයක් මගින් ඇවරකරුවකු පත් කරනු ලබන අවස්ථාවක;

(ආ) නිල දේපළ භාරකරු ඇවරකරු නොවන අවස්ථාවක; සහ

(ඇ) සමාගම වත්කම් රහිත සමාගමක් වන අවස්ථාවක,

ඇවරකිරීම මගින් යම් වියදමක් දැරීමට සිදු වන්නේ නම් හෝ දරන්නට සිදු විය හැකි නම්, ඇවර කිරීම සම්බන්ධයෙන් ඇවරකරු විසින් තම බලතල ක්‍රියාත්මක කිරීම හෝ කාර්යක් සහ කර්තව්‍ය ඉටු කිරීම අවශ්‍ය නොවන්නේ ය.

සමාගමේ කටයුතු විමර්ශනය කිරීම සඳහා ඇවරකරුගේ කාර්යභාර්යය

**338.** (1) සමාගමක් ඇවර කිරීම ආරම්භ වූ වහාම, ඇවරකරු විසින් ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මනින් -

(අ) සමාගමේ කටයුතු විමර්ශනය කළ යුතු ය;

(ආ) 302 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ප්‍රකාශයක් ඉදිරිපත් කර ගොනු කර ඇති අවස්ථාවක, ප්‍රකාශයේ දක්වා ඇති කාලසීමාව තුළ සමාගමට සිය ණය සම්පූර්ණයෙන් ම ගෙවීමට හැකි වේ ද නැද්ද යන්න ඇවරකරු විසින් සලකා බැලිය යුතු ය;

(ඇ) (2) වන උපවගන්තියට යටත්ව, සමාගම බල රහිත කළ හැකි ගනුදෙනුවකට හෝ ඌන තක්සේරු ගනුදෙනුවක පාර්ශ්වකරුවකු විය හැකි ද යන්න සලකා බලා, එම බල රහිත කළ හැකි ගනුදෙනු සහ ඌන තක්සේරු ගනුදෙනු සම්බන්ධයෙන් -

(i) ඒ පිළිබඳ විමර්ශනයක් සිදු කිරීම; සහ

(ii) 418 වන වගන්තිය යටතේ අය කර ගැනීමක් සඳහා 415 වන වගන්තිය යටතේ අධිකරණයට ඉල්ලුම් කිරීම.

(2) ණය හිමියන්ගේ යහපතට වන කරුණක් වන්නේ ද නැද්ද යන්න නිශ්චය කළ යුතු ය. 302 වන වගන්තිය සමාගමකට අදාළ වන තාක් දුරට සහදායකයකුගේ ඉල්ලීමක් මත අධිකරණය අන්‍යාකාරයකට නියෝග කරන්නේ නම් මිස, (1) වන වගන්තියේ (ඇ) වන උපවගන්තිය සමාගමට අදාළ නොවන්නේ ය.

ආ - සහදායකයන්

සහදායක ලැයිස්තුවක් නිරවුල් කිරීම

**339.** (1) (2) වන උපවගන්තියට යටත්ව, ඇවර කිරීමක් ආරම්භ කිරීමෙන් පසු ප්‍රායෝගිකව හැකි ඉක්මනින්, ඇවරකරු සහදායක ලැයිස්තුවක් නිරවුල් කළ යුතු ය.

(2) සහදායකයන් විමසීම අවශ්‍ය නොවන බව ඇවරකරු සලකන විට, සහදායක ලැයිස්තුවක් නිරවුල් කිරීම අවශ්‍ය නොවේ.

(3) සහදායක ලැයිස්තුවක් නිරවුල් කිරීමේ දී නියම කරනු ලැබිය හැකි ක්‍රියා පටිපාටියක් ඇවරකරු විසින් අනුගමනය කරනු ලැබිය යුතු ය.

(4) සහදායකයින්ගේ ලැයිස්තුවක්, නියම කරනු ලැබිය හැකි නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතු ය.

සහදායකයන්ගේ ලැයිස්තුවක් වෙනස් වීම

**340.** (1) ඇවරකරුට සහදායකන්ගේ ලැයිස්තුවක් වෙනස්කළ හැකි ය.

(2) සහදායකයන්ගේ ලැයිස්තුවක් වෙනස් කිරීමේ දී, ඇවරකරු විසින් නියම කරනු ලැබිය හැකි ඒ සඳහා වූ කාර්ය පටිපාටියක් අනුගමනය කළ යුතු ය.

සහදායකයින්ගේ අයිතිවාසිකම් ගැලපීම

**341.** (1) සහදායකයන්ගේ ලැයිස්තුවක් නිරවුල් කිරීමෙන් පසු ප්‍රායෝගිකව හැකි ඉක්මනින් ඇවරකරු විසින් සහදායකයන්ගේ වගකීම් තීරණය කිරීමට අවශ්‍ය වන තාක් දුරට, සහදායකයන් අතර ඔවුන්ගේ අයිතිවාසිකම් ගැලපීම සිදුකළ යුතු ය.

(2) සහදායකයන්ගේ අයිතිවාසිකම් ඔවුනොවුන් අතර ගැලපීමේ දී, ඇවරකරු විසින් නියම කළ හැකි පරිදි යම් කාර්යය පටිපාටියක් අනුගමනය කරනු ලැබිය යුතු ය.

පෙර කොටස් හිමි සහදායකයන්ගේ වගකීම

**342.** (1) මේ වගන්තියේ, සමාගමක් සම්බන්ධයෙන් "පෙර කොටස් හිමියා" යන්නෙන් එම සමාගමේ ඇවර කිරීම ආරම්භ කළ දිනට පෙරාතුවම වූ මාස දොළහක කාලසීමාව තුළ යම් අවස්ථාවක කොටස් හිමියකුව සිටි තැනැත්තකු අදහස් වේ.

(2) (3) වන සහ (4) වන උපවගන්තිවලට යටත්ව,

කොටස් හිමියකු, ඔහු විසින් කොටසක සම්බන්ධයෙන් ගෙවීමට ඇති යම් මුදලක් ගෙවීමට අපොහොසත් වුවහොත්, එම මුදල ගෙවිය යුතු අතර, ඕනෑම කලින් සිටි කොටස්හිමියකුගෙන් ඇවරකරු විසින් එම මුදල අය කර ගත හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් කාලසීමාව තුළ කලින් සිටි කොටස් හිමියා කොටස් හිමියකු වූ සෑම අවස්ථාවක දී ම, සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වල දී සමාගම විසින් ගෙවීමට නියමිත වූ එහි ණය ගෙවීමට හැකි වූ විට (2) වන උපවගන්තිය යටතේ කලින් සිටි කොටස් හිමියකු වගකිව යුතු නොවන්නේ ය.

(4) කොටසකට අදාළ බැරකමක් කලින් සිටි කොටස් හිමියකු විසින් එය දරා සිටි කාලයට පසුව වැඩි වී ඇති අවස්ථාවක, එම කොටස සම්බන්ධයෙන් (2) වන උපවගන්තිය යටතේ කලින් සිටි කොටස් හිමියාගේ බැරකම එම කලින් සිටි කොටස් හිමියා එම කොටස දරා සිටි අවස්ථාවට පසුව එම කොටසකට අදාළ බැරකමේ ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.

**343.** (1) ඇවරකරුවකු විසින් - 

*සහදායක යන්ගේ බැරකම් ක්‍රියාත්මක කිරීම*

(අ) ඇරයුම් නොකළ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් කොටස් හිමියකු ඇරයුමකට වගකිව යුතු අවස්ථාවක, එම ඇරයුම් නොකළ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් එම කොටස් හිමියාට ඇරයුමක් ලබා දිය හැකි ය; සහ

(ආ) සහදායකයකු වූ අන්‍යාකාරයකට සමාගමට බැරකමින් යටත්ව සිටින අවස්ථාවක ඇවරකරු විසින් එම බැරකම සම්බන්ධයෙන් සහදායකයා වෙත ඇරයුමක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඇවරකරුවකු ඇරයුමක් කිරීමේ දී විට, ඇවරුකරු විසින් එම ඇමතුම පිළිබඳ ලිඛිත දැන්වීමක් සහදායකයාට ලබා දිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් නියම කරනු ලැබිය හැකි නියමයන්ට අනුකූල විය යුතු ය.

(4) නියම කරනු ලැබිය හැකි පොලී අනුපාතය හෝ පොලී අනුපාත අනුව ඇරයුම් කිරීම් මත පොලී ගෙවිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ ඇවරකරු විසින් (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් මත, (4) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු වූ යම් පොලියක් ඇත්නම් එය සමග -

(අ) පුද්ගල ඇරයුමක්; හෝ

(ආ) බහු ඇරයුමක්,

ගෙවීම සඳහා අධිකරණය විසින් නියෝග කරනු ලැබිය හැකි ය.

*ඇ - සමාගමේ දේපළ අදාළකර ගැනීම*

**344.** (1) ඇවරකරු විසින් සමාගමේ දේපළ විකිණීමෙන් ලැබෙන මුදල් අදාළ දිනයේ දී පවත්නා පරිදි නිශ්චය කරනු ලබන, හතරවන උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාණයට සහ ප්‍රමුඛතා අනුපිළිවෙළට හිමිකම්පෑම් ඉටු කිරීමට හෝ ඒ සඳහා යොදා ගත යුතු ය. වරණීය හිමිකම්

(2) (1) හතරවන උපලේඛනයේ 9 වන ඡේදයට අගතිවිරහිතව, (1) වන උපවගන්තියේ සඳහන් “සමාගමේ දේපළ” යන්නට, 33 වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ) හෝ (ඉ) ඡේදය අදාළ වන්නේ නම් මිස, පිළිබැඳීමකට යටත් දේපළක් ඊට ඇතුළත් නොවන්නේ ය.

(3) (1) වන උපවගන්තියට අනුකූලව හිමිකම්පෑම් ගෙවීමෙන් පසු, සමාගමේ දේපළ විකිණීමෙන් ලැබෙන මුදල්, සියලු සාමාන්‍ය හිමිකම්පෑම් ද, ඒ සමඟම ගෙවමින්, අදාළ දිනයේ දී නිශ්චය කරන ලද පරිදි වූ සාමාන්‍ය හිමිකම්පෑම් ගෙවීම සඳහා අදාළ කර ගනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ දක්වා ඇති හිමිකම්පෑම් තමන් අතර සමානව ශ්‍රේණිගත වනු ලබන අතර, සමාගමේ දේපළ විකිණීමෙන් ලැබෙන ආදායම ඒවා සඳහා මුදල් ගෙවීමට ප්‍රමාණවත් නොවන්නේ නම් මිස, සම්පූර්ණයෙන් ගෙවනු ලැබිය යුතු අතර, නොඑසේ නම්, එවැනි සියලු හිමිකම්පෑම් අතර අනුපාතිකව අවකරණය විය යුතු ය.

(5) (3) වන උපවගන්තියට අනුකූලව හිමිකම්පෑම් ගෙවීමෙන් පසු (1) වන සහ (3) වන ඡේදවල සඳහන් හිමිකම්පෑම්

මත නියම කරනු ලැබිය හැකි ආකාරයට ගණනය කරන ලද පොළිය අදාළ දිනයේ සිට ගෙවිය යුතු ය.

(6) (5) වන උපවගන්තියේ දක්වා ඇති හිමිකම්පෑම්, එම උපවගන්තියේ සඳහන් පොළිය සම්බන්ධයෙන් එක හා සමානව ශ්‍රේණිගත වනු ලබන අතර, සමාගමේ දේපළ විකිණීමෙන් ලැබෙන ආදායම එය ගෙවීමට ප්‍රමාණවත් නොවන්නේ නම් මිස, එම පොළිය සම්පූර්ණයෙන් ම ගෙවනු ලැබිය යුතු මෙන්ම එසේ ප්‍රමාණවත් නොවන අවස්ථාවෙහි දී එම පොළී සම්බන්ධයෙන් එම උපවගන්තියේ සඳහන් කර ඇති සියලුම හිමිකම්පෑම් අතර අනුපාතිකව අවකරණය විය යුතු ය.

(7) (5) වන උපවගන්තියට අනුව හිමිකම්පෑම් ගෙවීමෙන් පසු ඇවරකරු -

(අ) (ආ) ඡේදයට යටත්ව, සමාගමේ දේපළ විකිණීමෙන් ලැබෙන අතිරික්ත ආදායම (8) වන උපවගන්තියට අනුකූලව යොදාගත යුතු ය;

(ආ) සමාගමේ විකුණනු නොලැබූ අතිරික්ත දේපළ විකිණීම වෙනුවට (8) වන උපවගන්තියට අනුකූලව එම දේපළ බෙදා හරිනු ලැබිය යුතු අතර, පහත දැක්වෙන අවස්ථාවල දී, එනම් -

20 (i) සමාගමේ ව්‍යවස්ථාවලිය එම දේපළ බෙදා හැරීමට අවසර දෙන අවස්ථාවක; හෝ

(ii) පහත දැක්වෙන අවසර දෙකම පළමුවෙන් ලබා ගැනීමෙන් පසු, එනම්-

20 (අ) දේපළ බෙදා හැරිය යුතු බවට විශේෂ යෝජනා සම්මතයක් මගින් කොටස් හිමියන් විසින් ලබා දෙන තීරණයක් ලබා ගැනීමෙන් පසු; සහ

(ආ)දේපළ බෙදා හැරීම සඳහා ඇවරකරුගේ ඉල්ලීම මත ලබා දෙන අධිකරණ අවසරය ලබා ගැනීමෙන් පසු,

ඇවරකරු විසින් එම අතිරික්ත දේපළ බෙදා හැරිය හැකි ය.

(8) (7) වන උපවගන්තිය යටතේ අතිරික්ත මුදල් යොදාගැනීමේ දී හෝ අතිරික්ත දේපළ බෙදාහැරීමේ දී -

(අ) සමාගමේ ව්‍යවස්ථාවලියේ සඳහන් ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව; හෝ

(ආ) එවැනි ප්‍රතිපාදන නොමැති විට, කොටස් හිමියන්ගේ අනුපාතවලට අනුව,

එම දේපළ බෙදා හැරිය යුතු ය.

(9) ඈවර කිරීමක් ආරම්භ කිරීමට පෙර, මෙම වගන්තිය යටතේ ණයහිමියකුගේ ණය සම්බන්ධයෙන් වූ ප්‍රමුඛත්වයට වඩා අඩු ප්‍රමුඛතාවයක් භාර ගැනීමට ණයහිමියකු එකඟ වී ඇති අවස්ථාවක, එම එකඟතාවේ සඳහන් නියමයනට අනුකූලව එම එකඟතාව බලාත්මක වීම වැළැක්වීමට මෙම වගන්තියේ සඳහන් කිසිවක් මගින් බලපෑමක් සිදු නොවිය යුතු ය.

ඇ - වාර්තා කිරීම සඳහා වූ කාර්ය භාරය

වැරදි ක්‍රියා වාර්තා කිරීමට ඈවරකරුට ඇති කාර්යභාරය

**345.** (1) සමාගමේ මුදල් හෝ වෙනත් දේපළ යම් මැදිහත්ව සිටින පාර්ශ්වයක් විසින් වැරදි ලෙස යොදාගෙන ඇති බව හෝ රඳවා තබාගෙන සිටින බව හෝ එම මුදල් හෝ දේපළ සම්බන්ධයෙන් වගකීමකට යටත්ව සිටින බව හෝ වගවීමකට යටත්ව සිටින බව නැතහොත් සමාගමට අදාළව එම පාර්ශ්වය නොසැලකිල්ල පැහැර හැරීම හෝ කාර්යභාරය හෝ විශ්වාසය කඩ කිරීම සම්බන්ධයෙන් වරදකරු වී ඇති බව ඈවරකරු විශ්වාස කරන විට හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති විට ඈවරකරු විසින් ප්‍රායෝගිකව හැකි තාක් ඉක්මනින් එම කාරණය රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට වාර්තා කළ යුතු ය.

(2) ඈවරකරු (1) වන උපවගන්තිය යටතේ වාර්තාවක් සිදු කරනු ලබන යම් අවස්ථාවක, ඈවර කරන්නා විසින් රෙජිස්ට්‍රාර්වරයා හෝ අධිකාරිය පහත දේ සම්බන්ධයෙන් සාධාරණ ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි සහාය රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට ලබා දිය යුතු ය. එනම් -

(අ) තොරතුරු සැපයීම;

(ආ) ලේඛන සඳහා ප්‍රවේශය ලබා ගැනීම; සහ

(ඇ) ලේඛන පරීක්ෂා කිරීම සහ පිටපත් කිරීම සඳහා පහසුකම් ලබා දීම.

(3) (1) වන උපවගන්තියට හෝ (2) වන උපවගන්තියට අනුකූල වීමට අපොහොසත් වන ඇවරකරුවකු වරදක් සිදු කරනු ලැබේ.

සිදු කරන ලද වරද වාර්තා කිරීමට ඇවරකරුට ඇති කාර්යභාරය

**346.** (1) (අ) මෙම පනත යටතේ; හෝ

(ආ) සමාගම් පනත යටතේ; හෝ

(ඇ) 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ,

සමාගමක් විසින් හෝ වෙනත් යම් මැදිහත් පාර්ශ්වයක් විසින් වරදක් සිදු කර ඇති බවට ඇවරකරු විශ්වාස කරන හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති අවස්ථාවක දී එම කාරණය පිළිබඳව ඇවරකරු විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට යොමුකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වාර්තා කරන ලද කාරණයක්, රෙජිස්ට්‍රාර්වරයා විසින් සහ අධිකාරිය විසින් උචිත නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධරයන්ට යොමුකළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරියකට යොමු කරන ලද යම් කාරණයක් සම්බන්ධයෙන් ඇවර කරන්නකු විසින් වාර්තාවක් ඉදිරිපත් කරනු ලබන යම් අවස්ථාවක, ඇවරකරු විසින් -

(අ) තොරතුරු සැපයීම මගින්;

(ආ) ලේඛන සඳහා ප්‍රවේශය ලබා දීම මගින්;සහ

(ඇ) ලේඛන පරීක්ෂා කිරීම සහ පිටපත් කිරීම සඳහා පහසුකම් සැලසීම මගින්,

අධිකාරිය විසින් අවශ්‍ය කරනු ලැබිය හැකි සහාය අධිකාරියට ලබා දිය යුතු ය.

(4) මෙම වගන්තියේ සඳහන් කිසිවක් මගින් වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ ඇවරකරුට පනවන ලද යම් කාර්යභාරයකට බලපෑමක් හෝ සීමා කිරීමක් සිදු නොවිය යුතු ය.

(5) (1) වන උපවගන්තියට හෝ (3) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින ඇවරකරුවකු විසින් වරදක් සිදු කරනු ලබන්නේ ය.

ගිණුම් සකස් කිරීම සඳහා ඇවරකරුට ඇති කාර්යභාරය

**347.** (1) අවස්ථාවෝචිත පරිදි, ඇවරකරු හෝ ඇවර කිරීම අවසානයේ ඇවරකරු වූ තැනැත්තකු විසින් පහත සඳහන් එක් එක් කාල පරිච්ඡේද සඳහා ගිණුමක් සකස් කළ යුතු ය :-

(අ) ඇවරකරු පත් කිරීමෙන් ඉක්බිතිව ම එළඹෙන මාස හයක කාලය සඳහා නැතහොත් ඇවරකරු විසින් නිශ්චය කරනු ලබන කෙටි කාලයක් සඳහා;

(ආ) ඇවරකරු ධුරය දරන පසුව එළඹෙන එක් එක් මාස හයක කාලසීමාව සඳහා; සහ

(ඇ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ආකාරයේ අවසාන කාල පරිච්ඡේදය සහ ඇවරකරු ධුරයෙන් ඉවත් වන දිනය අතර කාලසීමාව සඳහා.

(2) (1) වන උපවගන්තියේ සඳහන් අදාළ කාලසීමාව අවසන් වීමෙන් පසු වැඩ කරන දින විස්සක් ඇතුළත, අදාළ තැනැත්තා විසින් -

(අ) නියම කළ හැකි ආකාරයට, (1) වන උපවගන්තියේ සඳහන් ගිණුම, දන්නා වූ එක් එක් ණයහිමියාට සහ සහදායකයාට යැවිය යුතු ය; සහ

(ආ) ගිණුමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත යැවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් ගිණුම නියම කළ හැකි ආකෘති පත්‍රයට අනුව විය යුතු අතර, එමගින් -

(අ) එක් එක් කාලසීමාව සඳහා ඇවරකරුට ලැබුණු මුදල් සහ ගෙවීම් පෙන්නුම් කළ යුතු ය;

(ආ) පළමු කාලය හැර, එක් එක් කාලසීමාව සඳහා ඇවරකරු පත් කළ දිනයේ සිට ඇවරකරුගේ ලැබීම් සහ ගෙවීම්වල එකතුව පෙන්විය යුතු ය; සහ

(ඇ) නිල දේපළ භාර ගැනුම්කරු ඇවරකරු නොවන අවස්ථාවක සහ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් ගිණුම සම්බන්ධයෙන් හැර, 30 වන වගන්තියට අනුකූල වූ සහ ඇවරකරු විසින් අත්සන් කරන ලද, යාවත්කාලීන කරන ලද අයිතිවාසිකම් ප්‍රකාශයක් ඇතුළත් විය යුතු ය.

(4) 358 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ විශේෂ කළමනාකරුවකු පත් කර ඇති අවස්ථාවක, (1) වන උපවගන්තියේ සඳහන් අදාළ ගිණුමේ හෝ ගිණුම්වල, විශේෂ කළමනාකරුගේ ගිණුම හෝ ගිණුම් ඇතුළත් කර තිබිය යුතු ය.

(5) මෙම වගන්තිය පිළිපැදීම පැහැර හරින සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන්නේ ය.

වැරදි ක්‍රියා වාර්තා කිරීම සඳහා වූ ඇවරකරුගේ කාර්යභාරය

**348.** (1) ඇවර කිරීමක් අවසානයේ ඇවරකරු වූ තැනැත්තකුට මෙම කොටස අදාළ වන්නේ ය.

(2) ඇවර කිරීම සම්බන්ධයෙන් තැනැත්තාගේ අනෙකුත් සියලුම කාර්යභාරය ඉටු කළ වහාම ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මනින් සහ කෙසේ වුව ද, ඇවර කිරීම අවසන් වීමෙන් පසු වැඩ කරන දින විස්සක් ඇතුළත යම් අවස්ථාවක, තැනැත්තා විසින් -

(අ) නියම කළ හැකි තොරතුරු ඇතුළත් අවසාන වාර්තාවක් සහ ප්‍රකාශයක් පිළියෙල කළ යුතු අතර එම ප්‍රකාශයෙහි -

(i) ඇවර කිරීම ආරම්භ වන දිනය වන විට තිබූ සමාගමේ සියලු දේපළ විකුණන ලද හෝ බෙදා හරින ලද හෝ හිමිකම් අත්හරින ලද බව;

(ii) දේපළ විකිණීමෙන් ලැබුණු මුදල් ප්‍රායෝගිකව හැකි ප්‍රමාණයට බෙදා හරින ලද බව; සහ

(iii) සමාගම විසුරුවා හැරීමට නියමිත බව පිළිබඳ විස්තරයක් ඇතුළත් විය යුතු ය;

(ආ) (අ) ඡේදයේ සඳහන් ලේඛන නියම කළ හැකි ආකාරයට, හඳුනාගත් ඒ එක් එක් ණයහිමියාට සහ සහදායකයාට යැවිය යුතු ය; සහ

(ඇ) ලේඛනවල පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත යැවිය යුතු ය.

(3) මෙම වගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන්නේ ය.

*ඉ - විසුරුවා හැරීම*

**349.** (1) (2) වන උපවගන්තියට යටත්ව, 348 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයට අනුකූලවීමෙන් පසු මාස තුනක කල් ඉකුත්වීමේ දී සමාගමක් විසුරුවා හැරිය යුතු ය. විසුරුවා හැරීම

(2) උනන්දුවක් දක්වන තැනැත්තකුගේ ඉල්ලීමක් මත, සමාගම විසුරුවා හැරීමේ දිනය අවශ්‍ය වන පරිදි කල් දැමිය යුතු බවට අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නියෝගයක් නිකුත් කිරීමේ දී අධිකරණය විසින් අවශ්‍ය පරිදි වෙනත් ඕනෑම අනුපූරක ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම නියෝගයක ම පිටපතක්, නියෝගය නිකුත් කිරීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත, අධිකරණය විසින් රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත යැවිය යුතු ය.

*ඊ - විවිධ කාර්යභාර*

මුදල් සම්බන්ධයෙන් ඇවරකරුගේ කාර්යභාරය

**350.** (1) (2) වන සහ (3) වන උපවගන්තිවලට යටත්ව සහ අධිකරණය විසින් කරනු ලැබිය හැකි යම් ආඥාවකට යටත්ව, ඇවරකරුට ලැබෙන සියලුම මුදල් වහාම, බැංකු එකක හෝ වැඩි ගණනක තත් කාර්යය සඳහා පිහිටුවා ඇති ගිණුමකට හෝ ගිණුම්වලට බැර කරනු ලැබිය යුතු ය.

(2) ඇවරකරු විසින් ලැබෙන කිසිදු මුදලක් ඇවරකරුගේ පුද්ගලික බැංකු ගිණුමකට බැර කරනු නොලැබිය යුතු ය.

(3) ඇවරකරුවකු හට නියම කළ හැකි නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, ඇවර කිරීමේ දී ලැබෙන මුදල්, නියම කළ හැකි ප්‍රමාණයට (ඇත්නම්) සහ නියම කළ හැකි නියමයන්ට සහ කොන්දේසිවලට යටත් ව මූල්‍ය ආයතනවල ආයෝජනය කළ හැකි ය.

(4) මෙම වගන්තියට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් ඇවරකරුවකු මේ වගන්තිය යටතේ වරදක් සිදු කරන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියනයකට නොඅඩු සහ රුපියල් මිලියන දෙකහමාරකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු පහකට වැඩි නොවන බරපතළ වැඩ සහිත බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(5) (2) උපවගන්තියට අදාළ ඇවරකරුවකු විසින් වරදක් සිදු කරනු ලබන අවස්ථාවක දී පනවනු ලැබිය හැකි දඩයකට හෝ බන්ධනාගාරගත කිරීමකට අමතරව (2) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් ගෙවන ලද මුදල ඒ මත උපයන ලද යම් පොලී හෝ ලාභ ද සමඟ අධිකරණය විසින් අය කර ගනු ලැබිය යුතු අතර, එකී මුදල -

(අ) දඩ මුදලක් අයකර ගනු ලබන ආකාරයට අයකර ගත යුතු ය;

(ආ) අධිකරණය විසින් අන්‍යාකාරයකට විධාන කරනු ලැබුවහොත් මිස, (i) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

**351.** (1) සමාගමේ දේපළට සහ ව්‍යාපාරයට අදාළව ඇවර කිරීම අතරතුර ලැබුණු මුදල් සහ ගෙවීම් සහ වෙනත් ගනුදෙනු පිළිබඳව නිවැරදිව වාර්තා කරන සහ පැහැදිලි කරන ගිණුම් වාර්තා ඇවරකරු විසින් පිළියෙල කළ යුතු ය. ගිණුම් වාර්තා සම්බන්ධයෙන් ඇවරකරුගේ කාර්යභාරය

(2) උනන්දුවක් දක්වන තැනැත්තකු විසින් අධිකරණයට කරන ලද ඉල්ලීමක් මත, අවශ්‍ය නියම සහ කොන්දේසිවලට යටත්ව, (1) වන උපවගන්තියේ සඳහන් ගිණුම් වාර්තා පරීක්ෂා කිරීමට අයදුම්කරුට හැකි වන පරිදි අධිකරණය විසින් නියෝග කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් ගිණුම් වාර්තා ඇවර කිරීම අවසන් වීමෙන් පසු අවම වශයෙන් වසර හයක් සඳහා ඇවරකරු විසින් රඳවා තබා ගත යුතු ය.

(4) මෙම වගන්තියට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින ඇවරකරුවකු, වරදක් සිදු කරන්නේ ය.

*උ- තාවකාලික ඇවර කිරීමේ දී කාර්යභාරය*

**352.** ඇවරකරුවකුට කරනු ලබන සඳහනක් තාවකාලික ඇවරකරුවකුට කරනු ලබන සඳහනක් වූවා සේ සහ ඇවරකිරීමකට කරනු ලබන සඳහනක් තාවකාලික ඇවරකිරීමකට කරනු ලබන සඳහනක් වූවා සේ, මේ පරිච්ඡේදය තාවකාලික ඇවරකරුවකුට සහ තාවකාලික ඇවරකිරීමකට අදාළවන ප්‍රමාණය, එම නියෝගයේ නිශ්චිතව සඳහන් විය හැකි පරිදි විය යුතු ය. තාවකාලික ඇවර කිරීමේ දී මෙම පරිච්ඡේදය අදාළ වන බව

7 වන පරිච්ඡේදය

**ඇවරකරුගේ පාරිශ්‍රමිකය**

**353.** (1) 361වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට යටත්ව නිල දේපළ භාර ගැනුම්කරු හැර, වෙනත් ඇවරකරුවකුට පදනමක් හෝ කිහිපයක් මත සහ පැයකට හෝ පැය කිහිපයකට, ප්‍රතිශත අනුපාත සහ ස්ථිර මට්ටම් මත - නිල දේපළ භාරගැනුම්කරු හැර ඇවරකරුගේ පාරිශ්‍රමිකය

(අ) 302 වන වගන්තිය සමාගමට අදාළ වන අවස්ථාවක දී, නියම කරනු ලැබිය හැකි ආකාරයට, කොටස් හිමියන් විසින් එකඟ වනු ලැබිය හැකි පරිදි;

(ආ) 302 වන වගන්තිය සමාගමට අදාළ නොවන අවස්ථාවක දී, නියම කළ හැකි ආකාරයට ණයහිමියන් විසින් එකඟ වනු ලැබිය හැකි පරිදි; හෝ

(ඇ) කොටස් හිමියන් හෝ ණයහිමියන් අතර මෙම උපවගන්තියේ පෙර ඡේද යටතේ ගිවිසුමක් නොපවතින විට දී අධිකරණය විසින් නිශ්චය කරනු ලබන පරිදි,

පාරිශ්‍රමිකයක් ලැබීමට හිමිකම් ඇත්තේ ය.

(2) නිල දේපළ භාර ගැනුම්කරු හැර, වෙනත් ඇවරකරුවකුට, පාරිශ්‍රමිකයට අමතරව, 351 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ තබා ගැනීමට නියමිත වාර්තා ගබඩා කිරීමේ සාධාරණ වියදම් ලබා ගැනීමට හිමිකම් තිබිය යුතු ය.

8 වන පරිච්ඡේදය

**ඇවරකරුගේ, තාවකාලික ඇවරකරුගේ සහ විශේෂ කළමනාකරුගේ වගකීම්**

**354.** (1) ඇවර කිරීමේ හෝ තාවකාලික ඇවර කිරීමේ ක්‍රියාවලියේ දී උපචිත වූ වගකීම්වලින් ඇවර කරන්නකු, තාවකාලික ඇවර කරන්නකු හෝ විශේෂ කළමනාකරුවකු ලෙස ක්‍රියා කර ඇති තැනැත්තකු පහත සඳහන් අවස්ථාවල දී, එනම් - දෝෂයක් ඇති අවස්ථාවක වගකීමෙන් නිදහස් කිරීම

(අ) වගකීම උපචිත වූයේ අවස්ථාවෝචිත පරිදි, ඈවරකරු, තාවකාලික ඈවරකරු හෝ විශේෂ කළමනාකරු පත් කිරීමේ යෝජනා සම්මතයේ දෝෂයක් හේතුවෙන් පමණක් වන බවට; හෝ

(ආ) අවස්ථාවෝචිත පරිදි, ඈවරකරු, තාවකාලික ඈවරකරු හෝ විශේෂ කළමනාකරු අවංකව සහ සාධාරණව ක්‍රියා කළ අතර, එම තත්ත්වයන් තුළ වගකීමෙන් නිදහස් කළ යුතු බවට,

අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, අධිකරණය විසින් ඒ තැනැත්තා වගකීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(2) අවශ්‍ය නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ අධිකරණයට සිය බලතල ක්‍රියාත්මක කළ හැකි ය.

9 වන පරිච්ඡේදය

**ඈවර කිරීම - විවිධ**

අද්මිනිස්ත්‍රාසිකරුගේ දේපළ භාර ගැනුම්කරු හෝ විසින් ඈවරකරුට තොරතුරු සහ සහාය ලබා දිය යුතු බව

**355.** (1) 214 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඈවරකරුවකු ප්‍රතිඵල රැස්වීමක දී ණයහිමියන්ගේ යෝජනාවක් මගින් පත් කරනු ලැබූ අවස්ථාවක දී හෝ අද්මිනිස්ත්‍රාසි කිරීමට භාජනය වී ඇති සමාගමක ඈවරකරුවකු වෙනත් යම් ආකාරයකින් පත් කරනු ලැබූ අවස්ථාවක දී සහ 438 වන වගන්තියට යටත්ව, අද්මිනිස්ත්‍රාසි කිරීම අවසානයේ දී අද්මිනිස්ත්‍රාසිකරු ලෙස කටයුතු කළ තැනැත්තා (එම තැනැත්තා, පත් කරනු ලැබූ ඈවරකරු නොවන්නේ නම්) විසින් -

(අ) සමාගමේ කටයුතු, ව්‍යාපාර සහ දේපළ අද්මිනිස්ත්‍රාසි කිරීම ඈවරකරුගේ පාලනය යටතට පත් කිරීම සඳහා අවශ්‍ය සියල්ල වහාම කළ යුතු ය;

(ආ) ප්‍රායෝගිකව හැකි ඉක්මනින් -

(i) 245 වන වගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරු විසින් සාදන ලද සියලුම ගිණුම් වාර්තාවල පිටපතක් ඇවරකරුට ලබා යුතු ය; සහ

(ii) අද්මිනිස්ත්‍රාසි කිරීමට අදාළව, අද්මිනිස්ත්‍රාසිකරු සන්තකයේ හෝ භාරයේ හෝ පාලනය යටතේ ඇති වෙනත් ලියකියවිලි ඇවරකරු වෙත භාර දිය යුතු ය.

(2) 322 වන සහ 438 වන වගන්තිවලට යටත්ව, දේපළ භාර ගැනුම්කාරිත්වය යටතේ පවත්නා සමාගමක ඇවර කිරීම ආරම්භ වන අවස්ථාවක දේපළ භාර ගැනුම්කරු විසින් -

(අ) සමාගමේ කටයුතු, ව්‍යාපාර සහ දේපළ ඇවරකරුගේ පාලනය යටතට පත් කිරීමට අවශ්‍ය සියල්ල දේපළ භාර ගැනුම්කරු විසින් වහා කළ යුතු ය;

(ආ) ප්‍රායෝගිකව හැකි ඉක්මනින් -

(i) 388 වන වගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරු විසින් සකස් කරන ලද සියලුම ගිණුම් වාර්තාවල පිටපත් ඇවරකරුට ලබා දිය යුතු ය; සහ

(ii) දේපළ භාර ගැනුම්කාරිත්වයට අදාළව දේපළ භාර ගැනුම්කරුගේ සන්තකයේ හෝ භාරකාරත්වයේ හෝ පාලනය යටතේ ඇති වෙනත් යම් ලේඛන ඇවරකරු වෙත භාර දිය යුතු ය.

**356.** (1) ඇවරකරුගේ ධුරය දරන තැනැත්තා -

ඇවරකරුගේ ධුරය පුරප්පාඩු වීම

(අ) (2) වන උපවගන්තිය යටතේ තම ධුරයෙන් ඉල්ලා අස්වුවහොත්;

(ආ) මිය ගියහොත්;

(ඇ) අධිකරණය විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්;

(ඇ) බංකොලොත්භාවය පිළිබඳ වෘත්තිකයකු ලෙස වූ ඔහුගේ ලියාපදිංචිය අත්හිටුවා හෝ අවලංගු කර ඇත්නම්; හෝ

(ඉ) 348 වන වගන්තිය යටතේ අවසන් වාර්තාවක් යවා ඇත්නම්,

එකී ධුරය පුරප්පාඩු වන්නේ ය.

(2) නියම කරනු ලැබිය හැකි ආකාරයට වැඩ කරන දින පහක ලිඛිත දැනුම්දීමෙන් පසු සහ ඈවරකරුවකුට ඉල්ලා අස්වීමට ඇති අරමුණ පිළිබඳව -

(අ) පත්වීම් සිදු කළ තැනැත්තාට දැනුම් දීම මගින් සහ පත්වීම කරනු ලැබුවේ අධිකරණය විසින් නම් පත්වීම කරනු ලැබුවේ කවර තැනැත්තකුගේ ඉල්ලීම මත ද එකී තැනැත්තා වෙත දැනුම් දීම මගින්; සහ

(ආ) ණයහිමියන්ට දැනුම් දීම මගින්,

ඈවරකරුට ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(3) පහත දැක්වෙන කාරණාවලට යටත්ව, ඈවරකරු පත් කරන්නා විසින් ඈවරකරුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම සඳහා -

(අ) අධිකරණයේ යම් නියෝගයකට යටත්ව; සහ

(ආ) ඈවරකරුවකු පත් කිරීමට අදාළව මේ කොටස යටතේ වූ නියමයන්ට යටත්ව,

ප්‍රතියෝජන ඈවරකරුවකු පත් කරනු ලැබිය හැකි ය.

(4) (5) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ ඉල්ලීම මත, ඈවරකරුගේ ධුරය කවර හෝ හේතුවක් මත හිස්ව පවතින අවස්ථාවක, අධිකරණය විසින් ආඥාවක් මගින් -

(අ) සුදුසු ප්‍රතියෝජන ඈවරකරුවකු පත් කරමින්; හෝ

(ආ) සුදුසු ප්‍රතියෝජන ඈවරකරුවකු පත් කිරීම සඳහා කාර්ය පටිපාටිය නිශ්චිතව දක්වමින් ,

ආඥා කරනු ලැබිය හැකි ය.

(5) පහත සඳහන් යම් තැනැත්තකුට (4) වන උපවගන්තිය යටතේ අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය:-

(අ) ණයහිමියකු;

(ආ) සහදායකයකු;

(ඇ) සමාගමට කෙරෙහි යම් සම්බන්ධතාවක් ඇති වෙනත් යම් තැනැත්තකු;

(ඈ) රෙජිස්ට්‍රාර්වරයා; හෝ

(ඉ) අධිකාරිය.

(6) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ හැර, ඈවරකරුගේ ධුරයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, එම පුරප්පාඩුව පිළිබඳ ලිඛිත දැන්වීමක් ප්‍රායෝගිකව හැකි ඉක්මනින්, ධුරය හැර යන තැනැත්තා විසින් හෝ එකී තැනැත්තාට එසේ කිරීමට හැකි යාව නොමැති නම් ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා විසින් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට ලබා දිය යුතු ය.

(7) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ හැර, ඈවර කරන්නකුගේ ධුරය හිස් කරනු ලබන තැනැත්තකු විසින් ප්‍රායෝගිකව එසේ කළ හැකි අවස්ථාවල දී, ඒ තැනැත්තාගේ අනුප්‍රාප්තිකයා විසින් සාධාරණ ලෙස ඉල්ලා සිටිනු හැකි ලැබිය හැකි පරිදි, තොරතුරු සහ සහාය එම අනුප්‍රාප්තිකයාට ලබා දිය යුතු ය.

(8) ඈවර කරන්නකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරන ලද තැනැත්තකුගේ ඉල්ලීම මත, ඈවරකරුගේ කාර්ය, බලතල සහ කාර්තව්‍ය ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම පහසු කරලීමට අවශ්‍ය යයි සලකන යම් ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(9) (6) වන හෝ (7) වන උපවගන්තිවල විධිවිධාන කිසිවකට අනුකූල වීමට අපොහොසත් වන සෑම තැනැත්තකු ම මෙම උපවගන්තිය යටතේ වරදක් සිදු කරන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

(10) (8) වන උපවගන්තිය යටතේ කරන ලද යම් අධිකරණ ආඥාවකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම මෙම උපවගන්තිය යටතේ වරදක් සිදු කරන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු නිදහස් කිරීම

**357.** (1) යම් තැනැත්තකු ඇවරකරු හෝ තාවකාලික ඇවරකරුවකු වීම අවසන් වීමේ දී -

(අ) සමාගමට 302 වන වගන්තිය අදාළ වන අවස්ථාවක-

(i) එක් එක් කොටස් හිමියාට, නියම කරනු ලබන ආකාරයට සහ නියම කරනු ලැබිය හැකි ලේඛන ගොනු කරමින් ඉල්ලා සිටින නිදහස් කිරීම පිළිබඳව දැනුම් දී ඔවුන්, එයට විරුද්ධ විය හැකි ආකාරය පැහැදිලි කර ඇති අවස්ථාවක දී; සහ

(ii) නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ නියම කරනු ලැබිය හැකි කාලසීමාවක් තුළ කොටස් හිමියන් විරෝධය පළ නොකරන අවස්ථාවක දී; හෝ

(ආ) 302 වන වගන්තිය සමාගමට අදාළ නොවන අවස්ථාවක දී -

(i) හඳුනා ගනු ලැබූ එක් එක් ණයහිමියන්ට, නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ නියම කරනු ලැබිය හැකි ලේඛන ඇතුළත් කොට, ඉල්ලා සිටින නිදහස් කිරීම පිළිබඳව සහ ඔවුන්ට එයට විරුද්ධ විය හැකි ආකාරය පැහැදිලි කර දැනුම් දී ඇත්නම්; සහ

(ii) නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ නියම කරනු ලැබිය හැකි කාලසීමාවක් තුළ ණයහිමියන් එයට විරුද්ධ නොවන්නේ නම්; හෝ

(ඇ) නියම කරනු ලැබිය හැකි ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමෙන් පසුව, අධිකරණය විසින් අවසර ලබා දී ඇත්නම්,

ඒ තැනැත්තා, ඇවරකරු වීමෙන් හෝ තාවකාලික ඇවරකරු වීමෙන් මුදාහරිනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන මුදා හැරීම, අවස්ථාවෝචිත පරිදි, සමාගමේ ඇවර කිරීම හෝ තාවකාලික ඇවර කිරීම සම්බන්ධයෙන් එකී තැනැත්තාගේ කිසියම් ක්‍රියාවක් අතපසුවීමක් හෝ තීරණයක් සම්බන්ධයෙන් 419 වන වගන්තිය යටතේ වන බැරකම් හැර, සියලු බැරකම්වලින් ඒ තැනැත්තා නිදහස් කරනු ලබන්නේ ය.

(3) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ මුදාහරිනු ලැබූ අවස්ථාවක, එම තැනැත්තා එහි මුදාහැරීමෙන් වැඩ කරන දින දහයක් ඇතුළත එම මුදාහැරීම පිළිබඳ ලිඛිත දැනුම්දීමක් අධිකාරියට ලබා දිය යුතු ය.

විශේෂ කළමනාකරුවකු පත් කිරීම

**358.** (1) ඇවරකරුගේ හෝ තාවකාලික ඇවරකරුගේ ඉල්ලීම මත, (2) වන උපවගන්තියේ කොන්දේසි සපුරා ඇති බවට අධිකරණ සෑහීමකට පත් වන අවස්ථාවක, විශේෂ කළමනාකරුවකු පත් කරමින් අධිකරණය විසින් නියෝගයක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් කර ඇති කොන්දේසිය වනුයේ, සමාගමේ කටයුතු, ව්‍යාපාර හෝ දේපළවල ස්වභාවය හෝ පොදුවේ ණයහිමියන්ගේ හෝ සහදායකයින්ගේ සම්බන්ධතා විශේෂ කළමනාකරුවකු පත් කිරීම අවශ්‍ය කරනු ලබන බව වන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ කොන්දේසිය සපුරා තිබේ ද නැද්ද යන්න තීරණය කිරීමේ දී, ඉල්លුම්කරුට සමාගමේ සමස්ත කටයුතු, ව්‍යාපාර හෝ දේපළ පිළිබඳ සාධාරණ මට්ටමේ පුද්ගලික

පාලනයක් ක්‍රියාත්මක කළ හැකි ද යන්න පිළිබඳව අධිකරණය සලකා බැලිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කිරීමේ දී අධිකරණයට අවශ්‍ය පරිදි වෙනත් යම් අනුපූරක නියෝගයක් ද කළ හැකි ය.

(5) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් මඟින් පත් කරන ලද විශේෂ කළමනාකරුවකු -

(අ) ආඥාවේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ, එනම් -

(i) නිශ්චිත කාල සීමාවන් සඳහා;

(ii) නිශ්චිතව සඳහන් සිදුවීමක් සිදු වන තුරු; හෝ

(iii) අධිකරණය විසින් වැඩිදුර ආඥාවක් කරන තුරු,

ක්‍රියා කළ යුතු ය;

(ආ) ආඥාවේ නිශ්චිතව දක්වා ඇති බලතල සහ කාර්ය විශේෂ කළමනාකරුට තිබිය යුතු ය;

(ඇ) නියම කරනු ලැබිය හැකි පරිදි වූ ගිණුම් සකස් කළ යුතු ය;

(ඈ) (ඇ) වන ඡේදයේ සඳහන් ගිණුම් එවැනි තැනැත්තන්ට, නියම කරනු ලැබිය හැකි තැනැත්තන්ට එවැනි ආකාරයට සහ එවැනි කාලසීමාවන් තුළ යැවිය යුතු ය; සහ

(ඉ) අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයක් ලබා ගැනීමට විශේෂ කළමනාකරුට හිමිකම් තිබිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් මඟින් පත් කරන ලද විශේෂ කළමනාකරුවකු අධිකරණයේ නිලධරයකු විය යුතු ය.

(7) එසේ පත්කරනු ලැබිය යුතු තැනැත්තා විසින් නියම කරනු ලැබිය හැකි නියමයන්ට අනුකූලව පත්වීම සඳහා වූ

ඉල්ලුම්කරුගේ සුරැකුම ලබා දෙන තෙක් විශේෂ කළමනාකරුවකු පත් කිරීම බලාත්මක නොවේ.

(8) විශේෂ කළමනාකරුවකු විසින්, පත් කරනු ලැබීමෙන් පසු ප්‍රායෝගිකව හැකි ඉක්මනින් සහ කෙසේ වුව ද, වැඩ කරන දින පහක් ඇතුළත, නියම කරනු ලැබිය හැකි තැනැත්තන්ට සහ නියම කරනු ලැබිය හැකි ආකාරයට, පත් කිරීම පිළිබඳ දැනුම් දීමක් කරනු ලැබිය යුතු ය.

(9) විශේෂ කළමනාකරුවකුගේ පත්වීම -

(අ) විශේෂ කළමනාකරුගේ;

(ආ) තාවකාලික ඇවර කරන්නකු ගේ; හෝ

(ඇ) ඇවර කරන්නකුගේ,

ඉල්ලීමක් මත අධිකරණය විසින් අවසන් කරනු ලැබිය හැකි ය.

(10) පහත දැක්වෙන අවස්ථාවල දී, එනම් -

(අ) 302 වන වගන්තිය සමාගමට අදාළ වන අතර, විශේෂ යෝජනාවක් මගින්, පත් කිරීම අවසන් කළ යුතු බවට කොටස් හිමියන් තීරණය කරන්නේ නම්; හෝ

(ආ) 302 වන වගන්තිය සමාගමට අදාළ නොවන අතර, ණයහිමියන්ගේ යෝජනා සම්මතයක් මගින් පත්වීම අවසන් කළ යුතු බවට තීරණය කරන්නේ නම්,

විශේෂ කළමනාකරුවකුගේ පත්වීම අවසන් කිරීම සඳහා වූ ආඥාවක් සඳහා ධුරය දරන ඇවරකරුවකු හෝ තාවකාලික ඇවරකරුවකු හෝ විසින් අධිකරණයට ඉල්ලුම් කළ යුතු ය.

(11) (9) වන උපවගන්තිය යටතේ ඇති ඉල්ලීමක් මත අධිකරණය විසින් -

(අ) විශේෂ කළමනාකරුගේ පත් වීම අවසන් කරමින් ආඥාවක් කළ හැකි ය; සහ

(ආ) එවැනි ආඥා කිරීමේ දී, අවශ්‍ය පරිදි, වෙනත් අනුපූරක ආඥාවක් කළ හැකි ය.

(12) විශේෂ කළමනාකරුවකුගේ පත්වීම අවසන් කිරීමෙන් ලැබිය හැකි වැඩ කරන දින පහක් ඇතුළත, විශේෂ කළමනාකරු විසින් එම අවසන් කිරීම පිළිබඳව නියම කරනු ලැබිය හැකි තැනැත්තන්ට සහ නියම කරනු ලැබිය හැකි ආකාරයට දැනුම් දීමක් කළ යුතු ය.

මුද්දර ගාස්තුවලින් නිදහස් කිරීම

**359.** සමාගමක් ඈවර කිරීමේ දී -

(අ) ඔප්පුව ලියා අත්සන් කිරීමට පෙර සහ පසු යන අවස්ථා දෙකෙහි දී ම සමාගමේ දේපළෙහි කොටසක් වන නිශ්චල දේපළකට පමණක් අදාළ වන සෑම ඔප්පුවක් ම හෝ යම් චංචල හෝ නිශ්චල දේපළක බූදලයට, අයිතියකට හෝ සම්බන්ධතාවකට අදාළ සෑම ඔප්පුවක් ම; සහ

(ආ) (i) සමාගමේ දේපළක් වන; හෝ

(ii) ඈවර කිරීමේ කොටසක් වන යම් නීතිමය ක්‍රියාවලියක් හෝ වෙනත් නීතිමය කටයුත්තකට,

එකලාව, අදාළ සෑම ඇටෝර්නි බලපත්‍රයක්, පෙරකළාසියක්, රිට් පත්‍රයක්, ආඥාවක්, සහතිකයක්, දිවුරුම් ප්‍රකාශයක්, බැඳුම්කරයක් හෝ වෙනත් ලිඛිත සාධන පත්‍රයක්,

මුද්දර ගාස්තුවලින් නිදහස් විය යුතු ය.

10 වන පරිච්ඡේදය

**ඈවර කිරීමේ දී සහ තාවකාලික ඈවර කිරීමේ දී අධිකරණයේ බලතල**

ඈවරකරුවකු හෝ තාවකාලික ඈවරකරු විසින් විධාන සඳහා ඉල්ලුම් කිරීම

**360.** (1) අධිකරණය විසින් ඈවරකරුගේ හෝ තාවකාලික ඈවරකරුගේ හෝ අධිකාරියේ ඉල්ලීම මත -

(අ) අවස්ථාවෝචිත පරිදි, ඈවරකරුගේ හෝ තාවකාලික ඈවරකරුගේ යම් බලතල ක්‍රියාත්මක කිරීම හෝ කාර්ය සහ කර්තව්‍ය

ඉටු කිරීමට, අදාළව උද්ගතවන යම් කාරණයක් සම්බන්ධයෙන් විධාන ලබා දිය හැකි ය; හෝ

(ආ) එවැනි යම් විධානයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ වෙනස් කිරීම කළ හැකි ය .

(2) (1) වන උපවගන්තිය යටතේ පවරා ඇති බලතල -

(අ) අධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙනත් බලතලවලට අමතරව විය යුතු ය; සහ

(ආ) ඉල්ලීම ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු එම පත්වීම දැරීම අවසන් වී ඇති වුව ද එසේ නැති වුව ද අධිකරණය විසින් එම බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) අවස්ථාවෝචිත පරිදි, ඇවරකරුගේ හෝ තාවකාලික ඇවරකරුගේ යම් ක්‍රියාවක්, අතපසුවීමක් හෝ තීරණයක් සම්බන්ධයෙන් ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු (1) උපවගන්තිය යටතේ ලබා දී ඇති විධානවලට අනුකූලව ක්‍රියා කළ බව ඇවරකරුට හෝ තාවකාලික ඇවරකරුට එරෙහි හිමිකම්පෑමක් සම්බන්ධයෙන් විත්තිවාචකයක් වන්නේ ය.

ඇවරකරුවන් සහ තාවකාලික ඇවරකරුවන් පිළිබඳ අධිකරණයේ අධීක්ෂණය සහ ඇවරකරුවන්ගේ පාරිශ්‍රමික හෝ පත්වීම් පිළිබඳව ආඥා කිරීම

**361.** (1) (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත අධිකරණය විසින් -

(අ) ඇවරකරුවකුගේ හෝ තාවකාලික ඇවරකරුවකුගේ ක්‍රියාවක් හෝ තීරණයක් ස්ථිර කිරීම, ප්‍රතිවර්තනය කිරීම හෝ මඳ වශයෙන් වෙනස් කිරීම කළ හැකි ය;

(ආ) 353 වන වගන්තිය යටතේ, නිල දේපළ භාර ගැනුම්කරු හැර, වෙනත් ඇවරකරුවකුගේ පාරිශ්‍රමිකය තීරණය කර නොමැති යම් කාල පරිච්ඡේදයක් හෝ ක්‍රියාවක් සම්බන්ධයෙන් අවස්ථානුගත කරුණු අනුව සාධාරණ මට්ටමකින් පාරිශ්‍රමික නියම කළ හැකි ය; හෝ සහ

(ඈ) ඇවරකරු වලංගු ලෙස පත් කළේ ද නැද්ද යන්න ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) පහත සඳහන් කවර හෝ තැනැත්තකුට (1) වන උපවගන්තිය යටතේ අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය:-

(අ) ඇවරකරු හෝ ඇවරකරු ලෙස පත් කිරීමට සිටිනු ලබන තැනැත්තකු;

(ආ) තාවකාලික ඇවරකරුවකු;

(ඇ) අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු;

(ඈ) දේපළ භාර ගැනුම්කරුවකු;

(ඉ) ණයහිමියකු;

(ඊ) සහදායකයකු;

(උ) සමාගමෙහි සම්බන්ධතාවක් ඇති වෙනත් යම් තැනැත්තකු;

(ඌ) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය සම්බන්ධයන්, රෙජිස්ට්‍රාර්වරයා; හෝ

(එ) අධිකාරිය.

(3) (1) වන උපවගන්තිය යටතේ ලබා දී ඇති බලතල, ඉල්ලීම ඉදිරිපත් කරන විට අවස්ථාවෝචිත පරිදි ඇවරකරුගේ හෝ තාවකාලික ඇවරකරු එම තනතුරේ ක්‍රියා කිරීම අවසන් වී තිබුණ ද නොතිබුණ ද, ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

ඇවර කිරීමේ දී සහ තාවකාලික ඇවර කිරීමේ දී අධිකරණයේ සාමාන්‍ය බලතල

**362.** (1) (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ ඉල්ලීම මත, මෙම X11 කොටසේ විධිවිධාන යම් සමාගමකට අදාළව, අදාළ විය යුතු ආකාරය සම්බන්ධයෙන් අවශ්‍ය යයි සලකන යම් ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(2) පහත සඳහන් යම් තැනැත්තකුට (1) වන උපවගන්තිය යටතේ අධිකරණයට අයදුම්පතක් ඉදිරිපත් කළ හැකි ය:-

(අ) ඇවරකරු හෝ ඇවරකරු ලෙස පත් කරනු ලැබීමට සිටින තැනැත්තකු;

(ආ) තාවකාලික ඇවරකරුවකු;

(ඇ) විශේෂ කළමනාකරුවකු;

(ඈ) අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු;

(ඉ) දේපළ භාර ගැනුම්කරුවකු;

(ඊ) ණයහිමියකු;

(උ) සහදායකයකු;

(ඌ) සමාගම කෙරෙහි සම්බන්ධතාවයක් ඇති වෙනත් යම් තැනැත්තකු;

(එ) රෙජිස්ට්‍රාර්වරයා;

(ඒ) අධිකාරිය; හෝ

(ඔ) අධිකරණයේ අවසරය ඇතිව, උනන්දුවක් දක්වන වෙනත් යම් තැනැත්තකු.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක දී පහත දැක්වෙන හේතු මත ඇවර කිරීම අවසන් කළ යුතු බවට අධිකරණය සෑහීමකට පත් වන අවස්ථාවක දී අධිකරණය විසින් ඇවර කිරීමක් අවසන් කළ හැකි ය; එනම් -

(අ) මේ කොටසේ විධිවිධාන අයුතු ලෙස භාවිත කරනු ලැබීම;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම හේතු කොටගෙන 188 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ අත්හිටුවනු ලැබ ඇති ඇවර කිරීමක් සම්බන්ධයෙන් වන විට, අවස්ථාවක අද්මිනිස්ත්‍රාසි කිරීම අවසන් වී ඇති විට හෝ අවසන් කිරීමට නියමිතව ඇති විට (සමාගම් වැඩපිළිවෙළක් පිළිබඳ ඔප්පුවක් සකසා ඇති විට හෝ එසේ නැති විට) සහ සමාගම වස්තුභංගත්වයට පත් වී නැති හෝ එසේ වීමට ඉඩ ප්‍රස්ථා නැති බවට අධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක; හෝ

(ඇ) වෙනත් යම් හේතුවක් අනුව ඇවැර කිරීම අවසන් කළ යුතු බව සාධාරණ හා යුක්තිසහගත වන විට,

අධිකරණය විසින් ඇවර කිරීම අවසන් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම ආඥාවකම පිටපතක්, එම ආඥාව සිදු කර වැඩ කරන දින පහක් ඇතුළත අධිකරණය විසින් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට යවනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබීමේ දී අවශ්‍ය පරිදි අධිකරණය විසින් -

(අ) නියම හෝ කොන්දේසි පනවනු ලැබිය හැකි ය; සහ

(ආ) වෙනත් යම් අනුපූරක ආඥාවක් කරනු ලැබිය හැකි ය.

ඇවරකරුගේ හෝ තාවකාලික ඇවරකරුගේ කාර්ය බලාත්මක කිරීම සඳහා වූ ආඥාව

**363.** (1) මෙම වගන්තියේ, ඇවරකරුවකු හෝ තාවකාලික ඇවරකරුවකු සම්බන්ධයෙන් “අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වීම” යන්නෙන් -

(අ) මෙම පනත හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ; හෝ

(ආ) මෙම වගන්තිය යටතේ අනුකූල වීම සඳහා කරනු ලබන ආඥාවක් හැර, අධිකරණයේ යම් ආඥාවක් හෝ විධානයක් යටතේ,

උද්ගතවන්නා වූ කාර්ය භාරයකට අනුකූලව ක්‍රියාකිරීමට ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු (ක්‍රියාවෙන් හෝ නොකර හැරීමෙන්) අපොහොසත් වීම අදහස් වන අතර, “අනුකූලව ක්‍රියා කිරීම” යන්නට, අනුරූපී අර්ථය තිබිය යුතු ය.

(2) (3) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ ඉල්ලීමක් මත සහ අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීමක් තිබෙන බව හෝ තිබූ බවට අධිකරණය සෑහීමකට පත් වන අවස්ථාවක දී, අධිකරණය විසින් -

(අ) කාර්යභාරය කඩ කිරීමක් සම්බන්ධයෙන් ලබා ගත හැකි වෙනත් අයිතියකට හෝ ප්‍රතිකර්මයකට අගතිවිරහිතව අවස්ථාවෝචිත පරිදි ඇවරකරුට හෝ තාවකාලික ඇවරකරුට ආඥාවේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි අදාළ කාර්ය අනුකූලව ක්‍රියා කරන ලෙස ආඥාව කිරීම; හෝ

(ආ) අදාළ කාර්ය සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් අනුකූලව ක්‍රියා කිරීමෙන් අවස්ථාවෝචිත පරිදි, ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු නිදහස් කිරීම,

කරනු ලැබිය හැකි ය.

(3) පහත සඳහන් කවර හෝ තැනැත්තකුට (2) වන උපවගන්තිය යටතේ අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. එනම් -

(අ) දේපළ භාර ගැනුම්කරු;

(ආ) ණයහිමියකු;

(ඇ) සහදායකයකු;

(ඈ) සමාගමෙහි සම්බන්ධතාවක් ඇති වෙනත් යම් තැනැත්තකු;

(ඉ) අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු;

(ඊ) රෙජිස්ට්‍රාර්වරයා; හෝ

(උ) අධිකාරිය.

(4) අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම පිළිබඳ දැන්වීම අවස්ථාවෝචිත පරිදි ඇවරකරුට හෝ තාවකාලික ඇවරකරුට, ඉල්ලීම ඉදිරිපත් කිරීමට පෙර යටත් පිරිසෙයින් දින දහයක් ඇතුළත භාර දී ඇත්නම් මිස සහ ඉඩදීමේ දිනයේ දී පැහැර හැරීම දිගට ම පවතින්නේ ද නම් මිස, (2) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු නොලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද සෑම ආඥාවක ම පිටපතක්,ආඥාව නිකුත් කිරීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත, අධිකරණය විසින් අධිකාරිය වෙත යැවිය යුතු ය.

අධිකරණය මගින් ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු ධුරයෙන් ඉවත් කිරීම

**364.** (1) 363 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් වන තැනැත්තකුගේ ඉල්ලීම මත සහ පහත සඳහන් පරිදි, එනම් -

(අ) 363 වන වගන්තියේ (2) වන උපවගන්තියේ(අ) ඡේදය යටතේ කරන ලද ආඥාවකට අනුකූලව ක්‍රියා කිරීම ඇවරකරුවකු හෝ තාවකාලික ඇවරකරුවකු විසින් පැහැර හැර ඇති බවට; හෝ

(ආ) ඇවරකරුවකු ඇවරකරුවකු ලෙස 312 වන වගන්තිය යටතේ පත් කරනු ලැබීමට හෝ ක්‍රියා කිරීමට අවසර ලැබීම අවසන්ව ඇති බවට,

අධිකරණය සෑහීමට පත් වී ඇති අවස්ථාවක අධිකරණය විසින්-

(ඇ) අවස්ථාවෝචිත පරිදි, ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු ධුරයෙන් ඉවත් කිරීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය; සහ

(ඈ) වෙනත් යම් අනුපූරක ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද සෑම ආඥාවක ම පිටපතක්, ආඥාව නිකුත් කිරීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත, අධිකරණය විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත සහ අධිකාරිය වෙත යැවිය යුතු ය.

යම් ඉල්ලීමක් හෝ නඩු කටයුත්තක් නැවැත්වීමට හෝ වැළැක්වීමට ඇති බලය

**365.** (1) 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය යටතේ වූ ඉල්ලීමක් කිරීමෙන් පසු කවර හෝ අවස්ථාවක දී සහ එම ඉල්ලීම පිළිබඳ තීරණය ලබා දීමට පොරොත්තුව පවතිද්දී සමාගමට හෝ සමාගමේ දේපළකට එරෙහිව අධිකරණයක් තුළ යම් ඉල්ලීමක් හෝ නඩු කටයුත්තක් අවසන් නොවී පවතින අවස්ථාවක එම ඉල්ලීම හෝ නඩු කටයුත්ත නැවැත්වීම හෝ වැළැක්වීම සඳහා සමාගම හෝ ණයහිමියකු හෝ සහදායකයකු විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් මත, අධිකරණය විසින් එම ඉල්ලීම හෝ නඩු කටයුත්ත අවශ්‍ය නියම සහ කොන්දේසි මත නැවැත්වීම හෝ වැළැක්වීම කරනු ලැබිය හැකි ය.

*ඇවර කිරීමක දී හෝ තාවකාලික ඇවර කිරීමේ දී ණයහිමියන් ආරක්ෂා කිරීම සඳහා වූ ආඥාව*

**366.** යම් සමාගමක් ඇවර කිරීමේ දී හෝ තාවකාලික ඇවර කිරීමේ දී, රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ අධිකාරියේ ඉල්ලීම මත, සමස්තයක් ලෙස ණයහිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අධිකරණයට අවශ්‍ය යම් ආඥාවක් කළ හැකි ය.

## XIII වන කොටස

## දේපළ භාරගැනුම්කාරිත්වය

### 1 වන පරිච්ඡේදය

### අර්ථ නිරූපණය

*අර්ථ නිරූපණය*

**367.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම කොටසේ හා දසවන උපලේඛනයේ “දීමනාකරු” යන්නෙන්, යම් සමාගමක දේපළ සම්බන්ධයෙන් දේපළ භාරගැනුම්කරුවකු පත් කර ඇත්නම් හෝ පත් කරනු ලැබිය හැකි වන්නේ නම්, එවැනි සමාගමක් අදහස් වේ.

### 2 වන පරිච්ඡේදය

### දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම

*දේපළ භාර ගැනුම්කරුවකු පත්කිරීම සඳහා සාධන පත්‍රයක් මගින් බලය පැවැරිය හැකි බව*

**368.** සමාගමක සමස්ත හෝ ප්‍රමාණවත් වශයෙන් සමස්ත දේපළ හා ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සෘණ භාරයක් නිර්මාණය කරනු ලබන සාධන පත්‍රයක් මගින් එකී දේපළ සහ ව්‍යාපාර කටයුතු සඳහා භාරගැනුම්කරුවකු පත් කිරීමේ බලය ප්‍රදානලාභියා වෙත පවරනු ලැබිය හැකි ය.

*දේපළ භාර ගැනුම්කාරිත්වය ආරම්භ වන්නේ කවර අවස්ථාවකදී ද යන වග*

**369.** සමාගමක දේපළ භාර ගැනුම්කාරිත්වය ආරම්භ වන්නේ මෙම කොටස යටතේ ප්‍රතියෝජන දේපළ භාර ගැනුම්කරුවකු හැර දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලබන දිනයේ සිට සහ එම පත් කරන අවස්ථාවේ සිට ආරම්භ වේ.

**370.** (1) යම් තැනැත්තකු -

දේපළ භාර ගැනුම්කරුවකු ලෙස පත් කළ හැකි වනුයේ සහ ක්‍රියා කළ හැකි වනුයේ කවුරුන් ද යන්න

(අ) දේපළ භාර ගැනුම්කාරිත්වය සම්බන්ධයෙන් ප්‍රධාන තනතුරක් දරන්නකු ලෙස පත් කිරීමට සහ ක්‍රියා කිරීමට 12 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබා ඇත්නම්;

(ආ) දේපළ භාර ගැනුම්කරුවකු ලෙස පත් කරනු ලැබීමට හෝ ක්‍රියා කිරීමට 371 වන වගන්තිය යටතේ නුසුදුස්සකු බවට පත්ව නොමැති නම්;

(ඇ) (i) දේපළ භාර ගැනුම්කාරිත්වය සම්බන්ධයෙන් ප්‍රධාන තනතුරකට පත් කරනු ලැබීමට හෝ ක්‍රියා කිරීමට 12 වැනි වගන්තිය යටතේ තමා සුදුසුකම් ලබා ඇති බවට; සහ

(ii) දේපළ භාර ගැනුම්කරුවකු ලෙස පත් කරනු ලැබීමට හෝ ක්‍රියා කිරීමට 371 වන වගන්තිය යටතේ තමා නුසුදුස්සකු බවට පත්ව නොමැති බවට,

එම තැනැත්තා විසින් ලිඛිතව සහතික කර ඇත්නම්; සහ

(ඈ) එම පත්වීම සඳහා ලිඛිතව කැමැත්ත පළ කර ඇති අතර, පත් කරනු ලබන අවස්ථාවේ දී ඔහු විසින් කැමැත්ත ඉල්ලා අස්කර ගෙන නොමැති නම්,

එම තැනැත්තා යම් සමාගමක දේපළ භාරගැනුම්කරුවකු ලෙස පත් කරනු ලැබීමට හෝ එසේ ක්‍රියා කරනු ලැබීමට හැකි ය.

(2) යම් තැනැත්තකුගේ කැමැත්ත ඇතිව එම තැනැත්තාට (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් අවශ්‍යතාවන්ගෙන් කවර අවශ්‍යතාවක් හෝ නොමැති බව දැන දැනම, එම තැනැත්තා සමාගමක දේපළ භාර ගැනුම්කරුවකු ලෙස පත් කරන ලද විට හෝ ක්‍රියා කරනු ලබන අවස්ථාවක එම තැනැත්තා වරදක් සිදු කරන්නේ ය.

දේපළ භාර ගැනුම්කරුවකු ලෙස පත් කිරීමට හෝ ක්‍රියා කිරීමට නුසුදුසුකම්

**371.** (1) පහත සඳහන් තැනැත්තන් සහ ඔවුන් සම්බන්ධ පාර්ශ්වයන් සමාගමක දේපළ භාර ගැනුම්කරු ලෙස පත් කිරීමට හෝ ක්‍රියා කිරීමට නුසුදුස්සන් වන්නෝ ය:-

(අ) සමාගමේ ණයහිමියෙක්;

(ආ) දේපළ භාර ගැනුම්කාරිත්වය ආරම්භ කළ දිනට පෙරාතුව වූ වසර දෙකක කාලසීමාව තුළ එම තැනැත්තා -

(i) එකී සමාගමේ හෝ එහි ආශ්‍රිත සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු හෝ විගණකවරයකු හෝ සේවානියුක්තයකු වශයෙන් සිටියේ නම්; හෝ

(ii) භාර ගැනුම්කාරිත්වයේ පවතින දේපළෙහි ලැබුම්කරුගේ අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු හෝ සේවානියුක්තයකු වශයෙන් සිටියේ නම්,

එවැනි තැනැත්තන්;

(ඇ) යම් තැනැත්තකු දේපළ භාර ගැනුම්කාරිත්වය ආරම්භ වන දිනට පෙරාතුව වූ වසර දෙකක කාලසීමාව තුළ -

(i) සමාගම හෝ අදාළ ආශ්‍රිත සමාගමක් විසින් නිකුත් කරන ලද යම් කොටසකට ඍජු සම්බන්ධතාවක් දක්වන්නේ නම් හෝ දක්වන ලද්දේ නම්; හෝ

(ii) සමාගම හෝ ආශ්‍රිත සමාගම විසින් නිකුත් කරන ලද යම් වර්ගයක කොටස්වලින් සියයට පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයකට ඍජු නොවන සම්බන්ධතාවක් ඇත්නම් හෝ පැවතියේ නම්,

එවැනි තැනැත්තන්; හෝ

(ඇ) 372 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ යම් සාධන පත්‍රයක් යටතේ පත් කිරීමට නියමිත දේපළ භාර ගැනුම්කරුවකු එම තනතුරට පත් කිරීමට හෝ ක්‍රියා කිරීමට සාධන පත්‍රය යටතේ එම තැනැත්තාට අවසර නැත්නම්, එවැනි තැනැත්තන්,

සමාගමේ දේපළ භාර ගැනුම්කරුවකු ලෙස පත් කිරීමට හෝ ක්‍රියා කිරීමට නුසුදුස්සකු වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නුසුදුස්සකු බවට පත් ව සිටියදී යම් තැනැත්තකු දේපළ භාර ගැනුම්කරුවකු වශයෙන් පත් කරනු ලබන හෝ එසේ කටයුතු කරනු ලබන තැනැත්තතු වරදක් සිදු කරන්නේ ය.

සාධන පත්‍රයක් යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම

**372.** (1) යම් සාධන පත්‍රයක් මගින් සමාගමක දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීමේ බලය ප්‍රදානලාභියාට ලබා දෙනු ලබන විට, ප්‍රදානලාභී විසින් හෝ ඔහු වෙනුවෙන් ලිඛිතව අත්සන් කරන ලද සාධන පත්‍රයක් මගින් දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් සාධන පත්‍රයක් යටතේ පත් කරන ලද දේපළ භාර ගැනුම්කරුවකු එම සාධන පත්‍රයේ අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, එම තනතුර ප්‍රදානය කළ තැනැත්තාගේ නියෝජිතයකු වන්නේ ය.

(3) (අ) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද; සහ

(ආ) දේපළ භාර ගැනුම්කාරිත්වයට අදාළ දේපළවල නිශ්චල දේපළ ඇතුළත් වුව ද එසේ නොමැති වුව ද,

(1) උපවගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබිය හැකි ය.

(4) යම් සාධන පත්‍රයක් මගින් අන්‍යාකාරයෙන් ප්‍රකාශිතව විධිවිධාන සලස්වා ඇත්නම් මිස, දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීමට යම් සාධන පත්‍රයක් මගින් පවරා ඇති බලයට -

(අ) දේපළ භාර ගැනුම්කරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක්;

(ආ) දැනටමත් ධුරයේ සිටින දේපළ භාර ගැනුම්කරුට අමතරව තවත් දේපළ භාර ගැනුම්කරුවකු;

(ඇ) ධුරය පුරප්පාඩු වී ඇති දේපළ භාර ගැනුම්කරුවකු වෙනුවට කටයුතු කිරීමට දේපළ භාර ගැනුම්කරුවකු,

පත් කිරීමේ බලය ඇතුළත් වන්නේ ය.

(5) යම් සාධන පත්‍රයක් යටතේ තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් දේපළ භාර ගැනුම්කරුවන් ලෙස පත් කරනු ලැබූ අවස්ථාවක -

(අ) සාධන පත්‍රය මගින් අන්‍යාකාරයකින් විධිවිධාන සලසා ඇත්නම් හැර, දේපළ භාර ගැනුම්කරුගේ කර්තව්‍ය සහ බලතල ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම දේපළ භාර ගැනුම්කරුවන් අතරින් එක් අයකු විසින් හෝ ඔවුන් අතරින් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් එක්ව සිදු කරනු ලැබිය හැකි ය;

(ආ) දේපළ භාර ගැනුම්කරුවකු වශයෙන් එම තැනැත්තන්ගේ යම් වගකීමක් එක්ව හා වෙන් වෙන්ව විය යුතුය; සහ

(ඇ) එක් දේපළ භාර ගැනුම්කරුවකුට මෙම පනත යටතේ දේපළ භාරගැනුම්කරුවකුට කරන ලද යම් සඳහනක් අවශ්‍ය වන පරිදි, කවර හෝ දේපළ භාරගැනුම්කරුවකුට හෝ දේපළ භාර ගැනුම්කරුවන් එක් අයකු හෝ වැඩි සංඛ්‍යාවකට කරනු ලබන සඳහනක් වන්නේ ය.

(6) සැක දුරු කිරීමේ කාර්ය සඳහා -

(අ) මෙම වගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම උපකල්පිත ක්‍රියාවක් නොවේ; සහ

(ආ) (89 වන අධිකාරය) වන උකස් පනතේ 46 වන වගන්තිය, මෙම වගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම සම්බන්ධයෙන් බලපෑමක් හෝ අදාළ වීමක් සිදු නොවිය යුතු ය.

**373.** (1) වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ අධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි වෙනත් යම් බලතලවලට අගති විරහිතව සමාගමක් විසින් ප්‍රදානය කරනු ලබන ස්ථිර ඇපයකට හෝ චල සෘණ භාරයකට යටත්ව, අවස්ථාවෝචිත පරිදි, ස්ථිර ඇපයේ හෝ චල සෘණ භාරයේ ප්‍රදානය ලබන්නාගේ ඉල්ලීම මත -

අධිකරණය විසින් දේපළ භාර ගැනුම්කරුවෙකු පත් කළ හැකි බව

(අ) ප්‍රදානකරුට අය විය යුතු ණය මුදලක් ගෙවීමට සමාගම විසින් පැහැර හැර ඇති බවට හෝ ප්‍රදානය ලබන්නා වෙත පවතින යම් පිළිබැඳීමක් ඉටුකිරීමට සමාගම අන්‍යාකාරයෙන් අපොහොසත් වී ඇති බවට;

(ආ) අවස්ථාවෝචිත පරිදි ස්ථිර ඇපය හෝ චල සෘණ භාරයක් නිර්මාණය කරන යම් සාධන පත්‍රයක ඇති යම් නියමයන් උල්ලංඝනය කරමින්, සුරක්ෂිත දේපළ විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සමාගම යෝජනා කරන බවට; හෝ

(ඇ) ප්‍රදානය ලබන්නාගේ ප්‍රතිලාභය සඳහා සුරක්ෂිත දේපළ සංරක්ෂණය කිරීම තහවුරු කිරීම සඳහා එසේ කිරීම අවශ්‍ය වන බවට,

අධිකරණය විසින් සෑහීමට පත් වන්නේ නම්, අධිකරණය විසින් දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් පත් කරන ලද දේපළ භාර ගැනුම්කරුවකු අධිකරණ නිලධරයකු විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ -

(අ) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද; සහ

(ආ) දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත්ව ඇති දේපළ නිශ්චල දේපළ ඇතුළත් වුව ද ඇතුළත් නොවුව ද,

දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබිය හැකි ය.

(4) සැක දුරු කිරීමේ කාර්ය සඳහා -

(අ) මෙම වගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම උපකල්පිත ක්‍රියාවක් නොවේ; සහ

(ආ) (89 වන අධිකාරය වූ) උකස් පනතේ 46 වන වගන්තියේ සඳහන් කිසිවක් මගින් මෙම වගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම සම්බන්ධයෙන් බලපෑමක් හෝ අදාළ වීමක් සිදු නොවිය යුතු ය.

දේපළ භාරගැනුම්කරු පත් කිරීම පිළිබඳ දැන්වීම සහ විස්තර

**374.** (1) දේපළ භාර ගැනුම්කරුවකු විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් සහ පත්වීම ලැබීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත -

(අ) දේපළ භාරගැනුම්කරුවකුගේ, පත්වීම ලැබූ බවට වූ ලිඛිතව දැන්වීමක් ප්‍රදානකරුට ලබාදිය යුතු ය;

(ආ) පහත දැක්වෙන කරුණු, එනම් -

(i) දේපළ භාර ගැනුම්කරුගේ සම්පූර්ණ නම;

(ii) පත් කළ දිනය;

(iii) දේපළ භාර ගැනුම්කරු පත් කරන ලද තැනැත්තාගේ අනන්‍යතාවය සහ පත්වීම සිදු කරන ලද්දේ අධිකරණය විසින් නම් අධිකරණය විසින් පත්වීම සිදු කරන ලද්දේ යම් තැනැත්තකුගේ ඉල්ලීම මත ද, එම තැනැත්තාගේ අනන්‍යතාවය;

(iv) දේපළ භාර ගැනුම්කරුගේ කාර්යාලයීය ලිපිනය; සහ

(v) දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත්ව ඇති දේපළ පිළිබඳ කෙටි විස්තරයක්,

ඇතුළත් දේපළ භාර ගැනුම්කරුගේ පත්වීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කළ යුතු ය; සහ

(ඇ) එම ප්‍රසිද්ධ දැන්වීමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරිය වෙත යැවිය යුතු ය.

(2) දේපළ භාර ගැනුම්කරු පත් කිරීම දැනටමත් ධුරයේ සිටින දේපළ භාර ගැනුම්කරුවකුට අමතරව සිදු කරනු ලබන හෝ දේපළ භාර ගැනුම්කරු ලෙස ධුරයෙන් ඉවත් වූ තැනැත්තකු වෙනුවට පත් කරනු ලැබ සිටින අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ වන සෑම දැන්වීමක එම කාරණය සඳහන් කළ යුතු ය.

(3) දේපළ භාර ගැනුම්කරුගේ කාර්යාලයීය ලිපිනයෙහි කිසියම් වෙනසක් සිදු වුවහොත්, දේපළ භාර ගැනුම්කරු විසින් වැඩ කරන දින පහක් ඇතුළත -

(අ) නව ලිපිනය පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කළ යුතු ය; සහ

(ආ) එම ප්‍රසිද්ධ දැන්වීමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට යැවිය යුතු ය.

(4) මෙම වගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම මගින් දේපළ භාර ගැනුම්කරුගේ පත්වීමේ වලංගුභාවයට බලපෑමක් සිදු නොවිය යුතු ය.

(5) මෙම වගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන දේපළ භාර ගැනුම්කරුවකු වරදක් සිදු කරන්නේ ය.

ලේඛනවල දේපළ භාර ගැනුම්කරුවකුගේ පත්වීම පිළිබඳව සඳහන් කළ යුතු බව

**375.** (1) දේපළ භාර ගැනුම්කරුවකු ධුරය දරන තාක් කල්, ඔහු විසින් පහත සඳහන් කාරණා පිළිබඳව සහතික විය යුතු ය :-

(අ) ප්‍රදානකරු හෝ දේපළ භාර ගැනුම්කරු විසින් හෝ වෙනුවෙන් හෝ නිකුත් කරන ලද හෝ අත්සන් කරන ලද සහ ප්‍රදානකරුගේ නම සඳහන් වන සෑම ලේඛනයක ම, නම මුලින්ම සඳහන් වන ස්ථානයේ, දේපළ භාර ගැනුම්කරුවකු පත් කර ඇති බව සඳහන් කළ යුතු ය; සහ

(ආ) සමාගමට වෙබ් අඩවි එකක් හෝ කිහිපයක් තිබේ නම්, එක් එක් වෙබ් අඩවියේ සෑම පිටුවක ම දේපළ භාර ගැනුම්කරුවකු පත් කර ඇති බව ප්‍රකටව පෙනෙන ස්ථානයක සඳහන් කළ යුතු ය.

(2) දේපළ භාර ගැනුම්කරු යම් නිශ්චිත වත්කමක් සම්බන්ධයෙන් ධුර දරනු ලබන තාක් කල්, එම දේපළ භාර ගැනුම්කරු විසින් -

(අ) වත්කමට අදාළ ප්‍රදානකරු හෝ දේපළ භාර ගැනුම්කරු විසින් හෝ වෙනුවෙන් නිකුත් කරන ලද හෝ අත්සන් කරන ලද සහ ඒ මත ප්‍රදානකරුගේ නම සඳහන් වන සෑම ලේඛනය ම, දේපළ භාර ගැනුම්කරුවකු පත් කර ඇති බව පැහැදිළිව සඳහන් කර ඇති බවට සහතික විය යුතු ය; සහ

(ආ) සමාගමට වෙබ් අඩවි එකක් හෝ කිහිපයක් තිබේ නම්, එක් එක් වෙබ් අඩවියේ සෑම පිටුවක ම සමාගමේ නිශ්චිත වත්කමක් සම්බන්ධයෙන් දේපළ භාර ගැනුම්කරුවකු පත් කර ඇති බව ප්‍රකටව පෙනෙන පරිදි සඳහන් කර ඇති බව සහතික විය යුතු බවට සමාගමට නියම කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියට හෝ (2) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම මගින් -

(අ) දේපළ භාර ගැනුම්කරුවකු ලෙස යම් තැනැත්තකු පත් කිරීමේ; හෝ

(ආ) යම් ලේඛනයක,

වලංගුභාවයට බලපෑමක් නොවිය යුතු ය.

(4) (අ) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන; හෝ

(ආ) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීමට අනුබල දෙන හෝ ඒ හා සම්බන්ධ,

සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු ය.

## 3 වන පරිච්ඡේදය

### දේපළ භාරගැනුම්කරුගේ බලතල

දේපළ භාර ගැනුම්කරුගේ බලතල

**376.** (1) පත් කිරීම සිදු කරන ලද්දේ යම් සාධන පත්‍රයක් හෝ අධිකරණ ආඥාවක් මගින් ද හෝ ඒ යටතේ ද එම සාධන පත්‍රය හෝ අධිකරණ ආඥාව මගින් හෝ ඒ යටතේ ප්‍රකාශිතව හෝ ව්‍යංගව ප්‍රදානය කරන ලද බලතල හා අධිකාරි බලය දේපළ භාර ගැනුම්කරුවකු සතු විය යුතු ය.

(2) පත් කිරීම සිදු කරන ලද්දේ යම් සාධන පත්‍රයක් හෝ අධිකරණ ආඥාවක් මගින් හෝ ඒ යටතේ ද ඊට යටත්ව, දේපළ භාර ගැනුම්කරු වෙත දස වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බලතල තිබිය යුතු අතර, ඒවා ක්‍රියාත්මක කළ හැකි ය.

(3) පත් කිරීම සිදු කරන ලද්දේ යම් සාධන පත්‍රයක් හෝ අධිකරණ ආඥාවක් මගින් හෝ ඒ යටතේ ද ඊට යටත්ව, දේපළ භාර ගැනුම්කරුට සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ හෝ ප්‍රදානකරුගේ බලතලවලින් බැහැරව දේපළ භාර ගැනුම්කරුගේ බලතල සහ අධිකාරි බලය ක්‍රියාත්මක කළ හැකි ය.

දේපළ භාර ගැනුම්කරු විසින් ලේඛන ලියා අත්සන් කිරීම

**377.** (1) දේපළ භාර ගැනුම්කරුවකුගේ බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය හෝ ආනුෂංගික සියලුම ලේඛන දේපළ භාර ගැනුම්කරු විසින් සමාගම නමින් සහ සමාගම වෙනුවෙන් ලියා අත්සන් කළ හැකි ය.

(2) සමාගමක් වෙනුවෙන් දේපළ භාරගැනුම්කරුවකු විසින් අත්සන් කරන ලද ලේඛනයක් සමාගම් පනතේ 19 වන වගන්තියේ අරමුණු සඳහා සමාගම වෙනුවෙන් නිසි ලෙස ඇතුළත් කර ඇති බව සලකනු ලැබිය යුතු ය.

(3) වෙනත් යම් නීතියක හෝ සමාගමක ව්‍යවස්ථාවේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, දේපළ භාර ගැනුම්කරු පත් කරන ලද සාධන පත්‍රයේ හෝ අධිකරණයේ ආඥාවේ හෝ ඒ යටතේ ලේඛන ලියා අත්සන් කිරීමට සහ සමාගමේ පොදු මුද්‍රාව භාවිත කිරීමට දේපළ භාර ගැනුම්කරුට බලය ලබා දී ඇත්නම්, ඒ කාර්යය සඳහා සමාගම වෙනුවෙන්

දේපළ භාරගැනුම්කරුට සමාගමේ පොදු මුද්‍රාව ලේඛනවල තැබීමමෙන් සහ පොදු මුද්‍රාව තැබීම ලියා සහතික කිරීමෙන් සමාගම නමින් සහ සමාගම වෙනුවෙන් ලේඛන ලියා අත්සන් කිරීමට හැකි ය.

(4) (3) වන උපවගන්තියේ විස්තර කර ඇති ආකාරයට ලියා අත්සන් කරන ලද ලේඛනයක් සමාගම් පනතේ 19 වන වගන්තියේ කාර්යය සඳහා සමාගම විසින් නිසි ලෙස ඇතුළත් කර ඇති බව සලකනු ලැබිය යුතු ය.

දේපළ භාර ගැනුම්කරුවන් අතර ප්‍රමුඛත්වය

**378.** (1) සමාගමේ දේපළෙහි සම්පූර්ණ හෝ යම් කොටසක් මත වල සෘණ භාර දෙකක් හෝ වැඩි ගණනක් පවතින අවස්ථාවක, එවැනි එක් එක් භාර සම්බන්ධයෙන් මෙම කොටස යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කළ හැකි ය.

(2) වල සෘණ භාරයක ප්‍රදානලාභී ඉල්ලීමක් මගින් හෝ ඉල්ලීමක් මත පත් කරනු ලැබූ දේපළ භාර ගැනුම්කරුවකු එම දේපළ භාර ගැනුම්කරු පත් කරනු ලැබුවේ එම සෘණ භාරයට ප්‍රමුඛත්වය ඇති ඊට පෙර කර ඇතිව නම් කිසිවකට පටහැනි වීම නොතකා වෙනත් දේපළ භාර ගැනුම්කරුවන් බැහැරව එම දේපළ භාර ගැනුම්කරුට බලය පැවරී ඇත.

(3) සෘණ භාර දෙකක් හෝ වැඩි ප්‍රමාණයක් එක සමානව අනුස්ථානගතව පවතින අවස්ථාවක සහ දේපළ භාර ගැනුම්කරුවන් දෙදෙනකු හෝ වැඩි පිරිසක් එම සෘණභාර ප්‍රකාරව පත් කර ඇති අවස්ථාවක, එසේ පත් කරන ලද භාරගැනුම්කරුවන් ඒකාබද්ධ දේපළ භාරගැනුම්කරුවන් ලෙස පත් කර ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(4) ඒකාබද්ධ දේපළ භාර ගැනුම්කරුවන් ලෙස පත් කර ඇතැයි සලකනු ලබන, දේපළ භාර ගැනුම්කරුවන් ඔවුන්ට අදාළ පත්වීමේ සාධන පත්‍ර මගින් අන්‍යාකාරයකට විධිවිධාන සලසා ඇත්නම් මිස, ඒකාබද්ධව ක්‍රියා කළ යුතු ය.

(5) (6) වන උපවගන්තියට යටත්ව, වල සෘණ භාරයක ප්‍රදානලාභියකු විසින් හෝ ප්‍රදානලාභියකුගේ ඉල්ලීමක් මත පත් කරන ලද දේපළ භාර ගැනුම්කරුවකුගේ බලතල එම සෘණභාරයට වඩා ප්‍රමුඛතාවයක් ඇති වල සෘණ භාරයක ප්‍රදානලාභියකු විසින් හෝ ප්‍රදානලාභියකුගේ ඉල්ලීම මත දේපළ භාරගැනුම්කරුවකු පත් කිරීමෙන් සහ එම පත්කිරීම කරනු ලබන

අවස්ථාවේ සිට මෙම පනත මගින් පසුව සඳහන් කරන ලද දේපළ භාරගැනුම්කරුවකු වෙත පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමට දේපළ භාරගැනුම්කරුට හැකි කරන තාක් දුරට, අත්හිටුවනු ලැබිය යුතු අතර, එම අත්හිටුවනු ලැබූ බලතල එම දේපළට සම්බන්ධිත වල සෘණ භාරයේ ප්‍රමුඛතාව නතර වූ අවස්ථාවේ සිට සහ වල සෘණ භාරයට යටත්ව හෝ දේපළට සම්බන්ධිත වල සෘණ භාරයේ ප්‍රමුඛතාව යටතේ දේපළ භාර ගැනුම්කරුවකුගේ පත්වීම අවසන් වූ අවස්ථාවේ සිට, එම අවස්ථා දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාවේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරුවකුගේ බලතල අත්හිටුවීම මගින්, දේපළ භාරගැනුම්කරු තම කාර්යය, බලතල සහ කර්තව්‍යය නිසිපරිදි කිරීමේ දී, ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී විධිමත් ලෙස උපයන වූ යම් බැරකමක් සම්බන්ධයෙන් (දේපළ භාරගැනුම්කරු පත්කරනු ලැබූවේ යම් සෘණභාරයක් ප්‍රකාරව ද එකී සෘණ භාරයට යටත් දේපළේ කොටසෙහි වටිනාකමේ සීමාවට යටත්ව) අභිභවනය කරන්නා වූ දේපළ භාර ගැනුම්කරුගේ අගනා හානිපූරණයක් ලැබෙන්නේ නම් සහ එසේ ලැබෙන තෙක්, දේපළ භාරගැනුම්කරුගේ සන්තකයේ,භාරයේ හෝ පාලනය යටතේ පවතින සමාගමේ දේපළේ  කවර හෝ කොටසක් මුදාහැරීමට අවශ්‍ය කිරීමේ ප්‍රතිඵලයක් ඇති නොවිය යුතු ය.

(7)(5) වන උපවගන්තිය යටතේ දේපළ භාරගැනුම්කරුගේ බලතල අත්හිටුවීම මගින් එම දේපළ භාර ගැනුම්කරු පත් කරනු ලැබූවේ යම් සෘණභාරයක් සම්බන්ධයෙන් ද, එකී සෘණ භාරය එම දේපළට අදාළ වීම නැවතීමේ ප්‍රතිඵලය ඇති නොවිය යුතු ය.

(8) වල සෘණ භාර දෙකක් හෝ වැඩි ගණනක් එකම දේපළ භාරගැනුම්කරු පත් කිරීම මෙම වගන්තියේ කිසිවක් මගින් වළක්වනු නොලබයි.

**379.** (1) සමාගමක දේපළ සම්බන්ධයෙන් දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබූ අවස්ථාවක දී සමාගමේ සෑම අධ්‍යක්ෂකවරයකු සහ  වෙනත් සෑම නිලධරයකු ම- දේපළ භාර ගැනුම්කරුට තොරතුරු සැපයීමේ අවශ්‍යතාවය

(අ) ප්‍රායෝගිකව හැකි ඉක්මනින් සහ කෙසේ වුව ද, පත්වීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත තැනැත්තකුගේ සන්තකයේ හෝ භාරකාරත්වයේ හෝ තැනැත්තකුගේ පාලනය යටතේ ඇති

දේපළවලට අදාළ සියලුම පොත්, වාර්තා සහ ලේඛන දේපළ භාර ගැනුම්කරු වෙත ලබා දිය යුතු ය;

(ආ) දේපළ භාර ගැනුම්කරු විසින් එසේ කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන්නේ නම්, පොත්, වාර්තා සහ ලේඛන සම්පූර්ණ සහ නිවැරදි බව සාධාරණ කාලසීමාවක් තුළ දිවුරුම් ප්‍රකාශයක් මගින් තහවුරු කළ යුතු ය;

(ඇ) සමාගමට පොදු මුද්‍රාවක් ඇත්නම්, දේපළ භාර ගැනුම්කරුගේ භාවිතය සඳහා පොදු මුද්‍රාව කඩිනමින් ලබා දිය යුතු ය; සහ

(ඈ) දේපළ භාරගැනුම්කරු සාධාරණ ලෙස ඉල්ලා සිටිය හැකි සහාය ඔහුට ලබා දිය යුතු ය.

(2) දේපළ භාර ගැනුම්කරුගේ ඉල්ලීමක් මත, (1) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කරන ලෙස අධිකරණය විසින් සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකුට ආඥාවක් කළ හැකි ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වන තහවුරු, කිරීමක දී පොත්, වාර්තා සහ ලේඛනවල ඇති නිශ්චිත කරුණු සම්බන්ධයෙන් සුදුසුකම් ලැබිය හැකි -

(අ) පොත්, වාර්තා සහ ලේඛන සම්පූර්ණ සහ නිවැරදි ඒවා ලෙස සැලකිය යුතු ය; හෝ

(ආ) සත්‍යාපනය කිරීමට ඒ සඳහා අවශ්‍ය දැනුම සහ අවබෝධය නොතිබේ නම්,

සත්‍යාපනය ලබා දෙන තැනැත්තාගේ සත්‍යාපනයෙහි සුදුසුකමක් තිබිය නොහැකි ය.

**380.** (1) දේපළ භාරගැනුම්කාරිත්වයේ දේපළ විකිණීම සඳහා ප්‍රදානකරුගේ කැමැත්ත අවශ්‍ය වන විට සහ දේපළ භාරගැනුම්කරුට එම කැමැත්ත ලබා ගැනීමට නොහැකි වූ විට, දේපළ භාර ගැනුම්කරුට එම දේපළ පමණක් හෝ එම දේපළ වෙනත් දේපළ ද සමග හෝ විකිණීමට අවසර දෙන ආඥාවක් සඳහා අධිකරණයට ඉල්ලීමක් කළ හැකි ය. දේපළ විකිණීම සඳහා ප්‍රදානකරුගේ කැමැත්ත

(2) (1) වන උපවගන්තිය යටතේ ඇති ඉල්ලීමක් මත -

(අ) ප්‍රදානකරුගේ කැමැත්ත ලබා ගැනීමට දේපළ භාරගැනුම්කරු සාධාරණ උත්සාහයක් දරා ඇති බවට; සහ

(ආ) විකිණීම -

(i) (අ) ප්‍රදානකරුගේ ණයහිමියන්ගේ යහපත සඳහා වන බවට; සහ

(ii) විකිණීම මගින් ප්‍රදානලාභියාගේ අයිතියට අහිතකර ලෙස බලපෑමක් සිදු නොවන බවට,

අධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක, දේපළ භාර ගැනුම්කරු තම දේපළ විකිණීම සඳහා බලය පවරමින්, අවශ්‍ය විය හැකි නියෝග අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් කිරීමේ දී, අධිකරණ විසින් අවශ්‍ය පරිදි -

(අ) කිසියම් නියමයක් හෝ කොන්දේසියක් පනවනු ලැබිය හැකි ය; සහ

(ආ) වෙනත් යම් අනුපූරක ආඥාවක් නියෝගයක් කළ හැකි ය.

ඇවර කිරීමක දී දේපළ භාරගැනුම්කරුට ඇති බලතල

**381.** (1) (2) වන උපවගන්තියට යටත්ව සහ අධිකරණය අන්‍යාකාරයකට නියෝග කරන්නේ නම් මිස දේපළ භාර ගැනුම්කරුවකු පත්කරනු ලැබ එවැන්නකු ලෙස ක්‍රියා කළ හැකි අතර ඇවර කිරීමකට යටත්ව ඇති සමාගමක දේපළ සම්බන්ධයෙන්, දේපළ භාර ගැනුම්කරුවකුගේ සියලු බලතල ක්‍රියාත්මක කළ හැකි ය.

(2)(1) වන උපවගන්තියේ සඳහන් දේපළ සම්බන්ධයෙන් ධුර දරන දේපළ භාර ගැනුම්කරු විසින්, ප්‍රදානකරුගේ අනුයෝජිතයා ලෙස ක්‍රියා නොකළ යුතු ය -

(අ) ඇවරකරුගේ පූර්ව ලිඛිත අවසරය ලබාගෙන ඇත්නම් මිස; හෝ

(ආ) අධිකරණයේ අවසරය ලබාගෙන ඇත්නම් මිස.

(3) (2) වන උපවගන්තිය ප්‍රකාරව ප්‍රදානකරුගේ අනුයෝජිතයා ලෙස ක්‍රියා කිරීමට නොහැකි වූ දේපළ භාර ගැනුම්කරුවකු එම කරුණ නිසාම පමණක් දේපළ භාර ගැනුම්කරු පත් කරන ලද තැනැත්තාගේ හෝ ඔහු පත් කරන ලද්දේ කවරකුගේ යහපත සඳහා ද එකී තැනැත්තාගේ හෝ අනුයෝජිතයා නොවන්නේ ය.

(4) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කැමැත්ත ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ඇවරකරු අලාභ ගෙවීමට යටත් නොවන්නේ ය.

(5) (2) වන උපවගන්තියට අනුව ප්‍රදානකරුගේ අනුයෝජිතයා ලෙස ක්‍රියා කරන දේපළ භාර ගැනුම්කරුගේ ක්‍රියාවක් හෝ අතපසුවීමක් හරහා ප්‍රදානකරුවකුට උපචිත වන ලද ණයක් හෝ බැරකමක් ඇවරකරු වෙත පැවරෙන පිරිවැයක්, ගාස්තුවක් හෝ වියදමක් නොවිය යුතු ය.

4 වන පරිච්ඡේදය

**දේපළ භාර ගැනුම්කරුගේ කාර්ය**

දේපළ භාර ගැනුම්කරුවන්ගේ පොදු කාර්යය

**382.** (1) දේපළ භාරගැනුම්කරු විසින් දේපළ භාර ගැනුම්කරුගේ බලතල සද්භාවයෙන් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) දේපළ භාර ගැනුම්කරු පත් කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ යහපත උදෙසා ද එම තැනැත්තාගේ යහපත උදෙසා වනු ලබන බවට සාධාරණ හේතු මත විශ්වාස කරන ආකාරයට දේපළ භාර ගැනුම්කරු විසින් දේපළ භාර ගැනුම්කරුවකුගේ බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවලට අගති විරහිතව, දේපළ භාර ගැනුම්කරු විසින් -

(අ) ප්‍රදානකරුගේ;

(ආ) ප්‍රදානකරුගේ ණයහිමියන්ගේ; සහ

(ඇ) ප්‍රදානකරු හරහා දේපළ භාර ගැනුම්කාරිත්වයේ පවත්නා දේපළෙහි සම්බන්ධතාවකට හිමිකම්පාන වෙනත් යම් තැනැත්තකුගේ,

අයිතිවාසිකම් සැලකිල්ලට ගෙන දේපළ භාර ගැනුම්කරු විසින් තම බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

(4) 372 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ සාධන පත්‍රයක් යටතේ පත් කරන ලද දේපළ භාර ගැනුම්කරු විසින් තමා පත් කරනු ලැබුවේ කවරකු හෝ යහපත උදෙසා ද එකී තැනැත්තාගේ විධානවලට අනුකූලව ක්‍රියා කිරීමට බැඳී නැති අතර, එම විධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම, (2) වන උපවගන්තියේ සඳහන් කාර්ය භාරය කඩ කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(5) මෙම වගන්තියේ ඇති කිසිවක් මගින් 383 වන වගන්තිය අදාළ වීමට බලපෑමක් සිදු වන බවට හෝ සීමා කිරීමක් සිදු වන බවට සලකනු නොලැබිය යුතු ය.

දේපළ විකිණීමේදී දේපළ භාර ගැනුම්කරුට ඇති කාර්ය භාර්ය

**383.** දේපළ භාර ගැනුම්කාරිත්වයේ පවත්නා දේපළ විකිණීමේ බලයක් ක්‍රියාත්මක කරන දේපළ භාර ගැනුම්කරුවකුට එම විකිණීම් සිදු කරන අවස්ථාවේ දී එම දේපළ සඳහා උපරිම සාධාරණ මිලක් ලබා ගැනීමට 382 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන් කෙරෙහි දේපළ භාර ගැනුම්කරුට කාර්යභාරයක් පැවරී තිබිය යුතු ය.

විත්තිවාචකයක් හෝ හානිපූරණයක් නොමැති බව

**384.** (1) වෙනත් යම් ලිඛිත නීතියක හෝ දේපළ භාර ගැනුම්කරු පත් කරනු ලැබූ සාධන පත්‍රයේ පටහැනිව කුමක් සඳහන් වුව ද -

(අ) දේපළ භාර ගැනුම්කරු ප්‍රදානකරුගේ අනුයෝජිතයා ලෙස හෝ ප්‍රදානකරුගෙන් ලැබුණ ඇටෝර්නි බලපත්‍රයක් යටතේ ක්‍රියා කළ 383 වන වගන්තිය මගින් පනවා ඇති කාර්ය කඩ කිරීම සම්බන්ධයෙන් දේපළ භාරගැනුම්කරුට එරෙහිව පවතින නඩු කටයුතුවලට විත්ති වාචකයක් නොවිය යුතු ය;

(ආ) 383 වන වගන්තිය මගින් පනවා ඇති කාර්ය භාරයක් කඩ කිරීමෙන් දේපළ භාර ගැනුම්කරුට උපචිත වන යම් බැරකමක් සම්බන්ධයෙන් වන්දි

ලබා ගැනීමට හෝ හානිපූරණය කරනු ලැබීමට දේපළ භාර ගැනුම්කරුට හිමිකමක් නොතිබිය යුතු ය.

ස්ථිර ඇප දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබූ විට ප්‍රමුඛතා අනුපිළිවෙළ

**385.** (1) ස්ථිර ඇපයක් ප්‍රකාරව දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබූ විට එම දේපළ භාර ගැනුම්කරුට මේ වගන්තිය අදාළ විය යුතු ය.

(2) මෙම වගන්තියෙහි, ''අදාළ ස්ථිර ඇපය'' යන්නෙන්, දේපළ භාර ගැනුම්කරු පත් කරනු ලැබුවේ යම් ඇපයක් ප්‍රකාරව ද එම ඇපය අදහස් වන්නේ ය.

(3) 234 වන සහ 331 වන වගන්තිවලට යටත්ව සහ (4) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට යටත්ව, මෙම වගන්තිය අදාළ වන දේපළ භාර ගැනුම්කරුවකු විසින් දේපළ භාර ගැනුම්කාරිත්වය යටතේ ඇති දේපළ විකිණීමෙන් ලැබෙන මුදල් අදාළ ස්ථිර ඇපය මගින් සුරක්ෂිත කරන ලද, අදාළ දිනය වන විට පවතින බවට නිශ්චය කරන ලද ණය මුදල ගෙවා බේරුම් කිරීම සඳහා යොදා ගත යුතු ය.

(4) දේපළ භාර ගැනුම්කාරිත්වය යටතේ පවතින දේපළ විකිණීමෙන් ලැබෙන මුදල් බෙදා ගැනීමට, අදාළ ස්ථිර ඇප ලාභියාට පෙර පහත දැක්වෙන තැනැත්තන්ට හිමිකම් ඇති අතර, අදාළ ප්‍රමුඛත්ව අනුපිළිවෙළ පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) පළමුව, සමාගම ඇවර කිරීමට යටත්ව ඇත්නම්, දේපළ භාරකාරත්වයට යටත්ව ඇති දේපළ ආරක්ෂා කිරීම සහ විකිණීම සම්බන්ධයෙන් ඇවරකරු විසින් දරන ලද සාධාරණ වියදම් සඳහා; ඇවරකරු;

(ආ) දෙවනුව, දේපළ භාර ගැනුම්කරු විසින් නිසි පරිදි දරන ලද පිරිවැය, ගාස්තු සහ වියදම් සහ මෙම පනත යටතේ දේපළ භාර ගැනුම්කරුගේ පාරිශ්‍රමිකය දේපළ භාර ගැනුම්කරු සඳහා; සහ

(ඇ) තෙවනුව, පෙර අනුපිළිවෙළට දේපළෙහි කිසියම් කොටසක් මත කිසියම් ස්ථාවර ඇපයක් ප්‍රදානකරුට -

(i) අදාළ ස්ථාවර ඇපය; සහ

(ii) එම ප්‍රධානලාභියාට අයවිය යුතු ණයක් සඳහා වූ යම් චල සෘණ භාරයන්; අදාළ දිනට අනුව නිශ්චය කරනු ලබන; සහ

(ඇ) සමාගම් පනතේ 431 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ, අදාළ ස්ථාවර ඇපය, දේපළෙහි කිසියම් කොටසක් මත වූ චල සෘණ භාරයට වඩා අඩු මට්ටමක පවතින විට සහ මෙම උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවලට බලපෑම් කිරීමකින් හෝ සීමා කිරීමකින් තොරව –

(i) හතර වනුව,මෙම උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල ඇති පිරිවැය, ගාස්තු සහ වියදම් හැර, හතරවන උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාණය සහ ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව එම හතරවන උපලේඛනයේ 1, 2 සහ 8 වන ඡේදවල දක්වා ඇති පරිදි වරණීය හිමිකම් ඇති තැනැත්තන්, ඔවුන්ගේ හිමිකම් බේරුම් කිරීම් සඳහා;

(ii) පස් වනුව, අදාළ දිනය අනුව නිශ්චය කරන ලද චල සෘණ භාරයක් ප්‍රදානලාභියා වෙත ලැබිය යුතු යම් ණයක් සඳහා; සහ

(iii) හයවනුව, සමාගම් පනතේ 431 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ චල සෘණ භාරයකට පහළ වන නමුත් අදාළ, ස්ථාවර සුරකුමකට පෙරාතුව අනුකූල වන යම් දේපළක කොටසක් මත අදාළ දිනය අනුව නිශ්චය කරන ලද යම් ස්ථාවර සුරැකුමකට පෙරාතුව අදාළ දිනය අනුව නිශ්චය කරන ලද යම් ස්ථාවර සුරැකුමක ප්‍රදානලාභියා වෙත ලැබිය යුතු ණයක් සඳහා.

(5) අදාළ ස්ථාවර ඇපය මගින් සුරක්ෂිත කරන ලද ණය සම්පූර්ණව බේරුම් කිරීමෙන් පසු, දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත් දේපළ විකිණීමෙන් ලැබෙන ආදායම තවදුරටත් බෙදා හැරීමක් සමාගමට හෝ සමාගම ඈවර කරන්නේ නම්, ඈවරකරුට සිදු කළ යුතු ය.

වල සෘණ භාර දේපළ භාර ලැබුම්කරුවකු පත් කරනු ලැබූ අවස්ථාවක දී ප්‍රමුඛතා අනුපිළිවෙළ

**386.** (1) මෙම වගන්තිය වල සෘණ භාරයක් මගින් පත් කරන ලද දේපළ භාර ගැනුම්කරු සඳහා අදාළ විය යුතු ය.

(2) මෙම වගන්තියේ, ‘‘අදාළ වල සෘණ භාරය’’ යන්නෙන්, දේපළ භාර ගැනුම්කරු පත් කරනු ලැබූ සෘණ භාරය අදහස් වන්නේ ය.

(3) 234 වන සහ 331 වන වගන්තිවලට යටත්ව සහ (4) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට යටත්ව මේ වගන්තිය අදාළ වන දේපළ භාර ගැනුම්කරුවකු විසින් දේපළ භාර ගැනුම්කාරිත්වය යටතේ ඇති දේපළ විකිණීමෙන් ලැබෙන මුදලට අදාළ වල සෘණ භාරය මගින් අදාළ දිනය වන විට ඇති ලෙස නිශ්චය කරන ලද සුරක්ෂිත කර ඇති ණය මුදල ගෙවා බේරුම් කිරීම සඳහා යොදාගත යුතු ය.

(4) දේපළ භාර ගැනුම්කාරිත්වය යටතේ පවතින දේපළ විකිණීමෙන් ලැබෙන මුදල් බෙදා ගැනීමට අදාළ වල සෘණ භාරයේ ප්‍රදානලාභියාට වඩා වැඩි ප්‍රමුඛත්වයක් පහත දැක්වෙන තැනැත්තන්ට ඇති අතර, ප්‍රමුඛත්වය මෙහි අනුපිළිවෙළ අනුව ලැයිස්තුගත කර ඇති පරිදි විය යුතු ය:-

(අ) පළමුව, සමාගම ඈවර කරන්නේ නම්, ඈවරකරු, දේපළ භාර ගැනුම්කාරිත්වයට ඇති දේපළ සංරක්ෂණය කිරීම සහ විකිණීම සඳහා ඈවර කරන්නා විසින් සාධාරණ ලෙස දරනු ලබන කිසියම් පිරිවැයක් සඳහා;

(ආ) දෙවනුව, දේපළ භාර ගැනුම්කරු විසින් නිසි පරිදි දරන ලද පිරිවැය, ගාස්තු සහ වියදම් සහ මෙම පනත යටතේ දේපළ භාරගැනුම්කරුගේ පාරිශ්‍රමිකය සඳහා;

(ඇ) තෙවනුව, අදාළ දිනයට ඇති පරිදි නිශ්චය කරන ලද්දා වූ ද ප්‍රදානලාභියාට ලැබිය යුතුවූ ද යම්

ණයක් සඳහා අදාළ වල සෘණ භාරයට පෙර අනුස්ථානගතව ඇති දේපළක යම් කොටසක් මත වූ යම් ස්ථිර සුරකුමක ප්‍රදානලාභියා;

(ඇ) හතරවනුව, මෙම උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල දක්වා ඇති පිරිවැය, ගාස්තු සහ වියදම් හැර, එම උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාණය සහ ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව, අදාළ දිනයේ දී නිශ්චය කරන ලද, වරණීය හිමිකම් ඇති තැනැත්තන්, ඔවුන්ගේ හිමිකම් බේරුම් කිරීම සඳහා, හතර වන උපලේඛනයේ 1, 2 සහ 8 ඡේදවල දක්වා ඇති මුදල බේරුම් කිරීම සඳහා මෙම උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල දක්වා ඇති පිරිවැය, ගාස්තු සහ වියදම් හැර, එම උපලේඛනයේ දක්වා ඇති ප්‍රමාණය සහ ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව; සහ

(ඉ) පස්වනුව, අදාළ දිනය අනුව නිශ්චය කරන ලද අදාළ වල සෘණ භාරයකට පෙරාතුව අනුස්ථාන ගතව ඇති යම් දේපළක කොටසක් මත යම් වල සෘණ භාරයක ප්‍රදානලාභියා වෙත ලැබි යුතු ණයක් සඳහා එහි ප්‍රදානලාභියා; සහ

(ඊ) හයවනුව, සමාගම් පනතේ 431 වන වගන්තියේ (2) වන උපවගන්තිය (ඊ) ඡේදයේ සඳහන් වල සෘණ භාරයකට පහළ වන නමුත්, අදාළ ස්ථාවර ඇපයකට පෙරාතුවම අනුකූල වන යම් දේපළක කොටසක් මත අදාළ දිනය අනුව නිශ්චය කරන ලද යම් ස්ථාවර ඇපයක ප්‍රදානලාභියා වෙත ලැබිය යුතු ණයක් සඳහා.

(5) අදාළ වල සෘණ භාරයෙන් සුරක්ෂිත වූ ණය සම්පූර්ණයෙන් තෘප්ත කළ වූ පසු, දේපළ භාර ගැනුම්කාරිත්වයේ ඇති දේපළ විකිණීමෙන් ලැබෙන ආදායමෙන් තවදුරටත් කරනු ලබන බෙදා හැරීමක් සමාගමට හෝ සමාගම ඇවර කරන්නේ නම්, ඇවරකරුට කළ යුතු ය.

**387.** දේපළ භාර ගැනුම්කරු විසින් දේපළ භාරකාරත්වයේ ඇති දේපළවලට අදාළ මුදල්, දේපළ භාරකාරත්වයේ ඇති දේපළවලට අදාළ නොවන දේපළ භාරකාරත්වය තුළ දී ලැබුණු අනෙකුත්

මුදල් සම්බන්ධයෙන් දේපළ භාර ගැනුම්කරුගේ කාර්ය

මුදල්වලින් සහ දේපළ භාර ගැනුම්කරු විසින් දරනු ලබන හෝ ඔහුගේ පාලනය යටතේ පවතින වෙනත් යම් මුදල්වලින් වෙන්ව තබා ගත යුතු ය.

ගිණුම් වාර්තා සම්බන්ධයෙන් දේපළ භාරගැනුම්කරුගේ කාර්යය

**388.** (1) දේපළ භාර ගැනුම්කරු විසින් දේපළ භාරගැනුම්කාරිත්වයේ ඇති දේපළවලට, දේපළ භාර ගැනුම්කාරිත්ව කාලය තුළ අදාළ වූ සියලු ලදුපත්, ගෙවීම් සහ වෙනත් ගනුදෙනු නිවැරදි වාර්තා කරනු ලබන සහ පැහැදිලි කරනු ලබන ගිණුම් වාර්තා සියලු කල්හි තබාගත යුතු ය.

(2) ගිණුම් වාර්තා පරීක්ෂා කිරීමට උනන්දුවක් දක්වන තැනැත්තකු විසින් අධිකරණයට කරනු ලබන ඉල්ලීමක් මත, අවශ්‍ය විය හැකි නියම සහ කොන්දේසි මත (1) වන උපවගන්තියේ සඳහන් ගිණුම් වාර්තා පරීක්ෂා කිරීමට ඉල්ලුම්කරුට හැකි බවට අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් ගිණුම් වාර්තා, දේපළ භාර ගැනුම්කාරිත්වය අවසන් වීමෙන් පසු අවම වශයෙන් වසර පහක් සඳහා, දේපළ භාර ගැනුම්කරු විසින් රඳවා තබා ගත යුතු ය.

(4) මෙම වගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින දේපළ භාර ගැනුම්කරුවකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

5 වන පරිච්ඡේදය

**දේපළ භාර ගැනුම්කරුගේ පාරිශ්‍රමිකය**

දේපළ භාර ගැනුම්කරුගේ පාරිශ්‍රමික

**389.** (1) (අ) 372 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාධන පත්‍රයක් යටතේ දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලබන අවස්ථාවක ප්‍රදානලාභියා විසින් එකඟ විය හැකි පරිදි; හෝ

(ආ) 373 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් දේපළ භාර ගැනුම්කරුවකු පත් කරන අවස්ථාවක අධිකරණය විසින් තීරණය කළ හැකි පරිදි,

403 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයට යටත්ව, එකක් හෝ කිහිපයක් මත සහ පැය ගණනට කරනු ලබන ගෙවීම් ඉහත පදනම් සහ ප්‍රතිශත අනුපාතය අනුව ස්ථිර පදනමකින් පාරිශ්‍රමිකයක් ලබා ගැනීමට, දේපළ භාර ගැනුම්කරුවකුට හිමිකම් තිබිය යුතු ය.

(2) පාරිශ්‍රමිකයට අමතරව, 388 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අවශ්‍ය වන පරිදි වාර්තා තබා ගැනීමේ සාධාරණ ගාස්තුවක් රඳවා ගැනීමට දේපළ භාර ගැනුම්කරුට හිමිකම් තිබිය යුතු ය.

## 6 වන පරිච්ඡේදය

### දේපළ භාර ගැනුම්කරු විසින් වාර්තා පිළියෙළ කිරීම

දේපළ භාර ගැනුම්කරුගේ පළමු වාර්තාව

**390.** (1) අවස්ථාවෝචිත පරිදි දේපළ භාර ගැනුම්කරුවකු හෝ දේපළ භාර ගැනුම්කාරිත්වය අවසානයේ දී දේපළ භාර ගැනුම්කරුවකු වූ තැනැත්තකු, එම තැනැත්තාගේ පත්වීමේ දින සිට මාස දෙකක් ඇතුළත දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත් දේපළවල තත්ත්වය පිළිබඳ වාර්තාවක් සකස් කළ යුතු අතර, පහත දැක්වෙන විස්තර එම වාර්තාවේ ඇතුළත් කළ යුතු ය:-

(අ) භාරකාරත්වය යටතේ ඇති දේපළ සංයුක්ත වන, දේපළ පිළිබඳ විස්තර;

(ආ) දේපළ භාර ගැනුම්කාරත්වයට යටත්ව ඇති දේපළෙන් තෘප්ත කළ යුතු ණය සහ අනෙකුත් වගකීම් පිළිබඳ විස්තර;

(ඇ) දේපළ භාර ගැනුම්කාරත්වයට යටත්ව ඇති දේපළ පිළිබඳ බැඳියාවක් ඇති ණයහිමියන්ගේ නම් සහ ලිපිනයන්;

(ඈ) පිළිබැඳුම ඇතිකළ දිනය ඇතුළුව, දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත් දේපළ මත ණය හිමියකු විසින් දරනු ලබන යම් පිළිබැඳුමක විස්තර;

(ඉ) අදාළ තොරතුරු ලබා දීමේ දී ප්‍රදානලාභියාගේ යම් පැහැර හැරීමක් පිළිබඳ තොරතුරු; සහ

(ඊ) නියම කරනු ලැබිය හැකි වෙනත් තොරතුරු.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවේ පහත දැක්වෙන විස්තර, ඇතුළත් විය යුතුය:-

(අ) දේපළ භාර ගැනුම්කරු දැනුවත්ව ඇති පරිදි දේපළ භාර ගැනුම්කරු අදාළ පත් කිරීමට තුඩු දෙන ලද සිදුවීම්;

(ආ) බැහැර කරන ලද දේපළ සහ දේපළ භාර ගැනුම්කාරිත්වයේ ඇති දේපළ බැහැර කිරීම සඳහා වන යෝජනා;

(ඇ) දේපළ භාර ගැනුම්කරු පත් කරන ලද්දේ කවරකු සම්බන්ධයෙන් ද, එකී තැනැත්තාට පත්වීමේ දිනයට ගෙවීමට ඇති මුදල් ප්‍රමාණ;

(ඈ) පත්වීම් දිනට, වරණීය හිමිකම් ඇති ප්‍රදානකරුගේ ණයහිමියන්ට ගෙවිය යුතු මුදල්; සහ

(ඉ) (ඇ) ඡේදයේ සහ (ඈ) ඡේදයේ සඳහන් තැනැත්තන් හැර, වෙනත් ණයහිමියන්ට ගෙවීම සඳහා ලබා ගැනීමට ඉඩ ප්‍රස්තා ඇති මුදල්.

(3) (1) දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත්ව ඇති දේපළ බැහැර කිරීම සඳහා වූ යෝජනා පිළිබඳ විස්තර වාර්තාවට ඇතුළත් කිරීම මගින් දේපළ භාර ගැනුම්කරුගේ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් බරපතළ බලපෑමක් සිදු වන බව දේපළ භාර ගැනුම්කරු සලකන්නේ නම්, (1) වන උපවගන්තිය යටතේ පිළියෙල කිරීමට නියමිත වාර්තාවකින් දේපළ භාර ගැනුම්කරු විසින් එම තොරතුරු අත්හරිනු ලැබිය හැකි ය.

(4) මෙම වගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු විසින් ම වරදක් කරනු ලබන්නේ ය.

දේපළ භාර ගැනුම්කරු විසින් තවදුරටත් වාර්තා ඉදිරිපත් කිරීම

**391.** (1) අවස්ථාවෝචිත පරිදි, දේපළ භාර ගැනුම්කරු හෝ දේපළ භාර ගැනුම්කාරිත්වය අවසානයේ දී එම තනතුර දැරූ වෙනත් තැනැත්තකු විසින් -

(අ) දේපළ භාර ගැනුම්කරු පත් කිරීමෙන් පසු එක් එක් මාස හයක කාලසීමාවක් අවසානයේදී; සහ

(ආ) දේපළ භාර ගැනුම්කාරිත්වය අවසන් වන දිනයෙන්,

පසු වැඩකරන දින විස්සක් ඇතුළත එකී දින වන විට දේපළ භාර ගැනුම් කාරීත්වයට යටත්ව තිබූ දේපළවල තත්ත්වය පිළිබඳව සංක්ෂිප්ත ලෙස සඳහන් කරමින් එම වාර්තාව අදාළ වන කාලසීමාව තුළ ලැබුණු ආදායම සහ වියදම ඇතුළු දේපළ භාර ගැනුම්කාරිත්වයේ හැසිරීම පිළිබඳ වැඩිදුර වාර්තාවක් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට පහත දැක්වෙන විස්තර ඇතුළත් විය යුතුය: -

(අ) කිසියම් පූර්ව වාර්තාවක දින සිට බැහැර කරන ලද දේපළ සහ දේපළ භාර ගැනුම්කාරිත්වයේ ඇති දේපළ බැහැර කිරීම සඳහා වන කිසියම් යෝජනා;

(ආ) වාර්තාවේ දිනය අවසානයේ දී, දේපළ භාර ගැනුම්කරු පත් කරන ලද්දේ කවරකුගේ යහපත උදෙසා ද එකී තැනැත්තන්ට ගෙවිය යුතු මුදල්;

(ඇ) වාර්තාවේ දිනය වන විට, වරණීය හිමිකම් ඇති ප්‍රදානකරුගේ ණයහිමියන්ට ගෙවිය යුතු මුදල්;

(ඈ) (ආ) ඡේදයේ සහ (ඇ) ඡේදයේ සඳහන් ණය හිමියන් හැර, වෙනත් ණයහිමියන්ට ගෙවීම සඳහා වාර්තාවේ දිනය වන විට ලබා ගත හැකි මුදල්; සහ

(ඉ) නියම කරනු ලැබිය හැකි වෙනත් තොරතුරු.

(3) දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත්ව ඇති දේපළ බැහැර කිරීම සඳහා වූ යෝජනා පිළිබඳ විස්තර වාර්තාවට ඇතුළත් නොකිරීම මගින් දේපළ භාර ගැනුම්කරුගේ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් බරපතළ බලපෑමක් සිදු වන බව දේපළ භාර ගැනුම්කරු සලකන්නේ නම්, (1) වන උපවගන්තියේ (අ)ඡේදය යටතේ සකස් කිරීමට නියමිත වාර්තාවකින් දේපළ භාර ගැනුම්කරු විසින් එම තොරතුරු අත්හරිනු ලැබිය හැකි ය.

(4) මෙම වගන්තියට අනුකූලව ක්‍රියා කිරීමට පැහැර හරින සෑම තැනැත්තකු ම වරදක් කරනු ලබන්නේ ය.

වාර්තා සකස් කිරීම සඳහා කාලය දීර්ඝ කිරීම

**392.** (1) 390 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 391 වන වගන්තිය (1) වන උපවගන්තිය යටතේ වාර්තාවක් පිළියෙළ කිරීමට යම් තැනැත්තකුට අවශ්‍ය වන කාලසීමාවක්, එම තැනැත්තාගේ ඉල්ලීම මත -

(අ) 373 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් දේපළ භාර ගැනුම්කරු පත් කරනු ලැබ ඇති අවස්ථාවක දී අධිකරණය විසින්; හෝ

(ආ) 372 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන සාධන පත්‍රයක් යටතේ දේපළ භාර ගැනුම්කරු පත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, නම් රෙජිස්ට්‍රාර්වරයා විසින්,

දීර්ඝ කරනු ලැබිය හැකි

වාර්තා පරීක්ෂා කිරීමට සහ ලබා ගැනීමට හිමිකම් ඇති තැනැත්තන්

**393.** (1) 390 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 391 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වාර්තාවක් පිළියෙළ කර ඇත්නම්, එය පිළියෙළ කළ තැනැත්තා විසින් වැඩ කරන දින පහක් ඇතුළත -

(අ) එම වාර්තාව ප්‍රදානකරු වෙත යවනු ලැබිය යුතු ය;

(ආ) ප්‍රදානකරු සහ (4) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන් විසින් එය පරීක්ෂා කරනු ලැබීම සඳහා කටයුතු සලස්වනු ලැබිය යුතු ය; සහ

(ඇ) වාර්තාවක් පිළියෙළ කර ඇති බවට; සහ

(i) වාර්තාව පරීක්ෂා කිරීමට තබා ඇති බව; සහ

(ii) වාර්තාවේ පිටපත්, එම පිටපත් පිළියෙළ කිරීමේ සහ යැවීමේ සාධාරණ පිරිවැය ගෙවීම මත ඉල්ලුම් කිරීම මගින් ලබාගත හැකි බව,

ප්‍රදානකරුට සහ (4) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන්ට දැනුම් දීමට සැලැස්විය යුතු ය.

(2) 390 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 391 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ වාර්තාවක් පිළියෙළ කළ තැනැත්තා අධිකරණය විසින් දේපළ භාර ගැනුම්කරු ලෙස පත් කරනු ලැබුවහොත්, එම තැනැත්තා විසින් එය අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ගොනු කරනු ලැබිය යුතු ය.

(3) (4) උපවගන්තියේ සඳහන් කරනු ලැබ ඇති තැනැත්තකුට 390 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 391 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සකස් කරන ලද වාර්තාවක් සාමාන්‍ය වැඩ කරන වේලාවන් තුළ එය පිළියෙළ කළ තැනැත්තාගේ කාර්යාලයේ දී පරීක්ෂා කිරීමට හිමිකම් ඇත.

(4) 390 වන වගන්තියේ (1) වන උප වගන්තිය හෝ 391 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සකස් කරන ලද යම් වාර්තාවක පිටපතක් සඳහා ඉල්ලීමක් -

(අ) ප්‍රදානකරුගේ අධ්‍යක්ෂවරයකු;

(ආ) ප්‍රදානකරුගේ ණයහිමියකු; හෝ

(ඇ) දේපළ භාරගැනුම්කරු සන්තකයේ ඇති දේපළ ගැන සම්බන්ධතාවයක් ඇති වෙනත් ඕනෑම තැනැත්තකු,

වෙතින් ලැබීමෙන් පසු, පිටපත පිළියෙළ කිරීමේ සහ යැවීමේ සාධාරණ පිරිවැය ගෙවීමේ දී ඉල්ලීම ලැබී වැඩ කරන දින දහයක් ඇතුළත වාර්තාව සකස් කළ තැනැත්තා විසින් වාර්තාවේ පිටපතක් එය ඉල්ලුම්කළ තැනැත්තා වෙත යවනු ලැබිය යුතු ය.

(5) 390 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 391 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වාර්තාවක් පිළියෙළ කිරීමෙන් පසු වැඩ කරන දින දහයක් ඇතුළත එය පිළියෙළ කළ තැනැත්තා විසින් රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත පිටපතක් යැවිය යුතු ය.

(6) මෙම වගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන්නේ ය.

සිදු කළ වරදක් වාර්තා කිරීමට දේපළ භාරගැනුම්කරුට ඇති කාර්යභාරය

**394.** (1) සමාගම හෝ යම් පාර්ශ්වයක් -

(අ) මේ පනත යටතේ; හෝ

(ආ) සමාගම් පනත යටතේ ; හෝ

(ඇ) 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ ,

වරදක් කර ඇති බවට දේපළ භාර ගැනුම්කරු විශ්වාස කරන හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති අවස්ථාවක දී, දේපළ භාර ගැනුම්කරු විසින් එම කාරණය පිළිබඳව ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මනින් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට වාර්තා කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වාර්තා කරන ලද යම් කාරණයක්, රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය විසින් නීතිය ක්‍රියාත්මක කිරීමේ සුදුසු අධිකාරියක් වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නීතිය ක්‍රියාත්මක කිරීමේ අධිකාරියකට (1) වන උපවගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරු විසින් යම් කාරණයක් වාර්තා කර ඇති යම් විටෙක -

(අ) තොරතුරු සැපයීම මගින් ;

(ආ) ලේඛන සඳහා ප්‍රවේශය ලබා දීම මගින්; සහ

(ඇ) ලේඛන පරීක්ෂා කිරීම සහ පිටපත් කිරීම සඳහා පහසුකම් සලසාදීම මගින්,

අධිකාරිය විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි සහාය දේපළ භාර ගැනුම්කරු විසින් අධිකාරියට අවශ්‍ය සහාය ලබා දිය යුතු ය.

(4) මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින් -

(අ) (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබ ඇති යම් ආකාරයක වරදක් සිදුකර තිබේද යන්න විමර්ශනය කිරීම සඳහා දේපළ භාර ගැනුම්කරුවකු වෙත යම් කාර්යයක් පවරනු නොලැබිය යුතු ය; හෝ

(ආ) වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ දේපළ භාර ගැනුම්කරුවකු වෙත පවරන ලද යම් කාර්යභාරයක බලපෑමක් හෝ එම කාර්ය භාරය සීමා කිරීමක් සිදු නොවිය යුතු ය.

(5) (1) වන උපවගන්තියට හෝ (3) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින දේපළ භාර ගැනුම්කරුවකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

7 වන පරිච්ඡේදය

**දේපළ භාර ගැනුම්කරුගේ වගකීම්**

දේපළ භාර ගැනුම්කරු හානි පූරණය කිරීම

**395.** (1) 396 වන සහ 397 වන වගන්ති යටතේ දේපළ භාර ගැනුම්කරුගේ වගකීම සම්බන්ධයෙන් දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත්ව ඇති දේපළෙන් හානි පූරණ කිරීමක් ලබා ගැනීමට දේපළ භාර ගැනුම්කරුට හිමිකම් ඇත.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දේපළ භාර ගැනුම්කරුගේ හානිපූරණයට 385 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ 386 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නිසි පරිදි උපචිත වන ලද පිරිවැය, ගාස්තු සහ වියදම්වලට සහ දේපළ භාර ගැනුම්කරුගේ පාරිශ්‍රමිකයට ලබා දී ඇති ප්‍රමුඛත්වය තිබිය යුතු ය.

(3) මේ වගන්තියේ කිසිවක් මගින් -

(අ) දේපළ භාර ගැනුම්කරුවකුට හිමිකම් ලැබිය හැකි වෙනත් යම් හානිපූරණ කිරීමේ අයිතියක් සීමා නොකළ යුතු ය;

(ආ) අධිකාර බලයක් නොමැතිව දේපළ භාර ගැනුම්කරු ඇතුළත් වූ ගිවිසුමක ඇති වගකීම සීමා නොකළ යුතු ය; හෝ

(ඇ) අධිකාර බලයක් නොමැතිව ඇතුළත් වූ ගිවිසුමක් මත වූ වගකීමක් සම්බන්ධයෙන් හානිපූරණයක් ලැබීමට දේපළ භාර ගැනුම්කරුට අයිතියක් පිරිනැමීම නොකළ යුතු ය.

කලින් පැවති සේවානියුක්ති පිළිබඳ ගිවිසුම් යටතේ දේපළ භාර ගැනුම්කරුගේ වගකීම

**396.** (1) දේපළ භාර ගැනුම්කරුවකුගේ පත්වීමට පෙරාතුව ඇතුළත් වූ සේවා නියුක්තියක් පිළිබඳ ගිවිසුමකට අදාළව මුදල් ගෙවීමේ වගකීමට -

(අ) අදාළ සේවා නියුක්තිය පිළිබඳ ගිවිසුම දේපළ භාර ගැනුම්කරු විසින් ප්‍රකාශිතව ලිඛිතව පිළිගෙන ඇත්නම් මිස; හෝ

(ආ) ඒ සඳහා (3) වන උපවගන්තිය අදාළ වන්නේ නම් මිස,

දේපළ භාර ගැනුම්කරු යටත් නොවන්නේ ය.

(2) 373 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් පත් කරනු ලැබූ දේපළ භාර ගැනුම්කරුවකු හැර, (1) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ ගිවිසුමක් අනුගමනය කිරීම මගින් දේපළ භාර ගැනුම්කරුවකුගේ වගකීම බැහැර කිරීම හෝ සීමා කිරීම කළ හැකි ය.

(3) දේපළ භාර ගැනුම්කරුගේ පත්වීමට පෙර ඇතුළත් වූ සේවා නියුක්තිය පිළිබඳ ගිවිසුමකට අදාළව මුදල් ගෙවීමට දේපළ භාර ගැනුම්කරු පහත දැක්වෙන අවස්ථාවල දී වගකීමකට යටත් වන්නේ ය. එනම් දේපළ භාර ගැනුම්කරුගේ පත්වීමේ දින සිට උපචිත වූ සහ දේපළ භාර ගැනුම්කාරිත්වය අවසන් වූ දින සිට -

(අ) පඩි හෝ වැටුප් ගෙවීම සඳහා;

(ආ) පුද්ගලික ආදායම් බදු ගෙවීම සඳහා;

(ඇ) අයවීමට ඇති අර්ථසාධක අරමුදල් ගෙවීම සඳහා;

(ඈ) ව්‍යවස්ථාපිත පාරිතෝෂික දීමනා ගෙවීම සඳහා; සහ

(ඉ) අයවීමට ඇති සේවක භාර අරමුදල් ගෙවීම සඳහා;

(ඊ) (i) දේපළ භාර ගැනුම්කාරත්වය ආරම්භ වීමට පෙර ;

(ii) දේපළ භාර ගැනුම්කරු එම තනතුරු දැරීම අවසන් වූ දින දක්වා; සහ

(iii) ගිවිසුම අවසන් කිරීමේ දිනය දක්වා,

සේවා නියුක්තිය අවසන් කිරීමට අදාළ නීතියට අනුව, පත්වීමෙන් පසු වැඩ කරන දින දහයක් ඇතුළත, දේපළ භාර ගැනුම්කරු ගිවිසුම අවසන් කිරීම පිළිබඳ දැනුම් දීමක් කරන්නේ නම්; හෝ

(උ) (i) දේපළ භාර ගැනුම්කාරිත්වය අවසානය වීමට පෙර; සහ

(ii) දේපළ භාර ගැනුම්කරුගේ තනතුර අවසන් වීමේ දිනයට පෙර,

සේවා නියුක්තිය අවසන් කිරීමට අදාළ නීතියට අනුව, පත්වීමෙන් පසු වැඩ කරන දින දහයක් ඇතුළත, දේපළ භාර ගැනුම්කරුගේ ගිවිසුම අවසන් කිරීම පිළිබඳ දැනුම් ලබා නොදෙන්නේ නම්.

(4) (3) වන උපවගන්තියේ (ඊ) සහ (උ) ඡේදවල සඳහන් වැඩ කරන දින දහයේ කාලසීමාව අවසන් වීමට පෙර කරන ලද දේපළ භාර ගැනුම්කරුගේ ඉල්ලීම මත අධිකරණය විසින්, අවශ්‍ය විය හැකි නියමයන් සහ කොන්දේසි මත එම කාල සීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය.

වෙනත් ගිවිසුම් සහ කුලිය පිළිබඳව දේපළ භාර ගැනුම්කරුට ඇති වගකීම

**397.** (1) දේපළ භාර ගැනුම්කරුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය ඉටුකිරීමේ දී දේපළ භාර ගැනුම්කරු ඇතුළත් වූ ගිවිසුමක මත දේපළ භාරගැනුම්කරුවකු වගකීමට යටත් වන්නේ ය.

(2) (1) වෙනත් යම් ගිවිසුමක පටහැනිව කුමක් සඳහන් වුව ද නමුත්, සමාගමට හෝ වෙනත් යම් තැනැත්තකුට එරෙහිව වූ දේපළ භාර ගැනුම්කරුගේ අයිතිවාසිකම්වලට අගති විරහිතව, (1) වන උපවගන්තිය බලාත්මක වේ.

(3) (4) වන සහ (5) වන උපවගන්තිවලට යටත්ව, දේපළ භාර ගැනුම්කාරිත්වයේ පවත්නා දේපළක් ප්‍රදානකරු විසින් භාවිත කිරීම, පදිංචිය හෝ සන්තකයේ තබා ගැනීම සම්බන්ධව දේපළ භාර ගැනුම්කරු පත් කරන දිනයේ පවතින ගිවිසුමක් යටතේ ගෙවිය යුතු වන්නා වූ කුළී සහ වෙනත් ගෙවීම් සඳහා දේපළ භාර ගැනුම්කරු වගකිව යුතු වන්නේ ය.

(4) (3) වන උපවගන්තිය යටතේ, දේපළ භාර ගැනුම්කරු පත්කිරීමෙන් පසු වැඩ කරන දින දහයකින් ආරම්භ වන,

(අ) දේපළ භාර ගැනුම්කාරිත්වයේ අවසානය;

(ආ) දේපළ භාර ගැනුම්කරු දේපළ භාර ගැනුම්කරුවකු වීම අවසන් වන දිනය; සහ

(ඇ) ප්‍රදානලාභියා දේපළ භාවිතා කිරීම, පදිංචි වී සිටීම හෝ සන්තකය දැරීම අවසන් වන දිනය,

යන දිනයන්ගෙන් කලින්ම එළඹෙන දිනයෙන් අවස්ථාවක, කාලසීමාවට ආරෝපණය කළ හැකි කුළී හෝ වෙනත් ගෙවීම්වල එම කොටසට දේපළ භාර ගැනුම්කරුගේ වගකීම සීමා වන්නේ ය.

(5) දේපළ භාර ගැනුම්කරුගේ ඉල්ලීමක් මත, අධිකරණය විසින් -

(අ) (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකට දේපළ භාර ගැනුම්කරුගේ වගකීම සීමා කළ හැකි ය; හෝ

(ආ) (3) වන උපවගන්තිය යටතේ ඇති වගකීමෙන් දේපළ භාර ගැනුම්කරු සම්පූර්ණයෙන්ම නිදහස් කළ හැකි ය.

(6) (3) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ සඳහන් කිසිවක් මගින් -

(අ) (3) වන උපවගන්තියේ සඳහන් ගිවිසුමක් දේපළ භාර ගැනුම්කරු විසින් අනුගමනය කිරීමට උපචිත වන බවට නොසැලකිය යුතු ය; හෝ

(ආ) එවැනි ගිවිසුමක් යටතේ වෙනත් යම් වගකීමක් ඉටු නොකිරීම සම්බන්ධයෙන් දේපළ භාර ගැනුම්කරු වගකීමකට යටත් නොවිය යුතු ය.

දෝෂයක් ඇති අවස්ථාවක වගකීමෙන් නිදහස් වීම

**398.** (1) අධිකරණය විසින් දේපළ භාර ගැනුම්කරු ලෙස ක්‍රියා කර ඇති තැනැත්තකු,

(අ) එකී දේපළ භාර ගැනුම්කරු පත් කරනු ලැබූ සාධන පත්‍රයේ හෝ අධිකරණ ආඥාවේ දෝෂයක් තිබීමේ හේතුව මත පමණක් දේපළ භාර ගැනුම්කරුගේ බැරකම ඇති වූ බවට; සහ

(ආ) එකී දේපළ භාර ගැනුම්කරු අවංකව සහ සාධාරණව ක්‍රියා කර ඇති බවට සහ එම අවස්ථානුගත කරුණු අනුව ඔහු බැරකමින් නිදහස් කළ යුතු බවට,

සෑහීමට පත් වන අවස්ථාවක දී අධිකරණය විසින් එම දේපළ භාර ගැනුම්කරු දේපළ භාර ගැනුම්කාරත්වයේ දී උද්ගත වූ වගකීමෙන් නිදහස් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ආඥාවක් කිරීමේ දී, අධිකරණය විසින් අවශ්‍ය පරිදි, යම් නියමයක් හෝ කොන්දේසියක් පනවනු ලැබිය හැක.

(3) දේපළ භාර ගැනුම්කරු පත් කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ යහපත උදෙසා ද, අවශ්‍ය පරිදි අධිකරණය විසින් පනවනු ලබන නියම හා කොන්දේසිවලට යටත්ව එම තැනැත්තා (1) වන උපවගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරු නිදහස් කරනු ලැබූ ප්‍රමාණයට වගකිව යුතු වන්නේ ය.

8 වන පරිච්ඡේදය

**දේපළ භාර ගැනුම්කාරත්වය පිළිබඳ ධුරය පුරප්පාඩුවීම සහ දේපළ භාර ගැනුම්කාරත්වය අවසන්වීම**

දේපළ භාර ගැනුම්කරුගේ ධුරය පුරප්පාඩු වීම

**399.** (1) පහත දැක්වෙන අවස්ථාවල දී දේපළ භාර ගැනුම්කරුගේ ධුරය පුරප්පාඩු වන්නේ ය; එනම් -

(අ) දේපළ භාර ගැනුම්කරු (2) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉල්ලා අස්වීම;

(ආ) දේපළ භාර ගැනුම්කරු මියයාම;

(ඇ) අධිකරණය විසින් දේපළ භාරගැනුම්කරු ධුරයෙන් ඉවත් කිරීම;

(ඈ) වස්තුභංගත්ව වෘත්තිකයකු ලෙස දේපළ භාර ගැනුම්කරුගේ ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම; හෝ

(ඉ) දේපළ භාර ගැනුම්කරු විසින් 391 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ සකස් කිරීමට අවශ්‍ය වාර්තාවක පිටපතක් ඔහු විසින් 393 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත යැවීම.

(2) 372 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ සාධන පත්‍රයක් යටතේ පත් කරන දේපළ භාර ගැනුම්කරුවකු විසින් ධුරයෙන් ඉල්ලා අස්වීම පිළිබඳ ඔහුගේ අදහස සම්බන්ධයෙන් ලිඛිත දැන්වීමක් වැඩ කරන දින පහකට පෙර දේපළ භාර ගැනුම්කරු පත් කළ තැනැත්තාට ලබා දීම මගින් දේපළ භාර ගැනුම්කරුට ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(3) 373 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් පත් කරන ලද දේපළ භාර ගැනුම්කරුවකු විසින් අධිකරණයේ අවසරය නොමැතිව ධුරයෙන් ඉල්ලා අස්වීම නොකළ යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ හැර දේපළ භාර ගැනුම්කරුවකුගේ ධුරයේ පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී -

(අ) පුරප්පාඩුව පිළිබඳ ලිඛිත දැනුම්දීම ප්‍රායෝගිකව හැකි පහසු ඉක්මනින්, ධුරයෙන් ඉවත් වන තැනැත්තා විසින් හෝ, එම තැනැත්තාට ක්‍රියා කිරීමට නොහැකි නම්, ඔහුගේ නීතිඥානුකූල නියෝජිතයා විසින් රෙජිස්ට්‍රාර්වරයාට සහ අධිකාරියට ලබා දිය යුතු ය; සහ

(ආ) පුරප්පාඩුව ඇති වීමෙන් පසු වැඩ කරන දින විස්සක් ඇතුළත,

(i) 372 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාධන පත්‍රයක් යටතේ ධුරය අත්හරින තැනැත්තා පත් කරනු ලැබුවේ නම් එම වගන්තිය යටතේ පත් කිරීම සිදු කළ තැනැත්තා විසින් ප්‍රතියෝජන දේපළ භාර ගැනුම්කරුවකු පත් කරනු ලැබිය හැකි ය; හෝ

(ii) ධුරයෙන් ඉවත් වන තැනැත්තා 373 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් පත් කරනු ලැබුවේ නම්, එම උපවගන්තිය යටතේ ප්‍රතියෝජන දේපළ භාර ගැනුම්කරුවකු පත් කරන ලෙස අයදුම්කරු විසින් අධිකරණයට අයදුම් කළ හැකි ය.

(5) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ හැර වෙනත් අයුරකින් දේපළ භාර ගැනුම්කරුගේ ධුරයේ පුරප්පාඩුවක් ඇති වූ විට සහ -.

(අ) තනතුරු පුරප්පාඩුව ඇති වීමෙන් පසු වැඩ කරන දින විස්සක් ඇතුළත, (4) වන උපවගන්තියේ(ආ) ඡේදය යටතේ පත්වීමක් සිදුකොට නැති හෝ පත්වීමක් සඳහා ඉල්ලීමක් සිදුකර නැති හෝ අවස්ථාවක; හෝ

(ආ) (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති සහ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී,

දේපළ භාර ගැනුම්කාරත්වය අවසන් වේ.

(6) (1) වන උප වගන්තියේ (ඉ) ඡේදය යටතේ හැර, දේපළ භාර ගැනුම්කාර ධුරයෙන් ඉවත් වන තැනැත්තකු, ප්‍රායෝගිකව හැකි අවස්ථාවල දී, එකී තැනැත්තාගේ අනුප්‍රාප්තිකයා සාධාරණ ලෙස ඉල්ලා සිටිය හැකි පරිදි වූ තොරතුරු සහ සහාය එකී අනුප්‍රාප්තිකයාට ලබා දිය යුතු ය.

(7) දේපළ භාර ගැනුම්කාරත්ව ධුරයේ පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරන ලද තැනැත්තකුගේ ඉල්ලීම මත, දේපළ භාර ගැනුම්කරුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස, අවශ්‍ය යැයි සලකනු ලබන යම් ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(8) (4) වන උපවගන්තියේ (අ) ඡේදය සහ (6) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම මෙම උපවගන්තිය යටතේ වරදක් සිදු කරන අතර එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට ඒ තැනැත්තා යටත් වන්නේ ය.

(9) (7) වන උපවගන්තිය අනුව කරන ලද කිසියම් අධිකරණ ආඥාවකට අනුකූල ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම මෙම උපවගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබන අතර එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙලක්ෂ පනස් දහසකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය .

දේපළ භාර ගැනුම්කාරත්වය අවසන් වීම

**400.** පහත දැක්වෙන අවස්ථාවල දී දේපළ භාර ගැනුම්කාරත්වය අවසන් වේ, එනම් -

(අ) දේපළ භාර ගැනුම්කරු පහත දැක්වෙන කාරණා පිළිබඳව සෑහීමකට පත් වන අවස්ථාවලදී, එනම් -

(i) දේපළ භාර ගැනුම්කරු පත් කරනු ලැබුවේ ස්ථිර සුරැකුමක් හෝ වලහාරයක් ප්‍රකාරව ද එකී සුරැකුම හෝ වලහාරය මගින් සුරක්ෂිත කරන ලද ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් වී ඇති බවට දේපළ භාර ගැනුම්කරු සෑහීමකට පත් වන අවස්ථාවක; හෝ

(ii) (අ) දේපළ භාර ගැනුම්කරු පත් කරනු ලැබුවේ යම් දේපළ සම්බන්ධයෙන් එම දේපළ හෝ දේපළ භාර ගැනුම්කරුගේ මතය අනුව දේපළ භාර ගැනුම්කාරිත්වය දීර්ඝ නොකර අනවශ්‍ය ලෙස අත්කර ගැනීම හෝ හිමිකම් අත්හැරීම සිදු කළ හැකි බවට දේපළ භාර ගැනුම්කරුගේ මතය වන අවස්ථාවක; සහ

(ආ)දේපළ විකිණීමෙන් ලැබුණ මුදල් බෙදා හැර ඇති බවට ,

දේපළ භාර ගැනුම්කරු සෑහීමට පත් වන අවස්ථාවක දේපළ භාර ගැණුම්කාරීත්වය අවසන් වේ.

(ආ) 234 වන හෝ 331 වන වගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කාරිත්වය අවසන් විය යුතු බව නියම කරමින් අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් හෝ ඇවරකරුවකු විසින් දේපළ භාර ගැනුම්කරුට දැන්වීම් ලබා දීමෙන් පසු හෝ;

(ඇ) 399 වන වගන්තියේ (5) වන උප වගන්තිය යටතේ,

දේපළ භාර ගැනුම්කාරිත්වය අවසන් කළ හැකි ය.

දේපළ භාර ගැනුම්කාරිත්වය අවසන් වූ බවට දැනුම් දීමේ දේපළ භාර ගැනුම්කරුගේ කාර්යයභාරය

**401.** (1) දේපළ භාරකාරත්වය අවසන් වීමේ දී දේපළ භාර ගැනුම්කරුවකු වූ තැනැත්තකුට මෙම වගන්තිය අදාළ වන්නේ ය.

(2) දේපළ භාර ගැනුම්කාරිත්වය අවසන් වී වැඩ කරන දින දෙකක් ඇතුළත අදාළ තැනැත්තා විසින් -

(අ) දේපළ භාර ගැනුම්කාරිත්වය අවසන් වීම පිළිබඳව ලිඛිත දැනුම්දීමක් සමාගමට ලබා දිය යුතු අතර සමාගම ඇවර කිරීමට යටත්ව සිටී නම්, එම දැන්වීම ඇවරකරුවකු විසින් ලබා දිය යුතු ය;

(ආ) එම තැනැත්තා දේපළ භාර ගැනුම්කරු වශයෙන් පත් කරනු ලැබුවේ අධිකරණය විසින් නම්, එම ලිඛිත දැන්වීම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ගොනු කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) එම ලිඛිත දැන්වීමේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත යවනු ලැබිය යුතු ය.

(3) මෙම වගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම වරදක් සිදු කරනු ලබන්නේ ය.

9 වන පරිච්ඡේදය

**දේපළ භාර ගැනුම්කාරිත්වය පවතින අතරතුර අධිකරණයේ බලතල**

**402.** (1) දේපළ භාර ගැනුම්කරුවකුගේ හෝ අධිකාරියේ ඉල්ලීමක් මත අධිකරණය විසින් - දේපළ භාර ගැනුම්කරුවකු විසින් විධාන සඳහා ඉල්ලීම් කිරීම

(අ) දේපළ භාර ගැනුම්කරුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේදී සහ ඉටු කිරීම ඉටු කිරීමේ දී ඒ සම්බන්ධයෙන් මතු වන යම් කරුණක් පිළිබඳව අධිකරණය විසින් විධාන ලබා දිය හැකි ය;

(ආ) එවැනි යම් විධානයක් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම හෝ වෙනස් කිරීම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලබා දී ඇති බලතල -

(අ) අධිකරණය විසින් ක්‍රියාත්මක කළ හැකි වෙනත් බලතලවලට අමතරව වන්නේ ය; සහ

(ආ) ඉල්ලුම්පත ඉදිරිපත් කරන විට දේපළ භාර ගැනුම්කරු එම තනතුරේ සිටිය ද, නොසිටිය ද අධිකරණය විසින් එම බලතල ක්‍රියාත්මක කළ හැකි ය.

(3) දේපළ භාර ගැනුම්කරුගේ කිසියම් ක්‍රියාවක්, අතපසුවීමක් හෝ තීරණයක් සම්බන්ධයෙන්, දේපළ භාර ගැනුම්කරු (1) වන උපවගන්තිය යටතේ ලබා දී ඇති විධානයකට අනුකූලව ක්‍රියා කළ බව, දේපළ භාර ගැනුම්කරුට එරෙහිව ඉදිරිපත් කර ඇති හිමිකම්පෑමකට විත්තිවාචකයක් වන්නේ ය.

දේපළ භාර ගැනුම්කරුගේ පාරිශ්‍රමිකය හෝ පත්වීම පිළිබඳ නියෝගය

**403.** (1) (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ ඉල්ලුම් පත්‍රය මත අධිකරණය විසින් -

(අ) යම් කාල පරිච්ඡේදයක් හෝ ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් 389 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ දේපළ භාර ගැනුම්කරුගේ පාරිශ්‍රමිකය තීරණය කර නොමැති අවස්ථාවක, අවස්ථානුගත කරුණු අනුව සාධාරණ මට්ටමකට එම පාරිශ්‍රමිකය ගෙවන ලෙස ආඥා කරනු ලැබිය හැකි ය;

(ආ) කිසියම් දේපළක් සම්බන්ධයෙන් දේපළ භාර ගැනුම්කරු වලංගු ලෙස පත් කර තිබේ ද නැතහොත් කිසියම් දේපළක් වලංගු ලෙස සන්තකයේ තබා ගැනීමට හෝ භාරයට පත් කර තිබේ ද යන්න හෝ පාලනය කිරීම භාර ගත්තේ ද යන්න ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) පහත සඳහන් යම් තැනැත්තෙකුට (1) වන උපවගන්තිය යටතේ -

(අ) දේපළ භාර ගැනුම්කරු හෝ දේපළ භාර ගැනුම්කරු ලෙස පත් කිරීමට නියමිත තැනැත්තා විසින්;

(ආ) ඇවරකරුවකු හෝ තාවකාලික ඇවරකරුවකු විසින්;

(ඇ) අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු විසින්;

(ඈ) ප්‍රදානකරු විසින්;

(ඉ) ප්‍රදානකරුගේ ණයහිමියා විසින්;

(ඊ) දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත්ව ඇති දේපළ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන වෙනත් යම් තැනැත්තකු විසින්;

(උ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින්; හෝ

(ඌ) අධිකාරිය විසින්,

අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(3) ඉල්ලීම කරනු ලබන අවස්ථාවේ දී දේපළ භාර ගැනුම්කරු එම තනතුරට අනුව ක්‍රියා කිරීම අවසන් කර තිබුණ ද, එසේ නොවුව ද (1) වන උපවගන්තිය යටතේ ලබා දී ඇති බලතල ක්‍රියාත්මක කළ හැකි ය.

දේපළ භාර ගැනුම්කාරිත්වය අධිකරණය විසින් වැළැක්වීම හෝ සීමා කිරීම කළ හැකි බව

**404.** (1) (2) වන උපවගන්තියට යටත්ව, ප්‍රදානකරුගේ ඉල්ලීම මත හෝ ප්‍රදානකරුගේ ඇවරකරුගේ ඉල්ලීම මත අධිකරණය විසින් -

(අ) දේපළ භාර ගැනුම්කරු විසින් යම් නිශ්චිත දිනයක සහ වේලාවක සිට ක්‍රියා කිරීම නැවැත්විය යුතු අතර, දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත් දේපළ සම්බන්ධයෙන් වෙනත් දේපළ භාර ගැනුම්කරුවකු පත් කිරීම තහනම් කළ යුතු බවට ආඥා කළ හැකි ය; හෝ

(ආ) යම් නිශ්චිත දිනයක සහ වේලාවක සිට දේපළ භාර ගැනුම්කරු දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත් දේපළෙහි කොටසක් වන යම් නිශ්චිත දේපළක් සම්බන්ධයෙන් පමණක් ක්‍රියා කළ යුතු බවට ආඥා කරනු ලැබිය හැකි ය.

(2) (අ) දේපළ භාර ගැනුම්කාරිත්වයේ කාර්යය හැකි තාක් දුරට ඉටු කර ඇති බවට; හෝ

(ආ) පවතින අවස්ථානුගත කරුණු අනුව දේපළ භාර ගැනුම්කාරිත්වය දිගටම පවත්වාගෙන යාම සාධාරණ නොවන බවට,

අධිකරණය සෑහීමට පත් වන්නේ නම් (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබිය හැකි වන්නේ ය.

(3) අධිකරණය අන්‍යාකාරයකට ආඥා කරන්නේ නම් මිස, මෙම වගන්තිය යටතේ වූ ඉල්ලීමක පිටපතක් ඉල්ලීම විභාග කිරීමට අවම වශයෙන් වැඩ කරන දින පහකට පෙර දේපළ භාර ගැනුම්කරුට භාර දිය යුතු අතර දේපළ භාර ගැනුම්කරු අධිකරණය වෙත පැමිණ කරුණු ඉදිරිපත් කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කිරීමේ දී, අධිකරණය විසින් අවශ්‍ය විය හැකි පරිදි -

(අ) ආඥාවේ බලාත්මක වන කාල සීමාවට අදාළ යම් නියමයක් හා කොන්දේසියක් පනවනු ලැබිය හැකි ය;

(ආ) වෙනත් යම් උපකාරක ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් දේපළභාර ගැනුම්කාරිත්වයට යටත් දේපළක් අදාළව ඇති පිළිබැඳුමකට බලපෑමක් සිදු නොවිය යුතු ය.

දේපළ භාර ගැනුම්කරුගේ කාර්ය ඉටු කිරීම සඳහා වූ ආඥාව

**405.** (1) මේ වගන්තියේ, දේපළ භාර ගැනුම්කරු සම්බන්ධයෙන්, වන විට “අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම” යන්නෙන් -

(අ) දේපළභාර ගැනුම්කරු පත් කරනු ලැබූ සාධන පත්‍රය අනුව හෝ අධිකරණ ආඥාව යටතේ; හෝ

(ආ) මෙම පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ; හෝ

(ඇ) මෙම වගන්තිය යටතේ සිදු කරන ලද අනුකූලව ක්‍රියා කිරීම සඳහා වූ ආඥාවක් හැර, අධිකරණයේ යම් ආඥාවක් හෝ විධානයක් යටතේ,

උපචිත වන කාර්යභාරයකට අනුකූලව ක්‍රියා කිරීම දේපළ භාර ගැනුම්කරු විසින් පැහැර හැරීම අදහස් වන අතර.

“අනුකූලව ක්‍රියා කිරීම” යන්නට, ඊට අදාළ අනුරූප අර්ථය තිබිය යුතු ය.

(2) (3) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුගේ ඉල්ලීමක් මත සහ ඊට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින බව හෝ පැහැර හැර ඇති බවට අධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක, අධිකරණය විසින් -

(අ) කාර්ය ඉටු නොකිරීමට අදාළව පැහැර හැරීමට අදාළව ලබා ගත හැකි අයිතියක් හෝ ප්‍රතිකර්මයකට අගති විරහිතව අධිකරණය විසින් අදාළ ආඥාවේ නිශ්චිතව දැක්විය හැකි තාක් දුරට, අදාළ කාර්ය අනුකූලව ක්‍රියා කරන ලෙස දේපළ භාර ගැනුම්කරුට නියෝග කරනු ලැබිය හැකි ය; හෝ

(ආ) අදාළ කාර්යට අනුකූලව සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් ක්‍රියා කිරීමෙන් දේපළ භාර ගැනුම්කරු නිදහස් කරනු ලැබිය හැකි ය.

(3) පහත සඳහන් යම් අයකුට, (2) වන උපවගන්තිය යටතේ -

(අ) ප්‍රදානකරුගේ දේපළෙහි වෙනත් දේපළභාර ගැනුම්කරුවකු අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීමට අදාළව දේපළ භාර ගැනුම්කරු විසින්;

(ආ) ප්‍රදානකරු විසින්;

(ඇ) ප්‍රදානකරුගේ ණයහිමියා විසින්;

(ඈ) දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත් දේපළ පිළිබඳ සම්බන්ධතාවයක් දක්වන වෙනත් යම් තැනැත්තකු විසින්;

(ඉ) ප්‍රදානකරුගේ ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු විසින්;

(ඊ) ප්‍රදානකරුගේ අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු විසින්;

(උ) රෙජිස්ට්‍රාර්වරයා විසින්; හෝ

(ඌ) අධිකාරිය විසින්,

අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(4) ඉල්ලීමක් කිරීමට අවම වශයෙන් වැඩ කරන දින දහයකට පෙර දේපළ භාර ගැනුම්කරු වෙත අනුකූලව ක්‍රියා කිරීම පැහැර ඇති බවට වූ දැනුම් දීමක් කර ඇත්නම් මිස සහ ඉල්ලීම කරනු ලබන දිනට අඛණ්ඩව අසාර්ථක වීමක් සිදු වුවහොත් මිස, (2) වන උපවගන්තිය යටතේ කිසිදු ඉල්ලීමක් ඉදිරිපත් කරනු නොලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද සෑම නියෝගයකම පිටපතක්, ආඥාව නිකුත් කිරීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත, අධිකරණය විසින් අධිකාරිය වෙත යැවිය යුතු ය.

අධිකරණය විසින් දේපළ භාර ගැනුම්කරු ධූරයෙන් ඉවත් කිරීම

**406.** (1) 405(3) වන උපවගන්තිය යටතේ සඳහන් තැනැත්තකුගේ ඉල්ලීමක් මත -

(අ) 405 වන වගන්තියේ (2) වන වගන්තියේ (ආ) ඡේදය යටතේ කරන ලද නියෝගයකට අනුකූලව ක්‍රියා කිරීමට දේපළ භාර ගැනුම්කරු අපොහොසත් වී ඇති බවට; හෝ

(ආ) දේපළ භාරගැනුම්කරු ලෙස පත් කිරීමට හෝ ක්‍රියා කිරීමට 370 වන වගන්තිය යටතේ නුසුදුස්සකු වී ඇති බවට,

අධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක, අධිකරණය විසින්, එම දේපළ භාර ගැනුම්කරු ධූරයෙන් ඉවත් කිරීමට ආඥා කළ හැකි අතර, එවැනි ආඥාවක් සිදු කිරීමේ දී, :-

(2) (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද සෑම ආඥාවක ම පිටපතක්, ආඥාව නිකුත් කිරීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත, අධිකරණය විසින් රෙජිස්ට්‍රාර්වරයා සහ අධිකාරිය වෙත යැවිය යුතු ය.

දේපළ භාර ගැනුම්කාරිත්වය යටතේ දේපළ ආරක්ෂා කිරීම සඳහා වූ ආඥා

**407.** (1) අධිකරණය විසින් දේපළ භාර ගැනුම්කරු ධූරයෙන් ඉවත් කරමින් ආඥාවක් කිරීමේ දී හෝ ධූරයෙන් ඉවත් කිරීමේ බලපෑමක් ඇති කරන ආඥාවක් කිරීමේ දී, අවශ්‍ය පරිදි පහත දැක්වෙන කරුණු සඳහා එවැනි ආඥා කළ හැකි ය. එනම් -

(අ) දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත් දේපළ ආරක්ෂා කිරීම සඳහා; සහ

(ආ) (අ) ඡේදයේ සඳහන් කාර්යය සඳහා, තැනැත්තකු ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍ය වන විට -

(i) එම තැනැත්තාගේ සන්තකයේ හෝ භාරකාරත්වයේ ඇති ලේඛන හෝ දේපළ භාර ගැනුම්කරුගේ පාලනය යටතේ ඇති ලේඛන ආඥාවේ නිශ්චිතව නම් කර ඇති තැනැත්තාට භාර දිය යුතු බවට; සහ

(ii) අවශ්‍ය පරිදි වෙනත් ක්‍රියාමාර්ග ගන්නා ලෙසට;

නියෝග කරනු ලැබිය හැකි ය.

## XIV වන කොටස

### හරස්-දේශසීමා වස්තුභංගත්වය

**408.** (1) විදේශීය සමාගමක් ඈවර කිරීම සඳහා අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. විදේශීය සමාගම්

(2) (1) වන උපවගන්තිය යටතේ විදේශීය සමාගමක් -

(අ) ලියාපදිංචි විදේශීය සමාගමක් වුව ද එසේ නැති වුව ද;

(ආ) සමාගම් පනතේ 496 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම නතර කර ඇති බවට දැනුම් දී ඇත් ද; හෝ

(ඇ) වෙනත් ඕනෑම අධිකරණ බල ප්‍රදේශයක නීති යටතේ හෝ ඒ අනුව සමාගමක් ලෙස විසුරුවා හරිනු ලැබූ හෝ වෙනත් ආකාරයකින් පැවතීම නතර කර ඇත් ද,

ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(3) පහත දැක්වෙන අවස්ථාවල දී හැර, විදේශීය සමාගමක ඈවර කිරීමට XII වන කොටස අදාළ වේ:-

(අ) විදේශීය සමාගමක් පිළිබඳව කරන ලද සඳහන් කිරීම්වලට විදේශීය සමාගමකට කරන ලද සඳහන් කිරීමක් ඇතුළත් විය යුතු ය; සහ

(ආ) 349 වන වගන්තිය අදාළ නොවිය යුතු ය.

## XV වන කොටස

### වස්තුභංගත්වය

### 1 වන පරිච්ඡේදය

#### ණය ගෙවා ගැනීමට නොහැකි වීම සහ වැරදි සහගත වෙළඳාම

ණය ගෙවා ගැනීමට නොහැකි වීම

**409.** (1) යම් තැනැත්තකුගේ ණය ගෙවීමට ඇති විට එම තැනැත්තාට එම ණය ගෙවා ගැනීමට නොහැකි වන අවස්ථාවක දී එම තැනැත්තා වස්තුභංගත්වයට පත් වන්නේ ය.

(2) සාමාන්‍ය ව්‍යාපාරයේ දී ගෙවිය යුතු ණය ගෙවා ගැනීමට නොහැකි වූ විට සමාගමක් වස්තුභංගත්වයට පත් වන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ අර්ථානුකූලව වස්තුභංගත්වය බව සනාථ කිරීමට යම් සාක්ෂියකින් ඔප්පු කළ හැකි ය.

(4) මෙම පනතේ කාර්ය සඳහා, පටහැනිව යමක් ඔප්පු කළහොත් මිස, පහත දැක්වෙන අවස්ථාවල දී (2) වන උපවගන්තියේ අර්ථානුකූලව සමාගමක් වස්තුභංගත්වයට පත් වී ඇති බවට පූර්ව නිගමනය කළ යුතු ය:-

(අ) පැවරීමකින් හෝ අන්‍යාකාරයකින්, සමාගම විසින් නියමිත ප්‍රමාණය ඉක්මවා මුදලක් ණය වී ඇති ණයහිමියකු ණය මුදල ගෙවීමට අවශ්‍ය ව්‍යවස්ථාපිත ඉල්ලීමක් සමාගමට දී ඇති අතර, ඒ සඳහා, සහ ණයහිමියාගේ සාධාරණ ලෙස මුදල් ලබා ගැනීම හෝ සුරක්ෂිත කිරීම හෝ සමථයකට පැමිණීම මගින් සේවා දිනයේ සිට දින විසි එකක් ඉල්ලුමට අනුකූල වීමට සාධාරණ

හේතුවක් නොමැතිව සමාගම අපොහොසත් වී ඇති අවස්ථාවකදී;

(ආ) යම් අධිකරණයක නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් මත සමාගමේ ණයහිමියකුගේ වාසියට ක්‍රියාවේ යෙදවීමක් හෝ වෙනත් ක්‍රියාවලියක් නියෝග කර ඇති විට, එම ණය සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් හෝ නොගෙවා එම ආඥාවක් ආපසු එවා ඇති විට;

අධිකරණය විසින් ඉල්ලීම ඉවතලිය හැකි බව

**410.** (1) සමාගමේ ඉල්ලීමක් මත, පහත දැක්වෙන කරුණු පිළිබඳව අධිකරණය සෑහීමට පත් වන අවස්ථාවක, එනම් -

(අ) හරවත් හේතු මත ආරවුලට තුඩු දුන් මුදල් ප්‍රමාණය ගැබ් වී ඇති බවට පෙනී ඇත්නම්;

(ආ) සමාගමට ප්‍රතිවිරුද්ධ හිමිකම්පෑමක්, හිලව් කිරීමක් හෝ ප්‍රතිවිරුද්ධ ඉල්ලීමක් ඇති බව සහ ඉල්ලීමේ නිශ්චිතව දක්වා ඇති එකී මුදල ප්‍රතිවිරුද්ධ හිමිකම්පෑමේ, හිලව් කිරීමේ හෝ ප්‍රතිවිරුද්ධ ඉල්ලීමේ සඳහන් මුදලට වඩා අඩු බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම්; හෝ

(ඇ) වෙනත් හේතුවක් නිසා ඉල්ලුම ඉවත දැමිය යුතු බවට අධිකරණය සෑහීමට පත් වී ඇත්නම්,

අධිකරණය විසින් එම ව්‍යවස්ථාපිත ඉල්ලීම ඉවත දැමිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් -

(අ) සමාගම වෙත ඉල්ලීම භාර දීමෙන් වැඩ කරන දින දහයක් ඇතුළත ඉදිරිපත් කර තිබිය යුතු ය; සහ

(ආ) නියම කරනු ලැබිය හැකි ආකෘති පත්‍රය අනුව එම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් මගින් ව්‍යවස්ථාපිත ඉල්ලීමට අනුකූලව ක්‍රියා කිරීමේ කාලය අත්හිටුවිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, ව්‍යවස්ථාපිත ඉල්ලීමට අනුකූලව ක්‍රියා කිරීම සඳහා වූ කාලය ප්‍රතික්ෂේප කිරීමේ දින සිට ආරම්භ වේ.

(5) (1) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක් කිරීමේ දී, අධිකරණය විසින් අවශ්‍ය පරිදි -

(අ) යම් නියමයක් හෝ කොන්දේසියක් පනවනු ලැබිය හැකි ය; සහ

(ආ) වෙනත් උපකාරක ආඥාවක් කරනු ලැබිය හැකිය.

වැරදි සහගත වෙළෙඳාම

**411.** (1) සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී ණයක් ගෙවීමට තිබෙන විට හෝ ඉන් පසුව සාධාරණ කාලයක් ණය ගෙවීමට සමාගමට නොහැකි බවට විශ්වාස කරන සමාගමක අධ්‍යක්ෂවරයකු, මෙම උපවගන්තිය යටතේ දැනටමත් රැස්වීමක් කැඳවා නොමැති අවස්ථාවක, පහත දැක්වෙන කරුණු සලකා බැලීම සඳහා සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමක් වහාම කැඳවිය යුතු ය:-

(අ) සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ ණය ගෙවීමට සමාගමට නොහැකි වන්නේ ද, නැතහොත් ඉන් පසුව සාධාරණ කාලයක් ඇතුළත්ව ද ණය ගෙවීමට නොහැකි වන්නේ ද; සහ

(ආ) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් -

(i) 186 වන වගන්තිය යටතේ සමාගමේ අද්මිනිස්ත්‍රාසිවරයකු පත් කිරීමට යෝජනා කළ යුතු ද;

(ii) සමාගමේ අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම සඳහා 190 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ද; හෝ

(iii) සමාගමේ ඈවරකරුවකු පත් කිරීම සඳහා 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ද;

(2) (අ) (1) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කිරීමට අධ්‍යක්ෂවරයකු පැහැර හරින වන අවස්ථාවක දී;

(ආ) එම පැහැර හැරීම සිදුවන අවස්ථාවේ දී, හෝ ඉන් පසුව සාධාරණ කාලයක් තුළ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සිදු කරගෙන යාමේ දී ගෙවිය යුතු ණය ගෙවීමට සමාගමට නොහැකි වන අවස්ථාවක දී; සහ

(ඇ) ඉන් පසුව වසර පහක් ඇතුළත සමාගමේ ඈවර කිරීම ආරම්භ වන අවස්ථාවක,

එකී පැහැර හැරීම සිදු වූ අවස්ථාවේ දී අද්මිනිස්ත්‍රාසිකරු හෝ ඈවරකරුවකු සමාගමට පත් නොකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාගමට සිදු වූ පාඩුව සම්පූර්ණව හෝ ඉන් කොටසක් ගෙවීම සඳහා අදාළ අධ්‍යක්ෂවරයා වගකිව යුතු බවට යෝග්‍ය යයි සිතන්නේ නම්, ඈවරකරුගේ හෝ ණයහිමියාගේ ඉල්ලීම මත, අධිකරණය විසින් ආඥාවක් කළ හැකි ය.

(3) (අ) (i) (1) වන උපවගන්තිය යටතේ රැස්වීමක් කැඳවනු ලැබුව ද, එය පැවැත්වීමට අධ්‍යක්ෂවරුන් පැහැර හරින අවස්ථාවක දී; හෝ

(iii) (1) වන උපවගන්තිය යටතේ කැඳවා ඇති රැස්වීමක දී (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ දක්වා ඇති එක් පියවරක් ගැනීමට අධ්‍යක්ෂවරු පැහැර හැර ඇති අවස්ථාවක;

(ආ) එම පැහැර හැරීම සිදු වූ අවස්ථාවේ දී හෝ ඉන් පසුව සාධාරණ කාලයක් තුළ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී ගෙවිය යුතු ණය ගෙවීමට සමාගමට හැකි වූ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු නොතිබුණ අවස්ථාවක දී; සහ

(ඇ) ඉන් පසු වසර පහක් ඇතුළත සමාගම ඈවර කිරීම ආරම්භ වූ අවස්ථාවක දී,

ඈවරකරුගේ හෝ ණයහිමියාගේ ඉල්ලීම මත, අධිකරණය විසින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් පියවරවලින් එක පියවරක් ගැනීමට පක්ෂව රැස්වීමට පැමිණ ඡන්දය දුන් අධ්‍යක්ෂවරුන් හැර, අධිකරණය යෝග්‍ය යයි සිතන පරිදි සමාගම අද්මිනිස්ත්‍රාසි කිරීමට හෝ ඈවර කිරීමට යොමු නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස ණයහිමියන්ට සිදු වූ සම්පූර්ණ පාඩුව හෝ ඉන් කොටසක් සඳහා සමාගමේ අනෙක් අධ්‍යක්ෂවරුන් වගකිව යුතු බවට අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(4) මෙම වගන්තිය යටතේ ආඥාවක් කිරීමේ දී, අධිකරණයට අවශ්‍ය පරිදි -

(අ) යම් නියමයක් හෝ කොන්දේසියක් පැනවීම කළ හැකි ය;සහ

(ආ) වෙනත් අනුයාත ආඥාවක් කළ හැකි ය.

(5) මෙම වගන්තියේ සඳහන් කිසිවක් මගින් -

(අ) සමාගම් පනතේ 187 වන වගන්තියේ අදාළ කිරීමට බලපෑම් කිරීමක් හෝ සීමා කිරීමක් නොවිය යුතු ය; හෝ

(ආ) පහත කරුණු සඳහා සමාගමේ යෝජනාවක් සලකා බැලීම සඳහා සමාගමේ කොටස් හිමියන්ගේ රැස්වීමක් කැඳවීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වැළැක්වීමක් නොවිය යුතු ය:-

(i) 185 වන වගන්තිය යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම සඳහා;

(ii) අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම සඳහා 190 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අධිකරණයට කරන ලද ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා; හෝ

(iii) ඇවරකරුවකු පත් කිරීම සඳහා 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ අධිකරණයට කරන ලද ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා.

2 වන පරිච්ඡේදය

අවලංගු කළ හැකි ගනුදෙනු

අවලංගු කළ හැකි ප්‍රමුඛතාව

**412.** (1) පහත දැක්වෙන අවස්ථාවල දී අදාළ නිලධරයකු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත අධිකරණය විසින් ණයකරුවකුගේ ගනුදෙනුවක් ඉවත දැමිය හැකි ය:-

(අ) එම ගනුදෙනුවට ඇතුළත් වූයේ ණයකරු වස්තුභංගත්වයට පත් වී සිටි අවස්ථාවක;

(ආ) එම ගනුදෙනුව මගින් ණයකරු බංකොලොත්භාවයට හෝ ඇවර කිරීමට භාජන වී සිටි කාලයේ දී එම තැනැත්තාට ණයකරුගෙන් ලැබිය හැකිව තිබූ මුදලට වඩා වැඩි මුදලක් ණයකරුගෙන් ලබා ගත හැකි නම්; සහ

(ඇ) (i) එම ගනුදෙනුවට එළඹී ඇත්තේ ණයකරුගේ සම්බන්ධිත පාර්ශ්වයක් හැර, වෙනත් තැනැත්තකු සමග නම්, සහ එසේ එළඹී ඇත්තේ සම්මත සමාලෝචන කාලසීමාව තුළ දී නම්; හෝ

(ii) එම ගනුදෙනුවට ඇතුළත් වූයේ ණයකරුගේ සම්බන්ධිත පාර්ශ්වයක් සමග නම්, සහ එසේ එළඹෙන ලද්දේ සම්බන්ධිත පාර්ශ්වයේ සමාලෝචන කාලසීමාව තුළ දී නම්,

අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත ණයකරුගේ ගනුදෙනුවක් අධිකරණය විසින් අවලංගු කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා සම්මත සමාලෝචන කාලසීමාව තුළ දී ඇතුළත් වූ ගනුදෙනුවක් ඒ බවට පටහැනිව ඔප්පු කරන්නේ නම් මිස, ණයකරු වස්තුභංගත්වයට පත් වී තිබුණ අවස්ථාවක ඇතුළත් වී ඇති බවට පූර්ව නිගමනය කළ හැකි ය.

(3) (අ) වාණිජමය කාර්යයක් සඳහා වන්නා වූ ගනුදෙනුවක් වෙනත් තැනැත්තන් හා සම්බන්ධතාවයක් ඇති පාර්ශ්වයන් ඇතුළුව ණයකරු සහ ණයහිමියා අතර පවතින අනුක්‍රමණ ගිණුමක් ලෙස අඛණ්ඩව පවත්නා ව්‍යාපාර සම්බන්ධතාවයක වැදගත් අංගයක් වන අවස්ථාවක දී නම්; සහ

(ආ) සබඳතාවය අතරතුර සම්බන්ධතාවයේ කොටසක් ලෙස ගනුදෙනු රාශියක් පැවතීම හේතු කොටගෙන ණයහිමියාට ඇති ණයකරුගේ ණයගැතිභාවය වරින් වර වැඩි වීම හෝ අඩු වීම සිදුවන අවස්ථාවක දී නම්;

(ඇ) එවිට එම ගනුදෙනු මගින් එක ගනුදෙනුවක් සංයුක්ත වන ලෙස (1) වන උපවගන්තිය, (ආ) ඡේදය සම්බන්ධයෙන් සියලු ගනුදෙනුවලට අදාළ විය යුතු ය; සහ

(ඈ) එවිට (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයට අනුකූලව (1) වන උපවගන්තිය අදාළ වීමේ බලපෑම වනුයේ, (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් වන තනි ගනුදෙනුව අවලංගු කළ හැකි ප්‍රමුඛතාවයක් ලෙස සලකන්නේ නම් මිස, (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් ගනුදෙනුව අවලංගු කළ හැකි ප්‍රමුඛතාවයක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(4) අවලංගු කළ හැකි ප්‍රමුඛතාවයක් යනු (1) වන උපවගන්තිය යටතේ ඉවත දැමිය හැකි ගනුදෙනුවක් වන්නේ ය.

අවලංගු කළ හැකි පිළිබැඳීමක්

**413.** (1) (3) වන සහ (5) වන උපවගන්තිවලට යටත්ව, කැප අයිතියක් හැර, ණයකරුවකුගේ දේපළක් හෝ ව්‍යවසායක් මත පවතින පිළිබැඳීමක් පහත දැක්වෙන අවස්ථාවල දී, එනම් -

(අ) පිළිබැඳීම ලබා දුන් වහාම ණයකරු වස්තුභංගත්වයට පත් වූ අවස්ථාවක දී; සහ

(ආ) (i) පිළිබැඳීම ලබා දුන්නේ ණයකරුගේ සම්බන්ධිත පාර්ශ්වයක් නොවන තැනැත්තකුගේ වාසියට නම් සහ එය ලබා දුන්නේ සම්මත සමාලෝචන කාලසීමාව තුළ දී නම්; හෝ

(ii) පිළිබැඳීම ලබා දුන්නේ ණයකරුගේ සම්බන්ධිත පාර්ශ්වයකුගේ වාසියට නම් සහ එය සිදු වූයේ සම්බන්ධිත පාර්ශ්වයේ සමාලෝචන කාලසීමාව තුළ දී නම්,

අදාළ නිලධරයාගේ ඉල්ලීම මත අධිකරණය විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, සම්මත සමාලෝචන කාලසීමාව තුළ දී පිළිබැඳීමක් ලබාදෙන ණයකරුවකු පටහැනිව ඔප්පු කළහොත් මිස, පිළිබැඳීම ලබා දුන් වහාම එම ණයකරු වස්තුභංගත්වයට පත් වූ ලෙස පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.

(3) (4) වන උපවගන්තියට යටත්ව, පහත දැක්වෙන අවස්ථාවල දී, (1) වන උපවගන්තිය යටතේ, පිළිබැඳීමක් ඉවත දමනු නොලැබිය හැකි ය:-

(අ) යම් පිළිබැඳීමක් -

(i) සැබැවින්ම අත්තිකාරම් වශයෙන් හෝ ගෙවන ලද මුදල් වශයෙන් හෝ විකුණන ලද හෝ සැපයූ දේපළෙහි සැබෑ මිල හෝ වටිනාකම හෝ පිළිබැඳීම ලබා දුන් අවස්ථාවේ දී හෝ ඉන් පසුව පිළිබැඳීමේ දීමනාකරු විසින් සද්භාවයෙන් ණයකරුට ලබා දී ඇති වෙනත් යම් අගනා ප්‍රතිෂ්ඨාවක්; සහ

(ii) (i) වන අනුඡේදයේ සඳහන් මුදල මත ගෙවිය යුතු යම් පොලියක්;

මගින් සුරක්ෂිත කර ඇති අවස්ථාවක දී එම පිළිබැඳීම අවලංගු නොකළ යුතු ය; හෝ

(ආ) පිළිබැඳීම ණයකරු ලබා දුන් පිළිබැඳීමට ආදේශයක් නම්, සහ -

(i) එය ලබා දී ඇත්තේ ණයකරුට සම්බන්ධිත නොවන පාර්ශ්වයකට නම්, සහ එය ලබා දී ඇත්තේ සම්මත සමාලෝචන කාලයට පෙර නම්; හෝ

(ii) එය ලබා දී ඇත්තේ ණයකරුට සම්බන්ධිත පාර්ශ්වයක වාසියට සම්බන්ධිත පාර්ශ්වයේ සමාලෝචන කාලයට පෙර නම්.

(4) පහත දැක්වෙන අවස්ථාවල දී, අදාළ ප්‍රමාණයන්ට, එනම් -

(අ) ආදේශක පිළිබැඳීම මගින් සුරක්ෂිත කර ඇති මුදල එවකට පැවති පිළිබැඳීම සුරක්ෂිත කර ඇති මුදලට; හෝ

(ආ) ආදේශ කිරීම සිදු කරන දිනයේ දී ආදේශක පිළිබැඳීමට යටත්ව ඇති දේපළෙහි වටිනාකම, එම දිනය වන විට එවකට පැවැති පිළිබැඳීමට යටත්ව තිබූ දේපළෙහි වටිනාකමට,

වඩා වැඩිවන තාක් දුරට (3) වන උපවගන්තියේ (ආ) ඡේදය අදාළ නොවන්නේ ය.

(5) පහත දැක්වෙන අවස්ථාවල දී (1) වන උපවගන්තිය යටතේ පිළිබැඳීමක් එම දේපළ මත ලබාදුන්න ද, එසේ නොදුන්න ද, පිළිබැඳීම මගින් දේපළට අදාළ නොගෙවා ඇති මුදල හෝ එකී මුදල මත අය විය යුතු පොලිය පිළිබැඳීම මගින් සුරක්ෂිත කරන අවස්ථාවක දී පිළිබැඳීමක් ඉවත දමනු නොලැබිය හැකි ය:-

(අ) පිළිබැඳීම නිර්මාණය කරන සාධන පත්‍රය දේපළ විකිණීමෙන් පසු වැඩ කරන දින විස්සක් ඇතුළත ලියා අත්සන් කළේ නම්; හෝ

(ආ) බූදලය විකිණීමේ දී හෝ නිශ්චල දේපළක අයිතිය විකුණන අවස්ථාවක දී පිළිබැඳීම නිර්මාණය කරන සාධන පත්‍රය දේපළ විකිණීමෙන් පසු දින විස්සක් ඇතුළත ලියා අත්සන් කළේ නම්.

(6) (3) වන උපවගන්තියේ (අ) ඡේදය සහ (5) වන උපවගන්තියේ කාර්ය සඳහා, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කොන්දේසි සපුරාලන පිළිබැඳීමකට අනුව ණයකරුවකු විසින් ප්‍රදානය කරන තැනැත්තාට මුදල් ගෙවන අවස්ථාවක, එනම් -

(අ) පිළිබැඳීම ලබා දීමේ දී හෝ ඉන්පසු එම බැඳීම අනුව ප්‍රදානලාභියා විසින් ණයකරුට ගෙවා ඇති අත්තිකාරම් හෝ මුදල් ආපසු ගෙවීම සඳහා;

(ආ) පිළිබැඳීම ලබා දීමේ දී හෝ ඉන් පසු එම පිළිබැඳීම අනුව ප්‍රදානලාභියා විසින් ණයකරුට ගෙවා ඇති දේපළෙහි සැබෑ මිල හෝ වටිනාකම ගෙවීම සඳහා;

(ඇ) පිළිබැඳීම ලබා දීමේ දී හෝ ඉන් පසුව එම පිළිබැඳීම සද්භාවයෙන් ලබා දුන් වෙනත් යම් අගනා ප්‍රතිඡ්ඨාවක් සම්බන්ධයෙන් පිළිබැඳීමට අදාළව ණයකරුගේ යම් බැරකමක් ප්‍රදානකරුට ගෙවා බේරුම් කිරීමට යොදා ගන්නා මුදලක් සඳහා,

සහ (අ), (ආ) සහ (ඇ) වන ඡේදවල සඳහන් මුදල් ප්‍රමාණ මත ගෙවිය යුතු පොලිය ද ඇතුළුව, එකී ගෙවීම් ගැලපෙන පරිදි අනුයෝජනය කර ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(7) අවලංගු කළ හැකි පිළිබැඳීමක් යනු (1) වන උපවගන්තිය යටතේ ඉවත දමනු ලැබිය හැකි පිළිබැඳීමක් වන්නේ ය.

ණය හිමියෙකුට බාධා කිරීම, ප්‍රමාද කිරීම හෝ දුබල කිරීමේ චේතනාවෙන් දේපළ අන්සතු කිරීම

**414.** (1) වන (2) වන සහ (3) වන යන උපවගන්තිවලට යටත්ව, දේපළ සම්බන්ධයෙන් ණයහිමියකු සහන ලබා ගැනීමේ අයිතිය ක්‍රියාත්මක කිරීමේ දී ණයහිමියාට බාධා කිරීමේ, ප්‍රමාද කිරීමේ හෝ පරාජය කිරීමේ අරමුණ ඇතිව දීර්ඝ කරන සමාලෝචන කාලසීමාව තුළ දී, ණයකරු විසින් කිසියම් දේපළ පැවරීමක් හෝ විකිණීමක් කර ඇති විට, අදාළ නිලධරයාගේ ඉල්ලීමක් මත අධිකරණය විසින් ඉවත දමනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් අරමුණ පිළිබඳව අනුදැනුමක් නොමැතිව සද්භාවයෙන් දේපළ අත්කරගත් තැනැත්තකුට දේපළ පවරන අවස්ථාවක දී, (1) වන උපවගන්තිය යටතේ කර ඇති හිමිකරයක් හෝ පැවරීමක් ඉවත දැමිය නොහැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් කිසිවක් මගින් සුරක්ෂිත ණයහිමියකුට ලබා දී ඇති යම් අයිතිවාසිකමකට හෝ පිළියමකට බලපෑමක් හෝ සීමා කිරීමක් නොවන්නේ ය.

(4) අරමුණක් සහිතව අන්සතු කිරීමට දේපළ පැවරීමක් හෝ විකිණීමක් (1) වන උපවගන්තිය යටතේ ඉවත දමනු ලැබිය හැකි ය.

අරමුණක් සහිතව අවලංගු කළ හැකි ප්‍රමුඛතාවක්, අවලංගු කළ හැකි පිළිබැඳීමක් හෝ අන්සතු කිරීමක්, ඉවත දැමීම සඳහා කාර්ය පටිපාටිය

**415.** (1) අවලංගු කළ හැකි ගනුදෙනුවක් ඉවත දැමීම සඳහා අධිකරණයට කරන ලද ඉල්ලීමක්, මෙම පනත යටතේ ඒ යටතේ සාදන ලද ආඥා සහ වෙනත් ලිඛිත නීති යටතේ අදාළ නියමයන්ට අනුකූල වීමට අමතරව, පහත දැක්වෙන කරුණු නිශ්චිතව දැක්විය යුතු ය. එනම්:-

(අ) අභියෝගයට ලක්වන ගනුදෙනුවේ දිනය;

(ආ) අභියෝගයට ලක්වන ගනුදෙනුවේ තොරතුරු;

(ඇ) ඉවත දැමීම සඳහා වූ එක් එක් කොන්දේසි සපුරාලන ක්‍රමය,

(ඈ) අදාළ නිලධරයා අපේක්ෂා කරන ආඥාව හෝ ආඥා; සහ

(ඉ) (ඈ) ඡේදයේ සඳහන් ආඥාව හෝ ආඥා ඉල්ලා සිටීමේ දී විශ්වාසය තබන ගණනයන් හා වටිනාකම්.

(2) අදාළ නිලධරයා විසින් නියම කළ හැකි ආකාරයට සහ එවැනි කාලසීමාවක් තුළ අයදුම් පත්‍රයේ පිටපතක් -

(අ) ගනුදෙනුවේ පාර්ශ්වකරුවකු වූ ණයකරු හැර වෙනත් තැනැත්තකු; සහ

(ආ) අදාළ නිලධරයා විසින් ආඥාව හෝ ආඥා ඉල්ලා සිටින වෙනත් ඕනෑම තැනැත්තකු,

වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒ එක් එක් අවස්ථාවක දී නියම කළ හැකි වෙනත් තොරතුරු ද ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් වන තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ඉවත දැමීමකට එරෙහිව නියම කළ හැකි ආකාරයට සහ කාලසීමාව තුළ විරෝධතා ඉදිරිපත් කළ හැකි ය.

අවලංගු කළ හැකි ප්‍රමුඛත්වයක්, අවලංගු කළ හැකි පිළිබැඳීමක් හෝ චේතනාන්විත අන්සතු කිරීමක්, අවලංගු කිරීම සඳහා වන කාර්යය පටිපාටි

**416.** (1) අවලංගු කළ හැකි ගනුදෙනුවක් ඉවත දැමීමේ දී, අධිකරණයට පහත ආඥා එකක් හෝ කිහිපයක් කළ හැකි ය:-

(අ) යම් තැනැත්තකු විසින් -

(i) අදාළ නිලධරයාට; හෝ

(ii) අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ පසු ණයකරු ඇවර කිරීම ආරම්භ කර ඇති විට, ඇවරකරුට,

අවලංගු කළ හැකි ගනුදෙනුව යටතේ පවරන ලද ණයකරුගේ දේපළ හෝ දේපළ අයිතිවාසිකම් පවරනු ලැබීමට;

(ආ) යම් තැනැත්තෙකු විසින් -

(i) අදාළ නිලධරයා වෙත ගෙවන ලෙස; හෝ

(ii) අධිකරණයට ඉල්ලීම කිරීමෙන් පසු ණයකරු ඇවර කිරීම ආරම්භ කර ඇත්නම්, ඇවරකරුට,

අවලංගු කළ හැකි ගනුදෙනුව යටතේ ගෙවන ලද මුදලට සමාන මුදලක් ගෙවනු ලැබීමට.

(ඇ) අවලංගු කළ හැකි ගනුදෙනුවේ ප්‍රතිඵලයක් ලෙස අදාළ තැනැත්තාට ලැබුණු ප්‍රතිලාභවලට අධිකරණයේ මතය අනුව යම් ලෙසකින් සාධාරණ නියෝජනයක් වූ ගණනයක් වශයෙන් සමාන මුදලක් -

(i) අදාළ නිලධරයාට ගෙවන ලෙස; හෝ

(ii) අධිකරණයට කරන ලද ඉල්ලීමක් මත ණයකරු ඇවර කිරීම ආරම්භ කර ඇත්නම්, ඇවරකරුට එකී මුදල් ගෙවනු ලැබිය යුතු ය.

(ඈ) අධිකරණයේ මතය අනුව, පහත සඳහන් කරුණු දෙකෙන් එකක් හෝ සාධාරණ ලෙස නියෝජනය කරන තැනැත්තකු වෙත දේපළ හෝ දේපළ අයිතිය පැවරීමේ ආඥාවක් -

(i) අවලංගු කළ හැකි ගනුදෙනුව යටතේ ගෙවන ලද මුදල්වලින් සමහරක් හෝ සියල්ලම; සහ

(ii) අවලංගු කළ හැකි ගනුදෙනුව යටතේ පැවරූ ණයකරුගේ දේපළ හෝ දේපළ අයිතිය විකිණීමෙන් ලැබෙන මුදල් සමහරක් හෝ සියල්ල;

(ඉ) උපචිත වනු ලැබ ඇති යම් ණයක් හෝ ලබා දී ඇති යම් ඇපකරයක් හෝ බැඳීමක් සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් නිදහස් කරමින් දෙන ලද යම් ආඥාවක්;

(ඊ) මෙම උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් නිදහස් කිරීම සඳහා ඇපයක් ලබා දිය යුතු බවට වූ ආඥාවක්;

(උ) අවලංගු කළ හැකි ගනුදෙනුවක් අවලංගු කිරීමෙන් හානියට පත් පාර්ශ්වයකට සිදු වී ඇති හානිය නිශ්චිතව දක්වන ආඥාවක් ලබා දීම මගින් බංකොලොත්භාවයේ දී අද්මිනිස්ත්‍රාසි කිරීමේ දී හෝ ඇවර කිරීමේ දී ණයහිමියකු ලෙස සැලකීමට හිමිකම් ඇත; හෝ

(ඌ) අවලංගු කළ හැකි ගනුදෙනුවේ කොටසක් වන හෝ ඊට අදාළ ගිවිසුමක් ප්‍රකාශ කරන ආඥාවක් හෝ එවැනි ගිවිසුමක නිශ්චිත විධිවිධාන -

(i) ගිවිසුම ඇති කරගත් අවස්ථාවේ සිට හෝ එම ආඥාවේ සඳහන් කළ හැකි පසුකාලීනව අවලංගු වේ; හෝ

(ii) බලාත්මක කළ නොහැකි බවට වූ,

ආඥාවක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් නිකුත් කිරීමේ දී අධිකරණයට අවශ්‍ය පරිදි වෙනත් යම් අනුපූරක ආඥාවක් කළ හැකි ය.

අවලංගු කළ හැකි ප්‍රමුඛත්වයක්, අවලංගු කළ හැකි පිළිබැඳීමක් හෝ චේතනාවක් සහිත අන්සතු කිරීමක්, අස් කිරීම සඳහා වූ අධිකරණ නියෝග

**417.** (1), (2) වන (3) වන සහ (4) වන උපවගන්තිවලට යටත්ව, යම් තැනැත්තකු අවලංගු කළ හැකි ගනුදෙනුවක පාර්ශ්වකරුවකු වුව ද, එසේ නැති වුව ද, නැතහොත් අවලංගු කළ හැකි ගනුදෙනුව යටතේ අර්ථලාභියකු වුව ද, එසේ හැකි වුව ද, එම තැනැත්තාගේ දේපළට බලපාන හෝ එම තැනැත්තා මත පිළිබැඳීමක් ඇති කරවන ආඥාවක් 416 වන වගන්තිය යටතේ අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු අවලංගු කළ හැකි ගනුදෙනුවක පාර්ශ්වකරුවකු වන අවස්ථාවක දී හෝ එකී ගනුදෙනුව යටතේ අර්ථලාභියකු වන අවස්ථාවක දී එකී තැනැත්තා විසින් පහත දැක්වෙන පරිදි එනම්:-

(අ) එකී තැනැත්තා සද්භාවයෙන් ක්‍රියා කර ඇති බව;

(ආ) අවලංගු කළ හැකි ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ දී, එකී තැනැත්තාගේ තත්ත්වයේ සිටින සාධාරණ පුද්ගලයකු, ණයකරු බුන්වත් තැනැත්තකු බව හෝ අවලංගු කළ හැකි ගනුදෙනුව අවසාන වූ වහාම බුන්වත් තැනැත්තකු විය හැකි බව විශ්වාස නොකරනු ඇති බව;

(ඇ) (i) අවලංගු කළ හැකි ගනුදෙනුව යටතේ එකී තැනැත්තා විසින් සැලකිය යුතු මුදලක් ගෙවා ඇති බව; හෝ

(ii) අවලංගු කළ හැකි ගනුදෙනුව (මේ ඡේදයේ කොන්දේසිය හැර) අත්කර ගැනීම සඳහා

වූ කොන්දේසි සපුරාලනු ඇතැයි එකී තැනැත්තා විශ්වාස නොකළ අතර, එම තැනැත්තාට එවැනි විශ්වාසයක් නොතිබීම සාධාරණ බව,

ඔප්පු කරන්නේ නම් අධිකරණය විසින් 416 වන වගන්තිය යටතේ එකී තැනැත්තාට එරෙහිව ආඥාවක් නොකළ යුතු ය.

(3) යම් තැනැත්තකු අවලංගු කළ හැකි ගනුදෙනුවක පාර්ශ්වකරුවකු හෝ අවලංගු කළ හැකි ගනුදෙනුව යටතේ අර්ථලාභියා නොවන්නේ නම්, එම තැනැත්තා විසින් -

(අ) සද්භාවයෙන් ; සහ

(ආ) වටිනා ප්‍රතිෂ්ඨාවක් සඳහා,

අත්කරගනු ලැබ ඇති දේපළ සම්බන්ධයෙන් එකී තැනැත්තාට ඇති අයිතිය කෙරෙහි බලපාන ආඥාවක් අධිකරණය විසින් නොකළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා ණයකරුගේ සම්බන්ධිත පාර්ශ්වයක් වන අවස්ථාවක දී, ඊට පටහැනිව ඔප්පු කරන්නේ නම් මිස, තැනැත්තා සද්භාවයෙන් නොව වෙනත් ආකාරයකින් දේපළ අත්පත් කර ගත් බව උපකල්පනය කළ යුතු ය.

අඩු අගයක ගනුදෙනුව

**418.** (1) මෙම වගන්තියෙහි-

(අ) "අදාළ කළ හැකි ගනුදෙනුව" යන්නෙන්, ණයකරු පාර්ශ්වකරුවකු වූ හෝ පාර්ශ්වකරුවකු වන, ලැබුම්කරුවකු සමඟ වන ගනුදෙනුවක් අදහස් වේ;

(ආ) "අතිරික්තය" යන්නෙන්, අදාළ ගනුදෙනුවක් යටතේ ලැබුම්කරුට ණයකරුගෙන් ලැබුණු අගය, අදාළ ගනුදෙනුව යටතේ ලැබුම්කරුගෙන් ණයකරුට ලැබුණු අගය ඉක්මවන ප්‍රමාණය (ඇත්නම්), අදහස් වේ; සහ

(ඇ) "ලැබුම්කරු" යන්නෙන්, ණයකරුගෙන් අගය ලැබූ තැනැත්තකු අදහස් වේ.

(2) අදාළ ධුර දරන්නා විසින්, නියම කළ හැකි කාර්යපටිපාටිය අනුගමනය කරමින්, පහත දැක්වෙන අවස්ථාවල දී, එනම්:-

(අ) අවස්ථාවෝචිත පරිදි, ණයකරුගේ බංකොලොත්භාවය, අද්මිනිස්ත්‍රාසි කිරීම හෝ ඈවර කිරීම ආරම්භ කළ දිනට පෙරාතුව ම වසර දෙකක කාලය තුළ ණයකරු අදාළ ගනුදෙනුවට ඇතුළු වී ඇති අවස්ථාවක දී;

(ආ) (i) අදාළ ගනුදෙනුවට ඇතුළු වූ විට ණයකරු වස්තුභංගත්වයට පත්ව සිටීම; හෝ

(ii) අදාළ ගනුදෙනුවට ඇතුළු වූ නිසා ණයකරු වස්තුභංගත්වයට පත්වීම යන්නෙන් කවර හෝ අවස්ථාවක දී;

(ඇ) ණයකරුගේ දේපළෙහි වටිනාකම සලකා බැලීමේ දී, අතිරික්තය සැලකිය යුතු මුදලක් වන අවස්ථාවක දී; සහ

(ඈ) (3) වන උපවගන්තියේ සඳහන් කර ඇති කොන්දේසි දෙකෙන් එකක් හෝ කොන්දේසි දෙකම හෝ, සපුරා නැති අවස්ථාවක දී

ලැබුම්කරුගෙන් අතිරික්තයන් අය කර ගනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ සඳහන් කොන්දේසි වනුයේ -

(අ) අදාළ ගනුදෙනුව අතේ දුරකින් සිදු වීම; සහ

(ආ) ණයකරු එම ගනුදෙනුවට සද්භාවයෙන් ඇතුළත් වීම,

වේ.

(4) අඩු අගයක ගනුදෙනුවක් යනු මෙම වගන්තිය යටතේ අතිරික්තයක් අය කර ගැනීමට යටත් වනු ලබන ගනුදෙනුවකි.

**419.** (1) සමාගමක අද්මිනිස්ත්‍රාසි කිරීම, ඔප්පු අද්මිනිස්ත්‍රාසි කිරීම හෝ ඈවර කිරීම අතරතුර , සම්බන්ධ පාර්ශ්වයක් විසින් සමාගමේ මුදල් හෝ වෙනත් දේපළ වැරදි ලෙස අදාළ කරගෙන ඇති බව හෝ රඳවා තබා ගෙන ඇති බව හෝ එකී දේපළ හෝ මුදල්, හෝ සඳහා වගකිව යුතු බව හෝ සමාගම

අනීතිකරණය

දේපළ සම්බන්ධයෙන් නොසැලකිලිමත්කම, පැහැර හැරීම හෝ කාර්යභාරය හෝ විශ්වාසය කඩකිරීම පිළිබඳව වරදකරු බව අධිකාරිය හෝ අධිකරණය සලකන්නේ නම්, අදාළ නිලධරයකුගේ, ණයහිමියකුගේ, සහදායකයකුගේ, නිල දේපළ භාරගැනුම්කරුගේ, අධිකාරියේ හෝ වෙනත් උනන්දුවක් දක්වන තැනැත්තකුගේ ඉල්ලීම මත අධිකරණය විසින් -

(අ) අදාළ පාර්ශ්වයේ ක්‍රියා කලාපය පිළිබඳව පරීක්ෂණයක් කරනු ලැබිය හැකි ය; සහ

(ආ) (i) මුදල් ප්‍රමාණය හෝ යම් දේපළක් හෝ එහි යම් කොටසක් සහ අධිකරණය සුදුසු යැයි සලකන පොලී අනුපාතය අනුව පොලිය ද ආපසු ගෙවන ලෙස එම තැනැත්තාට ආඥාවක් කරනු ලැබිය හැකි ය;

(ii) සමාගමට වන්දි ගෙවීමක් වශයෙන්, එම අධිකරණය විසින් සුදුසු යැයි සලකනු ලබනු මුදලක් සමාගමේ දේපළවලට සහදානය කරන ලෙස එම තැනැත්තාට ආඥාවක් කරනු ලැබිය හැකි ය;

(iii) ඉල්ලීම ණයහිමියා විසින් කරනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තාට මුදල් හෝ වෙනත් දේපළක් හෝ එහි යම් කොටසක් අධිකරණය සුදුසු යැයි සලකනු ලබන අනුප්‍රමාණයක පොලිය සමඟ ණයහිමියාට හෝ ණයහිමියන්ට ගෙවීමට හෝ පැවරීමට ආඥාවක් කළ හැකි ය; හෝ

(iv) අවශ්‍ය පරිදි වෙනත් යම් ආඥාවක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මුදල් ගෙවීම සඳහා වන ආඥාවක් 89 වන වැනි වගන්තියේ කාර්ය සඳහා අවසාන තීන්දුවක් ලෙස සැලකිය යුතු ය.

(3) සමාගමේ අද්මිනිස්ත්‍රාසිකරුවකු, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු, ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු

ලෙස ක්‍රියා කර ඇති තැනැත්තකු සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් අධිකරණයේ අවසරය ඇතිව මිස සහ 258 වන හෝ 357 වන වගන්ති යටතේ එම තැනැත්තා මුදාහැරීමෙන් පසුව මිස, ඉදිරිපත් නොකළ යුතු ය.

**420.** 412, 413, 414, 415,416,417, 418 සිට 419 වන වගන්තිවල කාර්ය සඳහා- නිර්වචන

(අ) "සම්බන්ධිත පාර්ශ්වයේ සමාලෝචන කාලසීමාව" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි, ණයකරුගේ බංකොලොත්භාවය, අද්මිනිස්ත්‍රාසිකරණය හෝ ඈවර කිරීම ආරම්භ වන දිනට පෙරාතුව වූ වසර දෙකක කාලසීමාව අදහස් වේ;

(ආ) "දීර්ඝ කරන ලද සමාලෝචන කාලය" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි ණයකරුගේ බංකොලොත්භාවය, අද්මිනිස්ත්‍රාසිකරණය හෝ ඈවර කිරීම ආරම්භ වන දිනට පෙරාතුවම වූ වසර පහක කාලසීමාව අදහස් වේ;

(ඇ) "අදාළ ධුර දරන්නා" යනු -

(i) බංකොලොත්භාවය පිළිබඳව වූ විට බංකොලොත් භාරකරු ද;

(ii) අද්මිනිස්ත්‍රාසි කිරීමක දී අද්මිනිස්ත්‍රාසිකරු ද;

(iii) ඈවර කිරීමක දී ඈවරකරු; සහ

(iv) සමාගමක ඔප්පු වැඩපිළිවෙළක් ක්‍රියාත්මකව පවතින විට වස්තුභංගත්ව වෘත්තිකයකු හෝ ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු ද අදහස් වේ; සහ

(ඈ) "සම්මත සමාලෝචන කාලසීමාව" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි අදහස් වන්නේ ණයකරුගේ බංකොලොත්භාවය, අද්මිනිස්ත්‍රාසි කිරීම හෝ ඈවර කිරීම ආරම්භ වන දිනට පෙරාතුවම වූ මාස හයක කාලසීමාව අදහස් වේ.

(2) 412 වන සහ 418 වන වගන්තිවල කාර්යය සඳහා "ගනුදෙනුව" යන්නෙන්, ණයකරුගේ පහත සඳහන් යම් පියවරක්, එනම් -

(අ) ණයකරුගේ දේපළ ලියා පැවරීම හෝ පැවරීම;

(ආ) ණයකරුගේ දේපළ මත බැඳියාවක් ලබා දීම;

(ඇ) පිළිබැඳීමක් උපචිත වීම;

(ඈ) ඇස්කීසි කිරීමක් හෝ වෙනත් නීතිමය ක්‍රියාවලියක් සිදු කිරීම හෝ ආපදා මුදල් අය කිරීම;

(ඉ) මුදල් ගෙවීම; සහ

(උ) (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) යන ඡේද එකක හෝ කිහිපයක කාර්යය සඳහා සිදුකරන ලද හෝ නොකර හරින ලද යම් දෙයක්,

අදහස් වේ.

## 3 වන පරිච්ඡේදය

### ෆීනික්ස් සමාගම්

**421.** (1) මේ පරිච්ඡේදයේ — ෆීනික්ස් සමාගම

"අසාර්ථක සමාගමක අධ්‍යක්ෂවරයා" යන්නෙන්, සමාගමක් ඇවර කිරීම ආරම්භ කළ දිනට පෙරාතුවම වූ මාස දොළහක කාලසීමාව තුළ කවර හෝ අවස්ථාවක දී අසාර්ථක වූ සමාගමක අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කළ තැනැත්තකු අදහස් වේ;

"අසාර්ථක සමාගම" යන්නෙන්, ඇවර කිරීමට භාජනය වූ සමාගමක ඇවර කිරීම සම්බන්ධයෙන්, 302 වන වගන්තිය අදාළ නොවූ හෝ එම වගන්තිය අදාළ වීම අවසන් වූ සමාගමක් අදහස් වේ;

"ෆීනික්ස් සමාගම" යන්නේ, අසාර්ථක වූ සමාගමක් සම්බන්ධයෙන් වන විට අසාර්ථක වූ සමාගම ඇවර කිරීම ආරම්භවීමට පෙර කවර හෝ අවස්ථාවක දී හෝ, එසේ ආරම්භ වී වසර පහක් ඇතුළත හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් කාලසීමාවක් ඇතුළත අසාර්ථක වූ සමාගම ඇවර කිරීමට පෙර

එම අසාර්ථක වූ සමාගමට තිබූ නමින් හෝ වෙනත් සමාන නමකින් එකී සමාගම සංස්ථාගත කර ඇති හෝ නම වෙනස් කර ඇති සමාගමක් අදහස් වේ;

"ඈවර කිරීමට පෙර නම" යන්නෙන්, යම් සමාගමක් ඈවර කිරීම ආරම්භ කළ දිනට පෙරාතුව ම වූ මාස දොළහක කාලය තුළ යම් අසාර්ථක වූ සමාගමක එකී සමාගමේ (වෙළඳ නාමය ඇතුළුව) කවර හෝ නමක් අදහස් වේ;

"සමාන නම" යන්නෙන්, අසාර්ථක වූ සමාගමක් සමඟ ආශ්‍රිත බව සාධාරණ ලෙස පෙන්නුම් කරන පරිදි එකී අසාර්ථක සමාගමේ පූර්ව ඈවර කිරීමේ නමට බෙහෙවින් සමාන වූ නමක් අදහස් වේ.

(2) අධිකරණයේ අවසරය ඇතිව මිස හෝ 423 වන, 424 වන හෝ 425 වන වගන්තියේ ව්‍යතිරේක අදාළ වන්නේ නම් මිස, අසාර්ථක සමාගමක අධ්‍යක්ෂවරයකු අසාර්ථක වූ සමාගම ඈවර කිරීම ආරම්භ කිරීමෙන් පසු වසර පහක කාලයක් සඳහා -

(අ) ෆීනික්ස් සමාගමක අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු නොකළ යුතු ය;

(ආ) ෆීනික්ස් සමාගමක් පිහිටුවීම හෝ ප්‍රවර්ධනය කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා සහභාගි නොවිය යුතු ය හෝ සම්බන්ධ නොවිය යුතු ය; හෝ

(ඇ) අසාර්ථක වූ සමාගමේ පූර්ව ඈවර කිරීමේ නමක් හෝ ඒ හා සමාන නමක් ඇති ව්‍යාපාරයක් කරගෙන යාමට සහභාගී වීම හෝ සම්බන්ධ වීම නොකළ යුතු ය.

(3) (2) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු වරදක් කරනු ලබන්නේ ය.

පුද්ගලික වගකීම

**422.** (1) 421වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදයට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු ෆීනික්ස් සමාගමේ අදාළ සියලු ණය සඳහා පුද්ගලිකව වගකිව යුතු ය.

(2) ෆීනික්ස් සමාගමක කළමනාකාරිත්වය හා සම්බන්ධ (මේ "A" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු පහත වගන්තියේ දැක්වෙන අවස්ථාවල දී, සමාගමේ අදාළ සියලුම ණය

සඳහා පුද්ගලිකව වගකිව යුතු ය. එනම් :-

(අ) සමාගමේ කළමනාකාරිත්වය තුළ දී, (මේ වගන්තියේ “B” යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තාගේ උපදෙස් මත A යන තැනැත්තා ක්‍රියා කරන්නේ නම් හෝ එසේ ක්‍රියා කිරීමට කැමති නම්; සහ

(ආ) එම අවස්ථාවේ දී සමාගමට අදාළව 421 වන වගන්තියේ 2 වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය B තැනැත්තා උල්ලංඝනය කරන බව A දන්නේ නම් දනී නම්.

(3) මෙම වගන්තියෙහි -

(අ) (1) වන උපවගන්තියේ අදාළ ණය යන්නෙන්, වගකීමට යටත් තැනැත්තා ෆීනික්ස් සමාගමේ කළමනාකාරිත්වයට සහභාගී වී සිටිය දී ෆීනික්ස් සමාගමට උපචිත වූ ණය සහ වෙනත් බැරකම් අදහස් වන අතර, ඒ අවස්ථාවේ ෆීනික්ස් සමාගම අසාර්ථක වූ සමාගමේ පූර්ව ඇවර කිරීමේ නමකින් හෝ ඒ හා සමාන නමකින් හඳුන්වනු ලැබ තිබිය යුතු ය; සහ

(ආ) (2) වන උපවගන්තියේ අදාළ ණය යන්නෙන්, B යන අයගේ උපදෙස් මත A ක්‍රියාකරමින් සිටි හෝ එසේ කිරීමට කැමැත්තෙන් සිටි අවස්ථාවේ ෆීනික්ස් සමාගමට උපචිත වූ ණය සහ වෙනත් බැරකම් අදහස් වන අතර, ෆීනික්ස් සමාගම අසාර්ථක සමාගමේ පූර්ව ඇවර කිරීමේ නමකින් හෝ ඒ හා සමාන නමකින් හඳුන්වනු ලැබ තිබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ වූ යම් වගකීමක් එක්ව හා වෙන් වෙන්ව වූ වගකීමක් විය යුතු ය.

(5) මෙම වගන්තියේ කාර්යය සඳහා, සමාගමක කළමනාකාරිත්වයට සම්බන්ධ (මේ වගන්තියේ “C” යනුවෙන් සඳහන් කරනු ලබන) නමැති තැනැත්තකු අදාළ අවස්ථාවේ,

(2) වන උපවගන්තිය උල්ලංඝනය කරන තැනැත්තකු බවට ඔහු විසින් හඳුනාගෙන සිටි (මේ වගන්තියේ "D" යනුවෙන් සඳහන් කරනු ලබන) නමැති තැනැත්තකුගේ උපදෙස් මත ක්‍රියා කර ඇති විටෙක පටහැනිව ඔප්පු කළහොත් මිස, C යන තැනැත්තා කවර හෝ පසු අවස්ථාවක දී, D යන තැනැත්තාගේ උපදෙස් මත ක්‍රියා කිරීමට කැමැත්තෙන් සිටි බවට පූර්ව නිගමනය කරනු ලැබේ.

අනුප්‍රාප්තික සමාගම් නිවේදනයේ නම් කර ඇති තැනැත්තකු සඳහා ව්‍යාතිරේකය

**423.** (1) යම් අනුප්‍රාප්තික සමාගමක දැන්වීමක නම් කරන ලද තැනැත්තකු සම්බන්ධයෙන් 421 වන වගන්තිය අදාළ නොවිය විය යුතු ය.

(2) අනුප්‍රාප්තික සමාගමක් යන්නෙන්, අද්මිනිස්ත්‍රාසිකරුවකු, ඈවරකරුවකු හෝ දේපළ භාර ගැනුම්කරුවකු විසින් සාදනු ලබන වැඩපිළිවෙළක් යටතේ හෝ සමාගම් ඔප්පු වැඩපිළිවෙළක් යටතේ අසාර්ථක සමාගමක ව්‍යාපාරය සම්පූර්ණයෙන් හෝ සැලකිය යුතු කොටසක් අත්කර ගනු ලබන සමාගමක් අදහස් වේ.

(3) අනුප්‍රාප්තික දැන්වීමක් යනු -

(අ) අසාර්ථක වූ සමාගමේ එක් එක් දන්නා ණයහිමියකුට අනුප්‍රාප්තික සමාගම විසින් දෙනු ලබන;

(ආ) (2) වන උපවගන්තියේ සඳහන් ව්‍යාපාරය අත්පත් කර ගැනීම සඳහා වූ වැඩපිළිවෙළකින් පසුව මාසයක් ඇතුළත එම ණයහිමියන්ට ලබා දෙනු ලබන;

(ඇ) එම දැන්වීමෙහි -

(i) අසාර්ථක වූ සමාගමේ නම සහ ලියාපදිංචි අංකය නිශ්චිතව සඳහන් කරනු ලබන;

(ii) අනුප්‍රාප්තික සමාගම විසින් ව්‍යාපාර කටයුතු අත්කරගෙන ඇති අවස්ථානුගත කරුණු නිශ්චිතව සඳහන් කරනු ලබන;

(iii) එම ව්‍යාපාරය කරගෙන යාම සඳහා අනුප්‍රාප්තික සමාගම උපකල්පනය කරන ලද හෝ උපකල්පනය කිරීමට යෝජනා කරනු ලැබූ නම;

(iv) එම ව්‍යාපාරය කරගෙන යාම සඳහා අනුප්‍රාප්තික සමාගම විසින් සිදු කර ඇති හෝ සිදු කිරීමට යෝජිත නමෙහි යම් වෙනස් කිරීමක් සහ;

(ඈ) නිවේදනයේ නම් කර ඇති තැනැත්තකු සම්බන්ධයෙන් -

(i) එකී තැනැත්තාගේ සම්පූර්ණ නම සඳහන් වූ;

(ii) අසාර්ථක වූ සමාගමේ අධ්‍යක්ෂවරයාගේ කාලසීමාව කොපමණ ද යන්න සඳහන් වූ;

(iii) අසාර්ථක වූ සමාගමේ කළමනාකාරිත්වය කෙරෙහි එකී තැනැත්තාගේ සහභාගිත්වයේ ප්‍රමාණය සඳහන් වූ,

ලිඛිත දැන්වීමක් වේ.

තාවකාලික කාලසීමාව සඳහා නිදහස් කිරීම

**424.** (1) යම් තැනැත්තකු, අසාර්ථක සමාගමේ ඈවර කිරීම ආරම්භ කිරීමෙන් පසු වැඩ කරන දින පහක් ඇතුළත අදාළ තහනම් කිරීමෙන් එම තැනැත්තා නිදහස් කරන ලෙස ඉල්ලා යම් ආඥාවක් ලබා ගැනීම පිණිස යම් තැනැත්තකු විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලබන්නේ නම්, එකී තැනැත්තා (2) වන උපවගන්තියේ සඳහන් තාවකාලික කාලසීමාව සඳහා 421 වන වගන්තියේ ඇතුළත් තහනමක් උල්ලංඝනය නොකරන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් තාවකාලික කාලසීමාව යනු අසාර්ථක වූ සමාගම ඈවර කිරීම ආරම්භ කළ දින සිට ආරම්භ වී -

(අ) අධිකරණය විසින් නිදහස් කිරීමේ ආඥාවක් නිකුත් කරන දිනයෙන්; හෝ

(ආ) ඊට පෙර වුවහොත්, ඈවර කිරීම ආරම්භ කිරීමෙන් පසු වැඩ කරන දින තිහක් අවසන් වන දිනයෙන්,

අවසන් වන කාලසීමාව වන්නේ ය.

අක්‍රීය නොවන සමාගමක් සම්බන්ධයෙන් ව්‍යතිරේකය

**425.** (1) 421 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල ඇති තහනම් කිරීම් අසාර්ථක වූ සමාගමේ පූර්ව ඇවර කිරීමේ නාමය හෝ එකී නාමයට සමාන නමකින් හෝ නම්වලින් හැඳින්වෙන ෆීනික්ස් සමාගමක් සම්බන්ධයෙන් පහත අවස්ථාවල දී, එනම් -

(අ) ඇවර කිරීම ආරම්භ කළ දිනට පෙරාතුව ම වූ අවම වශයෙන් මාස දොළහක කාලයක් සඳහා එම නම හෝ එම නම්වලින් එම සමාගම හඳුන්වා දී තිබෙන අවස්ථාවක දී; සහ

(ආ) එම මාස දොළහක කාලයක් තුළ එම සමාගම කිසිදු අවස්ථාවක අක්‍රීයව නොතිබුණේ නම්,

අදාළ නොවිය යුතු ය.

(2) සමාගම් පනතේ 148 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ යම් සමාගමක ගිණුම් වාර්තාවල සටහන් කළ බවට නියමිත යම් ගනුදෙනු යම් මාස දොළහක කාලය තුළ සටහන් වී ඇත්නම්, එම කාලය තුළ සමාගම අක්‍රීයව නොපැවති බවට (1) වන උපවගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබේ.

4 වන පරිච්ඡේදය

**ණය , හිලව් කිරීම, බෙදා හැරීම් සහ ලේඛන යැවීම පිළිබඳ සාක්ෂි**

*අ - ණය පිළිබඳ සාක්ෂි සහ ණය ඔප්පු කිරීම*

ණය පිළිබඳ සාක්ෂි සහ ණය ඔප්පු කිරීම

**426.** (1) මෙම වගන්තියෙහි, “ණය” යන්නෙන් -

(අ) අදාළ දිනයේ දී ණයකරු යටත් වන යම් ණයක්;

(ආ) අදාළ දිනයට පෙර උපචිත වූ බැඳීමක් හේතුවෙන් අදාළ දිනට පසුව ණයකරු යටත් විය හැකි යම් ණයක්; සහ

(ඇ) (8) වන උපවගන්තියට අනුකූලව සාධනය කළ හැකි යම් පොලියක්,

අදහස් වේ.

(2) යම් ණයක් සම්බන්ධයෙන් හෝ නියම කළ හැකි වෙනත් යම් කාර්යය සඳහා ඡන්දය දීමට හෝ බෙදා හැරීමකට,

හිමිකම්පෑමට අදහස් කරනු ලබන යම් ණයහිමියකු විසින් -

(අ) මෙම පනත හෝ ඒ යටතේ සාදන ලද යම් ආඥාවක් අන්‍යාකාරයෙන් විධිවිධාන සලසා ඇත්නම් හෝ අධිකරණය අන්‍යාකාරයකට ආඥාවක් කර ඇත්නම්; හෝ

(ආ) 302 වන වගන්තිය, සමාගමට අදාළ වන අතර, එවිට ඇවරකරු විසින් යම් සාක්ෂියක් ඉදිරිපත් කරනු ලබන, ලාභ නියම කර ඇත්නම් නම් මිස, ණයහිමියා සාක්ෂියක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවන්නේ නම්; හෝ

මිස, ණය පිළිබඳ සාක්ෂියක් ඉදිරිපත් කළ යුතු ය.

(3) ණය පිළිබඳ සාක්ෂියක් -

(අ) නියම කළ හැකි ආකාරයෙන් සහ එවැනි අවස්ථාවල දී හෝ එවැනි වේලාවක දී කැඳවනු ලැබිය යුතු ය;

(ආ) නියම කළ හැකි එවැනි තත්ත්වයන් තුළ, ඉදිරිපත් කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) නියම කරනු ලැබිය හැකි ආකාරයට සහ නියම කරනු ලැබිය හැකි කාලසීමාවක් තුළ ඉදිරිපත් කළ යුතු ය; සහ

(ඇ) නියම කළ හැකි පරිදි එහි අන්තර්ගතය ඇතුළුව වෙනත් යම් අවශ්‍යතාවලට අනුකූල විය යුතු ය.

(4) නියම කළ හැකි පරිදි, ඇතුළත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ දැනුම්දීම මත, යම් කාලසීමාවක් තුළ, යම් ආකාරයකින් ණය පිළිබඳ සාක්ෂි සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ හැකි ය.

(5) එයට අදාළව (4) වන උපවගන්තිය යටතේ ණය පිළිබඳ සාක්ෂියක් පිළිගැනීමට තීරණයක් ගත් විට ණයක් ඔප්පු වේ.

(6) (අ) ණයක් සාධනය කිරීම පිළිබඳ සාක්ෂි -

(i) පොලිය සහිත ණයවලට අදාළ වන අවස්ථාවක දී;

(ii) වෙළඳ වට්ටම් හෝ වෙනත් අදාළ වට්ටම්වලට සම්බන්ධ ණයක් සම්බන්ධයෙන් අදාළ වන අවස්ථාවක දී;

(iii) එම ණය මුදල විදේශ ව්‍යවහාර මුදලකින් උපචිතව ඇති හෝ ගෙවිය යුතු අවස්ථාවක දී;

(iv) එම ණය මුදල අනාගත කාලයක දී ගෙවිය යුතු අවස්ථාවක දී;

(v) එම ණය මුදල කුලී හෝ කාලීන ස්වභාවයේ වෙනත් ගෙවීමකට අදාළ වන අවස්ථාවක දී;

(ආ) ණය පිළිබඳ සාක්ෂියක් සමාගමක සහදායකයකුට කරන ඇරයුමක් ලෙස ණයකරුට ඇති බැරකමට අදාළ වන අවස්ථාවක දී;

(ඇ) (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ණය පිළිබඳ සාක්ෂියක් ඉදිරිපත් කර ඇති බව සලකනු ලබන අවස්ථාවක දී;

(ඇ) ණය පිළිබඳ සාක්ෂියක් හදිසි අවස්ථාවකට හෝ නැතහොත් හානි වන්දි ගෙවීමට යටත් වන අවස්ථාවක දී; හෝ

(ඉ) වෙනත් යම් හේතුවක් නිසා ණය ඔප්පු කිරීමේ ප්‍රමාණය අවිනිශ්චිත වන අවස්ථාවක,

ආවේශ්‍ය කළ හැකි, සාධනය වූ ණය ප්‍රමාණය නියම කරනු ලැබිය හැකි ආකාරයට තීරණය කළ යුතු ය.

(7) ඇවර කිරීමක දී -

(අ) ස්ථිර ඇපයක් ලබා දෙන්නාට එම ඇපය සම්බන්ධයෙන් අටවන උපලේඛනයේ 1 වන ඡේදයේ සඳහන් විකල්ප තිබිය යුතු ය; සහ

(ආ) එම විකල්පයන් ක්‍රියාත්මක කිරීම එම උපලේඛනයේ විධිවිධාන මගින් පාලනය වේ.

(8) (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් ණය සඳහා අදාළ දිනය දක්වා වන නමුත් එකී දිනය හැර, පොලිය ඔප්පු කළ හැකි විය යුතු අතර, නියම කළ හැකි ආකාරයට ගණනය කළ යුතු ය.

(9) ණය පිළිබඳ සාධනය කිරීමක් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ගත් තීරණයක් ගැන යම් උනන්දුවක් දක්වන තැනැත්තකු සෑහීමට පත් නොවන අවස්ථාවක දී, එම තැනැත්තාට එම තීරණයට එරෙහිව නියම කරනු ලැබිය හැකි ආකාරයට එවැනි කාලයක් ඇතුළත අභියාචනය කිරීමට ඇති චේතනාව පිළිබඳව දැනුම්දීම සඳහා වන නියම කරනු ලැබිය හැකි යම් අවශ්‍යතාවන් සහිතව අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(10) නියම කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව සහ එවැනි ආකාරයෙන් ණය පිළිබඳ සාක්ෂියක් ඉල්ලා අස්කර ගැනීම හෝ වෙනස් කිරීම කළ හැකි ය.

(11) ණයහිමියකු විසින් නියම කළ හැකි කොන්දේසිවලට යටත්ව සහ එවැනි ආකාරයෙන් ණය සාධනය කිරීමක් සඳහා ආධාරක ලේඛන ඉදිරිපත් කරන ලෙස ණයහිමියකුට නියම කරනු ලැබිය හැකි ය.

(12) නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් නියම කරනු ලබන වේලාවන් සහ ස්ථානවල දී යම් තැනැත්තන්ට ණය සාධනය කිරීම පරීක්ෂා කිරීම සඳහා අවසර දෙනු ලැබේ.

(13) අධිකරණය අන්‍යාකාරයකට ආඥාවක් ලබා දෙන්නේ නම් මිස, ණය සාධනය කිරීමේ පිරිවැය ණයහිමියා විසින් දැරිය යුතු ය.

(14) (අ) යම් වැදගත් කරුණක් පිළිබඳව වූ සාවද්‍ය හෝ නොමඟ යවනසුලු ණය පිළිබඳ සාක්ෂියක්, එය සාවද්‍ය හෝ නොමඟ යවනසුලු බව දැන දැන ම, සාදනු ලබන හෝ සෑදීම අනුමත කරනු ලබන; හෝ

(ආ) යම් අත්හැරීමක් මගින් ණය සාධනය කිරීම යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ

නොමඟ යවනසුලු වන බව දැන දැනම යම් කරුණක් හෝ කාරණයක් යම් ණය සාධනය කිරීමකින් අත්හරින හෝ අත් හැරීමට අවසර දෙන,

යම් තැනැත්තකු වරදක් කරනු ලබන්නේ ය.

*ආ - හිලව් කිරීම*

බංකොලොත් ණයකරුවකු සහ වෙනත් පාර්ශ්වයක් අතර හිලව් කිරීම

**427.** (1) (3) වන, (4) වන සහ (5) වන උපවගන්තිවලට යටත්ව, බංකොලොත් ණයකරුවකු සහ බංකොලොත්භාවය පිළිබඳ නඩුවක දී ණය පිළිබඳ සාක්ෂි පිළිගන්නා ලෙස හිමිකම් පෑමට අපේක්ෂා කරන හෝ මේ වගන්තිය ක්‍රියාත්මක කිරීම සඳහා බංකොලොත්භාවය පිළිබඳ නඩුවක දී ණය පිළිබඳ සාක්ෂි පිළිගන්නා ලෙස ඉල්ලා සිටීම තැනැත්තකු අතර අන්‍යෝන්‍ය බැර හෝ අන්‍යෝන්‍ය ණය හෝ වෙනත් අන්‍යෝන්‍ය ගනුදෙනු තිබුණ අවස්ථාවක දී; සහ

(අ) එම බැර, ණය හෝ ගනුදෙනු සම්බන්ධයෙන් එක් පාර්ශ්වයකින් අනෙක් පාර්ශ්වයට ලැබිය යුතු මුදල් පිළිබඳ ගිණුම් ලබා ගත යුතු ය;

(ආ) එක් පාර්ශ්වයකින් අය විය යුතු මුදලක් අනෙක් පාර්ශ්වයෙන් අය විය යුතු මුදලකට හිලව් කළ යුතු ය; සහ

(ඇ) ගිණුමේ ශේෂය පමණක් ඔප්පු කළ හැකි ණයක් ලෙස පිළිගනු ලැබීම හෝ බංකොලොත් බූදලයේ කොටසක් ලෙස බංකොලොත් භාරකරුට ගෙවිය යුතු බවට පිළිගැනීම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, අන්‍යෝන්‍ය බැර, අන්‍යෝන්‍ය ණය සහ වෙනත් අන්‍යෝන්‍ය ගනුදෙනුවලට -

(අ) බංකොලොත්භාවය ආරම්භ වීමෙන් පසුව හෝ -

(i) 81 වන වගන්තිය යටතේ බංකොලොත් ණයකරුට අදාළ බංකොලොත්භාවය

පිළිබඳ ඉල්ලුමක් විභාග වෙමින් පවතින බවට; හෝ

(ii) 85 වන වගන්තිය යටතේ බංකොලොත් ණයකරුට අදාළව බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමක් විභාග වෙමින් පවතින බවට,

අදාළ තැනැත්තා දැන ගැනීමෙන් පසු කවර හෝ අවස්ථාවක දී, උපචිත වූ පිළිබැඳීමකින් පැන නඟින ණය මුදලක් ඇතුළත් නොවිය යුතු ය;

(ආ) බංකොලොත්භාවය ආරම්භ වීමෙන් පසුව හෝ -

(i) 81 වන වගන්තිය යටතේ බංකොලොත් ණයකරුට අදාළ බංකොලොත්භාවයේ ඉල්ලීමක් මත වන නඩු කටයුතු පිළිබඳව එම තැනැත්තා දැන ගැනීමෙන් පසු; හෝ

(ii) 85 වන වගන්තිය යටතේ බංකොලොත් ණයකරුට අදාළව බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමක් පවතින බව එම තැනැත්තා දැන ගැනීමෙන් පසු,

කවර හෝ අවස්ථාවක දී ඇතුළත් වූ ගිවිසුමක් යටතේ පැවරීමකින් හෝ අන්‍යාකාරයකට එම තැනැත්තා අත්කරගත් යම් ණයක් ඇතුළත් නොවිය යුතු ය.

(3) මෙම වගන්තියේ කාර්ය සඳහා, 426 වන වගන්තිය යටතේ නියම කළ හැකි මුදල් නිශ්චය කිරීම පිළිබඳ රීති අදාළ විය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකුට බංකොලොත් ණයකරුගෙන් අය වීමට ඇති මුදල, වරණීය හිමිකම්පෑම් සහ වරණීය නොවන හිමිකම්පෑම් යන දෙවර්ගයකට ම ඇතුළත් වන අවස්ථාවක, එම තැනැත්තාගෙන් බංකොලොත් ණයකරුට අය වීමට ඇති ඇති මුදල (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ එම හිමිකම්පෑම්වලට එරෙහිව අනුප්‍රමාණ වශයෙන් හිලව් කළ යුතු ය.

සමාගමක් සහ වෙනත් පාර්ශ්වයක් අතර හිලව් කිරීම

**428.** (1) (3) වන, (4) වන සහ (5) වන යන උපවගන්තිවලට යටත්ව, සමාගමක් සහ ඈවර කිරීමක දී ණය පිළිබඳ සාක්ෂි පිළිගන්නා ලෙස ඉල්ලා සිටීමට අපේක්ෂා කරන හෝ මේ වගන්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ඈවර කිරීමක දී ණය පිළිබඳ සාක්ෂි පිළිගන්නා ලෙස ඉල්ලා සිටීමට අපේක්ෂා කරන තැනැත්තකු අතර, අන්‍යෝන්‍ය බැර, අන්‍යෝන්‍ය ණය හෝ වෙනත් අන්‍යෝන්‍ය ගනුදෙනුවක් පවතින අවස්ථාවක දී -

(අ) එම බැරකම්, ණය හෝ ගනුදෙනු සම්බන්ධයෙන් එක් පාර්ශ්වයකට අනෙක් පාර්ශ්වයෙන් අය වීමට ඇති මුදල සම්බන්ධයෙන් ගිණුම් ලබා ගත යුතු ය;

(ආ) එක් පාර්ශ්වයකින් අය විය යුතු මුදලක් එරෙහිව අනෙක් පාර්ශ්වයෙන් අය විය යුතු මුදලකට එරෙහිව හිලව් කළ යුතුය; සහ

(ඇ) ගිණුමේ ශේෂය පමණක් ඔප්පු කළ හැකි ණයක් ලෙස පිළිගනු ලැබීම හෝ සමාගමට ගෙවිය යුතු බවට පිළිගැනීම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, අන්‍යෝන්‍ය බැර, අන්‍යෝන්‍ය ණය සහ අනෙකුත් අන්‍යෝන්‍ය ගනුදෙනුවලට -

(අ) ඈවර කිරීම ආරම්භ කිරීමෙන් පසුව හෝ-

(i) 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඈවරකරුවකු පත් කිරීම සඳහා වූ යෝජනා සම්මතයක් සලකා බැලීම සඳහා සමාගමේ යම් රැස්වීමක් කැඳවා ඇති බවට;

(ii) 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඈවරකරුවකු පත් කිරීමේ යෝජනා සම්මතයක් සලකා බැලීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් කැඳවා ඇති බවට;

(iii) 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බවට; හෝ

(iv) 214 වන උපවගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඈවරකරුවකු පත් කිරීම සඳහා ණයහිමියන්ගේ යෝජනා සම්මතයක් පිළිබඳව; හෝ

එම තැනැත්තා දැන ගැනීමෙන් පසුව හෝ කවර හෝ අවස්ථාවක දී ඇතිවන බැඳීමකින් උපචිතවන ණය මුදලක් ඇතුළත් නොවිය යුතු ය.;

(ආ) ඈවර කිරීම ආරම්භ කිරීමෙන් පසුව හෝ:-

(i) 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඈවරකරුවකු පත් කිරීම සඳහා වූ යෝජනා සම්මතයක් සලකා බැලීම සඳහා වූ රැස්වීමක් කැඳවා ඇති බවට;

(ii) 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඈවරකරුවකු පත් කිරීම සඳහා වූ යෝජනා සම්මතයක් සලකා බැලීම සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් කැඳවා ඇති බවට;

(iii) 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බවට; හෝ

(iv) 214 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඈවරකරුවකු පත් කිරීම සඳහා වූ ණයහිමියන්ගේ යෝජනා සම්මතයක් පිළිබඳව;

ඒ තැනැත්තාට දැන ගැනීමට ලැබීමෙන් පසුව, හෝ කවර හෝ අවස්ථාවකදී ඇතුළත් වූ ගිවිසුමක් යටතේ පැවරීමකින් හෝ අන්‍යාකාරයකට එම තැනැත්තා අත්කරගත් යම් ණයක් ඇතුළත් නොවිය යුතු ය.

(3) (අ) කොටසක් නිකුත් කිරීම සඳහා වූ ප්‍රතිඥාව හෝ ප්‍රතිඥාවෙන් කොටසක් ලෙස; හෝ

(ආ) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ ඇවරකරු විසින් සහදායකත්වයේ බැරකමක් සම්බන්ධයෙන් වූ ඇමතුමක් ඉටු කිරීමේ දී,

සහදායකයකු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු මුදලට (1) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

(4) මෙම වගන්තියේ කාර්ය සඳහා, 426 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ නියම කළ හැකි මුදල් ප්‍රමාණයන් තීරණය කිරීම සඳහා වූ රීති අදාළ විය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තාට සමාගමෙන් අය විය යුතු මුදලකට වරණීය හිමිකම්පෑම් සහ වරණීය නොවන හිමිකම්පෑම් යන දෙවර්ගයම ඇතුළත් වන අවස්ථාවක, අදාළ තැනැත්තාගෙන් සමාගමට අය විය යුතු මුදල (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ එම හිමිකම්පෑම්වලට එරෙහිව අනුප්‍රමාණ වශයෙන් හිලව් කරනු ලැබිය යුතු ය.

## ඇ - බෙදා හැරීම්

බෙදා හැරීම

**429.** (1) මෙම වගන්තියේ, “බෙදා හැරීමේ නිලධරයා” යන්නෙන් -

(අ) බංකොලොත්භාවයක දී, බංකොලොත්භාවය පිළිබඳ භාරකරු;

(ආ) ඇවර කිරීමක දී, ඇවරකරු; සහ

(ඇ) දේපළ භාරගැනුම්කාරත්වයක දී, දේපළ භාරගැනුම්කරු

අදහස් වේ.

(2) බෙදා හැරීමේ නිලධරයකු විසින් බෙදා හැරීමක් කිරීමට යෝජනා කරන අවස්ථාවක දී, බෙදා හැරීමේ නිලධරයා විසින් යෝජිත බෙදා හැරීම පිළිබඳව නියම කරනු ලැබිය හැකි නියමයන්ට අනුකූලව-

(අ) (i) ප්‍රසිද්ධ දැන්වීමක් පළ කළ යුතු ය; සහ

(ii) එක් එක් ණයහිමියන්ට දැනුම් දිය යුතු ය;

(ආ) නියම කරනු ලැබිය හැකි අවස්ථානුගත කරුණුවලට යටත්ව දැන්වීම් ලබා දී ඇති යෝජිත බෙදා හැරීම කල් දමනු ලැබිය හැකි ය, නැතහොත් අවලංගු කරනු ලැබිය හැකි ය;

(ඇ) (i) ඉදිරිපත් කර නොමැති හෝ ප්‍රමාණය නිශ්චය කර නොමැති ණය පිළිබඳ සාක්ෂි සඳහා; සහ

(ii) එම ණය පිළිබඳ සාක්ෂි පිළිගැනීමට, අදාළ හෝ ප්‍රමාණය නිශ්චය කිරීමට අදාළ වියදම්,

පිළිබඳව බෙදා හැරීමේ නිලධරයා විසින් සුදුසු යයි සලකනු ලබන යම් විධිවිධාන සකස් කරනු ලැබිය හැකි ය.

(3) බෙදා හැරීමක් සිදු කිරීමෙන් පසු ණයහිමියාගේ ණය (පිළිබඳ සාක්ෂි) ඉදිරිපත් කර ඇති හෝ බෙදා හැරීමක් කිරීමෙන් පසු වැඩි කර ඇති අවස්ථාවක දී -

(අ) එම හේතුව මත දැනටමත් සිදු කර ඇති බෙදා හැරීමකට බාධා නොකළ යුතු ය;

(ආ) දේපළ විකිණීමෙන් ලැබෙන මුදල් ප්‍රමාණවත් නම් සහ එම ප්‍රමාණවත් වීමේ ප්‍රමාණයට, තවදුරටත් වූ බෙදාහැරීමක් තිබේ නම් එය කළ යුතු වන්නේ යයි බෙදාහැරීම් වල දී තෘප්ත කළ ණය හිමියන්ගේ ණය කොටස් ප්‍රමාණය, සමාන ශ්‍රේණිගත හිමිකම් සහිත අන් සියලු ණය හිමියන්ගේ ණය ප්‍රමාණයෙන් පූර්වයේ තෘප්ත කළ ප්‍රමාණයට සමාන වන පරිදි වේ.

(4) බෙදා හැරීමක් සිදු කිරීම පැහැර හැරීම සම්බන්ධයෙන් අලාභ මුදල් ගෙවීමට බෙදා හැරීමේ ධුර දරන්නකු යටත් නොවන නමුත් එවැනි ධුර දරන්නකු විසින් බෙදා හැරීමක් කිරීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී සහ උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවකු විසින් අධිකරණයට ඉදිරිපත් කරන ඉල්ලීමක් මත -

(අ) බෙදා හැරීම සිදු කරන ලෙස; සහ

(ආ) බෙදා හැරීමේ ධුර දරන්නාට අයත් මුදල්වලින් පහත දැක්වෙන මුදල්; එනම් -

(i) නියම කරනු ලබන යම් අනුප්‍රමාණ මත බෙදා හරින මුදලේ වටිනාකම හෝ ප්‍රමාණය මත වන පොළිය; සහ

(ii) ඉල්ලීම ඉදිරිපත් කිරීම වෙනුවෙන් ඉල්ලුම්කරුට දැරීමට සිදු වූ සාධාරණ පිරිවැය,

ගෙවන ලෙස, අධිකරණය විසින් බෙදා හරින නිලධරයාට ආඥාවක් කරනු ලැබිය හැකි ය.

*ඈ - ණයහිමියන්ට සහ ඉවත් වූ ණයහිමියන්ට ලේඛන යැවීම*

ණය හිමියන්ට හා ඉවත් වූ ණය හිමියන්ට ලේඛන යැවීම

**430.** (1) මෙම පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් මගින් යම් නිශ්චිත පංතියක ණයහිමියන් ඇතුළු ණයහිමියන්ට ලේඛනයක් යැවීමට ධුර දරන්නාට නියම කර ඇති අවස්ථාවක-

(අ) පනත හෝ නියෝගය මගින් අන්‍යාකාරයකට විධිවිධාන සලසා ඇත්නම් මිස; හෝ

(ආ) අධිකරණය විසින් අන්‍යාකාරයකට ආඥාවක් ලබා දී ඇත්නම් මිස,

ඉවත් වූ ණයහිමියන්ට හැර ධුර දරන්නා ලිපිනය දන්නා වූ සියලු ණයහිමියන්ට ලේඛන යැවීම මගින් එකී අවශ්‍යතාවය පිළිපැදීම සිදු වන්නේ ය.

(2) යම් ණයහිමියකු හට ඕනෑම අවස්ථාවක, සහ යම් හේතුවක් මත, නියම කරනු ලැබිය හැකි ආකාරයේ ලිඛිත දැනුම් දීමක් ධුර දරන්නකු හට ලබා දීමෙන් ඉවත් වූ ණයහිමියකු වීමට තෝරා ගැනීමක් කළ හැකි ය.

(3) ඉවත් වූ ණයහිමියකුට ඕනෑම අවස්ථාවක, සහ යම් හේතුවක් මත නියම කරනු ලැබිය හැකි ආකාරයේ ලිඛිත දැනුම් දීමක් ධුර දරන්නාට ලබා දීමෙන් ඉවත් වූ ණයහිමියකු බවට පත් වීම අවසන් කිරීමට තෝරා ගැනීමක් කළ හැකි ය.

(4) ධුර දරන්නා විසින් යම් ණයහිමියකු සමඟ කරනු ලබන පළමු ලිඛිත සන්නිවේදනයේ දී, ණයහිමියා හට-

(අ) ඉවත් වූ ණයහිමියකු වීමට තෝරා ගැනීමක් කළ හැකි බව; සහ

(ආ) ඉවත් වූ ණයහිමියකු වීම අවසන් කිරීම සඳහා පසුව තෝරා ගැනීමක් කළ හැකි බව,

නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් දැනුම් දිය යුතු ය.

(5) (අ) ධුර දරන්නා ධුර දැරීම අවසන් වූ අවස්ථාව දක්වා; සහ

(ආ) ණයහිමියන් ඉවත් වීමෙන් ඉල්ලා අස් වූ වේලාව දක්වා,

ණයහිමියා ඉවත්ව ගිය ණය හිමියකු ලෙස ධුර දරන්නා විසින් සලකනු ලැබිය යුතු ය.

(6) මෙම වගන්තියෙහි -

(අ) "ඉවත්ව ගිය වේලාව" යනු, (2) වන උපවගන්තිය යටතේ ණයහිමියා විසින් දැනුම් දීමෙන් පසුව, ණයහිමියා ඉවත්ව ගිය ණය හිමියකු ලෙස සැලකීමට ධුර දරන්නාට සාධාරණ ලෙස ප්‍රායෝගිකව මුලින්ම සැලකිය හැකි වේලාව අදහස් වේ;

(ආ) "ඉවත් වීමෙන් ඉල්ලා අස් වූ වේලාව" යන්නෙන්, (3) වන උපවගන්තිය යටතේ ණයහිමියකු විසින් දැනුම් දීමෙන් පසු, ණයහිමියා ඉවත්ව ගිය ණයහිමියකු වීම අවසන් වන බවට සැලකීමට ධුර දරන්නාට සාධාරණ ලෙස ප්‍රායෝගිකව මුලින්ම සැලකිය හැකි වේලාව අදහස් වේ; සහ

(ඇ) ධුරදරන නිලධරයා සම්බන්ධයෙන් වන විට "ඉවත්ව ගිය ණයහිමියා" යන්නෙන් -

(i) සමාගමේ ණයහිමියකු වූ;

(ii) (2) වන උපවගන්තිය යටතේ ධුර දරන්නාට දැන්වීමක් ලබා දී ඇත්තා වූ; සහ

(iii) (3) වන උපවගන්තිය යටතේ ධුර දරන්නාට දැනුම් දීමක් කර නොමැති,

තැනැත්තකු අදහස් වේ.

## XVI වන කොටස

### සාමාන්‍ය සහ විවිධ විධිවිධාන

### 1 වන පරිච්ඡේදය
### සාමාන්‍ය

වස්තුභංගත්ව ධාරක ගිණුම සහ වස්තුභංගත්ව අතිරික්ත ගිණුම

**431.** (1) අමාත්‍යවරයා විසින් කලින් කල අනුමත කරනු ලබන යම් බැංකුවක නිල දේපළ භාරගැනුම්කරු විසින් වස්තුභංගත්ව ධාරක ගිණුම යනුවෙන් හඳුන්වනු ලබන ගිණුමක් පවත්වාගෙන යා යුතු ය.

(2) කලින් කල අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක නිල දේපළ භාරගැනුම්කරු විසින් වස්තුභංගත්ව අතිරික්ත ගිණුම යනුවෙන් හඳුන්වනු ලබන ගිණුමක් පවත්වාගෙන යා යුතු ය.

හිමිකම් නොපාන ලද සහ අතිරික්ත මුදල් අදාළ කර ගැනීම

**432.** (1) මේ වගන්තියෙහි -

(අ) "හිමිකම් ඇති තැනැත්තා" දේපළ විකිණීමෙන් ලැබෙන මුදල් බෙදාහැරීම සම්බන්ධයෙන්, එම මුදල්වලට හිමිකම් ඇති තැනැත්තකු අදහස් වේ; සහ

(ආ) "ඔප්පු කර ඇති හිමිකම්පෑම" යන්නෙන්, නිල දේපළ භාරගැනුම්කරු සාධාරණ ලෙස සෑහීමට පත්වන ලෙස ඔප්පු කර ඇති හිමිකම්පෑමක් අදහස් වේ.

(2) බංකොලොත්භාවයේ දී, ඈවර කිරීමේ දී හෝ දේපළ භාරගැනුම්කාරිත්වයක දී දේපළ විකිණීමෙන් ලැබෙන මුදල් බෙදා හැරීමක් සිදු කරන අවස්ථාවක-

(අ) බෙදා හැරීම සිදු කළ දින සිට මාස දොළහකට වැඩි කාලයකට පසුව; හෝ

(ආ) ඊට පූර්වයෙන් වූ විට බංකොලොත්භාවය හෝ ඈවර කිරීම හෝ දේපළ භාර ගැනුම්කාරත්වය සම්බන්ධයෙන් 138 වන වගන්තිය යටතේ මුදාහැරීමේ නියෝගයක් නිකුත් කරන අවස්ථාවේ දී,

හිමිකම්පෑමකින් තොරව ඉතිරිව ඇති මුදල්, අවස්ථාවෝචිත පරිදි, බංකොලොත්භාවය පිළිබඳ භාරකරු, ඈවරකරු හෝ දේපළ භාරගැනුම්කරු විසින් නිල දේපළ භාරගැනුම්කරුට භාර දිය යුතු ය.

(3)බංකොලොත්භාවය පිළිබඳ භාරකරුවකුට, ඈවරකරුවකුට හෝ දේපළ භාරගැනුම්කරුට (2) උපවගන්තිය යටතේ සිදුකරන ලද භාරදීමක් සම්බන්ධයෙන් නිල දේපළ භාරගැනුම්කරු විසින් සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි එය බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට, ඈවරකරුට හෝ දේපළ භාරගැනුම්කරුට සාධනීය නිදහස් කිරීමක් වන්නේ ය.

(4) (2) වන උපවගන්තිය යටතේ ලබා ඇති සියලුම මුදල් නිල දේපළ භාරගැනුම්කරු විසින් පවත්වාගෙන යනු ලබන" වස්තුභංගත්ව ධාරක ගිණුම" යනුවෙන් හඳුන්වනු ලබන ගිණුමකට බැරකර එය ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් හෝ හිමිකම් ඔප්පු ඇති තැනැත්තකුගේ හිමිකම්පෑම තෘප්තිමත් වන ලෙස අදාළ කිරීම සඳහා තැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ නිල දේපළ භාරගැනුම්කරුට මුදල් ලැබී මාස දොළහක් ඉකුත් වීමෙන් පසු, නිල දේපළ භාරගැනුම්කරු විසින් [ (4) වන උපවගන්තිය යටතේ වූ යම් මුදල් යොදා ගැනීමකින් පසුව)] ඉතිරිවන මුදල් නිල දේපළ භාරගැනුම්කරුගේ “වස්තුභංගත්ව අතිරික්ත ගිණුමට” බැර කරනු ලැබිය යුතු ය.

(6) වස්තුභංගත්ව අතිරික්ත ගිණුමේ බැරට මුදලක් ඉතිරිව ඇත්නම්, එසේ ඉතිරිව ඇති ප්‍රමාණයට -

(අ) දේපළ විකිණීමෙන් ලැබෙන මුදල් (5) වන උපවගන්තිය යටතේ බැර කරනු ලැබ ඇතිවිට අදාළ කිරීම හෝ හිමිකම් ඇති තැනැත්තකුගේ ඔප්පුකර ඇති හිමිකම්පෑම තෘප්තිමත් කිරීම සඳහා හෝ අදාළ කරගත යුතු ය;

(ආ) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසි කිරීමේ නඩු කටයුතු පිළිබඳ වියදම් පියවීමට ණයකරුගේ බූදලය ප්‍රමාණවත් නොවේ නම් ඒ සඳහා ඉහත කී ගිණුමේ ඇති මුදල් යොදාගනු ලැබිය යුතු ය.

(7) වස්තුභංගත්ව අතිරික්ත ගිණුමේ බැරට ඇති යම් මුදලක් නියම කරනු ලබන්නේ නම්, නියම කරනු ලබන නියමයන්ට අනුකූලව ආයෝජනය කරනු ලැබිය හැකි ය. එම ආයෝජනවලින් ලැබෙන ආදායම වස්තුභංගත්ව අතිරික්ත ගිණුමට වහාම බැර කරනු ලැබිය යුතු ය.

(8) (4) වන උපවගන්තිය හෝ (6) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ හිමිකම් ඇති තැනැත්තකුට වස්තුභංගත්ව ධාරක ගිණුමෙන් හෝ වස්තුභංගත්ව අතිරික්ත ගිණුමෙන් මුදල් ගෙවා ඇති විට, එම මුදල් සඳහා පසුව හිමිකම්පාන තැනැත්තකුට එකී මුදල සම්බන්ධයෙන් වස්තුභංගත්ව ධාරක ගිණුමෙන් හෝ වස්තුභංගත්ව අතිරික්ත ගිණුමෙන් මුදල් ලබා ගැනීමට හිමිකමක් නොමැත.

(9) නිල දේපළ භාරගැනුම්කරු විසින් වස්තුභංගත්ව ධාරක ගිණුම සහ වස්තුභංගත්ව අතිරික්ත ගිණුම සම්බන්ධව නියම කරනු ලැබිය හැකි තැනැත්තන්ට නියම කරනු ලැබිය හැකි තොරතුරු ඒ ආකාරයට සහ එවැනි වේලාවන්හි දී හෝ එවැනි අවස්ථාවන්හි දී යැවිය යුතු ය.

ණයහිමි යෝජනා සම්මතයන්

**433.** මේ පනතේ ණය හිමියන්ගේ යෝජනා සම්මතයක් පිළිබඳව සඳහන් කර ඇති අවස්ථාවක දී එවැනි යෝජනා සම්මතයක් සඳහා වූ නියමයන් පස්වන උපලේඛනයේ 7 වන අයිතමයේ දක්වා ඇති පරිදි විය යුතු ය.

සහදායකයන්ගේ යෝජනා සම්මතයන්

**434.** මේ පනතේ සහදායකයන්ගේ යෝජනා සම්මතයක් පිළිබඳව සඳහන් කර ඇති අවස්ථාවක දී එවැනි යෝජනා සම්මත යක් සඳහා වූ නියමයන් පස්වන උපලේඛනයේ 7 වන ඡේදයේ දක්වා ඇති පරිදි විය යුතු ය.

දේපළ පරිග්‍රහණය කිරීම හෝ බැහැර කිරීම පිළිබඳ ආරක්ෂාව

**435.** (1) (2) වන උපවගන්තියේ සඳහන් වන යම් තැනැත්තකු විසින් සමාගමට අයත් නොවන යම් දේපළක් පරිග්‍රහණයට ගනු ලබන හෝ බැහැර කරන අවස්ථාවක දී එම තැනැත්තාගේ අසද්භාවය හෝ නොසැලකිල්ල නිසා සිදු වූයේ නම් මිස එම පරිග්‍රහණයට ගැනීමෙන් හෝ බැහැර කිරීමෙන් සිදු වූ යම් පාඩුවක් හෝ හානියක් පිළිබඳව එම තැනැත්තා වගකිව යුතු නොවේ.

(2) (1) වන උපවගන්තිය සමාගමක අද්මිනිස්ත්‍රාසිකරුට, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුට, ඈවරකරුට, තාවකාලික ඈවරකරුට හෝ විශේෂ කළමනාකරුවකුට අදාළ විය යුතු ය.

(3) (අ) යම් දේපළක්; හෝ

(ආ) එම දේපළ විකිණීමෙන් ලැබෙන යම් මුදලක්,

සම්පූර්ණයෙන් හෝ එහි යම් කොටසක් අය කර ගැනීමට යම් තැනැත්තකුට ඇති අයිතියට හෝ යම් තැනැත්තකුට ඇති ප්‍රතිකර්මයකට (1) වන උපවගන්තියේ සඳහන් කිසිවකින් බලපෑමක් හෝ සීමා කිරීමක් සිදු නොවිය යුතු ය.

ක්‍රියාවල වලංගුභාවය

**436.** ක්‍රියාත්මක කළ හැකි බලයක් යටතේ අද්මිනිස්ත්‍රාසිකරුවකු, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු, ඇවරකරුවකු, තාවකාලික ඇවරකරුවකු, විශේෂ කළමනාකරුවකු හෝ දේපළ භාරගැනුම්කරුවකු වශයෙන් යම් තැනැත්තකු පත් කිරීමට අව්‍යාජ උත්සාහයක් ගෙන තිබුණේ නම් එම තැනැත්තාගේ පත් කිරීමේ දී යම් දෝෂයක් තිබුණ බවට හෝ සුදුසුකම්වල යම් දෝෂයක් තිබුණ බවට පසුව සොයා ගනු ලැබුව ද, එය නොතකා අවස්ථාවෝචිත පරිදි, අද්මිනිස්ත්‍රාසිකරු, ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරු, ඇවරකරුවකු, තාවකාලික ඇවරකරුවකු, විශේෂ කළමනාකරුවකු හෝ දේපළ භාරගැනුම්කරුවකු වශයෙන් එම තැනැත්තා විසින් කරන ලද ක්‍රියාවන් වලංගු වන්නේ ය.

කාලසීමාව දීර්ඝ කිරීම

**437.** (1) මෙම පනත යටතේ යම් අයිතියක් ක්‍රියාත්මක කිරීම කෙසේ විස්තර කර තිබුණ ද එම අයිතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ කාලසීමාව නැවැත්වීමට යටත් වන අවස්ථාවක දී එම අයිතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කිසිවක් මගින් මෙම පනත යටතේ යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීමේ අයිතියට හෝ අවසන් කිරීමේ අයිතියට යම් පරිසීමා කිරීමක් හෝ සීමා කිරීමක් පිළිබඳ බලපෑමක් සිදු නොකළ යුතු ය.

නිශ්චිත ධූර දරන්නෙකු විසින් නියම කරනු ලබන ලේඛන

**438.** (1) මෙම වගන්තියේ -

(අ) "ඉල්ලා සිටින පාර්ශ්වය" යන්නෙන් -

(i) අධිකාරිය;

(ii) අද්මිනිස්ත්‍රාසිකරු,

(iii) ඇවරකරුවකු; හෝ

(iv) තාවකාලික ඇවරකරුවකු; සහ

අදහස් වේ.

(ආ) ‘‘නිශ්චිත ධුර දරන්නා’’ යන්නෙන් -

(i) බංකොලොත්තාවය පිළිබඳ භාරකරුවකු;

(ii) පුද්ගලික වස්තුභංගත්ව යෝජකයකු;

(iii) පුද්ගලික වස්තුභංගත්ව අද්මිනිස්ත්‍රාසිකරුවකු;

(iv) අද්මිනිස්ත්‍රාසිකරුවකු;

(v) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුවකු;

(vi) ඇවරකරුවකු;

(vii) තාවකාලික ඇවරකරුවකු; හෝ

(viii) දේපළ භාරගැනුම්කරුවකු;

අදහස් වේ.

(2) යම් නිශ්චිත ධුර දරන්නකුගේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සහ කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා යම් පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් අවශ්‍ය වන්නේ නම් එම පොත, වාර්තාව හෝ ලේඛනය මේ පනත යටතේ ඒවා ඉල්ලුම් කරන පාර්ශ්වයට ලබා දීමට නියමිතව තිබුණ නමුත් එම පොත්, වාර්තා හෝ ලේඛන ඉල්ලා සිටින විට පාර්ශ්වයකට භාර නොදී සිටීමේ අයිතිය නිශ්චිත ධුර දරන්නකුට තිබිය යුතුය.

(3) යම් නිශ්චිත ධුර දරන්නකු විසින් (2) වන උපවගන්තිය යටතේ වූ තම අයිතිය ක්‍රියාත්මක කරනු ලබන විට, ඉල්ලුම් කරන පාර්ශ්වය විසින් නිශ්චිත ධුර දරන්නාගෙන් -

(අ) අවස්ථාවෝචිත පරිදි එම පොත, වාර්තාව හෝ ලේඛනය යම් සාධාරණ වේලාවක දී ඉල්ලා සිටින පාර්ශ්වයට පරීක්ෂා කිරීම සඳහා ලබාදෙන ලෙස ඉල්ලා සිටිය හැකි ය; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි එම පොතේ, වාර්තාවේ හෝ ලේඛනයේ පිටපතක් හෝ අදාළ කොටස හෝ කොටස් ලබාදෙන ලෙස ඉල්ලා සිටිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ යම් අවශ්‍යතාවයකට අනුකූලව ක්‍රියා කිරීමේ දී නිශ්චිත ධූර දරන්නාට දැරීමට සිදු වූ සාධාරණ වියදම් ඉල්ලුම් කරන පාර්ශ්වය විසින් ගෙවිය යුතු ය.

ඉල්ලීම් සහ දැනුම් දීම

**439.** (1) ඉල්ලීමක් කිරීම සඳහා මේ පනත මගින් විධිවිධාන සලසා ඇති එහෙත් එම ඉල්ලීම ඉදිරිපත් කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳව මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගවල සඳහන් නොවන අවස්ථාවක දී එම ඉල්ලීම් ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

(2) දැනුම්දීමක් හෝ ලිඛිත දැනුම් දීමක් ලබා දීම සඳහා මෙම පනත මගින් විධිවිධාන සලසා ඇති නමුත්, මෙම පනතෙහි හෝ ඒ යටතේ සාදන ලද කිසිඳු නියෝගයක නිශ්චිතව දැනුම් දීම කළ යුතු ක්‍රමය සඳහන් නොකර ඇති විට, එම දැනුම් දීම ලිඛිතව ලබා දිය යුතු ය.

(3) ප්‍රසිද්ධියේ දැනුම් දීම සඳහා මෙම පනත මගින් නියමකර ඇති අවස්ථාවක, එම දැනුම් දීම-

(අ) ගැසට් පත්‍රයේ;

(ආ) සාමාන්‍ය සංසරණයේ ඇති පුවත්පත්වල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන එක් එක් භාෂාවලින් වශයෙන් පළ කිරීම මගින්; සහ

(ඇ) නියම කරනු ලබන යම් ආකාරයකට වෙබ් අඩවියක, නියම කරනු ලබන යම් නියමයන්ට අනුකූලව

පළ කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

2 වන පරිච්ඡේදය

වැරදි

අද්මිනිස්ත්‍රාසි කිරීමට හෝ ඇවර කිරීමට පෙර අධ්‍යක්ෂවරයකුගේ හෝ වෙනත් නිලධරයකුගේ වැරදි ක්‍රියා

**440.** (1) සමාගමක අද්මිනිස්ත්‍රාසි කිරීම හෝ ඇවර කිරීම ආරම්භ වූ විට, අද්මිනිස්ත්‍රාසි කිරීම හෝ ඇවර කිරීමේ දිනයට පෙරාතුවම වූ අවුරුදු දෙකක කාලය තුළ හෝ ඉන් පසුව සමාගමේ සිටි හෝ දැනට සිටින අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු පහත දැක්වෙන ක්‍රියා සිදු කර ඇත්නම්, ඔහු විසින් වරදක් සිදු කර ඇත. එම ක්‍රියාවන් මෙසේ ය :-

(අ) රුපියල් දසදහසක් හෝ ඊට වැඩි වටිනාකමක් ඇති සමාගමේ දේපළෙහි යම් කොටසක් සැඟවීම හෝ සමාගමට අයවීමට ඇති හෝ සමාගම විසින් ගෙවීමට ඇති මුදලක් සැඟවීම;

(ආ) රුපියල් දසදහසක් හෝ ඊට වැඩි වටිනාකමක් ඇති සමාගමේ දේපළ කොටසක් වංචනික ලෙස ඉවත්කර ගැනීම;

(ඇ) සමාගමේ කටයුතුවලට, ව්‍යාපාරයට, දේපළට හෝ මූල්‍ය පරිවේෂණයට අදාළ, යම් පොතක්, වාර්තාවක්, හෝ ලේඛනයක් වංචනික ලෙස රැගෙන ගොස් තිබීමෙන්, විනාශ කිරීමෙන්, වෙනසක් සිදු කිරීමෙන් හෝ අත්හැරීමක් සිදු කිරීමෙන් හෝ වංචනික ලෙස ආධාර හෝ අනුබල දීම මගින් වංචනික ලෙස රැගෙන ගොස් තිබීම, විනාශ කිරීම, වෙනසක් සිදු කිරීම හෝ යම් අත්හැරීමක් සිදු කිරීම;

(ඈ) යම් වංචනික නියෝජනයක් මගින් හෝ වෙනත් වංචාවක් මගින්, සමාගම සඳහා හෝ ඒ වෙනුවෙන් ණයට දේපළ ලබා ගැනීමෙන් පසුව එම දේපළ සඳහා සමාගම විසින් මුදල් ගෙවා නොතිබීම;

(ඉ) සමාගම ණයට ගත් දේපළ උකස් කිරීම, ඔඩපනය කිරීම හෝ බැහැර කිරීම සිදු වූයේ සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුර දී නම් මිස සමාගම ණයට ගත් දේපළ උකස් කිරීම, ඔඩපනය

කිරීම හෝ බැහැර කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම හෝ ඒ සඳහා අනුබල දීම සහ එම දේපළ සඳහා මුදල් නොගෙවීම;

(ඊ) සමාගමේ ණය හිමියන්ට වංචා කිරීමේ චේතනාවක් ඇතිව සමාගමේ දේපළක් මත පිළිබැඳුමක්, තෑගි දීමක් හෝ පැවරීමක් කිරීම හෝ දීම හෝ එසේ කිරීමට හෝ දීමට සලස්වනු ලැබීම හෝ ලියා අත්සන් කිරීම හෝ වෙනත් නෛතික ක්‍රියාවලියක් ආරම්භයේ දී හෝ දිගටම පවත්වාගෙන යාමේ දී සැලසුම් සහගතව හෝ වංක සහයෝගය දැක්වීමෙන් සමාගමට හෝ එම දේපළට එරෙහිව තහනමකට ගැනීමේ බද්දක් අය කර ගැනීම;

(උ) සමාගමේ ණයහිමියන්ට වංචා කිරීමේ චේතනාවෙන් සමාගමට එරෙහිව ලබා ගත් මුදල් ගෙවීම සිදු නොකර තීන්දුවක් හෝ ආඥාවක් ලැබුණු දිනට පසුව හෝ එම මුදල් ගෙවීම මාස දෙකකට අඩු කාලයකට පෙර, සමාගමේ දේපළවල යම් කොටසක් සැඟවීම හෝ ඉවත් කිරීම; හෝ

(ඌ) සමාගමේ දේපළවලවල යම් කොටසක් සඳහා ව්‍යාජ පාඩු හෝ වියදම් දක්වමින් ගිණුම් පෙන්වීමට උත්සාහ කිරීම.

(2) අදාළ තැනැත්තාට වංචා කිරීමේ චේතනාවක් නොතිබූ බව ඔප්පු කිරීම වෙනුවෙන්, (1) වන උපවගන්තියේ (අ) හෝ (ඉ) වන ඡේදය යටතේ වූ චෝදනාවකට යහපත් විත්තිවාචකයක් වන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ යටතේ වූ වරදක් සිදු කරන තැනැත්තකු රුපියල් මිලියන තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමට හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ එම තැනැත්තා යටත් විය යුතු ය.

(4) (1) වන වගන්තියේ (ඉ) වන ඡේදය යටතේ වූ වරදක්, එම අවස්ථානුගත කරුණු යටතේ සංයුක්ත කරන සමාගමේ යම් දේපළක් උකස් කිරීමට, ඔඩපනය කිරීමට හෝ බැහැර කිරීමට සම්බන්ධ වන හෝ අනුබල දෙන තැනැත්තකු හෝ එම අවස්ථානුගත කරුණු යටතේ අදාළ දේපළ, උකස් කරන ලද්දක්, ඔඩපනය කරන ලද්දක් හෝ බැහැර කරන ලද්දක් බව දැන දැනම එම දේපළ උකසක් ඔඩපනයක් වශයෙන් හෝ අන්‍යාකාරයෙන් ලබා ගන්නා තැනැත්තකු වරදක් සිදු කරන අතර එසේ වරදකරු කරනු ලැබීමේ දී එම තැනැත්තා රුපියල් මිලියන තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

වංචනික ලෙස වෙළෙඳාම් කිරීම

**441.** (1) ඈවර කිරීමට හෝ අද්මිනිස්ත්‍රාසි කිරීමකට භාජන වී ඇති සමාගමක යම් ව්‍යාපාර කටයුතු ණයහිමියකු හෝ වෙනත් තැනැත්තකුට වංචා කිරීමේ චේතනාවෙන් හෝ යම් වංචනික අරමුණක් සඳහා සිදු කර ඇති අවස්ථාවක, එම ආකාරයට ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට සම්බන්ධ වන හෝ අනුබල දෙන සෑම තැනැත්තෙක්ම වරදක් සිදු කරන අතර, එහි දී වරදකරු කරනු ලැබීමේ දී එම තැනැත්තා රුපියල් මිලියන තුනකට නොවැඩි දඩයකට හෝ බරපතළ වැඩ ඇතිව අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) ඈවර කිරීමට හෝ අද්මිනිස්ත්‍රාසි කිරීමට භාජන වී ඇති සමාගමක ව්‍යාපාර කටයුතු, යම් ණයහිමියකු හෝ වෙනත් තැනැත්තකුට වංචා කිරීමේ චේතනාවෙන් හෝ කිසියම් වංචනික අරමුණක් සඳහා සිදු කරන අවස්ථාවක දී ඈවරකරුගේ හෝ අද්මිනිස්ත්‍රාසිකරුගේ ඉල්ලීම මත අධිකරණය විසින්, අවස්ථාවෝචිත පරිදි ඒ ආකාරයෙන් ව්‍යාපාරය කරගෙන යාමට ආධාර අනුබල දුන් හෝ සම්බන්ධ වූ සෑම තැනැත්තකු විසින් -

(අ) සමාගමේ දේපළ සඳහා යම් දායක මුදලක් ලබා දිය යුතු බවට; හෝ

(ආ) සමාගමේ ණය සහ වෙනත් බැරකම් සඳහා ඔහු පුද්ගලිකව වගකිව යුතු බවට,

අධිකරණය විසින් සුදුසු යයි සලකනු ලබන යම් ආඥාවක් ලබාදිය හැකි ය.

(3) මෙම වගන්තිය යටතේ ආඥාවක් ලබාදීමේ දී අධිකරණය විසින් සුදුසු යැයි සලකනු ලබන පරිදි -

(අ) යම් නියමයක් හෝ කොන්දේසියක් පැනවිය හැකි ය; සහ

(ආ) වෙනත් යම් උපකාරක ආඥාවක් ලබාදිය හැකි ය.

අද්මිනිස්ත්‍රාසිකරණය හෝ ඇවර කිරීම හා සම්බන්ධිත වැරදි

**442.** (1) අද්මිනිස්ත්‍රාසි කිරීමට හෝ ඇවර කිරීමකට භාජනය වී ඇති හෝ අද්මිනිස්ත්‍රාසි කිරීම හෝ ඇවර කිරීම පසුව ආරම්භ වූ යම් සමාගමක කලින් සිටි හෝ දැනට සිටින අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු හෝ සහදායකයකු විසින් -

(අ) අද්මිනිස්ත්‍රාසිකරුගේ, ඇවරකරුගේ හෝ තාවකාලික ඇවරකරුගේ ඉල්ලීම පරිදි තම උපරිම දැනුම හා විශ්වාසය අනුව, සමාගමේ සියලු නිශ්චල හා චංචල දේපළ පිළිබඳ විස්තර සහ සමාගමේ දේපළවලින් යම් කොටසක්, සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුර දී බැහැර කිරීම හැර, සමාගම එම දේපළ කොටස බැහැර කළේ කෙසේද, සහ එසේ බැහැර කළේ කාට ද සහ කුමන ප්‍රතිෂ්ඨාවක් සඳහා ද සහ සමාගම ඒවා බැහැර කළේ කවදා ද යන විස්තර අවස්ථාවෝචිත පරිදි එම අද්මිනිස්ත්‍රාසිකරුට, ඇවරකරුට හෝ තාවකාලික ඇවරකරුට සත්‍ය වශයෙන් සහ සම්පූර්ණයෙන් හෝ සහදායකයාට ලබා නොදෙන අවස්ථාවක දී;

(ආ) යම් තැනැත්තකුගේ සන්තකයේ හෝ භාරකාරත්වයේ හෝ තැනැත්තාගේ පාලනය යටතේ පවතින සමාගමේ යම් නිශ්චල හෝ චංචල දේපළක කොටසක් අවස්ථාවෝචිත පරිදි අද්මිනිස්ත්‍රාසිකරු, ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු විසින් තමාට භාරදෙන ලෙස සාධාරණ පරිදි ඉල්ලා සිටි විට අද්මිනිස්ත්‍රාසිකරුට,

ඇවරකරුට හෝ තාවකාලික ඇවරකරුට එය භාර නොදෙන අවස්ථාවක දී;

(ඈ) යම් තැනැත්තකුගේ සන්තකය හෝ භාරකාරත්වය හෝ තැනැත්තාගේ පාලනය යටතේ පවතින සමාගමේ සියලු පොත්පත්, වාර්තා සහ ලේඛන අවස්ථාවෝචිත පරිදි අද්මිනිස්ත්‍රාසිකරු, ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු විසින් තමාට භාරදෙන ලෙසට සාධාරණ පරිදි ඉල්ලා සිටි විට එම පොත්පත්, වාර්තා හෝ ලේඛන අද්මිනිස්ත්‍රාසිකරුට, ඇවරකරුට හෝ තාවකාලික ඇවරකරුට භාර නොදෙන අවස්ථාවක දී;

(ඇ) සමාගමේ කටයුතු, ව්‍යාපාර, දේපළ හෝ මූල්‍ය තත්ත්වයන්ට අදාළව යම් පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක්, අද්මිනිස්ත්‍රාසිකරු, ඇවරකරු හෝ තාවකාලික ඇවරකරු වෙත ඉදිරිපත් කිරීම වළක්වනු ලබන යම් අවස්ථාවක දී;

(ඉ) සමාගමේ කටයුතු, ව්‍යාපාර, දේපළ හෝ මූල්‍ය තත්ත්වයන්ට අදාළව -

(i) වැදගත් කරුණක් සම්බන්ධයෙන් නොමඟ යවන සුලු හෝ; අසත්‍ය හෝ;

(ii) යම් සිද්ධියක් හෝ කරුණක් හෙළිදරව් කිරීම අත්හරින සහ එමගින් කරනු ලබන ප්‍රකාශය වැදගත් කරුණක් සම්බන්ධයෙන් නොමඟ යවනසුලු ප්‍රකාශයක් බවට පත් කරවන,

යම් ප්‍රකාශයක් සිදු කරනු ලබන හෝ ඊට ආධාර අනුබල දෙන හෝ සම්බන්ධවන අවස්ථාවක දී;

(ඊ) යම් තැනැත්තකු විසින් යම් අසත්‍ය ණයක් ඔප්පු කර ඇති බව දැන දැනම හා විශ්වාස කරමින් අද්මිනිස්ත්‍රාසිකරුට ඇවරකරුට හෝ තාවකාලික ඇවරකරුට ඒ බව මාසයක්

ගතවන තුරු තිස්සේ දැනුම් නොදෙන අවස්ථාවක දී;

(උ) සමාගම සම්බන්ධයෙන් හෝ අද්මිනිස්ත්‍රාසි කිරීම හෝ ඈවර කිරීම සම්බන්ධයෙන් යම් ගිවිසුමකට යම් ණයහිමියකුගේ කැමැත්ත ලබා ගැනීමේ අරමුණින් යම් වංචනික නියෝජනයක් ඉදිරිපත් කිරීම හෝ වෙනත් යම් වංචාවක් සිදු කරනු ලබන අවස්ථාවකදී,

එවැනි යම් අධ්‍යක්ෂවරයකු, වෙනත් නිලධරයකු හෝ සහදායකයකු වරදකට වැරදිකරු විය යුතු අතර, එකී වරදකරු කිරීමේ දී එම තැනැත්තා රුපියල් මිලියන තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු හතකට වැඩි නොවන කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(2) සමාගමේ කටයුතු පිළිබඳ තත්ත්වය සැඟවීමට හෝ නීතිය පැරදවීමට හෝ අදාළ තැනැත්තාට චේතනාවක් නොතිබුණ බව ඔප්පු කිරීම (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ) සහ (ඊ) යන ඡේද යටතේ වූ යම් චෝදනාවක් සඳහා යහපත් විත්තිවාචකයක් වන්නේ ය.

තහනම් කරන ලද ක්‍රියාකලාපය

**443.** (1) යම් සමාගමක් ඈවර කිරීමකට හෝ අද්මිනිස්ත්‍රාසි කිරීමකට භාජන වී ඇති විට හෝ 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඈ) ඡේදය හෝ 190 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති විට කිසිදු තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් පිටතට යාම හේතුවෙන් -

(අ) සමාගමට ගෙවිය යුතු මුදල් ගෙවීමෙන් වැළකී සිටීමක්;

(ආ) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් සාක්ෂි දීම මඟ හැරීමක්; හෝ

(ඇ) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් අධිකරණයේ යම් ආඥාවකට, හෝ මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වන

වෙනත් යම් අවශ්‍යතාවයකට අනුකූලව ක්‍රියා කිරීම මඟ හැරීමක්,

වන්නේ නම්, එවැනි කිසිදු තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් පිටතට යාම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදක් සිදු කරන්නේ ය.

නියමිත පරිදි ගිණුම් නොතබා ඇති අවස්ථාවක වගකීම

**444.** (1) යම් සමාගමක් අද්මිනිස්ත්‍රාසි කිරීමේ දී හෝ ඈවර කිරීමේ ක්‍රියාවලියේ දී අද්මිනිස්ත්‍රාසි කිරීම හෝ ඈවර කිරීම ආරම්භ කළ දිනට පෙරාතුවට වූ වසර දෙකක කාලය ඇතුළත හෝ සමාගම සංස්ථාගත කිරීමේ දිනය සහ අද්මිනිස්ත්‍රාසි කිරීම හෝ ඈවර කිරීම ආරම්භ වූ දිනය අතර කාලසීමා වඩා අඩු කාලය තුළ දී සමාගමේ ගිණුම් පොත් නිසි පරිදි තබා නොමැති බව පෙන්නුම් කරන අවස්ථාවක දී ඒ පැහැර හැරීම කර ඇති සමාගමේ සෑම අධ්‍යක්ෂවරයකු සහ වෙනත් නිලධරයකු විසින් -

(අ) අවංකව සහ සාධාරණ ලෙස තමා ක්‍රියා කළ බව ; සහ

(ආ) සමාගමේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගිය අවස්ථානුගත කරුණු අනුව එම පැහැර හැරීම නොවැළැක්විය හැකි බව,

පෙන්වන්නේ නම් මිස,එවැනි සෑම අධ්‍යක්ෂකවරයකු සහ වෙනත් නිලධරයකු වරදක් සිදු කරන්නේ ය.

(2) මෙම වගන්තියේ කාර්ය සඳහා, යම් සමාගමක නිසි ගිණුම් පොත් පවත්වාගෙන ගොස් නොමැති බවට සලකනු ලැබිය යුත්තේ ලබා ඇති සියලු මුදල් සහ වැය වූ මුදල් පිළිබඳව ප්‍රමාණවත් විස්තර සහිත දෛනික සටහන්, පොත්පත් ද වෙළෙඳාම හෝ ව්‍යාපාරය භාණ්ඩ සම්බන්ධව වන්නේ නම් (සාමාන්‍ය සිල්ලර වෙළෙඳාමක් මගින් විකිණීමට ඇති භාණ්ඩ හැර) එම භාණ්ඩ සහ අලෙවි කරන ලද සහ මිල දී ගන්නා ලද තැනැත්තන් හඳුනා ගැනීමට හැකි වන පරිදි ප්‍රමාණවත් විස්තර ඇතුළත් වාර්ෂික තොග ගැනීම් පෙන්නුම් කරන ප්‍රකාශයක් ඇතුළුව සමාගමේ වෙළෙඳාම් සහ ව්‍යාපාර කටයුතුවල ගනුදෙනු සහ මූල්‍ය තත්ත්වය විදහා පෑමට සහ පැහැදිලි කිරීමට අවශ්‍ය ගිණුම් පොත් පවත්වාගෙන ගොස් නොමැති අවස්ථාවකදී ය.

*අසත්‍ය හෝ නොමඟ යවන ප්‍රකාශ*

**445.** (1) මෙම පනත මගින් අවශ්‍ය හෝ පනතේ කාර්ය සඳහා අවශ්‍ය තොරතුරු සපයනු ලබන යම් තැනැත්තකු විසින් -

(අ) යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ යම් නොමඟ යවන සුලු තොරතුරු සපයනු ලබන; සහ

(ආ) (i) යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් අදාළ තොරතුරු අසත්‍ය හෝ නොමඟ යවන සුලු බව දැන දැනම එම තොරතුරු හෙළිදරව් කරනු ලබන;

(ii) යම් සිද්ධියක් හෝ කරුණක් හෙළිදරව් කිරීම අත්හැරීම මගින් අදාළ තොරතුර යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ නොමඟ යවන සුලු බවට පත්වන බව දැන දැනම යම් සිද්ධියක් හෝ කරුණක් හෙළිදරව් නොකරන,

අවස්ථාවකදී, එවැනි යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියන තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

*අද්මිනිස්ත්‍රාසිකරුවන්ට සහ ඇවරකරුවන්ට සේවක අර්ථසාධක අරමුදල් පනත, සේවක භාරකාර අරමුදල් පනත සහ පාරිතෝෂික දීමනා ගෙවීමේ පනත අදාළ වීම*

**446.** 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත, 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත සහ 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීමේ පනත ඇතුළුව වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අයවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් නොගෙවීම, සේවක භාරකාර අරමුදල් නොගෙවීම සහ ව්‍යවස්ථාපිත පාරිතෝෂික දීමනා නොගෙවීම සම්බන්ධයෙන් වූ අදාළ කාරණා සඳහා අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ ඇවරකරුවකු සාපරාධී වගකීමකට යටත් නොවන්නේ ය.

3 වන පරිච්ඡේදය

**අධිකරණ බලය සහ කාර්ය පටිපාටිය**

**447.** (1) මෙම පනතේ, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, ‘‘අධිකරණය’’ යන්නෙන් - අධිකරණ බලය

(අ) පුද්ගලික වස්තුභංගත්ව කාර්ය පටිපාටියකට අදාළව, ණයකරු පදිංචිව සිටින දිස්ත්‍රික්කයේ ප්‍රදේශයේ දිසා අධිකරණය අදහස් වේ;

(ආ) සමාගමකට අදාළ කරුණක් වන විට, සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය අදහස් වේ; සහ

(ඇ) අනෙකුත් සියලුම කරුණු සම්බන්ධයෙන් වන විට, කොළඹ දිසා අධිකරණය අදහස් වේ.

(2) අධිකරණයේ යම් ආඥාවකට හෝ නඩු තීන්දුවකට එරෙහිව එම නඩු කටයුතුවලට සහභාගි වූ අතෘප්තියට පත් පාර්ශ්වය විසින් පළමුවෙන් අධිකරණයේ අවසරය ලබා ගැනීමෙන් පසු නඩු තීන්දුවේ හෝ දින සිට දින දාහතරක් ඇතුළත එම ආඥාවට හෝ නඩු තීන්දුවට එරෙහිව අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(3) අභියාචනය කිරීම සඳහා අවසර ලබා දෙන්නේ නම් මිස පෙත්සම්කරුට අසාධාරණ අගතියක් සහ සැලකිය යුතු අසාධාරණයක් සිදු වන බවට අභියාචනාධිකරණය සෑහීමට පත් වන්නේ නම්, අභියානාධිකරණය විසින් (2) වන උපවගන්තිය යටතේ අභියාචනය කිරීමට අවසර ලබා දිය යුතු ය.

**448.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා - වැරදි පිළිබඳව විභාග කිරීම සහ දඩ නියම කිරීම

(අ) මෙම පනත යටතේ වූ සියලු වැරදි මහෙස්ත්‍රාත්වරයකු විසින් ලඝු කාර්යපටිපාටිය අනුව විභාග කළ හැකි ය; සහ

(ආ) මෙම පනත යටතේ වන වරදක් සඳහා මහෙස්ත්‍රාත්වරයකු විසින් පනවනු ලැබිය හැකි දඩය මහෙස්ත්‍රාත්වරයකු ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී පනවනු ලැබිය හැකි දඩයට වඩා වැඩි වුව ද එය නොතකා මහෙස්ත්‍රාත්වරයා විසින් එම දඩය පනවනු ලැබිය හැකි ය.

කාර්ය පටිපාටිය

**449.** (1) මෙම පනතේ විධිවිධාන යටතේ අධිකරණයට ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක ම, අන්‍යාකාරයකට නියම කර ඇත්නම් හෝ අධිකරණය විසින් අන්‍යාකාරයකට විධාන කර ඇත්නම් මිස පෙත්සමක් සහ දිවුරුම් පෙත්සමක් මගින් ඉදිරිපත් කළ යුතු අතර, එම ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන්නේ යම් තැනැත්තකුට එරෙහිව ද එවැනි සෑම තැනැත්තකුගේ නම වගඋත්තරකරුවකු ලෙස එම ඉල්ලීමේ සඳහන් කළ යුතු අතර, එම ඉල්ලීම පිළිබඳව වගඋත්තරකරුට දැන්වීම් ලබා දිය යුතු අතර, එම ඉල්ලීමට එරෙහිව විරෝධතා ඉදිරිපත් කිරීමට එම වගඋත්තරකරුට හිමිකම් ඇත.

(2) මෙම පනත යටතේ වූ නඩු කටයුතු හෝ ඊට ආනුෂංගික වූ කටයුතු අතරතුර අධිකරණයට ඉදිරිපත් කරන සෑම ඉල්ලීමක් ම ලිඛිත මෝසමක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

(3) මේ පනත යටතේ අධිකරණය වෙත කර ඇති ඉල්ලීමක දී හෝ අධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතුවල කවර හෝ අවස්ථාවක දී අධිකාරියට සහ නිල දේපළ භාර ගැනුම්කරුට අධිකරණ සහායක ලෙස අධිකරණයේ පෙනී සිට කරුණු ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත.

(4) මෙම පනත යටතේ වූ ඉල්ලීමක් මගින් අධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු කටයුතුවල දී අධිකාරියට හෝ නිල දේපළ භාර ගැනුම්කරුට එරෙහිව නඩු ගාස්තු පිළිබඳ කිසිදු ආඥාවක් ලබා නොදිය යුතු ය.

අතුරු සහන

**450.** (1) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මෙම පනත යටතේ නඩු කටයුත්තක යම් පාර්ශ්වකරුවකු විසින් කරන ලද ඉල්ලීමක් මත ඒ පිළිබඳ අවසාන ආඥාවක් නිකුත් කරන තෙක් අධිකරණය විසින් සුදුසු යැයි සලකනු ලබන්නේ නම් ප්‍රතිබාධකන නියෝගයක් ඇතුළුව අතුරු නියෝගයක්

ලබාදිය හැකි ය.එම අතුරු ආඥාව අධිරණයේ අභිමතය අනුව ඒකපාක්ෂිකව වගඋත්තරකරුට දැන්වීම් යැවීමෙන් පසු ප්‍රකාශ කළ හැකි ය. වගඋත්තරකරු විසින් පෙත්සම්කරු වෙත දැන්වීම් යැවීමෙන් පසුව එම ඒකපාක්ෂික නියෝගය වෙනස් කිරීම හෝ අවලංගු කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(2) ඉල්ලුම්කරු විසින් අපේක්ෂිත ආඥාව ප්‍රදානය කරනු ලැබූ විට වෙනත් යම් තැනැත්තකුට යම් පාඩුවක් හෝ අලාභයක්, එම පාඩුව හෝ අලාභය ඉල්ලුම්කරු විසින් දැරීම සාධාරණ සහ යුක්ති සහගත යයි අධිකරණය සලකන්නේ නම් එම පාඩුව හෝ අලාභය ඉල්ලුම්කරු විසින් එකී තැනැත්තාහට හානිපූරණය කරන බවට වූ ලිඛිත ප්‍රතිඥාවක් පළමුවෙන් අධිකරණය වෙත යොමු කරනු ලැබ ඇත්නම් මිස, අධිකරණය විසින් එසේ කර ඇති යම් ඉල්ලීමක් වෙනුවෙන් ප්‍රතිබාධන නියෝගයක් හෝ වෙනත් යම් අතුරු ආඥාවක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ, ලබාදෙන ලද ප්‍රතිඥාව සඳහා ඉල්ලුම්කරු විසින් සැපයිය යුතු ඇප මුදල් ප්‍රමාණය, ප්‍රතිබාධන නියෝගයක් හෝ වෙනත් යම් ආකාරයක අතුරු ආඥාවක් ප්‍රදානය කිරීමට පෙර හෝ ප්‍රදානය කරන අවස්ථාවේ දී, අධිකරණය විසින් නියම කරනු ලැබිය යුතු ය. අධිකරණය වෙත මුදල් තැන්පත් කිරීමෙන් හෝ බැංකු ඇපකරයක් ඉදිරිපත් කිරීමෙන් හෝ ප්‍රමාණවත් යයි අධිකරණය සලකනු ලබන වෙනත් යම් ආකාරයක එම ඇප මුදල් සපයනු ලැබිය හැකි ය.

(4) අතුරු ආඥාවක් කිරීමේ හෝ දිගටම බලාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පාඩුවක් හෝ අලාභයක් සිදු වී ඇති යම් තැනැත්තකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත (2) වන උපවගන්තිය යටතේ දෙන ලද ප්‍රතිඥාව සඳහා ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු ඇප මුදල් ප්‍රමාණය අධිකරණය විසින් කලින් කළ වැඩි කරනු ලැබිය හැකි ය. ඉදිරිපත් කළ යුතු ඇප මුදල වැඩි කිරීම සඳහා වූ ආඥාවක් කරනු ලැබූ අවස්ථාවක අධිකරණය විසින් නිශ්චිතව දක්වනු ලබන කාලයක් ඇතුළත වැඩි කරන ලද ඇප මුදල සැපයිය යුතු බව අතුරු ආඥාව අඛණ්ඩව බලාත්මක වීම සඳහා වූ කොන්දේසියක් විය යුතු ය.

(5) (අ) (2) වන උපවගන්තිය යටතේ වූ ප්‍රතිඥාවක් ක්‍රියාත්මක කිරීම සඳහා;

(ආ) (3) වන උපවගන්තිය යටතේ ඇප වශයෙන් තැන්පත් කරන ලද මුදල් යම් තැනැත්තකුට ගෙවීම සඳහා; හෝ

(ඇ) (3) වන උපවගන්තිය යටතේ ඇපයක් ලෙස තැන්පත් කර ඇති යම් මුදල් පොලී උපදවන බැංකු ගිණුමක ආයෝජනය කිරීම සඳහා,

අධිකරණය විසින් සාධාරණ හා යුක්ති සහගත යයි සලකනු ලබන ආඥා අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

පිරිවැය

**451.** (1) අධිකරණය විසින් ඉල්ලීමක් හෝ නඩු කටයුත්තක් පිළිබඳ තීරණය කිරීමේදී නියම කරනු ලබන පරිදි අධිකරණය විසින් පහත දැක්වෙන ගාස්තු ඇතුළු ගාස්තු ගෙවීම් සඳහා ආඥාවක් කළ හැකි ය. එනම් -

(අ) එක් පාර්ශ්වයක ගාස්තු අනෙක් පාර්ශ්වය විසින් ගෙවිය යුතු බවට;

(ආ) ගෙවිය යුතු ගාස්තුවල ප්‍රමාණය; සහ

(ඇ) ගාස්තු ගෙවිය යුතු කාලසීමාව.

(2) අධිකරණය විසින් යම් නඩු කටයුත්තක් සම්බන්ධයෙන් නියම කරනු ලබන ආකාරයට ගාස්තු සඳහා වූ ඇප සම්බන්ධයෙන් ආඥාවක් කළ හැකි ය.

අධිකරණ නියෝග බලාත්මක කිරීම

**452.** (1) යම් අධිකරණයක පවතින නඩු කටයුත්තක දී අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කළ හැකි ආකාරයට ම මෙම පනත යටතේ අධිකරණය විසින් කරනු ලබන යම් ආඥාවක් බලාත්මක කළ හැකි ය.

(2) මෙම පනත යටතේ අධිකරණය විසින් කරන ලද යම් ආඥාවක් වෙනත් යම් අධිකරණයක් විසින් බලාත්මක කිරීමට ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක –

(අ) අදාළ ආඥාවේ සහතික කළ පිටපතක් එම ආඥාව පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය; සහ

(ආ) එවැනි සහතික කළ පිටපතක් ඉදිරිපත් කිරීමෙන්

පසු, අනෙක් අධිකරණය විසින් ආඥාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර එම අධිකරණය විසින් එම ආඥාව කරන ලද ආකාරයට ම ගනු ලැබිය යුතුය.

වැරදි සම්බන්ධයෙන් පොදු විධිවිධාන

**453.** (1) (අ) මෙම පනත යටතේ අධිකරණ නියෝගයකට අනුකූලව ක්‍රියා කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක; සහ

(ආ) එසේ පැහැර හැරීම වරදක් බවට අන්‍යාකාරයෙන් මෙම පනත මගින් විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවක,

අදාළ තැනැත්තා මේ උපවගන්තිය යටතේ වරදක් සිදු කරන අතර එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ දෙකකට අඩු නොවන සහ රුපියල් මිලියන දෙකකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ එම තැනැත්තා යටත් විය යුතු ය.

(2) (අ) මේ පනතේ යම් විධිවිධානයකට අනුකූලව ක්‍රියා කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක දී;

(ආ) (1) වන උපවගන්තිය යටතේ අදාළ තැනැත්තා පැහැර හැරීම සම්බන්ධයෙන් වරදකරු නොවන අවස්ථාවක දී; සහ

(ඇ) එසේ පැහැර හැරීම වරදක් බවට මේ පනත මගින් අනන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවක,

එම තැනැත්තා මේ උපවගන්තිය යටතේ වරදක් සිදු කරන අතර එසේ වරදකරු කිරීමේ දී රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් මිලියන තුනකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

## 4 වන පරිච්ඡේදය

### නීති පැනවීමට පවරන ලද බලතල

**454.** (1) මේ පනත යටතේ නියමයන් සෑදීමට අමාත්‍යවරයාට නියම කර හෝ බලය පවරා ඇති යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියමයන් සාදනු ලැබිය හැකි ය. නියම

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම නියමයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක කාල සීමාවක් ඇතුළත නොඅඩු කාලයකට පසු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) මෙම පනතේ යම් මුදල් ප්‍රමාණයක් නිශ්චිතව දක්වා ඇති අවස්ථාවක, මෙම පනත ක්‍රියාත්මක වූ දින සිට උද්ධමනය ගණනය කිරීම සඳහා කලින් කලට, ඒ සම්බන්ධයෙන් යම් ඉහළ අගයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කිරීමට අමාත්‍යවරයාට බලය පැවරී ඇත.

**455.** (1) (අ) මෙම පනත යටතේ නියෝග සෑදීමට බලය පැවරී ඇති යම්; හෝ නියෝග

(ආ) මෙම පනත යටතේ නියෝග සෑදීමට නියම කර ඇති, අවශ්‍ය වන, හෝ අපේක්ෂා කරනු ලබන,

යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් විධිවිධානවල ව්‍යාප්තියට අගති විරහිතව අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :-

(අ) පහත දැක්වෙන ලේඛන ඇතුළුව දැන්වීම්, වාර්තා සහ වෙනත් ලේඛන සහ එම දැන්වීම්වල, වාර්තාවල සහ ලේඛනවල, පිටපත් යැවීම,

සංශෝධනය කිරීම සහ ඉල්ලා අස් කර ගැනීම පිළිබඳ ආකෘතිය, අන්තර්ගත කරුණු, භාෂාව (හෝ භාෂාවන්), සත්‍ය බවට සහතික කිරීම යන කරුණු සම්බන්ධයෙන් ද -

(i) එම දැන්වීම්, වාර්තා සහ වෙනත් ලේඛන සහ එම දැන්වීම්වල පිටපත්, වාර්තා සහ වෙනත් ලේඛනවල පිටපත් ලැබුණු බවට සලකනු ලබන වේලාව පිළිබඳව; සහ

(ii) විද්‍යුත් සන්නිවේදනය සම්බන්ධයෙන්;

(ආ) (රාජ්‍ය ලිපිගොනු හා නාමලේඛන ඇතුළුව) ලේඛන හෙළිදරව් කිරීම, පළ කිරීම, නිවැරදි කිරීම සහ පරීක්ෂා කිරීම සහ ලේඛනවල පිටපත් සඳහා වන අයිතිවාසිකම්;

(ඇ) ණයහිමියා සහ සහදායකයාගේ තීරණ ගැනීම සම්බන්ධයෙන්;

(ඈ) වස්තුභංගත්ව ධූර දරන්නන් විසින් හිමිකම්පෑම් ඉදිරිපත් කළ හැකි ගාස්තු, පිරිවැය පිළිබඳ සහ වියදම් අය කිරීම් විෂය පථය;

(ඉ) ගාස්තු තක්සේරු කිරීම සහ අයකර ගැනීම සහ ගාස්තු සඳහා ඇප;

(ඊ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඇතුළුව අදාළ තැනැත්තන්ට සහ ආයතනවලට කරුණු දැනුම් දීම; සහ

(උ) අධිකාරියේ ව්‍යුහය සහ මෙහෙයුම්.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දින සිට හෝ නියෝගයේ නිශ්චිතව දක්වනු ලබන පසු දිනයක සිට බලපැවැත්විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් එසේ අනුමත නොකළ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට එයින් අගතියක් සිදු නොවිය යුතු ය.

**456.** (1) (අ) මෙම පනත යටතේ සෑදීමට බලය පවරා ඇති; හෝ

(ආ) මෙම පනත යටතේ සෑදීමට නියම කර ඇති, අවශ්‍ය හෝ අපේක්ෂා කරනු ලබන,

රීති, ප්‍රමිති, විධාන, පරිචයන්, අචාර ධර්ම පද්ධති සහ මාර්ගෝපදේශ

රීති, ප්‍රමිති, විධාන පරිචය, චර්යා සංග්‍රහය සහ මාර්ගෝපදේශ කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය වන අධිකාරිය විසින් රීති, ප්‍රමිති, විධාන පරිචය, චර්යා සංග්‍රහය සහ මාර්ගෝපදේශ සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් විධිවිධානවලට අගතියක් නොමැතිව, අධිකාරිය විසින් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා ද සහ ඒ සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති, ප්‍රමිති, විධාන පරිචය, චර්යා සංග්‍රහ සහ මාර්ගෝපදේශ සාදනු ලැබිය හැකි ය.

(3) නිල දේපළ භාර ගැනුම්කරුගේ, බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම සම්බන්ධයෙන් නිල දේපළ භාර ගැනුම්කරු විසින් අධිකාරිය විමසා විධාන, පරිචයන්, සහ මාර්ගෝපදේශ සාදනු ලැබිය හැකි ය.

(4) මෙම වගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක්, ප්‍රමිතියක්, විධාන පරිචයක්, චර්යා සංග්‍රහයක් සහ මාර්ගෝපදේශ යක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් කළ හැකි යම් පසු දිනක සිට බලාත්මක විය යුතු ය.

## XVII වන කොටස

## අවසානය

### 1 වන පරිච්ඡේදය

### අදාළ කර ගැනීම

**457.** වෙනත් යම් ප්‍රඥප්තියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා මෙහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් මෙම පනතේ විධිවිධාන බලපැවැත්විය යුතුය.

අදාළ කර ගැනීම

## සංශෝධන

**458.** සමාගම් පනතේ 46 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ගණන් බේරා වසා දැමීම සඳහා" යන වචන වෙනුවට "අද්මිනිස්ත්‍රාසි කිරීම හෝ ඇවර කිරීම සඳහා" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

සමාගම් පනතේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම

**459**. සමාගම් පනතේ 71 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඈ) ඡේදයෙහි, "IX වන කොටසේ" යන වචන වෙනුවට " 2026 අංක දරන බේරාගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ X වන කොටසේ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධන කරනු ලැබේ.

සමාගම් පනතේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම

**460.** සමාගම් පනතේ 88 වන වගන්තිය, එම වගන්තියේ (1) උපවගන්තියේ "269 වන වගන්තියට" යන වචන සහ ඉල්ලකම් වෙනුවට "2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ 342 වන වගන්තියට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

සමාගම් පනතේ 88 වන වගන්තිය සංශෝධනය කිරීම

**461.** සමාගම් පනතේ 92 වන වගන්තියේ (1) උපවගන්තියේ (ඉ) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

සමාගම් පනතේ 92 වන වගන්තිය සංශෝධනය කිරීම

> "(ඉ) 2026 අංක ....දරන. බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ 298 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ සමාගමේ ඇවරකරුවකු පත් කිරීම සඳහා යෝජනා සම්මත කිරීමේ;"

**462.** සමාගම් පනතේ 97 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ "අධිකරණය විසින් සමාගම ගණන් බේරා වසා දමන ලෙසට" යන වචන වෙනුවට "අධිකරණය විසින් සමාගම ඇවර කරන ලෙසට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

සමාගම් පනතේ 97 වන වගන්තිය සංශෝධනය කිරීම

සමාගම් පනතේ 213 වන වගන්තිය සංශෝධනය කිරීම

**463.** (1) සමාගම් පනතේ 213 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ ඇති "මේ පනත යටතේ" යන වචන වෙනුවට මේ පනත යටතේ හෝ වෙනුවට "2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත යටතේ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ, (ආ) ඡේදයේ "වංක හෝ වංචනික ක්‍රියාවක් හා සම්බන්ධ" යන වචන වෙනුවට "වංකභාවය හෝ වංචාව පිළිබඳ " යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඈ) ඡේදය ඉවත් කිරීමෙන්;

(ඈ) එම වගන්තියේ (ඇ) ඡේදයේ "විනිශ්චය කරනු ලැබ ඇති", යන වචන වෙනුවට " විනිශ්චය කරනු ලැබ ඇති; හෝ " යන වචන ආදේශ කිරීමෙන්;

(ඉ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් -

"(ඉ) 2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ 411 වන වගන්තිය යටතේ කරන ලද යම් අධිකරණ ආඥාවකට යටත්ව" සිටින

(ඊ) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි, "සමාගමක කළමනාකරණයට" යන වචනවලට ඉක්බිතිව ම " හෝ 2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අර්ථානුකූලව ධුරදරන්නෙකු ලෙස පත් කරනු ලැබීමට හෝ එලෙස ක්‍රියා කරනු ලැබීමට" දී යන වචන සහ ඉලක්කම් ඇතුළත් කිරීමෙන්; සහ

(උ) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) 2026 අංක දරන බේරාගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ 84 වන වගන්තිය හෝ 90 වන වගන්තිය යටතේ කරන ලද බංකොලොත්භාවය පිළිබඳ ආඥාවකට යම් තැනැත්තකු යටත් වන අවස්ථාවක දී එම තැනැත්තා "2026 අංක දරන බේරා ගැනීම් පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ 138 වන වගන්තිය හෝ 139 වන වගන්තිය ප්‍රකාරව නිදහස් කිරීමට පෙර එම තැනැත්තා විසින් ප්‍රථමයෙන් අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කර අධිකරණය විසින් සුදුසු යයි සලකනු ලබන නියම හා කොන්දේසි මත ඒ සඳහා අවසර ලබා දී ඇත්නම් මිස සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රවර්ධකයකු හෝ සමාගමේ කළමනාකාරිත්වයට සෘජුවම හෝ අනාාකාරයකින් සම්බන්ධිත තැනැත්තකු නොවිය යුතු අතර 2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අර්ථානුකූලව ධූර දරන්නෙකු ලෙස පත් කරනු ලැබීම හෝ එසේ ක්‍රියා කරනු ලැබීම සිදු නොකළ යුතු ය."

සමාගම් පනතේ 214 වන වගන්තිය සංශෝධනය කිරීම

**464.** (1) සමාගම් පනතේ 214 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:-

(අ) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ, "වංක හෝ වංචනික ක්‍රියා හා සම්බන්ධයෙන් වරදකට" යන වචන වෙනුවට "වංකභාවය හෝ වංචාව පිළිබඳ වරදකට" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (1) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ, වස්තු භංගත්වයට පත් වූ" යන වචන වෙනුවට " (තැනැත්තා අධ්‍යක්ෂවරයකුව සිටියදී හෝ පසුව) වස්තු භංගත්වය පිළිබඳ ක්‍රියාදාමයේ කොන්දේසිය සපුරාලන ලද හෝ එම කොන්දේසිය සපුරාලීමකින් තොරව විසුරුවා හරින ලද" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) (1) වන උපවගන්තියේ, “සමාගමක කළමනාකාරණයට” යන වචන වලට ඉක්බිතිව හෝ 2026 අංක දරන බේරා ගැනීම් පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ 2 වන වගන්තියේ, අර්ථානුකූලව ධූර දරන්නකු වශයෙන් පත් කිරීමට හෝ එසේ ක්‍රියා කිරීමට” යන වචන ඇතුළත් කිරීමෙන්;

(ඈ) (1) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

“ (අ) 1 වන උපවගන්තියේ (ඈ) ඡේදයේ කාර්ය සඳහා සමාගමක අධ්‍යක්ෂවරයකු ලෙස යම් තැනැත්තකු පත් කිරීමට නුසුදුසු ද යන්න තීරණය කිරීමේ දී, අධිකරණය විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතු ය:-

(අ) සමාගමක් හා අදාළව එම තැනැත්තා විසින් වැරදි ක්‍රියාවක් හෝ කාර්යභාරය හෝ විශ්වාසය කඩ කිරීමක් සිදු කර තිබේ ද යන්න;

(ආ) සමාගමක අධ්‍යක්ෂවරයකු වීමේ හේතුව මත අදාළ වන වෙනත් යම් නෛතික හෝ නියාමන අවශ්‍යතාවක් එම තැනැත්තා විසින් කඩ කර තිබේ ද යන්න;

(ඇ) සමාගමට අදාළ යම් නෛතික හෝ නියාමන අවශ්‍යතාවයක් සමාගමක් විසින් උල්ලංඝනය කිරීමට සිදු වූ හේතුවක් හෝ හේතු සඳහා අදාළ තැනැත්තා කෙතරම් දුරට (එසේ ඇත්නම්) වගකිව යුතු ද යන්න;

(ඈ) වස්තු භංගත්ව නඩු කටයුතු පිළිබඳ කොන්දේසි සමාගම විසින් සපුරා තිබීමේ හේතුව හෝ හේතු සඳහා අදාළ තැනැත්තා (එසේ ඇත්නම්) කෙතරම් දුරට වගකිව යුතු ද යන්න;

(ඉ) (අ), (ආ), (ඇ) සහ (ඈ) යන ඡේද යටතට වැටෙන අවස්ථා ගණන සහ වාර ගණන; සහ

(ඊ) යම් සමාගමක් සම්බන්ධයෙන් නැත්තාගේ ක්‍රියාකලාපය හේතු කොටගෙන සිදු වූ පාඩුවේ හෝ හානියේ ප්‍රමාණය'';

(ඉ) එම වගන්තියේ (3) වන උපවගන්තියේ, ''රෙජිස්ට්‍රාර්වරයා'' යන වචනයට ඉක්බිතිව ම '' හෝ නිල දේපළ භාර ගැනුම්කරු'' යන වචනය එකතු කිරීමෙන්;

(ඊ) (5) වන උපවගන්තියේ එන ''රෙජිස්ට්‍රාර්වරයා'' යන වචනවලට ඉක්බිතිවම '' සහ 2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ අර්ථානුකූලව අධිකාරිය'' යන වචන සහ ඉලක්කම් ඇතුළත් කිරීමෙන්;

(උ) එම වගන්තියේ (7) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

''(8) මේ වගන්තියේ කාර්ය සඳහා -

(අ) සමාගමේ ඈවර කිරීම ආරම්භ වී එම ඈවර කිරීම සම්බන්ධයෙන් ''2026 අංක දරන බේරාගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ 302 වන වගන්තිය එම සමාගමට අදාළ නොවන්නේ නම් හෝ අදාළ වීම අවසන් වන්නේ නම්;

(ආ) සමාගම අද්මිනිස්ත්‍රාසි කිරීම ආරම්භ වී ඇත්නම් හෝ;

(ඇ) සම්පූර්ණයෙන්ම සමාගමේ දේපළ සහ එහි ව්‍යාපාරය 2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ

වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත යටතේ දේපළ භාරගැනුම්කරුවකු පත් කර ඇත්නම්,

සමාගමක් විසින් වස්තුභංගත්ව නඩු කටයුතුවල කොන්දේසි සපුරාලනු ලබයි.

(ඌ) එම වගන්තියේ (8) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(9) මෙම වගන්තියේ කාර්ය සඳහා, කවර හෝ අධිකරණ බල සීමාවක් තුළ (අතුරු නඩු කටයුතු ඇතුළු) කවර හෝ විස්තරයකට අයත් වස්තුභංගත්ව නඩු කටයුතුවලට සමාගම ඇතුළත් වන්නේ නම් විදේශීය සමාගමක් විසින් වස්තුභංගත්ව නඩු කටයුතුවලට අදාළ කොන්දේසි සපුරාලනු ලැබේ.".

**465.** සමාගම් පනතේ 220 වගන්තියේ (1) උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- සමාගම් පනතේ 220 වන වගන්තිය සංශෝධනය කිරීම

(අ) "යම් සමාගමක "යන වචන වෙනුවට "යම් පොදු සමාගමක" යන වචන ආදේශ ; සහ

(ආ) "දින සිට" යන වචන වෙනුවට "දින සිට" යන වචනය ආදේශ කිරීමෙන්.

**466.** සමාගම් පනතේ 228 වන වගන්තිය (ඉ) වන ඡේදය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. සමාගම් පනතේ 228 වන වගන්තිය සංශෝධනය කිරීම

**467.** සමාගම් පනතේ 246 වන වගන්තියේ වගන්තිය (5) උපවගන්තියේ "හෝ සමාගම ගණන් බේරා වසා දමා" යන වචන වෙනුවට "හෝ සමාගම ඇවර කිරීම ආරම්භ වී" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධන කරනු ලැබේ. සමාගම් පනතේ 246 වන වගන්තිය සංශෝධනය කිරීම

සමාගම් පනතේ 255 වන වගන්තිය සංශෝධනය කිරීම

**468.** (1) සමාගම් පනතේ 255 වන වගන්තියේ "ණයහිමියා" යන වචනයේ අර්ථ නිරූපණය, එහි "357 වගන්තියේ විධිවිධාන ප්‍රකාර ඒ සමාගමෙන් ණයක් තමන්ට අයවිය යුතු යයි හිමිකම්පෑමට හිමිකම් ලබන තැනැත්තකු" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ 426 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ණයක් ගෙවීමට ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමට හිමිකම් ලබන තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) සමාගම් පනතේ 256 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "XIII වන කොටස යටතේ" යන වචන වෙනුවට "2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ IX වන කොටස යටතේ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(3) සමාගම් පනතේ 257 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "ඇවර කිරීම හෝ" යන වචන වෙනුවට "2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ XII වන කොටසට අනුකූලව යම් සමාගමක් ඇවර කිරීම හෝ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(4) සමාගම් පනතේ 258 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලැබේ:-

"ණය හිමියන් සම්බන්ධ වන්නේ නම් අධ්‍යක්ෂවරුන් විසින් ලබාදිය යුතු ප්‍රකාශය

**258අ.** (1) මේ කොටස යටතේ යම් වැඩපිළිවෙළකට හෝ ඒකාබද්ධ කිරීමකට හෝ සමථයකට ණයහිමියන් සම්බන්ධ වන අවස්ථාවක, 256 වන වගන්තිය යටතේ -

(අ) සමාගමේ සියලුම අධ්‍යක්ෂවරුන් විසින්; හෝ

(ආ) අධ්‍යක්ෂවරුන් දෙදෙනකුට වැඩිය සිටින සමාගමක සමාගමේ අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරය විසින් ඉදිරිපත් කරනු ලබන.

(2) වන උපවගන්තියේ කොන්දේසි සපුරාලන ලිඛිත ප්‍රකාශයක්

සමඟ ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස අධිකරණය විසින් බාරගනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කොන්දේසි වනුයේ ප්‍රකාශයේ -

(අ) පහත දැක්වෙන කරුණු, එනම් :-

(i) ප්‍රකාශනය කරනු ලබන අධ්‍යක්ෂවරුන් සමාගමේ කටයුතු පිළිබඳව පූර්ණ විමර්ශනයක් කර ඇති බව; සහ

(ii) එසේ කිරීමෙන් පසු, සමාගමේ ණය සම්පූර්ණයෙන්ම ගෙවා බේරුම් කිරීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු මාස දොළහකට නොවැඩි කාලයක් ඇතුළත සමාගමට හැකි වන බවට අධ්‍යක්ෂවරුන් මතයක් දරන බව,

සඳහන් විය යුතු වීම;

(ආ) සමාගමේ කටයුතු, ව්‍යාපාර, දේපළ සහ මූල්‍ය තත්ත්වයන් පිළිබඳ පහත දැක්වෙන කරුණු, එනම්:-

(i) එම ප්‍රකාශනය සිදුකිරීමට පෙර, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් වන දිනයකදී ප්‍රකාශනය සිදු කිරීමට සහ ඒ ඕනෑම අවස්ථාවක දින අනූවකටකට පෙර නොවන, ප්‍රායෝගික වූ, හැකිතාක් පසු දිනක-

(අ) තොග ලැයිස්තුවක් ඇතුළත් එහි එම තොගවලින් ලබාගත හැකි අපේක්ෂිත මිල සහ දේපළ පිළිබඳ තොරතුරු;

(ආ) සමාගමේ ණය සහ වෙනත් බැරකම්;

(ඇ) සමාගමේ එක් එක් ණය හිමියන්ගේ නම සහ ලිපිනය;

(ඈ) එක් එක් ණයහිමියා විසින් දරනු ලබන පිළිබැඳීම හෝ පිළිබැඳීම් පිළිබඳ විස්තරයක් (ඇත්නම්); සහ

(ඉ) එක් එක් පිළිබැඳීම නිර්මාණය කළ දිනය, යන කරුණු ඇතුළත්විය යුතුය; සහ

(ii) එම ප්‍රකාශය නිකුත් කරන දිනට සමාගමේ අධ්‍යක්ෂවරුන් වන තැනැත්තන්ගෙන් එක් අයකු හෝ කිහිප දෙනකු විසින්;

(ඇ) සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමක දී; සහ

(ඈ) ඉල්ලුම්පත ඉදිරිපත් කරන ලද දිනට පෙරාතුව දින විසිඑකක් ඇතුළත දී,

කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක් මඟින් සනාථ කළ යුතු ය.

(3) ප්‍රකාශනයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ සමාගමට සිය ණය සම්පූර්ණයෙන් ම ගෙවීමට හැකි වනු ඇතැයි යන මතය සඳහා සාධාරණ හේතු නොමැතිව (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශනයක් සිදු කරනු ලබන අධ්‍යක්ෂවරයකු වරදක් සිදු කරනු ලබයි.

බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත යටතේ නඩු

**258ආ.** මේ කොටස, 2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනත යටතේ වූ නඩු කටයුතුවලට අදාළ නොවන්නේ ය.''

සමාගම් පනතේ 394 වන වගන්තිය සංශෝධනය කිරීම

**469.** සමාගම් පනතේ 394 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ: -

(අ) එම වගන්තියේ (4) වන උපවගන්තියේ -

(i) ''සමාගමක් ගණන් බේරා වසා දමනු ලබන අවස්ථාවක '' යන වචන වෙනුවට

"සමාගමක් ඇවර කිරීමට අදාළව," යන වචන ආදේශ කිරීමෙන්;

(ii) එම උපවගන්තියේ "සම්පූර්ණයෙන් ගණන් බේරා වසා දමා ඇති බවත්" යන වචන වෙනුවට " 2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ 311 වන වගන්තිය යටතේ ඇවර කිරීම අවසන්ව ඇති බවත්"; සහ

(iii) "යවනු ලැබිය යුතුය " යන වචන වෙනුවට " යවනු ලැබිය යුතු අතර මෙම උපවගන්තිය අදාළ වන්නා වූ 2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තු භංගත්ව (ආයතනික සහ පෞද්ගලික) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අර්ථානුකූලව අධිකාරිය වෙත ලිඛිත දැන්වීමක් ලබා දිය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) එම වගන්තියේ (5) වන උපවගන්තියේ,

(i) "රෙජිස්ටරයෙන්" යන වචනය වෙනුවට "රෙජිස්ටරයෙන්" යන වචනය ආදේශ කිරීමෙන්; සහ

(ii)"ලේඛනයෙන් නම කපා හරිනු ලැබූ සමාගමක්" යන වචන වලින් ආරම්භව එම උපවගන්තියේ අවසානය දක්වා වූ වචන ඉවත් කර යන වචන වෙනුවට " 2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ XII වන කොටසේ හෝ 408 වන වගන්තියේ විධිවිධාන ලේඛනයන් නම කපා හරිනු ලැබූ සමාගමක් සඳහා අදාළ වීම කෙරෙහි කිසිදු බලපෑමක් හෝ සීමා කිරීමක් මෙම උපවගන්තියේ විධිවිධාන මඟින් ඇති නොකළ යුතු ය. සීමා නොකළ බලනොපෑ යුතු ය" යන වචන ආදේශ කිරීමෙන්.

**470.** (1) සමාගම් පනතේ 431 වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ: -

සමාගම් පනතේ 431 වන වගන්තිය සංශෝධනය කිරීම

(අ) එම උපවගන්තියේ (5)(ආ) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "440 වන වගන්තියේ" යන වචන වෙනුවට 2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ 374 වන වගන්තියේ " යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (6) එම වගන්තිනයේ උපවගන්තියේ -

(i) "ස්ථාවර ඇපයට" යන වචන වෙනුවට "ස්ථාවර ඇපය" යන වචන ආදේශ කිරීමෙන්;

(ii) එම උපවගන්තියේ "427 වන වගන්තියේ" යන වචන වෙනුවට"428 වන වගන්තියේ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(iii) " ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ඒ ඉඩම සම්බන්ධයෙන්" යන වචනය වෙනුවට "ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ඒ" යන වචන ආදේශ කිරීමෙන්.

**471.** (1) සමාගම් පනතේ 433 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

සමාගම් පනතේ 433 වන වගන්තිය සංශෝධනය කිරීම

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ, "ගණන් බේරා වසා දැමීම" යන වචන වෙනුවට "ඈවර කිරීම" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම වගන්තියේ (5) වන උප වගන්තියේ (ආ) ඡේදයේ "අනුකූලව" සහ "440 වන වගන්තියේ" යන වචන වෙනුවට පිළිවෙලින් "අනුකූලව" සහ "2026 අංක දරන බේරාගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනයක සහ පුද්ගලික) පනතේ 374 වන වගන්තියේ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) එම වගන්තියේ (6) වන උපවගන්තියේ, “XV වන කොටස” යන වචන වෙනුවට “2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ XIII වන කොටස” යන වචන ආදේශ කිරීමෙන්.

සමාගම් පනතේ 529 වන වගන්තිය සංශෝධනය කිරීම

**472.** සමාගම් පනතේ 529 වන වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) එම උපවගන්තියේ (ආ) ඡේදයේ “අධ්‍යක්ෂවරයා” යන අර්ථ නිරූපණයේ “197” යන ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට “ 14(1)(ආ) සහ 214(1), (ඇ) සහ ඉලක්කම් සහ යන වචන ආදේශ කිරීමෙන් (එම ඡේදයේ අවසාන යොමුව හැර)”214(1 අ) (ආ), 214(3); යනවචන ආදේශ කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (ඇ) ඡේදයේ ඇති “අධ්‍යක්ෂකවරයා” යන අර්ථ නිරූපණයේ “197” යන වචන වෙනුවට, “197, 214(1) (ආ), සහ 214(ඇ) (එම ඡේදයේ අවසාන යොමුව හැර)” යන වචන 214(1අ) (ආ), 214(3),” සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්,”; සහ

(ඇ) “ භාර ගැනුම්කරු” යන අර්ථ නිරූපණයේ, “XV වන කොටස”යන වචන වෙනුවට “2025 අංක.... දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ XIII වන කොටස” යන වචන ආදේශ කිරීමෙන්.

සමාගම් පනතේ පළමු උපලේඛනය සංශෝධනය කිරීම

**473.** සමාගම් පනතේ පළමු උපලේඛනයේ 34 වන ඡේදයේ “විශේෂ යෝජනා සම්මතයක් මගින් සමාගම ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා කොටස් හිමියන් විසින් තීරණය කරනු ලැබිය හැකි ය.” යන වචන වෙනුවට “විශේෂ යෝජනා සම්මතයක් මගින් සමාගමේ ඇවරකරුවකු පත් කිරීමට කොටස් හිමියන් තීරණය කරනු ලැබිය හැකි ය” යන වචන ආදේශ කිරීමෙන් පළමුවන උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

සමාගම් පනතේ හයවන උපලේඛනය සංශෝධනය කිරීම

**474.** (1) සමාගම් පනතේ හයවන උපලේඛනය පහත දැක්වෙන වචන ඉවත් කිරීම මගින් එම උපලේඛනය සංශෝධනය කරනු ලැබේ -

(අ) “401 වන වගන්තිය (අද්මිනිස්ත්‍රාසිකරු පත් කිරීමට මණ්ඩලය සතු බලතල)”; සහ

(ආ) “415 වන වගන්තිය (අද්මිනිස්ත්‍රාසිකරුගේ ධුරයේ පුරප්පාඩුව)”.

1988 අංක 72 දරණ සමථ මණ්ඩල පනතේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම

**475.** 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ තුන්වන උපලේඛනය 9 වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් පනතේ තුන්වන උපලේඛනය සංශෝධනය කරනු ලැබේ:-

“9. “2026 අංක බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ III, IV, V හෝ VI යන කොටස් යටතේ වූ ක්‍රියාමාර්ග”.

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 175 වන වගන්තිය සංශෝධනය කිරීම

**476.** (1) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 175 වන වගන්තියේ (6) උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින්:- “ 2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ XII වන කොටස යටතේ පත් කරන ලද ඇවර කරන්නකු හැර යම් අස්ථිත්වයක ඇවර කරන්නකු” :-

(ආ) එහි (ආ) ඡේදයේ ”අධිකරණයක් විසින්” යන වචනයට ඉක්බිතිව පහත දැක්වෙන කොටස එකතු කිරීම මගින්:- “2026 අංක දරන බේරා ගැනීම්, පුනරුත්ථාපන සහ වස්තුභංගත්ව (ආයතනික සහ පුද්ගලික) පනතේ XIII වන කොටස යටතේ පත් කරන ලද දේපළ භාර ගැනුම්කරවකු හැර” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) (ඇ) ඡේදය ඉවත් කිරීමෙන්.

## 2 වන පරිච්ඡේදය

### ඉවත් කිරීම

**477.** (1) සමාගම් පනතේ පහත සඳහන් විධිවිධාන මෙයින් ඉවත් කරනු ලැබේ :- ඉවත් කිරීම

(අ) 219 වන සහ 227 වන වගන්ති;

(ආ) IX වන කොටස;

(ඇ) 393 වන, 394 වන සහ 395 වන වගන්ති හැර XII වන කොටස;

(ඈ) XIII වන කොටස;

(ඉ) XV වන කොටස;

(ඊ) 497 වන වගන්තිය; සහ

(උ) හත්වන උපලේඛනය, අටවන උපලේඛනය, නවවැනි උපලේඛනය, දසවන උපලේඛනය, දොළොස්වන, උපලේඛනය සහ දහතුන්වන උපලේඛනය.

(2) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 168 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

(3) (97 වන අධිකාරය වූ) වස්තුභංගත්ව ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ.

## 3 වන පරිච්ඡේදය

### අන්තර්කාලීන විධිවිධාන සහ ව්‍යාවර්තන

**478.** (1) මේ පනතේ වෙනත් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව එය නොතකා වස්තු භංගත්වයට අදාළ - අන්තර්කාලීන විධිවිධාන සහ ව්‍යාවර්තන

(අ) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙර පවරන ලද දැනට විභාග වෙමින් පවතින නඩු සහ මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙර ආරම්භ කරන ලද දැනට විභාග වෙමින් පවතින නීති කෘත්‍යය; සහ

(ආ) එම නඩු හෝ නීති කෘත්‍යය සම්බන්ධයෙන් ධුර දරන සියලු නිලධරයන්,

මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙර සහ වස්තුභංගත්වයට අදාළව පවතින නඩු මේ පනත බලාත්මක නොවූ ලෙස සලකා විභාගකොට අවසන් කළ යුතු අතර, මෙම නඩු පවරනු ලැබූ සහ මෙම නඩු කටයුතු ආරම්භ කරනු ලැබුවේ යම් ලිඛිත නීතියක් යටතේ ද එම ලිඛිත නීතිය දැනට බලාත්මකව පවතින ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුවද එය නොතකා සමාගම් පනතේ 396 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති සමාගම් ඈවර කිරීමේ ගිණුම, මේ පනත බලාත්මක නොවූ ලෙස සලකා (1) වන උපවගන්තියේ සඳහන් සියලු නඩු සහ නීති කෘත්‍ය අවසන් කරනු ලැබී දින සිට අවුරුදු පහක් ගතවනතුරු ක්‍රියාත්මකව පැවැතිය යුතු අතර ඉන්පසු සමාගම් ඈවර කිරීමේ ගිණුමේ බැරට ඇති සියලු මුදල්-

(අ) රෙජිස්ට්‍රාර්වරයා විසින් වස්තුභංගත්ව අතිරික්ත ගිණුමට බැර කරනු ලැබිය යුතු ය; සහ

(ආ) මේ පනතේ 432 වන වගන්තියේ (6) වන වගන්තියේ (ආ) ඡේදය, (7) වන සහ (9) වන උපවගන්තිවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

(3) 8 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් දිනයක් නියම කරන තුරු සමාගම් පනත යටතේ මේ පනත ක්‍රියාත්මක කිරීමේ දිනයට පෙරාතුවට නිල දේපළ භාරගැනුම්කරු තනතුර දරන තැනැත්තා මෙම පනත ක්‍රියාත්මක වීමේ දින සිට මේ පනතේ කාර්ය සඳහා නිල දේපළ භාරගැනුම්කරු වශයෙන් කටයුතු කළ යුතු ය.

(4) ඉවත් කරන ලද ප්‍රඥාප්තිවලට අදාල අවශ්‍ය අන්තර් කාලීන විධිවිධාන මෙම පනත මගින් ප්‍රතිපාදනය කර නොමැති විට, එම කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් අවශ්‍ය නියෝග සාදනු ලැබිය හැකි ය.

අන්තර්කාලීන විධිවිධාන: වස්තුභංගත්ව වෘත්තිකයන්

**479.** (1) මෙම පනත ක්‍රියාත්මක වීමේ දින සිට හෝ නියෝග මගින් විධිවිධාන සලස්වන දිනයක් දක්වා මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසු මාස විසිහතරක කාලයක් සඳහා හෝ නියමයක් මගින් විධිවිධාන සලසා ඇති වෙනත් කාලසීමාවක් සඳහා -

(අ) ප්‍රධාන ධුර දරන්නකු ලෙස පත් කිරීමට ලිඛිත අනුමැතිය ලබා දී ඇතිතාක්; සහ

(ආ) (2) වන උපවගන්තියට යටත්ව නියෝග මගින් නියම කර ඇති තැනැත්තන් කාණ්ඩයකට අයත් වන,

වස්තු භංගත්වය වෘත්තිකයකු ලෙස 14 වන වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නියෝග සාදන තුරු යම් තැනැත්තකු -

(අ) ප්‍රධාන නිලතල දරන්නකු ලෙස පත් කිරීමට ලිඛිත කැමැත්ත දෙන තාක් කල්; සහ

(ආ) එම තැනැත්තා පහත සඳහන් තැනැත්තන්ගේ කාණ්ඩ එකකට හෝ වැඩි ගණනකට අයත් වන තාක් දුරට, එනම් -

(i) වසර හතකට නොඅඩු පළපුරුද්දක් ඇති නීතිඥවරයකු වන්නේ නම්;

(ii) වරලත් ගණකාධිකාරී ආයතනයේ පාඨමාලාව හදාරා ඇති සාමාජිකයකු වන්නේ නම්;

(iii) එම තැනැත්තා වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයේ සාමාජිකයකු වන්නේ නම්;හෝ

(iv) සමාගම් පනත ද ඇතුළුව, මෙම පනත ක්‍රියාත්මක වන දිනට පෙර ඇවරකරුවකු ලෙස සේවය කර ඇති යම් තැනැත්තකු නම් ,

එම තැනැත්තා 14 වන වගන්තිය යටතේ වස්තුභංගත්ව වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වි ඇති බවට සලකනු ලැබිය යුතු ය.

පළමුවන උපලේඛනය

[3 වන සහ 5 වන වගන්ති]

## අධිකාරියේ පත් කළ සාමාජිකයන් පිළිබඳ විධිවිධාන

1. අධිකාරියේ පත් කරන ලද සෑම සාමාජිකයකු ම, එම සාමාජිකයා මරණයෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් කලින් ධූරය හිස් වන්නේ නම් මිස, පත් කළ දින සිට වසර තුනක කාලයක් නිලය දරන්නේ ය. නම් සහ එම සාමාජිකයා ධූරයෙන් ඉවත් කර ඇත්නම් මිස, අනුක්‍රමික හෝ අන්‍යාකාරයකට වාර එකකට වඩා වැඩි නොවන වාර ගණනක් සඳහා නැවත පත්කිරීම සඳහා සුදුසුකම් ලබයි. සභාපතිවරයාගේ ධූර කාලය, පත්කළ සාමාජිකයකුගේ සාමාජිකත්ව කාල සීමාව විය යුතු ය.

2. යම් තැනැත්තකු -

(අ) එම තැනැත්තා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, යම් පළාත් සභාවක සභිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එසේ වූවහොත්;

(ආ) එම තැනැත්තා, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ඔහුගේ පුරවැසිභාවය අවසන් වන්නේ නම්;

(ඇ) එම තැනැත්තා, වස්තු භංගත්වයට පත්වූවකු බවට නිසි බලය ඇති අධිකරණයෙන් ප්‍රකාශ කර ඇත්නම්;

(ඈ) අධිකාරියේ සමාජිකයකු වශයෙන් එම තැනැත්තා සිය කාර්යය සමඟ ගැටුම් සහගත බැඳියාවක් පැවැත්වූ බවට හෝ පවත්වන බවට සොයාගෙන ඇත්නම්;

(ඉ) රෝගීභාවය හෝ හෝ වෙනත් යම් මානසික හෝ ශාරීරික ආබාධයක් හේතුවෙන් ධූරයේ කටයුතු කිරීමට නොහැකි හෝ නොහැකිභාවයට පත්වන්නේ නම්;

(ඊ) එම තැනැත්තා, සිහි විකල තැනැත්තකු බවට නිසි අධිකරණ බලය සහිත අධිකරණයක් විසින් ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්; හෝ

(උ) එම තැනැත්තා, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් මගින් පනවන ලද සිරදඬුවමක් විඳිමින් සිටින්නේ නම් හෝ එවැනි සිරදඬුවමක් විඳ ඇත්නම්,

ඔහු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීම සඳහා හෝ සාමාජිකයකු ලෙස තවදුරටත් කටයුතු කරනු ලැබීම සඳහා නුසුදුස්සකු වන්නේ ය.

3. (1) අධිකාරියේ පත්කරන ලද සාමාජිකයකුගේ ධුරය පහත දැක්වෙන අවස්ථාවල දී හිස් වන්නේ ය: -

(අ) එවැනි සාමාජිකයෙකුගේ මරණය සිදුවීම මත;

(ආ) එවැනි සාමාජිකයකු ජනාධිපතිවරයා වෙත ලිඛිතව ආමන්ත්‍රණය කරන ලිපියක් මගින් එම ධුරයෙන් ඉල්ලා අස්වීම මත සහ එම ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් පිළිගත් දින සිට බලාත්මක වේ;

(ඇ) එම සාමාජිකයා ධුරයෙන් ඉවත් කිරීම මත;

(ඈ) කල්තියා ලිඛිතව නිවාඩු ලබාගැනීමෙන් තොරව, අධිකාරියේ අඛණ්ඩ රැස්වීම් තුනකට සහභාගී නොවීම මත;

(ඉ) එම සාමාජිකයා සිය ධුර කාලය අතරතුර, එම ධුරයේ කාර්යවලට පරිභාහිර යම් සේවා නියුක්තියක යෙදීම මත; හෝ

(උ) එවැනි සාමාජිකයකුගේ ධුර කාලය අවසන් වීම මත.

(2) වංකභාවය හේතුවෙන් හෝ අධිකාරියේ සාමාජිකයකු වීම සඳහා මෙම උපලේඛනය යටතේ හෝ නුසුදුස්සකු බවට පත්වන යම් සභාපතිවරයකු හෝ පත්කළ සාමාජිකයකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත, ජනාධිපතිවරයාට නිළධාරියා ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(3)(අ) රෝගාතුරවීම හෝ වෙනත් ආබාධයක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් මත අධිකාරියේ සභාපතිවරයාට තම ධුරයේ කාර්යය ඉටු කිරීමට

තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, සභාපතිවරයා වෙනුවට කටයුතු කිරීමට සුදුසුකම් ඇති වෙනත් යම් සාමාජිකයකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(ආ) අධිකාරියේ සාමාජිකයකු රෝගාතුර වීම හෝ වෙනත් යම් ආබාධයක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ජනාධිපතිවරයා විසින් සාමාජිකයා නොසිටින කාල සීමාව සඳහා වෙනත් යම් සුදුසුකම් ලත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(4) පත්කල සාමාජිකයකුගේ ධූර කාලය අවසන් වීමට පෙර එම සාමාජිකයාගේ ධූරය හිස් වූ අවස්ථාවක, ජනාධිපතිවරයා විසින්, 3 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ දක්වා ඇති කාර්ය පටිපාටියට අනුගමනය කරමින්, අදාළ සාමාජිකයාගේ නොගෙවී ඉතිරිව ඇති ධූර කාලය සඳහා ධූරය දැරීම වෙනත් තැනැත්තකු පත්කළ යුතු ය.

(5) ගත නොවූ ධූර කාලයට වැඩ බැලීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබූ අවස්ථාවක, එම කාලය "ධූර කාලයක්" ලෙස සලකනු නොලැබිය යුතු ය.

(6) අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හේතුව මත හෝ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව මත අධිකාරියේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් වලංගු නොවන බවට නොසැලකිය යුතු ය.

4. (1) අධිකාරියේ සාමාජිකයන් අවම වශයෙන් මසකට එක් වතාවක් හෝ අවශ්‍යයි සලකනු ලබන යම් වාර ගණනක් රැස්විය යුතු ය. එවැනි රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු ය.

(2) අධිකාරියේ සියලුම රැස්වීම්වල සභාපතිවරයා මුලසුන දැරිය යුතු ය. අධිකාරියේ කිසියම් රැස්වීමක සභාපතිවරයා නොමැති අවස්ථාවකදී, එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයින් විසින් එම රැස්වීමේ මුලසුන දැරීමට අධිකාරියේ එක් සාමාජිකයකු තෝරා ගනු ලැබිය යුතු ය.

(3) අධිකාරියේ යම් රැස්වීමක මුලසුන දරන සභාපතිවරයාට හෝ සාමාජිකයාට තමාගේ ම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) මෙම පනතේ අනෙකුත් විධිවිධානවලට යටත්ව, අධිකාරියේ රැස්වීම් පැවැත්වීම සහ එවැනි රැස්වීම් වල කාර්යපටිපාටිය විධිමත් කිරීම සඳහා අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

5. (1) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින්, කලින් කලට තීරණය කරනු ලබන තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය.

(2) අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට අධිකාරියේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ මුද්‍රාව අධිකාරියේ අවසරය ඇතිව සහ ඔවුන් පැමිණ සිටීමේ සංකේතයක් ලෙස සාධන පත්‍රයකට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු අතර, සභාපතිවරයා සහ අධිකාරියේ තවත් එක් සාමාජිකයකු ඉදිරියේ හැර, කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය:

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අධිකාරියේ මුද්‍රාව තබන අවස්ථාවක දී සභාපතිවරයාට පැමිණ සිටීමට නොහැකි වන අවස්ථාවක දී තත් කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරන ලද අධිකාරියේ වෙනත් යම් සාමාජිකයකුට මේ උපවගන්තියේ ඉහත කී විධිවිධානවලට අනුකූලව එම අවස්ථාවේ දී එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය හැකි ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබා ඇති සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ ලේඛනයක් අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතු ය.

(5) අධිකාරියේ මුද්‍රාව දැන දැනම හෝ සිතාමතා අවභාවිත කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් සිදුකරන අතර, ඒ පිළිබඳව මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමේ දී ඒ තැනැත්තා රුපියල් මිලියන දෙකකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් වන්නේ ය.

6. (1) මෙම පනතේ විධිවිධානවලට යටත්ව, අධිකාරියේ බලතල සහ කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව කිරීම, සිදු කිරීම සහ ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවා

නියුක්තයන් අධිකාරිය විසින් සේවා නියුක්තකයින් කර අධිකාරිය විසින් සේවයේ නියුක්ත කිරීම හෝ පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ විධිවිධානවලට යටත්ව අධිකාරියට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:-

(අ) (1) වන ඡේදය යටතේ පත් කරන ලද අධිකාරියේ නිලධරයන් සහ සේවා නියුක්තයන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම;

(ආ) (1) වන ඡේදය යටතේ පත් කරන ලද නිලධරයෙක් සහ සේවකයින්ගේ සේවා නියමයන් සහ කොන්දේසි තීරණය කිරීම; සහ

(ඇ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව එම නිලධරයන් සහ සේවකයන්ට ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණ තීරණය කිරීම.

(3) (අ) අධිකාරියේ සියලුම නිලධරයන් සහ සේවා නියුක්තයන්, තම රැකියාව භාරගෙන මසක් ඇතුළත තම ඥාතීන් සහ අදාළ තැනැත්තන් ඇතුළු අධිකාරියේ කටයුතු සහ ගනුදෙනු පිළිබඳව එම තැනැත්තාට ඇති ඍජු හෝ ඍජු නොවන සම්බන්ධතාවයක් පිළිබඳ අධිකාරිය වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

(ආ) යම් අවස්ථානුගත කරුණක් යම් සම්බන්ධතාවයක් හෝ වෙනත් සිද්ධියක්, අධිකාරයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ අධිකාරියේ වෙනත් නිලධරයකුට හෝ සේවා නියුක්තයක කෙරෙහි ගැටුමක් හෝ බැඳීමක් ඇති කරවන හෝ ඇති කරවන බවට තේරුම්ගත හැකි අවස්ථාවක අතර -

(i) ඒ අවස්ථානුගත කරුණු සම්බන්ධතාව හෝ වෙනත් සිද්ධිය පිළිබඳව අධිකාරිය වෙත ලිඛිතව හෙළිදරව් කිරීමක් කළ යුතු ය; සහ

(ii) එම කරුණ පිළිබඳව අධිකාරියෙන් නිලධරයාට වැඩිදුර උපදෙස් ලැබෙන තුරු එම කරුණ සම්බන්ධයෙන් කටයුතු කිරීම හෝ ගණුදෙනු කිරීම නතර කළ යුතු ය.

(ඇ)හෙළිදරව් කිරීමක් සිදු වූ පසු, යම් ගැටුමක් කළමනාකරණය කළ යුතු ආකාරය පිළිබඳව අධිකාරිය තීරණය කළ යුතු අතර, එම කාර්යය සඳහා අවශ්‍ය විය හැකි උපදෙස් ලබා දිය හැකි ය.

(4) අධිකාරිය විසින් මුදල් විෂය පවරන ලද අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව නිලධරයන්ගේ සහ සේවා නියුක්තිකයින් සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ සහ නම් කළ අයගේ ප්‍රයෝජනය සඳහා විශ්‍රාම වැටුප් අරමුදල් සහ අර්ථසාධක අරමුදල් සහ යෝජනා ක්‍රම ස්ථාපිත කර නියාමනය හැකි ය, එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට අධිකාරිය දායක විය යුතු ය.

(5) අධිකාරියේ නිලධරයන්ට සහ සේවා නියුක්තිකයන්ට අදාළ වන ආචාර ධර්ම සංග්‍රහයක් අධිකාරිය විසින් ස්ථාපිත කළ යුතු ය.

(6) යම් තැනැත්තකු -

(අ) අධිකරණයක් විසින් හෝ විනිශ්චයාධිකාරයක් විසින් විෂමාචාර ක්‍රියාවක් සම්බන්ධයෙන් වරදකරු වී තිබේනම් හෝ නියාමන අධිකාරියක් විසින් ගනු ලැබූ විනයානුකූල පියවරකට යටත් කර තිබේ නම්;

(ආ) මීට පෙර ධූරයෙන් පහ කර තිබේ නම්; හෝ

(ඇ) මෙම පනතේ හෝ එය යටතේ සාදන ලද ආඥාව හෝ රීති අදාළ තැනැත්තා විසින් කඩ කර තිබේ නම්,

අධිකාරිය එම තැනැත්තා අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් නොකළයුතු ය.

(7) අධිකාරියේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ සිටින යම් නිලධරයකු, නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කළ හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කළ හැකි ය.

(8) රාජ්‍ය සේවයේ සිටින යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබුවහොත්, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන

වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයා සඳහා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(9) රාජ්‍ය සේවයේ සිටින යම් නිලධරයකු අධිකාරියේ කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ස්ථිර ලෙස පත් කරනු ලැබුවහොත්, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම නිලධරයා සඳහා සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(10) නිශ්චිත කාලසීමාවක් සඳහා රජයට සේවය කිරීමට එකඟ වූ යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ යොදවන්නේ නම්, එම තැනැත්තා විසින් අධිකාරිය කළ සේවයේ යෙදෙන යම් සේවා කාලයක්, තුළ එම ගිවිසුමේ වගකීම් ඉටු කිරීමේ කාර්යය සඳහා රජයට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(11) අධිකාරිය විසින් මේ ආයතනයේ හෝ නියාමන අධිකාරියේ අතර එකඟ වූ පැවරුමක් මත අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පිහිටි වෙනත් රාජ්‍ය ආයතන හෝ නියාමන අධිකාරීන් වෙත තම නිලධාරීන් හෝ සේවා නියුක්තිකයන් ඔවුන්ගේ කැමැත්ත ඇතිව එම නිලධරයාගේ හෝ සේවකයාගේ ද්විතියන පදනමින් අනුයුක්ත කිරීමට යෝජනා කළ හැකි ය. අනුයුක්ත කිරීමේ කාලසීමාව අධිකාරියට සිදුකරන සේවයක් ලෙස සලකනු ලැබේ.

7. (1) (අ) අධිකාරියේ හෝ එහි සාමාජිකයකුගේ හෝ එහි සේවා නියුක්තිකයකුගේ හෝ යම් අදාළ පුද්ගලයකුගේ යම් ආඥාවක්, තීරණයක්, ක්‍රියාවක් හෝ නොකර හැරීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන හෝ 140 වන ව්‍යවස්ථාව යටතේ වූ නඩු කටයුතුවල දී හැර යම් නඩු කටයුතු වලදී හෝ යම් අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතු ය.

(ආ) අධිකාරියේ හෝ එහි යම් සාමාජිකයකුගේ නිලධරයෙකුගේ හෝ සේවා නියුතයකුගේ යම් නියමයකට, තීරණයකට ක්‍රියාවකට හෝ නොකර හැරීමකට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව මගින් අභියාචනාධිකරණය වෙත පවරා ඇති රිට් අධිකරණ බලය අභියාචනාධිකරණය විසින් නොව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) (1) වන ඡේදයේ විධිවිධාන සලසා ඇති අවස්ථානුගත කරුණුවල හැර -

(අ) අධිකාරියේ සාමාජිකයකු ලෙස හෝ අධිකාරියට සහය වීම සඳහා වීම සඳහා පත් කරන ලද නිලධරයකු ලෙස හෝ සේවා නියුතයකුගේ ලෙස යම් තැනැත්තකු විසින් අධිකාරියට අපහාස කිරීම හැර, සද්භාවයෙන් කරන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් ඒ සාමාජිකයා, නිලධරයා හෝ සේවා නියුක්තයාට එරෙහිව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය;

(ආ) අධිකරණයේ ධූරය දරමින් සද්භාවයෙන් සකසන ලද යම් වාර්තාවක් සම්බන්ධයෙන් අධිකාරියේ යම් සමාජිකයකුට හෝ එම වාර්තාව පළ කිරීම සම්බන්ධයෙන් වෙනත් තැනැත්තකුට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය; සහ

(ඇ) යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් අධිකාරියට සාක්ෂි දීම හෝ ලේඛන භාර දීම සම්බන්ධයෙන් එම තැනැත්තාට එරෙහිව කිසිදු සිවිල් අපරාධ හෝ පරිපාලන නඩුවක් පවරනු නොලැබිය යුතු ය;.

(3) (2) වන ඡේදයේ (ආ) සහ (ඇ) ඡේදවල කාර්යය සඳහා වෙනත් තැනැත්තා යන්නෙන් -

(i) අධිකාරියේ සේවා නියුක්තයකු හෝ නිලධරයකු;
(ii) අධිකාරියේ පෙර සේවය කළ සේවා නියුක්තයකු හෝ නිලධරයකු;
(iii) අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;
(iv) අධිකාරියේ පෙර සේවයේ යෙදී සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු;
(v) අධිකාරියේ කමිටුවක සාමාජිකයකු;
(vi) අධිකාරියේ කමිටුවක පෙර සාමාජිකයකුව සිටි තැනැත්තකු,

අදහස් වේ.

8. (1) අධිකාරියේ භාවිතය සඳහා පමණක් ලාංඡනයක් තිබිය යුතු ය.

(2) අධිකාරියේ අනන්‍යතාවය පවත්වා ගැනීම සඳහා ධජයක් තිබිය යුතු ය.

(3) අධිකාරියේ ලාංඡනය හෝ ධජය දැන දැනම හෝ හිතාමතා අවභාවිත කරන තැනැත්තකු වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී, රුපියල් මිලියන දෙකක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාර කිරීම යන දෙකටම එම තැනැත්තා යටත් විය යුතු ය.

9. අධිකාරයේ සියලු සාමාජිකයින්, නිලධරයන් සහ සේවා නියුක්තිකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

10. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතුය.

දෙවන උපලේඛනය

[2 වන වගන්තිය]

**බැහැර කළ අස්ථිත්වයන්**

2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ “සමාගම” යන අර්ථ නිරූපණයේ (ආ) ඡේදයේ කාර්ය සඳහා පහත අස්ථිත්‍යයන් බැහැර කර ඇති අස්ථිත්‍යයන් වන්නේය:-

(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව වූ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක්;

(ආ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව වූ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්;

(ඇ) 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ අර්ථානුකූලව වූ යම් බැංකු ආයතනයක්;

(ඈ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූල වූ බැංකු ව්‍යාපාරය කරගෙන යන ඕනෑම ආයතනයක්;

(ඉ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ අර්ථානුකූල වූ යම් ලියාපදිංචි මුදල් සමාගමක්;

(ඊ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ අර්ථානුකූලව වූ මුදල් ව්‍යාපාරයක් සිදු කරන යම් ආයතනයක්;

(උ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ අර්ථානුකූල වූ යම් රක්ෂණ ව්‍යාපාරයක්;

(ඌ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ අර්ථානුකූලව වූ රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යන යම් ආයතනයක්;

(එ) 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ අර්ථානුකූලව ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක්;

(ඒ) 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ අර්ථානුකූලව බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්; සහ

(ඕ) 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ අර්ථානුකූලව ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් ආයතනයක්.

## තුන්වන උපලේඛනය

**[2 වන වගන්තිය]**

**සම්බන්ධිත පාර්ශ්වයන්**

**1.** 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ “සම්බන්ධිත පාර්ශ්වය” යන යෙදුම පුද්ගලයකුට සම්බන්ධ තැනැත්තකු සම්බන්ධයෙන් වන විට පහත දක්වා ඇති ආකාරයට තැනැත්තා සම්බන්ධිත වන්නේ ය:-

(අ) තැනැත්තාගේ භාර්යාව හෝ ස්වාමිපුරුෂයා හෝ ඥාතියකු හෝ තැනැත්තාගේ ඥාතියකුගේ භාර්යාව හෝ ස්වාමිපුරුෂයා වීම;

(ආ) බේරුම්කරණයක භාරකරු බේරුම්කරණය සම්බන්ධයෙන් -

(i) බේරුම්කරුවකු, සමභාරකරුවකු හෝ ප්‍රතිලාභියකු වන ඕනෑම තැනැත්තකු සමඟ සම්බන්ධ වේ;

(ii) මෙම උපලේඛනයේ වෙනත් විධිවිධාන යටතේ එවැනි තැනැත්තකු සමඟ සම්බන්ධ වී සිටින යම් තැනැත්තෙක්; සහ

(iii) මෙම උපලේඛනයේ අනෙකුත් විධිවිධාන යටතේ එම බේරුම්කරණයට සම්බන්ධ යම් සංස්ථාපිත පුද්ගල මණ්ඩලයක්;

(ඇ) සද්භාවයෙන් සකස් කළ වාණිජ සැලැස්මකට අනුව හවුල් වත්කම් අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම් සම්බන්ධයෙන් හැර, තැනැත්තකු -

(i) ඒ තැනැත්තා හවුල්ව සිටින යම් තැනැත්තකු සමඟ සම්බන්ධ වේ;

(ii) තැනැත්තා හවුල්ව සිටින යම් තැනැත්තකුගේ බිරිඳ හෝ ස්වාමිපුරුෂයා හෝ ඥාතියකු සමඟ සම්බන්ධ වේ; සහ

(iii) තැනැත්තාගේ හවුල්කරුවකු වන පුද්ගලයකුගේ ඥාතියකු වන හෝ ඥාතියකුගේ බිරිඳ හෝ ස්වාමිපුරුෂයා, වන තැනැත්තකු හෝ එවැනි තැනැත්තකුගේ බිරිඳ හෝ ස්වාමිපුරුෂයා සමඟ සම්බන්ධ වේ;

(ඈ) ආයතනයක් වෙනත් ආයතනයක් සමඟ පහත දැක්වෙන අවස්ථාවලදී සම්බන්ධ වන්නේ ය:-

(i) එකම තැනැත්තාට ආයතන දෙකෙහි ම පාලනය භාර වන්නේ නම්;

(ii) තැනැත්තකුට එක ආයතනයක පාලනයක් භාර වන්නේ නම් සහ එම තැනැත්තා හා සම්බන්ධ තැනැත්තන්ට හෝ එම තැනැත්තාට හා තැනැත්තාට සම්බන්ධ තැනැත්තන්ට අනෙක් අස්ථිත්‍යයේ පාලනය තිබේ නම්; සහ

(iii) තැනැත්තන් දෙදෙනකුගෙන් හෝ ඊට වැඩි දෙනකුගෙන් යුත් කණ්ඩායමකට එක් එක් අස්ථිත්‍යයක පාලනයක් තිබේ නම් සහ ඒ ඒ කණ්ඩායම් එකම තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ නම් හෝ (අවස්ථා එකක් හෝ වැඩි ගණනක දී) දෙයාකාරයෙන් එක් ආකාරයකට කණ්ඩායමක සාමාජිකයකු වෙනුවට යම් තැනැත්තකු ප්‍රතිස්ථාපනය කරනු ලැබුවහොත් එම තැනැත්තා සාමාජිකයකු සමඟ සම්බන්ධතාවක් ඇති තැනැත්තකු වන්නේ නම්;

(ඉ) තැනැත්තාට එහි පාලනය තිබේ නම් හෝ එම තැනැත්තා සහ එම තැනැත්තා හා සම්බන්ධ තැනැත්තන්ට එක්ව එය පාලනය කිරීමට හැකි වන්නේ නම්, අස්ථිත්‍යයක් වෙනත් තැනැත්තකු සමඟ සම්බන්ධ වේ.

**2.** මෙම උපලේඛනයේ -

"අස්ථිත්‍යය" යන්නට, යම් සංස්ථාපිත පුද්ගල මණ්ඩලයක් හෝ සංස්ථාපිත නොවන පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වන නමුත්, හවුල් ව්‍යාපාරයක් ඊට ඇතුළත් නොවේ; සහ මෙම උපලේඛනය යම් ඒකක භාර යෝජනා ක්‍රමයක් සම්බන්ධයෙන් අදාළ වන්නේ ඒ යෝජනා ක්‍රමය අස්ථිත්‍යයක් වන පරිදි සහ ඒකක භාර දරන්නන්ගේ අයිතිවාසිකම් එම අස්ථිත්වයේ කොටස් වන පරිදි වේ; සහ

"ඥාතියා" යන්නෙන්, සහෝදරයා, සහෝදරිය, මුතුන් මිත්තන්ගෙන් හෝ පරම්පරාවෙන් පැවත එන්නකු අදහස් වේ.

හතරවන උපලේඛනය

[2 වන සහ 275 (ඈ) වන වගන්ති]

ඈවර කිරීමක දී වරණීය හිමිකම්පෑම්

1. ඈවරකරු විසින් ලැයිස්තුගත කර ඇති ප්‍රමුඛතාවය අනුව පහත දැක්වෙන මුදල් ගෙවීම සිදු කළ යුතු ය:-

(අ) අවස්ථාවෝචිත පරිදි ඈවරකරුගේ හෝ තාවකාලික ඈවරකරු තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීමේ දී ඈවරකරුට හෝ තාවකාලික ඈවරකරුට දැරීමට සිදු වූ වියදම් සහ ඈවරකරුගේ හෝ තාවකාලික ඈවරකරුගේ පාරිශ්‍රමිකය සහ (ඇ) ඡේදයේ දක්වා ඇති අරමුදල් හැර විශේෂ කළමනාකරුවකුගේ පාරිශ්‍රමිකය;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අද්මිනිස්ත්‍රාසිකරු විසින් දරන ලද පිරිවැය, ගාස්තු සහ වියදම් සහ 247 වන වගන්තියට අනුකූලව එකඟ වූ පරිදි හෝ තීරණය කරන ලද සමාගමට අදාළ පූර්ව අද්මිනිස්ත්‍රාසි වියදම් ගාස්තු සහ (ඇ) ඡේදයේ සඳහන් මුදල් හැර අද්මිනිස්ත්‍රාසිකරුගේ පාරිශ්‍රමිකය;

(ඇ) අවස්ථාවෝචිත පරිදි අද්මිනිස්ත්‍රාසි කිරීමේ දී හෝ ඈවර කිරීමේ දී අද්මිනිස්ත්‍රාසිකරුට හෝ ඈවරකරුට නිසි පරිදි උපචිත වූ අද්මිනිස්ත්‍රාසි කිරීම හෝ ඈවර කිරීම අතරතුර සමාගමේ මෙහෙයුම් කටයුතුවල වියදම් ඇතුළු අද්මිනිස්ත්‍රාසි කිරීම හෝ ඈවර කිරීම ආරම්භ කිරීමේදී හෝ ආරම්භ කිරීමෙන් පසුව, ණය හිමියෙකු විසින් සමාගමට ලබා දුන් මුදල්;

(ඈ) ඉල්ලීම වෙනුවෙන් පෙනී සිටින තැනැත්තකුගේ අධිකරණය විසින් අවසර දුන් වියදම් ඇතුළුව සමාගම ඈවර කිරීම සඳහා අධිකරණයෙන් ආඥාවක් ලබා ගැනීමට ඉල්ලීමක් කළ තැනැත්තකුගේ සාධාරණ වියදම්;

(ඉ) අද්මිනිස්ත්‍රාසි ණය හිමියන්ගේ කමිටුවක්, ඇවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුවක් සහ ඇවර කිරීමේ සහදායක කමිටුවක් විසින් ස්වකීය මුදලින් අවශ්‍යයෙන්ම දරන ලද වියදම්;

(ඊ) ඔප්පු අද්මිනිස්ත්‍රාසිකරුගේ පාරිශ්‍රමිකය;සහ

(උ) 325 වන වගන්තියේ (8) වන උපවගන්තිය නිසා ඇවරකරුට එරෙහිව හිමිකම්පෑම තහනම් කර ඇති කැප අයිතිය දරන්නා විසින් සුරක්ෂිත කර ඇති ණය හෝ බැරකම්.

2. 1 ඡේදයේ සඳහන් හිමිකම්පෑම් සඳහා මුදල් ගෙවීමෙන් පසු, ඇවරකරු විසින් ඊළඟට පහත දැක්වෙන හිමිකම් සඳහා මුදල් ගෙවිය යුතු ය:-

(අ) යම් සේවකයකුට ගෙවිය යුතු සියලුම අර්ථසාධක අරමුදල්වල හිඟ තබා ඇති මුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් හිඟ තබා ඇති මුදල් සහ ව්‍යවස්ථාපිත පාරිතෝෂික ගෙවීම්;

(ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් තෝරා ගනු ලබන, ඇවර කිරීම ආරම්භ කිරීමට පෙර සම්පූර්ණ වසරක් සඳහා අය කළ හෝ අය කළ යුතු ආදායම් බදු;

(ඇ) ඇවර කිරීම ආරම්භ කළ දිනට පෙර සම්පූර්ණ වසර සඳහා අය කළ හෝ අය කළ යුතු පිරිවැටුම් බද්ද;

(ඈ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන අනුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් තෝරා ගනු ලබන ඇවර කිරීම ආරම්භ කිරීමට පෙර බදු අය කළ හැකි කාල සීමා හතරක් සඳහා අය කළ හෝ අය කළ යුතු අගය එකතු කළ බද්ද;

(ඉ) ඇවර කිරීමේ දිනයට සමාගමෙන් අයවීමට ඇති ඇවර කිරීම ආරම්භ කිරීමට පෙරාතුවම වූ මාස දොළහක කාලසීමාව තුළ ගෙවිය යුතු මෙම ඡේදයේ පෙර අනුඡේදවල සඳහන් අයවිය යුතු මුදල් හැර අනෙකුත් සියලුම ගාස්තු හෝ බදු;

(ඊ) වරින් වර ලබා දෙන හෝ සපයනු ලබන ඕනෑම සේවාවක් සඳහා පුනරාවර්තන ගෙවීම් ලෙස රජයට ගෙවිය යුතු සියලුම මුදල්;

(උ) කාර්මික අධිකරණ ප්‍රදානයක සහ ඕනෑම සේවා නියුක්තයකුට ගෙවිය යුතු වෙනත් ව්‍යවස්ථාපිත ගෙවීම්;

(ඌ) 4 වන ඡේදයට යටත්ව, ඇවර කිරීම ආරම්භ කරන ලද දිනයට පෙරාතුව වූ මාස හතරක කාල සීමාව තුළ සමාගමට සපයන ලද සේවාවන් සම්බන්ධයෙන් වන කොමිස් මුදලින් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් උපයාගත් හෝ නොගත් සහ කාලය හෝ වැඩ කරන ලද කෑලි ගණනට ගෙවීම් කළ යුතු යම් සේවකයකුගේ සියලුම වේතන හෝ වැටුප;

(එ) ඇවර කිරීම ආරම්භ කිරීමේ හෝ හේතුව නිසා ඊට පෙර සේවා නියුක්තිය අවසන් කිරීමේ දී සේවා නියුක්තයකුට (හෝ සේවකයා මිය ගිය විට, සේවකයාගේ අයිතිය මත වෙනත් ඕනෑම තැනැත්තකුට) ගෙවිය යුතු නිවාඩු දින වැටුප;

(ඒ) සමාගම ඇවර කිරීම ආරම්භ වන විට (139 වන අධිකාරය වූ) කම්කරු වන්දි ආඥාපනතේ 24 වන වගන්තියේ දක්වා ඇති ආකාරයේ කොන්ත්‍රාත්තුවක් යටතේ සේවකයා වෙත පැවරීමට සහ බලය පැවරීමට හැකියාව ඇති අයිතීන් තිබේ නම් මිස, ඕනෑම දෙයක් ඇවර කිරීම ආරම්භ කිරීමට පෙර උපචිත එම ආඥාපනත යටතේ සේවකයකුට ගෙවිය යුතු වන්දි හෝ වන්දි ගෙවීම සඳහා වූ වගකීමක්;

(ඕ) (6) වන ඡේදයට යටත්ව, තෙවන පාර්ශ්වයන්ට සේවකයාගේ පිළිබැඳීම් සෑහීමට පත් කිරීම සඳහා, ඇවර කිරීම ආරම්භ කළ දිනට පෙරාතුව වූ මාස හතර තුළ සමාගමට කරන ලද සේවාවන් සම්බන්ධයෙන් සමාගම විසින් සේවකයකුගේ වේතනයෙන් හෝ වැටුපෙන් අඩු කරන ලද මුදල් ප්‍රමාණයන්.

3. 2 වන ඡේදයේ ලැයිස්තුගත කර ඇති හිමිකම් සමානව ශ්‍රේණිගත කර ඇති අතර දේපළ විකිණීමෙන් ලැබෙන ආදායම ඒවා ගෙවීමට ප්‍රමාණවත් නොවන්නේ නම් මිස සම්පූර්ණයෙන් ගෙවා නිම කළ යුතු අතර සම්පූර්ණයෙන් ගෙවිය නොහැකි අවස්ථාවක දී එම හිමිකම් සියල්ල එකිනෙකට සමානුපාතිකව අඩු කළ යුතු ය.

4. එක් සේවානියුක්තයකු සම්බන්ධයෙන් 2 ඡේදයේ (ඉ) අනු උපඡේදය යටතේ ප්‍රමුඛත්වය දිය යුතු මුදල, රුපියල් දොළොස්දහසක් හෝ නියම කළ හැකි ඊට වැඩි වන යම් මුදලක් නොඉක්මවිය යුතු ය.

5. යම් වන්දි මුදලක් (139 වන අධිකාරය වූ) කම්කරු වන්දි ආඥාපනත යටතේ දෙසතියකට වරක් ගෙවන ගෙවීමක් වන අවස්ථාවක දී, එම වන්දි මුදල යටතේ ගෙවිය යුතු මුදල, 2 ඡේදයේ (ඒ) අනුඡේද කාර්ය සඳහා එම ආඥාපනත යටතේ ගණනය කළ පරිවර්තිත මුදල් ප්‍රමාණය සඳහා වූ එකවර ගෙවන මුදලක් විය යුතු ය.

6. 2 ඡේදයේ (ඔ) අනුඡේදය යටතේ ප්‍රමුඛත්වය දිය යුතු මුදල, එක් සේවා නියුක්තයකු සම්බන්ධයෙන් වන විට එක් එක් අවස්ථාවේ දී, 2 වන ඡේදයේ (ඉ) අනුඡේදය යටතේ ප්‍රමුඛත්වය දිය යුතු මුදල් ප්‍රමාණ අඩු කරනු ලැබ රුපියල් දොළොස් දහස හෝ නියම කරනු ලැබිය හැකි ඊට වැඩි මුදල් ප්‍රමාණයක් විය යුතු ය.

7. තත්කාර්ය සඳහා යම් තැනැත්තකු විසින් අත්තිකාරම් වශයෙන් දෙන ලද මුදලකින් -

(අ) වේතන හෝ වැටුප් වශයෙන් සමාගමේ යම් සේවා නියුක්තයකුට, මුදල් ගෙවා ඇති අවස්ථාවක දී; හෝ

(ආ) සමාගමේ සේවා නියුක්තයකු මිය ගොස් ඇති අවස්ථාවක, එම සේවා නියුක්තයාගේ අයිතිය සඳහා, වෙනත් තැනැත්තකුට මුදල් ගෙවා ඇති අවස්ථාවක දී, මුදල් ලැබූ සේවා නියුක්තයාට හෝ සේවා නියුක්තයා වෙනුවෙන් මුදල් ලබාගත් තැනැත්තාට මුදල් ගෙවනු නොලැබුවේ නම් ඔහුට ඇති අයිතියේ ප්‍රමුඛතාවට සමාන ප්‍රමුඛතාවක් ඇවර කිරීමකදී මුදල් අත්තිකාරම් ලබා දුන් තැනැත්තාට ද තිබිය යුතු ය.

8. 2 වන ඡේදයේ සඳහන් හිමිකම් ගෙවීමෙන් පසු, ඇවරකරු 275 වන වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් යම් පිරිවැයක මුදල ඊළඟට ගෙවිය යුතු ය.

9. 1, 2 සහ 8 ඡේදවල ලැයිස්තුගත කර ඇති හිමිකම්පෑම් සඳහා මුදල් ගෙවීමට සමාගමේ දේපළ විකිණීමෙන් ලැබෙන මුදල් ප්‍රමාණවත් වනතාක් දුරට, එම ඡේදවල ලැයිස්තුගත කර ඇති හිමිකම්පෑම්වලට -

(අ) (i) චල බැඳීමකට; හෝ

(ii) සමාගම් පනතේ 431 වන වගන්තියේ (2)වන උපවගන්තිය යටතේ ඇති චල බැඳීමකට පසුව ප්‍රමුඛත්වය ඇති ස්ථිර ඇපයකට,

යටත් දේපළක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට ඇති ප්‍රමුඛතාවයට වඩා වැඩි ප්‍රමුඛතාවයක් තිබිය යුතු ය; සහ

(ආ) ඒ අනුව එකී හිමිකම්පෑම් එකී දේපළේ මුදල්වලින් ගෙවා බේරුම් කළ යුතු ය.

10. මෙම උපලේඛනයේ කාර්ය සඳහා -

(අ) රෝගාතුර වීම හෝ වෙනත් යහපත් හේතුවක් නිසා සේවයට නොපැමිණි කාලයක් හෝ නිවාඩුවක් ගතකිරීමේ කාලය සඳහා වන පාරිශ්‍රමිකය එම කාලය තුළ දී සමාගමට සලසන ලද සේවය සඳහා වූ වැටුප් වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ආ) යම් තැනැත්තකුට අදාළ “නිවාඩු දින වැටුප” යන යෙදුමට එම තැනැත්තා නිවාඩු ලබා ගැනීමට හිමිකම් ලබන කාලය දක්වා ඔහුගේ සේවා කාලය පැවතියේ නම් සමාගමේ වැඩ කරන සාමාන්‍ය කාලය තුළ එම තැනැත්තාට ගෙවිය යුතු පාරිශ්‍රමිකය ප්‍රකාරව සමාගම විසින් එම තැනැත්තාගේ සේවා ගිවිසුම අනුව හෝ නීතියක විධිවිධාන අනුව ( යම් අධිකරණ ආඥාවක් හෝ ලිඛිත නීතියක් යටතේ දෙන ලද විධානයක් ඇතුළුව) සමාගම විසින් එම තැනැත්තාට ගෙවිය යුතු සියළු මුදල් ඇතුළත් වේ;

(ඇ) “ගාස්තු හෝ බදු” යන යෙදුමට, රජය හෝ යම් පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද අධිකාරියක් විසින් පනවන ලද ගාස්තු, බදු, අය කිරීම් හෝ තක්සේරු මුදල් ඇතුළත් වේ.

පස්වන උපලේඛනය

[255(4), 261(3), 271(5), 284(2), 308, 310 සහ 433 වන වගන්ති]

**ණය හිමියන්ගේ සහ සහදායකයින්ගේ රැස්වීම් සඳහා වූ කාර්ය පටිපාටිය**

අර්ථ නිරූපණ:

1. මෙම උපලේඛනයේ, “සහභාගිවන්නා” යන යෙදුමෙන් -

(අ) ණයහිමියන්ගේ රැස්වීමක් සම්බන්ධයෙන් වන විට ණයහිමියකු අදහස් වේ; සහ

(ආ) සහදායකයන්ගේ රැස්වීමක් සම්බන්ධයෙන් වන විට සහදායකයකු අදහස් වේ.

2. රැස්වීමක් පැවැත්වීමේ ක්‍රමය:

රැස්වීමක් -

(අ) යම් භෞතික ස්ථානයක තැනැත්තන් එක්රැස් කිරීමෙන්;

(ආ) ශ්‍රව්‍ය හෝ ශ්‍රව්‍ය සහ දෘශ්‍ය, සන්නිවේදනය මගින්, එහි දී තැනැත්තකු අදහස් ප්‍රකාශ නොකිරීමට තීරණය කරන අවස්ථාවක දී හැර සහභාගි වන අයට එකිනෙකාට සවන් දීමට හැකි විය යුතු ය; හෝ

(ඇ) (අ) ඡේදයේ ක්‍රමය සහ (ආ) ඡේදයේ ක්‍රමය යන ක්‍රම දෙකම සම්බන්ධ ක්‍රමයක් උපයෝගී කර ගැනීම මගින්,

පැවැත්විය හැකි ය.

3. දැනුම්දීම:

(1) රැස්වීමට පැමිණීමට හිමිකම ඇති සෑම සහභාගිවන්නකුට ම-

(අ) 2ඡේදයේ (අ) අනුඡේදය යටතේ පවත්වනු ලබන එක් එක් රැස්වීමේ දිනය, වේලාව සහ ස්ථානය;

(ආ) 2ඡේදයේ (ආ) අනුඡේදය යටතේ පවත්වනු ලබන එක් එක් රැස්වීමේ දිනය, වේලාව සහ සම්බන්ධ වන තැනැත්තන්ගේ විස්තර; හෝ

(ඇ) 2ඡේදයේ (ඇ) අනු ඡේදය යටතේ පවත්වනු ලබන එක් එක් රැස්වීමේ දිනය, වේලාව සහ අවශ්‍ය අවස්ථාවල සහභාගි වන තැනැත්තන්ගේ විස්තර,

පිළිබඳ ලිඛිත දැන්වීමක් යැවිය යුතු ය.

(2) මෙම පනත මගින් හෝ ඒ යටතේ සාදන ලද යම් ආඥාවක් මගින් අන්‍යාකාරයකට විධිවිධාන සලසනු ලබන්නේ නම් මිස හෝ අධිකරණය විසින් අන්‍යාකාරයකට ආඥා කරන්නේ නම් මිස (1) වන අනුඡේදය යටතේ වූ දැන්වීමක් රැස්වීම පැවැත්වීමට නියමිත දිනට අවම වශයෙන් වැඩ කරන දින පහකට පෙර යවනු ලැබිය යුතු ය.

(3) රැස්වීමක් පිළිබඳ දැන්වීමක ඇති දෝෂයක් හෝ දැන්වීම ලබා ගැනීමට අපොහොසත් වීම මගින් රැස්වීමේ කටයුතු පහත දැක්වෙන අවස්ථාවලදී අවලංගු නොවේ :-

(අ) අවිධිමත්භාවය හෝ අපොහොසත් වීම වැදගත් නොවේ නම්;

(ආ) එම අවිධිමත්භාවය හෝ අපොහොසත් වීම පිළිබඳව රැස්වීමට සහභාගිවන්නන් සියලු දෙනා විරෝධය පළ නොකරන්නේ නම්;

(ඇ) එම අවිධිමත්භාවය හෝ අපොහොසත් වීම නොතකා හැරීමට රැස්වීමට සහභාගීවන්නන් සියලු දෙනා ලිඛිත කැමැත්ත පළ කරන්නේ නම්; හෝ

(ඈ) රැස්වීමක් පිළිබඳව මහජනයා දැනුවත් කළ යුතු අවස්ථාවක දී, දැන්වීම නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට අනුකූල නම්.

4. ප්‍රතියුක්තයන්:

(1) රැස්වීමකට පැමිණ සහ ඡන්දය දීමට හිමිකම් ඇති සහභාගීවන්නකුට තමා විසින් ම හෝ ප්‍රතියුක්තයකු මගින් හෝ රැස්වීමට සහභාගි විය හැකි ය.

(2) රැස්වීමට සහභාගිවීමට හිමිකම් ඇති සහභාගිවන්නකුගේ ප්‍රතියුක්තයකුට ඒ සහභාගිවන්නාට රැස්වීමට පැමිණීමට සහ අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතියම ඇත.

(3) රැස්වීමට සහභාගි වීමට හිමිකම් ඇති සහභාගිවන්නා විසින් අත්සන් කරන ලද ලිඛිත දැන්වීමක් මගින් ප්‍රතියුක්තයා පත්කළ යුතු අතර, එම පත්කිරීම යම් විශේෂ රැස්වීමක් සඳහා ද, නැතහොත් මාස දොළහක් නොඉක්මවන යම් නිශ්චිතව සඳහන් කාලසීමාවක් සඳහා ද යන්න එම ලිඛිත දැන්වීමේ සඳහන් කළ යුතු ය.

(4) රැස්වීම ආරම්භ වීමට පෙර රැස්වීම කැඳවන තැනැත්තාට ප්‍රතියුක්තයා පත් කිරීම පිළිබඳ දැන්වීමේ පිටපතක් ලබා දෙන්නේ නම් මිස, එකී රැස්වීම සම්බන්ධයෙන් ප්‍රතියුක්තයා පත්කිරීම බලාත්මක නොවන්නේ ය.

5. සභාපතිවරයා:

(1) මෙම ඡේදයට යටත්ව, රැස්වීම කැඳවන තැනැත්තා රැස්වීමේ සභාපති ලෙස කටයුතු කළ යුතු ය.

(2) (1) වන අනුඡේදයේ සඳහන් තැනැත්තා පැමිණ නොමැති විට, රැස්වීමට පැමිණීමට හිමිකම් ඇති තමාට පැමිණ සිටින හෝ ප්‍රතියුක්තයන් මගින් හෝ සහභාගිවන්නන් රැස්වීමේ සභාපතිවරයා ලෙස ක්‍රියා කිරීම සඳහා ඔවුන් අතරින් කෙනෙකු තෝරා ගත යුතු ය.

6. ගණපූරණය:

(1)(අ) රැස්වීමට සහභාගී වීමට හිමිකම් ඇති සහභාගිවන්නන් තිදෙනකු හෝ ඔවුන්ගේ ප්‍රතියුක්තයන් රැස්වීමට පැමිණි විට; හෝ

(ආ) රැස්වීමට සහභාගී වීමට හිමිකම් ඇති සහභාගිවන්නන්ගේ සංඛ්‍යාව තිදෙනකු නොඉක්මවන අවස්ථාවක, සහභාගි වීමට හිමිකම් ඇති සියලුම සහභාගිවන්නන් හෝ ඔවුන්ගේ ප්‍රතියුක්තයන් පැමිණ සිටි විට,

රැස්වීමක් සඳහා ගණපූරණය සම්පූර්ණ වේ.

(2) රැස්වීම පැවැත්වීම සඳහා නියම කරන ලද වේලාවේ සිට මිනිත්තු තිහක් ගත වූ විට ගණපූරණයක් නොමැති නම්, ඊළඟ සතියේ එම දිනයේ ම සහ රැස්වීම සඳහා පත්කරන ලද එම වේලාවේ සහ එම ස්ථානයේම නිශ්චය කරනු ලැබිය හැකි රැස්වීම පැවැත්විය යුතු ය. නැතහොත් සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ දිනයකට, වේලාවකට හෝ ස්ථානයකට එම රැස්වීම කල්දැමිය යුතු ය. එම දෙවන දිනයේ දී රැස්වීම ආරම්භ වී විනාඩි තිහක් ගත වීමෙන් පසුව ද ගණපූරණය සම්පූර්ණ වී නොමැති නම් පැමිණ සිටින තැනැත්තන්ගෙන් සහ ඔවුන්ගේ ප්‍රතියුක්තයන්ගෙන් ගණපූරණය සංයුක්ත වේ.

7. යෝජනා:

(1) IV, IX, X සහ XI යන කොටස්වල කාර්ය සඳහා පවත්වනු ලබන රැස්වීමක දී හැර ණය හිමියන්ගේ හෝ සහදායකයින්ගේ

යම් රැස්වීමක දී -

(අ) එම යෝජනාවට ඡන්දය දෙන සියලු සහභාගි වන්නන්ගෙන් සංඛ්‍යාවට අනුව යෝජනාවට පක්ෂව ඡන්දය දෙන සංඛ්‍යාව බහුතරයක් වන අවස්ථාවක දී; සහ

(ආ) යෝජනාවට ඡන්දය දෙන සියලු සහභාගි වන්නන්ගේ හිමිකම්පෑම්වල වටිනාකම සැලකීමේදී යෝජනාවට පක්ෂව ඡන්දය දෙන සහභාගිවන්නන්ගේ හිමිකම්පෑම්වල වටිනාකම බහුතරයක් නියෝජනය කරන අවස්ථාවක දී, යෝජනාව අනුමත විය හැකි ය.

(2) IX වන කොටසේ කාර්ය සඳහා පවත්වනු ලබන ණයහිමියන්ගේ රැස්වීමක දී -

(අ) යෝජනාවට ඡන්දය දෙන සියලු ණය හිමියන්ගේ සංඛ්‍යාවට අනුව යෝජනාවට පක්ෂව ඡන්දය දෙන ණය හිමියන්ගේ සංඛ්‍යාව බහුතරයක් වන අවස්ථාවක දී; සහ

(ආ) යෝජනාවට ඡන්දය දෙන සියලු ණය හිමියන්ගේ හිමිකම්පෑම්වල වටිනාකම සැලකීමේදී යෝජනාවට පක්ෂව ඡන්දය දෙන ණයහිමියන්ගේ හිමිකම්පෑම්වල වටිනාකම අවම වශයෙන් සියයට හැත්තෑපහක් වන අවස්ථාවක,

එම යෝජනාව සම්මත විය හැකි ය.

(3) X වන කොටසෙහි කාර්ය සඳහා පවත්වනු ලබන යම් ණය හිමියන්ගේ රැස්වීමක දී, -

(අ) යෝජනාවට ඡන්දය දෙන සියලු ණයහිමියන්ගේ හෝ යම් පන්තියක සියලු ණය හිමියන්ගේ ඡන්ද සංඛ්‍යාවට අනුව එම යෝජනාවට පක්ෂව ඡන්දය දෙන ණයහිමියන්ගේ ඡන්දවල සංඛ්‍යාව බහුතරයක් වන විට; සහ

(ආ) යෝජනාවට ඡන්දය දෙන සියලු ණයහිමියන්ගේ හෝ යම් පන්තියක සියලු ණයහිමියන්ගේ

ඡන්ද හිමිකම්පෑම්වල සංඛ්‍යාව සැලකීමේ දී යෝජනාවට පක්ෂව ඡන්දය දෙන ණයහිමියන්ගේ හිමිකම්පෑම්වල වටිනාකම අවම වශයෙන් සියයට හැත්තෑපහක් සංයුක්ත වන විට,

එම යෝජනාව සම්මත විය හැකි ය.

(4) යෝජනාවකට ඡන්දය දීමේ දී, ඡන්දය දීමට හිමිකම් නොමැති සහභාගිවන්නකුගේ ඡන්දය, (අ), (ආ) සහ (ඇ) අනුඡේදවල ඡන්ද ගණන් කිරීමේ ගණනය කිරීමෙන් බැහැර කරනු ලැබිය යුතු ය.

8. රැස්වීම්වල වාර්තා:

(1) රැස්වීමක රැස්වීම් වාර්තා පවත්වාගෙන යාමට සභාපතිවරයා වග බලාගත යුතු ය.

(2) සභාපතිවරයා අත්සන් කළ රැස්වීම් වාර්තා එම රැස්වීමේ කටයුතු පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) රැස්වීම් වාර්තා නියම කළ හැකි තැනැත්තන්ට යවනු ලැබ ඔවුන් එම වාර්තා තබා ගත යුතු අතර නියම කළ හැකි ආකාරයට එම වාර්තා පවත්වා ගත යුතු ය.

(4) උනන්දුව දක්වන පාර්ශ්වයන් විසින් අධිකරණයට ඉදිරිපත් කරන ඉල්ලීමක් මත අධිකරණය විසින් අවශ්‍ය ලෙස සලකන කොන්දේසි සහිත ආඥාවක් එම රැස්වීම් වාර්තා ඉල්ලුම්කරුට පරීක්ෂා කළ හැකි ය.

9. රැස්වීම් අඩාලව කල් තැබීම:

(1) 6 ඡේදයේ (ආ) අනුඡේදයට අගති විරහිතව රැස්වීම් අඩාලව කල් තැබීම නියම කරනු ලබන පරිදි වූ පරිසීමාවලට සහ සීමා කිරීම්වලට යටත් වේ.

(2) අඩාලව කල් තබන ලද රැස්වීමක දී යෝජනාවක් සම්මත වූ අවස්ථාවක දී -

(i) සියලු කාර්ය සඳහා එම යෝජනාව සත්‍ය වශයෙන් ම සම්මත වූ දිනයේ සම්මත වූවක් ලෙස සැලකිය යුතු ය; සහ

(ii) කලින් දිනයක දී සම්මත වූ බව නොසැලකිය යුතු ය.

(3) වැඩ කරන දින හයකට වඩා අඩු කාලයකට රැස්වීම කල් තැබුවහොත් මිස 3 වන ඡේදයේ (අ) අනුඡේදයේ විධිවිධාන කල් තබන ලද රැස්වීමකට අදාළ වේ.

10. විවිධ:

(1) නියම කරනු ලැබුවහොත්, රැස්වීමක දී ඡන්දය දීමට හිමිකම් ඇති තැනැත්තකු විසින් නියමිත කාර්ය පටිපාටිය අනුගමනය කිරීමෙන් තැපැල් මඟින් ඡන්දය දීමට හැකි ය.

(2) (1) අනුඡේදයේ කාර්ය සඳහා, "තැපැල් මඟින් ඡන්දය දීම" යන්නට, නියම කරනු ලැබිය හැකි පරිදි වූ විද්‍යුත් ක්‍රමයක් මගින් ඡන්දයක් දීම ඇතුළත් වේ.

(3) යම් සහභාගිවන්නකු රැස්වීමකට නොපැමිණියහොත් එමගින් ඊට පසුව පැවැත්වෙන යම් රැස්වීමකට සහභාගි වීමට එම තැනැත්තාට ඇති අයිතියට මෙයින් අගතියක් සිදු නොවිය යුතු ය.

(4) මෙම පනතේ නියමයන්ට යටත්ව, යම් රැස්වීමක දී එහි කාර්ය පටිපාටිය විධිමත් කළ හැකි ය.

හයවන උපලේඛනය

[127 වන වගන්තිය]

**වස්තුභංගත්වයට පත්ව මියයන තැනැත්තකුගේ බංකොලොත් බූදලය කළමනාකරණය කිරීම**

1. වස්තුභංගත්වයට පත්ව මියයන තැනැත්තකුගේ බංකොලොත් බූදලය කළමනාකරණය කිරීම:

ණයකරු ජීවත්ව සිටියේ නම් ඔහුට එරෙහිව බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමක් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් වූ ණය මුදලක් ඇති මියගිය ණයකරුවකුගේ ණයහිමියකු විසින්, බංකොලොත්භාවය පිළිබඳව නීතියට අදාළව මියගිය ණයකරුගේ බූදලය කළමනාකරණය කිරීම සඳහා ආඥාවක් ලබා දෙන මෙන් අයදිමින් නියමිත ආකෘති පත්‍රයේ වූ පෙත්සමක් අධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි ය.

2. ආඥාව:

මියගිය ණයකරුගේ පුද්ගලික නියෝජිතයා වෙත නියමිත දැන්වීම ලබාදීමෙන් පසු අධිකරණය වෙත පෙත්සම්කරුට ඇති ණය පිළිබඳව සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු මියගිය ණයකරුගෙන් අය වීමට ඇති ණය ගෙවීම සඳහා බූදලය ප්‍රමාණවත් බවට අධිකරණය සෑහීමකට පත්වන්නේ නම් මිස මියගිය ණයකරුගේ බූදලය බංකොලොත්භාවයට අනුව කළමනාකරණය කිරීම සඳහා අධිකරණය විසින් නියමිත ආකාරයට ආඥාවක් කරනු ලැබිය හැකි අතර, නැතහොත් හේතු දැක්වීමෙන් පසු නඩු ගාස්තුවලට යටත්ව හෝ එසේ නොමැතිව නඩුව නිෂ්ප්‍රභ කළ හැකි ය.

3. දේපළ නිල දේපළ භාරගැනුම්කරු සතු විය යුතු බව:

(අ) මියගිය ණයකරුවන් බූදලය කළමනාකරණය කිරීම සඳහා ආඥාවක් කරනු ලැබීමේ දී ණයකරුගේ දේපළ නිල දේපළ භාර ගැනුම්කරු සතු විය යුතු අතර එම දේපළවල භාරකරු ලෙස ඔහු විසින් මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි එම දේපළ විකුණා ණයහිමියන්ට මුදල් බේරුම් කිරීම ආරම්භ කළ යුතු ය;

(ආ) වෙනත් අවස්ථාවලදී ණයකරුවකුගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කිරීමේදී හෝ බංකොලොත්භාවයට අදාළව කටයුතු කිරීමේ දී ණය හිමියකුට ඇති බලතලවලට සමාන බලතල බංකොලොත්භාවය පිළිබඳ භාරකරුවන් පත් කිරීමේ දී සහ ණයහිමියන්ගේ කමිටුව පත්කිරීමේ දී ණයහිමියාට ඇති අතර මේ පනත යටතේ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුවන් සහ ණයහිමියන්ගේ කමිටුවලට අදාළ විධිවිධාන, එම බලතල යටතේ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුවන් සහ ණය හිමියන්ගේ කමිටු පත් කිරීමේ දී අදාළ විය යුතු ය;

(ඇ) ණයහිමියන්ගේ කමිටු පත් කර නැත්නම්, ණයහිමියන්ගේ කමිටු විසින් සිදු කරනු ලැබිය යුතුව තිබුණා වූ යම් ක්‍රියාවක් හෝ ලබා දිය යුතුව තිබුණා වූ යම් විධානයක් හෝ අවසරයක් අධිකරණය විසින් ලබා දිය හැකි ය.

4. පනත අදාළවීම:

මෙහි මින්පසු සඳහන් කර ඇති සංශෝධනය කිරීම් සහිතව, නියම කළ හැකි සංශෝධනවලට යටත්ව VI වන කොටසේ විධිවිධාන, මේ පනත යටතේ බංකොලොත්භාවයට අදාළ ආඥාවකට අදාළ වන ආකාරයටම මේ උපලේඛනය යටතේ කළමනාකරණ ආඥාවකට ද අදාළ විය යුතු ය.

5. හිමිකම්පෑම්වල ප්‍රමුඛතාවය:

(අ) කළමනාකරණ ආඥාවක් යටතේ මියගිය ණයකරුවකුගේ දේපළ කළමනාකරණය කිරීමේ දී ණයකරුගේ බූදලයට අදාළව ඔහු හෝ ඇය විසින් දරන ලද අවමංගල්‍ය වියදම් සහ ඇස්තමේන්තු වියදම් ගෙවීම සඳහා මියගිය ණයකරුගේ පුද්ගලික නියෝජිත ඉදිරිපත් කළ හිමිකම් පෑම සම්බන්ධයෙන් නිල දේපළ භාරකරු සහ බංකොලොත්භාවය පිළිබඳ භාරකරු සැලකිල්ලක් දැක්විය යුතු ය;

(ආ) ඡේදයේ (අ) නිශ්චිතව දක්වා ඇති හිමිකම්පෑම් ආඥාවක් යටතේ වරණීය ණයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ණයවල ප්‍රමුඛතාවය සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, (අ) ඡේදය යටතේ වූ හිමිකම්පෑම් සඳහා වෙනත් ණයවලට වඩා ප්‍රමුඛත්වය ලබා දී එකී මුදල් මියගිය ණයකරුගේ බූදලයෙන් සම්පූර්ණයෙන් ගෙවිය යුතු ය.

6. අතිරික්තය:

මියගිය ණයකරුගේ බූදලය කළමනාකරණය කිරීමේ දී ණයකරුගෙන් අයවීමට ඇති සියලු ණයමුදල් ගෙවා බේරුම් කිරීමෙන් පසු සහ බංකොලොත්භාවය පිළිබඳ කටයුතු කිරීමේ දී මේ පනත මගින් විධිවිධාන සලසා ඇති පරිදි කළමනාකරණ ගාස්තු සහ පොලිය ගෙවීමෙන් පසු නිල දේපළ භාරගැනුම්කරු වෙත සහ බංකොලොත්භාවය පිළිබඳ භාරකරු වෙත යම් අතිරික්ත මුදලක් ඉතිරිවී ඇත්නම් එම අතිරික්ත මුදල මියගිය ණයකරුගේ බූදලයේ පුද්ගලික නියෝජිතයාට ගෙවිය යුතු අතර, නැතහොත් නියම කර ඇති වෙනත් යම් ආකාරයකට එකී මුදල ගෙවිය යුතු ය.

7. පෙත්සම ඉදිරිපත් කිරීම පිළිබඳ පුද්ගලික නියෝජිතයාට දැනුම් දීමේ බලපෑම:

(අ) මේ වගන්තිය යටතේ ණය හිමියකු විසින් පෙත්සමක් ඉදිරිපත් කිරීම පිළිබඳව මියගිය ණයහිමියාගේ පුද්ගලික නියෝජිතයා වෙත දැන්වීම එම පෙත්සම මත බූදලය කළමනාකරණය කිරීම සඳහා ආඥාවක් ලබා දීමේ දී, බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමේ දැන්වීම ලැබීමට සමානය;

(ආ) එම දැන්වීම ලැබීමෙන් පසු පුද්ගලික නියෝජිතයා විසින් මුදල් ගෙවීමක් හෝ දේපළ පැවරීමක් නිල දේපළ භාර ගැණුම්කරුට හෝ බංකොලොත්භාවය පිළිබඳ භාරකරුට එම මුදල් ගෙවීමෙන් හෝ දේපළ පැවරීමෙන් නිදහස් කිරීමක් ලෙස ක්‍රියාත්මක නොවේ;

(ඇ) ඉහත අවස්ථාවල දී හැර කළමනාකරණ ආඥාව සිදු කිරීමේ දිනයට පෙර පුද්ගලික නියෝජිත විසින් සද්භාවයෙන් කරනු ලබන මුදල් ගෙවීමක් හෝ වෙනත් ක්‍රියාවක් මෙහි විධිවිධාන මඟින් නිර්බල බවට පත් නොවේ.

8. පුද්ගලික නියෝජිතයා විසින් පෙත්සමක් ඉදිරිපත් කළ හැකි බව:

මේ උපලේඛනය යටතේ මියගිය ණයකරුගේ බූදලය කළමනාකරණය කිරීම සඳහා ණයකරුගේ පුද්ගලික නියෝජිතයා විසින් පෙත්සමක් ඉදිරිපත් කළ හැකි අතර, එම නියෝජිතයා විසින් එවැනි පෙත්සමක් ඉදිරිපත් කළ විට නියම කළ හැකි වෙනස් කිරීම්වලට යටත්ව මෙම උපලේඛනය එම පෙත්සම සම්බන්ධයෙන් අදාළ වේ.

9. "ණය හිමියා":

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ උපලේඛනයේ "ණයහිමියා" යන්නෙන්, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි බංකොලොත්භාවය පිළිබඳ පෙත්සමක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති ණයහිමියන් එක් අයකු හෝ වැඩි දෙනකු අදහස් වේ.

හත්වන උපලේඛනය

[232 වන වගන්තිය]

## අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල

1. IX වන කොටස යටතේ පත් කරන ලද සෑම අද්මිනිස්ත්‍රාසිකරුවකුට ම පහත දැක්වෙන බලතල තිබිය යුතු ය -

(අ) සමාගමේ දේපළවල සන්තකය ලබාගැනීමට, එම දේපළ එකතු කිරීමට සහ එම දේපළ ලබා ගැනීමට;

(ආ) ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින්, පුද්ගලික වෙන්දේසියක් හෝ පුද්ගලික ගිවිසුමක් මගින් සමාගමේ දේපළ විකිණීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම;

(ඇ) සමාගමේ දේපළවලින් ලැබෙන ආදායම, නඩුවක් මගින් හෝ අන්‍යාකාරයකට ඉල්ලා සිටීම සහ අයකර ගැනීම;

(ඈ) අය කර ගත් ආදායම සඳහා රිසිට්පත් නිකුත් කිරීම;

(ඉ) සමාගමේ ව්‍යාපාර සහ දේපළ සම්බන්ධයෙන් රක්ෂණයක් ලබාගැනීම සහ රක්ෂණය පවත්වාගෙන යාම;

(ඊ) සමාගමේ දේපළ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම;

(උ) සමාගමේ කටයුතු, ව්‍යාපාර, දේපළ සහ මූල්‍ය තත්ත්වයන්ට අදාළ සහ සමාගමේ සන්තකයේ හෝ භාරකාරත්වයේ හෝ පාලනය යටතේ පවතින යම් පොත්පත්, වාර්තා හෝ ලේඛන පරීක්ෂා කිරීම;

(ඌ) සමාගම හැර, වෙනත් යම් තැනැත්තකුගේ සන්තකය, භාරකාරත්වය හෝ පාලනය යටතේ පවතින සමාගමේ කටයුතුවලට, ව්‍යාපාරවලට, දේපළවලට සහ මූල්‍ය තත්ත්වයන්ට අදාළ පොත්පත්, වාර්තා හෝ ලේඛන පරීක්ෂා කිරීමේ අයිතියක් ක්‍රියාත්මක කිරීම;

(එ) සමාගමේ දේපළ සම්බන්ධයෙන් මුදල් සඳහා ඇප තබා හෝ නොතබා ණයහිමියකු හෝ කොටස් හිමියකු වන හෝ නොවන තැනැත්තකුගෙන්, මුදල් ලබා ගැනීම හෝ ණයට ගැනීම;

(ඒ) අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල, ක්‍රියාත්මක කිරීම සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම යන කටයුතුවල දී අද්මිනිස්ත්‍රාසිකරුට සහාය වීම සඳහා නීතිඥයකු හෝ ගණකාධිකාරීවරයකු හෝ වෙනත් වෘත්තීයමය වශයෙන් සුදුසුකම්ලත් තැනැත්තකු පත් කිරීම;

(ඔ) සමාගම නමින් සහ සමාගම වෙනුවෙන් යම් නෛතික ක්‍රියාවලියක් හෝ නීති කෘත්‍යයක් සඳහා විත්තිවාචක ඉදිරිපත් කිරීම සහ සමාගම නමින් සහ සමාගම වෙනුවෙන් තහනමට ගැනීමේ ගාස්තු අයකර ගැනීම දිගටම පවත්වාගෙන යාම, අවසන් කිරීම හෝ;

(ඕ) සමාගමට අදාළ යම් ප්‍රශ්නයක් සමථකරණයට හෝ බේරුම් කිරීමකට හෝ යම් ඔම්බුඩ්ස්මන් වරයකු වෙත යොමු කිරීම;

(ක) සමාගමේ පොදු මුද්‍රාවක් තිබේ නම් එය භාවිත කිරීම;

(ග) සමාගම නමින් සහ සමාගම වෙනුවෙන් සියලු ක්‍රියා ඉටු කිරීම, යම් ගිවිසුමක්, ඔප්පුවක් හෝ වෙනත් ලේඛනයක් ලියා අත්සන් කිරීම;

(ච) සමාගම නමින් සහ සමාගම වෙනුවෙන් යම් විනිමය බිල්පතක් හෝ පොරොන්දු නෝට්ටුවක් ලිවීම, භාරගැනීම, පිටපත් කිරීම සහ දරා සිටීම;

(ජ) අද්මිනිස්ත්‍රාසිකරුට සිදුකළ නොහැකි වූ ද, හෝ නියෝජිතයකුට වඩාත් පහසු ලෙස කළ හැකි වූ ද යම් කටයුතු ඉටු කිරීම සඳහා නියෝජිතයකු පත් කිරීම;

(ට) සේවානියුක්තයන් සේවයේ යෙදවීම, සේවයෙන් පහකිරීම හෝ සේවානියුක්තයන් සේවයෙන් පහකිරීම සඳහා උචිත අධිකාරියෙන් අවසර ලබා ගැනීම;

(ඩ) සමාගමේ දේපළ විකිණීම සඳහා අවශ්‍ය විය හැකි (වැඩ කටයුතු ඉටු කිරීම ඇතුළු) සියලුම දේ කිරීම;

(ණ) අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල ක්‍රියාත්මක කිරීම, සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික යම් මුදල් ගෙවීම සිදු කිරීම;

(ත) සමාගමේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම;

(ද) සමාගමේ පාලිත සමාගම් පිහිටුවීම;

(න) සමාගමේ ව්‍යාපාර හෝ දේපළ සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් පාලිත සමාගම්වලට පැවරීම;

(ප) සමාගමේ යම් දේපළක් බදු දීම හෝ බදු දීම හෝ ආපසු ලබා දීම, භාර ගැනීම සහ සමාගමේ ව්‍යාපාරවලට අවශ්‍ය හෝ පහසුවන්නා වූ යම් දේපළ කුලියට ගැනීම හෝ බද්දට ගැනීම;

(බ) අදාළ කාර්යපටිපාටිය යටතේ අවසර දී ඇති විට සමාගම වෙනුවෙන් වූ යම් වැඩපිළිවෙළක්, ඒකාබද්ධ කිරීමක් හෝ එකඟත්වයක් සඳහා යෝජනා කිරීම හෝ ඒ සඳහා කැමැත්ත ලබාදීම;

(ම) යම් තැනැත්තකුගෙන් සමාගමට ණයක් අය වීමට ඇති විට හෝ අන්‍යාකාරයකින් එම තැනැත්තා සමාගම සම්බන්ධයෙන් යම් බැරකමකට යටත්ව ඇති විට -

(i) එම තැනැත්තාගේ බංකොලොත්භාවයේ දී, වස්තුභංගත්වයේ දී හෝ ඈවර කිරීමේ දී ණය හෝ වෙනත් බැරකම සම්බන්ධයෙන් ඡන්දය දීම, ඔප්පු කිරීම සහ ශ්‍රේණිගත කිරීම සහ එම තැනැත්තාගේ ණයහිමියකු වශයෙන් බෙදා හැරීම් ලබා ගැනීම; සහ

(ii) අදාළ කාර්යපටිපාටිය යටතේ අවසර දී ඇති අවස්ථාවක එම තැනැත්තාගේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ තුළ ණයහිමියකු වශයෙන් සහභාගි වීම සහ ඡන්දය දීම සහ බෙදා හැරීම ලබා ගැනීම;

(iii) අදාළ කාර්යපටිපාටිය යටතේ අවසර දී ඇති අවස්ථාවක එම තැනැත්තාගේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ තුළ ණයහිමියකු වශයෙන් ඡන්දය දීම, බෙදා හැරීම, ලබා ගැනීම සහ අන්‍යාකාරයෙන් ඒ සඳහා සහභාගි වීම;

(ය) සමාගමට යම් ඇවරකරුවකු පත් කිරීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කිරීම;

(අඅ) සමාගමට ලිපි ලැබෙන පරිදි ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය වෙනස් කිරීම;

(ආආ) සමාගමේ කටයුතුවලට අවශ්‍ය හෝ පහසු වන්නා වූ යම් දේපළක් අත්කර ගැනීම;

(ඇඇ) සමාගමේ දේපළ මත විකල්පයක් ප්‍රදානය කිරීම;

(ඈඈ) සමාගමේ දේපළ අලුත් කිරීම හෝ විශාල කිරීම;

(ඉඉ) සමාගම නමින් සහ ඒ වෙනුවෙන් යම් ගිණුමක් ක්‍රියාත්මක කිරීමට යම් තැනැත්තකුට අවසර දීම;

(ඊඊ) බදු වාර්තාවක් ගොනු කර බදු හිඟ ගෙවීම;

(උඋ) සමාගමේ අධ්‍යක්ෂවරයකු ඉවත් කිරීම;

(ඌඌ) අද්මිනිස්ත්‍රාසි කිරීමට අදාළ කරුණු පිළිබඳව අද්මිනිස්ත්‍රාසි ණයහිමියන්ගේ කමිටුව සමග සාකච්ඡා කිරීම;

(එඑ) (i) (අ) අද්මිනිස්ත්‍රාසි කිරීමේ කටයුතුවල ප්‍රගතිය පිළිබඳ දැනුම්දීම සඳහා;

(ආ) අද්මිනිස්ත්‍රාසි කිරීමට අදාළව පැන නැගී ඇති යම් කරුණක් සම්බන්ධයෙන් වන මතය දැන ගැනීම සඳහා; හෝ

(ii) අද්මිනිස්ත්‍රාසි කිරීමට අදාළ වෙනත් යම් කාර්යයක් කිරීම සඳහා,

218 වන වගන්තිය යටතේ අවසර දී ඇති විට හෝ නියම කර ඇති විට ණය හිමියන්ගේ හෝ කොටස් හිමියන්ගේ රැස්වීමක් හෝ අද්මිනිස්ත්‍රාසි ණය හිමියන්ගේ කමිටු රැස්වීමක් කැඳවිය හැකි ය;

(ඒ) ඇරයුම් නොකළ ප්‍රාග්ධනය සහ වෙනත් බැරකම් සම්බන්ධයෙන් සමාගමේ සහදායකයන් වෙත ඇමතුම් කිරීම;

(ඔ) මේ ජේදයේ සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍යවන්නා වූ හෝ ආනුෂංගික දේ කිරීම සඳහා;

(ඕ) අද්මිනිස්ත්‍රාසි කිරීම පිරිමැසුම්දායි ලෙස සහ කඩිනමින් සිදු කිරීම සඳහා අධිකරණය විසින් අනුමත කරනු ලබන වෙනත් දේ කිරීම.

අටවන උපලේඛනය

[333 වන සහ 426 වන වගන්ති]

**සුරක්ෂිත ණය හිමියන්ගේ විකල්ප**

1. යම් සමාගමක දේපළ මත ස්ථිර ඇපයක් දරා සිටින යම් සුරක්ෂිත ණයහිමියකු විසින් -

(අ) එම සුරක්ෂිත ණයහිමියාට ඒ සඳහා හිමිකම් ලැබෙන අවස්ථාවක දී එම ඇපය බලාත්මක කළ හැකි ය; හෝ

(ආ) සමස්ථයක් ලෙස ණයහිමියන්ගේ ප්‍රතිලාභ උදෙසා ඇපයට යටත් දේපළ ඇවරකරුට භාර දී සම්පූර්ණ ණය මුදල වෙනුවෙන් සුරක්ෂිත නොවූ ණයහිමියකු ලෙස හිමිකම් පෑ හැකි ය.

2. 1 වන ඡේදයේ (අ) අනුඡේදයේ සඳහන් විකල්පය ක්‍රියාත්මක කරනු ලබන සුරක්ෂිත ණයහිමියකු විසින්-

(අ) අදාළ දිනය වන විට නිශ්චය කරන ලද සුරක්ෂිත ණයහිමියාගේ ස්ථිර ඇපයට වඩා කලින් ශ්‍රේණිගත කර තිබූ දේපළක යම් කොටසක් මත ස්ථිර ඇපයක් ලබාදුන් තැනැත්තාට හිමිවිය යුතු යම් ණය මුදලක් ගෙවා බේරුම්කිරීමෙන්; සහ

(ආ) අදාළ දිනය වන විට නිශ්චය කරන ලද සම්පූර්ණ ණය මුදල ගෙවා බේරුම් කිරීමෙන්,

පසුව ලැබෙන යම් ශුද්ධ මුදල් ප්‍රමාණයෙන් ඉතිරිව පවතින යම් අතිරික්තයක් ඇවරකරුට දැනුම් දිය යුතු ය.

(3) ඇවරකරු විසින් ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීම ලැබී වැඩ කරන දින විස්සක් ඇතුළත සුරක්ෂිත ණයහිමියාට-

(අ) 1 වන ඡේදයේ (අ) අනුඡේදයේ සඳහන් විකල්පය හෝ 1 වන ඡේදයේ (ආ) අනුඡේදයේ සඳහන් විකල්පය ක්‍රියාත්මක කරන ලෙස; සහ

(ආ) 1වන ඡේදයේ (ආ) අනුඡේදයේ සඳහන් විකල්පය ක්‍රියාත්මක කිරීම ණයහිමියා විසින් තෝරාගතහොත්, අදාළ කාලසීමාව තුළ එසේ කරන ලෙස,

නියම කළ හැකිය.

(4) 3 වන ඡේදය යටතේ වූ දැන්වීමක් භාරදෙන ලදුව එම දැන්වීම අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ යම් සුරක්ෂිත ණයහිමියකු විසින් -

(අ) සමස්ථයක් ලෙස ණයහිමියන්ගේ ප්‍රතිලාභය උදෙසා ඇපයට යටත් දේපළ ඇවරකරුට භාර දී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) සුරක්ෂිත නොවූ ණයහිමියකු ලෙස සම්පූර්ණ ණය මුදල සඳහා හිමිකම්පෑම කරනු ලැබිය හැකි ය.

නවවන උපලේඛනය

[329 වන වගන්තිය]

**ඇවරකරුගේ බලතල**

1. XII වන කොටස යටතේ පත් කරන ලද සෑම ඇවරකරුවකුටම පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:-

(අ) සමාගමේ දේපළවල සන්තකය ලබා ගැනීමට, එම දේපළ එකතු කිරීමට සහ එම දේපළ ලබා ගැනීමට;

(ආ) ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින්, පුද්ගලික වෙන්දේසියක් මගින් හෝ පුද්ගලික ගිවිසුමක් මගින් සමාගමේ දේපළ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඇ) සමාගමේ දේපළවලින් ලැබෙන ආදායම, නඩුවක් මගින් හෝ අන්‍යාකාරයකින් ඉල්ලා සිටීම සහ අයකර ගැනීම;

(ඈ) අයකරගත් ආදායම සඳහා රිසිට්පත් නිකුත් කිරීම;

(ඉ) සමාගමේ ව්‍යාපාර සහ දේපළ සම්බන්ධයෙන් රක්ෂණයන් ලබාගෙන ඒවා පවත්වාගෙන යාම;

(ඊ) සමාගමේ දේපළ අලුත්වැඩියා කර පවත්වාගෙන යාම;

(උ) සමාගමේ සන්තකය හෝ භාරකාරත්වය හෝ පාලනය යටතේ ඇති සහ සමාගමේ කටයුතු වලට, ව්‍යාපාරවලට, දේපළවලට සහ මූල්‍ය තත්ත්වයට අදාළ පොත්පත්, වාර්තා හෝ ලේඛන පරීක්ෂා කිරීම;

(ඌ) සමාගම හැර වෙනත් තැනැත්තකුගේ සන්තකයේ, භාරයේ සහ පාලනයේ පවතින සමාගමේ කටයුතුවලට, ව්‍යාපාරයට, දේපළට සහ මූල්‍ය තත්ත්වයන්ට අදාළ පොත්පත්, වාර්තා හෝ ලේඛන පරීක්ෂා කිරීමේ අයිතිය ක්‍රියාත්මක කිරීම;

(එ) සමාගමේ දේපළ සම්බන්ධයෙන් මුදල් සඳහා ඇප තබා හෝ නොතබා ණයහිමියකු හෝ කොටස්හිමියකු වන හෝ නොවන යම් තැනැත්තකුගෙන් මුදල් ලබා ගැනීම හෝ ණයට ගැනීම;

(ඒ) ඇවරකරුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීමේ දී ඇවරකරුට සහාය වීම සඳහා නීතිඥවරයකු, හෝ ගණකාධිකාරිවරයකු හෝ වෙනත් වෘත්තීය වශයෙන් සුදුසුකම්ලත් තැනැත්තකු පත් කිරීම;

(ඔ) සමාගම නමින් සහ සමාගම වෙනුවෙන් යම් නෛතික ක්‍රියාවලියකට හෝ වෙනත් නීති කෘත්‍යයකට විත්තිවාචක ඉදිරිපත් කිරීම සහ දිගටම පවත්වාගෙන යාම හෝ අවසන් කිරීම සහ සමාගම නමින් සහ සමාගම වෙනුවෙන් තහනමට ගැනීමේ ගාස්තුවක් අයකර ගැනීම;

(ඕ) සමාගමට බලපාන යම් ප්‍රශ්නයක් සමථකරණයට, බේරුම් කිරීමට හෝ ඔම්බුඩ්ස්මන්වරයාට යොමු කිරීම;

(ක) සමාගමට පොදු මුද්‍රාවක් තිබේ නම් එය භාවිත කිරීම;

(ග) සමාගම නමින් සහ එය වෙනුවෙන් සියලු ක්‍රියා ඉටුකිරීම සහ යම් ගිවිසුමක්, ඔප්පුවක් හෝ වෙනත් ලේඛනයක් ලියා අත්සන් කිරීම;

(ච) සමාගම නමින් සහ එය වෙනුවෙන් විනිමය බිල්පතක් හෝ පොරොන්දු නෝට්ටුවක් ලිවීම, භාරගැනීම, පිටපත් කිරීම සහ දරා සිටීම;

(ඡ) ඇවරකරුට සිදුකළ නොහැකි වූ ද හෝ නියෝජිතයකුට වඩාත් පහසු ලෙස කළ හැකි වූ ද යම් කටයුතු ඉටු කිරීම සඳහා නියෝජිතයකු පත් කිරීම;

(ට) සේවානියුක්තයන් සේවයේ යෙදවීම, සේවයෙන් පහකිරීම හෝ සේවානියුක්තයන් සේවයෙන් පහකිරීම සඳහා උචිත අධිකාරියෙන් අවසර ලබා ගැනීම;

(ඩ) සමාගමේ දේපළ විකිණීම සඳහා අවශ්‍ය (වැඩ කටයුතු කිරීම ඇතුළු) සියලු දේ කිරීම;

(ණ) ඇවරකරුගේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික යම් මුදලක් ගෙවීම;

(ත) ඇවර කිරීමට අවශ්‍ය ප්‍රමාණයට සමාගමේ ව්‍යාපාර සිදු කිරීම;

(ද) සමාගමේ පාලිත සමාගම් ඇති කිරීම;

(න) සමාගමේ ව්‍යාපාර සහ දේපළ සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක් හෝ පාලිත සමාගම්වලට පැවරීම;

(ප) සමාගමේ යම් දේපළ බදු දීම හෝ කුලියට දීම හෝ ආපසු ලබා දීම, භාරගැනීම සහ සමාගමේ ව්‍යාපාරවලට අවශ්‍ය හෝ පහසු වන්නා වූ යම් දේපළ කුලියට ගැනීම හෝ බද්දට ගැනීම;

(බ) අදාළ කාර්ය පටිපාටිය යටතේ අවසර දී ඇති විට සමාගම වෙනුවෙන් වූ යම් වැඩපිළිවෙළක්, ඒකාබද්ධ කිරීමක් හෝ එකඟත්වයක් සඳහා පත් කිරීමට යෝජනා කිරීම හෝ ඊට කැමැත්ත දීම;

(ම) යම් තැනැත්තකුගෙන් සමාගමට ණයක් අයවීමට ඇති විට, හෝ අන්‍යාකාරයකින් එම තැනැත්තා සමාගම සම්බන්ධයෙන් යම් බැරකමකට යටත් ව සිටින විට -

(i) එම තැනැත්තාගේ බංකොලොත්භාවයේ දී, වස්තුභංගත්වයේ දී හෝ ඇවර කිරීමේ දී ණය හෝ බැරකම සම්බන්ධයෙන් ඡන්දය දීම, ඔප්පු කිරීමේ සහ ශ්‍රේණිගත කිරීම සහ එම තැනැත්තාගේ ණයහිමියකු වශයෙන් බෙදාහැරීම් ලබාගැනීම;

(ii) අදාළ කාර්යපටිපාටිය යටතේ අවසර දී ඇති අවස්ථාවක, එම තැනැත්තාගේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක දී ණයහිමියකු ලෙස ඡන්දය දීම, බෙදා හැරීම්

ලබා ගැනීම සහ අනාාකාරයකින් ඒ සඳහා සහභාගී වීම;

(ය) IX වන කොටස යටතේ අවසර දී ඇති අවස්ථාවක, සමාගමේ අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම;

(අඅ) සමාගමට ලිපි යැවීම සඳහා ලියාපදිංචි කාර්යාලයට සහ ලිපිනය වෙනස් කිරීම;

(ආආ)සමාගමේ කටයුතු සඳහා අවශ්‍ය හෝ පහසු වන්නා වූ යම් දේපළක් අත්කර ගැනීම;

(ඇඇ) සමාගමේ දේපළ මත විකල්පයක් ප්‍රදානය කිරීම;

(ඈඈ) සමාගමේ දේපළ අලුත් කිරීම හෝ විශාල කිරීම;

(ඉඉ) සමාගම නමින් සහ ඒ වෙනුවෙන් යම් ගිණුමක් ක්‍රියාත්මක කිරීමට යම් තැනැත්තකුට අවසර දීම;

(ඊඊ) බදු වාර්තා ගොනු කිරීම සහ හිඟ බදු ගෙවීම;

(උඋ) සමාගමේ අධ්‍යක්ෂවරයකු ඉවත් කිරීම;

(ඌඌ)ඇවර කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් ඇවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුව සමඟ සාකච්ඡා කිරීම;

(එඑ) ඇවර කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් ඇවර කිරීමේ සහදායක කමිටුව සමඟ සාකච්ඡා කිරීම;

(ඒඒ)(i)(අ) ඇවර කිරීමේ ප්‍රගතිය පිළිබඳ දැනුම් දීම සඳහා;

(ආ) ඇවර කිරීමට අදාළ යම් කරුණක් පිළිබඳව මතය දැනගැනීම සඳහා; හෝ

(ii) ඇවර කිරීම හා සම්බන්ධ වෙනත් යම් කාර්යයක් සඳහා ,

310 වන වගන්තිය යටතේ අවසර දී ඇති අවස්ථාවක දී හෝ නියම කරනු ලැබ ඇති අවස්ථාවකදී ණයහිමියන්ගේ, කොටස්

හිමියන්ගේ, සහදායකයන්ගේ, ඇවර කිරීමේ ණයහිමියන්ගේ කමිටුවක හෝ ඇවර කිරීමේ සහදායකයන්ගේ කමිටුවක රැස්වීමක් කැඳවීම;

(ඔඔ) ණයහිමියන් හෝ ණයහිමියන් බවට හිමිකම්පාන තැනැත්තන් හෝ සමාගමට එරෙහිව හිමිකම් පෑමක් ඇති හෝ හිමිකම්පෑමක් ඇති බව පවසනු ලබන තැනැත්තන් සමග එකඟත්වයක් හෝ වැඩපිළිවෙළක් ඇතිකර ගැනීම, එම හිමිකම් පෑම දැනට පවතින හෝ අනාගත හිමිකම් පෑමක් විය හැකි ය. එය නිශ්චිත හෝ අවිනිශ්චිත එකක් විය හැකි ය. එය අලාභ පිළිබඳ නිසැකව දැනගත් හෝ සමාගමට එරෙහිව අලාභ පිළිබඳ පමණක් සම්බන්ධ එකක් විය හැකි ය. නමුත් එවැනි එකඟත්වයක් හෝ වැඩපිළිවෙළක් මගින් ණය හිමියන්ගේ නීත්‍යනුකූල අයිතිවාසිකම් අනුව හැර බෙදාහැරීමක් සඳහා විධිවිධාන සැලැස්වීම නොකළ යුතු ය;

(ඕඕ) ඇරයුම් නොකළ ප්‍රාග්ධනය හෝ වෙනත් බැරකම් සම්බන්ධයෙන් සමාගමේ සහදායකයන් වෙත ඇමතුම් කළ හැකි ය;

(කක) එකඟ විය හැකි කොන්දේසි මත සමාගම සහ යම් තැනැත්තකු අතර පවතින හෝ පවතින බවට අදහස් කරනු ලබන වර්තමාන හෝ අනාගත, නිශ්චිත හෝ අවිනිශ්චිත සහ නිශ්චය කරන ලද හෝ නිශ්චය නොකරන ලද සමථ ඇමතුම්, ණය සහ වෙනත් බැරකම් සම්බන්ධයෙන් එකඟත්වයක් ඇතිකර ගැනීම, එවැනි ඇමතුම්, ණය හෝ බැරකම් නිදහස් කිරීම සඳහා ඇප ලබාගෙන ඒවා සම්බන්ධයෙන් සම්පූර්ණ නිදහස් කිරීමක් කිරීම;

(ගග) මෙම ඡේදයේ සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ වෙනත් සියලු දේ කළ හැකි ය;

(චච) ඇවර කිරීම පිරිමැසුම්දායී ලෙස සහ කඩිනමින් සිදු කිරීම සඳහා අධිකරණය විසින් අනුමත කරනු ලබන වෙනත් සියලු දේ කිරීම.

දසවන උපලේඛනය

[376 වන වගන්තිය]

**දේපළ භාර ගැනුම්කරුවන්ගේ බලතල**

1. XIII වන කොටස යටතේ පත් කරන ලද සෑම දේපළ භාර ගැනුම්කරුවකු ම පත් කිරීම සිදු කරනු ලැබූ සාධන පත්‍රය යටතේ හෝ අධිකරණ ආඥාව මගින් හෝ ඒ යටතේ වන දේපළ භාර ගැනුම්කරුවකුගේ බලතල පිළිබඳ යම් සීමාවකට යටත්ව එම දේපළ භාර ගැනුම්කරුට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය:-

(අ) දේපළ භාර ගැනුම්කාරිත්වය යටතේ ඇති දේපළවල සන්තකය ලබා ගැනීම, එම දේපළ එකතු කිරීම සහ ලබා ගැනීම;

(ආ) දේපළ භාර ගැනුම්කාරිත්වය යටතේ ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ, පුද්ගලික වෙන්දේසියේ හෝ පුද්ගලික ගිවිසුමක් මගින් විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඇ) දේපළ භාර ගැනුම්කාරිත්වය යටතේ ඇති දේපළවල ආදායම නඩුවක් මගින් හෝ අන්‍යාකාරයකින් ඉල්ලා ඒවා ලබාගැනීම;

(ඈ) ලබාගත් ආදායම සඳහා ලදුපත් නිකුත් කිරීම ;

(ඉ) දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත් දේපළ කළමනාකරණය කිරීම;

(ඊ) දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත් දේපළ සම්බන්ධයෙන් රක්ෂණයන් ලබාගෙන ඒවා පවත්වාගෙන යාම;

(උ) දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත් දේපළ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම;

(ඌ) ප්‍රදානකරුගේ සන්තකයේ හෝ භාරකාරත්වයේ හෝ පාලනය යටතේ ඇති දේපළ භාරගැනුම්කාරිත්වයට යටත් දේපළවලට අදාළ පොත්පත්, වාර්තා හෝ ලේඛන යම් සාධාරණ වේලාවක සහ ස්ථානයක දී පරීක්ෂා කිරීම;

(එ) ප්‍රදානකරු හැර, වෙනත් තැනැත්තකුගේ සන්තකය, භාරය හෝ පාලනය යටතේ ඇති දේපළ භාර ගැනුම්කාරිත්වයට යටත් දේපළවලට අදාළ පොත්පත්, වාර්තා හෝ ලේඛන පරීක්ෂා කිරීමේ අයිතියක් ප්‍රදානකරු වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම;

(ඒ) දේපළ භාර ගැනුම්කරුගේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික වන්නා වූ යම් ගෙවීමක් සිදුකිරීම;

(ඔ) මෙම ඡේදයේ දක්වා ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික වන්නා වූ වෙනත් සියලුම දේ කිරීම.

2. 1 වන ඡේදයට අගති විරහිතව, සමාගමක දේපළ සහ ව්‍යාපාර සඳහා එම සමස්ථ දේපළ සහ ව්‍යාපාර හෝ ඒවායින් සැළකිය යුතු සමස්ථයක් සම්බන්ධයෙන් පත් කරන ලද භාරගැනුම්කරුට තමා පත් කළ සාධන පත්‍රයක් හෝ අධිකරණ ආඥාවක් මගින් හෝ ඒ යටතේ ඔහුගේ බලතල සීමා කිරීම්වලට යටත්ව පහත දැක්වෙන බලතල ඇත්තේ ය:-

(අ) සමාගමේ දේපළ සම්බන්ධයෙන් මුදල් සඳහා ඇප තබා හෝ නොතබා ණයහිමියකු හෝ කොටස් හිමියකු වන හෝ නොවන තැනැත්තකුගෙන් මුදල් ලබා ගැනීම හෝ ණයට ගැනීම;

(ආ) අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අද්මිනිස්ත්‍රාසිකරුට සහාය වීම සඳහා නීතිඥවරයකු හෝ ගණකාධිකාරිවරයකු හෝ වෙනත් වෘත්තීය වශයෙන් සුදුසුකම්ලත් තැනැත්තකු පත් කිරීම;

(ඇ) සමාගම නමින් සහ සමාගම වෙනුවෙන් යම් නෛයිතික ක්‍රියාවලියකට හෝ නීති කෘත්‍යයකට විත්තිවාචක ඉදිරිපත් කිරීම සහ දිගටම පවත්වාගෙන යාම හෝ අවසන් කිරීම සහ සමාගම නමින් සහ සමාගම වෙනුවෙන් තහනමට ගැනීමේ ගාස්තුවක් අයකර ගැනීම;

(ඇ) සමාගමට බලපාන යම් ප්‍රශ්නයක් සමථකරණයට, බේරුම් කිරීමට හෝ ඔම්බුඩ්ස්මන්වරයාට යොමු කිරීම ;

(ඉ) සමාගමට පොදු මුද්‍රාවක් තිබේනම් එය භාවිත කිරීම;

(ඊ) සමාගම නමින් සහ සමාගම වෙනුවෙන් සියලු ක්‍රියා ඉටුකිරීම සහ යම් ගිවිසුමක්, ඔප්පුවක් හෝ වෙනත් ලේඛනයක් ලියා අත්සන් කිරීම;

(උ) සමාගම නමින් හෝ ඒ වෙනුවෙන් විනිමය බිල්පත් හෝ පොරොන්දු නෝට්ටු ලිවීම, භාරගැනීම, පිටපත් කිරීම සහ දරා සිටීම;

(ඌ) දේපළ භාර ගැනුම්කරුට තනිවම කළ නොහැකි හෝ නියෝජිතයකුට වඩාත් පහසු ලෙස කළ හැකි යම් ව්‍යාපාරයක් කිරීමට යම් නියෝජිතයකු පත් කිරීම;

(එ) සේවානියුක්තයන් සේවයේ යෙදවීම, සේවයෙන් පහ කිරීම හෝ සේවානියුක්තයන් සේවයෙන් පහ කිරීම සඳහා උචිත අධිකාරියෙන් අවසර ලබා ගැනීම;

(ඒ) සමාගමේ දේපළ විකිණීම සඳහා අවශ්‍ය විය හැකි (වැඩ කටයුතු සිදු කිරීම ඇතුළුව) සියලු දේ කිරීම;

(ඔ) සමාගමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් රක්ෂණයන් ලබා ගැනීම සහ රක්ෂණය පවත්වාගෙන යාම;

(ඕ) සමාගමේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම;

(ක) සමාගමේ පාලිත සමාගම් ඇති කිරීම;

(ග) සමාගමේ ව්‍යාපාර සහ දේපළ සම්පූර්ණයෙන් ම හෝ එහි කොටසක් හෝ පලිත සමාගම්වලට පැවරීම;

(ච) සමාගමේ යම් දේපළක් බදු දීම හෝ කුලියට දීම හෝ ආපසු ලබාදීම භාරගැනීම සහ සමාගමේ ව්‍යාපාරවලට අවශ්‍ය හෝ පහසු වන්නා වූ යම් දේපළ කුලියට ගැනීම හෝ බද්දට ගැනීම;

(ඡ) අදාළ කාර්ය පටිපාටිය යටතේ අවසර දී ඇති විට සමාගම වෙනුවෙන් වූ යම් වැඩපිළිවෙළක්, ඒකාබද්ධ කිරීමක් හෝ එකඟත්වයක් සඳහා යෝජනා කිරීම හෝ ඊට කැමැත්ත දීම;

(ට) යම් තැනැත්තකුගෙන් සමාගමට ණයක් අය වීමට ඇති විට හෝ අන්‍යාකාරයෙන් එම තැනැත්තා සමාගම සම්බන්ධයෙන් යම් බැරකමකට යටත් ව සිටින විට -

(i) එම තැනැත්තාගේ බංකොලොත්භාවයේ දී, වස්තුභංගත්වයේ දී හෝ ඈවර කිරීමේ දී ණය හෝ බැරකම සම්බන්ධයෙන් ඡන්දය දීම, ඔප්පුකිරීම සහ ශ්‍රේණිගත කිරීම සහ එම තැනැත්තාගේ ණයහිමියකු වශයෙන් බෙදා හැරීම් ලබාගැනීම; සහ

(ii) එම තැනැත්තාගේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක දී ණයහිමියකු ලෙස ඡන්දය දීම, බෙදාහැරීම් ලබා ගැනීම් සහ අන්‍යාකාරයෙන් ඒ සඳහා සහභාගි වීම;

(ඩ) අදාළ කාර්යපටිපාටිය යටතේ අවසර ලබා දී ඇති විට සමාගමේ ඈවරකරුවකු පත් කිරීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම;

(ණ) IVකොටස යටතේ අවසර දී ඇති අවස්ථාවක සමාගමේ අද්මිනිස්ත්‍රාසිකරුවකු පත් කිරීම;

(ත) සමාගමේ සේවය සඳහා ලියාපදිංචි කාර්යාලය හෝ ලිපිනය වෙනස් කිරීම;

(ද) සමාගමේ ව්‍යාපාරය සඳහා අවශ්‍ය හෝ පහසු ඕනෑම දේපළක් අත්පත් කර ගැනීම;

(න) සමාගමේ දේපළ සඳහා විකල්පයක් ලබා දීම;

(ප) සමාගමේ දේපළ අලුත් කිරීම හෝ විශාල කිරීම;

(බ) සමාගමේ නමින් හෝ එය වෙනුවෙන් ගිණුමක් ක්‍රියාත්මක කිරීමට යම් තැනැත්තකුට ඉඩදීම;

(ම) කිසියම් බදු වාර්තාවක් ගොනු කර ගෙවිය යුතු හිඟ බදු ගෙවීම; සහ

(ය) මෙම ඡේදයේ දක්වා ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික අනෙකුත් සියලුම දේ කිරීම.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**480.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.